سنهالي

# ශුද්ධ අල්-කුර්ආනයේ

අවසන් ජුස්උ තුනෙහි අර්ථ විවරණය

මෙය තුළ මුස්ලිම්වරුන්ට
අවශ්‍ය සියළුම නීති අඩංගුව ඇත.

www.tafseer.info

بسم الله الرحمن الرحيم

# පෙරවදන

සියළු ප්‍රශංසා අල්ලාහ්ටමය. අල්ලාහ්ගේ අවසාන දූතයාණන්වූ අපගේ නායක මුහම්මද් (එතුමාට ශාන්තිය සමාදානය හිමිවේවා)

**ඉස්ලාම් සහෝදර සහෝදියනිණි අල්ලාහ් ඔබ සැමට දයාව පහල කරන්වා෴ නීති හතරක් හැදීම අපගේ යුතුකමකි.**

**❶ දැනුම:-** එනම් අල්ලාහ් ගැන ද ඔහුගේ දූතයාණන් ගැන ද ඉස්ලාම් දහම ගැනද දැනගැනීමයි. දැනුමෙන් තොරව අල්ලාහ්ට නැමදුම් ඉටු නොකල යුතුය. එසේ කිරීමෙන් මංමුලා විය හැකිය. එය ක්‍රිස්තියානි වරුන්ගේ ක්‍රියාවට සමාන වන්නේය

**❷ වතාවත්:-** කවරෙකු දැනුමෙ සහිතව වතාවත් ඉටු නොකරයි ද ඔහු යුදෙව්වන්ට සමාන වෙයි. මන්ද ඔවුන් දැනගත් පිදී වතාවත් ඉටු කලේ නැත. දැනුම නොලද පුද්ගලයා අල්ලාහ්ගෙන් සමාව ලැබුවෙකියි විශ්වාසය ඇති කරවා මිනිසාව දැනුම හැදීමෙන් වැලැක්වීම ෂෙයිතාන්ගේ කපටි ක්‍රියාවන්ගෙන් එකකි. කවරෙකුට දැනුම හැදීමට අවස්ථාව තිබියත් ඔහු දැනුම (ශිල්පය) නොහදාරයි ද ඔහු වරද කරුවෙකුවන අතර එය ඔහුට එරෙහිව සාධකයක් ලෙස පෙනීසිටී. නුහ් නබිතුමාගේ සමාජයේ විසූ ජනයාගේ කපටිකම ද එසේම විය. වරද ඔවුන් කෙරෙහි නොපැටවෙනු පිණිස (ඔවුහු තම ඇඟිලි කනේ ගසාගෙන තම ඇඳුමෙන් මුහුණු වසාගෙන සිටියහ.)

**❸ කැඳවීම:-** ආගමික වියතුන් ද කැඳවුම් කරුවන් ද නබිවරුන්ගේ (අල්ලාහ්ගේ වක්තෘවරුන්ගේ) උරුම (පෙලපත්) කරුවන්ය. අල්ලාහ් බනී ඉස්රායීල්වරුන්ට (යුදෙව්වන්ට)ශාප කලේය. මන්ද (ඔවුන් කල පාප ක්‍රියාවන්ගෙන් එකිනෙකා වලක්වාගනු නොලැබුහ. ඔවුන් කරමින් සිටියේ නපුරු ක්‍රියාවන්ය.) කැඳවීම ද ශිල්ප ඉගැන්වීම ද පොත් අනිවාර්ය (ෆර්ලු කිෆායා) ක්‍රියාවකි. සැලකිය යුතු පිසක් එය ඉටුකරයිනම් කිසිවෙකු පව්කාරයන් හෝ වැරදිකරුවන් නොවෙති. සියළුදෙනාම එම ක්‍රියාව නොකරන්නේනම් සියළුදෙනාම පව්කාරයින්ය.

**❹ නිෂ්කරතාවයන් ඉවසා ගැනීම:-** දැනුම සෙවීමේ " හා වත්පිළිවෙත් ඉටු කිරීමේ " මතුවිය හැකි නිෂ්කරතා ඉවසා ගැනීම.

නුගත් කම ඉවත් කිරීම සඳහා දායක වීමටත් අවශ්‍ය දැනුම ලබා ගැනීමට පහසුකම් ලබා "මටත් සංක්ෂිප්ත මෙම ශුද්ධ කුර්ආනයේ (ග්‍රන්ථයේ) අවසන් (කොටස්) ජුස්උ තුනෙහි අර්ථ විවරණ සහිතව ඉස්ලාම් දැනුමෙහි වැදගත් කොටස් ඇතුලත් කලෙමු. හැකිතරම් කෙටි විය යුතු බවටත්, හ"ස (නබි වදන්) සත්‍ය එවා විය යුතු බවටත් දැඩි අවධානය යොමු කර ඇත්තෙමු. අපි සියල්ල ගැන සම්පූර්ණ දැනුම ඇත්තන් යැයි වාද නොකරමු. මන්ද එය අල්ලාහ්ට පමණක් හිමි දෙයකි. එහෙත් මෙය යටහත් පහත් වූ උත්සාහයයකි. නිවැරදි දැ අල්ලාහ්ගේය. වැරදි ඒවා අපගේ හා ෂෙයිතාන්ගේය. අල්ලාහ් ද ඔහුගේ දූතයාණන් ද ඒ පිළිබඳව නිවැරදි කරුවන්ය. සාධාරණ ලෙස අපගේ වැරදි පෙන්වා " විවේචනය කරන අයට අල්ලාහ්ගේ දයාව හිමිවේවා

**මෙය සම්පාදනය කිරීමේ " දණී පිවර්තනයේ " දණී මුද්‍රණය කිරීමේ" දණී බෙදා හැරීමේ " දණී කියවීමේ" දණී ඉගැන්වීමේ" ද දායකවන සියලුම දෙනාට අල්ලාහ් යහපත් ප්‍රතිඵල ලබා දෙන්වා! ඔවුන්ගේ උත්සාහයන් පිළිගනිත්වා!**

**සර්ව සම්පූර්ණ දැනුම ඇත්තා අල්ලාහ්මය. අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අපගේ නායකයාණන් හා අල්ලාහ්ගේ දූතයාණන් වන මුහම්මද් තුමණ්ට හිමිවේවා**

# පටුන


| | |
|---|---|
| අල්-කුර්ආනයේ මහිමය | 2 |
| ශුද්ධ අල්-කුර්ආනයේ | 4 |
| මුස්ලිම් වරයෙකුගේ ජීවිතයේ වැදගත් ප්‍රශ්න කීපයක් | 68 |
| කවරෙකු කුර්ආනය හා හදීසය විමසා බලන්නේද ඔහු එහි ඇති එම නාමයන් පාඩම් කරගනි. ඒවානම් | 69 |
| **සිත හා සම් බන්ධ අමලයන් (ක්‍රියාවන්)** | 84 |
| **නිහඬ සංවාදයක්** | 94 |
| ලා ඉලාහා ඉල්ලල්ලාහු | 107 |
| මුහම්මදුර් රසූලුල්ලාහ් | 108 |
| පිරිසිදු කම | 110 |
| ගැහැණුන්ගේ සුපුරුදු මාස් ශුද්ධිය පිළිබඳ නීතීන් | 114 |
| **ඉස්ලාම් හි ස්ත්‍රීන්ගේ ස්ථාවරය** | 116 |
| සලාතය | 120 |
| **සකාත් (අනිවාර්ය බද්ද)** | 126 |
| උපවාසය | 129 |
| හජ් හා උම්රාව | 132 |
| අනුපිළිවෙලින් හජ් නැමදුම ඉටු කරන ආකාරය පෙන්වන කෙටි වගුව | 136 |
| පොදුවේ සමහර උපදේශයන් | 137 |
| ඉස්ලාමිය ක්‍රමයට මැතිරීම | 143 |
| ප්‍රාර්ථනා කිරීම | 150 |
| පාඩම් කරගත යුතු වැදගත් ප්‍රාර්ථනාවන් කීපයක් | 152 |
| ලාභ ගෙන දෙන වෙළදාම | 157 |
| උදේ සවස දිනපතා කියවිය යුතු ප්‍රාර්ථනා | 158 |
| අධික වශයෙන් යහපත ලඟා කර දෙන වදන් හා කුසල් | 161 |
| තහනම් කෙරුණු සමහර කරුණු | 167 |
| නිම නොවන නිරන්තර චාරිකාව | 171 |
| වුළු කිරීමේ ක්‍රමය | |
| සලාතය ඉටුකරන ක්‍රමය | |
| දැනුම සෙවීමේඅරමුණ එදිනෙදා ජීවිතයේ ක්‍රියාත්මක කිරීමටය | |

# අල්-කුර්ආනයේ මහිමය

**අල්-කුර්ආනය පාරායනය කිරීමෙන් (කියවීමෙන්) ලැබෙන යහ ප්‍රතිඵල:-**

අල්-කුර්ආනය හැදෑරීම, එය ඉගැන්වීම සහ එය පාරායනා කිරීම තුළින් බොහෝ කුසල් ලබාගත හැක. ඒවායින් සමහරක් ගැන බලමු.

**ඉගැන්වීමෙන් ලැබෙන ප්‍රතිඵල :-**

මුහම්මද් (එතුමාට අල්ලාහ්ගේ ක්ශානතිය හා සාමය හිමිවේවා) තුමාණෝ මෙසේ පැවසූහ. ,නුඹලාගෙන් වැදගත් අය වනුයේ අල්-කුර්ආනය හදාරා එය සෙස්සන්ට උගන්වන තැනැත්තන්ය." (මූලාශ්‍රය: බුහාරි)

**එය පාරායනා කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල :-**

මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ. ,කවරෙකු දේව මඟපෙන්වීමෙහි (කුර්ආනයෙහි) අකුරක් කියවන්නේ ද (පාරායනය කරන්නේ ද) ඔහුට එක් කුසලක් ඇත. එක කුසලක් දස ගුණයකින් යුක්තය. (මූලාශ්‍රය: බුහාරි)

**අල්-කුර්ආනය ඉගෙනීම එය කටපාඩම් කිරීම සහ එය දක්ෂ ලෙස පාරායනය කිරීමේ මහිමය:-**

,අල්-කුර්ආනය පාඩම් (මනනය) කර එය පාරායනය කරන්නා ගෞරවනීය මලක්වරුන් සමග සිටී. කෙනෙකුට එය දුෂ්කර වුවද එය අවධානයෙන් යුතුව පාරායනය කළොත් ඔහුට යහවිපාක දෙකක් ඇත., (මූලාශ්‍රය: බුහාරි සහ මුස්ලිම්)

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ. ,කුර්ආනය ඇත්තාට පරලොවදී මෙසේ පැවසෙයි. .ඔබ කියවන්න, ලොවෙහි ඔබ කුර්ආනය පිළිවෙළින් කියෙව්වා සේ කියවන්න. මන්ද ඔබේ නවාතැන ඔබ කියවන අවසන් වැකියේ ඇත., (මූලාශ්‍රය:තිර්මිදි)

සමහර සටහන් වල පහත සඳහන් පරිදි දක්නට ඇති බව ඉමාම් කතාබි (රහ්මතුල්ලාහි අලෙයිහි) තුමා ප්‍රකාශ කරයි. ,කුර්ආනයේ වැකි වල ප්‍රමාණය ස්වර්ගයේ තරාතිරම් වල ප්‍රමාණයට සමානය. එහෙයින් කුර්ආනය කියවන අයට මෙසේ කියවෙයි. අල්-කුර්ආනයෙන් ඔබ කිය වූ වැකිවල ප්‍රමාණයට මෙම පියගැට පෙළ උඩට නගින්න. එහෙයින් කවරෙකු අල්-කුර්ආනය සම්පූර්ණයෙන්ම පාරායනය කරන්නේ ද ඔහු ස්වර්ගයේ තත්ත්වයන්හි උච්චස්ථානයක අසුන් ගනියි. කවරෙකු කුර්ආනයෙහි සමහර කොටස් පමණක් පාරායනය කරයි ද ඔහුගේ නැගීමද ඒ තරමටම වෙයි. එසේම ඔහුගේ විපාකයේ ප්‍රමාණය ද කියවීමේ ප්‍රමාණයටම සමවෙයි.

**කුර්ආනය උගත් තැනැත්තාගේ දෙගුරුන්ට අත්වෙන යහ විපාක**

නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ. ,අල්-කුර්ආනය කියවා එය ඉගෙන ඒ අනුව ජීවත් වූ තැනැත්තාගේ දෙගුරුන්ට විනිශ්චය දිනයේ ආලෝකයෙන් නිම වූ ඔටුන්නක් පලඳවනු ලැබේ. එහි දීප්තිය සූර්යයාගේ දීප්තිය බඳුවෙයි. ඔවුන්ට වස්ත්‍ර දෙකක් අන්දවනු ඇත. ඒ දෙකෙහි වටිනාකම මේ ලෝකයට මිල කළ නොහැක. .අප මෙසේ අන්දවනු ලබන්නේ කුමක් නිසාදැ.?යි ඔවුහු ප්‍රශ්න කරති. එවිට .නුඹලාගේ දරුවන් කුර්ආනය උගත් නිසායැ.යි පිළිතුරු දෙනු ඇත, (මූලාශ්‍රය: හාකිම්)

**කුර්ආනය ඇති තැනැත්තාට විනිශ්චය දිනයේ දී එය අනුකම්පා බස් දොඩයි:-**

නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ. ,කුර්ආනය කියවනු. මන්ද එය ඔවුන් වෙනුවෙන් විනිශ්චය දිනයේ අනුකම්පා බස් දොඩන්නේමය, (මූලාශ්‍රය: මුස්ලිම්)

තවදුරටත් මෙසේ පැවසූහ. ,සව්ම(උපවාස)ය ද අල්-කුර්ආනය ද විනිශ්චය දිනයේ ගැත්තා වෙනුවෙන් අනුකම්පා බස් දොඩයි. (මූලාශ්‍රය: අහ්මද් හා හාකිම්)

**එය කියවා ඉගෙනීමට එක් රැස්වූ අයට ලැබෙන විපාක:-**

,ඕනෑම පිරිසක් දේව මස්ජිද්වල එක්රැස් වී අල්-කුර්ආනය කියවා එය ඉගෙන තේරුම් ගන්නේ ද ඔවුන් වෙත ශාන්තිය පහළ වෙයි. දේව දායාදය ඔවුන්ව වසා ගනී. මලක්වරු ඔවුන්ව වටකර ගනිති. අල්ලාහ් ඔහු ළඟ සිටින අය සමඟ ඔවුන් ගැන සිහිපත් කරයි., (මූලාශ්‍රය: අබූ දාවුද්)

**කුර්ආනය කියවීමට (පාරායනය කිරීමට) පිළිවෙළවල් සමහරක් ඇත:-**

ඉමාම් ඉබ්නු කසීර් තුමා එවායින් සමහරක් ගැන ප්‍රකාශ කර ඇත. වුළූ රහිතව එය කියවීමෙන් හෝ ඇල්ලීමෙන් වැළකීම. කියවීමට පෙර මිස්වාක් කර (දත් මැද) ගැනීම. පිරිසිදු ඇඳුම් ඇඳ සිටීම. කිබ්ලාව බලා සිටීම ඈනුම් යන විට කුර්ආනය කියවීම නතර කිරීම. අනවශ්‍ය අන්දමින් වෙනත් දෙයක් කථා කිරීම සඳහා කියවීම නතර නොකිරීම. සම්පූර්ණ අවධානය එයට යොමු කිරීම. දෙවියන්ගේ පොරොන්දු එළි දක්වන වාක්‍යවල දී ඒවා ඇයැදීම. ඔහු බියගන්වා අවවාද කරන තැන්වලදී ඒවායින් ආරක්ෂාව පැතීම. කුර්ආනය විවෘත කර නොතැබීම. ඒ මත කිසිවක් නොතැබීම. තව කෙනෙකුට බාධා වන අන්දමින් ශබ්ද නගා නොකියවීම. වෙළඳ පොළවල් හා ඝෝෂාව ඇති තැන්වල නොකියවා සිටීම.

**අල්-කුර්ආනය කියවිය යුත්තේ කෙසේද?**

නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ කියවීම පිළිබඳව අනස් (රළියල්ලාහු අන්හු) තුමාණන්ගෙන් ප්‍රශ්න කළ විට, එතුමාණෝ මිහිරි ලෙස දික් කර කියවති. බිස්මි.. යන්න කියවන විට (සුදුසු අන්දමින්) බිස්මිල්ලාහ් ද අර්-රහ්මාන් ද අර්-රහීම් ද දික් කරති.යි කීය.

**කියවීමේ යහ විපාක දෙගුණයක් වීම:-**

දෙවියන් වෙනුවෙන් පිරිසිදු සිතකින් අල්-කුර්ආනය කියවන සැමට යහවිපාක ඇත. එහෙත් කියවන විට එහි අර්ථය අවබෝධ කරගෙන කියවන විට එයට ලැබෙන යහවිපාක දෙගුණයක් වෙයි. එවිට අකුරකට දහගුණයේ සිට 700 ගුණය දක්වා යහවිපාක අධික වෙයි.

**දිවා රාත්‍රී ඇතුළත් දවසකදී කියවීමේ ප්‍රමාණය:-**

නබි සහගාමීන් දිනකට ඔවුන් සඳහා කිය විය යුතු ප්‍රමාණයක් නියම කර ගත්හ. දින හතකට වඩා අඩුවෙන් කියවා නියම කිරීම ඔවුන් පුරුද්දක් කර ගත්තේ නැත. දින තුනකට වඩා අඩු කාලයක් තුළ කියවා නිම කිරීමේ තහනම පිළිබඳව පැහැදිලි කළ නබි වදන්(හදීස්) ඇත.

එහෙයින් ආදරණීය සොයුරණි, දිනපතා කුර්ආනය කියවීමට ඔබේ කාලයෙන් කොටසක් වැය කිරීමට උනන්දු වන්න. ඔබට කියා යම් ප්‍රමාණයක් තබා ගන්න. එය කුමන අවස්ථාවක වුව ද අත් නොහරින්න. කඩින් කඩ කරන අධික ප්‍රමාණයට වඩා අඛණ්ඩව කරන සුළු ප්‍රමාණය වැදගත්ය. නින්ද හෝ අමතක වීම හේතුකොටගෙන අත හැරෙන දේ ඊළඟ දවසේ ඉලව් කරන්න. නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ. ,කවරෙක් තමා පුරුද්දක් වශයෙන් කරන කියවීම් හෝ කියවීමක් නොකර නිදාගෙන ඊළඟ දිනයේ ෆජ්ර් හා ලුහර් (උදෑසන සලාතය හා දවල් සලාතය) අතර එය ඉලව්වක් ලෙස කියවා නිම කරයි නම් ඔහු ගත වූ රාත්‍රියේ කියවූවාට සමාන වන්නේමය., (මූලාශ්‍රය: මුස්ලිම්) කිසිම අන්දමකින් කුර්ආනය අමතක කර එයින් දුරස්ථ වූ අයෙකු නොවන්න. එයින් දුරස්ථවීම යනු එය නොකියවීම හෝ තේරුම් නොගැනීම හා ඒ තුළින් රෝග නිවාරණය නොසෙවීම හෝ යන සියල්ල අඩංගු වේ.

## අල්-ෆාතිහා (ආරම්භය)

ෆාතිහා යනු සෑම දෙයකම ආරම්භය වෙයි. අල්-කුර්ආනය මෙම පරිච්ඡේදයෙන් අරම්භ කරන නිසා මෙයට .ෆාතිහා. යනුවෙන් නම් කර ඇත. මන්ද මෙය මුල්කරගෙනම අල්-කුර්ආනය කියවන්නා ද ලියන්නා ද තම කාර්යය ආරම්භ කරයි. මෙය ප්‍රථමයෙන්ම පහළ වූ වාක්‍යය නොවේ. මෙය මක්කී ද (මක්කාහ්වේ පහළ වූවක් ද) මදනී ද(මදීනාහ්වේ පහළ වූවක් ද)ැ යි විද්වතුන් අතර මතභේදයක් පවතී. මෙය .උම්මුල් කිතාබ්, අස්සබඋල් මසානි, සූරතුල් හම්ද්, සූරතුස් සලාත්, අල්-වාකියා. යන ගරු නම්වලින් ද අමතනු ලබයි. මෙහි මහිමය දක්වන නබි වදන් බොහෝමයක් ඇත. අබූ සර්ද් අල්-මුඅල්ලා (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පවසයි. අල්ලාහ්ගේ දූතයාණෝ මට මෙසේ කීහ. මම අල්-කුර්ආනයේ ඉතා වැදගත් සූරාවක් නුඹට උගන්වම්'යි පවසා මගේ අතින් අල්ලා ගත්හ. එතුමාණෝ මස්ජිදයෙන් පිටතට යාමට සූදානම් වූ විට මම එතුමා දෙස බලා අල්-කුර්ආනයේ වැදගත් සූරාවක් මට කියාදෙන බව ඔබතුමා කීවා නොවේදැ? යි ඇසුවෙමි. එවිට එතුමාණෝ ඕව් අල්-හම්දු සූරාහ්ව එයය. එය නැවත නැවත කියවෙන වාක්‍ය හතය. තවද මට පහළ වූ ඉතා මහගු කුර්ආනයයි.

(1) අල්ලාහ්ගේ ශුද්ධ නාමයෙන් ආරම්භ කරමි (ඔහු) අසීමිත දයාවන්තයාය. අපරිමිත ආදර වන්තයාය. (මෙම වැකිය ආරම්භයේ ලිවී ඇති පරිච්ඡේදවල මුල්ම වචනය යැයි අදහස් කළ හැකි ද? නැත්නම් ෆාතිහාවේ පමණක් ආරම්භ වචනය ද? එසේත් නැත්නම් ඕනෑම පරිච්ඡේදයක මුල් වැකිය ලෙස අදහස් කළ නොහැකි ද? යන්නෙහි විද්වතුන් මතභේදයක් ඇතිකරගෙන සිටිති. එනමුත් නම්ල් සූරතයෙහි සඳහන් මෙය වැකියක් යන මතයේ සියලු දෙනාම එකගවෙති. අල්ලාහ් යන නාමය ඔහුට පමණක් විශේෂිත නාමයකි. වෙන කිසිවෙකුට මෙය භාවිත නොකළ යුතුය.)

(2) ලෝකවාසීන්ගේ රක්ෂකයාණන් වූ අල්ලාහ්ටමය සියලු ප්‍රශංසා. (ප්‍රශංසාව යනු යහපත් දේවල් පිළිබඳව කටින් උපහාර දැක්වීමකි. එය දිවෙන් -වචනයෙන්- පමණක් කෙරෙයි. කෘතවේදී බව -ස්තුතිය යනු- සෑම අවයවයකින්ම කෙරෙන්නකි.)

(3) (ඔහු) අසීමිත දයාවන්තයාය. අපරිමිත ආදරවන්තයාය.

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ ﴿١﴾
الْحَمْدُ لِلَّهِ رَبِّ الْعَالَمِينَ ﴿٢﴾ الرَّحْمَٰنِ
الرَّحِيمِ ﴿٣﴾ مَالِكِ يَوْمِ الدِّينِ ﴿٤﴾ إِيَّاكَ نَعْبُدُ وَإِيَّاكَ
نَسْتَعِينُ ﴿٥﴾ اهْدِنَا الصِّرَاطَ الْمُسْتَقِيمَ ﴿٦﴾
صِرَاطَ الَّذِينَ أَنْعَمْتَ عَلَيْهِمْ غَيْرِ الْمَغْضُوبِ
عَلَيْهِمْ وَلَا الضَّالِّينَ ﴿٧﴾

(4) ඔහු විනිශ්චය දිනයේ අධිපතියාය. (කතාදා - රහ්මතුල්ලාහි අලෙයිහි- තුමා මෙසේ කියයි. මෙය අල්ලාහ් විසින් ඔහුගේ ගැත්තන්ට ඔවුන්ගේ ක්‍රියාවන්ට විපාක ප්‍රදානය කරන දිනයයි.)

(5) අපි නුඹටම නැමදුම් ඉටු කරමු. තවද නුඹෙන්ම උදව් පතමු. (නැමදුම යනු සම්පූර්ණයෙන්ම යටහත්ව අවනතවීමයි. මෙම වාක්‍යයේ අර්ථය - නුඹ හැර වෙන කිසිවෙකුට නැමදුම් නොකරමු. නුඹ හැර වෙන කිසිවෙකුගෙන් උදව් නොපතන්නෙමු යන්නයි.)

(6) අපට සෘජුමග පෙන්වනු මැනවා (හිදායත් යන වචනයේ අර්ථය සෘජුමග පෙන්වීම හෝ වතාවත්වලට අනුග්‍රහය දැක්වීම යන්නයි. සෘජු මගෙහි සිටින කෙනෙක් අල්ලාහ්ගෙන් සෘජුමග ඉල්ලීමේ අදහස සෘජුමග තවත් අධිකව ලබා දෙන ලෙස කරන ඉල්ලීමයි. මෙම වැකියේ සෘජු මග යනු ඉස්ලාම් නමැති සෘජු මගයි)

(7) නුඹ කවරෙකුට දයාව පහළ කළෙහි ද ඔවුන්ගේ මාර්ගය පෙන්වනු මැනවා (මොවුහු කවරහුද යත් සූරා අන්-නිසා 4 වැනි පරිච්ඡේදයේ 60 හා 70 යන වැකිවල අල්ලාහ් පැහැදිලි කරයි. ඔවුහු නබිවරු ද සත්‍යවාදීහුද සැදැහැවතුන් වන අල්ලාහ්ගේ යහපත් ගැත්තෝද වන්නෝය.) නුඹේ ශාපයට ගොදුරු වූවන්ගේ ද මංමුළා වූවන්ගේ ද මාර්ගය නොවේ. (ශාපයට ගොදුරු වූවන් යුදෙව්වරුන්ය. මන්ද ඔවුහු දැන දැනත් සෘජු මග අනුගමනය නොකළහ. මංමුළා වූවෝ ක්‍රිස්තියානින්ය. ඔවුහු ජේසු -ඊසා අලෙයිහිස් සලාම්- තුමා පිළිබඳව නොදැනුවත් කම නිසා මංමුළා වූහ.)

# අල්-මුජාදලාහ්

1 (නබිවරයාණනි) තම සැමියා ගැන ඔබ සමග තර්ක කර (තම කාරණය) අල්ලාහ් වෙත පැමිණිලි කළ ගැහැනියගේ වදන්වලට අල්ලාහ් සවන් දුන්නේය. තවද ඔබ දෙදෙනාගේ වාද විවාදයට ද අල්ලාහ් සවන් දුන්නේය. නියතවශයෙන්ම අල්ලාහ් සියලු දෑ අසන්නෙකු හා බලන්නෙකුව සිටී. (ආයිෂා - රළියල්ලාහු අන්හා- තුමිය මෙසේ දන්වයි. එනම් සියල්ලට සවන් දිය හැකි අල්ලාහ් උත්තරීතරය. හව්ලා බින්ත් සෑලබා නැමැති කාන්තාව නබි තුමා සමග කථා කරන විට මම සවන් දුනිමි. එයින් සමහර කරුණු මට ඇසුනේ නැත. එම කාන්තාව තම සැමියා පිළිබඳව නබිතුමන්ට පැමිණිලි කරමින් සිටියාය. ඇය මෙසේ කීවාය. අල්ලාහ්ගේ දූතයාණනි, මගේ සැමියා මගේ යෞවනය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගත්තේය. මගේ උදරය ඔහුට විවෘත කර දුනිමි. මා වියපත් වී දරුවන් ලැබීමේ හැකියාව මගෙන් ඉවත් වූ විට, නුඹ මට මගේ මව හා සමානයි යැයි කියා ඈත් විය. තවදුරටත් ඇය ප්‍රකාශ කරමින් දෙවියනි, මගේ සැමියාගේ කාරණය නුඹට පැමිණිලි කරමි. මෙසේ ඇය පැමිණිලි කරමින් සිටිය දී ජිබ්රීල්(අලෛයිහිස් සලාම්) තුමා මෙම වැකි රැගෙන පහළ විය. ඔහු මදීනා වැසියෙකු වන අවුස් බින් සාමිත් නැමැත්තාය.)

2 නුඹලාගෙන් සමහරෙක් තම භාර්යාවන් දෙස බලා ඔබ මට මගේ මව වගේ යැයි පවසන්නෙහුය. එසේ ඔවුන් ප්‍රකාශ කිරීම නිසා මව්වරුන් වන්නේ නැත. ඔවුන්ව ප්‍රසූත කළ අය ඔවුන්ගේ මව්වරු වන්නෝය. නියතවශයෙන්ම අල්ලාහ් අධිකව ක්ෂමා කරන්නෙකි.

3 මෙසේ තම භාර්යාවන් තම මව්වරුන්ට සමාන කර තම ප්‍රකාශය වෙනස් කර ඔවුන් සමග සංසර්ගයේ යෙදෙන්නවුන් එසේ සංසර්ගයේ යෙදීමට පෙර කළ වරදට ප්‍රතිකර්මයක් වශයෙන් වහලෙකු නිදහස් කළ යුතුය. එසේ කරන ලෙස නුඹලා දෙවියන්ගෙන් උපදෙස් දෙනු ලබන්නෙහුය.

4 තවද (නිදහස් කිරීම සඳහා වහලෙකු හෝ එසේ මුදවාලීමට අවශ්‍ය පහසුකමක් හෝ) නොමැති අයෙකු එම කාන්තාවන් ඇසුරු කරන්නා (සංසර්ගයට) පෙර අඛණ්ඩව මාස දෙකක් සව්ම් (උපවාසය) රැකිය යුතුය. (අනුමත හේතුවකින් තොරව අතරමග උපවාසය අතපසු වුවහොත් නැවත මුල සිට මාස දෙකක්ම උපවාසයේ යෙදිය යුතුය) එයටත් ශක්තියක් නොමැති කෙනෙකු හැට දෙනෙකුට ආහාර සැපයිය යුතුය. (හැම කෙනෙකුටම කි. 1 ග්‍රෑම් 250 ක ධාන්‍ය හෝ පිසූ ආහාර හෝ දිය යුතුය.) නුඹලා අල්ලාහ්ව හා ඔහුගේ දූතයාණන්ව (පරිපූර්ණව) විශ්වාස කිරීම සඳහා (මෙසේ අපි තීන්දු කළෙමු.) මෙය අල්ලාහ් නියම කළ සීමාවන්ය. (එහෙයින් ඔහුගේ සීමාවන් ඉක්මවා ගොස් නුඹලාගේ භාර්යාවන් නුඹලාගේ මව්වරුන් බවට පත් නොකරගනු.) තවද (අල්ලාහ්ගේ සීමාවන් අබිබවා යන) ප්‍රතික්ෂේප කරන්නන්ට වේදනාව ගෙන දෙන දඬුවම් ඇත. (එය නිරයයි.)

5 නියතවශයෙන්ම අල්ලාහ්ට ද ඔහුගේ දූතයාණන්ට ද විරුද්ධ වන්නන්, ඔවුන්ට කලින් සිටියවුන් නින්දාවට ලක්වූවාසේ නින්දාවට පත් වෙති. තවද දෙවියන්ව ප්‍රතික්ෂේප කරන්නන්ට වේදනාකාරී දඬුවම් ද ඇත.

6 ඔවුන් සියළු දෙනාව අල්ලාහ් නැගිට්ටුවන (විනිශ්චය) දිනයේ ඔවුන් කළ (පාපිෂ්ඨ හා නරක) ක්‍රියාවන් ඔවුන්ට දන්වා සිටියි. අල්ලාහ් ඒවා සුරක්ෂිතව තබා ගත්තේය. ඔවුහු ඒවා අමතක කළෝය. ඔවුන්ගේ ලේඛනයේ ඒවා පදිංචිවී ඇති බව ඔවුහු දකින්නෝය. අල්ලාහ් සියල්ල දන්නේය.

7 නියතවශයෙන්ම අල්ලාහ් අහස්හි ද පොළොවෙහි ද ඇති දෑ හොඳින් දනී. (ඔහුට කිසිවක් නො සැඟවේ) යන්න ඔබ නොදන්නේ ද? තිදෙනෙක් රහස් කථා කරන විට ඔහු සිව්වැන්නා ලෙස ඉඳ (එය දැනගනී.) තවද ඔවුන් පස්දෙනෙකු රහස් කථා කරන විට ඔහු හයවැන්නා ලෙස ඉඳ (දැනගනී.) ඊට අඩු සංඛ්‍යාවක් හෝ වැඩි

ترتيبها ٥٨ — سُورَةُ المُجَادلَة — آياتها ٢٢

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

قَدۡ سَمِعَ ٱللَّهُ قَوۡلَ ٱلَّتِي تُجَٰدِلُكَ فِي زَوۡجِهَا وَتَشۡتَكِيٓ إِلَى ٱللَّهِ
وَٱللَّهُ يَسۡمَعُ تَحَاوُرَكُمَآۚ إِنَّ ٱللَّهَ سَمِيعُۢ بَصِيرٌ ١ ٱلَّذِينَ يُظَٰهِرُونَ
مِنكُم مِّن نِّسَآئِهِم مَّا هُنَّ أُمَّهَٰتِهِمۡۖ إِنۡ أُمَّهَٰتُهُمۡ إِلَّا ٱلَّٰٓـِٔي
وَلَدۡنَهُمۡۚ وَإِنَّهُمۡ لَيَقُولُونَ مُنكَرٗا مِّنَ ٱلۡقَوۡلِ وَزُورٗاۚ وَإِنَّ
ٱللَّهَ لَعَفُوٌّ غَفُورٞ ٢ وَٱلَّذِينَ يُظَٰهِرُونَ مِن نِّسَآئِهِمۡ ثُمَّ يَعُودُونَ
لِمَا قَالُواْ فَتَحۡرِيرُ رَقَبَةٖ مِّن قَبۡلِ أَن يَتَمَآسَّاۚ ذَٰلِكُمۡ تُوعَظُونَ
بِهِۦۚ وَٱللَّهُ بِمَا تَعۡمَلُونَ خَبِيرٞ ٣ فَمَن لَّمۡ يَجِدۡ فَصِيَامُ شَهۡرَيۡنِ
مُتَتَابِعَيۡنِ مِن قَبۡلِ أَن يَتَمَآسَّاۖ فَمَن لَّمۡ يَسۡتَطِعۡ فَإِطۡعَامُ سِتِّينَ
مِسۡكِينٗاۚ ذَٰلِكَ لِتُؤۡمِنُواْ بِٱللَّهِ وَرَسُولِهِۦۚ وَتِلۡكَ حُدُودُ ٱللَّهِۗ
وَلِلۡكَٰفِرِينَ عَذَابٌ أَلِيمٌ ٤ إِنَّ ٱلَّذِينَ يُحَآدُّونَ ٱللَّهَ وَرَسُولَهُۥ كُبِتُواْ
كَمَا كُبِتَ ٱلَّذِينَ مِن قَبۡلِهِمۡۚ وَقَدۡ أَنزَلۡنَآ ءَايَٰتِۭ بَيِّنَٰتٖۚ وَلِلۡكَٰفِرِينَ
عَذَابٞ مُّهِينٞ ٥ يَوۡمَ يَبۡعَثُهُمُ ٱللَّهُ جَمِيعٗا فَيُنَبِّئُهُم بِمَا
عَمِلُوٓاْۚ أَحۡصَىٰهُ ٱللَّهُ وَنَسُوهُۚ وَٱللَّهُ عَلَىٰ كُلِّ شَيۡءٖ شَهِيدٌ ٦

أَلَمْ تَرَ أَنَّ اللَّهَ يَعْلَمُ مَا فِي السَّمَاوَاتِ وَمَا فِي الْأَرْضِ مَا يَكُونُ
مِن نَّجْوَىٰ ثَلَاثَةٍ إِلَّا هُوَ رَابِعُهُمْ وَلَا خَمْسَةٍ إِلَّا هُوَ سَادِسُهُمْ
وَلَا أَدْنَىٰ مِن ذَٰلِكَ وَلَا أَكْثَرَ إِلَّا هُوَ مَعَهُمْ أَيْنَ مَا كَانُوا ثُمَّ يُنَبِّئُهُم
بِمَا عَمِلُوا يَوْمَ الْقِيَامَةِ إِنَّ اللَّهَ بِكُلِّ شَيْءٍ عَلِيمٌ ﴿٧﴾ أَلَمْ تَرَ إِلَى الَّذِينَ
نُهُوا عَنِ النَّجْوَىٰ ثُمَّ يَعُودُونَ لِمَا نُهُوا عَنْهُ وَيَتَنَاجَوْنَ بِالْإِثْمِ
وَالْعُدْوَانِ وَمَعْصِيَتِ الرَّسُولِ وَإِذَا جَاءُوكَ حَيَّوْكَ بِمَا لَمْ يُحَيِّكَ
بِهِ اللَّهُ وَيَقُولُونَ فِي أَنفُسِهِمْ لَوْلَا يُعَذِّبُنَا اللَّهُ بِمَا نَقُولُ حَسْبُهُمْ
جَهَنَّمُ يَصْلَوْنَهَا فَبِئْسَ الْمَصِيرُ ﴿٨﴾ يَا أَيُّهَا الَّذِينَ آمَنُوا إِذَا
تَنَاجَيْتُمْ فَلَا تَتَنَاجَوْا بِالْإِثْمِ وَالْعُدْوَانِ وَمَعْصِيَتِ الرَّسُولِ وَتَنَاجَوْا
بِالْبِرِّ وَالتَّقْوَىٰ وَاتَّقُوا اللَّهَ الَّذِي إِلَيْهِ تُحْشَرُونَ ﴿٩﴾ إِنَّمَا النَّجْوَىٰ
مِنَ الشَّيْطَانِ لِيَحْزُنَ الَّذِينَ آمَنُوا وَلَيْسَ بِضَارِّهِمْ شَيْئًا
إِلَّا بِإِذْنِ اللَّهِ وَعَلَى اللَّهِ فَلْيَتَوَكَّلِ الْمُؤْمِنُونَ ﴿١٠﴾ يَا أَيُّهَا الَّذِينَ
آمَنُوا إِذَا قِيلَ لَكُمْ تَفَسَّحُوا فِي الْمَجَالِسِ فَافْسَحُوا يَفْسَحِ
اللَّهُ لَكُمْ وَإِذَا قِيلَ انشُزُوا فَانشُزُوا يَرْفَعِ اللَّهُ الَّذِينَ آمَنُوا
مِنكُمْ وَالَّذِينَ أُوتُوا الْعِلْمَ دَرَجَاتٍ وَاللَّهُ بِمَا تَعْمَلُونَ خَبِيرٌ ﴿١١﴾

සංඛ්‍යාවක් හෝ කථා කරන විට ඔහු ද ඔවුන් සමග ඉඳ (දැනගනී.) ඔවුන් කොහි සිටියත් කමක් නැත. පසුව ඔවුන් (රහසේ කථා කළ හෝ) කළ දේවල් ඔවුන්ට දන්වයි. නියතවශයෙන්ම අල්ලාහ් සියල්ල දන්නාය.

(8) ඔවුන්ට රහස් කථා කිරීම තහනම් කර තිබියදීත් ඔවුහු රහස කරා එළඹෙන්නෝය. ඔවුන් ගැන නුඹලා සැලකිලිමත් වූයේ නැද්ද? (යුදෙව්වන් පසු කරමින් විශ්වාසවන්තයින් යන විට යුදෙව්වෝ ඔවුන් අතරේ රහස් කථා කරගනිති. එය ඔවුන්ට තහනම් කළ ද ඔවුන් එයින් වැළකුනේ නැත. එහෙයින් මෙම දේව වාක්‍යය අල්ලාහ් පහළ කළේයේ.) ඔවුහු පාපය ද සීමාව ඉක්මවීම ගැන ද දේව දූතයාණන්ට පිටුපෑම ගැන ද රහස් කථා කරති. (නබිවරයාණනි) ඔවුහු ඔබ ළඟට පැමිණියහොත් අල්ලාහ් ශාන්තිය පිණිස නොපැවසූ වදන්වලින් ශාන්තිය (ආචාර කිරීම) ප්‍රකාශ කරති. (යුදෙව්වන් නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමන් වෙතට පැමිණි .අස්සාමු අලෙයිකුම්. යැයි කියති. පිටතින් ශාන්ති වදන් කියන්නාක් මෙන් පෙන්වා ගනිති. සත්‍ය වශයෙන්ම එයින් නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට මරණය අත්විය යුතු යැයි බලාපොරොත්තු වෙති. මන්ද .සාම්. යන වදන අරාබි බසට අනුව මරණය යන තේරුම දෙයි. නබි තුමාණෝ .නුඹලාට එය අත්වුනාවයිම යැයි පිළිතුරු දෙති.) ඔවුහු ඔවුන් අතරේ කථා කරගනිති. (මුහම්මද් අල්ලාහ්ගේ දූතයෙකු නම්) අප ප්‍රකාශ කරන වචන නිසා අපට අල්ලාහ් දඬුවම් නොකළ යුතු ද? නිරයම ඔවුන්ට ප්‍රමාණවත්ය. එහි ඔවුහු ප්‍රවේශ වන්නෝය. එය යන තැන්වලින් ඉතා නරකය.

(9) දේව විශ්වාසවන්තයිනි, නුඹලා රහස් කථා කරන්නේ නම් (යුදෙව්වන් හා කුහකයින් කථා කරන්නා සේ) පාපයන් ගැන ද සීමාවන් ඉක්මවා යාම ගැන ද දේව දූතයාණන්ට පිටුපෑම ගැන ද රහස් කථා නොකරනු. (ඒ වෙනුවට) නුඹලා යහපත් දේවල් ගැන ද බියබැතිකම ඇතිකරවන දේවල් ගැන ද රහස් කථා කරහු. (හෙට විනිශ්චය දිනයේ) නුඹලාව කවරෙකු වෙතට රැස්කෙරෙන්නේ ද එම අල්ලාහ්ටම බියවහු.

(10) (මෙසේ පාප ක්‍රියා ගැන) රහස් කථා කිරීම ෂෙයිතාන්ගේ ක්‍රියාවකි. ඔහු විශ්වාසවන්තයින් ශෝකයට පත් කරවීම සඳහා (මෙසේ කීමට සලස්වයි) අල්ලාහ්ගේ මනාපය නොමැතිව ඔහු විසින් ඔවුන්ට කිසිම හානියක් කළ නොහැක. දේව විශ්වාසවන්තයෝ දෙවියන් කෙරෙහිම (තමන්ගේ සියලුම කාර්යයන්) භාර කරති. (ඔවුහු තම සෑම කරුණක්ම) අල්ලාහ් වෙතම භාර කරති. ඔහුගෙන්ම ෂෙයිතාන්ගෙන් ආරක්ෂාව පතති. (ප්‍රතික්ෂේප කරන්නන්ගේ මෙම රහස් ගැන සැලකිලිමත් නොවෙති. නබි-සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්-තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ. .නුඹලා තිදෙනෙක් සිටින අවස්ථාවන්හිදී දෙදෙනෙක් රහස් කථා නොකරහු. එය තුන්වැන්නට සිත් වේදනාවක් ගෙන දෙන්නකි.. -බුහාරි හා මුස්ලිම්)

(11) දේව විශ්වාසවන්තයිනි, සභාවන්හි (අනෙක් අයට) ඉඩ දී වාඩිවහුයි නුඹලාට කියනු ලැබුවෙහුනම් නුඹලා ඉඩ දී වාඩිවෙහු. (කතාදා හා මුජාහිද් යන විද්වතුන් දෙපොළ මෙසේ පවසති. නබි-සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමාගේ මිතුරන් නබි තුමාගේ සභාවලදී තරගකාරීව ළංවී වාඩිවෙති. එහෙයින් ඔවුහු ඉඩදී වාඩිවෙන මෙන් විධානය කරනු ලැබූහ. මෙය මුස්ලිම්වරුන් රැස්වෙන සියලුම සභාවන්ට පොදුය. කවරෙකු පළමුවෙන් පැමිණෙන්නේ ද එම ස්ථානය ඔහුටම අයිති වන්නේය. එහෙත් ඔහු අනෙක් අයට ඉඩ දී වාඩි වෙයි. නබි-සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්-තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ. කෙනෙක් තවත් කෙනෙකුව ඔහුගේ තැනින් නො නැගිටවන්න. එහෙත් නුඹලා ඉඩ දී වාඩිවෙහු.) තවද (ආගමේ මහිමයත් ගෞරවයත් ඇති අය වාඩිවීම සඳහා) නැගිටින්න.යි ඔබලාට පවසනු ලැබුවෙහි නම් නුඹලා නැගිට සිටිහු. නුඹලා අතර විශ්වාස කර දැනුමත් ලබාදුන් අයගේ තත්ත්වයන් (මෙලොව හා පරලොවදී) අල්ලාහ් උසස් කරන්නේය. අල්ලාහ් ඔබ කරන සියලු දේ දන්නාය.

يَـٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوٓاْ إِذَا نَـٰجَيۡتُمُ ٱلرَّسُولَ فَقَدِّمُواْ بَيۡنَ يَدَيۡ نَجۡوَىٰكُمۡ
صَدَقَةٗۚ ذَٰلِكَ خَيۡرٞ لَّكُمۡ وَأَطۡهَرُۚ فَإِن لَّمۡ تَجِدُواْ فَإِنَّ ٱللَّهَ غَفُورٞ رَّحِيمٌ
١٢ ءَأَشۡفَقۡتُمۡ أَن تُقَدِّمُواْ بَيۡنَ يَدَيۡ نَجۡوَىٰكُمۡ صَدَقَٰتٖۚ فَإِذۡ لَمۡ تَفۡعَلُواْ
وَتَابَ ٱللَّهُ عَلَيۡكُمۡ فَأَقِيمُواْ ٱلصَّلَوٰةَ وَءَاتُواْ ٱلزَّكَوٰةَ وَأَطِيعُواْ ٱللَّهَ
وَرَسُولَهُۥۚ وَٱللَّهُ خَبِيرُۢ بِمَا تَعۡمَلُونَ ١٣ ۞ أَلَمۡ تَرَ إِلَى ٱلَّذِينَ تَوَلَّوۡاْ قَوۡمًا
غَضِبَ ٱللَّهُ عَلَيۡهِم مَّا هُم مِّنكُمۡ وَلَا مِنۡهُمۡ وَيَحۡلِفُونَ عَلَى ٱلۡكَذِبِ
وَهُمۡ يَعۡلَمُونَ ١٤ أَعَدَّ ٱللَّهُ لَهُمۡ عَذَابٗا شَدِيدًاۖ إِنَّهُمۡ سَآءَ مَا كَانُواْ
يَعۡمَلُونَ ١٥ ٱتَّخَذُوٓاْ أَيۡمَٰنَهُمۡ جُنَّةٗ فَصَدُّواْ عَن سَبِيلِ ٱللَّهِ فَلَهُمۡ
عَذَابٞ مُّهِينٞ ١٦ لَّن تُغۡنِيَ عَنۡهُمۡ أَمۡوَٰلُهُمۡ وَلَآ أَوۡلَٰدُهُم مِّنَ ٱللَّهِ
شَيۡـًٔاۚ أُوْلَـٰٓئِكَ أَصۡحَٰبُ ٱلنَّارِۖ هُمۡ فِيهَا خَٰلِدُونَ ١٧ يَوۡمَ يَبۡعَثُهُمُ
ٱللَّهُ جَمِيعٗا فَيَحۡلِفُونَ لَهُۥ كَمَا يَحۡلِفُونَ لَكُمۡ وَيَحۡسَبُونَ أَنَّهُمۡ عَلَىٰ شَيۡءٍۚ أَلَآ
إِنَّهُمۡ هُمُ ٱلۡكَٰذِبُونَ ١٨ ٱسۡتَحۡوَذَ عَلَيۡهِمُ ٱلشَّيۡطَٰنُ فَأَنسَىٰهُمۡ ذِكۡرَ
ٱللَّهِۚ أُوْلَـٰٓئِكَ حِزۡبُ ٱلشَّيۡطَٰنِۚ أَلَآ إِنَّ حِزۡبَ ٱلشَّيۡطَٰنِ هُمُ ٱلۡخَٰسِرُونَ
١٩ إِنَّ ٱلَّذِينَ يُحَآدُّونَ ٱللَّهَ وَرَسُولَهُۥٓ أُوْلَـٰٓئِكَ فِي ٱلۡأَذَلِّينَ ٢٠
كَتَبَ ٱللَّهُ لَأَغۡلِبَنَّ أَنَا۠ وَرُسُلِيٓۚ إِنَّ ٱللَّهَ قَوِيٌّ عَزِيزٞ ٢١

12 විශ්වාසවන්තයිනි, නුඹලා නබිවරයා සමග රහස් කථා කිරීමට යන්නෙහු නම් නුඹලා එසේ කිරීමට පෙර දන් දෙහු. නුඹලා එසේ කිරීම නුඹලාට වැදගත් වූ ද පාරිශුද්ධ වූ ද ක්‍රියාවකි. (මෙම වැකිය අල්ලාහ් පහළ කළ වහාම මං මුළාවූ අය නබි-සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තුමන් සමග රහස් කථා කිරීම නතර කළහ. මන්ද ඔවුහු දන් නොදෙන්නෝය. දන්දීම පහසුකම් නොමැති විශ්වාසවන්තයින් ද නබිතුමන් සමග රහස් කථා කිරීමෙන් වැළකුනෝය. එය ඔවුන්ට මහත් දුෂ්කරතාවක් විය. ඊළඟ වාක්‍යයෙන් අල්ලාහ් ඔවුන්ගේ දුෂ්කරතාව පහසු කළේය. එනම්) ඔබලා (දානය) නොලැබුවෙහුනම් අල්ලාහ් අධිකව ක්‍ෂමා කරන්නෙකු හා දයාන්විතයාද වන්නේය. (ඉහත කී දානය නොදීම වරදක් නොවේ.)

13 නුඹලා නුඹලාගේ රහස් කතිකාවට පෙර දන් දීමෙන් (සාගතයට) බියවන්නෙහු ද නුඹලා එසේ නොකර අල්ලාහ් නුඹලාව ක්‍ෂමා කළ තත්ත්වයෙන් සලාතය ස්ථාවර කරහු. තවද සකාත් (බද්ද ද) දෙහු. අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට අවනත වවු. නුඹලා කරන දෑ අල්ලාහ් දනී. (අල්ලාහ් ඒවාට යහවිපාක ප්‍රදානය කරයි. මුකාතිල් -රහ්මතුල්ලාහි අලෛයිහි- තුමා මෙසේ ප්‍රකාශ කරයි. මෙම නීතිය හඳුන්වා දී දින දහයකින් වෙනස් කෙරිණි.)

14 (නබිවරයාණනි) නුඹ අල්ලාහ්ගේ ශාපයට ගොදුරුවූවන් (යුදෙව්වන්) සමග මිත්‍රකම් පවත්වන පිරිස (කුහකයින්ව) නොදුටුවෙහි ද? ඔවුහු (කුහකයෝ) නුඹට පක්‍ෂපාති අය ද නොවෙති. ඔවුන්ට පාක්‍ෂපාති අයද නොවෙති. ඔවුහු (කුහකයෝ) දැනගෙනම (ඔවුහු මුස්ලිම් කියා හෝ යුදෙව්වන් සමග සම්බන්ධකම් නොමැති බවට හෝ) බොරුවට දිවුරති.

15 (ඔවුහු යුදෙව්වන් සමග මිත්‍ර වූ නිසාද බොරුවට දිවුරූ නිසා ද) බරපතලවූ දඬුවමක් අල්ලාහ් ඔවුන් සඳහා සූදානම් කර ඇත. නියතවශයෙන්ම ඔවුන් කරන ක්‍රියාව ඉතා නරකය.

16 (දෙවියන් ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙන තමන් ඝාතනය කරනු ලැබීමෙන් තමන්ව) ආරක්‍ෂා කරන පලිහක්ව ඔවුන්ගේ දිවුරුම ඔවුහු භාවිත කළහ. (ඝාතනය කරනු ලැබීමට බියෙන් ඔවුන් කටින් විශ්වාස කළහ. ඔවුන්ගේ හදවත් විශ්වාස කළේ නැත.) ඔවුහු අල්ලාහ්ගේ මාර්ගයෙන් (ජනතාව) වැළැක්වූහ. එහෙයින් ඔවුන්ට නින්දාව ගෙන දෙන දඬුවම් ඇත.

17 ඔවුන්ගේ වස්තූන් ද දරුවන් ද අල්ලාහ්ගේ (දඬුවම් නවතාලීමට) ඔවුනට කිසිදු ප්‍රයෝජනයක් නොවේ. ඔවුන් නිරයේ වැසියන් ය. ඔවුහු (එහි) සදාකල් සිටින්නෝය.

18 අල්ලාහ් ඔවුන් සියලු දෙනා නැගිටුවන (විනිශ්චය) දිනයේ නුඹලා ඉදිරියේ ඔවුහු දිවුරුවා සේ අල්ලාහ්ට (ඉදිරියේ ද) ඔවුහු දිවුරති. (අල්ලාහ් මත දිවුරා කියමු. අප එසේ කළේ නැතැයි දිවුරති.) ඔවුහු (එසේ බොරුවට දිවුරීම මගින් තමන් ප්‍රයෝජනවත්) කාර්යයක යෙදෙන බව අදහස් කරති. දැන්ගහු. ඔවුන් සියලු දෙනා බොරුකාරයින්ය.

19 ෂෙයිතාන් ඔවුන්ව ආක්‍රමණය කර අල්ලාහ් සිහි කිරීම අමතක කෙරෙව්වේය. (එම හේතුව නිසා ඔවුහු අල්ලාහ්ගේ අණ පිළිපැදීමත් ඔහුට අවනතවීමත් අත් හළහ.) ඔවුහු ෂෙයිතාන්ට අයත් කණ්ඩායමකි. දැනගහු ෂෙයිතාන්ගේ කණ්ඩායම පාඩු ලැබුවන්ය. (මන්ද ස්වර්ගය හා සෘජුමග යනාදිය වෙනුවට ඔවුහු නිරය හා මංමුළාව තෝරාගත්හ. තවද අල්ලාහ් මත ද ඔහුගේ නබිවරයා මත ද බොරු ප්‍රචාරය කර බොරු දිවුරිල්ල ද කළහ. ඔවුහු මෙලොවෙහි ද පරලොවෙහි ද පාඩු ලබන්නෙහුය.)

20 නියත වශයෙන්ම අල්ලාහ්ට ද ඔහුගේ දූතයාණන්ට ද විරුද්ධවන්නන් (මෙලොවදී ද පරලොව දී ද අල්ලාහ් විසින්) නින්දා කරනු ලබන්නන් සමග සිටින්නේය.

21 මම ද මගේ දූතයින් ද ස්ථිර වශයෙන්ම අබිබවා යන්නෙමුයි අල්ලාහ් (තම තීන්දුවේ දී) තීන්දු කළේය. නියතවශයෙන්ම අල්ලාහ් ශක්ති සම්පන්න වූ ද අබිබවා යන්නෙකු ද වේ.

لَا تَجِدُ قَوْمًا يُؤْمِنُونَ بِٱللَّهِ وَٱلْيَوْمِ ٱلْـَٔاخِرِ يُوَآدُّونَ مَنْ
حَآدَّ ٱللَّهَ وَرَسُولَهُۥ وَلَوْ كَانُوٓا۟ ءَابَآءَهُمْ أَوْ أَبْنَآءَهُمْ
أَوْ إِخْوَٰنَهُمْ أَوْ عَشِيرَتَهُمْ ۚ أُو۟لَٰٓئِكَ كَتَبَ فِى قُلُوبِهِمُ
ٱلْإِيمَٰنَ وَأَيَّدَهُم بِرُوحٍ مِّنْهُ ۖ وَيُدْخِلُهُمْ جَنَّٰتٍ تَجْرِى
مِن تَحْتِهَا ٱلْأَنْهَٰرُ خَٰلِدِينَ فِيهَا ۚ رَضِىَ ٱللَّهُ عَنْهُمْ وَرَضُوا۟
عَنْهُ ۚ أُو۟لَٰٓئِكَ حِزْبُ ٱللَّهِ ۚ أَلَآ إِنَّ حِزْبَ ٱللَّهِ هُمُ ٱلْمُفْلِحُونَ ٢٢

ترتيبها ٥٩ — سُورَةُ الحَشْرِ — آياتها ٢٤

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

سَبَّحَ لِلَّهِ مَا فِى ٱلسَّمَٰوَٰتِ وَمَا فِى ٱلْأَرْضِ ۖ وَهُوَ ٱلْعَزِيزُ ٱلْحَكِيمُ
١ هُوَ ٱلَّذِىٓ أَخْرَجَ ٱلَّذِينَ كَفَرُوا۟ مِنْ أَهْلِ ٱلْكِتَٰبِ مِن دِيَٰرِهِمْ
لِأَوَّلِ ٱلْحَشْرِ ۚ مَا ظَنَنتُمْ أَن يَخْرُجُوا۟ ۖ وَظَنُّوٓا۟ أَنَّهُم مَّانِعَتُهُمْ
حُصُونُهُم مِّنَ ٱللَّهِ فَأَتَىٰهُمُ ٱللَّهُ مِنْ حَيْثُ لَمْ يَحْتَسِبُوا۟ ۖ وَقَذَفَ
فِى قُلُوبِهِمُ ٱلرُّعْبَ ۚ يُخْرِبُونَ بُيُوتَهُم بِأَيْدِيهِمْ وَأَيْدِى ٱلْمُؤْمِنِينَ
فَٱعْتَبِرُوا۟ يَٰٓأُو۟لِى ٱلْأَبْصَٰرِ ٢ وَلَوْلَآ أَن كَتَبَ ٱللَّهُ عَلَيْهِمُ
ٱلْجَلَآءَ لَعَذَّبَهُمْ فِى ٱلدُّنْيَا ۖ وَلَهُمْ فِى ٱلْـَٔاخِرَةِ عَذَابُ ٱلنَّارِ ٣

22 (නබිවරයාණනි,) නුඹ අල්ලාහ්වද අවසන් දිනය ද විශ්වාස කළ එක් කණ්ඩායමක් අල්ලාහ්ට ද ඔහුගේ දූතයාණන්ට ද විරුද්ධ වන්නන් සමග මිත්‍රවන්නන් ලෙස නුඹ නොදකින්නෙහිය. (එසේ අල්ලාහ්ට ද ඔහුගේ දූතයාට ද විරුද්ධ වන්නන්) ඔවුන්ගේ දෙගුරුන් හෝ දරුවන් හෝ සහෝදරයින් හෝ ඥාතීන් හෝ වුව ද කමක් නැත. (ඔවුන්ගේ විශ්වාසය ඔවුන් එසේ කිරීමෙන් ඔවුන්ව වළක්වයි. නෑදෑ හිතවත් කම් රැකීමට වඩා විශ්වාසය රැක ගැනීම ඉතා බලවත්ය. අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට විරුද්ධ වන්නන් සමග මිත්‍ර නොවන) මොවුන්ගේ හදවත් තුළ (අල්ලාහ්) විශ්වාසය තදින් (ඔබ්බවා තහවුරු) කළේය. තවද ඔහු තමන් වෙතින් එන උදව්ව මගින් ඔවුන්ව බලවත් කළේය. ඒවාට පහළින් ගලායන ඔයවල් සහිත ස්වර්ගයන් හි ඔවුන්ව ඇතුල් කරන්නේය. ඔවුහු ඒවායෙහි සදාකාලිකව වාසය කරති. (ඔවුන් කළ යහපත් ක්‍රියා ඔහු අනුමත කර මෙලොවෙහි හා පරලොවෙහි දී ඔහුගේ දයාවන් ඇති තරම් ලබා දී) ඔවුන් ව ඔහු පිළිගත්තේය. ඔවුන් ද (ඔවුන්ට ලැබුන යහවිපාක බලා) ඔහුව පිළිගත්තෝය. අල්ලාහ්ගේ කණ්ඩායම වන්නේ මොවුන් වැනි අයයි. දැනගනු නියතවශයෙන් ජය ලද්දෝ අල්ලාහ්ගේ කණ්ඩායමේ අයයි. (බද්ර් සටන පැවති දිනයේ අබූ උබයිදා -රළියල්ලාහු අන්හු- තුමා ඉදිරියට එතුමාගේ පියා ආවේය. එහෙත් අබූ උබෙයිදා මග හැර යමින් සිටියේය. කීප විටක්ම එසේ මුණ ගැසුන විට අබූ උබෙයිදා ප්‍රතික්ෂේප කරන්නෙකු වූ තම පියාව ඝාතනය කළේය. මෙම වැකිය පහළ වූයේ එම අවස්ථාවේ දීය. -මූලාශ්‍රය හාකිම්, තබ්රානි, ඉබ්නු අබී හාතිම්)

## අල්-හෂ්ර්

1 අහස්හි ද පොළොවෙහි ද ඇති දෑ අල්ලාහ්ව සුවිශුද්ධ කරන්නේය. ඔහු අබිබවා යා හැකි වූ දැනුම ඥානය ඇත්තා ද වෙයි.

2 ඔහුම පුස්තකය ඇත්තවුන්ගෙන් ප්‍රතික්ෂේප කළවුන්ව පළමුවන පිටුවහල් කිරීමේ දී ඔවුන්ගේ නිවෙස්වලින් පිටමං කළේය. (ඔවුහු බනූ නළීර් යන කොටස්වලට අයත්ය. ඉස්රාඊල් වරුන් අතරේ ඇති වූ ආරවුල්වල පසුබිමේ ඔවුහු මදීනාවට පැමිණි පදිංචි වූහ. මක්කමේ ආදේශ කරන්නවුන් සමග සහයෝගයෙන් කටයුතු නොකරන්නෙමුයි නබි(සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාට පොරොන්දු වී එය කඩ කළහ. එහෙයින් නබි(සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා ඔවුන් රටින් පිටුවහල් කිරීම පිළිගන්නාතෙක් ඔවුන්ව වැටලූහ. මෙය ඔවුන්ගේ පළමුවන පිටමං කිරීමයි. ඔවුන්ගේ දෙවන පිටමං වීම උමර් (රළියල්ලාහු අන්හු) තුමාගේ කාලයේ සිදුවිය) නුඹ ඔවුන් පිටමං වේවි යැයි සිතුවේ නැත. (මන්ද ඔවුන් සතුව බලකොටු ද වස්තු ද රට ඉඩ් වතු ද මිනිස් බලය ආදිය ද දක්නට තිබින) ඔවුහු ද ඔවුන්ගේ බලකොටු අල්ලාහ්ගෙන් (ඔහුගේ දඬුවමින්) ඔවුන්ව ආරක්ෂා කරාවි යැයි සිතා සිටියහ. ඔවුන් නොසිතූ පරිදි අල්ලාහ්ගේ දඬුවම ඔවුන් කරා පැමිණියේය. (මෙවැනි දඬුවමක් ඔවුන්ට ලැබේවි යැයි ඔවුන් කල්පනා කළේ නැත.) අල්ලාහ් ඔවුන්ගේ හදවත් තුළට මහත් වූ බියක් ජනිත කළේය. (නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණෝ මෙසේ කීහ. මාසයක දුර ප්‍රමාණයක් ගමන් කරන තරමට බිය මගින් උදව් කරනු ලැබුවෙමි.) ඔවුහු ඔවුන්ගේ නිවාස ඔවුන්ගේ අත්වලින් ද මූඃමින්වරුන්ගේ අත්වලින් ද විනාශ කළහ. (තමන් පිටමං වීම ස්ථිර වශයෙන් දැනගත් වහාම විශ්වාසවන්තයින්ට ඔවුන්ගේ නිවාසවල වාසය කරන්නට ඉඩ නොදීම සඳහා නිවාස ඇතුළතම ඉඳගෙන ඒවා විනාශ කරන්න පටන් ගත්හ. ඉමාම් සුහ්රි උර්වා බින් සුබෙයිර් යන අය මෙසේ සඳහන් කරති. ඔවුන්ගේ ඔටුවන්ට උසුලාගත හැකි ප්‍රමාණයට භාණ්ඩ ගෙන යාමට නබි(සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ අවසර දුන්හ. ඔවුහු නිවාස බිඳ දමා හොඳ තත්ත්වයකින් තිබුණ ලී කනු හා කුලුනු ද රැගෙන ගියහ. විශ්වාසවන්තයින් අනෙක් ඒවා විනාශ කළහ.) චින්තනය ඇත්තවුනි, නුඹලා පාඩම් ඉගෙනගනු.

ذَٰلِكَ بِأَنَّهُمْ شَاقُّوا۟ ٱللَّهَ وَرَسُولَهُۥ ۖ وَمَن يُشَآقِّ ٱللَّهَ فَإِنَّ ٱللَّهَ شَدِيدُ
ٱلْعِقَابِ ﴿٤﴾ مَا قَطَعْتُم مِّن لِّينَةٍ أَوْ تَرَكْتُمُوهَا قَآئِمَةً
عَلَىٰٓ أُصُولِهَا فَبِإِذْنِ ٱللَّهِ وَلِيُخْزِىَ ٱلْفَٰسِقِينَ ﴿٥﴾ وَمَآ أَفَآءَ ٱللَّهُ
عَلَىٰ رَسُولِهِۦ مِنْهُمْ فَمَآ أَوْجَفْتُمْ عَلَيْهِ مِنْ خَيْلٍ وَلَا رِكَابٍ
وَلَٰكِنَّ ٱللَّهَ يُسَلِّطُ رُسُلَهُۥ عَلَىٰ مَن يَشَآءُ ۚ وَٱللَّهُ عَلَىٰ كُلِّ شَىْءٍ
قَدِيرٌ ﴿٦﴾ مَّآ أَفَآءَ ٱللَّهُ عَلَىٰ رَسُولِهِۦ مِنْ أَهْلِ ٱلْقُرَىٰ فَلِلَّهِ وَلِلرَّسُولِ
وَلِذِى ٱلْقُرْبَىٰ وَٱلْيَتَٰمَىٰ وَٱلْمَسَٰكِينِ وَٱبْنِ ٱلسَّبِيلِ كَىْ لَا يَكُونَ
دُولَةًۢ بَيْنَ ٱلْأَغْنِيَآءِ مِنكُمْ ۚ وَمَآ ءَاتَىٰكُمُ ٱلرَّسُولُ فَخُذُوهُ وَمَا
نَهَىٰكُمْ عَنْهُ فَٱنتَهُوا۟ ۚ وَٱتَّقُوا۟ ٱللَّهَ ۖ إِنَّ ٱللَّهَ شَدِيدُ ٱلْعِقَابِ ﴿٧﴾
لِلْفُقَرَآءِ ٱلْمُهَٰجِرِينَ ٱلَّذِينَ أُخْرِجُوا۟ مِن دِيَٰرِهِمْ وَأَمْوَٰلِهِمْ
يَبْتَغُونَ فَضْلًا مِّنَ ٱللَّهِ وَرِضْوَٰنًا وَيَنصُرُونَ ٱللَّهَ وَرَسُولَهُۥٓ ۚ أُو۟لَٰٓئِكَ
هُمُ ٱلصَّٰدِقُونَ ﴿٨﴾ وَٱلَّذِينَ تَبَوَّءُو ٱلدَّارَ وَٱلْإِيمَٰنَ مِن قَبْلِهِمْ
يُحِبُّونَ مَنْ هَاجَرَ إِلَيْهِمْ وَلَا يَجِدُونَ فِى صُدُورِهِمْ حَاجَةً
مِّمَّآ أُوتُوا۟ وَيُؤْثِرُونَ عَلَىٰٓ أَنفُسِهِمْ وَلَوْ كَانَ بِهِمْ خَصَاصَةٌ ۚ
وَمَن يُوقَ شُحَّ نَفْسِهِۦ فَأُو۟لَٰٓئِكَ هُمُ ٱلْمُفْلِحُونَ ﴿٩﴾

3 ඔවුන්ව (ඔවුන්ගේ ගම්වලින්) පිටුවහල් කළ යුතු යැයි අල්ලාහ් ඔවුන්ට නියම නොකළා නම් ලෝකයේ ඔවුන්ව (බනූ කුරෙයිළා නමැති ගෝත්‍රිකයින්ට සිදුවූවා සේ ඝාතනය කිරීම මගින් හා බන්ධනාගාරගත කිරීම මගින් ද) ඔවුන්ට ඔහු දඬුවම් කරන්නේය.) ඔවුන්ට මින් මතු ජීවිතයේ වේදනාකාරී දඬුවම ඇත.

4 එය ඔවුන් අල්ලාහ් හා ඔහුගේ දූතයාණන්ට විරුද්ධ වීමේ හේතුව නිසාය. කවරෙකු අල්ලාහ්ට විරුද්ධ වන්නේ ද අල්ලාහ් ඔවුන්ට) දඬුවම් කිරීමෙහි ඉතා දැඩිය.

5 නුඹලා ඔවුන්ගේ රට ඉඳි ගස් කැපුවේ ද නැත්නම් (නොකපා) ඒවා මුල්වල දරා සිටින ලෙස අත්හලේද අල්ලාහ්ගේ නියෝගය පරිදිය. (බනූ නළීර් යුද්ධයේ දී සමහර මුස්ලිම්වරු ප්‍රතික්ෂේප කරන්නවුන්ට කෝපය ඇති කිරීම සඳහා ඔවුන්ගේ රට ඉඳි ගස් කපන්න පටන් ගත්හ. එවිට ඔවුහු නබිතුමන්ව බලා ඔබ යහපත මනාප වන නබිවරයෙකු යැයි වාද කරන්නෙහි නොවේ ද? ගස් කැපීමත් ඒවා ගිනිබත් කිරීමත් යහපතට අයත් දැ?යි ඇසූහ. එය මුස්ලිම් වරුන්ට සිත් තැවුලක් ඇති කළේය. එම අවස්ථාවේ මෙම වැකිය පහළ විය.) තවද අල්ලාහ්ට අවනත වීම ප්‍රතික්ෂේප කරන්නන්ට නින්දාව ඇති කිරීමට ද (අල්ලාහ් මෙය කළේය.)

6 තවද අල්ලාහ් තම දූතයාට ඔවුන්ගෙන් ලබාගෙන දුන් දෑ ලබා ගැනීම සඳහා නුඹලා අශ්වයින්ව හෝ ඔටුවන්ව හෝ එළෙව්වේ නැත. (ඒ සඳහා නුඹලා යුද්ධ කළේවත් වෙහෙසට පත් වූයේ වත් නැත.) අල්ලාහ් සියලු දෑ කිරීමට ශක්තිය ඇත්තාය.

7 ගම්වැසියන්ගෙන් (යුද්ධයෙන් තොරව) තම දූතයාණන්ට ලබාදුන් දෑ අල්ලාහ්ට ද ඔහුගේ දූතයාණන්ට ද එතුමාගේ (හාෂිම් හා මුත්තලිබ් පවුල්වලට අයත්) ඥාතින්ට ද (පියා අහිමිවූ දරුවන් වන) අනාථයින්ට ද දුප්පත් හා මගීන්ට ද අයිති වන්නේය. (මෙය යුද්ධ නොකර ප්‍රතික්ෂේප කරන්නන්ගෙන් මුස්ලිම්වරුන්ට ලබාගත් දෑ බෙදාගන්නා ක්‍රමයයි. මෙහි නබිවරයාගේ කොටස එතුමාගේ අභාවයෙන් පසුව මුස්ලිම් වරුන්ගේ පොදු කටයුතු වෙනුවෙන් වියදම් කෙරෙයි.) ධනවතුන් අතරේ දෝලනය වන ද්‍රව්‍ය බවට මේවා පත් නොවී තිබීමට (මෙසේ බෙදා දෙන ලෙස අල්ලාහ් අණ කළේය.) නබිවරයා නුඹලාට කුමක් දෙන්නේ ද එය නුඹලා ලබාගනු. ඔහු නුඹලාට කුමක් තහනම් කරන්නේ ද එයින් වැළකී සිටිනු. අල්ලාහ්ට බිය වනු. අල්ලාහ් දඬුවම් කිරීමෙහි ඉතා දැඩිය.

8 (මක්කමෙන්) තම නිවෙස් වලින් පිටුවහල් කරනු ලැබූ දුප්පතුන්ටද (මෙහි කොටස් හිමිවන්නේය) ඔවුහු (ලෝකයේ අල්ලාහ්ගේ) දයාව ද (පරලොවදී ඔහුගේ) පිළිගැනීමද බලාපොරොත්තු වන්නෝය. තවද ඔවුහු (ප්‍රතික්ෂේප කරන්නන් සමඟ අල්ලාහ් වෙනුවෙන් කරන සටනේදී) අල්ලාහ්ට ද ඔහුගේ දූතයාණන්ට ද උදව් කරන්නෝය. සත්‍යවාදීන් වනුයේ මොවුහුය.

9 මොවුන්ට පෙර (මදීනාහ්වේ) ජීවත්ව විශ්වාස කළ (අන්සාර් යනුවෙන් හඳුන්වන) අය (මක්කාවාසීන්) ඔවුන් වෙත හිජ්රත් පැමිණි අයට ප්‍රිය මනාප වෙති. (මුහාජිර්වරුන්ට බොහෝ සුබ සාධන ඉටු කර ඔවුන්ගේ වස්තුවෙන් හා නිවෙස් වලින් ද කොටස් වෙන්කර දුන්හ.) ඔවුන්ට (මුහාජිර්වරුන්ට) දුන් දැයින් ඔවුහු කිසිදු අවශ්‍යතාවක් බලාපොරොත්තු නොවූහ. (නබිතුමන් බනූ නළීර් ගෝත්‍රිකයින්ගේ යුද්ධයෙන් තොරව විවිධ ද්‍රව්‍ය ලබා ගත් විට අන්සාර්වරුන්ව කැඳවා නබිතුමාණෝ මෙසේ කීහ. නුඹලා මනාප නම් බනූ නළීර් වරුන්ගෙන් අල්ලාහ් මට ලබා දුන් දැයින් නුඹලාට ද මුහාජිර්වරුන් ද බෙදා දෙමි. ඔවුහු නුඹලාගේ ස්ථානවල තවදුරටත් ඉඳීවි. නැත්නම් ඔවුන්ට පමණක් ඒවා දෙමි. ඔවුහු නුඹලාගේ ස්ථානයන්ගෙන් ඉවත් වී යන්නෝය. එවිට ඔවුහු මුහාජිර්වරුන්ට පමණක් බෙදා දීමට කැමැත්තෙන්ම එකඟ වූහ.) ඔවුහු (අන්සාර්වරු) තමන්ට අවශ්‍යතාව තිබියදීත් තමන්ට වඩා අනුන්ව) තෝරාගන්නෝය. කවරහු (ආගමෙන් ඔවුන්ට අණ කළ දැයින් වියදම් කර) මසුරුකමින් ආරක්ෂාව ලබන්නෝද ඔවුහුමය ජය ලද්දෝ. (මසුරු කම් ඇති අය ජය නොලබති.)

وَٱلَّذِينَ جَآءُو مِنۢ بَعۡدِهِمۡ يَقُولُونَ رَبَّنَا ٱغۡفِرۡ لَنَا
وَلِإِخۡوَٰنِنَا ٱلَّذِينَ سَبَقُونَا بِٱلۡإِيمَٰنِ وَلَا تَجۡعَلۡ فِي قُلُوبِنَا
غِلّٗا لِّلَّذِينَ ءَامَنُواْ رَبَّنَآ إِنَّكَ رَءُوفٞ رَّحِيمٌ ١٠ ۞ أَلَمۡ تَرَ إِلَى
ٱلَّذِينَ نَافَقُواْ يَقُولُونَ لِإِخۡوَٰنِهِمُ ٱلَّذِينَ كَفَرُواْ مِنۡ أَهۡلِ
ٱلۡكِتَٰبِ لَئِنۡ أُخۡرِجۡتُمۡ لَنَخۡرُجَنَّ مَعَكُمۡ وَلَا نُطِيعُ فِيكُمۡ
أَحَدًا أَبَدٗا وَإِن قُوتِلۡتُمۡ لَنَنصُرَنَّكُمۡ وَٱللَّهُ يَشۡهَدُ إِنَّهُمۡ لَكَٰذِبُونَ
١١ لَئِنۡ أُخۡرِجُواْ لَا يَخۡرُجُونَ مَعَهُمۡ وَلَئِن قُوتِلُواْ لَا يَنصُرُونَهُمۡ
وَلَئِن نَّصَرُوهُمۡ لَيُوَلُّنَّ ٱلۡأَدۡبَٰرَ ثُمَّ لَا يُنصَرُونَ ١٢
لَأَنتُمۡ أَشَدُّ رَهۡبَةٗ فِي صُدُورِهِم مِّنَ ٱللَّهِۚ ذَٰلِكَ بِأَنَّهُمۡ قَوۡمٞ
لَّا يَفۡقَهُونَ ١٣ لَا يُقَٰتِلُونَكُمۡ جَمِيعًا إِلَّا فِي قُرٗى
مُّحَصَّنَةٍ أَوۡ مِن وَرَآءِ جُدُرِۭۚ بَأۡسُهُم بَيۡنَهُمۡ شَدِيدٞۚ تَحۡسَبُهُمۡ
جَمِيعٗا وَقُلُوبُهُمۡ شَتَّىٰۚ ذَٰلِكَ بِأَنَّهُمۡ قَوۡمٞ لَّا يَعۡقِلُونَ ١٤
كَمَثَلِ ٱلَّذِينَ مِن قَبۡلِهِمۡ قَرِيبٗاۖ ذَاقُواْ وَبَالَ أَمۡرِهِمۡ وَلَهُمۡ عَذَابٌ
أَلِيمٞ ١٥ كَمَثَلِ ٱلشَّيۡطَٰنِ إِذۡ قَالَ لِلۡإِنسَٰنِ ٱكۡفُرۡ فَلَمَّا كَفَرَ
قَالَ إِنِّي بَرِيٓءٞ مِّنكَ إِنِّيٓ أَخَافُ ٱللَّهَ رَبَّ ٱلۡعَٰلَمِينَ ١٦

10 (විශ්වාස කළ තත්ත්වයෙන් අවසන් දිනය දක්වා) ඔවුන්ට පසුව එන අය (පහත සඳහන් පරිදි අල්ලාහ්ගෙන්) ප්‍රාර්ථනා කරති. .අපගේ පරමාධිපතියාණනි, අපට ක්ෂමා කර තවද විශ්වාස කිරීමෙන් අපට ඉදිරියෙන් සිටි අයගේ සහෝදරයින්ව ද (මුහාජිර් හා අන්සාර්වරුන්වද) ක්ෂමා කරනු මැනව විශ්වාස කළවුන් මත අපගේ හදවත් තුළ ක්‍රෝධය ඇති නොකරනු මැනෟ අපගේ පරමාධිපතියාණනි, නියත වශයෙන්ම ඔබ දයාව හා කරුණාව දක්වන්නාය. (විශ්වාස කළ අයගෙන් නබිතුමාගේ මිත්‍රයෝ ප්‍රමුඛයෝය. එහෙයින් ඔවුන් මත සීයාවරුන් මෙන් ක්‍රෝධය ඇති කර ගනී නම් ඔහු ෂෙයිතාන්ගේ ග්‍රහණයට හසු වී පාපිෂ්ඨයෙකු වන්නේය. තවද ඔවුන්ට බැණවැදීම ද ඔවුන්ව පහත් කොට කථා කිරීම ද වරදකි.-

11 (නබිවරයාණනි) නුඹ කුහකයින් ගැන සැලකිලිමත් වූයේ නැද්ද? (ඔවුහු අබ්දුල්ලාහ් බින් උබෙයි හා ඔහුගේ සගයින් ය) ඔවුහු පුස්තකය ලද වුන්ගෙන් ප්‍රතික්ෂේප කරන්නන් වූ ඔවුන්ගේ සහෝදරයින් දෙස බලා නුඹලා පිටුවහල් කරනු ලැබුවෙහු නම් අපිද පිටමං වන්නෙමුයි පවසති. (මොවුහු බනූ නළීර් ගෝත්‍රිකයින්ට නුඹලා එහි සිට පිට මං නොවී එහිම රැඳී සිටිහුයි පණිවිඩයක් යවා තිබුණි.) තවද (ඔවුහු මෙසේ පැවසූහ) අපි නුඹලා සම්බන්ධයෙන් කිසිවෙකුට අවනත නොවන්නෙමු. නුඹලා සමග යුද්ධ කළොත් නියත වශයෙන්ම අපි (නුඹලාගේ සතුරන් ට විරුද්ධව) නුඹලාට උදව් කරන්නෙමු. (ඔවුන් සමග පිටමං වෙන බවටත් ඔවුන්ට උදව් කරන බවටත් ඔවුන් පොරොන්දු වන කාර්යයෙහි) නියතවශයෙන්ම ඔවුහු බොරු කියතියි අල්ලාහ් සාක්ෂි කියයි.

12 ඔවුන් (බනූ නළීර්) පිටුවහල් කරනු ලැබුවොත් ඔවුන් සමග මොවුහු පිටමං නොවෙති. තවද ඔවුන් සමග යුද්ධ කරනු ලැබුව ද ඔවුන්ට උදව් ද නොකරන්නෝය. (අල්ලාහ් සඳහන් කළ පරිදි බනූ නළීර් පිටුවහල කරනු ලැබූ විට මොවුන් පිටමංවූයේ ද නැත. බනූ කුරෙයිළා වරුන් සමග ද කයිබර් වැසියන් සමග ද යුද්ධ කළ අවස්ථාවේ ඔවුන් උදව් කළේ ද නැත.) ඔවුන්ට මොවුන් උදව් කළත් (පරාජය වී) පසුබා දුවනු ඇත. පසුව ඔවුහු (කුහකයෝ) කිසිවෙකුගේ උදව් කරනු නොලබන්නෝය. (අල්ලාහ් ඔවුන් ද නින්දාවට පත් කරන්නේය)

13 නියත වශයෙන්ම ඔවුහු තම හදවත් වලින් අල්ලාහ්ට බියවීමට වඩා අධිකව නුඹලාට බියවන්නෝය. එය (එසේ බියවනුයේ) ඔවුහු තේරුමක් නොමැති පිරිසක් නිසාය. (ඔවුනට තේරුමක් ඇත්නම් නුඹලාව ඔවුන්ට මෙසේ පෙන්වා ඇත්තේ අල්ලාහ් යැයි තේරුම් ගන්නෝය.)

14 (නිවටකම) හේතු කොට ගෙන බලකොටුවලින් ආරක්ෂිත ගම්වල සිට හෝ බිත්තිවලට පිටුපසින් හෝ නොසිට ඔවුහු සියලු දෙනා එකමුතු වී සටන් නොකරන්නෝය. ඔවුන් අතරේ ඔවුන්ගේ ක්‍රෝධය බලවත්ය. නුඹලා ඔවුන් එකට සිටින්නවුන් යැයි සිතන්නෙහුය. ඔවුන්ගේ හදවත් වෙන් වී ඇත. (ඔවුන් එකමුතු වී සිටින්නේ එළිපිට පමණි.) එය (එසේ බෙදී සිටින්නේ) ඔවුන් නොදැනුවත් පිරිසක් නිසාය. (ඔවුහු දැනුමක් ඇත්තවුන් නම් සත්‍යය දැන එකමුතු වන්නෝය.)

15 (ඔවුන්ට උදාහරණයක් වනුයේ) මොවුන්ට කෙටි කලකට පෙර සිටි (බද්ර් සටනේ දී) තම නරක ක්‍රියාවන්ට සුදුසු දඬුවම වින්ඳ අය වැනිය. (මෙය බනූ නළීර් ගෝත්‍රිකයින්ව පිටුවහල් කිරීමට මාස හයකට පෙර සිදු වූවකි) ඔවුන්ට වේදනාකාරී දඬුවම් ඇත.

16 (උදව් නොකර පසුබසින මෙම කුහකයින්ට උදාහරණය වන්නේ) ෂෙයිතාන් වැනිය. ඔහු මිනිසාව බලා නුඹ (අල්ලාහ්ව) ප්‍රතික්ෂේප කරහි යි කීය. ඔහු ප්‍රතික්ෂේප කළ විට මම නුඹෙන් නිර්දෝෂ වන්නෙමි. මම ලෝකයාගේ දෙවියා වන අල්ලාහ්ට බියවෙමි යි කීය.

17 ඒ දෙදෙනාගේ (ෂෙයිතාන්ගේ හා ඔහුට අවනත වූ මිනිසාගේ) අවසානය වන්නේ ඔවුහු දෙදෙනාම නිරයේ සිටින්නෝය. අසාධාරණය කරනවුන්ගේ විපාකය එයයි.

فَكَانَ عَاقِبَتَهُمَا أَنَّهُمَا فِي النَّارِ خَالِدَيْنِ فِيهَا ۚ وَذَٰلِكَ جَزَاءُ
الظَّالِمِينَ ﴿١٧﴾ يَا أَيُّهَا الَّذِينَ آمَنُوا اتَّقُوا اللَّهَ وَلْتَنظُرْ
نَفْسٌ مَّا قَدَّمَتْ لِغَدٍ ۖ وَاتَّقُوا اللَّهَ ۚ إِنَّ اللَّهَ خَبِيرٌ بِمَا تَعْمَلُونَ
﴿١٨﴾ وَلَا تَكُونُوا كَالَّذِينَ نَسُوا اللَّهَ فَأَنسَاهُمْ أَنفُسَهُمْ ۚ أُولَٰئِكَ
هُمُ الْفَاسِقُونَ ﴿١٩﴾ لَا يَسْتَوِي أَصْحَابُ النَّارِ وَأَصْحَابُ
الْجَنَّةِ ۚ أَصْحَابُ الْجَنَّةِ هُمُ الْفَائِزُونَ ﴿٢٠﴾ لَوْ أَنزَلْنَا هَٰذَا
الْقُرْآنَ عَلَىٰ جَبَلٍ لَّرَأَيْتَهُ خَاشِعًا مُّتَصَدِّعًا مِّنْ خَشْيَةِ
اللَّهِ ۚ وَتِلْكَ الْأَمْثَالُ نَضْرِبُهَا لِلنَّاسِ لَعَلَّهُمْ يَتَفَكَّرُونَ
﴿٢١﴾ هُوَ اللَّهُ الَّذِي لَا إِلَٰهَ إِلَّا هُوَ ۖ عَالِمُ الْغَيْبِ وَالشَّهَادَةِ ۖ
هُوَ الرَّحْمَٰنُ الرَّحِيمُ ﴿٢٢﴾ هُوَ اللَّهُ الَّذِي لَا إِلَٰهَ إِلَّا هُوَ
الْمَلِكُ الْقُدُّوسُ السَّلَامُ الْمُؤْمِنُ الْمُهَيْمِنُ الْعَزِيزُ
الْجَبَّارُ الْمُتَكَبِّرُ ۚ سُبْحَانَ اللَّهِ عَمَّا يُشْرِكُونَ
﴿٢٣﴾ هُوَ اللَّهُ الْخَالِقُ الْبَارِئُ الْمُصَوِّرُ ۖ لَهُ الْأَسْمَاءُ الْحُسْنَىٰ ۚ
يُسَبِّحُ لَهُ مَا فِي السَّمَاوَاتِ وَالْأَرْضِ ۖ وَهُوَ الْعَزِيزُ الْحَكِيمُ ﴿٢٤﴾

18 විශ්වාසවන්තයිනි, නුඹලා (නුඹලාට අණ කරන ලද දෑ කිරීම තුළින් ද තහනම් කළ දැයින් වැළකීමෙන් ද) අල්ලාහ්ට බියවනු. සෑම ආත්මයක්ම හෙට (පරලොව) සඳහා (යහක්‍රියාවන්ගෙන්) කුමක් කලින් යැව්වෙමු දැයි සලකා බැලිය යුතුය.

19 නුඹලා (ඔහුගේ අණ අතහැර දමා) අල්ලාහ්ව අමතක කළවුන් සේ නොසිටිනු. (ඔවුහු ඔහුව අමතක කළ හේතුව නිසා තමන්ට විමුක්තිය ලබා දෙන යහක්‍රියාවන්ගෙන්) ඔවුන්ව ඔහු අමතක කෙරෙව්වේය. ඔවුන්මය (අල්ලාහ්ට අවනත නොවූ) පව් කාරයෝය.

20 ස්වර්ග වැසියන් ද නිරයේ වැසියන් ද සම නොවන්නේය. ජය ලද්දෝ ස්වර්ග වාසීන්මය. (තමන්ට රිසි හැම දෙයක්ම ලබා ගනිති. තමන්ට නොරිසි හැමදෙයකින්ම විමුක්තිය ලබති.)

21 අප මෙම කුර්ආනය කන්දක් මත පහළ කළේ නම් අල්ලාහ් පිළිබඳ වූ බිය හේතුකොට ගෙන බියවූ ස්වභාවයෙන් ද දෙදරා ගිය ස්වභාවයෙන් ද (නබිවරයාණනි) නුඹ (එය) දකින්නෙහිය. (විශාල වූ ද ශක්තිමත් වූ ද කඳු පවා අල්-කුර්ආනයේ සාහිත්‍යමය ව්‍යාකරණ ව්‍යක්ත බව හදවත් උණු කරවන උපදෙස් යනාදිය දැක බිය වී දෙදරා යන්නේය.)

22 ඔහු අල්ලාහ් හැර නැමදුමට සුදුස්සා අන් කිසිවෙක් නොමැත. ඔහු (ඉන්ද්‍රියයන්ට නොදැනෙන) සැඟවුණ දෑ ද (ඒවායින්) දැනගත හැකි දෑ ද දන්නෝය.

23 අල්ලාහ් ඔහුමය. ඔහු හැර නැමදුමට සුදුසු දෙවියෙකු වෙනත් නැත. (ඔහු) රජුය. (සියලු ඌනතාවලින් ඔහු) පවිත්‍රය. (තම ගැත්තන්ට අසාධාරණ වීමෙන්) අභය දෙන්නාය. (ගැත්තන්ගේ ක්‍රියා) නිරීක්ෂණය කරයි. (සියල්ල) අබිබවා යයි. මර්ධනය කර පාලනය කරයි. (සියලු අඩුපාඩුවලින් ඉවත් වී) ආඩම්බරය අත්කරගත්තෙක් (ආඩම්බරය යනු ගැත්තන්ට අප කීර්තිය ගෙන දුන්න ද අල්ලාහ් පිළිබඳව කීර්තිය ගෙන දෙන ගුණාංගයකි.) ආදේශ කරන්නන්ගේ (ආදේශවලින්) ඔහු පාරිශුද්ධය.

24 අල්ලාහ් ඔහුය (මැවීම් සියල්ල) මවන්නාය. (නියම පිළිවෙළකට) ඇති කරන්නාය. (මැවීම් සියල්ලට) රුවක් ලබා දෙන්නාය. ඔහුට ලස්සන ශුද්ධ නාමයන් ඇත. අහස්හි ද පොළොවෙහි ද ඇති දෑ ඔහුට තුති කරයි. ඔහු (සියල්ල) අබිබවා යන්නාය. දැනුම ඥානය ඇත්තාය.

سُورَةُ الْمُمْتَحَنَةِ

ترتيبها ٦٠ — آياتها ١٣

## අල්-මුම්තහිනා

1 විශ්වාසවන්තයිනි, නුඹලා මගේ ද නුඹලාගේ ද සතුරන්ව මිතුරන් නොකරගනු. (මෙම වැකිය නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් මක්කාහ් ජයග්‍රහණයට සූදානම් වූ අවස්ථාවේ එම පණිවිඩය මක්කමට යැවීමට උත්සාහ කළ හාතිබ් බින් අබී බල්තආ නැමැත්තා මුල් කරගෙන පහළ වූවකි. මෙම වැකිය දෙවියන්ව ප්‍රතික්ෂේප කරන්නන් සමඟ කිසිම අන්දමකින් මිත්‍ර නොවිය යුතු යැයි දන්වයි. නුඹලා අතර ඇති) ආදරය නිසා (නබිතුමාගේ තොරතුරු) ඔවුන්ට ලබා දෙන්නෙහුය. ඔවුහු නුඹලාට පහළ වී ඇති සත්‍යයන් (අල්ලාහ් දෙවියන්ගේ දූතයාණන් අල්-කුර්ආනය හා ඍජු මඟ යනාදිය) ප්‍රතික්ෂේප කරති. නුඹලාගේ දෙවියන් වූ අල්ලාහ් ව විශ්වාස කළ නිසා (ඔහුගේ) දූතයාව ද නුඹලාව ද පිටුවහල් කළහ. මගේ මාර්ගයේ යුද්ධ කිරීමටත් මාගේ පිළිගැනීම අපේක්ෂා කළ නිසාත් නුඹලා පිටමං වූයේ නම් (මාගේත් නුඹලාගේත් සතුරන්ව මිතුරන් නොකර ගනිහු. නුඹලා ඔවුන් සමඟ ඇති ආදරය නිසා) රහසිගතව තොරතුරු දෙන්නෙහුය. නුඹලා වසං කරන (තොරතුරු ඔවුන්ට හුවමාරු කරන්නාක් වැනි) කරුණු ද අනෙකුත් ප්‍රසිද්ධ කරන කරුණු ද මම දනිමි. නුඹලාගෙන් කවරෙකු හෝ එය කරයි නම් ඔහු ඍජු මාර්ගයෙන් ගිලිහුණෝය.

2 ඔවුහු නුඹලාව දැනගනිත්නම් නුඹලාට සතුරන්ම වන්නෝය. (තම හදවත් තුළ නුඹලා කෙරෙහි ඇති විරුද්ධත්වය හෙළි කරන්නෝය.) තවද ඔවුහු (පහර දීම වැනි) නරක ක්‍රියා මගින් තම අත් ද (බැණ වැදීම වැනි) නරක ක්‍රියා මගින් තම දිව ද නුඹලා වෙත යොමු කරති. තවද නුඹලා ආගමෙන් වෙන් වී ප්‍රතික්ෂේප කරන්නන් වීම ඔවුහු ප්‍රිය කරති.

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ
يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُواْ لَا تَتَّخِذُواْ عَدُوِّي وَعَدُوَّكُمۡ أَوۡلِيَآءَ تُلۡقُونَ
إِلَيۡهِم بِٱلۡمَوَدَّةِ وَقَدۡ كَفَرُواْ بِمَا جَآءَكُم مِّنَ ٱلۡحَقِّ يُخۡرِجُونَ ٱلرَّسُولَ
وَإِيَّاكُمۡ أَن تُؤۡمِنُواْ بِٱللَّهِ رَبِّكُمۡ إِن كُنتُمۡ خَرَجۡتُمۡ جِهَٰدٗا فِي سَبِيلِي
وَٱبۡتِغَآءَ مَرۡضَاتِيۚ تُسِرُّونَ إِلَيۡهِم بِٱلۡمَوَدَّةِ وَأَنَا۠ أَعۡلَمُ بِمَآ أَخۡفَيۡتُمۡ
وَمَآ أَعۡلَنتُمۡۚ وَمَن يَفۡعَلۡهُ مِنكُمۡ فَقَدۡ ضَلَّ سَوَآءَ ٱلسَّبِيلِ ١ إِن
يَثۡقَفُوكُمۡ يَكُونُواْ لَكُمۡ أَعۡدَآءٗ وَيَبۡسُطُوٓاْ إِلَيۡكُمۡ أَيۡدِيَهُمۡ وَأَلۡسِنَتَهُم
بِٱلسُّوٓءِ وَوَدُّواْ لَوۡ تَكۡفُرُونَ ٢ لَن تَنفَعَكُمۡ أَرۡحَامُكُمۡ وَلَآ أَوۡلَٰدُكُمۡۚ
يَوۡمَ ٱلۡقِيَٰمَةِ يَفۡصِلُ بَيۡنَكُمۡۚ وَٱللَّهُ بِمَا تَعۡمَلُونَ بَصِيرٞ ٣ قَدۡ
كَانَتۡ لَكُمۡ أُسۡوَةٌ حَسَنَةٞ فِيٓ إِبۡرَٰهِيمَ وَٱلَّذِينَ مَعَهُۥٓ إِذۡ قَالُواْ لِقَوۡمِهِمۡ
إِنَّا بُرَءَٰٓؤُاْ مِنكُمۡ وَمِمَّا تَعۡبُدُونَ مِن دُونِ ٱللَّهِ كَفَرۡنَا بِكُمۡ وَبَدَا بَيۡنَنَا
وَبَيۡنَكُمُ ٱلۡعَدَٰوَةُ وَٱلۡبَغۡضَآءُ أَبَدًا حَتَّىٰ تُؤۡمِنُواْ بِٱللَّهِ وَحۡدَهُۥٓ إِلَّا
قَوۡلَ إِبۡرَٰهِيمَ لِأَبِيهِ لَأَسۡتَغۡفِرَنَّ لَكَ وَمَآ أَمۡلِكُ لَكَ مِنَ ٱللَّهِ مِن شَيۡءٖۖ
رَّبَّنَا عَلَيۡكَ تَوَكَّلۡنَا وَإِلَيۡكَ أَنَبۡنَا وَإِلَيۡكَ ٱلۡمَصِيرُ ٤ رَبَّنَا لَا تَجۡعَلۡنَا
فِتۡنَةٗ لِّلَّذِينَ كَفَرُواْ وَٱغۡفِرۡ لَنَا رَبَّنَآۖ إِنَّكَ أَنتَ ٱلۡعَزِيزُ ٱلۡحَكِيمُ ٥

3 (විනිශ්චය දිනයේ) නුඹලාගේ නෑදෑයෝ ද දරුවෝ ද නුඹලාට ප්‍රයෝජනවත් නොවෙති. (එසේ ප්‍රයෝජනවත් වන්නේ නම් ප්‍රතික්ෂේප කරන්නන් සමග මිත්‍ර විය යුතුය. එසේ නොව නුඹලා ප්‍රතික්ෂේප කරන්නන් සමග විරුද්ධ වීමත් ඔවුන් සමග පුණ්‍ය යුද්ධ කිරීමත් පමණක් නුඹලාට ප්‍රයෝජනවත් වෙයි.) නුඹලා අතර වෙන්වීමක් ඇති වෙයි. නුඹලා කරන සෑම දෙයක්ම අල්ලාහ් (මනාව) දකින්නේය

4 ඉබ්‍රාහිම් (අලෛයිහිස් සලාම්) තුමාගේ ද එතුමා සමග සිටිය අයගේ ද (පිළිපැදිය හැකි) පූර්වා දර්ශයන් නුඹලාට ඇත. (හාතිබ් බින් බල්තආ, ඉබ්‍රාහිම් (අලෛයිහිස් සලාම්) තම පවුලෙන් වෙන්වුවා සේ නුඹත් වෙන්වුවා නම් නරක ද?) ඔහු තම සමාජය දෙස බලා අපි නුඹලාගෙන් ද තවද අල්ලාහ් හැර නුඹලා නැමදුම් කරන දැයින්(පිළිමවලින්) ද ඉවත් වූයෙමු. (අප නුඹලාට අයත් අයද නොවේ. නුඹලා අපේ අය ද නොවේ.) අපි නුඹලාව (නුඹලාගේ ආගම) ප්‍රතික්ෂේප කළෙමු. නුඹලා එකම අල්ලාහ්ට පමණක් නැමදුම් ඉටු කරන තෙක් නුඹලාත් අපත් අතරේ කවදත් විරෝධයත් කෝපයත් පිට විය. (නුඹලා එය කරන්නෙහු නම් විරෝධයත් අමනාපයත් මිතුරුකම හා මනාපය බවට වෙනස් වනු ඇතැයි පැවසීය. ඉබ්‍රාහිම් (අලෛයිහිස් සලාම්) තුමා තම පියා දෙස බලා ඔබ වෙනුවෙන් මම අල්ලාහ්ගෙන් පාපක්ෂමාව අයදිමි. අල්ලාහ්ගෙන් කිසිවක් ඔබ වෙනුවෙන් මම හිමි කර නොගනිමියි කී එතුමාගේ වදන් හැර (එතුමාගේ අනෙක් සෑම වදනකම පූර්වාදර්ශයක් තිබිණ.) අපගේ පරමාධිපතියාණනි, ඔබ මතම අප විශ්වාසය තබන්නෙමු. ඔබ වෙතම අප කන්නලව් කරන්නෙමු. තවද ඔබ වෙතම අප ආපසු හැරී එන්නෙමු.

5 අපගේ දෙවියනි, අපව දෙවියන් ප්‍රතික්ෂේප කරන්නන්ට පරීක්ෂණයක් බවට පත්නොකරනු මැනව (මුජාහිද් රහ්මතුල්ලාහි අලෛයිහි තුමා මෙසේ පවසයි. ඔවුන්ගේ අතින් හෝ නුඹේ දඬුවම මගින් හෝ අපට දඬුවම් නොකරනු මැනවි. එවිට ඔවුහු මොවුන් සත්‍ය ආගමක සිටියේ නම් මොවුන්ට මෙම දඬුවම අත් නොවන්නේ යැයි කියන්නෝය.) අපගේ දෙවියනි, නුඹ අපට ක්ෂමා කරත්වා නියත වශයෙන්ම නුඹ අබිබවායාමට හැකි වූ ද දැනුම හා ඥානය ඇත්තෙකු ද වන්නෙහිය.

6 නුඹලාගෙන් අල්ලාහ්ව හා විනිශ්චය දිනය ආදරය කරන අපට මෙතුමන්ලාගෙන් (ඉබ්‍රාහිම් තුමාගේ හා එතුමා සමග සිටි අයගෙන්) ලස්සන පූර්වාදර්ශයන් ඇත. (මෙම පූර්වාදර්ශය මෙලොව හා පරලොව අල්ලාහ්ගෙන් යහපත බලාපොරොත්තුවන අයටම ඇත්තේය. මෙම පූර්වාදර්ශය) කවරෙකු හෝ නොසලකා හරී නම් නියත වශයෙන්ම අල්ලාහ් (තම ගැත්තන්ගෙන්) අවශ්‍යතාවකින් තොර ප්‍රශංසනීය වන්නේය.

7 අල්ලාහ් නුඹලාට ද (මක්කමේ ආදේශ කරන්නන් වන) නුඹලා විරෝධය පාන අය අතර ද මිත්‍රකම ඇති කළ හැක. (එය ඔවුන් ඉස්ලාමය පිළිගෙන නුඹලාගේ ආගම වැළඳ ගන්නා මක්කා ජයග්‍රහණයෙන් පසු ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඉස්ලාමයට ඇතුල් වී යහපත් මුස්ලිම්වරු වූහ. කලින් ඉස්ලාමය පිළිගත් අයටත් මොවුන්ටත් අතර නැවතත් මිත්‍රත්වය ඇති විය. නබි -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තුමාණෝ අබූ සුෆ්යාන්ගේ දුව උම්මු හබීබා තුමිය හා විවාහ වී සිටිය ද මක්කම ජය ගැනීමෙන් අනතුරුව ඔහු ඉස්ලාමය වැළඳ ගෙන නබිතුමන්ට විරුද්ධවීම අත්හළ පසුව ම ඔහු සමග නබිතුමාණෝ සුහද වූහ. ආගම ස්ථාවර කිරීම සඳහා ආගම වෙනස් කළවුන් සමග ප්‍රථම වතාවට යුද වැදුනේ අබූ සුෆ්යාන් යැයි අබූ උරෙයිරා -රළියල්ලාහු අන්හු- තුමා පවසයි. අල්ලාහ් (සියල්ල කෙරෙහි) ශක්ති ඇත්තාය. තවද අල්ලාහ් පව් ක්ෂමා කරන්නාය. පරම දයාබරය.

8 ආගම සම්බන්ධයෙන් නුඹලා සමග යුද්ධ නොකර ද නුඹලාගේ නිවෙස්වලින් පිටුවහල් නොකර ද සිටින අයට (නෑදෑයින් සමග එකමුතුව සිටීම සංග්‍රහ කිරීම යාබද නිවෙස සඳහා ඉටු කළ යුතු යුතුකම් ඉටු කිරීම ආදී) හොඳ දේවල් කිරීමටත් (ඔවුන්ට ඉටු කළ යුතු යුතුකම් ඉටු කර) ඔවුන් සමග සාධාරණව කටයුතු කිරීමටත් අල්ලාහ් තහනම් නොකරන්නේය. නියත වශයෙන්ම අල්ලාහ් සාධාරණව කටයුතු කරන්නන්ව ප්‍රිය කරයි. (මෙම වැකියේ තේරුම වනුයේ මුස්ලිම්වරුන්ට හානියක් නොකරන ප්‍රතික්ෂේප කරන්නන්ට හොඳ කිරීමත් ඔවුන් සමග සාධාරණව කටයුතු කිරීමත් අල්ලාහ්

لَقَدۡ كَانَ لَكُمۡ فِيهِمۡ أُسۡوَةٌ حَسَنَةٞ لِّمَن كَانَ يَرۡجُواْ ٱللَّهَ وَٱلۡيَوۡمَ ٱلۡأٓخِرَۚ
وَمَن يَتَوَلَّ فَإِنَّ ٱللَّهَ هُوَ ٱلۡغَنِيُّ ٱلۡحَمِيدُ ٦ عَسَى ٱللَّهُ أَن يَجۡعَلَ
بَيۡنَكُمۡ وَبَيۡنَ ٱلَّذِينَ عَادَيۡتُم مِّنۡهُم مَّوَدَّةٗۚ وَٱللَّهُ قَدِيرٞۚ وَٱللَّهُ غَفُورٞ رَّحِيمٞ
٧ لَّا يَنۡهَىٰكُمُ ٱللَّهُ عَنِ ٱلَّذِينَ لَمۡ يُقَٰتِلُوكُمۡ فِي ٱلدِّينِ وَلَمۡ يُخۡرِجُوكُم
مِّن دِيَٰرِكُمۡ أَن تَبَرُّوهُمۡ وَتُقۡسِطُوٓاْ إِلَيۡهِمۡۚ إِنَّ ٱللَّهَ يُحِبُّ ٱلۡمُقۡسِطِينَ
٨ إِنَّمَا يَنۡهَىٰكُمُ ٱللَّهُ عَنِ ٱلَّذِينَ قَٰتَلُوكُمۡ فِي ٱلدِّينِ وَأَخۡرَجُوكُم
مِّن دِيَٰرِكُمۡ وَظَٰهَرُواْ عَلَىٰٓ إِخۡرَاجِكُمۡ أَن تَوَلَّوۡهُمۡۚ وَمَن يَتَوَلَّهُمۡ فَأُوْلَٰٓئِكَ
هُمُ ٱلظَّٰلِمُونَ ٩ يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوٓاْ إِذَا جَآءَكُمُ ٱلۡمُؤۡمِنَٰتُ
مُهَٰجِرَٰتٖ فَٱمۡتَحِنُوهُنَّۖ ٱللَّهُ أَعۡلَمُ بِإِيمَٰنِهِنَّۖ فَإِنۡ عَلِمۡتُمُوهُنَّ مُؤۡمِنَٰتٖ
فَلَا تَرۡجِعُوهُنَّ إِلَى ٱلۡكُفَّارِۖ لَا هُنَّ حِلّٞ لَّهُمۡ وَلَا هُمۡ يَحِلُّونَ لَهُنَّۖ وَءَاتُوهُم
مَّآ أَنفَقُواْۚ وَلَا جُنَاحَ عَلَيۡكُمۡ أَن تَنكِحُوهُنَّ إِذَآ ءَاتَيۡتُمُوهُنَّ أُجُورَهُنَّۚ
وَلَا تُمۡسِكُواْ بِعِصَمِ ٱلۡكَوَافِرِ وَسۡـَٔلُواْ مَآ أَنفَقۡتُمۡ وَلۡيَسۡـَٔلُواْ مَآ أَنفَقُواْۚ
ذَٰلِكُمۡ حُكۡمُ ٱللَّهِ يَحۡكُمُ بَيۡنَكُمۡۚ وَٱللَّهُ عَلِيمٌ حَكِيمٞ ١٠ وَإِن فَاتَكُمۡ
شَيۡءٞ مِّنۡ أَزۡوَٰجِكُمۡ إِلَى ٱلۡكُفَّارِ فَعَاقَبۡتُمۡ فَـَٔاتُواْ ٱلَّذِينَ ذَهَبَتۡ
أَزۡوَٰجُهُم مِّثۡلَ مَآ أَنفَقُواْۚ وَٱتَّقُواْ ٱللَّهَ ٱلَّذِيٓ أَنتُم بِهِۦ مُؤۡمِنُونَ ١١

නුඹලාට තහනම් නොකරන බවයි.)

9 නියත වශයෙන් අල්ලාහ් ආගම සම්බන්ධයෙන් නුඹලා සමඟ යුද්ධ කර නුඹලාගේ නිවෙස්වලින් නුඹලාව පිටුවහල් කළ(කුරෙයිෂ් නායකයින් වූ ඔ)වුන් සමඟ ද නුඹලාව පිටුවහල් කිරීමට (ඔවුනට) උදව් කළ (අනෙකුත් මක්කමේ) ප්‍රතික්ෂේප කරන්නන් සමඟ ද මිත්‍රවීම අල්ලාහ් තහනම් කරයි. ඔවුන් සමඟ කවරෙකු හෝ මිත්‍රවෙයි නම් ඔවුහු අපරාධ කාරයෝය.

10 විශ්වාසවන්තයිනි, විශ්වාස කළ කාන්තාවන් ප්‍රතික්ෂේප කළ අය ළඟ සිට හිජ්රත් එයිනම් ඔවුන්ව පරීක්ෂා කර බලහු. (නබිතුමාණෝ හුදෙයිබියාවේ ප්‍රතික්ෂේප කරන්නන් සමඟ ගිවිසුමක් අස්සන් කළහ. මක්කමේ සිට කවරෙකු හෝ ඉස්ලාමය වැළඳ ගෙන මදීනාහ්වට නබිතුමන් වෙතට පැමිණියහොත් ඔහුව ආපසු යැවිය යුතුයි යන්න එහි කොන්දේසිවලින් එකක් විය. කාන්තාවන් ඔවුන් වෙත සිට හිජ්රත් පැමිණි විට ඔවුන්ව ආපසු යැවීම තහනම් කර, 'අපි විශ්වාස කළෙමුයි ඔවුන් කරන දෑ කොතරම් සත්‍යය දැයි පරීක්ෂා කර බලන ලෙස නබිතුමන්ට අල්ලාහ් අණ කළේය. ඔවුහු නබිතුමන්ට 'අපි ස්වාමිපුරුෂයින් සමඟ අමනාප වී හෝ එක ගමක් අත්හැර තවත් ගමකට ආශාකර හෝ ලෞකික සැප සම්පත්වලට ආශාවෙන් හෝ පැමිණියේ නැතැ'යි ඔවුහු දිවුරා ප්‍රකාශ කරති. ඔවුන්ගේ විශ්වාසයේ (සත්‍ය) තත්ත්වය අල්ලාහ් අධිකව දනී. (එය නුඹලාට දැන ගත නොහැක එළිපිට ඔවුන් සත්‍ය කියන්නේ දැ?යි දැන ගැනීම පිණිස ඔවුන්ව දිවුරවන්න. ඔවුන්ගේ (දිවුරිලි අනුව) ඔවුන්ව විශ්වාස වන්තයින් යැයි නුඹලා දැන ගන්නෙහුනම් ඔවුන්ව ප්‍රතිකෙෂ්ප කරන්නන් (වූ ඔවුන්ගේ ස්වාමිපුරුෂයින්) වෙත ආපසු නොයවන්න. මෙම කාන්තාවෝ ඔවුනට අනුමත ද නොවෙති. (ප්‍රතික්ෂේප කරන්නන් වූ) ඔවුහු ද මොවුන්ට අනුමත නොවෙති. (මන්ද කාන්තාවන් ඉස්ලාමය වැළඳ ගැනීම ඇයව ඇගේ ස්වාමිපුරුෂයාගෙන් වෙන් කරයි.) ඔවුහු (එම ස්වාමි පුරුෂයන්) වියදම් කළ දෑ ඔවුනට නුඹලා දෙහු. (හිජ්රත් පැමිණි මෙම කාන්තාවන්ට ඔවුන්ගේ ස්වාමි පුරුෂයින් විසින් දෙන ලද මහර් ප්‍රමාණය නුඹලා ඔවුනට දෙහු. ඉමාම් ෂාෆිඉ (රහ්මතුල්ලාහි අලෛයිහි) තුමා මෙසේ පවසයි. 'ස්වාමි පුරුෂයන් නොවන වෙනත් ඥාතීන්ට කිසිම වන්දියක් ගෙවනු නොලැබේ.) නුඹලා ඔවුනට නියමිත මහර් ප්‍රමාණය ගෙවන්නෙහු නම් නුඹලා එම කාන්තාවන්(ගේ ඉද්දා කාලය අවසන් වූ පසු) විවාහ කර ගැනීම නුඹලාට වරදක් නොවේ. (මන්ද ඔවුහු දැන් නුඹලාගේ ආගමට අයත් අය ලෙස වෙනස් වූහ.) දෙවියන්ව ප්‍රතික්ෂේප කරන්නන්ගේ විවාහ ගිවිසුම් පිළිපැදීමට නුඹලා ඉදිරිපත් නොවූහ. (මුල් කාලයේ ප්‍රතික්ෂේප කරන්නන් තම කාන්තාවන්ව මුස්ලිම්වරුන්ට විවාහ කර දුන්හ. ඒ අන්දමින් මුස්ලිම්වරු ද ඔවුන්ට විවාහ කර දෙති. මෙම වැකිය මගින් එම අනුමැතිය වෙනස් විය.) තවද (නුඹලාගේ කාන්තාවන් ඉස්ලාමය අතහැර ඔවුන් වෙතට ගියොත්) නුඹලා වියදම් කළ (නුඹලාගේ මහර්) ප්‍රමාණය නුඹලා අසහු. ඔවුන් ද ඔවුන් වියදම් කළ (මහර්) ප්‍රමාණය ඇසුවාවේ. (විවරණ වියතුන් මෙසේ ප්‍රකාශ කරති. ඉස්ලාමයේ සිටි ගැහැණුන් කවරෙකු හෝ ඔවුන් වෙත ගියහොත් ඔවුන්ට දෙන ලද මහර් ප්‍රමාණය ඔවුන්ගෙන් අසා ලබා ගනු ඇත. ඒ අයුරින් ඔවුන්ගේ ගැහැණුන් මුස්ලිම්වරුන් ළඟට පැමිණි විට ඔවුහු මුස්ලිම්වරුන්ගෙන් අසා ලබා ගනිති) මෙය (හුදෙයිබියා ගිවිසුමෙන් පසු) අල්ලාහ් විසින් ඇති කළ තීන්දුවකි. ඔහු නුඹලා අතරේ තීන්දු කරයි. (ඉමාම් කුර්තුබී -රහ්මතුල්ලාහි අලෛයිහි- තුමා මෙසේ කියයි. මහර් ආපසු දිය යුතුයි යන තීන්දුව එකලට පමණක් වලංගු වූවකි. පසුව මෙම නීතිය වෙනස් කරන ලදී.) අල්ලාහ් සියලු දෑ දන්නා හා ඥානය ඇත්තාය.

11 නුඹලාගේ භාර්යාවන් (ඉස්ලාම් දහම අතහැර) ප්‍රතික්ෂේප කරන්නන් වෙත යාම නිසා (නුඹලා දුන් මහර් ප්‍රමාණයෙන්) කිසිවක් වැරදීමකින් නුඹලා (ඔවුන්ගෙන්) ලබා ගත්තෙහු නම් භාර්යාවන් අහිමි වූවන්ට (නුඹලාට ලැබුණු දැයින්) ඔවුන් දුන් මහර් ප්‍රමාණය දෙහු. (මෙය ආදේශ කරන්නන් ඔවුන් වෙත පැමිණි කාන්තාවන්ගේ මහර් ප්‍රමාණය නොදුන් අවස්ථාවකය) නුඹලා කුමන දෙවියෙකුව විශ්වාස කර ඇත්තේ හුද එම දෙවියාට බියවහු. (නුඹලාට දඬුවම් අනිවාර්ය විය හැකි කිසිම ක්‍රියාවක් නොකර වැළකී සිටිහු)

12 නබිවරයාණනි, විශ්වාස කළ කාන්තාවන් අල්ලාහ්ට කිසිවක් ආදේශ නොකරන බවත්

يَٰٓأَيُّهَا ٱلنَّبِيُّ إِذَا جَآءَكَ ٱلْمُؤْمِنَٰتُ يُبَايِعْنَكَ عَلَىٰٓ أَن لَّا يُشْرِكْنَ
بِٱللَّهِ شَيْـًٔا وَلَا يَسْرِقْنَ وَلَا يَزْنِينَ وَلَا يَقْتُلْنَ أَوْلَٰدَهُنَّ وَلَا يَأْتِينَ
بِبُهْتَٰنٍ يَفْتَرِينَهُۥ بَيْنَ أَيْدِيهِنَّ وَأَرْجُلِهِنَّ وَلَا يَعْصِينَكَ
فِى مَعْرُوفٍ فَبَايِعْهُنَّ وَٱسْتَغْفِرْ لَهُنَّ ٱللَّهَ إِنَّ ٱللَّهَ غَفُورٌ رَّحِيمٌ ١٢
يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوا۟ لَا تَتَوَلَّوْا۟ قَوْمًا غَضِبَ ٱللَّهُ عَلَيْهِمْ
قَدْ يَئِسُوا۟ مِنَ ٱلْءَاخِرَةِ كَمَا يَئِسَ ٱلْكُفَّارُ مِنْ أَصْحَٰبِ ٱلْقُبُورِ ١٣

ترتيبها ٦١ — سُورَةُ ٱلصَّفِّ — آياتها ١٤

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

سَبَّحَ لِلَّهِ مَا فِى ٱلسَّمَٰوَٰتِ وَمَا فِى ٱلْأَرْضِ وَهُوَ ٱلْعَزِيزُ ٱلْحَكِيمُ
١ يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوا۟ لِمَ تَقُولُونَ مَا لَا تَفْعَلُونَ ٢
كَبُرَ مَقْتًا عِندَ ٱللَّهِ أَن تَقُولُوا۟ مَا لَا تَفْعَلُونَ ٣ إِنَّ
ٱللَّهَ يُحِبُّ ٱلَّذِينَ يُقَٰتِلُونَ فِى سَبِيلِهِۦ صَفًّا كَأَنَّهُم
بُنْيَٰنٌ مَّرْصُوصٌ ٤ وَإِذْ قَالَ مُوسَىٰ لِقَوْمِهِۦ يَٰقَوْمِ لِمَ
تُؤْذُونَنِى وَقَد تَّعْلَمُونَ أَنِّى رَسُولُ ٱللَّهِ إِلَيْكُمْ فَلَمَّا
زَاغُوٓا۟ أَزَاغَ ٱللَّهُ قُلُوبَهُمْ وَٱللَّهُ لَا يَهْدِى ٱلْقَوْمَ ٱلْفَٰسِقِينَ ٥

සොරකම් නොකරන බවත් කාම අපචාරයේ නොයෙදෙන බවත් ජාහිලිය්යා (නූගත් කාලයේ මෙන් (ගැහැණු දරුවන් වළ දැමීම මගින්) ඔවුන්ගේ දරුවන් ඝාතනය නොකරන බවත් ඔවුන් අතරේ ඔවුන් පතුරවන ඕපාදූප නොකියන බවත් (මන්ද ජාහිලිය්යා කාලයේ ගැහැණු ඔවුන්ගේ ස්වාමි පුරුෂයින්ට අයත් නොවන දරුවන්ව ඔවුනට භාර දෙති. ඉමාම් බර්රාද -රහ්මතුල්ලාහි අලෙයිහි- තුමා මෙසේ ප්‍රකාශ කරයි. ගැහැණියක දරුවෙකුව අහුලාගෙන තම ස්වාමි පුරුෂයා දෙස බලා 'මේ නුඹ මගින් මා ලද දරුවෙකි'යි කියන්නීය. ඉබ්නු අබ්බාස් -රළියල්ලාහු අන්හු- තුමා මෙසේ පවසයි. ගැහැණු ළදරුවෙකුව ප්‍රසූත කළ කාන්තාවක එය දී පිරිමි ළදරුවෙකුව ලබාගන්නීය.) තවද යහපත් කාර්යයන්හි නුඹට වෙනස්කම් නොකරන බවත් පොරොන්දු වීමට නුඹ වෙත පැමිණියහොත් ඔවුන්ගේ එම පොරොන්දුව පිළිගන්න. තවද (ඔවුන් මෙම පොරොන්දුවීම වෙනුවෙන් ඔවුන් සඳහා අල්ලාහ්ගෙන් පාපක්ෂමාව ඇයදින්න. නියත වශයෙන්ම අල්ලාහ් පාපක්ෂමා කර දයාව පහළ කරන්නෙකු වන්නේය.

13 විශ්වාසවන්තයිනි, නුඹලා අල්ලාහ්ගේ කෝපයට ගොදුරු වී සිටින කණ්ඩායමක් සමඟ මිතුරු නොවනු. දෙවියන්ව ප්‍රතික්ෂේප කරන්නන් සොහොන් තුළ සිටින්නන් නැගිටුවීම පිළිබඳව විශ්වාසය අත්හළ සේ ඔවුහුද විශ්වාසය අත් හළහ.

# අස්-සෆ්

1 අහස්හි ද පොළොවෙහි ද ඇති දෑ අල්ලාහ්ව මෙනෙහි කරයි. ඔහු (සියල්ල) අබිබවා යන්නෙකි. දැනුම ඥානය ඇත්තෙකි.

2 විශ්වාසවන්තයිනි, නුඹලා නොකරන දේ ගැන කියනුයේ මන්ද (ඉබ්නු අබ්බාස් -රළියල්ලාහු අන්හු- තුමා මෙසේ කියයි. පුණ්‍ය සටන අනිවාර්ය වීමට පෙර සමහරෙක් අල්ලාහ් ඔහුට මනාප හොඳ ක්‍රියාවන් අපට දැනුම් දෙන්නේ නම් කළ හැකි යැයි කීහ. එහෙත් අල්ලාහ් තමාට වඩාත් මනාප හොඳ ක්‍රියාව වන්නේ 'ජිහාද්' යැයි දැන් වූ විට සමහරෙක් එයට අකැමැති වූහ. එය ඔවුන්ට දුෂ්කර ද විය. ඒ අවස්ථාවේ මෙම වැකිය පහළ විය.)

3 නුඹලා නොකරන දෑ කීම අල්ලාහ්ට ඉතා අප්‍රිය හා කෝපය ඇතිකරන දෙයකි. (තමා කිසිවක් නොකර තම කඩුවෙන් යුද්ධ කළ බවත් අහවල් අහ වල් අයව තමා ඝාතනය කළ බවත් නබි තුමන් වෙතට පැමිණ කියන පිරිසක් සම්බන්ධයෙන් මෙම වැකිය පහළ වූ බවද කියැවෙයි)

4 නියත වශයෙන්ම අල්ලාහ් ඔහුගේ මාර්ගයේ එකින් එකට සම්බන්ධ වී තිබෙන ගොඩනැගිල්ලක් සේ එකම සේනාවක් ලෙස ඉඳ සටන් කරන්නන්ව අල්ලාහ් ප්‍රිය කරයි. (අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කිරීම ඔහු මනාප ක්‍රියාවන්ගෙන් ඉතා උසස් වූ එකකි. නබිතුමාණෝ මෙසේ කීහ. ක්‍රියාවන්ගේ අත්තිවාරම ඉස්ලාමිය. එහි කුලුන සලාතයයි. එහි උසස් වූ වැදගත්ම කොටස අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කිරීමයි. මෙම පුණ්‍ය සටනේ මනාප ඇත්තෝ ඕනෑම අවස්ථාවක අප්‍රමාදව එයට පිළිතුරු දෙති.)

5 (අල්ලාහ් ඔහුගේ මාර්ගයේ සටන් කරන්නන් ගැන මනාප වන බව ප්‍රකාශ කර මූසා ඊසා (අලෙයිහිමස් සලාම්) ආදි දූතයින් දෙපොළ ගැන ද සඳහන් කරයි.) මූසා (අලෙයිහිස් සලාම්) තම සමාජය දෙස බලා 'නියත වශයෙන් මා අල්ලාහ් විසින් නුඹලා වෙත එවනු ලැබූ දූතයෙකු බව දැන දැනත් නුඹලා මට හිංසා කරන්නේ මන්දැ?'යි විමසූ සැටි සිහිපත් කරහි. (අල්ලාහ් නුඹලාට අනිවාර්ය කළ දැට වෙනස්කම් කිරීම තුළින් හෝ නුඹලා මට බැන වැදීම තුළින් හෝ නුඹලා මට කුමක් නිසා හිංසා කරන්නෙහුද? නබි නමැත්තා ගරු කළ යුතු කෙනෙකි. මා නුඹලාට එවන ලද නබි බව මා පෙන්වන ප්‍රාතිහාර්යයන් (මුඃජිසාත්) නැමැති සාධක මගින් ද දැන සිටින්නෙහුය.) ඔවුහු (ඔවුන්ගේ නබිට හිංසාකර සත්‍යයෙන්) දුරස්ථවූ විට අල්ලාහ් ද (සත්‍ය ආගමෙන්) ඔවුන්ගේ හදවත් දුරස්ථ කළේය.

6 මර්යම්ගේ පුත් ඊසා (අලෙයිහිස් සලාම්) ඉස්රායීල් දරුවන්ව බලා "මට පෙර වූ තව්රාතය සත්‍යය කරමින් ද මට පසුව අහ්මද් නැමැති නමින් යුතුව ඒමට සිටින දූතයා ගැනත් පෙර දැනුම් දීමක් කරන තත්ත්වයෙන් ද මා නුඹලා වෙත එවන ලද දූතයෙකි'යි කී බව සිහි කරහු. (අල්ලාහ් ඉන්ජීල් නමැති ආගම ප්‍රදානය කර දූතයෙකු ලෙස එව්වේය. එය තව්රාතයට වෙනස් එකක් නොවේ. එසේ නොව එය සත්‍යයක් ලෙසට තහවුරු කරයි. තවද මම මට

وَإِذْ قَالَ عِيسَى ٱبْنُ مَرْيَمَ يَٰبَنِىٓ إِسْرَٰٓءِيلَ إِنِّى رَسُولُ ٱللَّهِ إِلَيْكُم مُّصَدِّقًا
لِّمَا بَيْنَ يَدَىَّ مِنَ ٱلتَّوْرَىٰةِ وَمُبَشِّرًۢا بِرَسُولٍ يَأْتِى مِنۢ بَعْدِى ٱسْمُهُۥٓ أَحْمَدُ فَلَمَّا
جَآءَهُم بِٱلْبَيِّنَٰتِ قَالُوا۟ هَٰذَا سِحْرٌ مُّبِينٌ ٦ وَمَنْ أَظْلَمُ مِمَّنِ ٱفْتَرَىٰ
عَلَى ٱللَّهِ ٱلْكَذِبَ وَهُوَ يُدْعَىٰٓ إِلَى ٱلْإِسْلَٰمِ وَٱللَّهُ لَا يَهْدِى ٱلْقَوْمَ ٱلظَّٰلِمِينَ
٧ يُرِيدُونَ لِيُطْفِـُٔوا۟ نُورَ ٱللَّهِ بِأَفْوَٰهِهِمْ وَٱللَّهُ مُتِمُّ نُورِهِۦ وَلَوْ كَرِهَ
ٱلْكَٰفِرُونَ ٨ هُوَ ٱلَّذِىٓ أَرْسَلَ رَسُولَهُۥ بِٱلْهُدَىٰ وَدِينِ ٱلْحَقِّ لِيُظْهِرَهُۥ
عَلَى ٱلدِّينِ كُلِّهِۦ وَلَوْ كَرِهَ ٱلْمُشْرِكُونَ ٩ يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوا۟ هَلْ أَدُلُّكُمْ
عَلَىٰ تِجَٰرَةٍ تُنجِيكُم مِّنْ عَذَابٍ أَلِيمٍ ١٠ تُؤْمِنُونَ بِٱللَّهِ وَرَسُولِهِۦ وَتُجَٰهِدُونَ
فِى سَبِيلِ ٱللَّهِ بِأَمْوَٰلِكُمْ وَأَنفُسِكُمْ ذَٰلِكُمْ خَيْرٌ لَّكُمْ إِن كُنتُمْ تَعْلَمُونَ ١١
يَغْفِرْ لَكُمْ ذُنُوبَكُمْ وَيُدْخِلْكُمْ جَنَّٰتٍ تَجْرِى مِن تَحْتِهَا ٱلْأَنْهَٰرُ وَمَسَٰكِنَ
طَيِّبَةً فِى جَنَّٰتِ عَدْنٍ ذَٰلِكَ ٱلْفَوْزُ ٱلْعَظِيمُ ١٢ وَأُخْرَىٰ تُحِبُّونَهَا نَصْرٌ
مِّنَ ٱللَّهِ وَفَتْحٌ قَرِيبٌ وَبَشِّرِ ٱلْمُؤْمِنِينَ ١٣ يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوا۟ كُونُوٓا۟
أَنصَارَ ٱللَّهِ كَمَا قَالَ عِيسَى ٱبْنُ مَرْيَمَ لِلْحَوَارِيِّۦنَ مَنْ أَنصَارِىٓ إِلَى ٱللَّهِ
قَالَ ٱلْحَوَارِيُّونَ نَحْنُ أَنصَارُ ٱللَّهِ فَـَٔامَنَت طَّآئِفَةٌ مِّنۢ بَنِىٓ إِسْرَٰٓءِيلَ
وَكَفَرَت طَّآئِفَةٌ فَأَيَّدْنَا ٱلَّذِينَ ءَامَنُوا۟ عَلَىٰ عَدُوِّهِمْ فَأَصْبَحُوا۟ ظَٰهِرِينَ ١٤

පසුව ඒමට සිටින අහ්මද් නමැති දූතයෙකු ගැන ද නුඹලාට පෙර දැනුම් දීමක් කරමි.) ඊසා (අලෙයිහිස් සලාම්) තුමා ඔවුන් වෙත (මු:ජිසාත් නමැති) සාධක ගෙන ආ විට (ඔබ ගෙනැවිත් ඇති මෙම ආගම) පැහැදිලි හූනියමක් යැයි පැවසූහ.

7 (ආගම් වලින් වැදගත් වූද ප්‍රශංසනීය වූ ද) ඉස්ලාමය කරා කැඳවූ විට අල්ලාහ් මත බොරු ගොතා කියන්නාට වඩා ඉතාමත් අපරාධ කරුවෙක් වෙන කවරෙකු වෙයි ද? (වැදගත් ආගම කරා කැඳවනු ලැබූවෙකු අල්ලාහ් මත බොරු නොකියා එය පිළිගැනීම ඔහුගේ යුතුකමකි.) අක්‍රමිකතා කරන අයට සෘජු මඟ නොපෙන්වයි.

8 ඔවුහු තමන්ගේ කටවල් වලින් අල්ලාහ්ගේ ආලෝකය නිවීමට ඉදිරිපත් වෙති. (ඔවුන්ගේ බොරු ප්‍රකාශ මගින් ඉස්ලාමය හා එහි සෘජු මඟ අවහිර කිරීමට ඉදිරිපත් වීම අල්ලාහ්ගේ ආලෝකය තම කටින් පිඹ නිවීමට ඉදිරිපත් වීම වැනිය. ප්‍රතික්ෂේප කරන්නන් අකමැති වුවද අල්ලාහ් (ලෝකයේ සතර දිශාවේම ඉස්ලාමය මතුකර එය උසස් තත්ත්වයට පත් කිරීම මගින්) තම ආලෝකය සම්පූර්ණ කරයි.

9 තම දූතයාව සෘජු මගද සත්‍ය ආගමද දී එව්වේ ඔහුය. ආදේශ කරන්නන් අකැමති වුවද (ලෝකයේ පෙනෙන්නට ඇති) අනෙක් සෑම ආගම්වලට වඩා එය උසස් කිරීම සඳහා (එව්වේය.)

10 විශ්වාසවන්තයිනි, හිංසාවෙන් යුත් වේදනාවෙන් නුඹලාව ආරක්ෂා කරන ව්‍යාපාරයක් නුඹලාට දැනුම් දෙන්නද?

11 නුඹලා අල්ලාහ්ව ද ඔහුගේ දූතයාව ද විශ්වාස කරහු. තවද ඔහුගේ මාර්ගයේ නුඹලා දේපළ වලින් ද ප්‍රාණයන්ගෙන් ද සටන් කරහු. නුඹලා දන්නහු නම් එය නුඹලාට අගනේය. (අල්ලාහ් ඉහත සඳහන් යහපත් ක්‍රියාවන් වෙළඳාමට සම කරමින් ප්‍රකාශ කළේය. මන්ද වෙළඳාමෙන් ලාභ ලබන්නා සේ මෙයින් ද ඔවුහු නිරයෙන් ආරක්ෂාව ලබා ස්වර්ගයට පිවිසීම මගින් ලාභ ලබන්නෝය. විශ්වාස කිරීම යුද්ධ කිරීම ආදි දෙකටම අල්ලාහ් ලබාදෙන යහ විපාකය ස්වර්ගය වන්නේය. එය ලාභ ගෙන දෙන වෙළඳාමක් බව ඊළඟට එන වැකි මඟින් ඔහු පැහැදිලි කරන්නේය.)

12 (නුඹලා එසේ විශ්වාස කර සටන් කරන්නෙහු නම්) ඔහු (අල්ලාහ්) නුඹලාට නුඹලාගේ පව් ක්ෂමා කරන්නේය. තවද ඒවායින් ගංගා ගලා යන (ස්වර්ගයේ) උයන්වල ද සදාකාලික ස්වර්ගයන්හි දකින්නට ලැබෙන වැදගත් නිවහන්වල ද නුඹලාව ඔහු ඇතුල් කරවයි. (පාපයන්ට ක්ෂමාව දී සදාකාලික ස්වර්ගයන්හි ඇතුල් කිරීම) මහත් වූ ජයග්‍රහණය මෙයයි. (එයට ඉහළින් වෙනත් ජයග්‍රහණයක් නැත.)

13 තවද නුඹලාට නුඹලා කැමති තවත් කරුණක් ඇත. එය අල්ලාහ්ගෙන් ලැබෙන උදව්ව හා ළංවී ඇති ජයග්‍රහණය ද වෙයි. (කුරෙයිෂ් ප්‍රතික්ෂේපකයින්ට පරිහානියක් ලෙස නුඹලාට උදව් කිරීමත් මක්කා ජයග්‍රහණයත් වන්නේය. අදා නමැති විද්වතා මෙසේ කියයි. එය රෝමය හා පර්සියාවේ ජයග්‍රහණයයි) නුඹලා මෙම සුභාරංචිය විශ්වාසවන්තයින්ට දැනුම් දෙහු.

14 විශ්වාසවන්තයිනි, නුඹලා අල්ලාහ්ට (ඔහුගේ ආගමට තවදුරටත්) උදව් කරන්නන්ව සිටහු. ඊසා (අලෙයිහිස් සලාම්) තුමා (තමාගේ සමීපතම සගයින් වන) හවාරිය්යීන්ලාව අමතා 'අල්ලාහ්(ගේ ආගම) කෙරෙහි මට උදව් කරන්නෝ කවරහු දැ?'යි ඇසූ විට අප අල්ලාහ්ගේ උදව් කරුවන් යැයි ඔවුහු පැවසූහ. (එහෙයින් නුඹලා ද ඔවුන් සේ උදව් කරුවන්ව සිටිහු. හවාරිය්යූන් නැමැත්තෝ ඊසා (අලෙයිහිස් සලාම්) තුමාගේ උදව් කරුවන් ද විශ්වාසවන්ත මිත්‍රයින් ද එතුමාව මුලින්ම විශ්වාස කළ අයද වන්නෝය. මොවුන් දොළොස් දෙනෙකි. බනූ ඉස්රායීල්වරුන් ගෙන් කොටසක් ඊසා (අලෙයිහිස් සලාම්) තුමාව විශ්වාස කළහ. තවත් කොටසක් එතුමාව ප්‍රතික්ෂේප කළහ. අප විශ්වාසවන්තයින්ව ඔවුන්ගේ සතුරන් ලෙස (මංමුළාවූවන්ට පරිහානියක් ලෙස) බලවත් කළෙමු. එහෙයින් ඔවුහු ජයග්‍රහකයින් බවට පත් වූහ. (කතාදා -රහ්මතුල්ලාහි අලෙයිහි- තුමා මෙසේ ප්‍රකාශ කරයි. විශ්වාසවන්තයිනි, අල්ලාහ්ගේ උදව්කරුවන් ලෙස සිටිහුයි වැකිය විග්‍රහ කරන විට එය සිදු වී අවසන් විය. අකබා ප්‍රතිඥාවේ දී 70 දෙනෙක් ඉස්ලාමය පිළිගෙන ප්‍රතිඥාවට සහභාගි වූහ. ඔවුහු නබිතුමන්ට තම ගමේ ඉඩ ලබා දුන්හ. ආගම දියුණු තත්ත්වයට පත් වනතුරු උදව් කළහ. -අබ්දුර් රස්සාක්- නබි -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමා වෙත පැමිණ බයිඅත් කළ අයට මෙසේ පැවසූහ. නුඹලා නුඹලාගෙන් දෙළොස් දෙනෙකුව තෝරා ගනු. ඔවුහු ඊසාතුමාට හවාරිය්යූන්වරුන් භාරකරුවන්ව

سُورَةُ الجُمُعَةِ

ترتيبها ٦٢ — آياتها ١١

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

يُسَبِّحُ لِلَّهِ مَا فِى ٱلسَّمَٰوَٰتِ وَمَا فِى ٱلْأَرْضِ ٱلْمَلِكِ ٱلْقُدُّوسِ ٱلْعَزِيزِ
ٱلْحَكِيمِ ﴿١﴾ هُوَ ٱلَّذِى بَعَثَ فِى ٱلْأُمِّيِّۦنَ رَسُولًا مِّنْهُمْ يَتْلُوا۟
عَلَيْهِمْ ءَايَٰتِهِۦ وَيُزَكِّيهِمْ وَيُعَلِّمُهُمُ ٱلْكِتَٰبَ وَٱلْحِكْمَةَ وَإِن كَانُوا۟
مِن قَبْلُ لَفِى ضَلَٰلٍ مُّبِينٍ ﴿٢﴾ وَءَاخَرِينَ مِنْهُمْ لَمَّا يَلْحَقُوا۟ بِهِمْ ۚ
وَهُوَ ٱلْعَزِيزُ ٱلْحَكِيمُ ﴿٣﴾ ذَٰلِكَ فَضْلُ ٱللَّهِ يُؤْتِيهِ مَن يَشَآءُ ۚ وَٱللَّهُ
ذُو ٱلْفَضْلِ ٱلْعَظِيمِ ﴿٤﴾ مَثَلُ ٱلَّذِينَ حُمِّلُوا۟ ٱلتَّوْرَىٰةَ ثُمَّ لَمْ
يَحْمِلُوهَا كَمَثَلِ ٱلْحِمَارِ يَحْمِلُ أَسْفَارًۢا ۚ بِئْسَ مَثَلُ ٱلْقَوْمِ
ٱلَّذِينَ كَذَّبُوا۟ بِـَٔايَٰتِ ٱللَّهِ ۚ وَٱللَّهُ لَا يَهْدِى ٱلْقَوْمَ ٱلظَّٰلِمِينَ ﴿٥﴾
قُلْ يَٰٓأَيُّهَا ٱلَّذِينَ هَادُوٓا۟ إِن زَعَمْتُمْ أَنَّكُمْ أَوْلِيَآءُ لِلَّهِ مِن
دُونِ ٱلنَّاسِ فَتَمَنَّوُا۟ ٱلْمَوْتَ إِن كُنتُمْ صَٰدِقِينَ ﴿٦﴾ وَلَا يَتَمَنَّوْنَهُۥٓ
أَبَدًۢا بِمَا قَدَّمَتْ أَيْدِيهِمْ ۚ وَٱللَّهُ عَلِيمٌۢ بِٱلظَّٰلِمِينَ ﴿٧﴾ قُلْ إِنَّ
ٱلْمَوْتَ ٱلَّذِى تَفِرُّونَ مِنْهُ فَإِنَّهُۥ مُلَٰقِيكُمْ ۖ ثُمَّ تُرَدُّونَ
إِلَىٰ عَٰلِمِ ٱلْغَيْبِ وَٱلشَّهَٰدَةِ فَيُنَبِّئُكُم بِمَا كُنتُمْ تَعْمَلُونَ ﴿٨﴾

සිටියා සේ භාරකරුවන්ව සිටිති'යි පවසා තෝරාගත් අය දෙස බලා හවාරිය්යුන්වරු ඊසා තුමාගේ දෑවාවට භාකරුවන් සිටියා සේ නුඹලා භාරකරුවන්ව සිටිහුයි කී විට මා මාගේ කණ්ඩායමට භාරකරුයි කීම් එය එතුමාණෝ පිළිගත්හ.)

## අල්-ජුමුආහ්

1 (සියල්ල කෙරෙහි) රජෙකු ද (සියලු ඌනතාවන්ගෙන්) සුවිශුද්ධ වූ ද (සියල්ල) අබිබවා යන්නෙකු වූ ද දැනුම ඥානය ඇත්තා වූ ද අල්ලාහ්ව අහස්හි ද පොළොවෙහි ද ඇති දෑ මෙනෙහි කරන්නේය.

2 2. ඔහුම නූගතුන් අතරින් ඔවුන්ගෙන්ම දූතයෙකු එව්වේය. (මෙම වැකියේ උම්මියීන් යන වදන මගින් මුළු අරාබි සමූහයාම අදහස් කරනු ලබති. මෙයට අකුරු දන්න අය ද නොදන්න අය ද ඇතුළත් වෙති. ඔවුහු පුස්තකයන් ලබා දෙනු ලැබ ඒවා ගැන දැනුමක් ඔවුනට නැති හේතුව නිසාම මේ වදන ඔවුන්ට භාවිත වී ඇත. මූලික වශයෙන් උම්මි යනුවෙන් හඳුන්වනුයේ ලිවීමට හා කියවීමට නොහැකි අයයි. එදා ජීවත් වූ අරාබි ජනතාවගෙන් බොහෝ දෙනෙක් මෙම තත්ත්වයෙන් පසු වූහ.) ඔහු (ලිවීමට හෝ කියවීමට දන්නෙකුව සිටිය ද) ඔවුනට (දෙවියන්ව ප්‍රතික්ෂේප කිරීම පාපයන් නරක ගතිගුණ ආදියෙන් ඉවත් කර) පවිත්‍ර කරයි. තවද ඔවුනට ධර්මය ද (අල්-කුර්ආනය ද) ඥානය (සුන්නාහ්ව) ද උගන්වයි. (ඉමාම් මාලික් තුමා අල්-කිතාබ් යනු ලිවීමේ දැනුමත් අල්-හික්මා යනු ආගමික අවබෝධයත් බව හඳුන්වයි යැයි සඳහන් කරයි) නියත වශයෙන්ම ඔවුහු මෙයට පෙර (ආදේශ කිරීම වැනි) පැහැදිලි මංමුළාවේම සිටියෝය.

3 තවද මෙතෙක් පැමිණ එකතු නොවූ (ඔවුනට පසු බිහිවිය හැකි) වෙනත් බොහෝ දෙනෙකුව ද ඔහු පවිත්‍ර කරයි. (ඔවුහු නබිම්තුරන්ට පසුව ආ අය ද අවසන් දිනය දන්වා පැමිණීමට ඇති මුස්ලිම්වරු ද වන්නෝය. අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) මෙසේ පවසයි. සූරත් අල්-ජුම්ආ පහළ වූ අවස්ථාවේ අපි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමන් අසල වාඩිවී සිටියෙමු. එතුමෝ අපට එය කියවා පෙන්වූහ. මෙතෙක් පැමිණ එක් නොවුන වෙනත් බොහෝ දෙනෙකුවද (එතුමාණෝ පවිත්‍ර කරති.) යන වැකියට පැමිණි විට අයෙක් ඔවුහු කවරහු දැ?යි ඇසීය. එවිට සල්මාන් අල්-ෆාරිස් නමැති නබි මිත්‍රයා මත තම අත තබා කවෙරෙකුගේ දෑතෙහි මාගේ ප්‍රාණය තිබෙන්නේ ද ඔහු මත දිවුරන්නෙමි සුරෙයියා නමැති තරුවේ විශ්වාසය තිබුණත් මොවුන්ට අයත් (ඉරාන්) සමහර මිනිසුන් එයට සම්ප්‍රාප්ත වෙති යැයි පැවසූහ.) ඔහු අබිබවා යන්නෙකු ද දැනුම ඥානය ඇත්තෙකු ද වන්නේය.

4 එය අල්ලාහ්ගේ දයාවයි. ඔහු තමාට මනාප අයට එය දෙයි. අල්ලාහ් මහත් දයාවන් ඇත්තෙකි.

5 තව්රාතය ඔවුන් මත පටවා (එය පිළිගෙන කටයුතු කරන ලෙස අණ කරනු ලැබ) පසුව නොඋසුලන ලද අයට (ඒ අනුව කටයුතු නොකළ අයට) උදාහරණය වන්නේ (පිටේ පොත් පටවාගත් බූරුවන් වැනිය. (බූරුවන්ගේ පිටේ පටවා ඇත්තේ අඟනා මහා ග්‍රන්ථද නැත්නම් සුළු භාණ්ඩ ද? නොදනී) අල්ලාහ්ගේ වාක්‍ය බොරු කරන්නන්ගේ උදාහරණය ඉතා නරකය. (මෙම උදාහරණය තමන්ට පිරිනමන ලද තව්රාතය පිළිනොගෙන කටයුතු නොකළ යුදෙව්වන්ට කී එකකි. මෙම උදාහරණය මගින් නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා වේදිකාවේ සිට දේශනයක් කරමින් සිටිය දී වෙළෙඳ කණ්ඩායම දුටු සැනින් නබි තුමන්ව අතහැර ගිය මුස්ලිම්වරුන්ට අල්ලාහ් අවවාද කරයි. මේ වගේම ඉමාම් කුත්බා දේශනය පවත්වද්දී කථා කරන්නාව නබිතුමා බූරුවාට සමාන කරමින් ප්‍රකාශ කර එසේ කථා කරන්නාව බලා කටවහන්න යැයි ප්‍රකාශ කළහොත් ඔහු ද ජුමුආහ්වේ ප්‍රයෝජනය අහිමි කරගන්නේ යැයි පවසා ඇත්තේය.) නමුත් මෙම හදීසය ලර්ෆ්(දූර්වල)ය. අල්ලාහ් අපරාධ (අක්‍රමිකතා) කරන්නන්ට යහමඟ පෙන්වන්නේ නැත.

6 (යුදෙව්වෝ තමන් අනෙක් මිනිසුන්ට වඩා වැදගත් අය බවද තමන් පමණක් අල්ලාහ්ගේ මිත්‍රයින් බව ද අල්ලාහ්ගේ දරුවන් බව ද ඔහුගේ ප්‍රියාදරයින් බව ද වාද කරමින් සිටියහ. අල්ලාහ් ඔවුන්ව බලා මෙසේ ප්‍රකාශ කරයි. (නබිවරයාණනි,) නුඹ කියහි. යුදෙව්වනි, අනෙක් මිනිසුන් නොව අල්ලාහ්ගේ ප්‍රියාදරයින් නුඹලා යැයි නුඹලා වාදකරන්නේ නම් නුඹලා මෙහි සත්‍යවදීන් නම් මරණය ආශා කරහු.

يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوٓا۟ إِذَا نُودِىَ لِلصَّلَوٰةِ مِن يَوْمِ ٱلْجُمُعَةِ
فَٱسْعَوْا۟ إِلَىٰ ذِكْرِ ٱللَّهِ وَذَرُوا۟ ٱلْبَيْعَ ۚ ذَٰلِكُمْ خَيْرٌ لَّكُمْ إِن كُنتُمْ
تَعْلَمُونَ ﴿٩﴾ فَإِذَا قُضِيَتِ ٱلصَّلَوٰةُ فَٱنتَشِرُوا۟ فِى ٱلْأَرْضِ
وَٱبْتَغُوا۟ مِن فَضْلِ ٱللَّهِ وَٱذْكُرُوا۟ ٱللَّهَ كَثِيرًا لَّعَلَّكُمْ تُفْلِحُونَ
﴿١٠﴾ وَإِذَا رَأَوْا۟ تِجَٰرَةً أَوْ لَهْوًا ٱنفَضُّوٓا۟ إِلَيْهَا وَتَرَكُوكَ قَآئِمًا ۚ قُلْ
مَا عِندَ ٱللَّهِ خَيْرٌ مِّنَ ٱللَّهْوِ وَمِنَ ٱلتِّجَٰرَةِ ۚ وَٱللَّهُ خَيْرُ ٱلرَّٰزِقِينَ ﴿١١﴾

## سُورَةُ المُنَافِقُونَ

ترتيبها ٦٣ — آياتها ١١

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

إِذَا جَآءَكَ ٱلْمُنَٰفِقُونَ قَالُوا۟ نَشْهَدُ إِنَّكَ لَرَسُولُ ٱللَّهِ ۗ وَٱللَّهُ يَعْلَمُ
إِنَّكَ لَرَسُولُهُۥ وَٱللَّهُ يَشْهَدُ إِنَّ ٱلْمُنَٰفِقِينَ لَكَٰذِبُونَ ﴿١﴾
ٱتَّخَذُوٓا۟ أَيْمَٰنَهُمْ جُنَّةً فَصَدُّوا۟ عَن سَبِيلِ ٱللَّهِ ۚ إِنَّهُمْ سَآءَ مَا كَانُوا۟
يَعْمَلُونَ ﴿٢﴾ ذَٰلِكَ بِأَنَّهُمْ ءَامَنُوا۟ ثُمَّ كَفَرُوا۟ فَطُبِعَ عَلَىٰ قُلُوبِهِمْ
فَهُمْ لَا يَفْقَهُونَ ﴿٣﴾ ۞ وَإِذَا رَأَيْتَهُمْ تُعْجِبُكَ أَجْسَامُهُمْ ۖ
وَإِن يَقُولُوا۟ تَسْمَعْ لِقَوْلِهِمْ ۖ كَأَنَّهُمْ خُشُبٌ مُّسَنَّدَةٌ ۖ يَحْسَبُونَ كُلَّ
صَيْحَةٍ عَلَيْهِمْ ۚ هُمُ ٱلْعَدُوُّ فَٱحْذَرْهُمْ ۚ قَٰتَلَهُمُ ٱللَّهُ ۖ أَنَّىٰ يُؤْفَكُونَ ﴿٤﴾

(මන්ද තමා ස්වර්ගවාසියෙක් බව දන්නා කෙනෙක්
එහි යාම සඳහා මරණයට ආශා කරයි.)
7 ඔවුන් ගේ අත් කලින්ම යවන ලද ක්‍රියාවන්
(දෙවියන් ප්‍රතික්ෂේප කිරීම පාප ක්‍රියා පුස්තකයන්
වෙනස් කිරීම ආදිය) හේතුකොටගෙන එය ඔවුහු
කිසිවිටෙක මනාප නොවෙති. අල්ලාහ් අක්‍රමිකතා
කරන්නවුන් දැන සිටී.
8 (නබිවරයාණනි) ඔවුනට නුඹ පවසහි කුමන
මරණයකිනි වෙන් වී නුඹලා පලා දුවන්නෙහු ද එම
මරණය නුඹලාට නියත වශයෙන්ම හමුවන්නේය.
(නුඹලා කුමන ස්ථානයකට ගැලවී දුවන්නෙහු ද එම
ස්ථානයේදී එය නුඹලාව හමුවෙයි.) පසුව නුඹලා
සැඟවුන දේවල් ද පැහැදිලි දේවල් ද දැන සිටින්නා
(අල්ලාහ්) හමුවට යොමු කෙරෙන්නෙහුය. (ඒ පරලොව
දීය) එහෙයින් නුඹලා කර ඇති (නරක ක්‍රියාවන්) ඔහු
නුඹලාට දන්වයි. (ඒවාට විපාක ද ලබා දෙයි)
9 විශ්වාස වන්තයිනි, සිකුරාදා දිනයන්හි සලාතය
සඳහා කැඳවනු ලැබුවොත් (මෙම කැඳවීම ඉමාම්
වේදිකාවේ වාඩි වූ පසු කියනු ලබන අදාන්ය. මන් ද
නබිතුමන්ගේ කාලයේ මෙම අදානය පමණක් දකින්න
ලැබිණ. ජුමුආහ්ව සඳහා පෙර අදානය මදීනාව
විශාල වූ පසු උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා
විසින් නබි මිතුරන් ඉදිරියේ ඇති කරන ලද්දකි.)
නුඹලා අල්ලාහ්ව සිහිපත් කිරීම සඳහා (කුත්බා හා
ජුම්ආ සලාතය කරා) යනු. (ස්නානය වුළූ කිරීම
මස්ජිද් කරා යාම වැනි එහි ක්‍රියාවන්හි ද නිරත වනු.)
තවද වෙළෙඳාම අත් හරිනු. (අනෙක් රැකියාවන් ද
මෙසේමය සිකුරාදා මුඅස්සින් අදාන් ප්‍රකාශ කරයි
නම් විකිනීම හෝ මිලදී ගැනීම හලාල් නොවන්නේය.)
නුඹලා දන්නා අය නම් එය නුඹලාට වැදගත් වන්නේය.
(වෙළෙඳාම වැනි දේවල් අතහැර කුත්බා හා ජුම්ආ
සලාතයට යාම වෙළෙඳාම් කිරීමට වඩා වැදගත්ය.)
10 සලාතය ඉටුකළ පසුව (එය නුඹලා ඉටුකර නිම
කළෙහු නම් වෙළෙඳාමට ද වෙනත් රැකියාවන්ට ද)
නුඹලා වෙන්ව ගොස් අල්ලාහ් (වෙළෙඳාම මගින් ද
වෙනත් ආදායම් මාර්ගවලින් ද පිරිනමන) දයාවන්ගෙන්
ද නුඹලා සොයා ගනු. තවද නුඹලා (දෙලොව
භාග්‍යයන්ගෙන්) ජය ගැනීම සඳහා (නුඹලාගේ
වෙළෙඳ රැකියා කටයුතු අතරේ) අල්ලාහ්ව අධිකව
සිහිපත් කරගනු. (ඔහු නුඹලාට දෙලොව යහපත්
භාග්‍යයන්ට මග පෙන්වූ නිසා ඔහුට කෘතවේදී වනු.)
11 නබිවරයාණනි, ඔවුහු වෙළෙඳාම හෝ එසේත්
නැත්නම් විනෝදාංශයක් හෝ දකින්නෙහු නම් ඒ කරා
ඔවුහු වෙන්වී යන්නෝය. (නුඹ වේදිකාවේ) සිටියදීම
ඔවුහු නුඹව අත්හැර යන්නෝය. (මෙම වැකිය පළ වූ
අවස්ථාව මදීනා වැසියන්ට සාගතයද අවශ්‍යතාද
තිබිණ. නබිතුමන් සිකුරාදා දින කුත්බා දේශනය
පවත්වමින් සිටින විට සිරියාව වැනි ප්‍රදේශවල සිට
වෙළඳ කණ්ඩායමක් පැමිණියේය. ජනතාව ඒ කරා
ගියෝය. මස්ජිදයේ නබිතුමන් සමග දොළොස්
දෙනෙක් පමණක් ඉතිරිව සිටියහ. ඒ අවස්ථාවේ
මෙම වැකි පහළ විය. (නබිවරයාණනි,) නුඹ කියනු.
අල්ලාහ් ළග ඇති දෑ (ඔහු පිරිනමන අනන්ත වූ
විපාකය වූ ස්වර්ගය මස්ජිදයේ සිට කුත්බාවට
සවන් දීම අතහැර ගිය) එම වෙළෙඳාමට වඩා
විනෝදාංශයට වඩා ද අගනේය. අල්ලාහ් ආහාර
සපයන්නන්ගෙන් ඉතා වැදගත් කෙනෙකි.

## අල්-මුනාෆිකූන්

1 නුඹ වෙත කුහකයින් පැමිණියොත් නියත වශයෙන්
ඔබ අල්ලාහ්ගේ දූතයෙකු යැයි අපි සාක්ෂි දරමුයි
කියති. (එය තම හදවතින්ම එන බව නබිතුමාට
දැන්වීම පිණිස තම සාක්ෂිය තහවුරු කර ප්‍රකාශ
කරති.) නියත වශයෙන්ම නුඹ ඔහුගේ දූතයෙකු බව
අල්ලාහ් දනී. නියතවශයෙන්ම කුහකයින් බොරුකාරයින්
බවට අල්ලාහ් සාක්ෂි දරයි. ඔවුන්ගේ සාක්ෂියේ කී
දේ සත්‍යය වුව ද විශ්වාසයෙන් යුතුව හදවතෙන්
සම්පූර්ණයෙන් එය පිළිගෙන ප්‍රකාශ කරන්නා සේ
පෙන්වීමට ඉදිරිපත් වූහ. (එහි ඔවුහු බොරු කාරයෝය.)
2 ඔහු තම දිවුරිලි (ඝාතනය කිරීම බන්ධනාගත කිරීම
ආදියෙන් තමන් ආරක්ෂා කරන) පලිහයක් කර
ගත්හ. තවද අල්ලාහ්ගේ මාර්ගයෙන් වැළැක් වූහ.
(නබිත්වයට දොස් කියමින්ද ඒ පිළිබඳව සැකය ඇති
කරමින් ද පුණ්‍ය සටන් කිරීම හා අනෙකුත් යහපත්
ක්‍රියා කිරීමෙන් ඔවුහු ජනතාව වැළැක් වූහ.)
නියතවශයෙන්ම ඔවුන් කරන මෙම ක්‍රියාවන් (කුහකකම
හා සෑජු මගෙන් ජනතාව වැළැක් වීම) ඉතා නරකය.
3 ඒ ඔවුන් (කුහක කමින් යුතුව) විශ්වාස කර පසුව
ඔවුන් ප්‍රතික්ෂේප කළ නිසාය. මෙම හේතුවෙන්

وَإِذَا قِيلَ لَهُمْ تَعَالَوْا يَسْتَغْفِرْ لَكُمْ رَسُولُ اللَّهِ لَوَّوْا رُءُوسَهُمْ
وَرَأَيْتَهُمْ يَصُدُّونَ وَهُم مُّسْتَكْبِرُونَ ﴿٥﴾ سَوَاءٌ عَلَيْهِمْ
أَسْتَغْفَرْتَ لَهُمْ أَمْ لَمْ تَسْتَغْفِرْ لَهُمْ لَن يَغْفِرَ اللَّهُ لَهُمْ ۚ إِنَّ
اللَّهَ لَا يَهْدِي الْقَوْمَ الْفَاسِقِينَ ﴿٦﴾ هُمُ الَّذِينَ يَقُولُونَ
لَا تُنفِقُوا عَلَىٰ مَنْ عِندَ رَسُولِ اللَّهِ حَتَّىٰ يَنفَضُّوا ۗ وَلِلَّهِ
خَزَائِنُ السَّمَاوَاتِ وَالْأَرْضِ وَلَٰكِنَّ الْمُنَافِقِينَ لَا يَفْقَهُونَ
﴿٧﴾ يَقُولُونَ لَئِن رَّجَعْنَا إِلَى الْمَدِينَةِ لَيُخْرِجَنَّ الْأَعَزُّ
مِنْهَا الْأَذَلَّ ۚ وَلِلَّهِ الْعِزَّةُ وَلِرَسُولِهِ وَلِلْمُؤْمِنِينَ وَلَٰكِنَّ
الْمُنَافِقِينَ لَا يَعْلَمُونَ ﴿٨﴾ يَا أَيُّهَا الَّذِينَ آمَنُوا لَا تُلْهِكُمْ
أَمْوَالُكُمْ وَلَا أَوْلَادُكُمْ عَن ذِكْرِ اللَّهِ ۚ وَمَن يَفْعَلْ
ذَٰلِكَ فَأُولَٰئِكَ هُمُ الْخَاسِرُونَ ﴿٩﴾ وَأَنفِقُوا مِن مَّا رَزَقْنَاكُم
مِّن قَبْلِ أَن يَأْتِيَ أَحَدَكُمُ الْمَوْتُ فَيَقُولَ رَبِّ لَوْلَا أَخَّرْتَنِي
إِلَىٰ أَجَلٍ قَرِيبٍ فَأَصَّدَّقَ وَأَكُن مِّنَ الصَّالِحِينَ ﴿١٠﴾ وَلَن
يُؤَخِّرَ اللَّهُ نَفْسًا إِذَا جَاءَ أَجَلُهَا ۚ وَاللَّهُ خَبِيرٌ بِمَا تَعْمَلُونَ ﴿١١﴾

ترتيبها ٦٤ — سُورَةُ التَّغَابُنِ — آياتها ١٨

ඔවුන්ගේ හදවත්වල මුද්‍රාව තැබිණ. (මීට පසු) ඔවුහු විශ්වාස නොකරති. (තමන්ට කුමක සෘජුමග හා යහපත ඇත්තේ දැයි) ඔවු නොදනිති.

4 නුඹලා ඔවුන්ව දකින්නෙහු නම් ඔවුන්ගේ ශරීරයන් නුඹලාව විස්මයට පත් කරවයි. (ඒවා ඉතා ලස්සන වූ ද ආකර්ශනීය වූ ද පෙනුමකින් යුක්ත වෙයි.) ඔවුහු කථා කරත් නම් ඔවුන්ගේ වචනවලට සවන් දීගෙනම සිටින්නෝය. (ඔවුන් පැහැදිලිව ද ලස්සන ලෙස ද රසවත්ව ද කථා කරන නිසා නුඹලා එය සත්‍ය යැයි විශ්වාස කරන්නෙහුය. ඔවුන්ගේ නායකයා අබ්දුල්ලාහ් බින් උබෙයි ඉතා ලස්සනට ද ආකර්ශනීය ලෙස ද කථා කරන්නෙකි. ආකර්ශනීය පෙනුමකින් ද යුක්ත වන්නේය.) ඔවුහු (ආගමේ කිසිම අවබෝධයක් හා දැනුමක් නැති තත්ත්වය) බිත්තිවලට හේත්තු කර ඇති කොට වැනිය. (ඔවුන් හොඳ පරිනාහ දේහයක් ලබාගෙන සිටිය ද ඉතා බියගුල්ලන්ය. එහෙයින්) පැමිණෙන හැම ශබ්දයක්ම තමන්ට විපතක් ලෙස (දඬුවමක් ලෙස) සිතති. නුඹලාගේ සතුරන් ඔවුන්ය. (ඔවුන් නුඹලාගෙන් අවස්ථාවක් ලබා ගැනීමෙහි නැත්නම් නුඹලාගේ රහස් දැන ගැනීමෙහි) නුඹලා ප්‍රවේශම් වහු. (මන්ද ඔවුහු ප්‍රතික්ෂේප කරන්නන්ගේ ඔත්තුකරුවන් ලෙස ක්‍රියා කරති.) අල්ලාහ් ඔවුන්හට ශාප කරත්වා ඔවුහු කෙසේ නම් සත්‍යය අතහැර හරවනු ලබන්නෝද? (දෙවියන් ප්‍රතික්ෂේප කරන්නන්ට පක්ෂග්‍රාහී වන්නෝ ද)

5 නුඹලා එහු. අල්ලාහ්ගේ දූතයාණන් නුඹලා වෙනුවෙන් පාපක්ෂමාව අයැදීවි යැයි කියනු ලැබුවොත් (ඒ ගැන සමච්චල් කරනවුන් ලෙස ද පාපක්ෂමාව ඉල්ලීම නොසලකා හරින්නන් ලෙසත්) තමන්ගේ හිස් සොලවති. (ඔවුන් රසූල් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමන්ව නොසලකා නැවිත්) ආඩම්බරයෙන් වළක්වා ගැනීම (නබිතුමනි) නුඹ දකීවි. (ඔවුහු නබිතුමන් වෙත ඒමද පාපක්ෂමාව ඉල්ලීමත් තමන්ට නින්දාවක් සේ සැලකූහ.)

6 නුඹලා ඔවුන් වෙනුවෙන් පාපක්ෂමාව ඇයදීමත් ඇයද නොසිටීමත් සමාන වේ. (කුහක කමෙහි ද දෙවියන් ප්‍රතික්ෂේප කිරීමෙහි ද දිගටම සිටින නිසා එය ඔවුනට ප්‍රයෝජනවත් නොවේ.) අල්ලාහ් (කුහක කමේ ඔවුන් සිටින තාක්) ඔවුන්ට ක්ෂමා නොකරන්නේය. (සම්පූර්ණයෙන් ඔහුගේ වත්පිළිවෙත්වලින් ඈත්වී පාපයෙහි ගිලී සිටින) පාපිෂ්ඨයින් වන පිරිසකට අල්ලාහ් සෘජු මඟ නොපෙන්වන්නේය. (මෙහි කුහකයෝ ප්‍රථමයෙන් ඇතුල් වෙති)

7 අල්ලාහ්ගේ දූතයාණන් සමග සිටින (හිජ්රත් පැමිණි අයගෙන් දිළිඳු අයට) ඔවුන් (එතුමන් අතහැර) වෙන් වී එනතෙක් කිසිවක් වියදම් නොකරන්න යනුවෙන් පවසන්නේ ඔවුන්ය. අහස්හි ද පොළොවෙහි ද භාණ්ඩාගාරය ඇත්තේ ඔහු සතුවය. (මේ මුහාජිර්වරුන්ට ආහාර සපයන්නේ ඔහුමය) එසේ තිබියදීත් මෙම කුහකයෝ (සියලුම භාණ්ඩාගාර අල්ලාහ් සතුව ඇති බව) තේරුම් නොගන්නෝය. (එහෙයින් අල්ලාහ් විශ්වාස වන්තයින්ට ඇති තරම් කිසිවක් නොදෙන්නේ යැයි සිතති.

8 ඔවුහු මෙසේ ප්‍රකාශ කරති. අප මදීනාහ්වට ආපසු ගියොත් අපගේ ගෞරවනීය පුද්ගලයා ඉතා පහත් පුද්ගලයාව එයින් පිටුවහල් කරන්නේය. ගෞරවය හිමිවන්නේ අල්ලාහ්ට ද ඔහුගේ දූතයාණන්ට හා විශ්වාස කරන අයලුන් හටයි. එය කුහකයෝ නොදනිති. (මෙසේ කීවේ කුහකයින්ගේ නායකයා වූ අබ්දුල්ලාහ් බින් උබෙයි නැමැත්තාය. ඉතා ගෞරවනීය අය ලෙස තමාව හා තමාගේ පාක්ෂිකයින්ව ද ඉතා පහත් අය ලෙස නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් හා එතුමාණන් සමඟ සිටිය අයවද සඳහන් කරන්නේය. සෙයිද් බින් අර්කම් තුමා මෙසේ සඳහන් කරයි. මම නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමන් සමඟ යුද්ධයකට සහභාගි වී සිටියෙමි. එහිදී අබ්දුල්ලාහ් බින් උබෙයි මෙසේ කීය. අප මදීනාහ්වට ආපසු ගියොත් එහි ගෞරවනීය අය පහත් අයව පිටුවහල් කරයි මම නබිතුමාණන් වෙත පැමිණ එතුමන්ට මෙම පුවත දැනුම් දුනිමි. අබ්දුල්ලාහ් බින් උබෙයි එලෙස කිසිවක් සිදුනොවුනේ යැයි දිවුරා කීය. මගේ පිරිස මට දොස් පැවරූහ. නුඹ මේ ක්‍රියාව කළේ මන්දැ?යි විමසූහ. මම ශෝකයෙන් නින්දට ගියෙමි. නබිතුමාණන් මා කැඳවා ඔබ සත්‍ය ප්‍රකාශ කළෙහි යැයි අල්ලාහ් වැකිය පහළ කළේය යැයි පැවසූහ.

9 විශ්වාස වන්තයිනි, නුඹලාගේ වස්තුව ද දරුවන් ද අල්ලාහ්ව සිහිකිරීම අතහැර නුඹලා (අවධානය) නොහරවන්න. (අල්ලාහ්ගේ යුතුකම් නොසලකා හැර වස්තුව හා දරුවන් කෙරෙහි ද අවධානය යොමු

කිරීම කුහකයින්ගේ ගුණයකි. අල්ලාහ් මේ පිළිබඳව විශ්වාසවන්තයින්ට අවවාද කරයි. තවද මෙහි අල්ලාහ් සිහි කිරීම යනුවෙන් හඳුන්වනුයේ අල්ලාහ් නියම කළ යුතුකම්ය.) එසේ කවරෙකු හෝ කළහොත් (ආගමෙන් දුරස්ථ වී වස්තුව හා දරුවන් කෙරෙහි අවධානය යොමු කළොත්) පාඩු ලද්දෝ ඔවුහුය.

(10) නුඹලාගෙන් කෙනෙකුට මරණය පැමිණීමට පෙර (එයට අදාළ ක්‍රියාවන් සිදුවීමට පෙර) අප නුඹලාට පිරිනමන ලද දැයින් (සකාත් ඇතුළු යහපත් කටයුතු සඳහා) වියදම් කරහු. ඔහු එසේ නොකරන්නේ නම් 'මගේ දෙවියනි, මාව කෙටි කාලයකට ප්‍රමාද නොකරන්නේ ද මම දන් දී යහපත් පුද්ගලයින්ගෙන් කෙනෙක් වෙමි යැයි ප්‍රකාශ කරයි.

(11) කිසිම ආත්මයක් එයට නියමිත වේලාව පැමිණ (එහි ජීවිත කාලය අවසන් වුවොත්) අල්ලාහ් ප්‍රමාද නොකරන්නේය. නුඹලා කරන දෑ අල්ලාහ් වැඩියෙන් දනී. (ඔහුට කිසිවක් නොසැඟවෙන්නේය. ඒ සඳහා ඔහුට විපාක ලබා දෙයි.

## අත්-තඝාබුන්

(1) අහස්හි ද පොළොවෙහි ද ඇති දෑ අල්ලාහ්ව මෙනෙහි කරන්නේය. සියලු පාලනය ඔහු සතුය. ප්‍රශංසාවන්ට ද ඔහුමය සුදුස්සා. ඔහු සියල්ල කෙරෙහි ශක්තිය ඇත්තාය.

(2) නුඹලාව මවන ලද්දේ ඔහුමය. නුඹලා අතරේ දෙවියන් ප්‍රතික්ෂේප කරන්නෝද සිටිති. තවද නුඹලා අතරේ විශ්වාස වන්තයෝ ද සිටිති. (ප්‍රතික්ෂේප කරන්නා මැවූයේ අල්ලාහ්ය. විශ්වාසවන්තයාව මැවූයේ ද ඔහුය. ඔවුන් එකිනෙකාගේ කබ්රය(මිනී වළ)ද විශ්වාසය ද ඔවුනොවුන්ගේ ක්‍රියාවන්ය. එක් විශ්වාසවන්තයෙක් විශ්වාසය තෝරාගනී. කාෆිර් ප්‍රතික්ෂේප කිරීම තෝරා ගනී. මේ හැම එකක්ම දෙවියන්ගේ නියෝගය අනුවම සිදුවන්නේය. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. අල්ලාහ් මනාප නොවන දෙයක් නුඹලාට මනාප විය නොහැක නුඹලා කරන දෑ අල්ලාහ් බලා දැනගෙන සිටී.

(3) ඔහු අහස් ද පොළොවද සත්‍ය වූ (ශක්තිමත් වූ) තීරණයක් අනුව මැව්වේය. නුඹලාගේ රූපය නිර්මාණය කළේය. තවද නුඹලාගේ රූප ඉතා අලංකාර ලෙස සකස් කළේය. නුඹලා ඔහු වෙතටම නැවත එන්නෙහුය. (නුඹලාව වැදගත් වූ ද සම්පූර්ණ වූ ද අලංකාර වූ ද රූපවලින් මැව්වේය. මිනිසුන්ව විශේෂ වූ රූපයකින් මවා තිබීම තුළ අල්ලාහ්ගේ ශක්තිය ඔහුගේ ඥානය බලසම්පන්න බව සේම ඔහුගේ අභ්‍යන්තරික රූප නිර්මාණය චින්තනයේ මහිමය ආදිය පිළිබඳව ද පැහැදිලි සාධක ඇත. සිතීමේ හැකියා ඇති අය එය අවබෝධ කර ගනිති. අල්ලාහ් පවසයි. තහවුරු කරගන්නා අයට භූමියේ සාධක ඇත. නුඹලා නුඹලා ගැන සිතා නොබැලිය යුතු නොවේ ද?)

(4) ඔහු අහස්හි ඇති දෑ ද පොළොවෙහි ඇති දෑ ද දනී. තවද නුඹලා සඟවන දෑ ද ප්‍රසිද්ධ කරන දෑ ද දනී. තවද අල්ලාහ් හදවත්හි ඇති දෑ ද දනී.

(5) නුඹලාට පෙර දෙවියන් ප්‍රතික්ෂේප කළ අයගේ තොරතුරු නුඹලාට නොපැමිණියේ ද? (ඔවුහු ගත වූ

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

يُسَبِّحُ لِلَّهِ مَا فِي ٱلسَّمَٰوَٰتِ وَمَا فِي ٱلۡأَرۡضِۖ لَهُ ٱلۡمُلۡكُ وَلَهُ ٱلۡحَمۡدُۖ
وَهُوَ عَلَىٰ كُلِّ شَيۡءٖ قَدِيرٌ ١ هُوَ ٱلَّذِي خَلَقَكُمۡ فَمِنكُمۡ كَافِرٞ
وَمِنكُم مُّؤۡمِنٞۚ وَٱللَّهُ بِمَا تَعۡمَلُونَ بَصِيرٌ ٢ خَلَقَ ٱلسَّمَٰوَٰتِ
وَٱلۡأَرۡضَ بِٱلۡحَقِّ وَصَوَّرَكُمۡ فَأَحۡسَنَ صُوَرَكُمۡۖ وَإِلَيۡهِ ٱلۡمَصِيرُ ٣
يَعۡلَمُ مَا فِي ٱلسَّمَٰوَٰتِ وَٱلۡأَرۡضِ وَيَعۡلَمُ مَا تُسِرُّونَ وَمَا تُعۡلِنُونَۚ وَٱللَّهُ
عَلِيمُۢ بِذَاتِ ٱلصُّدُورِ ٤ أَلَمۡ يَأۡتِكُمۡ نَبَؤُاْ ٱلَّذِينَ كَفَرُواْ مِن قَبۡلُ
فَذَاقُواْ وَبَالَ أَمۡرِهِمۡ وَلَهُمۡ عَذَابٌ أَلِيمٞ ٥ ذَٰلِكَ بِأَنَّهُۥ كَانَت تَّأۡتِيهِمۡ
رُسُلُهُم بِٱلۡبَيِّنَٰتِ فَقَالُوٓاْ أَبَشَرٞ يَهۡدُونَنَا فَكَفَرُواْ وَتَوَلَّواْۚ وَّٱسۡتَغۡنَى
ٱللَّهُۚ وَٱللَّهُ غَنِيٌّ حَمِيدٞ ٦ زَعَمَ ٱلَّذِينَ كَفَرُوٓاْ أَن لَّن يُبۡعَثُواْۚ قُلۡ بَلَىٰ وَرَبِّي
لَتُبۡعَثُنَّ ثُمَّ لَتُنَبَّؤُنَّ بِمَا عَمِلۡتُمۡۚ وَذَٰلِكَ عَلَى ٱللَّهِ يَسِيرٞ ٧ فَـَٔامِنُواْ بِٱللَّهِ
وَرَسُولِهِۦ وَٱلنُّورِ ٱلَّذِيٓ أَنزَلۡنَاۚ وَٱللَّهُ بِمَا تَعۡمَلُونَ خَبِيرٞ ٨ يَوۡمَ
يَجۡمَعُكُمۡ لِيَوۡمِ ٱلۡجَمۡعِۖ ذَٰلِكَ يَوۡمُ ٱلتَّغَابُنِۗ وَمَن يُؤۡمِنۢ بِٱللَّهِ وَيَعۡمَلۡ
صَٰلِحٗا يُكَفِّرۡ عَنۡهُ سَيِّـَٔاتِهِۦ وَيُدۡخِلۡهُ جَنَّٰتٖ تَجۡرِي مِن تَحۡتِهَا
ٱلۡأَنۡهَٰرُ خَٰلِدِينَ فِيهَآ أَبَدٗاۚ ذَٰلِكَ ٱلۡفَوۡزُ ٱلۡعَظِيمُ ٩

සමාජයන් වන නූහ් නබිතුමාගේ සමාජය ද ආද් සමූද් සමාජයන් වැනි දෙවියන් ප්‍රතික්ෂේප කළවුන් ඔවුන්ගේ දූතයින් ඔවුන්ව දෙවියන්ගේ ඒක දේව ප්‍රතිපත්තිය කරා ඇරයුම් කළේ කෙසේ ද යන්න ගැන ද එතුමන්ලාව බොරු කළවුන්ව අල්ලාහ් විනාශ කර විශ්වාස කළ අයව ඔහු ආරක්ෂා කළ ආකාරය ගැන ද ඔහු අල්-කුර්ආනයේ සඳහන් කළේය.) ඔවුහු ඔවුන්ගේ ක්‍රියාවන්ට අදාළ නරක විපාකයන් (මෙලොවදී) භුක්ති වින්දෝය. ඔවුනට (පරලොවෙහි ද) හිංසාකාරී වේදනාව ඇත.

(6) එය (දෙලොව දඬුවමකි.) මන්ද ඔවුන්ගේ දූතයෝ ඔවුනට (පැහැදිලිව) සාධක ගෙන ආහ. අපට ඍජුමඟ පෙන්වන්නේ මිනිසුන් දැ?යි ඇසූහ. (දූතයින් මිනිසුන් අතරින් පැමිණීම ප්‍රතික්ෂේප කළහ.) ඔවුහු (විශ්වාස කිරීමෙන් තොරව) ප්‍රතික්ෂේප කර පසු බැස්සෝය. අල්ලාහ් (ඔවුන්ගේ වත් පිළිවෙත්වලින්) කිසිවක් අවශ්‍ය නොකළේය. ඔහු අවශ්‍යතාවක් නොමැති ප්‍රශංසාවට සුදුස්සාය.

(7) ප්‍රතික්ෂේප කරන්නෝ (විනිශ්චය දිනයේ) තමන් නැගිටුවනු නොලබන්නේ යැයි සිතාගෙන සිටිති. නබිවරයාණනි, නුඹ කියහ. එසේ නොව මාගේ දෙවියන් මත දිවුරා කියමි. නිශ්චිත වශයෙන්ම නුඹලා (මරණයෙන් මතු) නැගිටවනු ලබන්නෙහුය. පසුව නුඹලා කළ දෑ නුඹලාට දැනුම් දෙනු ලැබේ. (ඒ සඳහා

وَٱلَّذِينَ كَفَرُواْ وَكَذَّبُواْ بِـَٔايَٰتِنَآ أُوْلَٰٓئِكَ أَصۡحَٰبُ
ٱلنَّارِ خَٰلِدِينَ فِيهَاۖ وَبِئۡسَ ٱلۡمَصِيرُ ١٠ مَآ أَصَابَ مِن
مُّصِيبَةٍ إِلَّا بِإِذۡنِ ٱللَّهِۗ وَمَن يُؤۡمِنۢ بِٱللَّهِ يَهۡدِ قَلۡبَهُۥۚ وَٱللَّهُ بِكُلِّ
شَيۡءٍ عَلِيمٞ ١١ وَأَطِيعُواْ ٱللَّهَ وَأَطِيعُواْ ٱلرَّسُولَۚ فَإِن
تَوَلَّيۡتُمۡ فَإِنَّمَا عَلَىٰ رَسُولِنَا ٱلۡبَلَٰغُ ٱلۡمُبِينُ ١٢ ٱللَّهُ لَآ إِلَٰهَ
إِلَّا هُوَۚ وَعَلَى ٱللَّهِ فَلۡيَتَوَكَّلِ ٱلۡمُؤۡمِنُونَ ١٣ يَٰٓأَيُّهَا
ٱلَّذِينَ ءَامَنُوٓاْ إِنَّ مِنۡ أَزۡوَٰجِكُمۡ وَأَوۡلَٰدِكُمۡ عَدُوّٗا
لَّكُمۡ فَٱحۡذَرُوهُمۡۚ وَإِن تَعۡفُواْ وَتَصۡفَحُواْ وَتَغۡفِرُواْ
فَإِنَّ ٱللَّهَ غَفُورٞ رَّحِيمٌ ١٤ إِنَّمَآ أَمۡوَٰلُكُمۡ وَأَوۡلَٰدُكُمۡ
فِتۡنَةٞۚ وَٱللَّهُ عِندَهُۥٓ أَجۡرٌ عَظِيمٞ ١٥ فَٱتَّقُواْ ٱللَّهَ مَا ٱسۡتَطَعۡتُمۡ
وَٱسۡمَعُواْ وَأَطِيعُواْ وَأَنفِقُواْ خَيۡرٗا لِّأَنفُسِكُمۡۗ وَمَن
يُوقَ شُحَّ نَفۡسِهِۦ فَأُوْلَٰٓئِكَ هُمُ ٱلۡمُفۡلِحُونَ ١٦ إِن تُقۡرِضُواْ
ٱللَّهَ قَرۡضًا حَسَنٗا يُضَٰعِفۡهُ لَكُمۡ وَيَغۡفِرۡ لَكُمۡۚ وَٱللَّهُ شَكُورٌ
حَلِيمٌ ١٧ عَٰلِمُ ٱلۡغَيۡبِ وَٱلشَّهَٰدَةِ ٱلۡعَزِيزُ ٱلۡحَكِيمُ ١٨

## سُورَةُ الطَّلَاقِ

ترتيبها ٦٥ — آياتها ١٢

නුඹලාට විපාක ලබා දෙනු ඇත.) එය (නැගිටුවීම ද විපාක ලබා දීම ද) අල්ලාහ්ට පහසු කාර්යයකි.

8 නුඹලා අල්ලාහ්ව ද ඔහුගේ දූතයාව ද අප පහළ කළාවූ අල්-කුර්ආනය ද විශ්වාස කරහු. (අල්-කුර්ආනය අලෝකයකි. මං මුළාව නමැති අඳුරෙන් සෘජු මඟ නමැති ආලෝකය කරා එය මඟ පෙන්වයි) අල්ලාහ් නුඹලා කරන දෑ මැනවින් දනී.

9 ඒකරාශි කරනු ලබන දිනය වෙනුවෙන් (විනිශ්වය දිනයේ) නුඹලාව ඔහු ඒකරාශි කරන දිනයේ (නුඹලා කළ දෑ නුඹලාට දැනුම් දෙයි. එම දිනයේ විපාක ලබා දීම සඳහා සෑම මිනිසෙකුවම ඔහුගේ සෑම ක්‍රියාවක්ම තවද සෑම නබිවරයෙකුවම ඔහුගේ සමාජයද අසාධාරණ කළ තැනැත්තා ද අසාධාරණය ලක් වූ තැනැත්තා වද පෙර පැමිණි අය හා පසුව පැමිණි අයද සියලු දෙනාවම ඒකරාශි කරයි.) එය සමහරෙකු ලාභ ලබන තවත් සමරෙහකෙු පාඩු ලබන දිනයයි. (සත්‍යය ඇති අය ලාභ ලැබ, අසත්‍ය මත සිටින අය පාඩු විඳන්නෝය. ස්වර්ගවාසීන් ලබන ලාභයට වඩා වැදගත් ලාභයක් අන් කිසිවෙක් නැත) කවරෙකු අල්ලාහ්ව විශ්වාස කර යහපත් ක්‍රියා කරන්නේ ද අල්ලාහ් ඔහුගේ පාපයන්ට ක්ෂමාව දෙන්නේය.

10 දෙවියන් ප්‍රතික්ෂේප කර අපගේ වැකි බොරු කළවුන් ඔවුහු නිරයේ වැසියන් ය. එහි ඔවුහු සදාකාලිකව සිටිති. එය යන තැන් වලින් ඉතා නරක තැනකි.

11 කුමන හෝ පරීක්ෂණයක් ඇතිවුවොත් එය අල්ලාහ්ගේ මනාපය පරිදිය. (එය අල්ලාහ්ගේ මනාපය පරිදිම සිදුවන්නේය.) කවරෙක් අල්ලාහ්ව විශ්වාස කරන්නේ ද (මේවා අල්ලාහ්ගේ මනාපය පරිදි සිදුවන්නේ යැයි විශ්වාස කරන්නේ ද) අල්ලාහ් (ඔහුට පරීක්ෂණ ඇති වන අවස්ථාවල මේවා අල්ලාහ්ගේම පැමිණෙන්නේ යැයි දැන ඉවසා දරා ගැනීමේ) දැනීම ඔහුගේ සිතට ලබා දෙයි. අල්ලාහ් සියල්ල දන්නේය.

12 නුඹලා අල්ලාහ්ට අවනත වහු. ඔහුගේ දූතයාණන්ට ද අවනත වහු. නුඹලා (එසේ අවනත වීමට) පසුබට වන්නහු නම් (එහි වරද නුඹලාටමය. අපේ දූතයාට ඒ පිළිබඳව කිසිඳු වරදක් නැත) පැහැදිලිව දැනුවත් කිරීම පමණක් අපේ දූතයාගේ වගකීමයි. (එය ඔහු ඉටු කළේය. වෙනත් කිසිඳු වගකීමක් ඔහුට නැත.)

13 අල්ලාහ් හැර නැමදුමට සුදුසු දෙවියෙකු අන් කිසිවෙකු නැත.

14 විශ්වාසවන්තයිනි, නුඹලාගේ බිරියන් අතරේ ද නුඹලාගේ දරුවන් අතරේ ද නුඹලාට සතුරෝ සිටිති. (ඔවුහු නුඹලාව යහපතින් වළක්වන්නෝය. සමහරෙක් ඉස්ලාමය පිළිගෙන මදීනාහ්වට හිජ්රත් යාමට සූදානම් වූ විට ඔවුන්ගේ බිරියන් ද දරුවෝ ද ඔවුන්ව වැළැක්වූහ. ඒ අවස්ථාවේ මෙ වැකිය පහළ විය) ඔවුන් පිළිබඳව නුඹලා ප්‍රවේශමෙන් සිටිහු. (මොවුන්ට නුඹලා දක්වන ආදරය නුඹලා අල්ලාහ්ගේ යුතුකම් පිළිගෙන ඉටු කිරීමට බාධාවක් නොවිය යුතුය) තවද (ඔවුන්ගෙන් නුඹලාට සිදු වූ වැරදි) ක්ෂමා කර (ඒවා) ගණන් නොගෙන අත්හරින්නෙහු නම් නියත වශයෙන්ම අල්ලාහ් (නුඹලාව ද ඔවුන්ව ද) ක්ෂමා කර දයාව පහළ කරයි.

15 නියත වශයෙන්ම නුඹලාගේ වස්තුව ද දරුවන් ද පරීක්ෂණයන්ය. (අල්ලාහ්ගේ යුතුකම් වැළැක්වීමට හෝ තහනම් කළ මාර්ගවලින් උපයා ගැනීමට හෝ ඔවුන් නුඹලාව පෙලඹවිය හැක.) අල්ලාහ් ළඟ ඉතා අඟනා යහ විපාක ඇත. (තම වස්තු ගැන ද දරුවන් ගැන ද ආශා වී අල්ලාහ්ව අමතක නොකර ඔහුට අවනත වූවන්ට එය ප්‍රදානය කරයි.)

16 නුඹලා හැකි පමණින් අල්ලාහ්ට බියවහු. (අල්ලාහ්ගේ ද ඔහුගේ දූතයාණන්ගේ ද අණවලට) සවන් දී අවනත වහු. නුඹලාගේ යහපත සඳහා (යහපත් කරුණු අතින් අල්ලාහ් නුඹලාට ලබා දී ඇති දෑවලින් මසුරුකම් නොදක්වා) නුඹලා වියදම් කරහු. තම සිතේ මසුරුකමින් කවුරුන් ආරක්ෂාව ලබන්නෝ ද ඔවුහුම ජය ලබන්නෝ.

17 නුඹලා අල්ලාහ්ට ලස්සන ණය දෙන්නෙහු නම් (පිරිසිදු සිතකින් ද සතුටු සිතකින් ද යහපත් කාර්යයන්හි වියදම් කරන්නෙහු නම්) ඔහු එය නුඹලාට අධික ගුණයෙන් දෙයි. (ඔහු එය දහයේ සිට හත්සිය ගුණය දක්වා එය අධික කරයි) ඒ සමගම (නුඹලාගේ පාපයන්) නුඹලාට ක්ෂමා කරයි.

18 ඔහු සැඟවුන දෑ ද එළිපිට ඇති දෑ ද දන්නාය. (සියල්ල) අබිබවා යන්නෙකි. ඥානවන්තයෙකි.

# අත්-තලාක්

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

يَٰٓأَيُّهَا ٱلنَّبِيُّ إِذَا طَلَّقۡتُمُ ٱلنِّسَآءَ فَطَلِّقُوهُنَّ لِعِدَّتِهِنَّ وَأَحۡصُواْ
ٱلۡعِدَّةَۖ وَٱتَّقُواْ ٱللَّهَ رَبَّكُمۡۖ لَا تُخۡرِجُوهُنَّ مِنۢ بُيُوتِهِنَّ
وَلَا يَخۡرُجۡنَ إِلَّآ أَن يَأۡتِينَ بِفَٰحِشَةٖ مُّبَيِّنَةٖۚ وَتِلۡكَ حُدُودُ
ٱللَّهِۚ وَمَن يَتَعَدَّ حُدُودَ ٱللَّهِ فَقَدۡ ظَلَمَ نَفۡسَهُۥۚ لَا تَدۡرِي لَعَلَّ
ٱللَّهَ يُحۡدِثُ بَعۡدَ ذَٰلِكَ أَمۡرٗا ١ فَإِذَا بَلَغۡنَ أَجَلَهُنَّ فَأَمۡسِكُوهُنَّ
بِمَعۡرُوفٍ أَوۡ فَارِقُوهُنَّ بِمَعۡرُوفٖ وَأَشۡهِدُواْ ذَوَيۡ عَدۡلٖ مِّنكُمۡ
وَأَقِيمُواْ ٱلشَّهَٰدَةَ لِلَّهِۚ ذَٰلِكُمۡ يُوعَظُ بِهِۦ مَن كَانَ يُؤۡمِنُ
بِٱللَّهِ وَٱلۡيَوۡمِ ٱلۡأٓخِرِۚ وَمَن يَتَّقِ ٱللَّهَ يَجۡعَل لَّهُۥ مَخۡرَجٗا ٢ وَيَرۡزُقۡهُ
مِنۡ حَيۡثُ لَا يَحۡتَسِبُۚ وَمَن يَتَوَكَّلۡ عَلَى ٱللَّهِ فَهُوَ حَسۡبُهُۥٓۚ إِنَّ ٱللَّهَ
بَٰلِغُ أَمۡرِهِۦۚ قَدۡ جَعَلَ ٱللَّهُ لِكُلِّ شَيۡءٖ قَدۡرٗا ٣ وَٱلَّٰٓـِٔي يَئِسۡنَ
مِنَ ٱلۡمَحِيضِ مِن نِّسَآئِكُمۡ إِنِ ٱرۡتَبۡتُمۡ فَعِدَّتُهُنَّ ثَلَٰثَةُ أَشۡهُرٖ
وَٱلَّٰٓـِٔي لَمۡ يَحِضۡنَۚ وَأُوْلَٰتُ ٱلۡأَحۡمَالِ أَجَلُهُنَّ أَن يَضَعۡنَ حَمۡلَهُنَّۚ
وَمَن يَتَّقِ ٱللَّهَ يَجۡعَل لَّهُۥ مِنۡ أَمۡرِهِۦ يُسۡرٗا ٤ ذَٰلِكَ أَمۡرُ ٱللَّهِ أَنزَلَهُۥٓ
إِلَيۡكُمۡۚ وَمَن يَتَّقِ ٱللَّهَ يُكَفِّرۡ عَنۡهُ سَيِّـَٔاتِهِۦ وَيُعۡظِمۡ لَهُۥٓ أَجۡرًا ٥

1 නබිවරයාණනි, නුඹලා දික්කසාද වීමට මනාප නම් ඔවුහු ඉද්දා සිටිය යුතු කාල වකවනුවේ ඔවුන්ව දික්කසාද කරහු. (නුඹලා නුඹලාගේ භාර්යාවන් දික්කසාද කිරීමට තීරණනය කළෙහු නම් ඔවුන් මාස් ශුද්ධියෙන් පිරිසිදු වී ඔවුන් සමඟ සංසර්ගයේ යෙදීමට පෙර ඔවුන්ව දික්කසාද කරහු. ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) එතුමාගේ බිරියව ඇය මාස් ශුද්ධියේ සිටියදීම දික්කසාද කළේය. එය නබිතුමන්ට දැන් වූ විට එතුමාණෝ කෝප වූහ. පසුව නබිතුමාණෝ මෙසේ කීහ. එම කාන්තාව නැවත භාරගන්නා මෙන් ඔහුට කියනු. ඇය පිරිසිදු වී නැවත මාස් ශුද්ධිය ඇති වී පිරිසිදුවන තෙක් තබාගන්න. ඊට පසු අවශ්‍ය නම් ඇය සමඟ සංවාසයේ යෙදීමට පෙර පිරිසිදුව සිටියදීම දික්කසා ද වන්න. ගැහැණුන්ව දික්කසාද කිරීමට අල්ලාහ් පැනවූ කාලය එයයි) නුඹලා ඉද්දාහි කාලය ගණන් තබා ගහු. (එය මාස්ශුද්ධිය අතර කාල පරිච්ඡේද තුනකි.) නුඹලාගේ දෙවියන් වන අල්ලාහ්ට බියවහු. (නුඹලාට ඔහු පනවා ඇති කරුණු වල ඔහුට වෙනස් කම් නොකරහු.) තවද (ඔවුන්ට හිරිහැර කර ඔවුන් දික්කසාද විය යුතු අවස්ථාවේ ඔවුන් සිටි) ඔවුන්ගේ නිවෙස්වලින් ඔවුන්ව පලවා නොහරිහු. තවද (ඔවුන්ගේ ඉද්දා අවසන් වන තෙක්) ඔවුන් පිටවිය නොයුතුය. (එහෙත්) ඔවුන් පැහැදිලිව පාපක්‍රියාවක් කළොත් මිස (කාම අපචාරය තම හෝ දිවෙන් එහි සිටින අයට හිරිහැර කිරීම ආදි පාපයන් කළොත් මිස නුඹලා ඔවුන්ව පිටුවහල් නොකරහු.) මේවා අල්ලාහ්ගේ සීමාවන්ය. (මේවා ඔහු ගැත්තන් මත නියම කර ඇත්තේය. ඒවා අබිබවා යාම ඔවුන්ට අනුමත නොවේ.) කවරෙක් අල්ලාහ්ගේ සීමාවන් අබිබවා යන්නේ ද ඔහු තමන්ටම අසාධාරණ කර ගත්තේය. අල්ලාහ් ඊටපසු යමක් කරන්නේ යැයි නුඹ නොදනිහිය. (මෙසේ ඉද්දා සිටින අවස්ථාවේ ඔවුන්ගේ හදවත්හි අල්ලහ් වෙනසක් ඇති කර ඔවුන් නැවතත් එක්විය හැකි අවස්ථාව උදාකළ හැක.)

2 ඔවුන්ගේ කාලසීමාවට ඔවුන් (එම ගැහැණුන්) පත්වන්නේ නම් (ඉද්දා අවසන් විය යුතු කාලය ළං වන්නේ නම්) ඔවුන්ව වැදගත් අන්දමින් රඳවා තබාගහු. (සිත සතුටින් වැදගත් ලෙස ඔවුන් සමඟ ජීවත් වීමට ඔවුන්ව නැවතත් භාරගහු.) නැත්නම් වැදගත් ලෙස ඔවුන්ගෙන් වෙන්වහු. (ඉද්දාව එලෙස අවසන් කිරීමට දී ඔවුන්ගේ අයිතිය ලබා දී වෙන්වහු. ඔවුන්ට නුඹලා හිරිහැර කිරීමට හෝ නැත්නම් අසාධාරණ කිරීමට හෝ ඔවුන්ව තවදුරටත් තබා ගැනීම අනුමත නොවේ.) තවද (නුඹලා එසේ භාරගැනීම හෝ වෙන් වෙන අවස්ථාවේ) සාධාරණ දෙදෙනෙකු සාක්ෂි වශයෙන් තබාගහු. (මෙය පසුවට ආරවුල් විසඳා ගැනීමට පහසු වන්නේය.) මෙම සාක්ෂිය නුඹලා අල්ලාහ් වෙනුවෙන් (ඔහුගේ තෘප්තිය ලැබීමේ අරමුණෙන්) ස්ථාවර කරහු. මෙසේ අල්ලාහ්ව ද විනිශ්චය දිනය ද විශ්වාස කරනවුනට උපදෙස් දෙනු ලැබේ. (මන්ද උපදෙස් ලබන්නෝ ඔවුහුමය) තවද (ඔහුගේ සීමාවන් පිළිගෙන අල්ලාහ්ව කවරෙක් පිළිපදින්නේ ද) ඔහුට දුෂ්කරතාවලින් මිදෙන මඟක් ඔහු සකස්කර දෙන්නේය.

3 තවද ඔවුනට ඔහු බලාපොරොත්තු නොවූ අන්දමේ ජීවනාධාර ලබා දෙයි. (දික්කසාදයේදී හෝ නැත්නම් නැවත භාරගැනීමේදී හෝ අල්ලාහ්ට බියවන්නවුන්ට මෙම පහසුකම් ඇති කර දෙන්නේය. එසේ නැතිව මෙම අවස්ථාවන්හිදී අල්ලාහ්ට බිය නොවන අයට දුෂ්කරතා ඇතිවේ.) කවරෙකු (තම කටයුතුවලදී) අල්ලාහ් මත සම්පූර්ණ වගකීම පවරන්නේද ඔහු ඔවුනට ප්‍රමාණවත් වන්නේය. (ඔවුන්ගේ අවශ්‍යතා ඔහු ඉටුකර දෙයි.) නියත වශයෙන් අල්ලාහ් ඔහුගේ කාර්යයන් ලබා ගත හැකි අයෙකි. (කිසිවක් ඔහුව නොහැකි කෙනෙක් බවට පත් නොකරන්නේය) නියත වශයෙන්ම ඔහු සෑම දෙයකටම එක (නියමිත) ප්‍රමාණයක් සකස් කර ඇත්තේය. (දුෂ්කරතා හා සාරවත් කම ආදී හැම එකකටම යම් ප්‍රමාණයක් ඔහු නිගමනය කර ඇත්තේය.)

4 නුඹලාගේ ගහැණුන්ගෙන් (තම වියපත්කම හේතුකොටගෙන) මාස් ශුද්ධිය පිළිබඳව විශ්වාසයක් නොමැති අය ඔවුන්ගේ ඉද්දාහි නුඹලා සැක සිතන්නෙහුනම් (ඔවුන් කෙසේ ඉද්දා සිටින්නේදැයි නුඹලා නොදන්නෙහු නම්) ඔවුන්ගේ ඉද්දා කාලය මාස තුනකි. (ඔවුන් බාලවයස් කාරියන් වූ විටද මෙසේමය.) මාස් ශුද්ධිය ඇති නොවන්නවුන් (ඔවුන්ගේ ඉද්දා කාලය ද මාස තුනකි.) තවද ගර්භනී කාන්තාවන්ගේ (ඉද්දා අවසන් වන) දිනය වන්නේ

أَسْكِنُوهُنَّ مِنْ حَيْثُ سَكَنتُم مِّن وُجْدِكُمْ وَلَا تُضَآرُّوهُنَّ لِتُضَيِّقُوا۟
عَلَيْهِنَّ ۚ وَإِن كُنَّ أُو۟لَـٰتِ حَمْلٍ فَأَنفِقُوا۟ عَلَيْهِنَّ حَتَّىٰ يَضَعْنَ حَمْلَهُنَّ ۚ
فَإِنْ أَرْضَعْنَ لَكُمْ فَـَٔاتُوهُنَّ أُجُورَهُنَّ ۖ وَأْتَمِرُوا۟ بَيْنَكُم بِمَعْرُوفٍ ۖ وَإِن
تَعَاسَرْتُمْ فَسَتُرْضِعُ لَهُۥٓ أُخْرَىٰ ﴿٦﴾ لِيُنفِقْ ذُو سَعَةٍ مِّن سَعَتِهِۦ ۖ
وَمَن قُدِرَ عَلَيْهِ رِزْقُهُۥ فَلْيُنفِقْ مِمَّآ ءَاتَىٰهُ ٱللَّهُ ۚ لَا يُكَلِّفُ ٱللَّهُ نَفْسًا
إِلَّا مَآ ءَاتَىٰهَا ۚ سَيَجْعَلُ ٱللَّهُ بَعْدَ عُسْرٍ يُسْرًا ﴿٧﴾ وَكَأَيِّن مِّن قَرْيَةٍ
عَتَتْ عَنْ أَمْرِ رَبِّهَا وَرُسُلِهِۦ فَحَاسَبْنَـٰهَا حِسَابًا شَدِيدًا وَعَذَّبْنَـٰهَا
عَذَابًا نُّكْرًا ﴿٨﴾ فَذَاقَتْ وَبَالَ أَمْرِهَا وَكَانَ عَـٰقِبَةُ أَمْرِهَا خُسْرًا ﴿٩﴾
أَعَدَّ ٱللَّهُ لَهُمْ عَذَابًا شَدِيدًا ۖ فَٱتَّقُوا۟ ٱللَّهَ يَـٰٓأُو۟لِى ٱلْأَلْبَـٰبِ ٱلَّذِينَ ءَامَنُوا۟ ۚ
قَدْ أَنزَلَ ٱللَّهُ إِلَيْكُمْ ذِكْرًا ﴿١٠﴾ رَّسُولًا يَتْلُوا۟ عَلَيْكُمْ ءَايَـٰتِ ٱللَّهِ مُبَيِّنَـٰتٍ
لِّيُخْرِجَ ٱلَّذِينَ ءَامَنُوا۟ وَعَمِلُوا۟ ٱلصَّـٰلِحَـٰتِ مِنَ ٱلظُّلُمَـٰتِ إِلَى ٱلنُّورِ ۚ
وَمَن يُؤْمِنۢ بِٱللَّهِ وَيَعْمَلْ صَـٰلِحًا يُدْخِلْهُ جَنَّـٰتٍ تَجْرِى مِن تَحْتِهَا
ٱلْأَنْهَـٰرُ خَـٰلِدِينَ فِيهَآ أَبَدًا ۖ قَدْ أَحْسَنَ ٱللَّهُ لَهُۥ رِزْقًا ﴿١١﴾ ٱللَّهُ ٱلَّذِى خَلَقَ
سَبْعَ سَمَـٰوَٰتٍ وَمِنَ ٱلْأَرْضِ مِثْلَهُنَّ يَتَنَزَّلُ ٱلْأَمْرُ بَيْنَهُنَّ لِتَعْلَمُوٓا۟ أَنَّ
ٱللَّهَ عَلَىٰ كُلِّ شَىْءٍ قَدِيرٌ وَأَنَّ ٱللَّهَ قَدْ أَحَاطَ بِكُلِّ شَىْءٍ عِلْمًۢا ﴿١٢﴾

ඔවුන්ගේ දරු ප්‍රසූතියයි. (ඔවුන් ඔවුන්ගේ දරු ප්‍රසූතිය දක්වා ඉද්දා ඉඳිය යුතුය.)කවරෙකු අල්ලාහ්ට බියවන්නේද ඔවුනට (මෙලොව) ඔවුන්ගේ කාර්යයන් හි පහසුව ඇති කරන්නේය.

(5) එය අල්ලාහ් නුඹලාට පහළ කළ ආඥාවයි. කවරෙක් අල්ලාහ්ට බියවන්නේ ද ඔවුනට ඔවුන්ගේ පාපයන් ක්ෂමා කරන්නේය. තවද (හෙට විනිශ්චය දිනයේ) ඔවුන්ගේ ප්‍රතිඵල ඔවුනට විශාල කරන්නේය.(එය ස්වර්ගයයි)

(6) නුඹලාගේ පහසුකම් අනුව නුඹලා වාසය කරන ස්ථානවල ඔවුනට ද වාසය කිරීමට සලස්වන්න. (වරක් හෝ දෙවරක් දික්කසාද කරනු ලැබූ ගැහැනුන්ට ඔවුන් ඉද්දා සිටින කාලය තුළ ඔවුන්ට නවාතැන් සපයා දෙන අතරම ආහාර පාන සපයා දීම ද අනිවාර්ය වෙයි. තුන්වරක් දික්කසා ද වූ ගැහැණුන් හට මේවා ලබාදීම අවශ්‍ය නොවේ.) නුඹලා ඔවුනට (නවාතැනහි හෝ නැත්නම් ආහාර වැනි දෑවල හෝ) දුෂ්කරතා ඇති කිරීම සඳහා ඔවුනට හිරිහැර නොකරහු. ඔවුන් ගර්භනී කාන්තාවන් නම් ඔවුන්ගේ දරු ප්‍රසූතය දක්වා ඔවුනට වියදම් කරහු. (දික්කසාද කරනු ලැබූ ගැහැණුන් ගර්භනීයන්ව සිටී නම් ඔවුනට නවාතැන් ද ආහාර පාන ද සැපයීම අනිවාර්ය බවට වියතුන් අතරේ මතභේදයෙන් තොර කරුණක් වන්නේය.) එයට පසුව (නුඹලාගේ දරුවනට) නුඹලා වෙනුවෙන් ඔවුන් කිරි පොවන්නේ නම් ඔවුනට නියමිත වේතනය ඔවුනට දෙහු. (මේවා පිළිබඳව නුඹලා නුඹලා අතරේ සාධාරණව සාකච්ඡා කර තීරණයකට බසීහු. ළදරුවන්ට කිරිදීම හා එය නතර කිරීම ආදි කරුණු සඳහා සූරා බකරාහ්වේ 233 වැනි වැකියේ සඳහන් පරිදි සාකච්ඡා කිරීමෙන් අනතුරුවම තීරණයකට බැස ගනීහු.) තවද (මෙම කාරණය පිළිබඳව) නුඹලා දුෂ්කරතා ද (ආරවුල් ද) ඇතිවුවොත් (සැමියා කිරි පෙවීමට අදාළ වේතනය නොදෙන අතර එම ගැහැණිය ද වේතනය රහිතව කිරිදීම ප්‍රතික්ෂේප කළොත්) වෙනත් අයෙකු එම ළදරුවන්ට කිරි පොවන්නිය. (කිරි පොවන කිරි මවක සැමියා විසින් කුලියට පත් කර ගනී.)

(7) පහසුකම් ඇති අය ඔවුන්ගේ පහසුකම් අනුව වියදම් කළ යුතුය. (පහසුකම් ඇති අය කිරි පොවන ගැහැණුන්ට තම පහසුකම් වලට අනුව වේතනය ලබා දෙන මෙන් අල්ලාහ් මෙයින් විධානය දෙයි.) කවරෙකුට පහසුකම් ප්‍රමාණයන් අනුව ප්‍රදානය කර ඇද්ද ඔවුනට අල්ලාහ් ප්‍රදානය කළ දැයින් වියදම් කළ යුතුය. (පහසුකම් අඩු අය තම පහසුකමට අනුව වේතනය ගෙවිය යුතුය.) අල්ලාහ් කිසිම මිනිසෙකුට ඔහුට දුන් දෑ හැර (දෙන ලෙස) කරදර නො කරන්නේය. (එහෙයින් දුප්පතුන් ධනවතුන් සේ ගෙවිය යුතු නැත.)අල්ලාහ් දුෂ්කරතාවට පසුව පහසුව ඇති කරයි (දුප්පත් කමට පසුව ධනවත්කම ලබා දෙයි.)

(8) බොහෝ ගම්මාන (එහි වාසය කරන්නන්) ඒවායෙහි දෙවියන්ගේ ද (අල්ලාහ්ගේ ද) ඔවුන්ගේ දූතයින්ගේ ද අණ්වල (වෙනස්කම් කර) අසාධාරණ කළෝය. (ඔවුන් ලෝකයේ කළ ක්‍රියාවන් සඳහා) අප ඔවුන්ව විභාග කර ඔවුනට අපි දැඩි දඬුවම් දුනිමු. (මෙලොව කුසගින්න සාගතය මිනී මැරීම් රූපය වෙනස් කිරීම භූමිය තුළට කිඳා බැසීම් ආදි දඬුවම් මගින් දඬුවම් කළෙමු. පරලොව ද ඉතා දැඩි දඬුවම් මගින් දඬුවම් කරන්නෙමු.)

(9) ඔවුහු (එම ගම්වැසියන්) තම ක්‍රියාවන්ගේ නරක ප්‍රතිඵල අත්වින්දෝය. (ඔවුන්ගේ දේව ප්‍රතික්ෂේප කිරීමේ දඬුවම් අත් වින්දෝය.) ඔවුන්ගේ අවසානය පාඩුවක් විය. (ලෝකයේ ද පරලොවෙහි දඬුවම් ලැබ තම සම්පත් ද පවුල් ද අහිමි කර ගත්හ.)

(10) අල්ලාහ් ඔවුනට (පරලොවදී) දැඩි දඬුවම් (නිරය) සූදානම් කර ඇත්තේය. විශ්වාස කර (මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ව අනුකරණය කළ) නැණවතුණි, නුඹලා අල්ලාහ්ට බියවහු. (නුඹලා නුඹලාගේ විශ්වාසයෙහි සත්‍යවාදීන්ව ඉඳගහු. නුඹලාට පෙර විසූ සමාජයන් අසාධාරණය කළාසේ නුඹලා අල්ලාහ්ට වෙනස්කම් කර අසාධාරණය නොකරහු. එසේ කරන්නෙහු නම් ඔවුන් සේ නුඹලාද දඬුවම් කරනු ලබන්නෙහුය.) අල්ලාහ් නුඹලාට උපදේශය පහළ කළේය. (එය අල්-කුර්ආනයයි)

(11) (එම උපදේශය රැගෙන එන) දූතයෙකුව නුඹලාට එව්වේය. ඔහු විශ්වාස කර යහ ක්‍රියා කළ අයව මංමුලාව නැමැති අඳුරෙන් (ඍජු මග නැමැති) ආලෝකය කරා නික්මවීමේ අරමුණෙන් (ආගමික නීතිරීති) පැහැදිලි කරන අල්ලාහ්ගේ වැකි නුඹලාට කියවා පෙන්වයි. අල්ලාහ් හු ඔහුගේ දූතයාණන් පිළිගෙන යහ ක්‍රියා කරන්නේ ද ඔවුන්ට ගංගා ගලන ස්වර්ගයෙහි ඔහු ඇතුළත් කරන්නේය. ඔවුන් එහි

සදාකල් සිටිති. අල්ලාහ් ඔහුට වඩාත් අලංකාර අවශ්‍යතා සපයා දුන්නේය.

12 අල්ලාහ් ඔහු කවරෙකුද යත් අහස් හත ද එවැනිම භූමි (හතක්) ද මැව්වේය. (මෙම වැකියේ අහස් වැනි භූමි හතක් ද ඇති බව අල්ලාහ් සඳහන් කරයි. මෙය පහත සඳහන් හදීසය ද තහවුරු කරයි. එනම් කවරෙකු හෝ භූමියේ එක වියතක ප්‍රමාණයක් අසාධාරණ කරයි නම් අල්ලාහ් භූමි හතකින් එම ප්‍රමාණය ගෙන ඔහුට මාල පළඳවයි. (බුහාරි හා මුස්ලිම්) නියත වශයෙන්ම අල්ලාහ් සියල්ල කෙරෙහි ශක්තිය ඇත්තාය යන්න ද ඔහු (තම) දැනුමෙන් සියල්ල වටකර දැනගත්තේය යන්න ද නුඹලා දැන ගැනීම පිණිස එම අහස් අතරේ සිට (අල්ලාහ්ගේ) තීරණයන් (වැස්ස රාත්‍රිය දවාල නියං කාලය වැසිකාලය ආදිය) පහළ කරයි.

## අත්-තහ්රීම්

سُورَةُ التَّحْرِيمِ — آياتها ١٢ — ترتيبها ٦٦

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

يَا أَيُّهَا النَّبِيُّ لِمَ تُحَرِّمُ مَا أَحَلَّ اللَّهُ لَكَ ۖ تَبْتَغِي مَرْضَاتَ أَزْوَاجِكَ ۚ وَاللَّهُ
غَفُورٌ رَحِيمٌ ١ قَدْ فَرَضَ اللَّهُ لَكُمْ تَحِلَّةَ أَيْمَانِكُمْ ۚ وَاللَّهُ مَوْلَاكُمْ ۖ
وَهُوَ الْعَلِيمُ الْحَكِيمُ ٢ وَإِذْ أَسَرَّ النَّبِيُّ إِلَىٰ بَعْضِ أَزْوَاجِهِ حَدِيثًا
فَلَمَّا نَبَّأَتْ بِهِ وَأَظْهَرَهُ اللَّهُ عَلَيْهِ عَرَّفَ بَعْضَهُ وَأَعْرَضَ عَنْ بَعْضٍ ۖ
فَلَمَّا نَبَّأَهَا بِهِ قَالَتْ مَنْ أَنْبَأَكَ هَٰذَا ۖ قَالَ نَبَّأَنِيَ الْعَلِيمُ الْخَبِيرُ
٣ إِنْ تَتُوبَا إِلَى اللَّهِ فَقَدْ صَغَتْ قُلُوبُكُمَا ۖ وَإِنْ تَظَاهَرَا عَلَيْهِ
فَإِنَّ اللَّهَ هُوَ مَوْلَاهُ وَجِبْرِيلُ وَصَالِحُ الْمُؤْمِنِينَ ۖ وَالْمَلَائِكَةُ
بَعْدَ ذَٰلِكَ ظَهِيرٌ ٤ عَسَىٰ رَبُّهُ إِنْ طَلَّقَكُنَّ أَنْ يُبْدِلَهُ أَزْوَاجًا
خَيْرًا مِنْكُنَّ مُسْلِمَاتٍ مُؤْمِنَاتٍ قَانِتَاتٍ تَائِبَاتٍ عَابِدَاتٍ سَائِحَاتٍ
ثَيِّبَاتٍ وَأَبْكَارًا ٥ يَا أَيُّهَا الَّذِينَ آمَنُوا قُوا أَنْفُسَكُمْ وَأَهْلِيكُمْ
نَارًا وَقُودُهَا النَّاسُ وَالْحِجَارَةُ عَلَيْهَا مَلَائِكَةٌ غِلَاظٌ شِدَادٌ
لَا يَعْصُونَ اللَّهَ مَا أَمَرَهُمْ وَيَفْعَلُونَ مَا يُؤْمَرُونَ ٦ يَا أَيُّهَا
الَّذِينَ كَفَرُوا لَا تَعْتَذِرُوا الْيَوْمَ ۖ إِنَّمَا تُجْزَوْنَ مَا كُنْتُمْ تَعْمَلُونَ ٧

1 නබිවරයාණනි, අල්ලාහ් නුඹට අනුමත කළ දේ නුඹගේ බිරියන්ගේ තෘප්තිය සඳහා නුඹ තහනම් කරන්නේ මන් ද? (නබිතුමාණෝ සෙයිනබ් බින්ත් ජහ්ස් නමැති තම බිරියගෙන් මී පැණි බොමින් සිටියහ. මෙය නොරිස්සූ අනෙක් බිරියන් දෙදෙනෙකු වන ආයිෂා රළියල්ලාහු අන්හා හා හෆ්සා රළියල්ලාහු අන්හා යන අය සෙයිනබ් තුමියට විරුද්ධව කුමන්ත්‍රණය කිරීමට තීරණය කරගත්හ. නබිතුමන් ඔවුන් දෙපළ ළඟට පැමිණි විට අපි ඔබ ළඟ දුගඳක් ආඝ්‍රාණය කරමයි කීහ. මෙය මී පැණි නිසා ඇති වූ වෙනසක් යැයි සිතූ නබිතුමාණෝ මී පැණි තමන්ට තහනම් කරගත්හ. එම අවස්ථාවේ අල්ලාහ් මෙම වැකි පහළ කළේය. මෙසේ නුඹ වැරදීමකින් තහනම් කළ දේ වෙනුවෙන්) අල්ලාහ් ක්ෂමාකර දයාව පහළ කරන්නෙකි.

2 නුඹලාගේ දිවුරිලි නුඹලා අතහැරීම අල්ලාහු නුඹලාට අනිවාර්ය කළේය. (නුඹලා කිසිවෙකුට අල්ලාහ් අනුමත කළ දේ තහනම් කළ නොහැක. එසේ කවරෙකු හෝ කළොත් ඔහු දිවුරිල්ලක් කළ අයෙකු සේ වන්නේය. ඔහු දිවුරිල්ලක් කඩ කළ අයෙකුට නියමිත විකල්ප ප්‍රතිකර්මය කර එය වෙනස් කරගත යුතුය. අල්ලාහ් නුඹලාගේ නිලධාරියාය. (නුඹලාට ඔහු උදව් කරන්නෙකි.) තවද ඔහු (නුඹලාට කුමන යහපත ඇත්දැයි) දනී. තවද තමාගේ (ක්‍රියාවන්වල ද වචනවල ද) ඥානය අධිකව ඇත්තෙකි.

3 නබිතුමාණෝ තම භාර්යාවන්ගෙන් කෙනෙකුට යම් පුවතක් රහසින් කී වේලාව සිහිපත් කර බලන්න. (නබිතුමාණන් මී පැණි තහනම් කළ පුවත හෆ්සා රළියල්ලාහු අන්හා වෙත රහසින් ප්‍රකාශ කර එය කිසිවෙකුට නොකියන්නැයි කීහ. ඇය එය ආයිෂා තුමියට හෙළි කළාය අල්ලාහ් එතුමන්ට ඒ බව දැනුම් දුන් විට එතුමාණෝ එයින් (එම රහසින්) සමහරක් කියා පෙන් වූහ. තවත් සමහරක් නොකියා නොසලකා හැරියහ. එතුමාණෝ එම බිරියට එය (එතුමිය හෙළිකළ රහසින් සමහරක්) කියා පෙන්වූ විට එම බිරිය එතුමන් අමතා ඔබට මෙය දැනුම් දුන්නේ කවරෙකු දැ?යි විමසුවාය. (සියල්ල) දැන තේරුම් ගත් තැනැත්තා (අල්ලාහ්) මට දැනුම් දුන්නේ යැයි එතුමාණෝ පිළිතුරු දුන්හ.

4 (මෙයට සම්බන්ධ වූ අයිෂා හෆ්සා යන දෙදෙනා අමතා අල්ලාහ් මෙසේ කියයි. නුඹලා දෙදෙනා අල්ලාහ්ගෙන් පාප ක්ෂමාව අයදින්නෙහු නම් නුඹලා දෙදෙනාගේ සිත් (යහපත කරා) යොමු වන්නේය. (නබිතුමන් ගැන ලැජ්ජාවීමත් ඔවුන්ගේ රහස් හෙළිකිරීමෙනුත්) ඔවුන්ට විරුද්ධව නුඹලා දෙදෙනා එකිනෙකාට සහයෝගය දෙන්නෙහු නම් නියත වශයෙන්ම අල්ලාහ් ඔවුනට උදව් කරන්නේය. තවද ජිබ්රීල් (අලෙයිහිස් සලාම්) තුමා ද යහපත් ගැත්තන් වන විශ්වාස වන්තකයින් ද (උදව් කර ආරක්ෂා කර ගන්නෝය.) එයට පසුව (යහපත් ගැත්තන්ගෙන් උදව්වට පසුව) අල්ලාහ් ද ජිබ්රීල් තුමා ද මලක්වරු ද උදව් කරන්නෝය.

5 (නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ තම භාර්යාවන් දික්කසාද කරන්නෙහු නම් අල්ලාහ් එතුමන්ට ඔවුනට වඩා අගනා භාර්යාවන් ව දීමට ශක්තිය ඇත්තෙක් බව දැනුවත් කර ප්‍රකාශ කරයි.) ඔහු නුඹලාව දික්කසා ද කරන්නේ නම් ඔහුගේ දෙවියන් නුඹලාට වඩා අගනා අයව (ඉස්ලාමයේ යුතුකම් පිළිගෙන විශ්වාසයේ කරුණුවල ස්ථාවරව සිටින) මුස්ලිම්වරුන් ලෙස ද විශ්වාසවන්තයින් ලෙස ද (අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට ද) සම්පූර්ණයෙන් අවනත වන්නන් ලෙස ද (පාපයන්ගෙන්) පාපක්ෂමා අයදින්නන් වූ ද නැමදුම් වත්පිළිවෙත්වල නිරත වන්නාවූ ද නෝම්බි (උපවාසය) ඉටු කරන්නන් වූද

يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُواْ تُوبُوٓاْ إِلَى ٱللَّهِ تَوۡبَةٗ نَّصُوحًا عَسَىٰ رَبُّكُمۡ
أَن يُكَفِّرَ عَنكُمۡ سَيِّـَٔاتِكُمۡ وَيُدۡخِلَكُمۡ جَنَّٰتٖ تَجۡرِي
مِن تَحۡتِهَا ٱلۡأَنۡهَٰرُ يَوۡمَ لَا يُخۡزِي ٱللَّهُ ٱلنَّبِيَّ وَٱلَّذِينَ ءَامَنُواْ
مَعَهُۥۖ نُورُهُمۡ يَسۡعَىٰ بَيۡنَ أَيۡدِيهِمۡ وَبِأَيۡمَٰنِهِمۡ يَقُولُونَ رَبَّنَآ
أَتۡمِمۡ لَنَا نُورَنَا وَٱغۡفِرۡ لَنَآۖ إِنَّكَ عَلَىٰ كُلِّ شَيۡءٖ قَدِيرٞ ٨
يَٰٓأَيُّهَا ٱلنَّبِيُّ جَٰهِدِ ٱلۡكُفَّارَ وَٱلۡمُنَٰفِقِينَ وَٱغۡلُظۡ عَلَيۡهِمۡۚ
وَمَأۡوَىٰهُمۡ جَهَنَّمُۖ وَبِئۡسَ ٱلۡمَصِيرُ ٩ ضَرَبَ ٱللَّهُ مَثَلٗا
لِّلَّذِينَ كَفَرُواْ ٱمۡرَأَتَ نُوحٖ وَٱمۡرَأَتَ لُوطٖۖ كَانَتَا تَحۡتَ
عَبۡدَيۡنِ مِنۡ عِبَادِنَا صَٰلِحَيۡنِ فَخَانَتَاهُمَا فَلَمۡ يُغۡنِيَا عَنۡهُمَا
مِنَ ٱللَّهِ شَيۡـٔٗا وَقِيلَ ٱدۡخُلَا ٱلنَّارَ مَعَ ٱلدَّٰخِلِينَ ١٠
وَضَرَبَ ٱللَّهُ مَثَلٗا لِّلَّذِينَ ءَامَنُواْ ٱمۡرَأَتَ فِرۡعَوۡنَ إِذۡ
قَالَتۡ رَبِّ ٱبۡنِ لِي عِندَكَ بَيۡتٗا فِي ٱلۡجَنَّةِ وَنَجِّنِي مِن فِرۡعَوۡنَ
وَعَمَلِهِۦ وَنَجِّنِي مِنَ ٱلۡقَوۡمِ ٱلظَّٰلِمِينَ ١١ وَمَرۡيَمَ ٱبۡنَتَ
عِمۡرَٰنَ ٱلَّتِيٓ أَحۡصَنَتۡ فَرۡجَهَا فَنَفَخۡنَا فِيهِ مِن رُّوحِنَا
وَصَدَّقَتۡ بِكَلِمَٰتِ رَبِّهَا وَكُتُبِهِۦ وَكَانَتۡ مِنَ ٱلۡقَٰنِتِينَ ١٢

(කලින් වෙනත් සැමියෙකු විවාහ කර ගැනීම හේතුකොට ගෙන) කණ්‍යා අහිමි වූ හෝ කණ්‍යාභාය ගැහැණුන්ම අල්ලාහ් ඔහුට (භාර්යාවන් ලෙස) මාරු කර දීමට ප්‍රමාණවත් වන්නේය.

6 විශ්වාසවන්තයිනි, (මා නුඹලාට විධානය කළ දෑ කිරීම තුළින් ද වැළැක්වූ දේවල්වලින් වැළකී සිටීම තුළින් ද) නුඹලා නුඹලාව ද (ඒවා විධානය කිරීම තුළින්) නුඹලාගේ පවුලේ අයවද නිරයෙන් ආරක්ෂා කරගනු. එහි ඉන්ධන මිනිසුන් හා ගල්ද වෙයි. (මෙලොව ගින්දර දර මගින් අවුළුවන්නා සේ නිරයේ ගින්දර මිනිසුන් හා ගල් යොදා අවුළුවනු ලැබේ.) එහි හැඩිදැඩිවූද බලසම්පන්න අය වූ ද මලක්වරු කරුණාවක් නොදක්වන්නෝය.) අල්ලාහ් ඔවුනට කළ විධානයට (කිසිවිටෙක) වෙනසක් නොකරන්නෝය. ඔවුහු (අල්ලාහ්ගෙන්) ඔවුනට කෙරෙන විධානය ක්‍රියාත්මක කරමින් සිටිති. (එහෙයින් නිරයේ වැසියන්ට දඬුවම් කිරීම විෂයෙහි පසුබට නොවන්නෝය.)

7 (දෙවියන් ප්‍රතික්ෂේප කළවුන්ව නිරයට තල්ලු කර දැමීමේ දී ඔවුන් අමතා මෙසේ ප්‍රකාශ කෙරෙයි.) දෙවියන් ප්‍රතික්ෂේප කළවුනි, නුඹලා (ලෝකයේ කළ කර්යයන් සඳහා) අද ක්ෂමාව නොඉල්ලනු. නුඹලා කළ දෑ වෙනුවෙන්ය නුඹලාට විපාක දෙනු ලබන්නේ.

8 විශ්වාසවන්තයිනි, නුඹලා පවිත්‍ර වූ තත්ත්වයෙන් (සත්‍යවශයෙන්ම අල්ලාහ්ගෙන් පාප ක්ෂමාව අයදිනු. (සැබෑ තව්බාව වනුයේ හදවතින් පාපයන් සඳහා ශෝක වී ඒවායින් ඉවත් වී ඒවා නැවත නොකරන අදහසින් කරන තව්බාවයි.) නුඹලාගේ දෙවියන් නුඹලාගේ පාපයන් ක්ෂමා කිරීමට ප්‍රමාණවත් අයෙකි. තවද අල්ලාහ් නබිතුමන්ට ද ඔහු සමග විශ්වාස කළ විශ්වාස වන්තයින්ට ද නින්දාව ඇති නොකරන දිනයේ නුඹලාව ඒවා යටින් ගංගාවල් ගලා බසින ස්වර්ගයන්හි ඇතුල් කිරීමට ප්‍රමාණවත් අයෙකි. (ඔවුහු ස්වර්ගය කරා යමින් සිටියදී) ඔවුන්ගේ දීප්තිය ඔවුන්ට ඉදිරියෙන් ද ඔවුන්ගේ දකුණු පසින් ද යමින් පවතී. ඔවුහු අපගේ දෙවියනි, අපගේ දීප්තිය අපට සම්පූර්ණ කරනු මැනවි අපව ක්ෂමා කරනු මැනවි නියත වශයෙන්ම නුඹ සියල්ලට ශක්තිය ඇත්තායැ'යි ප්‍රකාශ කරති.

9 නබිවරයාණනි, නුඹ (සටන් කිරීම මගින්) දෙවියන් ප්‍රතික්ෂේප කරනන්න සමග ද (දඬුවම් කිරීම මගින්) කුහකයින් සමග ද පුණ්‍ය සටන් කරනු. (දෙපාර්ශවය සමගම නුඹ දැඩිව කටයුතු කරනු) ඔවුන් යන තැන නිරයයි. යන තැන්වලින් එය ඉතා නරකය.

10 අල්ලාහ් ප්‍රතික්ෂේප කරන්නන්ට නූහ් (අලෛයිහිස් සලාම්) තුමාගේ බිරිය ද ලූත් (අලෛයිහිස් සලාම්) තුමාගේ බිරිය ද උදාහරණයක් ලෙස සඳහන් කරයි. ඔවුහු දෙදෙනාම අපගේ යහපත් ගැත්තන් දෙදෙනෙකු යටතේ සිට දෙදෙනාම වංචා සහගතව කුමන්ත්‍රණය කළෝය. (නූහ් අලෛයිහිස් සලාම් තුමාගේ බිරිය එතුමාව පිස්සෙකු යැයි කී බවත් ලූත් අලෛයිහිස් සලාම් තුමාගේ බිරිය එතුමාගේ අමුත්තන්ව එතුමාගේ සමාජයට පාවා දුන් බවත් ප්‍රකාශ වේ එම නබිවරුන්) දෙදෙනාම (තම බිරියන්) දෙදෙනාව ම අල්ලාහ්ගේ (දඬුවම්වලින්) කිසිවකගෙන් ආරක්ෂා කළේ නැත. (ඔවුන් දෙදෙනා) අල්ලාහ් හමුවේ ගෞරවනීය අය ලෙස සිටිය ද තම බිරියන්ව දඬුවම්වලින් ආරක්ෂා කළ නොහැක.) තවද (නිරයේ) ඇතුල්වන්නන් සමග නුඹලා ද නිරයට ඇතුළු වනුයි ඒ දෙදෙනා අමතා පවසන ලදී.

11 විශ්වාස වන්තයින්ට අල්ලාහ් ෆිර්අවුන්ගේ බිරියව උදාහරණයට ගෙන දක්වයි. (එම කාන්තා රත්නය දැවැන්ත ප්‍රතික්ෂේප කරන්නෙකු යටතේ සිටියද ඔහුගේ ශක්තිය හා මර්ධනකාරීත්වය ආදිය ඇගේ විශ්වාසයට කිසිඳු හානියක් නොකළේය.) එම කාන්තාව මාගේ දෙවියනි, මට ස්වර්ගයේ නුඹ නිවසක් තනා දෙනු මැනවි (ස්වර්ගයේ නුඹට සමීප වූ අයට නිර්මාණය කරන ස්ථානයේ මටත් නිවසක් නිර්මාණය කරනු මැනව) තවද ෆිර්අවුන්ගෙන් ද ඔහුගේ (දුෂ්ට) ක්‍රියාවන්ගෙන් ද මා ආරක්ෂා කරනු මැනව තවද (කිබ්ති ගෝත්‍රයට අයත් ප්‍රතික්ෂේප කරන්නන් වූ) අක්‍රමිකතා කරුවන්ගෙන් ද මා ආරක්ෂා කරනු මැනව'යි කී අවස්ථාව (නබිවරයාණනි,) නුඹ සිහිපත් කරනු.

12 තවද තම රහසඟ (පාපයෙන්) ආරක්ෂා කරගත් ඉම්රාන්ගේ දියණිය වූ මර්යම්වද (අල්ලාහ් මු:මින්වරුන්ට උදාහරණයක් ලෙස සඳහන් කරයි. අල්ලාහ් මෙලොවදී එතුමියට ගෞරවය හා ආරක්ෂාව ද පරලොව දී ගෞරවය ද දී මෙලොව කාන්තාවන් හැමෝටම වඩා එතුමියව අල්ලාහ් තෝරාගත්තේය.) අපි අපගේ ප්‍රාණය ඇයට පිම්බෙමු. (ජිබ්රීල්

අලෙයිහිස් සලාම් තුමා ඇගේ ශරීරය මත පිම්බූ විට ඒ මගින් ඊසා අලෙයිහිස් සලාම් තුමාව ගර්භයේ ඉසිලුවාය.) එතුමිය තම දෙවියන්ගේ වාක්‍යයන් ද පුස්තකයන් ද සැබෑ කළාය. (ආගමික නීතිරීති ද විශේෂයෙන් ඊසා අලෙයිහිස් සලාම් තුමා ගැන කී පුවතක් ද පෙර නබිවරුන්ගේ ආගම් ආදිය ද විශ්වාස කළාය) එම කාන්තා රත්නය (අල්ලාහ් ට) අවනතවී කටයුතු කරන පිරිසට අයත් වන්නීය. (ඇගේ පවුලේ අය ද අල්ලාහ්ගේ යහපත් ගැත්තන්ය.)

## අල්-මුල්ක්

ترتيبها ٦٧ — سُورَةُ المُلْكِ — آياتها ٣٠

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

تَبَٰرَكَ ٱلَّذِى بِيَدِهِ ٱلْمُلْكُ وَهُوَ عَلَىٰ كُلِّ شَىْءٍ قَدِيرٌ ١ ٱلَّذِى خَلَقَ
ٱلْمَوْتَ وَٱلْحَيَوٰةَ لِيَبْلُوَكُمْ أَيُّكُمْ أَحْسَنُ عَمَلًا وَهُوَ ٱلْعَزِيزُ ٱلْغَفُورُ ٢
ٱلَّذِى خَلَقَ سَبْعَ سَمَٰوَٰتٍ طِبَاقًا مَّا تَرَىٰ فِى خَلْقِ ٱلرَّحْمَٰنِ مِن
تَفَٰوُتٍ فَٱرْجِعِ ٱلْبَصَرَ هَلْ تَرَىٰ مِن فُطُورٍ ٣ ثُمَّ ٱرْجِعِ ٱلْبَصَرَ كَرَّتَيْنِ
يَنقَلِبْ إِلَيْكَ ٱلْبَصَرُ خَاسِئًا وَهُوَ حَسِيرٌ ٤ وَلَقَدْ زَيَّنَّا ٱلسَّمَآءَ
ٱلدُّنْيَا بِمَصَٰبِيحَ وَجَعَلْنَٰهَا رُجُومًا لِّلشَّيَٰطِينِ وَأَعْتَدْنَا لَهُمْ عَذَابَ
ٱلسَّعِيرِ ٥ وَلِلَّذِينَ كَفَرُوا۟ بِرَبِّهِمْ عَذَابُ جَهَنَّمَ وَبِئْسَ ٱلْمَصِيرُ
٦ إِذَآ أُلْقُوا۟ فِيهَا سَمِعُوا۟ لَهَا شَهِيقًا وَهِىَ تَفُورُ ٧ تَكَادُ تَمَيَّزُ
مِنَ ٱلْغَيْظِ كُلَّمَآ أُلْقِىَ فِيهَا فَوْجٌ سَأَلَهُمْ خَزَنَتُهَآ أَلَمْ يَأْتِكُمْ نَذِيرٌ ٨
قَالُوا۟ بَلَىٰ قَدْ جَآءَنَا نَذِيرٌ فَكَذَّبْنَا وَقُلْنَا مَا نَزَّلَ ٱللَّهُ مِن شَىْءٍ إِنْ أَنتُمْ
إِلَّا فِى ضَلَٰلٍ كَبِيرٍ ٩ وَقَالُوا۟ لَوْ كُنَّا نَسْمَعُ أَوْ نَعْقِلُ مَا كُنَّا فِىٓ أَصْحَٰبِ
ٱلسَّعِيرِ ١٠ فَٱعْتَرَفُوا۟ بِذَنۢبِهِمْ فَسُحْقًا لِّأَصْحَٰبِ ٱلسَّعِيرِ ١١
إِنَّ ٱلَّذِينَ يَخْشَوْنَ رَبَّهُم بِٱلْغَيْبِ لَهُم مَّغْفِرَةٌ وَأَجْرٌ كَبِيرٌ ١٢

1 කවරෙකුගේ අතෙහි (මෙලොව ද පරලොවෙහි ද අහස් හා පොළොව යනාදියෙහි) පාලනය ඇද්ද ඔහු (අල්ලාහ්) උසස් කෙනෙකු වූයේය. ඔහු සියල්ල කෙරෙහි හැකියාව ඇත්තෙකි.

2 ඔහු (කෙබඳු කෙනෙකු ද යත් නුඹලාට ආගම දී නීති රීති විධානය කර) නුඹලා අතරේ යහපත් ක්‍රියා කරනුයේ කවරෙකුදැයි පරීක්ෂා කිරීම සඳහා ජීවිතය ද මරණය ද ඇති කළේය. (මේ දෙක ඇතිකිරීමේ අරමුණ අවනත වන්නන්ව ද පව්කාරයින්ව ද ප්‍රසිද්ධියේ දැන ගැනීම පිණිසය.) ඔහු අබිබවා යා හැකි වූද අධිකව ක්ෂමා දෙන්නෙකු ද වන්නේය.

3 අහස් හත තට්ටු පිට තට්ටු ලෙස (එකපිට එක) මැවූයේ ඔහුය. දයාවන්තයා වූ (අල්ලාහ්ගේ) මැවීමේ කිසිම අඩුවක් (ඇද නොගැලපීම් හා ගැටුම්) නොදැක ගන්නෙහුය. (නුඹලාගේ) බැල්ම අහස දෙස හරවා (ඒවා දැවැන්ත ලෙසද විශාල ලෙසද තිබුනද) ඒවායේ සිදුරු නුඹලා දකින්නෙහුදැ?යි බලනු.

4 පසුවද නුඹලා (එක වරකට) දෙවරක් (නුඹලාගේ) බැල්ම හරවා බලහු. (බොහෝ වාර ගණනක් බලහු. කිසිම අඩුවක් දැකගත) නොහැකි ලෙසද නින්දාවට පත්වූ ලෙස ද (නුඹලාගේ) බැල්ම නුඹලා දෙසට හැරී එයි.

5 අපි පහළ අහස පහන් (තාරකා)වලින් අලංකාර කර ඇත්තෙමු. තවද ඒවා (එම තාරකා) ෂෙයිතාන්ලා (පලවා හැරීමට විසි කරන) විසිගල් ලෙස ද නිර්මාණය කළෙමු. (මෙය තාරකාවන්ගේ තවත් ප්‍රයෝජනයකි. කතාදා රහ්මතුල්ලාහි අලෛහි තුමා මෙසේ සඳහන් කරයි. අල්ලාහ් තාරකා මැව්වේ කරුණු තුනක් උදෙසාය. 1) අහස අලංකාර කරන පහන් ලෙස ද 2) ෂෙයිතාන්ලා පලවා හරින විසිගල් ලෙස ද 3) සාගරයේත් ගොඩබිමේත් මාර්ගයන් හා දිසාවන් දැනගැනීම සඳහා සලකුණු ලෙසද මැව්වේය.) තවද ඔවුනට (ෂෙයිතාන්ලාට ඔවුන්ගේ) පුළුස්සන දඬුවම ද අපි සූදානම් කර ඇත්තෙමු.

6 ඔවුන්ගේ දෙවියන් ප්‍රතික්ෂේප කළවුන්ට නිරයේ වේදනාව ඇත. එය මිදෙන (යන) ස්ථානවලින් ඉතා නරකය.

7 (ගින්නට දර විසි කරන්නා සේ) එහි ඔවුන්ව විසි කරනු ලැබුවහොත් එය උණුවෙමින් පවතින තත්ත්වයේ (බුරුවන් කෑගසන අවස්ථාවේ ඇති ශබ්දය මෙන්) හඬකට සවන් දෙති.

8 (ප්‍රතික්ෂේප කරන්නන් කෙරෙහි ඇති කරගත්) තද කෝපය හේතු කොටගෙන එය කැලි කැලි කැඩී යාමට සමීප වෙයි. එහි එක් පිරිසක් විසි කරනු ලබන හැම අවස්ථාවකම එහි (එම නිරයේ) භාරකරුවෝ (වූ මලක්වරු, මේ නිරය ගැන) අවවාද කරන අය නුඹලා වෙත නොආවෙහු දැ?’යි අසති

9 ඔවුහු මෙසේ කියති. එසේය, (අල්ලාහ්ගේ දූතයින් ලෙස එන) අවවාද කරුවෝ පැමිණියහ. (ඔවුහු අපට බිය උපදවා මෙම අපාය ගැන අවවාද කළහ. තවද මෙම දිනය ගැනද දැනුම් දුන්හ.) අප ඔවුන්ව බොරුකර (නුඹලා දැනුම් දෙන අදෘශ්‍යමාන කරුණු පරලොව පිළිබඳ තොරතුරු නුඹලාට අල්ලාහ් වහී ලෙස නොදැන්වීය.) අල්ලාහ් නුඹලාට කිසිවක් පහළ කළේ නැත. නුඹලා මහා මං මුළාවකම සිටින්නෙහු යැයි (එම දූතයින්ව බලා) ප්‍රකාශ කළෙමු.

10 තවද ඔවුහු මෙසේ කියති. (සවන් දී කටයුතු කරන අයුරින්) අප සවන් දුන්නේ නම් නිරයේ වැසියන් නොවන්නෙමු. (එසේ නොවී අප විශ්වාසකර දේව දූතයින්ව අනුගමනය කර ස්වර්ගයට යාමට තිබුණි.)

11 (නිරයට සුදුස්සන් වීමට හේතු වූ දේව ප්‍රතික්ෂේපය දූතයින්ව බොරු කිරීම ආදී) ඔවුන්ගේ පාපයන් ඔවුහු පිළිගනිති. නිරයේ වැසියන්ට (දෙවියන්ගේ දයාවෙන්) බැහැරක්ම වේවා.

12 නියත වශයෙන්ම (ඔවුන්ගේ පරමාධිපති) ඔවුනට අදෘශ්‍යමානව සිටිය දී පවා තම පරමාධිපතිව විශ්වාස කරන අය, ඔවුනට (පරමාධිපතිගේ) ක්ෂමාව ද විශාල ප්‍රතිඵල ද ඇත.

13 නුඹලා වචන රහසේ කියහු නැත්නම් ඒවා ශබ්ද නගා කියහු. (ඒවා හැම එකක්ම අල්ලාහ් දනී. ඔහුට

وَأَسِرُّوا۟ قَوْلَكُمْ أَوِ ٱجْهَرُوا۟ بِهِۦٓ ۖ إِنَّهُۥ عَلِيمٌۢ بِذَاتِ ٱلصُّدُورِ ﴿١٣﴾ أَلَا
يَعْلَمُ مَنْ خَلَقَ وَهُوَ ٱللَّطِيفُ ٱلْخَبِيرُ ﴿١٤﴾ هُوَ ٱلَّذِى جَعَلَ لَكُمُ
ٱلْأَرْضَ ذَلُولًا فَٱمْشُوا۟ فِى مَنَاكِبِهَا وَكُلُوا۟ مِن رِّزْقِهِۦ ۖ وَإِلَيْهِ ٱلنُّشُورُ
﴿١٥﴾ ءَأَمِنتُم مَّن فِى ٱلسَّمَآءِ أَن يَخْسِفَ بِكُمُ ٱلْأَرْضَ فَإِذَا هِىَ
تَمُورُ ﴿١٦﴾ أَمْ أَمِنتُم مَّن فِى ٱلسَّمَآءِ أَن يُرْسِلَ عَلَيْكُمْ حَاصِبًا ۖ
فَسَتَعْلَمُونَ كَيْفَ نَذِيرِ ﴿١٧﴾ وَلَقَدْ كَذَّبَ ٱلَّذِينَ مِن قَبْلِهِمْ فَكَيْفَ
كَانَ نَكِيرِ ﴿١٨﴾ أَوَلَمْ يَرَوْا۟ إِلَى ٱلطَّيْرِ فَوْقَهُمْ صَٰٓفَّٰتٍ وَيَقْبِضْنَ ۚ مَا
يُمْسِكُهُنَّ إِلَّا ٱلرَّحْمَٰنُ ۚ إِنَّهُۥ بِكُلِّ شَىْءٍۭ بَصِيرٌ ﴿١٩﴾ أَمَّنْ هَٰذَا ٱلَّذِى
هُوَ جُندٌ لَّكُمْ يَنصُرُكُم مِّن دُونِ ٱلرَّحْمَٰنِ ۚ إِنِ ٱلْكَٰفِرُونَ إِلَّا فِى غُرُورٍ
﴿٢٠﴾ أَمَّنْ هَٰذَا ٱلَّذِى يَرْزُقُكُمْ إِنْ أَمْسَكَ رِزْقَهُۥ ۚ بَل لَّجُّوا۟ فِى عُتُوٍّ
وَنُفُورٍ ﴿٢١﴾ أَفَمَن يَمْشِى مُكِبًّا عَلَىٰ وَجْهِهِۦٓ أَهْدَىٰٓ أَمَّن يَمْشِى سَوِيًّا
عَلَىٰ صِرَٰطٍ مُّسْتَقِيمٍ ﴿٢٢﴾ قُلْ هُوَ ٱلَّذِىٓ أَنشَأَكُمْ وَجَعَلَ لَكُمُ ٱلسَّمْعَ
وَٱلْأَبْصَٰرَ وَٱلْأَفْـِٔدَةَ ۖ قَلِيلًا مَّا تَشْكُرُونَ ﴿٢٣﴾ قُلْ هُوَ ٱلَّذِى ذَرَأَكُمْ
فِى ٱلْأَرْضِ وَإِلَيْهِ تُحْشَرُونَ ﴿٢٤﴾ وَيَقُولُونَ مَتَىٰ هَٰذَا ٱلْوَعْدُ إِن كُنتُمْ
صَٰدِقِينَ ﴿٢٥﴾ قُلْ إِنَّمَا ٱلْعِلْمُ عِندَ ٱللَّهِ وَإِنَّمَآ أَنَا۠ نَذِيرٌ مُّبِينٌ ﴿٢٦﴾

කිසිම සැඟවුන දෙයක් නො සැඟවේ.) නියත වශයෙන්ම ඔහු හදවත්හි ඇති දෑ ද (සඟවා ඇති දෑ ද) දන්නේය.

14 (තම අත්වලින් මිනිසුන්ව ද මැවුන දෑ ද) මැවුවෙකි. (රහස් ද හදවත්හි සඟවා ඇති) සියුම් කරුණු ද දැනගත හැක්කෙකි. (රහස් කරුණුද දැන ගත හැක්කෙකි.)

15 නුඹලාට භූමිය (එහි පයින් යා හැකි තත්ත්වයට ද වාසය කිරීමට හැකි පරිදිද) මෘදු ලෙස නිර්මාණය කළේ ඔහුය. (නුඹලාට වාසය කිරීමට හෝ පයින් යාමට හෝ නොහැකි පරිදි රළුව හෝ එය නිර්මාණය කළේ නැත. එහෙයින් භූමියේ විවිධ පැතිවලට නුඹලා පයින් ගොස් (ඔහු නුඹලාට මවා ඇති) ඔහුගේ ආහාරවලින් නුඹලා අනුභව කරහු. (අල්ලාහ් තම ගැත්තන්ට භූමියේ සම්පත් ප්‍රයෝජනයට ගත හැකි පරිදි එය මෘදු කර ඔවුන්ට දයාව පහළ කළ බව සඳහන් කර පෙන්වා දී ඒවා ප්‍රයෝජනයට ගන්නා ලෙස ද පොලඹවයි.) (කබ්රයේ -මිනීවළෙන්- නුඹලා නැගිටුවා) ඔහු වෙතම ඒකරාශී කෙරෙන්නෙහුය.

16 (නුඹලාට භූමිය මෘදුකර දයාව පහළ කළ පසු) අහසේ ඉහළ සිටින්නා (අල්ලාහ් කාරූන්ට කළා සේ) නුඹලාව (ද) භූමිය තුළට කිඳාබස්සවයි යන්න පිළිබඳව නුඹලා නිර්භයව සිටිහු ද? එසේ ඔහු කරන්නේ නම් (සන්සුන්ව තිබුන පොළොව) සසල වෙමින් ද වෙවුලමින් ද පවතී.

17 (ලූත් -අලෛයිහිස් සලාම්- තුමාගේ සමාජයට ද ඇත් සේනාවට ද එවූ පරිදි) අහසේ ඉහළ සිටින්නා (අල්ලාහ්) නුඹලාට ගල් වර්ෂාව පතිත කරයි යන්න පිළිබඳව නුඹලා නිර්භයව සිටිහු ද? (නුඹලා මෙම දඬුවම් ඇසෙන් දකිහු නම් අවවාදය කෙසේ දැයි නුඹලා දැනගන්නෙහුය. (ඒ අවස්ථාවේ නුඹලා දැන ගැනීම නුඹලාට ප්‍රයෝජනවත් නොවේ.)

18 ඔවුන්ට පෙර සිටි අය (පෙර නබිවරුන්ගේ සමාජවල අය මොවුන් සේම) අපගේ වැකි බොරු කළහ. (ඔවුනට දඬුවම් කර) මා කළ අවවාදය කෙසේ විද?

19 ඔවුනට ඉහළින් (අහසේ තම පියාපත් විහිද වූ තත්ත්වයෙන් ද තවද (ඒවා ළංකර) නැවූ තත්ත්වයෙන් ද (පියාසර කරන) පක්ෂීන්ව ඔවුහු නොදැක්කෙහු ද? (ඒවා තම පියාපත් විහිදුවාගත් තත්ත්වයෙන් ද නවා තම ශරීරයට හේත්තු කරගත් තත්ත්වයෙන් ද (අහසේ) මහා දයාවන්තයාම (අල්ලාහ්ම) එවා රඳවා ගෙන සිටී. (ඒවා තම පියාපත් ප්‍රයෝජනයට ගෙන ඉහළ නැගීමටත් ඉදිරියට යාමටත් හැකි පරිදි ඒවා පියාපත් සකස් කළ අල්ලාහ්ගේ මැවීම විස්මය ජනකය. නියත වශයෙන්ම ඔහු සියල්ල බලා සිටින්නෙකි. (ඔහුට කිසිවක් නොසැඟවේ.)

20 සැමතැන රහ්මාන් වූ (අල්ලාහ්) හැර නුඹලාට උදව් කරන හමුදාවක් කොහි සිටී ද? (අල්ලාහ් හැර ඔහුගේ දඬුවමින් ආරක්ෂා කරන්නන් කිසිවෙක් නොමැත. අල්ලාහ් තම දයාවෙන් ද උදව්වෙන් ද නුඹලාට උදව් නොකළේ නම් කවරහු නම් නුඹලාට උදව් කරත් ද?) ප්‍රතික්ෂේප කරන්නෝ (මහා) රැවටීමක සිටිති. (ෂෙයිතාන් ඔවුන්ව රවටාගෙන සිටී.)

21 නැතිනම් ඔහු තම රිස්ක් (අහාර හා වැස්ස ආදිය) බාධාකර නතර කළේ නම් නුඹලාට රිස්ක් (ආහාර හා වැස්ස ආදිය) දෙන්නන් කවරෙක් සිටිහු ද? හැම තැනකම ඔවුහු (සත්‍යය පිළිනොගෙන) උඩඟු ඇනීමෙනුත් (එයින් දුරස්ථවීමෙහි) ගිලෙමින් සිටිති.

22 තම මුහුණ මත මුණින් වැටුන තත්ත්වයෙන් ගමන් කරන්නා ඍජුමග ලද්දෙක් ද? (ඔහු දෙවියන් ප්‍රතික්ෂේප කරන්නෙක්. ලෝකයේ පාපයන්හි මුණින් අතට වැටී සිටින්නාව හෙට විනිශ්චය දිනයේ මුහුණ මුණින් වැටු තත්ත්වයේම අල්ලාහ් නැගිටුවන්නේය.) නැත්නම් ඍජු මගෙහි ඍජුව ගමන් කරන්නා ඍජු මග ලද්දෙක් ද? (මොහු මු:මින්වන්නේය. අල්ලාහ් පෙන්වූ මගෙහි යන්නේය. විනිශ්චය දිනයේ දී ඍජු තත්ත්වයේම නැගිට්ටුවා ඍජු මගේම ගොස් ස්වර්ගයට ඇතුල් වෙයි.

23 (නබිවරයාණනි,) නුඹ පවසනු. නුඹලාව (ආරම්භයේ) නිර්මාණය කර නුඹලාට ශ්‍රවණේන්ද්‍රිය හා පෙනීමද ලබා දුන්නේ ඔහුය. නුඹලා මෙම (දයාවන්ට) ස්තුති කරනුයේ ඉතාම අඩුවෙන්ය.

24 (නබිවරයාණනි,) නුඹ ප්‍රකාශ කරනු. නුඹලාව පොළොවේ මැව්වේ ඔහුය. (හෙට විනිශ්චය දිනයේ) ඔහු වෙතටම නුඹලා (නැගිටුවා) ඒකරාශී කරනු ලබන්නෙහුය.

25 නුඹලා සත්‍යවාදීන්ව සිටිහු නම් මෙම පොරොන්දු වූ කාරණය (විනිශ්චය දිනය) කවදා සිදුවේවි දැයි (කියන්නැයි නුඹව බලා) අසන්නෝය.

26 (නබිවරයාණනි,) නුඹ ප්‍රකාශ කරනු. (ඒ පිළිබඳව දැනීම) අල්ලාහ් සතුව පමණක් ඇත. ඔහු හැර අන් කිසිවෙක් එය නොදනියි. මා (නුඹලාට ප්‍රතික්ෂේප කිරීම හා විනිශ්චය දිනය ගැනද) අවවාද කරන්නෙකු පමණි.

فَلَمَّا رَأَوْهُ زُلْفَةً سِيٓـَٔتْ وُجُوهُ ٱلَّذِينَ كَفَرُوا۟ وَقِيلَ هَٰذَا ٱلَّذِى
كُنتُم بِهِۦ تَدَّعُونَ ﴿٢٧﴾ قُلْ أَرَءَيْتُمْ إِنْ أَهْلَكَنِىَ ٱللَّهُ وَمَن مَّعِىَ
أَوْ رَحِمَنَا فَمَن يُجِيرُ ٱلْكَٰفِرِينَ مِنْ عَذَابٍ أَلِيمٍ ﴿٢٨﴾ قُلْ هُوَ
ٱلرَّحْمَٰنُ ءَامَنَّا بِهِۦ وَعَلَيْهِ تَوَكَّلْنَا ۖ فَسَتَعْلَمُونَ مَنْ هُوَ فِى ضَلَٰلٍ مُّبِينٍ ﴿٢٩﴾
قُلْ أَرَءَيْتُمْ إِنْ أَصْبَحَ مَآؤُكُمْ غَوْرًا فَمَن يَأْتِيكُم بِمَآءٍ مَّعِينٍۭ ﴿٣٠﴾

## سُورَةُ القَلَمِ

ترتيبها ٦٨ — آياتها ٥٢

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

نٓ ۚ وَٱلْقَلَمِ وَمَا يَسْطُرُونَ ﴿١﴾ مَآ أَنتَ بِنِعْمَةِ رَبِّكَ بِمَجْنُونٍ ﴿٢﴾
وَإِنَّ لَكَ لَأَجْرًا غَيْرَ مَمْنُونٍ ﴿٣﴾ وَإِنَّكَ لَعَلَىٰ خُلُقٍ عَظِيمٍ ﴿٤﴾
فَسَتُبْصِرُ وَيُبْصِرُونَ ﴿٥﴾ بِأَييِّكُمُ ٱلْمَفْتُونُ ﴿٦﴾ إِنَّ رَبَّكَ هُوَ
أَعْلَمُ بِمَن ضَلَّ عَن سَبِيلِهِۦ وَهُوَ أَعْلَمُ بِٱلْمُهْتَدِينَ ﴿٧﴾ فَلَا تُطِعِ
ٱلْمُكَذِّبِينَ ﴿٨﴾ وَدُّوا۟ لَوْ تُدْهِنُ فَيُدْهِنُونَ ﴿٩﴾ وَلَا تُطِعْ كُلَّ
حَلَّافٍ مَّهِينٍ ﴿١٠﴾ هَمَّازٍ مَّشَّآءٍۭ بِنَمِيمٍ ﴿١١﴾ مَّنَّاعٍ لِّلْخَيْرِ مُعْتَدٍ
أَثِيمٍ ﴿١٢﴾ عُتُلٍّۭ بَعْدَ ذَٰلِكَ زَنِيمٍ ﴿١٣﴾ أَن كَانَ ذَا مَالٍ وَبَنِينَ
﴿١٤﴾ إِذَا تُتْلَىٰ عَلَيْهِ ءَايَٰتُنَا قَالَ أَسَٰطِيرُ ٱلْأَوَّلِينَ ﴿١٥﴾

27 එය (ඔවුනට අයත් දඬුවම) සමීප වූ බව ඔවුන් දැකගන්නා විට ප්‍රතික්ෂේප කළවුන්ගේ මුහුණු (කළු පැහැගැන්වී ශෝකයෙන් වෙළී) පලුදු වී යයි. (එවිට ඔවුන් අමතා) ප්‍රකාශ කෙරෙයි. මෙයයි (කවදා ඒවි දැයි නුඹලා ඉක්මන් වී) සොයමින් සිටි දිනය.

28 (නබිවරයාණනි,) නුඹ ප්‍රකාශ කරහි. (නුඹලා ආශා කරන්නාක් මෙන් ඝාතනය කරනු ලැබීම මගින් හෝ මරණය මගින් හෝ) මාව ද  මා සමඟ සිටින අයව විනාශ කළ ද නැතිනම් (දීර්ඝ ආයුෂ දී) අපට දයාව පහළ කළ ද හිංසාවෙන් යුත් දඬුවමෙන් කාෆිර්වරුන් (ප්‍රතික්ෂේප කරන්නන්)ව ආරක්ෂා කරන්නෝ කවරහුදැ?යි දැනුම් දෙහි. (ඔවුන්ව ආරක්ෂා කිරීමට කිසිවෙකු නැත.)

29 (නබිවරයාණනි,) නුඹ ප්‍රකාශ කරහි. ඔහු (එසේ ආරක්ෂා කරන්නෙක්) දයාවන්තයා (අල්ලාහ්)ය අපි ඔහුව විශ්වාස කරන්නෙමු. (අපගේ සෑම කටයුත්තකදීම ඔහු වෙත අපි භාරකර ඇත්තෙමු. පැහැදිලි මංමුළාවේ කවුරුන් සිටින්නේදැයි නුඹලා දැනගන්නෙහුය.

30 (නබිවරයාණනි,) නුඹ ප්‍රකාශ කරහි. (ළිං ඔයවල් හා උල්පත් මගින් නුඹලාට දයාව ලෙස දුන්) නුඹලාගේ ජලය (සම්පූර්ණයෙන් නැති වෙන අයුරින්) හිඳෙන්නේ නම් අධිකව හලන ජලය නුඹලාට ගෙන එන්නේ කවරහුද? (අල්ලාහ් හැර අන් කිසිවෙකුට ගෙන ආ නොහැක.)

# අල්- කලම්

1 මම පන්හිඳ මතද (ඒ මගින්) ඔවුන් ලියන දෑ මත ද දිවුරා කියමි. (අල්ලාහ් දැනුම් මතද ඒවා පැහැදිලි කිරීමට හා ලිවීමට ප්‍රයෝජනයට ගන්නා පෑන් මතද දිවුරා ඇත්තේය.)

2 නුඹ (නබිත්වය නායකත්වය වැනි) නුඹේ දෙවියන්ගේ දයාවන් හේතු කොට ගෙන නුඹ උමතු වූවෙක් නොවන්නෙහිය.

3 (නබිත්වයේ වගකීම් දරාගෙන නුඹ විවිධාකාර හිංසාවන්ට මුහුණ දුන් හේතුවෙන්) නුඹට අඛණ්ඩ වූ ප්‍රතිඵල ඇත.

4 නියත වශයෙන්ම නුඹ ශ්‍රේෂ්ඨ ගතිගුණවලින් යුක්ත වන්නෙහිය. (අල්-කුර්ආනයේ අල්ලාහ් නුඹට කුමන ගතිගුණ විධානය කර ඇත් ද එවැනි ගතිගුණවලින් යුක්තව නුඹ සිටින්නෙහිය. තවද පහත සඳහන් හදීසය මගින් මෙය ස්ථීර වේ. ආයිෂා (රළියල්ලාහු අන්හා) තුමියගෙන් නබිතුමාගේ ගතිගුණ ගැන විමසූ විට එතුමන්ගේ ගතිගුණ අල්-කුර්ආනය වීයයැයි පිළිතුරු දුන්නාය.)

5 (සත්‍යය හෙළිවී තිර ඉවත් වන අවස්ථාවේ) නුඹ ද දැනගන්නෙහිය. ඔවුහු ද (ප්‍රතික්ෂේප කරන්නෝ ද) දැනගන්නෝය.

6 නුඹලාගෙන් කවරෙකු (උමතුව මගින්) පරීක්ෂණයට ඇතුළත් කර සිටින්නේ දැයි (පරලොවදී දැනගන්නෙහුය. මෙය නබි මුහම්මද් - සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමාණන් මංමුළා වූවෙකු හා උමතුව මගින් පරීක්ෂණයට ලක් වූ අයෙකු යැයි කී අයට විරුද්ධව කළ ප්‍රකාශයකි.)

7 නියත වශයෙන්ම නුඹේ රක්ෂකයාණන් ඔහුගේ මාර්ගයෙන් මුළාවී ගිය අයව හොඳින් දන්නේය. (සැබැවින්ම මංමුළාවේ සිටින්නෝ කවරහුද? නුඹලා ද නැත්නම් නුඹලාට දොස් පවරන ඔවුහුද? යන්න ඔහු හොඳින් දනී. ඔහු සදාකාලික (භාග්‍ය කරා ගෙන යන) ඍජුමඟ ලද අයවද හොඳින් දනී.

8 එහෙයින් බොරු කරන්නන්ට නුඹ අවනත නොවෙහි.

9 නුඹ (ඔවුන් සමඟ) ලිහිල් වී කටයුතු කිරීම ප්‍රිය කරති. එසේ නම් ඔවුහු ද නුඹ සමඟ ලිහිල්ව කටයුතු කරන්නෝය. (නුඹ ඔවුන් සමඟ මෘදු ලෙසද නම්‍යශීලිව ද කටයුතු කිරීම ඔවුහු ප්‍රිය කරති. එසේ නුඹ කටයුතු කරන්නෙහි නම් ඔවුහුද නම්‍යශීලි වන්නෝය.)

10 නුඹ අධිකව දිවුරන නින්දිත වූ කිසිවෙකුට යටහත් නොවෙහි.

11 (ඔහු මිනිසුන්ගේ) දොස් අධිකව කථා කරමින් ඇවිදින්නේය. (තවද මිනිසුන් අතරේ අර්බුද ඇති කරලීමේ අරමුණෙන්) කේලම් රැගෙන යන්නෙකි. (හම්මාස් බනු ජනතාව ඉදිරිපිට ඔවුන්ගේ දොස් කියමින් ඇවිදින්නාය.)

12 (ඔහු) යහපත් කරුණු අධිකව වළක් වන්නෙකි. සීමාව ඉක්මවන්නෙකි. පව්කාරයෙකි.

13 රළු ගති ඇත්තෙකි. මේවාට පසු (දෙමව්පියන් නොදැන) අසම්මත ක්‍රමයෙන් උපන්නෙකි.

14 ඔහු ධනය ද පිරිමි දරුවන් ද ඇත්තෙකු වීම නිසා (නුඹ ඔහුට යටහත් නොවෙහි)

15 ඔහුට අපේ වැකි කියවා පෙන්වූ විට මෙය මුතුන් මිත්තන්ගේ පොත් යැයි පවසයි.

سَنَسِمُهُۥ عَلَى ٱلْخُرْطُومِ ١٦ إِنَّا بَلَوْنَٰهُمْ كَمَا بَلَوْنَآ أَصْحَٰبَ ٱلْجَنَّةِ إِذْ أَقْسَمُوا۟
لَيَصْرِمُنَّهَا مُصْبِحِينَ ١٧ وَلَا يَسْتَثْنُونَ ١٨ فَطَافَ عَلَيْهَا طَآئِفٌ مِّن رَّبِّكَ
وَهُمْ نَآئِمُونَ ١٩ فَأَصْبَحَتْ كَٱلصَّرِيمِ ٢٠ فَتَنَادَوْا۟ مُصْبِحِينَ ٢١ أَنِ
ٱغْدُوا۟ عَلَىٰ حَرْثِكُمْ إِن كُنتُمْ صَٰرِمِينَ ٢٢ فَٱنطَلَقُوا۟ وَهُمْ يَتَخَٰفَتُونَ ٢٣
أَن لَّا يَدْخُلَنَّهَا ٱلْيَوْمَ عَلَيْكُم مِّسْكِينٌ ٢٤ وَغَدَوْا۟ عَلَىٰ حَرْدٍ قَٰدِرِينَ ٢٥ فَلَمَّا
رَأَوْهَا قَالُوٓا۟ إِنَّا لَضَآلُّونَ ٢٦ بَلْ نَحْنُ مَحْرُومُونَ ٢٧ قَالَ أَوْسَطُهُمْ أَلَمْ أَقُل
لَّكُمْ لَوْلَا تُسَبِّحُونَ ٢٨ قَالُوا۟ سُبْحَٰنَ رَبِّنَآ إِنَّا كُنَّا ظَٰلِمِينَ ٢٩ فَأَقْبَلَ
بَعْضُهُمْ عَلَىٰ بَعْضٍ يَتَلَٰوَمُونَ ٣٠ قَالُوا۟ يَٰوَيْلَنَآ إِنَّا كُنَّا طَٰغِينَ ٣١ عَسَىٰ
رَبُّنَآ أَن يُبْدِلَنَا خَيْرًا مِّنْهَآ إِنَّآ إِلَىٰ رَبِّنَا رَٰغِبُونَ ٣٢ كَذَٰلِكَ ٱلْعَذَابُ ۖ وَلَعَذَابُ
ٱلْءَاخِرَةِ أَكْبَرُ ۚ لَوْ كَانُوا۟ يَعْلَمُونَ ٣٣ إِنَّ لِلْمُتَّقِينَ عِندَ رَبِّهِمْ جَنَّٰتِ ٱلنَّعِيمِ
٣٤ أَفَنَجْعَلُ ٱلْمُسْلِمِينَ كَٱلْمُجْرِمِينَ ٣٥ مَا لَكُمْ كَيْفَ تَحْكُمُونَ ٣٦ أَمْ
لَكُمْ كِتَٰبٌ فِيهِ تَدْرُسُونَ ٣٧ إِنَّ لَكُمْ فِيهِ لَمَا تَخَيَّرُونَ ٣٨ أَمْ لَكُمْ أَيْمَٰنٌ
عَلَيْنَا بَٰلِغَةٌ إِلَىٰ يَوْمِ ٱلْقِيَٰمَةِ ۙ إِنَّ لَكُمْ لَمَا تَحْكُمُونَ ٣٩ سَلْهُمْ أَيُّهُم
بِذَٰلِكَ زَعِيمٌ ٤٠ أَمْ لَهُمْ شُرَكَآءُ فَلْيَأْتُوا۟ بِشُرَكَآئِهِمْ إِن كَانُوا۟ صَٰدِقِينَ ٤١
يَوْمَ يُكْشَفُ عَن سَاقٍ وَيُدْعَوْنَ إِلَى ٱلسُّجُودِ فَلَا يَسْتَطِيعُونَ ٤٢

16 අපි (විනිශ්චය දිනයේ) ඔහුගේ නාසයේ සලකුණු කරමු. (ඔහු නිරයට යාමට පෙර ඔහුගේ මුහුණ ගින්නෙන් කළු පැහැ කරනු ඇත.)

17 නියත වශයෙන්ම අපි (යෙමනයේ සන්ආවට සමීපව සිටි) වතු අයිතිකරුවන්ව පරීක්ෂා කළාසේ ඔවුන්ව (මක්කමේ කාෆිර් වරුන්ව නබි තුමන්ගේ ප්‍රාර්ථනය අනුව සාගින්නෙන් හා සාගතයෙන්) පරීක්ෂා කළෙමු. (එම වත්ත සන්ආවට මඳක් දුරින් අල්ලාහ්ගේ යහපත් ගැත්තන්ගෙන් කෙනෙකුට අයිතිව තිබුණි. අල්ලාහ්ගේ යුතුකම් ඔහු ඉටු කරමින් සිටියේය. ඔහුගේ අභාවයෙන් පසුව එම වත්ත ඔහුගේ දරුවන්ට අයිති වු විට ඔවුහු එහි යුතුකම් ඉටු කිරීම ප්‍රතික්ෂේප කළහ.) හෙට උදෙන්ම ඒවායේ (පලතුරු) නෙලන බවට ඔවුන් දිවුරූ අවස්ථාවේ දී (අල්ලාහ් ඔවුන්ව පරීක්ෂා කළේය.)

18 (එසේ දිවුරන විට) අල්ලාහ් මනාප වුවොත් (ඉන්ෂා අල්ලාහ්) කීවේ නැත.

19 (එදින රාත්‍රි) ඔවුන් නිදාගෙන සිටින විට අල්ලාහ් වෙතින් පැමිණී ගින්න එම වත්ත වටකර (විනාශ කළේය).

20 එහෙයින් එය (පලතුරු) නෙලා ගත්තා සේ වෙනස් විය. (එහි කිසිම පළතුරක් ඉතිරිවුයේ නැත.)

21 එළිය වැටුන විට ඔවුහු එකෙක් අනෙකාව අමතා (කීහ)

22 නුඹලා (කපා) අස්වැන්න නෙළන්නේ නම් (දුප්පතුන් කිසිවෙක් පැමිණීමට පෙර උදෙන්ම නුඹලාගේ වතුවලට යනු.

23 ඔවුහු (අනුන්ට නොඇසි) රහසේ කථා කරගෙන ගියහ.

24 අද මේ වත්තට දුප්පතුන් කිසිවෙක් නොපැමිණිය යුතය (රහසේ කථා කර ගෙන ගියහ.)

25 ඔවුහු තනිවම ශක්තිමත්ව බලසම්පන්න අය ලෙස (ඔවුන්ගේ වත්තට) උදෙන්ම ගියහ.

26 ඔවුහු එය (වෙනස් මුහුණු වරකින්) දුටු විට අපි පාර වරද්දා ගත්තෙමු" යි කීහ. (ඔවුහු හොඳින් එබිකම් කර සුපරීක්ෂාකාරිව බලා එය ඔවුන්ගේ ම වත්ත බව දැන ගත් විට ඔවුහු මෙසේ කීහ).

27 නැහැ අපි අභාග්‍යවන්තයින් වීමු. (අප දුප්පතුන්ට නොදීමට තීරණය කළ නිසා අල්ලාහ් මෙම පලතුරු විනාශ කර අපව අභාග්‍යවන්තයින් කළේය.

28 ඔවුනතර සාධාරණ හා වැදගත් පුද්ගලයා මෙසේ කීය .නුඹලා මෙයින් දුප්පතුන්ට නොදී වැළැක්වීම අසාධාරණයක් බව මම නොකීවෙම්ද? නුඹලා අල්ලාහ් ව මෙනෙහි නොකරන්නෙහුද?

29 ඔවුහු මෙසේ කීහ. අපි අපගේ දෙවියන්ව මෙනෙහි කරමු. අපි (දුප්පතුන්ගේ අයිතීන් වැළැක්වීම මගින්) අසාධාරණ කර ගතිමු.

30 ඔවුහු සමහරෙක් සමහරෙකුට දොස් පවරන්නට වුහ.

31 ඔවුහු මෙසේ කීහ. අහෝ අපට වු පරිහානිය, අප (අසාධාරණකම් කර) සීමාව ඉක්මවා ගියෙමු.

32 අපගේ රක්ෂකයාණන් අපට එයට වඩා වැදගත් දෙයක් විකල්ප වශයෙන් දීමට ප්‍රමාණවත් වන්නේය. නියත වශයෙන්ම අපි (යහපතද ක්ෂමාවද) අපගේ දෙවියන්ගෙන්ම බලාපොරොත්තු වන්නෙමු.

33 දඬුවම එසේය. (වත්ත අයිති කරුවන්ට අපි දඬුවම් කළා සේ මෙලොව දෙවියන් ප්‍රතික්ෂේප කරන්නන්ට දඬුවම් කරන්නෙමු.) ඔවුහු දනිත් නම් පරලොව දඬුවම් අති විශාලය. (එහෙත් ඔවුහු නොදනිති).

34 (අල්ලාහ්ට) බිය වුවන්ට ඔවුන්ගේ රක්ෂකයා සතුව ස්වර්ගයේ උයන් ඇත.

35 අපි අපරාධ කරුවන් සේ මුස්ලිම්වරුන්ව ද පත් කරන්නෙමුද? (දෙවියන් ප්‍රතික්ෂේප කරන්නන් ගේ නායකයින් පරලොවක් ඇත්නම් ලෝකයේ අපටත් මුස්ලිම්වරුන්ටත් අතරේ ලෝකයේ භාග්‍යයන්ගෙන් වෙනසක් නැතුවා සේ පරලොවද වෙනසක් නොවන්නේයැ'යි කීහ. ඔවුහු දෙදෙනාම සමාන නොවෙති. අවනත වුවන්ටත් ප්‍රතික්ෂේප කළවුන්ටත් අතරේ සම කිරීම සාධාරණ නොවේ.)

36 නුඹලාට කුමක් සිදුවීද? (මෙසේ ඇදේට) කෙසේ තීරණ ගන්නෙහුද?

37 එසේ නැත්නම් නුඹලා එයින් ඉගෙන ගන්නා පුස්තකයක් නුඹලාට තිබේද? (එසේ තිබේනම් එහි විශ්වාස කළ වුන්ද ප්‍රතිකෙෂ්ප කළ අයත් සමාන යැයි කියා තිබේද?

38 එහි (එම පුස්තකයෙහි) පරලොවෙහි නුඹලාට නුඹලා කැමති හැමදෙයක්ම ඇත"යි කියා තිබේද?

39 ඔවුන් තීරණය කරන දෑ ඔවුන්ට පරලොවදී ඇතැයි පරලොව දක්වා (වෙනස් නොවන) ගිවිසුම් කිසිවක් ඔවුන් අප සමග කරගෙන තිබේද? (ඔවුහු ස්වර්ගයට ඇතුල් වන බවටත් එය පරලොව දක්වා වෙනස් නොවන බවටත් අල්ලාහ්ගෙන් ප්‍රතිඥාවක් ලබා ගත්තහුද?)

40 (එසේ ඔවුන් ලබා ගෙන ඇත්නම්) එයට ඔවුන්ගෙන් වගකිව යුක්තා කවරෙක්ද?"යි (නබිවරයාණෙනි) නුඹ ඔවුන්ගෙන් අසහු.

41 එසේ නැතිනම් (අල්ලාහ් සමග) ඔවුන්ට ආදේශකරුවන් සිටිද? (පරලොවදී මුස්ලිම් සිටිද?) ඔවුහු සත්‍යවාදීන් නම් ඔවුන්ගේ ආදේශකරුවන් ව කැඳවාගෙන එනු.

42 පාදයේ බත් කෙණ්ඩෙන් (තිරය) ඉවත් කර ඔවුන්ව සුජුද් කරා කැඳවන දිනයේ එයට ඔවුහු ශක්තිය නොලබති. (අබු සර්ද් -රළියල්ලාහු අන්හු-තුමා මෙසේ පවසයි. නබි -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්-තුමාණන් කළ ප්‍රකාශයකට මම සවන් දුනිමි. අපගේ පරමාධිපති තම පාදයේ කෙණ්ඩය හෙළි කරයි. ඒ අවස්ථාවේ විශ්වාස කළ ගැහැණු පිරිමි දෙපාර්ශවයම සුජුද් කරති. ලෝකයේ මුනිවිජාවට හා ප්‍රශංසාවට සුජුද් කළ අය ඉතිරි වෙති. ඔවුහු එයට උත්සාහ කරන්නෝය. ඔවුන්ගේ පිට ඝනවී තට්ටුවක් සේ වෙයි. -බුහාරි- එහෙයින් ප්‍රතික්ෂේප කළවුන්ද කුහකයින්ද ඒ අවස්ථාවේ ඔවුන්ගේ පිට ඝනවීම හේතුකොට ගෙන සුජුද් කරන්න නොහැකි අය බවට පත් වන්නෝය. අල්ලාහ් තම කෙණ්ඩය විවෘත කරනුයේ එදවසේ බරපතලකම පෙන්වීමටය.)

43 ඔවුන්ව නින්දාව (බරපතල නින්දාව හා පසු තැවිල්ල ආදිය) වෙළා ගනී. ඔවුන් නිරෝගීමත් තත්ත්වයේ (ලෝකයේ) සුජුද් කිරීමට කැඳවනු ලැබුහ. (ඉබ්‍රාහිම් අත්තෙමි මෙසේ ප්‍රකාශ කරයි) අදාන්, ඉකාමත් මගින් කැඳවනු ලැබුහ. ඔවුහු ප්‍රතික්ෂේප කළහ.)

44 (නබිවරයාණනි) නුඹ මාවද මෙම පුවත (කුර්ආනය) ද බොරුකරන්නන්ව අත්හරිහී. (ඔවුන් පිළිබඳව නුඹ කල්පනා නොකරහු. ඔවුන්ව මගේ භාරයට දෙහු) ඔවුන් නොදන්නා මාර්ගයෙන් අපි ඔවුන්ව අල්ලන්නෙමු. (ඔවුන්ව අපි සෙමින් දඬුවම් කරා කැඳවාගෙන යන්නෙමු)

45 (ඔවුන් පාපය තවදුරටත් අධික කරගැනීම සඳහා) ඔවුනට මම අවකාශය දෙමි. නියත වශයෙන්ම (ඔවුන්ට දඬුවම් කිරීමට) මා කරන සැලැස්ම ශක්තිමත්ය.

46 (අල්ලාහ්ව විශ්වාස කිරීම සඳහා ඔවුන්ව කැඳවීමට) ඔවුන්ගෙන් නුඹ කුලිය ඉල්ලන්නෙහිද? (එසේ නුඹ ඉල්ලා ඇත්නම්) එම ණය බර ඔවුන් මත පැටවෙන්න තිබිණ. (එසේ නුඹ නොඉල්ලා තිබියදීත් ඔවුන් විශ්වාස කරන්න පසුබට වන්නේ මන්ද?)

47 නැතිනම් ඔවුන්ට සැගවුන (දැනුම) ඇත්ද? (ඔවුන් ඒ මගින් නුඹ සමග තර්ක කිරීම සඳහා අවශ්‍ය සාධක ලියා ගන්නහිද?)

48 (නබිවරයාණනි) නුඹ නුඹේ දෙවියන්ගේ තීන්දුව ඉවසා ගනී. නුඹ මාළුවා සම්බන්ධ කෙනො මෙන් (ඉක්මන් වීමෙන්ද කෝප වීමෙන්ද යූනුස් -අලෙයිහිස් සලාම්- තුමා මෙන්) නොවහි. ඔහු (ශෝකයට හා කෝපයට පත් වී තම දෙවියන්ව කැඳවූ අවස්ථාව සිහි කරහු. (මෙම කාෆිර් වරුන් සම්බන්ධයෙන් ඔහුමෙන් ඉක්මන් නොවහු.)

49 (පාප ක්ෂමාව ඉල්ලන අවස්ථාවල දී පසුව එය පිළිගෙන පාප ක්ෂමාව ලබා දීම මගින්) ඔහුගේ දෙවියන් ඔහුට පහළ කළ දයාව ඔහුට නොලැබුණේ නම් නින්දාවට පත් වී (කිසිම පැළයක් නොපැළවෙන) පුරන් බිමක (මාළුවාගේ කුසෙන්) පිටතට විසි කරනු ලබන්නේය.

50 අල්ලාහ් ඔහුව (නබිත්වයට) තෝරාගෙන ඔහුගේ

خَٰشِعَةً أَبْصَٰرُهُمْ تَرْهَقُهُمْ ذِلَّةٌ وَقَدْ كَانُوا۟ يُدْعَوْنَ إِلَى ٱلسُّجُودِ وَهُمْ سَٰلِمُونَ
﴿٤٣﴾ فَذَرْنِى وَمَن يُكَذِّبُ بِهَٰذَا ٱلْحَدِيثِ سَنَسْتَدْرِجُهُم مِّنْ حَيْثُ
لَا يَعْلَمُونَ ﴿٤٤﴾ وَأُمْلِى لَهُمْ إِنَّ كَيْدِى مَتِينٌ ﴿٤٥﴾ أَمْ تَسْـَٔلُهُمْ أَجْرًا فَهُم
مِّن مَّغْرَمٍ مُّثْقَلُونَ ﴿٤٦﴾ أَمْ عِندَهُمُ ٱلْغَيْبُ فَهُمْ يَكْتُبُونَ ﴿٤٧﴾ فَٱصْبِرْ
لِحُكْمِ رَبِّكَ وَلَا تَكُن كَصَاحِبِ ٱلْحُوتِ إِذْ نَادَىٰ وَهُوَ مَكْظُومٌ ﴿٤٨﴾ لَّوْلَآ
أَن تَدَٰرَكَهُۥ نِعْمَةٌ مِّن رَّبِّهِۦ لَنُبِذَ بِٱلْعَرَآءِ وَهُوَ مَذْمُومٌ ﴿٤٩﴾ فَٱجْتَبَٰهُ رَبُّهُۥ
فَجَعَلَهُۥ مِنَ ٱلصَّٰلِحِينَ ﴿٥٠﴾ وَإِن يَكَادُ ٱلَّذِينَ كَفَرُوا۟ لَيُزْلِقُونَكَ بِأَبْصَٰرِهِمْ
لَمَّا سَمِعُوا۟ ٱلذِّكْرَ وَيَقُولُونَ إِنَّهُۥ لَمَجْنُونٌ ﴿٥١﴾ وَمَا هُوَ إِلَّا ذِكْرٌ لِّلْعَٰلَمِينَ ﴿٥٢﴾

ترتيبها ٦٩ — سُورَةُ الحَاقَّة — آياتها ٥٢

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

ٱلْحَآقَّةُ ﴿١﴾ مَا ٱلْحَآقَّةُ ﴿٢﴾ وَمَآ أَدْرَىٰكَ مَا ٱلْحَآقَّةُ ﴿٣﴾ كَذَّبَتْ ثَمُودُ
وَعَادٌۢ بِٱلْقَارِعَةِ ﴿٤﴾ فَأَمَّا ثَمُودُ فَأُهْلِكُوا۟ بِٱلطَّاغِيَةِ ﴿٥﴾ وَأَمَّا
عَادٌ فَأُهْلِكُوا۟ بِرِيحٍ صَرْصَرٍ عَاتِيَةٍ ﴿٦﴾ سَخَّرَهَا عَلَيْهِمْ
سَبْعَ لَيَالٍ وَثَمَٰنِيَةَ أَيَّامٍ حُسُومًا فَتَرَى ٱلْقَوْمَ فِيهَا صَرْعَىٰ
كَأَنَّهُمْ أَعْجَازُ نَخْلٍ خَاوِيَةٍ ﴿٧﴾ فَهَلْ تَرَىٰ لَهُم مِّنۢ بَاقِيَةٍ ﴿٨﴾

යහපත් ගැත්තන් ගෙන් කෙනෙකු කළේය. (ඔහුව නැවතත් ලක්ෂයක් හෝ ඊටත් වැඩි සංඛ්‍යාවකට දූතයෙකු වශයෙන් එවා ඔවුහු හැමෝම විශ්වාස කළහ).

51 දෙවියන් ප්‍රතික්ෂේප කරන්නෝ මෙම උපදේශය (අල්කුර්ආනය) අසන විට කෝපය හේතු කොට ගෙන ඔවුන්ගේ බැල්මෙන් නුඹව බිම හෙළීමට වෙර දරන්නෝය. තවද ඔවුහු නුඹ ගැන ඔහු උමතුවෙක් යැයි කියති.

52 එය ලෝකවාසීන්ට උපදේශයක් මිස වෙනෙකක් නැත.

# අල් හාක්කා

1 සත්‍ය වශයෙන්ම සිදුවන (විනිශ්වය) දිනය වනාහි.

2 සත්‍ය වශයෙන් ම සිදුවන්නේ කුමක්ද?

3 සත්‍ය වශයෙන්ම සිදුවන්නේ කුමක්ද?"යි (නබිවරයාණනි) නුඹට දැනුම දුන්නේ කුමක්ද?

4 සමූද් සමූහයා ද ආද් සමූහයා ද (හදවත්) තැතිගැස්ම ඇති කරන දෙය (අවසන් දිනය) බොරු කළහ. (විනිශ්වය දිනය කාරිආ 'තැතිගැස්ම ඇති කරන්නකි' යන නමින් හඳුන්වනු ලබයි. මන්ද එය තම භායානක කමින් හදවත් තැති ගන්වන්නේය).

5 සමූද් සමූහයා (සාලිහ් --අලෙයිහිස් සලාම්-තුමාගේ සමූහයයාය.) ඔවුන් දරාගත නොහැකි ශබ්දයක් මගින් ඔවුහු විනාශ කරනු ලැබූහ.

6 ආද් සමූහයා (මොවුහු හූද් -අලෙයිහිස් සලාම්-තුමාගේ සමූහයයාය.) තද ශීතලෙන් යුත් මහා

وَجَآءَ فِرۡعَوۡنُ وَمَن قَبۡلَهُۥ وَٱلۡمُؤۡتَفِكَٰتُ بِٱلۡخَاطِئَةِ ٩ فَعَصَوۡاْ رَسُولَ
رَبِّهِمۡ فَأَخَذَهُمۡ أَخۡذَةٗ رَّابِيَةً ١٠ إِنَّا لَمَّا طَغَا ٱلۡمَآءُ حَمَلۡنَٰكُمۡ فِي ٱلۡجَارِيَةِ
١١ لِنَجۡعَلَهَا لَكُمۡ تَذۡكِرَةٗ وَتَعِيَهَآ أُذُنٞ وَٰعِيَةٞ ١٢ فَإِذَا نُفِخَ فِي ٱلصُّورِ
نَفۡخَةٞ وَٰحِدَةٞ ١٣ وَحُمِلَتِ ٱلۡأَرۡضُ وَٱلۡجِبَالُ فَدُكَّتَا دَكَّةٗ وَٰحِدَةٗ ١٤
فَيَوۡمَئِذٖ وَقَعَتِ ٱلۡوَاقِعَةُ ١٥ وَٱنشَقَّتِ ٱلسَّمَآءُ فَهِيَ يَوۡمَئِذٖ وَاهِيَةٞ
١٦ وَٱلۡمَلَكُ عَلَىٰٓ أَرۡجَآئِهَاۚ وَيَحۡمِلُ عَرۡشَ رَبِّكَ فَوۡقَهُمۡ يَوۡمَئِذٖ ثَمَٰنِيَةٞ
١٧ يَوۡمَئِذٖ تُعۡرَضُونَ لَا تَخۡفَىٰ مِنكُمۡ خَافِيَةٞ ١٨ فَأَمَّا مَنۡ أُوتِيَ
كِتَٰبَهُۥ بِيَمِينِهِۦ فَيَقُولُ هَآؤُمُ ٱقۡرَءُواْ كِتَٰبِيَهۡ ١٩ إِنِّي ظَنَنتُ أَنِّي مُلَٰقٍ
حِسَابِيَهۡ ٢٠ فَهُوَ فِي عِيشَةٖ رَّاضِيَةٖ ٢١ فِي جَنَّةٍ عَالِيَةٖ ٢٢
قُطُوفُهَا دَانِيَةٞ ٢٣ كُلُواْ وَٱشۡرَبُواْ هَنِيٓـَٔۢا بِمَآ أَسۡلَفۡتُمۡ فِي ٱلۡأَيَّامِ
ٱلۡخَالِيَةِ ٢٤ وَأَمَّا مَنۡ أُوتِيَ كِتَٰبَهُۥ بِشِمَالِهِۦ فَيَقُولُ يَٰلَيۡتَنِي لَمۡ أُوتَ كِتَٰبِيَهۡ
٢٥ وَلَمۡ أَدۡرِ مَا حِسَابِيَهۡ ٢٦ يَٰلَيۡتَهَا كَانَتِ ٱلۡقَاضِيَةَ ٢٧ مَآ أَغۡنَىٰ
عَنِّي مَالِيَهۡۜ ٢٨ هَلَكَ عَنِّي سُلۡطَٰنِيَهۡ ٢٩ خُذُوهُ فَغُلُّوهُ ٣٠ ثُمَّ ٱلۡجَحِيمَ
صَلُّوهُ ٣١ ثُمَّ فِي سِلۡسِلَةٖ ذَرۡعُهَا سَبۡعُونَ ذِرَاعٗا فَٱسۡلُكُوهُ ٣٢ إِنَّهُۥ
كَانَ لَا يُؤۡمِنُ بِٱللَّهِ ٱلۡعَظِيمِ ٣٣ وَلَا يَحُضُّ عَلَىٰ طَعَامِ ٱلۡمِسۡكِينِ ٣٤

විනාශයක් කළ හැකි (වේගවත් හා දිගු කාලීන) සුළඟක් මගින් විනාශ කරනු ලැබූහ.

7 එම සුළඟ ඔහු ඔවුන් මත රාත්‍රි හතක්ද දහවල් අටක්ද ඔවුන්ව සමුල ඝාතනය කිරීම සඳහා එවීය. (මෙම කාලය තුළ අඛණ්ඩව හැමූ සුළඟ ඔවුන් මත කුඩාගල් කැටද විසි කළේය.) ඒවායින් (ඔවුන්ගේ ස්ථානවලින්) එම සමූහයා මුලක් සමග වැටී ඇති ඉඳිගස් මෙන් මැරී වැටී සිටිනු දැක ඇත්තෙහුය.

8 ඔවුන්ගෙන් ඉතිරි වූවන් කිසිවෙකු හෝ නුඹලා දැක ඇත්තෙහුද (ඔවුන්ගෙන් කිසිවෙකු ඉතිරි වූයේ නැත).

9 තවද ෆිර්අවුන් හා ඔහුට පෙර පැමිණියවුන්ද (ලූත් -අලෛයිහිස් සලාම්- තුමාගේ සමූහයා මෙන්) දූතයින්ව බොරු කළවුන්ද (ආදේශ කිරීම, පාපයන් ඇතුළු) වැරදි කළහ.

10 ඔවුහු ඔවුන්ගේ රක්ෂකයාගේ දූතයින්ට වෙනස්කම් කළහ. එහෙයින් ඔහු (ඔවුන්ගේ ගම් උඩුයටිකුරු කිරීම, ගල්වරුෂා වැස්සවීම ආදී දඬුවම් මගින්) ඔවුන්ව දැඩිව හසුකර ගත්තේය.

11 නියත වශයෙන්ම අපි ජලය සීමාව ඉක්මවා (ඉහළට) ගිය විට නුඹලාව නැවේ (නංවා) උස්සාගෙන ආරක්ෂා කළෙමු. (නුඹලා එවිට නුඹලාගේ දෙමව්පියන්ගේ කොඳු ඇට වල සිටියෙහුය. (මෙහි සඳහන් නැව තුෆාන් ගං වතුර අවස්ථාවේ නූහ් -අලෛයිහිස් සලාම්- තුමා විශ්වාස වන්තයින්ව නංවා ගෙන ගිය නැවයි.)

12 (නූහ් -අලෛයිහිස් සලාම්- තුමාගේ සමූහය විනාශ කරන ලද මෙම සිද්ධිය මුහම්මද් -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තුමාණන්ගේ අනුගාමිකයින් වන) නුඹලාට එක් උපදේශයක් ලෙස අප පත් කිරීම සඳහා ද (මනනය කර) ආරක්ෂා කරන කන් (මගින්) එය (මනනය කර) ආරක්ෂා කර (දැනුවත් කිරීම සඳහා ද අපි එය නුඹලාට ප්‍රකාශ කරමු.)

13 (විනිශ්චය දිනය ඇති වීමට) නළාවෙන් වරක් පිඹ.

14 පොළොව ද කඳු ද උස්සා ඒ දෙකම එකවරට කොටා සුනුවිසුනු කළ විට

15 එම දිනයේ ඇතිවිය යුතු (අවසන් දිනය) ඇතිවෙයි.

16 තවද අහස් පැළී යයි. (මලක්වරු එහි සිට බිමට බසිති.) ඒ දවස එය දුර්වලව පෙනෙයි.

17 තවද මලක්වරු එහි පැතිවල පෙනී සිටිති. (දෙවියන් අණ කළ වහා බිමට බැස එහි සිටින අයව වටකර ගනිති). ඒ දවස නුඹේ දෙවියන්ගේ අර්ෂය ඔවුන්ට ඉහළින් අට දෙනෙකු උසුලාගෙන සිටිති.

18 එ දවසේ නුඹලා (විභාගය සඳහා අල්ලාහ් වෙත) ඉදිරිපත් කරනු ලබන්නෙහුය. කිසිම සැඟවුන විෂයක්ම නුඹලාගෙන් නොසැඟවෙයි.

19 තමාගේ (ක්‍රියාවන් ලියා පදිංචි කරන ලද) සටහන් පොත ඔහුගේ දකුණු අතට දෙනු ලැබුවෙක් මෙන්න මගේ සටහන් පොත ගෙන කියවා බලහු"යි තම සටහන් පොත බලා සතුටින් ප්‍රකාශ කරයි.

20 (තව දුරටත් ඔහු කියයි.) මම (විනිශ්චය දිනයේ) විභාගයට මුහුණ දෙන බව (මිහිතලයේ) දැන සිටියෙමි (යැයි ද ප්‍රකාශ කරයි)

21 එහෙයින් ඔහු තෘප්තිමත් විය හැකි ජීවිතයක සිටී. (ජීවත් වෙයි)

22 ඔහු උසස් ස්වර්ගයන්හි සිටී. (ඒවා තත්ත්වයෙන්ද ස්ථානයෙන්ද උසස්වූ ඒවාය. මන්ද ඒවා අහසට ඉහළින් පෙනෙන්නේය.)

23 එහි කඩාගත හැකි පලතුරු සමීපයේය. (ඒවායේ පලතුරු සිටගත් වාඩි වූ හා හාන්සි වූ හැම කෙනෙකුම සමීපය.)

24 (ඔවුන්ව බලා මෙසේ කියනු ලබයි. නුඹලා ලෝකයේ) ගත වූ දවස්වල (පරලොව සඳහා) කලින් එවූ දෑ වල (යහපත් ක්‍රියා හේතුවෙන්) සතුටින් (ඇති තරම්) බුදිහු. තවද පානය කරහු.

25 ඔහුගේ හොඳ නරක (ලියා පදිංචි කළ) සටහන් පොත වම් අතට දෙනු ලැබූ පුද්ගලයා මෙසේ කියයි. 'මගේ සටහන් පොත මට නොදී ඉන්නට තිබුණා නොවේ ද?

26 තවද මගේ විභාගය කුමක්ද?යි මා නොදැන සිටිය යුතු නොවේ ද?

27 එය (මට ඇතිවූ මරණය) අවසානයක් විය යුතු නොවේ ද? (ඔහුගේ සටහන් පොතේ ඇති නරක ක්‍රියාවන් ද එයින් තමාට ලැබීමට ඇති දඬුවම ද දැන තමාට ඇති වූ මරණය අවසානයක් විය යුතු නොවේදැයි කැමති වෙයි)

28 මගේ වස්තුව (අල්ලාහ්ගේ දඬුවමෙන් මාව බේරා ගැනීමට) ප්‍රයෝජනවත් නොවිය.

29 (මා තබාගෙන සිටි) මගේ සාධක (නැතිනම් මගේ නිලතල) මගෙන් ඉවත් වී විනාශ විය.

30 (මෙසේ ඔහු ප්‍රකාශ කරන විට අල්ලාහ්) මොහුව අල්වා (මොහුගේ අත් බෙල්ලට තබා) විලංගු දමහු' (යි ප්‍රකාශ කරයි.)

31 පසුව මොහුව නිරයට ඇතුල් කරහු.
32 පසුව රියන් හැත්තෑවක් දිග දම්වැලෙහි මොහුව අමුණහු. (යනුවෙන් අණ කරයි.) (සුෆ්යාන් රහ්මතුල්ලාහි අලෙයිහි තුමා මෙසේ ප්‍රකාශ කරයි. එම දම්වැල ඔහුගේ අධෝමුඛයෙන් ඇතුල් කර කටින් පිටතට ගෙන එහි ඔහු අමුණනු ලබයි.)
33 නියත වශයෙන්ම ඔහු බලවත් අල්ලාහ් පිළිබඳව විශ්වාස කළේ නැත.
34 තවද දුප්පතුන්ට ආහාර දීමට පොළඹවන්නෙකුව සිටියේද නැත.
35 තවද ඔහුට මෙහි සමීප වූවෝ (නෑදෑයින් හෝ මිතුරන්) කිසිවෙක් නොසිටිති. (ඔවුහු කිසිවෙක් මොහුට ප්‍රයෝජනවත් වීමට හෝ මොහු වෙනුවෙන් අනුකම්පා බස් දෙඩීමට හෝ නොඑති. මන්ද එය නෑදෑයෙක් තවත් නෑදෑයෙකුගෙන්ද හිතවතෙක් තවත් හිතවතෙකුගෙන් ද වෙන්වී දුවන දවසකි.)
36 තවද ඔවුනට (ඔවුන්ගේ ශරීරවලින් ගලා බසින) සැරවා හැර වෙනත් ආහාරයක් නොමැත.
37 ලොව පව්කාරයින් ලෙස සිටි අය පමණක් එය අනුභව කරති.
38 නුඹලාට බැලිය හැකි දෑ මත මම දිවුරමි.
39 තවද නුඹලාට බැලිය නොහැකි දෑ මතද (මම දිවුරමි)
40 නියත වශයෙන්ම මෙය ගෞරවනීය දූතයෙකුගේ වදනකි. (මෙය නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් විසින් කියවා පෙන්වනු ලැබූ වදනකි. නැතිනම් මෙහි අර්ථය ජිබ්රීල් අලෙයිහිස් සලාම් තුමා විසින් නබි තුමාණන්ට කියා දෙනු ලබන කුර්ආනයයි.)
41 (නුඹලා සිතන්නා සේ) මෙය කවියෙකුගේ වදනක් නොවේ. (මෙම වැකි කාව්‍යයන්ට සාපේක්ෂ ඒවා නොවේ) ඉතා අඩුවෙන්ම නුඹලා විශ්වාස කරන්නෙහුය.
42 (තවද නුඹලා වාද කරන්නා සේ) මෙය ශාස්ත්‍ර කියන්නාගේ වදනක් ද නොවේ. (ශාස්ත්‍ර යනු වෙනත් දෙයකි. එයටත් කුර්ආනයටත් කිසිම සම්බන්ධයක් නැත) නුඹලා ඉතා අඩුවෙන්ම උපදෙස් ලබන්නේහුය.
43 (මෙය) ලෝකවාසීන්ගේ රක්ෂකයාගෙන් පහළ කරන ලද (ධර්මයයි.)
44 ඔහු (එම දූතයා) අප පිළිබඳව (අප නොකී) සමහර වදන් වැකි ගොතා කියයි නම්
45 ඔහුගේ දකුණු අත අල්වා ගනිමු.
46 පසුව ඔහුගේ (පිටකොන්දේ සිට හදවතට සම්බන්ධ) ජීවනාලය කපා දමන්නෙමු. (ඔහුව අපි ඉතා දැඩිව වේදනාවට ලක් කරමු.)
47 (එසේ අප වේදනාවට ලක් කරද්දී) ඔහුව (එම වේදනාවෙන්) වළක්වන්නන් කිසිවෙක් නොසිටින්නෝය. (මෙසේ තිබිය දී ඔහු අප පිළිබඳව බොරු කියන්නේ කෙසේද?)
48 නියත වශයෙන්ම මෙය (අල්-කුර්ආනය) බිය බැතිකම ඇති අයට එක් උපදේශයකි. (මෙයින් ප්‍රයෝජනය ලබන්නේ ඔවුහුය.)
49 නුඹලා අතර (මෙම කුර්ආනය) බොරුකළ හැකි අයද සිටිති'යි අපි දනිමු. (අපි එයට නියමිත විපාක ඔවුනට දෙන්නෙමු)
50 තවද නියත වශයෙන්ම මෙය (අල්-කුර්ආනය)

فَلَيْسَ لَهُ ٱلْيَوْمَ هَٰهُنَا حَمِيمٌ ﴿٣٥﴾ وَلَا طَعَامٌ إِلَّا مِنْ غِسْلِينٍ ﴿٣٦﴾ لَّا يَأْكُلُهُۥٓ
إِلَّا ٱلْخَٰطِـُٔونَ ﴿٣٧﴾ فَلَآ أُقْسِمُ بِمَا تُبْصِرُونَ ﴿٣٨﴾ وَمَا لَا تُبْصِرُونَ ﴿٣٩﴾
إِنَّهُۥ لَقَوْلُ رَسُولٍ كَرِيمٍ ﴿٤٠﴾ وَمَا هُوَ بِقَوْلِ شَاعِرٍ ۚ قَلِيلًا مَّا تُؤْمِنُونَ ﴿٤١﴾
وَلَا بِقَوْلِ كَاهِنٍ ۚ قَلِيلًا مَّا تَذَكَّرُونَ ﴿٤٢﴾ تَنزِيلٌ مِّن رَّبِّ ٱلْعَٰلَمِينَ ﴿٤٣﴾ وَلَوْ
تَقَوَّلَ عَلَيْنَا بَعْضَ ٱلْأَقَاوِيلِ ﴿٤٤﴾ لَأَخَذْنَا مِنْهُ بِٱلْيَمِينِ ﴿٤٥﴾ ثُمَّ لَقَطَعْنَا
مِنْهُ ٱلْوَتِينَ ﴿٤٦﴾ فَمَا مِنكُم مِّنْ أَحَدٍ عَنْهُ حَٰجِزِينَ ﴿٤٧﴾ وَإِنَّهُۥ لَتَذْكِرَةٌ
لِّلْمُتَّقِينَ ﴿٤٨﴾ وَإِنَّا لَنَعْلَمُ أَنَّ مِنكُم مُّكَذِّبِينَ ﴿٤٩﴾ وَإِنَّهُۥ لَحَسْرَةٌ عَلَى
ٱلْكَٰفِرِينَ ﴿٥٠﴾ وَإِنَّهُۥ لَحَقُّ ٱلْيَقِينِ ﴿٥١﴾ فَسَبِّحْ بِٱسْمِ رَبِّكَ ٱلْعَظِيمِ ﴿٥٢﴾

## سُورَةُ المَعَارِج

ترتيبها ٧٠ — آياتها ٤٤

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

سَأَلَ سَآئِلٌۢ بِعَذَابٍ وَاقِعٍ ﴿١﴾ لِّلْكَٰفِرِينَ لَيْسَ لَهُۥ دَافِعٌ ﴿٢﴾ مِّنَ
ٱللَّهِ ذِى ٱلْمَعَارِجِ ﴿٣﴾ تَعْرُجُ ٱلْمَلَٰٓئِكَةُ وَٱلرُّوحُ إِلَيْهِ فِى
يَوْمٍ كَانَ مِقْدَارُهُۥ خَمْسِينَ أَلْفَ سَنَةٍ ﴿٤﴾ فَٱصْبِرْ صَبْرًا جَمِيلًا ﴿٥﴾
إِنَّهُمْ يَرَوْنَهُۥ بَعِيدًا ﴿٦﴾ وَنَرَىٰهُ قَرِيبًا ﴿٧﴾ يَوْمَ تَكُونُ ٱلسَّمَآءُ كَٱلْمُهْلِ
﴿٨﴾ وَتَكُونُ ٱلْجِبَالُ كَٱلْعِهْنِ ﴿٩﴾ وَلَا يَسْـَٔلُ حَمِيمٌ حَمِيمًا ﴿١٠﴾

ප්‍රතික්ෂේප කරන්නන්ට පසුතැවිල්ල (ද ශෝකයද) ඇති කළ හැක්කකි.
51 නියත වශයෙන්ම මෙය ස්ථිර සත්‍යයකි.
52 නුඹ ගෞරවනීය නුඹේ දෙවියන්ගේ ශුද්ධ නාමයෙන් තුති කරහි.

# අල්- මආරිජ්

1 පවතින දඬුවම පිළිබඳව ඇසිය යුතු එකෙකු ඇසීය. (නළ්ර් ඉබ්නු හාරිස් නමැත්තා දෙවියනි, මෙය නුඹ වෙතින් එන සත්‍යයක් වන්නේ නම් අහසේ සිට අපට ගල් වරුෂාව වස්සවනු මැනවි නැතිනම් අපට හිංසාකාරි දඬුවම ගෙන එනු මැනවි'යි ප්‍රාර්ථනා කළේය.)
2 ප්‍රතික්ෂේප කරන්නන්ට (සිදුකරන එම දඬුවම) වළක්වන්නවුන් කිසිවෙකු නැත.
3 (මලක්වරු) ඒ මත නැගී යන ඉණිමංවලින් යුත් අල්ලාහ්ගෙන් (එම දඬුවම සිදුවෙයි.)
4 මලක්වරුද ජිබ්රීල් (අලෙයිහිස් සලාම් තුමන්)ද අල්ලාහ් වෙත (එම පියගැට පෙළවල් මගින්) දවසකින් ඉහළට යති. එහි ප්‍රමාණය (මෙලොව අවුරුදු වලින්) අවුරුදු පනස් දහසකි. (මෙය ගැත්තන් විභාගය සඳහා මහ්ෂර් පිටියේ සිටින කාලය වෙයි. ඉන්පසු ස්වර්ගවාසීන් ස්වර්ගටය ද නිරයේ වැසියන් නිරයට ද යන්නෝය.)
5 (නුඹලාගේ දුෂ්කරතා අල්ලාහ් හැර අනෙක් අයට

يُبَصَّرُونَهُمْ يَوَدُّ الْمُجْرِمُ لَوْ يَفْتَدِي مِنْ عَذَابِ يَوْمِئِذٍ بِبَنِيهِ ﴿١١﴾
وَصَاحِبَتِهِ وَأَخِيهِ ﴿١٢﴾ وَفَصِيلَتِهِ الَّتِي تُؤْوِيهِ ﴿١٣﴾ وَمَنْ فِي الْأَرْضِ
جَمِيعًا ثُمَّ يُنْجِيهِ ﴿١٤﴾ كَلَّا إِنَّهَا لَظَىٰ ﴿١٥﴾ نَزَّاعَةً لِلشَّوَىٰ ﴿١٦﴾ تَدْعُو
مَنْ أَدْبَرَ وَتَوَلَّىٰ ﴿١٧﴾ وَجَمَعَ فَأَوْعَىٰ ﴿١٨﴾ ۞ إِنَّ الْإِنْسَانَ خُلِقَ هَلُوعًا
﴿١٩﴾ إِذَا مَسَّهُ الشَّرُّ جَزُوعًا ﴿٢٠﴾ وَإِذَا مَسَّهُ الْخَيْرُ مَنُوعًا ﴿٢١﴾ إِلَّا
الْمُصَلِّينَ ﴿٢٢﴾ الَّذِينَ هُمْ عَلَىٰ صَلَاتِهِمْ دَائِمُونَ ﴿٢٣﴾ وَالَّذِينَ فِي
أَمْوَالِهِمْ حَقٌّ مَعْلُومٌ ﴿٢٤﴾ لِلسَّائِلِ وَالْمَحْرُومِ ﴿٢٥﴾ وَالَّذِينَ يُصَدِّقُونَ
بِيَوْمِ الدِّينِ ﴿٢٦﴾ وَالَّذِينَ هُمْ مِنْ عَذَابِ رَبِّهِمْ مُشْفِقُونَ ﴿٢٧﴾ إِنَّ عَذَابَ
رَبِّهِمْ غَيْرُ مَأْمُونٍ ﴿٢٨﴾ وَالَّذِينَ هُمْ لِفُرُوجِهِمْ حَافِظُونَ ﴿٢٩﴾ إِلَّا عَلَىٰ
أَزْوَاجِهِمْ أَوْ مَا مَلَكَتْ أَيْمَانُهُمْ فَإِنَّهُمْ غَيْرُ مَلُومِينَ ﴿٣٠﴾ فَمَنِ ابْتَغَىٰ وَرَاءَ
ذَٰلِكَ فَأُولَٰئِكَ هُمُ الْعَادُونَ ﴿٣١﴾ وَالَّذِينَ هُمْ لِأَمَانَاتِهِمْ وَعَهْدِهِمْ رَاعُونَ
﴿٣٢﴾ وَالَّذِينَ هُمْ بِشَهَادَاتِهِمْ قَائِمُونَ ﴿٣٣﴾ وَالَّذِينَ هُمْ عَلَىٰ صَلَاتِهِمْ يُحَافِظُونَ
﴿٣٤﴾ أُولَٰئِكَ فِي جَنَّاتٍ مُكْرَمُونَ ﴿٣٥﴾ فَمَالِ الَّذِينَ كَفَرُوا قِبَلَكَ مُهْطِعِينَ
﴿٣٦﴾ عَنِ الْيَمِينِ وَعَنِ الشِّمَالِ عِزِينَ ﴿٣٧﴾ أَيَطْمَعُ كُلُّ امْرِئٍ مِنْهُمْ
أَنْ يُدْخَلَ جَنَّةَ نَعِيمٍ ﴿٣٨﴾ كَلَّا إِنَّا خَلَقْنَاهُمْ مِمَّا يَعْلَمُونَ ﴿٣٩﴾

පැමිණිලි නොකර) නුඹලා මනා අන්දමින් ඉවසා ගනු.

(6) නියත වශයෙන්ම ඔවුහු දුරස්ථව (සිදුවිය නොහැක්කක් ලෙස) දකිති.

(7) අපි එය සමීප දෙයක් ලෙස දකිමු.

(8) උණු කරන ලද සෙම්බුව බවට පත්වන දවසේ (එය සිදුවෙයි.)

(9) තවද කඳු සායම් කවන ලද පුළුන් මෙන් පවතින දිනයේ (එය සිදුවෙයි.)

(10) (එහි සිදුවන භයානක සිදුවීම් හේතුකොට ගෙන) මිතුරෙක් අනෙක් මිතුරාගෙන් (කිසිවක්) නොඅසයි.

(11) ඔවුනට ඔවුන්ව (මිතුරන්ව) පෙන්වනු ඇත. (එකෙක් අනෙකාව හඳුනා ගත්තද ඔහු අනෙකාගෙන් කිසිවක් අසන්නේ හෝ කථා කරන්නේ නැත.) වරද කළ තැනැත්තා එ දවසේ (විනිශ්චය දිනයේ) දඬුවමෙන් (තමාව ආරක්ෂා කර ගැනීම සඳහා) තම දරුවන්ව ඇපයට දීමට උත්සාහ කරයි.

(12) තවද ඔහුගේ බිරිය ද සහෝදරයාව ද

(13) (දුෂ්කර අවස්ථාවල) ඔහුට උදව් කරන (සමීප) නෑයින්ව ද

(14) තවද පොළොවේ සිටින හැම කෙනෙකුවම (ඇපයට දී) තමාව ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරයි.

(15) එසේ කළ නොහැක. නියත වශයෙන්ම එය (දලුලා ඇවිලෙන) 'ලළා' නමැති නිරයයි.

(16) එය හිසේ හම ගලවා දැමිය හැක්කකි.

(17) එය (ලෝකයේ සත්‍යයෙන්) පසුබට වී නොසලකා සිටියවුන්ව කැඳවයි.

(18) තවද වස්තුව රැස්කර (වියදම් නොකර) මලුවල දමා ආරක්ෂා කළවුන්ව ද කැඳවයි.

(19) නියත වශයෙන්ම මිනිසා (ඉතාමත් තන්හාවෙන් යුක්තවූ) තැති ගැස්මෙන් යුත් එකෙකු ලෙස මවනු ලැබීය.

(20) ඔහුට යම් (සාගින්න හා අසනීපය වැනි) අයහපතක් සිදුවුවොත් අධික වශයෙන් තැතිගනී.

(21) තවද ඔහුට (වස්තුව වැනි) යහපතක් සිදුවු වොත් (එය වියදම් නොකර) වළක්වන්නෙකුව සිටී.

(22) සලාතය ඉටු කරන්නන් හැර (ඔවුහු එම ගුණාංගයන්ගෙන් යුක්ත නොවෙති.)

(23) ඔවුහු ඔවුන්ගේ සලාතයෙහි ස්ථාවරව සිටිති. (සලාතය එයට නියමිත වේලාවේ ඉටු කරති. සලාතය හැර ඔවුන්ගේ අවධානය වෙන කිසිවක් නොහරවයි.)

(24) තවද ඔවුන්ගේ වස්තු වල දැනුවත් කරනු ලැබූ කොටසක් ඇත. (සකාත් වැනි වතාවත් ඉටු කරති.)

(25) යාචකයින්ට ද දුප්පතුන්ට ද (කොටස් ඇත.)

(26) තවද ඔවුහු විපාක දෙනු ලබන (විනිශ්චය) දිනය සත්‍ය බව පිළිගනිති.

(27) (ඔවුහු නැමදුම් වත්පිළිවෙත් ඉටු කළ ද) ඔවුන්ගේ රක්ෂකයාගේ වේදනාවට බියවෙමින් සිටිති.

(28) නියත වශයෙන්ම ඔවුන්ගේ රක්ෂකයාගේ වේදනාව ගැන නොබියව සිටිය යුත්තක් නොවේ. (ඒ ගැන සැවොම බිය විය යුතුය.)

(29) තවද ඔවුහු ඔවුන්ගේ රහසඟ ආරක්ෂා කර ගනිති.

(30) ඔවුන්ගේ බිරියන්ටද තම දකුණත අයිති කරගත් (වහල්) ස්ත්‍රීන්ට ද හැර (හෙළි නොකරති.) එසේ මොවුහු හෙළිකරන අවස්ථාවේ නියත වශයෙන්ම මොවුහු දෝෂයට ලක් නොවෙති.

(31) ඊට එහා කවරෙක් හෝ සොයන්නේ නම් ඔවුහු සීමාව ඉක්මවුවෝය.

(32) තවද ඔවුහු තම ප්‍රවේශම් සහිත දෑ ද ගිවිසුම් ද ආරක්ෂා කර ගනිති. (ප්‍රවේශම් සහිත දෑ හි වංචා නොකරති. ගිවිසුම් කඩ නොකරති)

(33) (නෑදැයින් - දුරස්ථ වූ නැතිනම් උස් පහත් භේදයකින් තොරව) ඔවුන්ගේ සාක්ෂි (ක්‍රමානුකූලව) ඉටු කරති.

(34) තවද ඔවුහු තම සලාතය ආරක්ෂා කර ගනිති. (සලාතය අතහැර වෙනත් කටයුතුවල නොයෙදෙති. එහි යහපත මැකෙන ක්‍රියාවන් ද නොකරති.)

(35) ඔවුහු (ඉහත සඳහන් ගුණයෙන් යුක්ත වුවෝ) ස්වර්ගයන්හි ගෞරව කරනු ලබන්නෝය.

(36) (නබිවරයාණෙනි,) ප්‍රතික්ෂේප කරන්නන්ට කුමක් සිදුවිද? (ඔවුහු නුඹව බොරුකර සමච්චල් කිරීම සඳහා) බෙලි දිගු කරමින් වේගයෙන් පැමිණෙති.

(37) (නබි තුමාගේ) දකුණු පසින්ද වම් පසින්ද විවිධ කණ්ඩායම් වශයෙන් (වෙන්වී සිටිති.)

(38) ඔවුන්ගෙන් හැම කෙනෙකුම දයාවන්ගෙන් පිරි ස්වර්ගයට ඇතුල් කරවීම ආශා කරති.

(39) එසේ නොවේ. නියත වශයෙන්ම අපි ඔවුන්ව ඔවුන් දන්නා දෙයින් මවා ඇත්තෙමු. (ඔවුන් දැන සිටින ශුක්‍රධාතුවෙන් අපි මැව්වෙමු. නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් මෙම

වැකිය කියවූ විට එතුමන්ගේ අල්ලේ කෙළ ගසා එමත තම ඇඟිල්ල තබා මෙසේ කීහ. අල්ලාහ් ප්‍රකාශ කරයි. 'මනුෂ්‍යය මෙවැනි දෙයකින් නුඹව මැවූ පසු නුඹ මා (කිසිවක්) නොහැකි කෙනෙකු කිරීමට උත්සාහ කරන්නෙහි ද?' -ඉබ්නු මාජහ්-)
40 නියත වශයෙන් අප ශක්තිමත් අය යැයි නැගෙන හිරෙහි ද බටහිරෙහි ද රක්ෂකයා මත මම දිවුරමි.
41 (පව් කරන මොවුන්ව විනාශ කර අපට අවනත වන) මොවුන්ට වඩා වැදගත් අයව අප විකල්ප වශයෙන් ගෙන ඒමට (ශක්තිය ඇති අයයි. අප එසේ කිරීමට සිතුවහොත්) අපව අබිබවා යා නොහැක.
42 ඔවුන්ට පොරොන්දු වූ (විනිශ්චය) දිනය ඔවුන් හමුවෙන තුරු (ඔවුන්ව මංමුළාවේ) ගිලෙන්නත් ලෙල්ලම් කරන්නත් අත්හරිනු)
43 ඔවුහු (ඔවුන්ගේ) සොහොන්වලින් කඩිනමින් පිටවන දිනයේ ඔවුන් සිටුවා ඇති කොඩියක් කරා වේගයෙන් යන්නාසේ වෙයි)
44 ඔවුන්ගේ බැල්ම (නින්දිතව) පහත් වූ ස්වභාවයෙන් (තදබල) නින්දාව ඔවුන්ව වසා ගනී. ඔවුන්ට පොරොන්දු වූ දිනය එයයි.

## නූහ්

1 ඔවුන්ට හිංසාකාරී වේදනාව ඒමට පෙර නුඹ නුඹේ සමූහයාට අවවාද කරහි"යි පවසා අපි නූහ්(අලෙයිහිස් සලාම්)ව ඔහුගේ සමූහයාට දූතයෙකු ලෙස එවූයෙමු. (නූහ් අලෙයිහිස් සලාම් ලොවට එවන ලද ප්‍රථම රසූල්වරයෙකු -දූතයෙකු-වන්නේය)
2 එතුමා (තම සමූහයා අමතා) මෙසේ කීය. 'මාගේ ජනයිනි, මම නුඹලාට පැහැදිලිව අවවාද කරමි.
3 4 නුඹලා අල්ලාහ්ට බිය වී ඔහුට නැමදුම් ඉටු කරනු. තවද නුඹලා මට අවනත වනු. තවද නියමිත කාල සීමාවක් දක්වා නුඹලාව (නුඹලාගේ මරණය) පසුවට කල් දමයි. නියත වශයෙන්ම අල්ලාහ්ගේ නියමිත දිනය පැමිණි විට එය ප්‍රමාද නොකෙරේ. නුඹලා දැනුම ඇත්තවුන් නම් (අල්ලාහ්ගේ දිනය ප්‍රමාද නොකරන බව දැන ගත්තෙහුය)
5 ඔහු (නූහ් අලෙයිහිස් සලාම්) මෙසේ පැවසීය. 'මගේ රක්ෂකයාණනි, මගේ සමූහයාව දිවා රාත්‍රී (නුඹව විශ්වාස කරන ලෙස) කැඳවූයෙමි.
6 එහෙත් මගේ කැඳවීම (කුමක් කරා ඔවුන්ව කැඳවනු ලැබුවේ ද එයින් තව දුරටත්) දුරස්ථ වීම ඔවුන්ව වර්ධනය කළේය.
7 නුඹ ක්ෂමාව දීම සඳහා (නුඹව විශ්වාස කර නුඹට අවනත වන ලෙස) ඔවුන්ව මා කැඳවූ හැම අවස්ථාවකම ඔවුහු (මගේ කැඳවීම නොඇසීම පිණිස) ඔවුන්ගේ ඇඟිලි ඔවුන්ගේ කන්වල ඔබා ගත්හ. තවද ඔවුහු (මා නොදැක සිටීම සඳහා ඔවුන්ගේ මුහුණු) ඔවුන්ගේ ඇඳුමෙන් වසාගත්හ. ඔවුන්ගේ (ප්‍රතික්ෂේප කිරීමෙහිම) දිගටම තදබල ලෙස අහංකාරකම පෙන්වූහ.

فَلَآ أُقۡسِمُ بِرَبِّ ٱلۡمَشَٰرِقِ وَٱلۡمَغَٰرِبِ إِنَّا لَقَٰدِرُونَ ٤٠ عَلَىٰٓ أَن نُّبَدِّلَ خَيۡرٗا مِّنۡهُمۡ
وَمَا نَحۡنُ بِمَسۡبُوقِينَ ٤١ فَذَرۡهُمۡ يَخُوضُواْ وَيَلۡعَبُواْ حَتَّىٰ يُلَٰقُواْ يَوۡمَهُمُ ٱلَّذِي
يُوعَدُونَ ٤٢ يَوۡمَ يَخۡرُجُونَ مِنَ ٱلۡأَجۡدَاثِ سِرَاعٗا كَأَنَّهُمۡ إِلَىٰ نُصُبٖ يُوفِضُونَ
٤٣ خَٰشِعَةً أَبۡصَٰرُهُمۡ تَرۡهَقُهُمۡ ذِلَّةٞۚ ذَٰلِكَ ٱلۡيَوۡمُ ٱلَّذِي كَانُواْ يُوعَدُونَ ٤٤

ترتيبها ٧١ — سُورَةُ نُوحٍ — آياتها ٢٨

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

إِنَّآ أَرۡسَلۡنَا نُوحًا إِلَىٰ قَوۡمِهِۦٓ أَنۡ أَنذِرۡ قَوۡمَكَ مِن قَبۡلِ أَن يَأۡتِيَهُمۡ
عَذَابٌ أَلِيمٞ ١ قَالَ يَٰقَوۡمِ إِنِّي لَكُمۡ نَذِيرٞ مُّبِينٌ ٢ أَنِ ٱعۡبُدُواْ
ٱللَّهَ وَٱتَّقُوهُ وَأَطِيعُونِ ٣ يَغۡفِرۡ لَكُم مِّن ذُنُوبِكُمۡ وَيُؤَخِّرۡكُمۡ
إِلَىٰٓ أَجَلٖ مُّسَمًّىۚ إِنَّ أَجَلَ ٱللَّهِ إِذَا جَآءَ لَا يُؤَخَّرُۚ لَوۡ كُنتُمۡ تَعۡلَمُونَ
٤ قَالَ رَبِّ إِنِّي دَعَوۡتُ قَوۡمِي لَيۡلٗا وَنَهَارٗا ٥ فَلَمۡ يَزِدۡهُمۡ دُعَآءِيٓ إِلَّا
فِرَارٗا ٦ وَإِنِّي كُلَّمَا دَعَوۡتُهُمۡ لِتَغۡفِرَ لَهُمۡ جَعَلُوٓاْ أَصَٰبِعَهُمۡ
فِيٓ ءَاذَانِهِمۡ وَٱسۡتَغۡشَوۡاْ ثِيَابَهُمۡ وَأَصَرُّواْ وَٱسۡتَكۡبَرُواْ ٱسۡتِكۡبَارٗا
٧ ثُمَّ إِنِّي دَعَوۡتُهُمۡ جِهَارٗا ٨ ثُمَّ إِنِّيٓ أَعۡلَنتُ لَهُمۡ وَأَسۡرَرۡتُ
لَهُمۡ إِسۡرَارٗا ٩ فَقُلۡتُ ٱسۡتَغۡفِرُواْ رَبَّكُمۡ إِنَّهُۥ كَانَ غَفَّارٗا ١٠

8 පසුව මම ඔවුන්ව ප්‍රසිද්ධියේද කැඳවූයෙමි.
9 තවද ප්‍රසිද්ධියේද (එකිනෙකා තනිව හමු වී) රහසිගතවද කැඳවීමි. (විවිධ වෙනස් වූ මාර්ග අනුගමනය කරමින් කැඳවීය)
10 මම (ඔවුනට මෙසේ කීවෙමි) .නුඹලා රක්ෂකයාණන්ගෙන් පාප ක්ෂමාව අයදිනු. නියත වශයෙන්ම ඔහු පාපයන් වැඩියෙන් ක්ෂමා කරන්නෙකුව සිටියි.
11 (නුඹලා මෙසේ පාප ක්ෂමාව අයදින්නහු නම්) දිගටම අධිකව වහින වැස්ස නුඹලාට එවයි. (වැස්ස, ආහාර ආදිය අප ලබා ගැනීමට අවශ්‍ය සාධක වලින් පාප ක්ෂමාව ඇයදීම වැදගත් තැනක් ගන්නා බව මෙම වාක්‍යය අපව දැනුවත් කරයි.)
12 තවද වස්තූන්ද දරුවන්ද ලබා දෙයි. නුඹලාට වතු ද ඇති කර දෙයි. ඔයවල් ද ලබා දෙයි.
13 නුඹලාට කුමක් සිදුවිද? අල්ලාහ්ට බියනොවී (ඔහුගේ) මහිමය නුඹලා නොදැන සිටින්නෙහුය.
14 ඔහු නුඹලාව විවිධ පියවරවල් වලින් මැවිය. (ආරම්භයේ ශුක්‍රාණුවක් ලෙසද පසුව ලේ කැටියක් ලෙසද මස් වදැල්ලක් ලෙසද මවා නුඹලාව සම්පූර්ණ කළේය. පසුව ළදරු අවධිය ළමා අවධිය, තරුණ අවධිය, වියපත් අවධිය යනුවෙන් විවිධ පියවරවල් නුඹලාට ඇති කළේය. මෙවන්

يُرْسِلِ ٱلسَّمَآءَ عَلَيْكُم مِّدْرَارًا ﴿١١﴾ وَيُمْدِدْكُم بِأَمْوَٰلٍ وَبَنِينَ وَيَجْعَل
لَّكُمْ جَنَّٰتٍ وَيَجْعَل لَّكُمْ أَنْهَٰرًا ﴿١٢﴾ مَّا لَكُمْ لَا تَرْجُونَ لِلَّهِ وَقَارًا ﴿١٣﴾
وَقَدْ خَلَقَكُمْ أَطْوَارًا ﴿١٤﴾ أَلَمْ تَرَوْا۟ كَيْفَ خَلَقَ ٱللَّهُ سَبْعَ سَمَٰوَٰتٍ
طِبَاقًا ﴿١٥﴾ وَجَعَلَ ٱلْقَمَرَ فِيهِنَّ نُورًا وَجَعَلَ ٱلشَّمْسَ سِرَاجًا ﴿١٦﴾
وَٱللَّهُ أَنۢبَتَكُم مِّنَ ٱلْأَرْضِ نَبَاتًا ﴿١٧﴾ ثُمَّ يُعِيدُكُمْ فِيهَا وَيُخْرِجُكُمْ
إِخْرَاجًا ﴿١٨﴾ وَٱللَّهُ جَعَلَ لَكُمُ ٱلْأَرْضَ بِسَاطًا ﴿١٩﴾ لِّتَسْلُكُوا۟ مِنْهَا
سُبُلًا فِجَاجًا ﴿٢٠﴾ قَالَ نُوحٌ رَّبِّ إِنَّهُمْ عَصَوْنِى وَٱتَّبَعُوا۟ مَن لَّمْ يَزِدْهُ
مَالُهُۥ وَوَلَدُهُۥٓ إِلَّا خَسَارًا ﴿٢١﴾ وَمَكَرُوا۟ مَكْرًا كُبَّارًا ﴿٢٢﴾ وَقَالُوا۟
لَا تَذَرُنَّ ءَالِهَتَكُمْ وَلَا تَذَرُنَّ وَدًّا وَلَا سُوَاعًا وَلَا يَغُوثَ وَيَعُوقَ
وَنَسْرًا ﴿٢٣﴾ وَقَدْ أَضَلُّوا۟ كَثِيرًا ۖ وَلَا تَزِدِ ٱلظَّٰلِمِينَ إِلَّا ضَلَٰلًا ﴿٢٤﴾
مِّمَّا خَطِيٓـَٰٔتِهِمْ أُغْرِقُوا۟ فَأُدْخِلُوا۟ نَارًا فَلَمْ يَجِدُوا۟ لَهُم مِّن دُونِ
ٱللَّهِ أَنصَارًا ﴿٢٥﴾ وَقَالَ نُوحٌ رَّبِّ لَا تَذَرْ عَلَى ٱلْأَرْضِ مِنَ ٱلْكَٰفِرِينَ
دَيَّارًا ﴿٢٦﴾ إِنَّكَ إِن تَذَرْهُمْ يُضِلُّوا۟ عِبَادَكَ وَلَا يَلِدُوٓا۟ إِلَّا فَاجِرًا
كَفَّارًا ﴿٢٧﴾ رَّبِّ ٱغْفِرْ لِى وَلِوَٰلِدَىَّ وَلِمَن دَخَلَ بَيْتِىَ
مُؤْمِنًا وَلِلْمُؤْمِنِينَ وَٱلْمُؤْمِنَٰتِ وَلَا تَزِدِ ٱلظَّٰلِمِينَ إِلَّا تَبَارًۢا ﴿٢٨﴾

අල්ලාහ්ව ගෞරව කිරීමෙහිලා නුඹලා
නොසැලකිලිමත් වනුයේ කෙසේද?)
15 අල්ලාහ් අහස් හත (එක පිට එක) ලෙස මවා
ඇත්තේ කෙසේද?'යි නුඹලා නොදුටුවෙහුද?
16 තවද ඒවායින් පොළොවට ආලෝකය දිය
හැකි (අහසේ) චන්ද්‍රයාද නිර්මාණය කළේය. තවද
සූර්යයා (ලෝකයට) පහනක් ලෙසද නිර්මාණය
කළේය.
17 අල්ලාහ් නුඹලාව පොළොවේ සිට අලංකාර
අයුරින් නිර්මාණය කළේය. (ආදම් -අලෛයිහිස්
සලාම්- තුමා පොළොවේ මතුපිට තිබුණ පසින්
මැව්ය. ඔහුගේ පරම්පරාව එහි මතුපිට දකින්නට
ඇති ශාක හා සත්වයින් ආදිය අනුභව කිරීමට
සලස්වා ව්‍යාප්ත වීමට සැලැස්විය)
18 පසුව එතුළ (භූමිය තුළ) ට නුඹලාව යවයි.
(නුඹලා මරණයට පත් වී භූමිය තුළ මිහිදන්
කිරීමෙන් පසු නුඹලාගේ දේහය පස්වී ඒ සමග
මුසුවෙයි.) තවද (විනිශ්චය දිනයේ නැගිටවීම මගින්
නැවතත්) නුඹලාව එයින් මතු කරවයි.
19 අල්ලාහ් නුඹලාට පොළොව ඇතිරිල්ලක්
කළේය.
20 එහි නුඹලා විශාල පාරවල්වල ගමන් කිරීම
සඳහා (මෙසේ ඇතිරිල්ලක් කළේය)
21 නූහ් (අලෛයිහිස් සලාම්) තුමා මෙසේ කීය.
'මගේ දෙවියනි, ඔවුන් මට වෙනස්කම් කර කාගේ
වතුන් හා දරුවන්ද ඔවුනට පාඩුව පමණක් ඇති
කරන්නේද එවැනි අය ව අනුගමනය කළහ.
ඔවුන්ගේ වස්තූන්ද දරුවන්ද මෙලොව මංමුලාවද
පරලොවදී දඬුවම පමණක්ද වර්ධනය
කරන්නේය)
22 තවද මට විරුද්ධව මහා කුමන්ත්‍රණ කරති.
23 තවද ඔවුහු (නායකයින් බාලයින්ට මෙසේ
කීහ.) නුඹලා නුඹලාගේ දෙවිවරුන්ව අත්
නොහරිහු. (ඒවා ඔවුන් අතර පෙණුන පිළිරූ
වන්නේය. පසුව අරාබි රටේ ජනතාවද නමැදුම්
කලේ මේවාට ය) නුඹලා පැමිණි වද්, සුවාඃ, යකූස්,
යඌක් නස්ර්' ආදි දෙවිවරුන්ව අත් නොහරිහු.
(ඒවා ආදම් (අලෛ) තුමා හා නූහ් (අලෛ) තුමා
අතර කාලය තුළ ජීවත් වූ සමහර
සැදැහැවතුන්ගේ නම්ය. මොවුහු ඔවුන්ගේ නමැදුම්
ස්ථානවල ඔවුන්ව සිහිපත් කිරීමේ අරමුණින්
පිළිරූ අඹා ගත්හ. ඔවුන්ගේ ඊළඟ පරම්පරාව
පැමිණි විට ඉබ්ලීස් ඔවුන් අමතා නුඹලාගේ මුතුන්
මිත්තන් නැමදුම් කළේ මේවාටය. නුඹලාද
මේවාටම නමැදුම් ඉටු කරහු''යි කීය. එහෙයින්
මොවුහුද ඒවාටම නැමදුම් කළහ. පිළිම වන්දනාව
ආරම්භ වුයේ එදා සිටය. පසුව මෙම පිළිම
අරාබිකරයටද පැමිණ ඒවාට අරාබි ගෝත්‍රිකයින්
බොහොමයක්ද නමැදුම් කළහ.
24 තවද ඔවුහු (නායකයෝ) බොහෝ දෙනෙකුව
මංමුළා කළහ. අක්‍රමිකතා කරන්නන්ට පාඩුව ම
අධික කරත්වා෴
25 ඔවුන් කළ පාපයන් හේතුකොට ගෙන ඔවුහු
(තූෆාන් ගංවතුර මගින්) ගිල්වනු ලැබූහ. (විනිශ්චය
දිනයේ) ඔවුහු ගින්නට ඇතුල් කරනු ලබන්නෝය.
(එය අපාය ගින්නයි) අල්ලාහ්ව හැර ඔවුහු කිසිඳු
උදව් කරුවෙකුව ලබා නොගන්නෝය.
26 නූහ් (අලෛයිහිස් සලාම්) තුමා මෙසේ කීය.
මගේ දෙවියනි, පොළොවේ ප්‍රතික්ෂේප කරන්නන්
කිසිවෙකුව අත් නොහරිනු මැනවි. (අල්ලාහ් වහී
මගින් කලින්ම ඔහුව විශ්වාස කළ අයට අමතරව
වෙන කිසිවෙකු විශ්වාස නොකරන බව දැනුම් දුන්
පසු විශ්වාස නොමැතිව මෙසේ ප්‍රාර්ථනා කළෝය.
අල්ලාහ් එතුමාගේ ප්‍රාර්ථනය පිළිගෙන ඔවුන්ව
විනාශ කළේය)
27 නියත වශයෙන් නුඹ ඔවුන්ව අත් හරින්නේනම්
ඔවුහු නුඹේ ගැත්තන්ව (සත්‍යයට පිටුපා) මං මුළා
කරවති. තවද නුඹේ (දයාවන්ට) අධිකව කළගුණ
අමතක කරන නරක අයවම ප්‍රසූත කරන්නෝය.
28 මගේ දෙවියනි, මටද මගේ දෙගුරුන්ට ද මගේ
නිවසේ මුඃමින්වරු ලෙස ඇතුල් වුවන්ටද විශ්වාස
වන්තයින් වන ගැහැණුන් හා පිරිමින් සියල්ලටමද
(පව් ක්ෂමා කරත්වා තවද අක්‍රමිතා කරන්නවුන්ට
විනාශය මිස අධික නොකරනු මැනවි (අවසන්
දිනය දක්වා අක්‍රමිකතා කරන සියල්ලෝම මෙයට
ඇතුළත් වෙති.

سُورَةُ الْجِنِّ

آياتها ٢٨ — ترتيبها ٧٢

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

قُلْ أُوحِيَ إِلَيَّ أَنَّهُ اسْتَمَعَ نَفَرٌ مِّنَ الْجِنِّ فَقَالُوا إِنَّا سَمِعْنَا قُرْآنًا
عَجَبًا ﴿١﴾ يَهْدِي إِلَى الرُّشْدِ فَآمَنَّا بِهِ ۖ وَلَن نُّشْرِكَ بِرَبِّنَا أَحَدًا ﴿٢﴾
وَأَنَّهُ تَعَالَىٰ جَدُّ رَبِّنَا مَا اتَّخَذَ صَاحِبَةً وَلَا وَلَدًا ﴿٣﴾ وَأَنَّهُ كَانَ
يَقُولُ سَفِيهُنَا عَلَى اللَّهِ شَطَطًا ﴿٤﴾ وَأَنَّا ظَنَنَّا أَن لَّن تَقُولَ الْإِنسُ
وَالْجِنُّ عَلَى اللَّهِ كَذِبًا ﴿٥﴾ وَأَنَّهُ كَانَ رِجَالٌ مِّنَ الْإِنسِ يَعُوذُونَ بِرِجَالٍ
مِّنَ الْجِنِّ فَزَادُوهُمْ رَهَقًا ﴿٦﴾ وَأَنَّهُمْ ظَنُّوا كَمَا ظَنَنتُمْ أَن لَّن يَبْعَثَ
اللَّهُ أَحَدًا ﴿٧﴾ وَأَنَّا لَمَسْنَا السَّمَاءَ فَوَجَدْنَاهَا مُلِئَتْ حَرَسًا
شَدِيدًا وَشُهُبًا ﴿٨﴾ وَأَنَّا كُنَّا نَقْعُدُ مِنْهَا مَقَاعِدَ لِلسَّمْعِ ۖ فَمَن
يَسْتَمِعِ الْآنَ يَجِدْ لَهُ شِهَابًا رَّصَدًا ﴿٩﴾ وَأَنَّا لَا نَدْرِي أَشَرٌّ أُرِيدَ
بِمَن فِي الْأَرْضِ أَمْ أَرَادَ بِهِمْ رَبُّهُمْ رَشَدًا ﴿١٠﴾ وَأَنَّا مِنَّا الصَّالِحُونَ
وَمِنَّا دُونَ ذَٰلِكَ ۖ كُنَّا طَرَائِقَ قِدَدًا ﴿١١﴾ وَأَنَّا ظَنَنَّا أَن لَّن نُّعْجِزَ
اللَّهَ فِي الْأَرْضِ وَلَن نُّعْجِزَهُ هَرَبًا ﴿١٢﴾ وَأَنَّا لَمَّا سَمِعْنَا الْهُدَىٰ
آمَنَّا بِهِ ۖ فَمَن يُؤْمِن بِرَبِّهِ فَلَا يَخَافُ بَخْسًا وَلَا رَهَقًا ﴿١٣﴾

## අල් - ජින්

1 (නබි වරයාණනි,) නුඹ පවසනු. (නියත වශයෙන්ම මා කියවන මෙම කුර්ආනයට ජින්වරුන් ගෙන් එක් කණ්ඩායමක් සවන් දුන්නේ යැයි (ජිබ්රීල් -අලෙයිහිස් සලාම්- මගින්) මට දැනුම් දී ඇත. (ඔවුහු ඉක්රඃ සූරාවට සවන් දුන් බව ප්‍රකාශ වී ඇත. ජින්වරුන්ගෙන් දේව දූතයින් කිසිවෙක් එවනු ලැබුයේ නැත. මිනිසුන් හට දූතයින් ලෙස එවූ අයම ඔවුන්ටද දූතයින් වන්නේය) ඔවුහු (තම කණ්ඩායම වෙතට ගිය විට) නියත වශයෙන්ම අපි විස්මයජනක කුර්ආනයකට සවන් දුනිමු'යි කීහ.

2 එය සෘජු මග කරා මග පෙන්වයි. එහෙයින් අපි එය විශ්වාස කළෙමු. තවද අපි අපේ දෙවියන්ට කිසිවක් ආදේශ නොකරන්නෙමු.

3 තවද අපගේ දෙවියන්ගේ ගෞරවය උසස්ය. ඔහු බිරිය හෝ දරුවන්ව හෝ ගත්තේ නැත.

4 තවද නියතවශයෙන්ම අප අතරේ නුගතුන් අල්ලාහ් මත නොහොබිනා (අසාධාරණකම් හා දෙවියන් ප්‍රතික්ෂේප කිරීම මගින්ද ඉතා නරක) වචන කියමින් සිටියහ.

5 මිනිසුන්ද ජින්වරුන්ද (අල්ලාහ්ට ආදේශ වුවෙක්ද, බිරිය හා දරුවන්ද ඇතැයි කී අවස්ථාවේ) අල්ලාහ්ගේ නමින් බොරු නොකියන්නෝ යැයි අපි සිතුවෙමු. (එහෙයින් ඔවුන්ව අපි සැබෑ කළෙමු)

6 තවද මිනිසුන්ගෙන් සමහරෙක් ජින්වරුන්ගෙන් ආරක්ෂාව සොයමින් සිටියහ. (ආරාබීන්ගෙන් කෙනෙකුට කොතැනක හෝ කඳු බෑවුමක නතර වීමට සිදු වුවහොත් ඔහු මෙසේ කියයි. මෙම බෑවුමේ නායකයාගෙන් ජින්වරුන්ව අයති) ඔවුන්ගේ නුගතුන්ගෙන් ආරක්‍ෂාව පතමි. පසුව ඔහු එළිවනතුරු එම ජින්වරයාගේ ආරක්ෂාව යටතේ සිටි බව පැවසෙයි) ඔවුහු (ජින්වරු) මොවුන්ට (ඔවුන්ගේ ආරක්ෂාව පැතූ මිනිසුන්ට) දුෂ්කරතාව වැඩි කළහ.

7 තවද නුඹලා සිතූ පරිදි අල්ලාහ් කිසිවෙකු (විනිශ්වය දිනයේ) නොනැගිටුවන්නේ යැයි සිතා සිටියහ.)

8 අපි (සුපුරුදු පරිදි) අහසට අත තබා එහි තොරතුරු සොයා බැලුවෙමු. (හොරෙන් තොරතුරු නොඅසා) තදින් වළක්වන ආරක්ෂකයින් ගෙන්ද (මලක්වරු ගෙන්ද ගිනි පන්දම් මගින් ද පුරවා ඇති බවට අපි එය දුටුවෙමු. (මෙම ආරක්ෂාව මුහම්මද් -සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමාණන් නබිවරයා ලෙස එවීමෙන් පසු සංවිධනය කෙරිණ.)

9 (මලක්වරුන්ගේ කතා බස්වලට සවන්දී ඒවා ශාස්ත්‍ර කියන අය වෙත ගෙන යාමට) අහසේ සමහර ස්ථානවල අපි වාඩි වී සිටියෙමු. දැනට කිසිවෙකු (එසේ) අසයි නම් ඔහු (තමාට) බලාපොරොත්තුවෙන් සිටින (තාරකාවලින් පිටවන) ගිනි පන්දම් ලබා ගන්නේය.

10 (අල්ලාහ් අහස මෙතරම් තදින් ආරක්ෂා කිරීම තුළින්) පොළොවේ සිටිනවුන්ට අයහපතක් මනාප වුයේද නැත්නම් ඔවුන්ගේ දෙවියා ඔවුනට යහපත මනාප වුයේ දැයි අපි නොදනිමු. ඉබ්නු ෂෛද් (රහ්) තුමා මෙසේ ප්‍රකාශ කරයි. ඉබ්ලීස් මෙම බාධකය තුළින් පොළොවේ සිටින අයට දඬුවමක් පහළ කිරීමට යන්නේද? නැතිනම් ඔවුනට දූතයෙකු එවන්නේ දැයි අපි නොදනිමු.

11 (අප කුර්ආනයට සවන් දුන් පසු) අප අතරෙන් (විශ්වාස කළ) යහපත් ගැත්තන්ද සිටියෝය. තවද (විශ්වාස නොකර) එයට වෙනස් වූ අයද සිටියහ. අපි වෙනස් වූ විවිධ කණ්ඩායම් වශයෙන් සිටියෙමු. (සර්ද් -රහ්මතුල්ලාහි අලෙයිහි- තුමා මෙසේ ප්‍රකාශ කරයි. ඔවුනතර මුස්ලිම්වරුන් යුදෙව්වන් ක්‍රිස්තියානින් අග්නි වන්දනා කරන්නන් යනුවෙන් විවිධ කොටස් සිටියෝය.)

12 (අල්ලාහ් අපට දඬුවම් කිරීමට මනාප වුයේ නම් ඒ සඳහා) අල්ලාහ්ව නොහැකි කෙනෙකු බවට අප විසින් පත් කළ නොහැකි බව ද නැතිනම් අපි පලා දුවමින් ඔහු (අපට දඬුවම් කිරීමට) නොහැකි කෙනෙකු බවට පත් කළ නොහැකි බව ද අපි මහපොළොවේ දැන සිටියෙමු. (ඔහු අපට දඬුවම් කරන්නේ නම් අපට එයින් බේරිය නොහැක.)

13 තවද නියත වශයෙන්ම අප සෘජුමග (අල් කුර්ආනය) ඇසූ පමණින් එය අපි විශ්වාස කළෙමු. කවරෙකු තම රක්ෂකයාව විශ්වාස කරන්නේද ඔවුහු (තම යහපත් ක්‍රියාවන්ගෙන් නැත්නම් වස්තුවෙන්) අඩුවක් ගැන හෝ අසාධාරණයක් ගැන හෝ බිය නොවෙති.

14 තවද නියත වශයෙන්ම අප අතරේ (විශ්වාස කළ) මුස්ලිම් වරුද සිටිති. (සෘජු මගින් වෙන් වී

وَأَنَّا مِنَّا ٱلْمُسْلِمُونَ وَمِنَّا ٱلْقَٰسِطُونَ ۖ فَمَنْ أَسْلَمَ فَأُو۟لَٰٓئِكَ
تَحَرَّوْا۟ رَشَدًا ﴿١٤﴾ وَأَمَّا ٱلْقَٰسِطُونَ فَكَانُوا۟ لِجَهَنَّمَ حَطَبًا ﴿١٥﴾
وَأَلَّوِ ٱسْتَقَٰمُوا۟ عَلَى ٱلطَّرِيقَةِ لَأَسْقَيْنَٰهُم مَّآءً غَدَقًا ﴿١٦﴾ لِّنَفْتِنَهُمْ
فِيهِ ۚ وَمَن يُعْرِضْ عَن ذِكْرِ رَبِّهِۦ يَسْلُكْهُ عَذَابًا صَعَدًا ﴿١٧﴾ وَأَنَّ
ٱلْمَسَٰجِدَ لِلَّهِ فَلَا تَدْعُوا۟ مَعَ ٱللَّهِ أَحَدًا ﴿١٨﴾ وَأَنَّهُۥ لَمَّا قَامَ عَبْدُ ٱللَّهِ
يَدْعُوهُ كَادُوا۟ يَكُونُونَ عَلَيْهِ لِبَدًا ﴿١٩﴾ قُلْ إِنَّمَآ أَدْعُوا۟ رَبِّى وَلَآ أُشْرِكُ
بِهِۦٓ أَحَدًا ﴿٢٠﴾ قُلْ إِنِّى لَآ أَمْلِكُ لَكُمْ ضَرًّا وَلَا رَشَدًا ﴿٢١﴾ قُلْ إِنِّى
لَن يُجِيرَنِى مِنَ ٱللَّهِ أَحَدٌ وَلَنْ أَجِدَ مِن دُونِهِۦ مُلْتَحَدًا ﴿٢٢﴾ إِلَّا بَلَٰغًا
مِّنَ ٱللَّهِ وَرِسَٰلَٰتِهِۦ ۚ وَمَن يَعْصِ ٱللَّهَ وَرَسُولَهُۥ فَإِنَّ لَهُۥ نَارَ جَهَنَّمَ
خَٰلِدِينَ فِيهَآ أَبَدًا ﴿٢٣﴾ حَتَّىٰٓ إِذَا رَأَوْا۟ مَا يُوعَدُونَ فَسَيَعْلَمُونَ
مَنْ أَضْعَفُ نَاصِرًا وَأَقَلُّ عَدَدًا ﴿٢٤﴾ قُلْ إِنْ أَدْرِىٓ أَقَرِيبٌ
مَّا تُوعَدُونَ أَمْ يَجْعَلُ لَهُۥ رَبِّىٓ أَمَدًا ﴿٢٥﴾ عَٰلِمُ ٱلْغَيْبِ فَلَا
يُظْهِرُ عَلَىٰ غَيْبِهِۦٓ أَحَدًا ﴿٢٦﴾ إِلَّا مَنِ ٱرْتَضَىٰ مِن رَّسُولٍ فَإِنَّهُۥ
يَسْلُكُ مِنۢ بَيْنِ يَدَيْهِ وَمِنْ خَلْفِهِۦ رَصَدًا ﴿٢٧﴾ لِّيَعْلَمَ أَن قَدْ أَبْلَغُوا۟
رِسَٰلَٰتِ رَبِّهِمْ وَأَحَاطَ بِمَا لَدَيْهِمْ وَأَحْصَىٰ كُلَّ شَىْءٍ عَدَدًۢا ﴿٢٨﴾

ගිය) අක්‍රම්කතා කරන අයද සිටිති. ඉස්ලාමය පිළිගත් අය සෘජු මග සොයා ලබා ගත්හ.

15 තවද අක්‍රම්කතා කළවුන් නිරයේ ඉන්ධන බවට පත් වූහ. ප්‍රතික්ෂේප කළවුන් නිරයේ දවාලන්නා සේ ඔවුහුද දවනු ලබන්නෝය.

16 තවද ඔවුහු (ජින්වරු ද මිනිස්සු ද සෘජු මගේ ස්ථාවරව සිටිත්නම් අපි ඔවුනට අධික ජලය ලබා දෙන්නෙමු.)

17 එයට ඔවුහු (කෙසේ කළගුණ සලකන්නෙහු ද යන වග) අපි පරීක්ෂාකර (දැන) ගැනීම (අපි එය ලබා දෙන්නෙමු) කවරෙකු කුර්ආනය (නැතිනම් උපදේශය) නොසලකා හරින්නේද ඔහුව දුෂ්කර වේදනාව තුළට ඔහු ඇතුළත් කරවයි.

18 තවද මස්ජිද් සියල්ල අල්ලාහ්ට අයිති ඒවාය. (පිළිම වලට හෝ වෙන කවරෙකු සඳහා හෝ ගොඩ නැගුන ඒවා නොවේ) එහෙයින් නුඹලා අල්ලාහ් සමඟ වෙන කිසිවෙකුට ආරාධනා නොකරහු. මන්ද ප්‍රාර්ථනයද එක් නැමදුමක් වන්නේය.

19 තවද නියත වශයෙන්ම අල්ලාහ්ගේ ගැත්තාවු (නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් බද්න් අල් නහ්ලා නමැති ස්ථානයේ අල්ලාහ්ට නැමදුම් ඉටුකර) ඔහු වෙත ප්‍රාර්ථනා කරන්න පටන් ගත් අවස්ථාවේ දී ඔවුහු (ජින්වරුන් කුර්ආනයට සවන් දීම සඳහා) එකෙක් අනෙකා සමඟ ළංවී සිටීමට උත්සාහ කළහ.

20 (නබිවරයාණෙනි,) නුඹ ප්‍රකාශ කරහි. නියත වශයෙන්ම මම කැඳවන්නේ මගේ රක්ෂකයාණන් පමණී. ඔහුට කිසිවක් ආදේශ නොකරමි.

21 (නබිවරයානණී,) නියත වශයෙන්ම මම නුඹලාට හානියක් හෝ යහපතක් කළ නොහැක්කෙමි. (මෙලොව හෝ පරලොව නුඹලාට සිදුවිය හැකි හානියක් වැළැක්වීමට හෝ නුඹලාට යහපතක් ඇති කිරීමට හෝ මට නොහැක.)

22 (නබිවරයාණනි,) නුඹ ප්‍රකාශ කරනු. නියත වශයෙන්ම අල්ලාහ් වෙතින් කිසිවෙකු මා බේරාගැනීමට නොහැක්කේය. අභයදානය මා හට ලබා ගත හැක්කේ ඔහුගෙන් පමණය.

23 අල්ලාහ්ගෙන් හා ඔහුගේ දූත මෙහෙවරෙන්ද දැනුවත් කරන දෑ හැර (මගෙන් කිසිවක් කළ නොහැක. අන්‍යයන්ට මා කියන දෑ මම පිළිපදිමි. ඒවා ඉටු කළහොත් මම බේරෙන්නෙමි. නැතිනම් මමද විනාශ වෙමි.) කවරෙකු අල්ලාහ්ට ද ඔහුගේ දූතයාවද (විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කර) වෙනස්කම් කරන්නෝද ඔවුනට දිගුකල් නැවති සිටින නිරය ඇත.

24 ඔවුනට පොරොන්දු වූ (විනිශ්චය දිනය) ඔවුහු දුටු සැනින් උදව් කරුවන්ගෙන් දුර්වල වුවන්ද සංඛ්‍යාවෙන් අඩු වුවන්ද කවුරුන් දැයි ඔවුහු (ප්‍රතික්ෂේප කළ අය) දැන ගනිති. (විශ්වාස වන්තයින්ද නැතිනම් ප්‍රතික්ෂේප කරන්නන් දැයි දැන ගනිති).

25 (නබිවරයාණනි,) නුඹ කියහි. නුඹලාට පොරෙන්දු වුන (විනිශ්චය දිනය) සමීපද? නැතිනම් මගේ රක්ෂකයාණන් එයට දිනයක් නියම කර (ප්‍රමාද කර)යි ද? යි මම නොදනිමි. (විනිශ්චය දිනය කවදා දැයි අල්ලාහ් හැර වෙන කිසිවෙක් නොදන්නෝය)

26 ඔහු සැඟවුන දෑ දන්නේය. තමා විසින් සඟවන දෑ ඔහු කිසිවෙකුට හෙළි නොකරයි.

27 තමා පිළිගත් දූතයෙකුට හැර (සැඟවුන දෑ කිසිවෙකුට හෙළි නොකරයි. දේව දූතයින්ගෙන් තමාට මනාප කෙනෙකුට තමාට මනාප ප්‍රමාණයක් වහී මගින් ඔහු හෙළි කරයි. එසේ සමහර සැඟවුන දෑ වහී මගින් දැනගෙන ප්‍රකාශ කිරීම ඔවුන්ගේ මුඃජිසා (ප්‍රාතිහාර්ය) ලෙසද නබිත්වයේ සංකේත ලෙසද ඇති කළේය. ශාස්ත්‍රකරුවන්ට මේවා දැනගත නොහැක. ඔවුහු අනුමාන කරමින් දෙවියන් මත බොරු පවසති. ඔවුහු (එම දැනුම ප්‍රතික්ෂේප කරන අය) නියත වශයෙන්ම අල්ලාහ් එම දූතයාට පෙරද, පසුද (ඔහුව) ආරක්ෂා කළ යුත්තන්ව (මලක්වරුන්ව) ඔවුන් සමඟ ගමන් කරවයි. (ඔහු වෙත අල්ලාහ් හෙළිකර දුන් සමහර සැඟවුන දැනුම් ඇති බව දැනගත් ෂෙතාන් ඔවුන්ගෙන් එය ඇසීමට උත්සාහ නොකර සිටීමට මෙසේ කළේය.

28 ඔවුන්ගේ රක්ෂකයාගේ දූත මෙහෙවර ඔවුහු පෙන්වා දුන්බව ඔහු දැන ගැනීම පිණිස, (ඔවුනට ආරකෂාව ඇති කළේය) තවද ඔවුන් සතුව ඇති සෑම දෙයක්ම ඔහු වටකර දැන ගත්තේය. තවද සෑම දෙයක්ම ගණනය කර තබා ඇත්තේය.

# අල් මුස්සම්මිල්

1 පොරවාගත් පුද්ගලයා, (නබි -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තුමාණන්ට වහී ආරම්භ වූ විට එතුමාණෝ බිය වූහ. එයින් එතුමාණෝ තම ඇඳුමෙන් පොරවාගෙන සිටියහ. දෙවන වරද මලක්වරයාගේ හඬ ඇසුන විට තම බිරිය වෙත ගොස් තමාව පොරවන ලෙස කීය. එම අවස්ථාවේ අල්ලාහ් මෙසේ ඇමතීය. වහී පහළ වෙන්න පටන් ගත් විට එතුමන්ට හුරු වී ය ඉවත් විය.)

2 රාත්‍රියේ සමහර වේලාවන් හැර රාත්‍රියේ (අනෙක් වේලාවල) නුඹ සිටගෙන නැමඳුම් ඉටු කරනු.

3 නුඹ එහි (රාත්‍රියේ) අඩක් (සිටගෙන නමදි) නැත්නම් එයින් මඳක් අඩු කරනු.

4 නැතිනම් එයට වඩා (මඳක්) වැඩි කරනු. (අඩක් හෝ තුනෙන් එකක් හෝ තුනෙන් දෙකක් හෝ සලාතයේ යෙදෙහිම දෙවියන් කියන්නාක් මෙන් ඇත. සඅද් බින් හිසාම් නමැත්තා මෙසේ සඳහන් කරයි: මට ආයිෂා -රළියල්ලාහු අන්හා- තුමිය ගෙන් නබි සල්-සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්- තුමාගේ රාත්‍රි නැමඳුම ගැන මට දන්වනු මැනව්'යි කීමි. එවිට එතුමිය නුඹ 'සූරා මුසම්මිල් නොකියවූ වෙහිදැ'යි ඇසුවාය. මම 'ඔව්, කියවා ඇත්තෙමි යනුවෙන් කීවෙමි. පසුව ඇය මෙසේ පැවසුවාය. එම පරිච්ඡේදයේ ආරම්භයේ රාත්‍රි නැමඳුම අල්ලාහ් අනිවාර්ය කළේය. නබි -සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමා හා එතුමාණන්ගේ මිතුරන් වසරක් පුරා ඔවුන්ගේ පාද ඉදිමෙන තුරු සිටගෙන නමැදුම් ඉටු කළහ. මෙම පරිච්ඡේදයේ අවසන් කොටස අල්ලාහ් වසරක් අහසේ රඳවා ගත්තේය. වසරකට පසු රාත්‍රි සලාතයේ පහසුකම් සලසන අවසන් වැකි පහළ කළේය. රාත්‍රි සලාතය අනිවාර්ය වී පසුව සුන්නත් එනම් අතිරේක බවට පත් විය) අල්-කුර්ආනය නුඹ නිසි ආකාරව (වේගවත් නොවී, එහි නීති පිළිපැද) කියවනු.

5 නියත වශයෙන්ම නුඹට බර වැකි (කුර්ආනය) පහළ කරන්නෙමු. (එහි නියම කෙරෙන වගකීම් හරාම්, හලාල් හා සීමාවන් ආදිය බර ඒවාය. අල්ලාහ්ගේ අනුග්‍රහය ලද අයෙකුම එය දරා ගන්නේය)

6 නින්දෙන් පසුව අවදි වී ඉටුකරන සලාතය වූ රාත්‍රි සලාතය (දිවටද හදවතට ද) ඍජුභාවය ඇති කිරීමේ විෂයෙහි ශක්තිමත් වෙයි. තවද වදනින් ඍජු එකක් දවන්නේය (රාත්‍රි කාලයේ නිහඬතාව ඇති නිසා දිවද හදවතද එක් වී කියවිය හැකිය)

7 නියත වශයෙන්ම (නබි වරයාණනි) නුඹට දිවා කාලයේ අධික වැඩ කටයුතු ඇත. (එහෙයින් රාත්‍රියේ නුඹ සලාතයේ යෙදෙනු)

8 නුඹ නුඹේ රක්ෂකයාගේ නාමය මෙනෙහි කරනු. තවද (ඔහුට නැමදුම් කිරීම මගින්ද ඔහු ළඟ ඇති දයාවන් සෙවීම මගින් ද) ඔහු කරාම ළංවෙනු.

9 (ඔහු) නැගෙනහිරෙහි ද බටහිරෙහිද රක්ෂකයාය. නුඹ ඔහුවම (නුඹගේ කාර්යයන්හි) වගකීම් භාර කළ යුත්තෙකු වශයෙන් පත් කරනු.

10 ඔවුන් කරන ප්‍රකාශ කෙරෙහි නුඹ ඉවසනු. ඔවුන්ව නුඹ ලස්සන අන්දමින් ප්‍රතික්ෂේප කරනු. (ඔවුනට නුඹ එකට එක නොකරනු.)

ترتيبها ٧٣ — سُورَةُ المُزَّمِّل — آياتها ٢٠

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

يَٰٓأَيُّهَا ٱلۡمُزَّمِّلُ ١ قُمِ ٱلَّيۡلَ إِلَّا قَلِيلٗا ٢ نِّصۡفَهُۥٓ أَوِ ٱنقُصۡ مِنۡهُ قَلِيلًا
٣ أَوۡ زِدۡ عَلَيۡهِ وَرَتِّلِ ٱلۡقُرۡءَانَ تَرۡتِيلًا ٤ إِنَّا سَنُلۡقِي عَلَيۡكَ قَوۡلٗا
ثَقِيلًا ٥ إِنَّ نَاشِئَةَ ٱلَّيۡلِ هِيَ أَشَدُّ وَطۡـٔٗا وَأَقۡوَمُ قِيلًا ٦ إِنَّ لَكَ فِي
ٱلنَّهَارِ سَبۡحٗا طَوِيلٗا ٧ وَٱذۡكُرِ ٱسۡمَ رَبِّكَ وَتَبَتَّلۡ إِلَيۡهِ تَبۡتِيلٗا ٨
رَّبُّ ٱلۡمَشۡرِقِ وَٱلۡمَغۡرِبِ لَآ إِلَٰهَ إِلَّا هُوَ فَٱتَّخِذۡهُ وَكِيلٗا ٩ وَٱصۡبِرۡ
عَلَىٰ مَا يَقُولُونَ وَٱهۡجُرۡهُمۡ هَجۡرٗا جَمِيلٗا ١٠ وَذَرۡنِي وَٱلۡمُكَذِّبِينَ
أُوْلِي ٱلنَّعۡمَةِ وَمَهِّلۡهُمۡ قَلِيلًا ١١ إِنَّ لَدَيۡنَآ أَنكَالٗا وَجَحِيمٗا ١٢
وَطَعَامٗا ذَا غُصَّةٖ وَعَذَابًا أَلِيمٗا ١٣ يَوۡمَ تَرۡجُفُ ٱلۡأَرۡضُ وَٱلۡجِبَالُ
وَكَانَتِ ٱلۡجِبَالُ كَثِيبٗا مَّهِيلًا ١٤ إِنَّآ أَرۡسَلۡنَآ إِلَيۡكُمۡ رَسُولٗا شَٰهِدًا
عَلَيۡكُمۡ كَمَآ أَرۡسَلۡنَآ إِلَىٰ فِرۡعَوۡنَ رَسُولٗا ١٥ فَعَصَىٰ فِرۡعَوۡنُ ٱلرَّسُولَ
فَأَخَذۡنَٰهُ أَخۡذٗا وَبِيلٗا ١٦ فَكَيۡفَ تَتَّقُونَ إِن كَفَرۡتُمۡ يَوۡمٗا يَجۡعَلُ
ٱلۡوِلۡدَٰنَ شِيبًا ١٧ ٱلسَّمَآءُ مُنفَطِرُۢ بِهِۦۚ كَانَ وَعۡدُهُۥ مَفۡعُولًا ١٨
إِنَّ هَٰذِهِۦ تَذۡكِرَةٞۖ فَمَن شَآءَ ٱتَّخَذَ إِلَىٰ رَبِّهِۦ سَبِيلًا ١٩

11 නුඹ මාවද සැප පහසුකම් වලින් යුතුව බොරුකරමින් සිටින අයවද අත්හරිනු. (ඔවුන්ගේ කටයුත්ත මම භාරගනිමි. නුඹේ අවධානය ඔවුන් වෙත යොමු නොකරනු.) ඔවුනට ටික කලක් (ඔවුන්ගේ කාලය අවසන් වන තෙක්) අවස්ථාව දෙනු.

12 නියත වශයෙන්ම අප ළඟ විලංගුද (දැවෙමින් තිබෙන) නිරය ද ඇත.

13 තවද හිරවෙන ආහාර ද ඇත. (උගුරේ හිර වී ගිලීමටත් නොහැකිව කෙළ ගැසීමටත් නොහැකිව පැටලෙන ආහාර ඇත.) තවද හිංසාකාරී වේදනාවන්ද ඇත.

14 භූමියද කඳු ද තදින් සෙල වී කඳු පෙරළී වැලි ගොඩවල් බවට පත් වන දිනයේ (හිංසාකාරී වේදනාව ඇත.)

15 නියත වශයෙන්ම අපි ෆිර්අවුන්ට දූතයෙකු එව්වා සේ නුඹලාටද නුඹලාගේ ක්‍රියාවන්ට (නුඹලාට) විරුද්ධව සාක්ෂි කියන දූතයෙකුව අපි එව්වෙමු. (නුඹලා ඔහුට වෙනස්කම් කළෙහුය)

16 ෆිර්අවුන් එම දූතයාට වෙනස්කම් කළේය. (ඔහුව බොරුකර විශ්වාස කිරීමට ප්‍රතික්ෂේප කළේය.) අපි ඔහුව (ගිල්වීම මගින්) තදින් ග්‍රහණය කළෙමු.

17 නුඹලා (දිගටම) දෙවියන් ප්‍රතික්ෂේප කරමින් සිටිහු නම් ළමයින් ව පවා මහල්ලන් බවට පත් කරවන දිනයේ (එහි දඬුවමෙන්) නුඹලා නුඹලාව කෙසේ ආරක්ෂා කර ගන්නෙහුද? (මෙය එම

۞ إِنَّ رَبَّكَ يَعْلَمُ أَنَّكَ تَقُومُ أَدْنَىٰ مِن ثُلُثَيِ ٱلَّيْلِ وَنِصْفَهُۥ وَثُلُثَهُۥ وَطَآئِفَةٌ
مِّنَ ٱلَّذِينَ مَعَكَ ۚ وَٱللَّهُ يُقَدِّرُ ٱلَّيْلَ وَٱلنَّهَارَ ۚ عَلِمَ أَن لَّن تُحْصُوهُ فَتَابَ
عَلَيْكُمْ ۖ فَٱقْرَءُوا۟ مَا تَيَسَّرَ مِنَ ٱلْقُرْءَانِ ۚ عَلِمَ أَن سَيَكُونُ مِنكُم مَّرْضَىٰ ۙ
وَءَاخَرُونَ يَضْرِبُونَ فِى ٱلْأَرْضِ يَبْتَغُونَ مِن فَضْلِ ٱللَّهِ ۙ وَءَاخَرُونَ
يُقَٰتِلُونَ فِى سَبِيلِ ٱللَّهِ ۖ فَٱقْرَءُوا۟ مَا تَيَسَّرَ مِنْهُ ۚ وَأَقِيمُوا۟ ٱلصَّلَوٰةَ وَءَاتُوا۟
ٱلزَّكَوٰةَ وَأَقْرِضُوا۟ ٱللَّهَ قَرْضًا حَسَنًا ۚ وَمَا تُقَدِّمُوا۟ لِأَنفُسِكُم مِّنْ خَيْرٍ تَجِدُوهُ
عِندَ ٱللَّهِ هُوَ خَيْرًا وَأَعْظَمَ أَجْرًا ۚ وَٱسْتَغْفِرُوا۟ ٱللَّهَ ۖ إِنَّ ٱللَّهَ غَفُورٌ رَّحِيمٌۢ ﴿٢٠﴾

## سُورَةُ المُدَّثِّرِ

ترتيبها ٧٤ — آياتها ٢٠

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

يَٰٓأَيُّهَا ٱلْمُدَّثِّرُ ﴿١﴾ قُمْ فَأَنذِرْ ﴿٢﴾ وَرَبَّكَ فَكَبِّرْ ﴿٣﴾ وَثِيَابَكَ فَطَهِّرْ ﴿٤﴾
وَٱلرُّجْزَ فَٱهْجُرْ ﴿٥﴾ وَلَا تَمْنُن تَسْتَكْثِرُ ﴿٦﴾ وَلِرَبِّكَ فَٱصْبِرْ ﴿٧﴾
فَإِذَا نُقِرَ فِى ٱلنَّاقُورِ ﴿٨﴾ فَذَٰلِكَ يَوْمَئِذٍ يَوْمٌ عَسِيرٌ ﴿٩﴾ عَلَى ٱلْكَٰفِرِينَ
غَيْرُ يَسِيرٍ ﴿١٠﴾ ذَرْنِى وَمَنْ خَلَقْتُ وَحِيدًا ﴿١١﴾ وَجَعَلْتُ لَهُۥ مَالًا
مَّمْدُودًا ﴿١٢﴾ وَبَنِينَ شُهُودًا ﴿١٣﴾ وَمَهَّدتُّ لَهُۥ تَمْهِيدًا ﴿١٤﴾ ثُمَّ يَطْمَعُ
أَنْ أَزِيدَ ﴿١٥﴾ كَلَّآ ۖ إِنَّهُۥ كَانَ لِءَايَٰتِنَا عَنِيدًا ﴿١٦﴾ سَأُرْهِقُهُۥ صَعُودًا ﴿١٧﴾

දවසේ භයානක කම කොතරම් දරුණු දැයි පෙන්වන්නේය)

18 (මලක්වරුන් බැසීම සඳහා) අහස එහිදී (එම දවසේ) පැළී යන්නේය. අල්ලාහ්ගේ වචනය (පොරොන්දුව) ඉටු වන්නකි.

19 නියත වශයෙන්ම මේවා (මෙම වැකි මු:මින්වරුන්ට) උපදේශයන්ය. මනාප අය (අල්ලාහ්ගේ වත් පිළිවෙත් මගින්) ඔහුගේ දෙවියන් කරා මාර්ගයක් සකස් කර ගන්නෝය. (ස්වර්ගයේ ඔහුගේ තෘප්තිය කරා කැඳවාගෙන යන මාර්ගයක් තෝරා ගනිති)

20 නියත වශයෙන්ම නුඹේ රක්ෂකයා නුඹලා (ඔහු අණ කළ පරිදි සමහර අවස්ථාවල) රාත්‍රියේ තුනෙන් දෙකකට වඩා මඳක් අඩුවෙන්ද (තවත් සමහරකදී) අඩක්ද (වෙනත් අවස්ථාවලදී) තුනෙන් එක කොටසක්ද රාත්‍රියේ සිට ගෙන නමැදුම් කරන්නෙහු යැයි දනී. තවද නුඹ ළඟ ඇති (නුඹේ මිතුරන්ගෙන්) කොටසක්ද (මෙසේ සිටගෙන නමැදුම් කරන්නෝ යැයි දනී. රාත්‍රිය ද දවාලද ඔහුම ඇති කරන්නේය. (එහෙයින් නුඹලා සිටගෙන කරන නමැදුම් ප්‍රමාණය ඔහු දනී) එය (සිටගෙන නමැදීම) නුඹලා විසින් සම්පූර්ණයෙන් කළ නොහැකි බව ඔහු දැන ඔහු නුඹලාට ක්ෂමා කළේය. (තවද රාත්‍රියේ සිටගෙන නමැදීම අත හැරීමටද සහනය ලබා දුන්නේය) එහෙයින් කුර්ආනයේ කුමක් පහසුවට ඇත්ද එය කියවහු. (මෙම වැකිය මගින් රාත්‍රියේ අනිවාර්යයෙන් සිටගෙන නමැදුම් ඉටුකළ යුතු බවට තිබුණ නීතිය වෙනස් කරන ලදි) නුඹලා අතර රෝගීන් සිටින බව ඔහු දනී. (ඔවුහු රාත්‍රියේ සිටගෙන නමැදුම් කිරීමට ශක්තිය නොලබති.) තවද අල්ලාහ්ගේ දයාව සොයා ගමන් කරන තවත් සමහරු සිටිති. (එයද ඔහු දනී. ඔවුහු තම ජීවිතයේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වෙළෙඳාම් කර ලාභ ලැබීම සඳහාද වෙනත් රැකියාවන්ටද ගමන් කරති. ඔවුහුද ශක්තිය නොලබති) තවද අල්ලාහ් දනී. ඔවුහුද ශක්තිය නොලබති. අල්ලාහ් රාත්‍රී සලාතය දුෂ්කර විය හැකි හේතූන් තුනක් පෙන්වාදී පොදුවේ සියල්ලන්ටම සහනය ලබා දුන්නේය). එහෙයින් නුඹලා එහිදී පහසු පරිදි කියවහු. තවද නුඹලා (අනිවාර්ය) සලාතය ඉටුකරහු. තවද නුඹලාගේ (වස්තුවලින් අනිවාර්ය වූ) සකාත් ද දෙහු. (ඔහුට මනාප යහමගෙහි වියදම් කර) අල්ලාහ්ට අලංකාර ණය ලබා දෙහු. කුසල්වලින් නුඹලා වෙනුවෙන් කුමක් හෝ කලින් යවන්නහු නම් අල්ලාහ් වෙතින් අගනාවූද ශ්‍රේෂ්ඨ වූද විපාක ලෙස ඒවා දකින්නේහුය. (නුඹලා මරණය දක්වා ප්‍රමාද නොකර කලින් ම දීම අගනේය) නුඹලා අල්ලාහ් පාප ක්‍ෂමාව අයදිහු. නියත වශයෙන්ම අල්ලාහ් අධිකව ක්‍ෂමාව දෙන ඉතාමත් කරුණාව දක්වන්නෙකි.

## අල් මුද්දස්සිර්

නබි තුමන්ට ආරම්භයේ වහී පහළ වූ පසු ටික දවසක් වහි ප්‍රමාද විය. නැවතත් ජිබ්රීල් (අලෛ) තුමා පැමිණියේය. නබි තුමෝ එතුමන්ව අහසටත් පොළොවටත් අතරේ ආසනයක වාඩි වී සිටිනු දැක සිහිසුන්ව වැටුනාහ. පසුව පියවි සිහිය ලැබ නිවසට ගොස් වතුර දෙන ලෙස ඉල්ලා එය ලබා ගෙන තම සිරුරේ ඉස ගත්හ. පසුව කදීජා (රලි) තුමිය අමතා 'මාව පොරවන්නැ'යි පැවසූහ. එම අවස්ථාවේ මෙය පහළ විය.

1 පොරවාගෙන සිටින (නුඹ)

2 නුඹ නැගිට ගොස් (මක්කාවාසීන්ට) අවවාද කරහු. (ඔවුන් ඉස්ලාමය නොපිළිගන්නේ නම් ඔවුනට දඬුවම් ඇතැයි කියහු)

3 නුඹ (ව මවා පරිපාලනය කරන) රක්ෂිතයාණන් උපහාර දක්වහු.

4 නුඹේ ඇඳුම් (අපිරිසිදු නොවී) පිරිසිදු ව තබා ගනු. (කිලිටි නොවී) පිරිසිදුව තබා ගනු.)

5 තවද නුඹ පිළිම ප්‍රතික්ෂේප කර (අයිනට කර)හු. (ඒවාට නුඹ නමැදුම් නොකරහු. එය අල්ලාහ්ගේ දඬුවමට හේතු වන්නේය.)

6 (නබිත්වයේ බර) නුඹ අධිකව සිතා (එය නුඹේ දෙවියන් වෙත) කියා නොපාහු. (නැතිනම් මෙම වැකියේ අදහස නුඹ අධිකව ලැබීමේ අරමුණෙන් උපකාර නොකරහු.)

7 (නුඹට විශාල වගකීමක් භාරදී ඇත. ජනතාව නුඹව බලාපොරොත්තු වෙති). එහෙයින් නුඹේ රක්ෂකයා වෙනුවෙන් ඉවසහු.

8 (විනිශ්චය දිනය එළඹීම සඳහා) නළාව පිඹිනු ලැබුවහොත්

9 එදවස ඉතා දුෂ්කර දිනයකි.

إِنَّهُۥ فَكَّرَ وَقَدَّرَ ﴿١٨﴾ فَقُتِلَ كَيۡفَ قَدَّرَ ﴿١٩﴾ ثُمَّ قُتِلَ كَيۡفَ قَدَّرَ ﴿٢٠﴾ ثُمَّ نَظَرَ
﴿٢١﴾ ثُمَّ عَبَسَ وَبَسَرَ ﴿٢٢﴾ ثُمَّ أَدۡبَرَ وَٱسۡتَكۡبَرَ ﴿٢٣﴾ فَقَالَ إِنۡ هَٰذَآ إِلَّا سِحۡرٞ
يُؤۡثَرُ ﴿٢٤﴾ إِنۡ هَٰذَآ إِلَّا قَوۡلُ ٱلۡبَشَرِ ﴿٢٥﴾ سَأُصۡلِيهِ سَقَرَ ﴿٢٦﴾ وَمَآ أَدۡرَىٰكَ
مَا سَقَرُ ﴿٢٧﴾ لَا تُبۡقِي وَلَا تَذَرُ ﴿٢٨﴾ لَوَّاحَةٞ لِّلۡبَشَرِ ﴿٢٩﴾ عَلَيۡهَا تِسۡعَةَ عَشَرَ
﴿٣٠﴾ وَمَا جَعَلۡنَآ أَصۡحَٰبَ ٱلنَّارِ إِلَّا مَلَٰٓئِكَةٗۙ وَمَا جَعَلۡنَا عِدَّتَهُمۡ إِلَّا فِتۡنَةٗ
لِّلَّذِينَ كَفَرُواْ لِيَسۡتَيۡقِنَ ٱلَّذِينَ أُوتُواْ ٱلۡكِتَٰبَ وَيَزۡدَادَ ٱلَّذِينَ ءَامَنُوٓاْ إِيمَٰنٗا
وَلَا يَرۡتَابَ ٱلَّذِينَ أُوتُواْ ٱلۡكِتَٰبَ وَٱلۡمُؤۡمِنُونَ وَلِيَقُولَ ٱلَّذِينَ فِي قُلُوبِهِم مَّرَضٞ
وَٱلۡكَٰفِرُونَ مَاذَآ أَرَادَ ٱللَّهُ بِهَٰذَا مَثَلٗاۚ كَذَٰلِكَ يُضِلُّ ٱللَّهُ مَن يَشَآءُ وَيَهۡدِي
مَن يَشَآءُۚ وَمَا يَعۡلَمُ جُنُودَ رَبِّكَ إِلَّا هُوَۚ وَمَا هِيَ إِلَّا ذِكۡرَىٰ لِلۡبَشَرِ ﴿٣١﴾ كَلَّا
وَٱلۡقَمَرِ ﴿٣٢﴾ وَٱلَّيۡلِ إِذۡ أَدۡبَرَ ﴿٣٣﴾ وَٱلصُّبۡحِ إِذَآ أَسۡفَرَ ﴿٣٤﴾ إِنَّهَا لَإِحۡدَى
ٱلۡكُبَرِ ﴿٣٥﴾ نَذِيرٗا لِّلۡبَشَرِ ﴿٣٦﴾ لِمَن شَآءَ مِنكُمۡ أَن يَتَقَدَّمَ أَوۡ يَتَأَخَّرَ ﴿٣٧﴾ كُلُّ
نَفۡسِۭ بِمَا كَسَبَتۡ رَهِينَةٌ ﴿٣٨﴾ إِلَّآ أَصۡحَٰبَ ٱلۡيَمِينِ ﴿٣٩﴾ فِي جَنَّٰتٖ يَتَسَآءَلُونَ
﴿٤٠﴾ عَنِ ٱلۡمُجۡرِمِينَ ﴿٤١﴾ مَا سَلَكَكُمۡ فِي سَقَرَ ﴿٤٢﴾ قَالُواْ لَمۡ نَكُ مِنَ
ٱلۡمُصَلِّينَ ﴿٤٣﴾ وَلَمۡ نَكُ نُطۡعِمُ ٱلۡمِسۡكِينَ ﴿٤٤﴾ وَكُنَّا نَخُوضُ مَعَ
ٱلۡخَآئِضِينَ ﴿٤٥﴾ وَكُنَّا نُكَذِّبُ بِيَوۡمِ ٱلدِّينِ ﴿٤٦﴾ حَتَّىٰٓ أَتَىٰنَا ٱلۡيَقِينُ ﴿٤٧﴾

(10) දෙවියන් ප්‍රතික්ෂේප කළවුන්ට එය පහසු දිනයක් නොවන්නේය.
(11) (නබිවරයාණනි,) නුඹ මාව ද මා මැවූ ඔහුවද තනිවම අතහරිනු. (ඔහුට දඬුවම් කිරීම මට භාර දී අත් හරිනු. මෙහි සඳහන් කරන්නේ අල් වලීද් බින් මුගීරා බව විවරණ කරුවෝ ප්‍රකාශ කරති.)
(12) තවද මම ඔහුට අධික වස්තුවද ලබා දුනිමි.
(13) (මක්කමේ) ඔහු ළඟ සිටිය යුතු දරුවන්ව ද (අපි ලබා දුනිමු. තම පියා ළඟ ඇති තරම් වස්තුව තිබුණ හෙයින් ඉපැයීම සඳහා කිසිඳු තැනකට යාමට අවශ්‍යතාවක් නොවිය.)
(14) (ඔහුගේ ජීවිතයේ සෑම අංශයක ම) ඔහුට පුළුල් බව ඇති කළෙමු.
(15) පසුවද මම ඔහුට (වස්තුව) අධිකව ලබාදීම ඔහු ආශා කරයි.
(16) නැත, (එසේ නොව) නියත වශයෙන්ම ඔහු (අප අපගේ නබිවරයා වෙත පහළ කළ) වැකි ප්‍රතික්ෂේප කරන්නෙකුව සිටී.
(17) මම (ඔහුට දරා නොගත හැකි) දුෂ්කර දඬුවම් දී ඔහුට හිරිහැර කරමි.
(18) නියත වශයෙන්ම ඔහු සිතාමතාම (අල්-කුර්ආනයේ විෂයෙහි එක් තීන්දුවක්) ඇති කර ගත්තේය.
(19) ඔහු ශාප කරනු ලැබිය. ඔහු කෙසේ (කුර්ආනයේ විෂයෙහි) ඇති කර ගන්නේද?
(20) නැවතත් ඔහු ශාප කරනු ලැබිය. ඔහු කෙසේ ඇති කරයි ද?
(21) පසුව ඔහු (අල්-කුර්ආනයේ විෂයෙහි කුමන තීරණයක් කියාවිදැ?යි) සිතීය.
(22) (කිසිඳු තීන්දුවක් නොලැබුන නිසා) පසුව (ඔහුගේ මුහුණ ඇඹුල් කර ගත්තේය)
(23) පසුව ඔහු (විශ්වාස නොකර) පසුබට වී උඩඟු වුයේය.
(24) ඔහු මෙසේ කීය" මෙය (අනුන්ගෙන් ඉගෙන ගෙන) ලබා ගත් හූනියම් හැර වෙනත් නැත.
(25) මෙය මිනිසුන්ගේ වචන හැර වෙනත් නැත. (අල්ලාහ්ගේ වචනය නොවේ)
(26) මම ඔහුව සකර් නමැති නිරයේ ඇතුල් කරවමි.
(27) 'සකර්' නමැති නිරය කුමක් දැයි නුඹට දැනුම් දුන්නේ කුමක්ද?
(28) කිසිවෙකුව එය අත් හරින්නේ හෝ ඉතිරි කරන්නේ හෝ නැත.
(29) (එය) මිනිසුනට (ඔවුන්ගේ පෙනුමට) පෙනී යා හැකි එකකි. (නැතිනම් මෙම වැකියේ අදහස මිනිසුන්ව පුලුස්සා අඟුරු කරන්නකි.)
(30) එය භාරව (මලක්වරු) දහ නව දෙනෙක් සිටිති. (මෙම වැකිය පහළ වූ විට අබූ ජහ්ල් මෙසේ ඇසීය. මුහම්මද්ට සිටින්නේ උදව්කරුවන් දහ නව දෙනෙකු පමණක් ද? නුඹලාගෙන් සිය දෙනෙකු එක් වී ඔවුන්ගෙන් කෙනෙකුව අල්වා පහර දී අපායෙන් පිටතට යාම නොහැකි කාර්යයක්ද? එවිට පහත වැකිය පහළ විය.)
(31) නිරයේ වගකිව යුත්තන් ලෙස අපි මලක්වරුන්ව නියම කළෙමු. (ඔවුන් සමඟ සටන් කිරීමට ශක්තිය ඇත්තේ කාහටද ඔවුහු අල්ලාහ් වෙනුවෙන් කෝපවීමෙහි ඉතා දැඩි අය වන්නෝය.) ඔවුනතර (දහනව දෙනෙක් යන) සංඛ්‍යාව ප්‍රතික්ෂේප කරන්නන් හට පරීක්ෂණයක් ලෙසම ඇති කළෙමු. (ඔවුන් මේ ගැන කථා කරමින් තව දුරටත් ඔවුන්ව දඬුවමට ලක් කිරීම සඳහාම මෙසේ කළෙමු). පුස්තකය දෙනු ලැබූ අය (මෙම සංඛ්‍යාව ඔවුන්ගේ පුස්තකවල ප්‍රකාශ වූ පරිදි සනාථ වන බැවින්) තහවුරු කර ගැනීම සඳහා ද තවද විශ්වාස කළ අය ඔවුන්ගේ විශ්වාසය තව දුරටත් අධික කර ගැනීම සඳහා ද (අපි මෙසේ කළෙමු).

තවද ඔවුන්ගේ හදවත් වල රෝග ඇති අයද (කුහකයින්) ප්‍රතික්ෂේප කරන අයද (දහ නවයක් යන) මෙම (සංඛ්‍යාවේ) උදාහරණය මගින් අල්ලාහ්ගේ මනාපය කුමක්දැ?යි ඇසීම සඳහා ද (අපි මෙසේ කළෙමු). නුඹගේ රක්ෂකයාගේ සේනාවන් පිළිබඳව ඔහුම විනා වෙන කිසිවෙක් නොදන්නෝය. මෙය මිනිසුනට උපදේශයක් හැර වෙනත් නැත.
(32) එසේ නොව චන්ද්‍රයා මත දිවුරා කියමි.
(33) එය පසුබැස යන තත්ත්වයේ උදෑසන කාලය මත දිවුරා කියමි.
(34) එය දීප්තිය විහිදුවන තත්ත්වයේ උදෑසන කාලය මත දිවුරා කියමි.
(35) නියත වශයෙන්ම එය (සකර්) අති විශාල වූ (පරීක්ෂණවලින්) එකකි.
(36) මිනිසුනට අවවාදයක් වූ (පරීක්ෂණවලින් එකකි.)
(37) නුඹලා අතර මනාප වූ අයව (විශ්වාස කිරීම තුළින්) ඉදිරියට යාමට පිළිවන. නැතිනම් (ප්‍රතික්ෂේප කිරීම තුළින්) පසු බැසීමටද පිළිවන.

فَمَا تَنفَعُهُمۡ شَفَٰعَةُ ٱلشَّٰفِعِينَ ٤٨ فَمَا لَهُمۡ عَنِ ٱلتَّذۡكِرَةِ مُعۡرِضِينَ
٤٩ كَأَنَّهُمۡ حُمُرٞ مُّسۡتَنفِرَةٞ ٥٠ فَرَّتۡ مِن قَسۡوَرَةِۭ ٥١ بَلۡ يُرِيدُ
كُلُّ ٱمۡرِيٕٖ مِّنۡهُمۡ أَن يُؤۡتَىٰ صُحُفٗا مُّنَشَّرَةٗ ٥٢ كَلَّاۖ بَل لَّا يَخَافُونَ
ٱلۡأٓخِرَةَ ٥٣ كَلَّآ إِنَّهُۥ تَذۡكِرَةٞ ٥٤ فَمَن شَآءَ ذَكَرَهُۥ ٥٥
وَمَا يَذۡكُرُونَ إِلَّآ أَن يَشَآءَ ٱللَّهُۚ هُوَ أَهۡلُ ٱلتَّقۡوَىٰ وَأَهۡلُ ٱلۡمَغۡفِرَةِ ٥٦

ترتيبها ٧٥ — سُورَةُ القِيَامَةِ — آياتها ٤٠

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

لَآ أُقۡسِمُ بِيَوۡمِ ٱلۡقِيَٰمَةِ ١ وَلَآ أُقۡسِمُ بِٱلنَّفۡسِ ٱللَّوَّامَةِ ٢ أَيَحۡسَبُ
ٱلۡإِنسَٰنُ أَلَّن نَّجۡمَعَ عِظَامَهُۥ ٣ بَلَىٰ قَٰدِرِينَ عَلَىٰٓ أَن نُّسَوِّيَ بَنَانَهُۥ ٤ بَلۡ
يُرِيدُ ٱلۡإِنسَٰنُ لِيَفۡجُرَ أَمَامَهُۥ ٥ يَسۡـَٔلُ أَيَّانَ يَوۡمُ ٱلۡقِيَٰمَةِ ٦ فَإِذَا بَرِقَ ٱلۡبَصَرُ
٧ وَخَسَفَ ٱلۡقَمَرُ ٨ وَجُمِعَ ٱلشَّمۡسُ وَٱلۡقَمَرُ ٩ يَقُولُ ٱلۡإِنسَٰنُ يَوۡمَئِذٍ
أَيۡنَ ٱلۡمَفَرُّ ١٠ كَلَّا لَا وَزَرَ ١١ إِلَىٰ رَبِّكَ يَوۡمَئِذٍ ٱلۡمُسۡتَقَرُّ ١٢ يُنَبَّؤُاْ ٱلۡإِنسَٰنُ
يَوۡمَئِذِۭ بِمَا قَدَّمَ وَأَخَّرَ ١٣ بَلِ ٱلۡإِنسَٰنُ عَلَىٰ نَفۡسِهِۦ بَصِيرَةٞ ١٤ وَلَوۡ أَلۡقَىٰ
مَعَاذِيرَهُۥ ١٥ لَا تُحَرِّكۡ بِهِۦ لِسَانَكَ لِتَعۡجَلَ بِهِۦٓ ١٦ إِنَّ عَلَيۡنَا جَمۡعَهُۥ
وَقُرۡءَانَهُۥ ١٧ فَإِذَا قَرَأۡنَٰهُ فَٱتَّبِعۡ قُرۡءَانَهُۥ ١٨ ثُمَّ إِنَّ عَلَيۡنَا بَيَانَهُۥ ١٩

38 සෑම ආත්මයක්ම එය සොයා ගත් දෙය අනුව අල්වා ගනු ලබයි (එය යහපත් නම් ආරක්ෂා කරයි. නැතිනම් ඔහුව විනාශ කරයි)

39 (ඔවුන්ගේ) දකුණතෙහි සටහන් ලේඛන දෙනු ලබන අය හැර (ඔවුන්ගේ කුසල් අධික නිසා ඔවුන්ගේ පාප ක්ෂමා කෙරෙයි.)

40 ස්වර්ගයේ එකිනෙකා ඔවුහු විමසා ගනිති.

41 වරද කරුවන් ගැන (එකිනෙකා ඔවුහු විමසා ගනිති)

42 (ස්වර්ග වාසීහු වැරදි කළවුන් දෙස බලා මෙසේ අසති) නුඹලාව 'සකර්' නමැති නිරයට ගෙන ගියේ කුමක්ද?

43 ඔවුහු මෙසේ පවසති. අප සලාතය ඉටුකරන්නන්ව සිටියේ නැත.

44 අප දිළින්දන්ට ආහාර දුන්නේ නැත.

45 (පාපයන්හිද අනවශ්‍ය දේවල් වලද) ගිලී සිටියවුන් සමග අපිද ගිලී සිටියෙමු.

46 තවද විනිශ්වය දිනය අපි බොරු කරමින් සිටියෙමු.

47 ස්ථිර වූ (මරණය) අපට අත්වන තෙක් (අපි මෙසේ සිටියෙමු)

48 අනුකම්පා බස් දොඩවන්නන්ගේ අනුකම්පා බස් ඔවුනට ඵලක් නොවේ.

49 ඔවුනට කුමක් සිදු වූයේද? ඔවුහු මෙම උපදේශය (උපදෙස් අන්තර්ගත කුර්ආනය) පිටු දකින්නන් ලෙස සිටිති.

50 නියත වශයෙන්ම ඔවුන් මරබියේ දුවන බූරුවන් සේය.

51 සිංහයාව දැක (ප්‍රාණභයේ දුවන බූරුවන් සේය.

52 එහෙත් ඔවුන් අතර සෑම මිනිසෙකුම (මුහම්මද් - සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්- තුමන්ව අල්ලාහ්ගේ දූත යා බවට ලියැවුන) පොත් (තනිතනිව) පිරිනැමීම ප්‍රිය කරති.

53 එසේ නොවන්නේය. එහෙත් ඔවුහු විනිශ්වය දිනය බිය නොවෙති.

54 නියත වශයෙන්ම මෙය (කුර්ආනය) උපදේශයකි.

55 කවරෙකු මනාප වන්නේද ඔහු උපදෙස් ලබයි.

56 තවද අල්ලාහ් (ඔවුනට සෘජුමග) මනාප වුවොත් මිස ඔවුහු උපදෙස් නොලබති. ඔහු (ඔහුගේ අණ පිළිපැද පාපයන්ගෙන් ඉවත්ව) බිය වීමට සුදුස්සාය. තවද (විශ්වාස වන්තයින්ට ඔවුන්ගේ පෙර පව්වලට) ක්ෂමාව දීමටද සුදුස්සාය.

# අල් කියාමා

1 මම විනිශ්වය දිනය මත දිවුරමි. (විනිශ්වය දිනය මත දිවුරනුයේ එයට ගරු කිරීමක් වශයෙන්ය.)

2 අධිකව අපහාස කරන ආත්මය මත දිවුරමි. (අතහැරුණ කුසල් වෙනුවෙන්ද අධික වූ පාපයන් වෙනුවෙන් ද එය අපහසා කරමින් සිටි)

3 මිනිසා (ඔහු මරණයට පත් වී ඔහුගේ සිරුර දිරාපත් වී පස් වූ පසු) ඔහුගේ ඇටකටු එක්කර (නැවතත් ඔහුව නැගිටුවීම) නොකරන්නෙමුයි සිතන්නේ ද?(එය වැරදි සිතුවිල්ලකි)

4 ඔව් (අපි එක් කරන්නෙමු අපි) ඔහුගේ ඇඟිලි තුඩු පවා (ඒ අතර ඇති පරතරය නැති කර ඔටුවාගේ පාදය මෙන් එක්කර) සම කරන්නට ශක්තිමත් ය. (එහෙත් අප ඇඟිලි අතර පරතරය ඇති කර ඒවායේ නහර හා හංදි ද ඇති කර ඔහුට අපි දයාව පහළ කළෙමු. සමහර වියතුන්, අල්ලාහ් සෑම මිනිසෙකුවම වෙනස් අයුරින් ඇති කළේය. එක් අයෙකුගේ ඇඟිල්ලක් අනෙකාගේ ඇඟිල්ලට වඩා වෙනස් වන බව මෙම වැකිය මගින් දැනුවත් කරන බව සඳහන් කරයි.)

5 එහෙත් (මිනිසා ගත වූ කාලය තුළ සිදුවූ පාපයන්ට ක්ෂමාව නො ඇයද) තමාට ඉදිරියේ (එන කාලවලදී ද) පාපයන් කිරීමට කැමති වෙයි.

6 ඔහු විනිශ්වය දිනය කවදා (ඇති වෙයි)දැ?'යි විමසයි. (එය දුරස්ථ කරුණක් යැයි සිතමින් ද සමච්චල් කරමින් ද මෙසේ අසයි)

7 (විනිශ්වය දිනයේ බියකරු බව දැක තැතිගෙන) බැල්ම ඉහළට ගියහොත්

8 තවද චන්ද්‍රයා එහි දීප්තිය (සම්පූර්ණයෙන්) නැති කරගත් විට

9 තවද සූර්යයාද චන්ද්‍රයාද (ඒ දෙකෙහිම දීප්තිය නැති වූ පසු) එක් කරනු ලබයි නම් (ඉන්පසු දිවා රාත්‍රි වෙනස්වීම සිදු නොවෙයි)

10 එදවස මිනිසා (අල්ලාහ්ගේ පරීක්ෂාවෙන් හා දඬුවමෙන් ගැලවී) කොහේ දුවන්නදැ?'යි විමසයි.

11 එසේ නොවේ, (එ දවසේ අල්ලාහ්ගේ දඬුවමෙන් ගැලවී) ආරක්ෂා කළ හැකි කිසිම තැනක් (බලකොටු හෝ කඳු හෝ ) නැත.

12 එ දවසේ (සියල්ලෝම නැවතත්) රැඳී සිටිනුයේ නුඹේ රක්ෂකයා ළඟය.

13 ඒ දවසේ ඔවුනොවුන් කලින් කළ දෑ (ඔහුගේ ක්‍රියාවන්) ද පසුව කළ දෑ ද මිනිසාට දැනුම් දෙනු ඇත.

14 නැත. මිනිසාම ඔහු ගැන දැන ගනී. (ප්‍රමාන්, ප්‍රතික්ෂේපය අවනත වීම, වෙනස්කම් කිරීම ආදියෙහි ඔහුගේ තත්ත්වය ඔහුම දැන ගනී)
15 (ඔහු තම වැරදි සඟවන්නා) තමා පිළිබඳව සාධාරණත්වය කියා පෑවද (ඔහුට ඒවා ප්‍රයෝජනවත් නොවෙයි)
16 (නබිවරයාණනි,) නුඹ මෙය (අල්-කුර්ආනය) කඩිනමින් මනනය කර ගැනීමේ අරමුණෙන් නුඹේ දිව නොසොලවහි. (නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් තමන්ට ජිබ්රීල් අලෙයිහිස් සලාම් තුමා 'වහී'ය කියා නිම කිරීමට පෙර එතුමාණෝද එය කියවන්නට පටන් ගන්නෝය. එය මනනය කර ගැනීමේ ආශාව නිසා එතුමෝ මෙසේ කළහ. එම අවස්ථාවේ මෙම වැකිය පහළ විය)
17 නියත වශයෙන්ම (නුඹේ හදවතේ) එය එක්රැස් කිරීමත් (මනනය කරවීමටත්) එය (නුඹේ දිවෙන්) කියවීමට සැලැස්වීමත් අපේ වගකීමකි.
18 එහෙයින් අප (ජිබ්රීල් (අලෛ) තුමා මගින් නුඹට) එය කියවා පෙන්වුවහොත් නුඹ එය කියවන විට සවන් දී අසහි.
19 පසුව එය පැහැදිලි කිරීම ද අපේ වගකීමකි. (එහි ඇති හරාම් හලාල් ආදි නීති පැහැදිලි කිරීම අපේ වගකීමයි.)
20 එහෙත් සත්‍ය වශයෙන්ම නුඹලා මෙලොවට ප්‍රිය කරන්නෙහුය.
21 තවද පරලොව අත් හරින්නෙහුය.
22 එ දවසේ සමහර මුහුණු අලංකාරව පෙනෙයි.
23 (ඒවා) ඒවායේ රක්ෂකයාව බැලිය හැකි ඒවා වන්නේය. (විනිශ්චය දිනයේ අල්ලාහ්ගේ යහපත් ගැත්තෝ පුන්සඳ ඇති දිනයේ චන්ද්‍රයාව දකින්නා සේ දකිති. බොහෝ හදීස් මගින් මෙය දැනුම් දී ඇත)
24 තවද සමහර මුහුණු (දීප්තියෙන් තොරව) අඳුරුවී පෙනෙයි.
25 (තම කොඳු ඇට කැඩී යා හැකි) පරීක්ෂණයක් තමන්ට සිදු වන්නට යන්නේ යැයි සිතමින් සිටිති)
26 සත්‍ය වශයෙන්ම (ඔහුගේ) ප්‍රාණය උගුරු දණ්ඩ ළඟට (මරණය ඉතා සමීප) වී නම්
27 (ඔහුට වෙදකම් කර සුව කරන්නට) මතුරන්නන් කවරෙක් සිටීදැ?යි අසනු ලැබුවොත් (මැතිරීම් වැනි දෑ මගින් ඔහුව සුව කරන්න උත්සාහ කරති. එහෙත් ඔහුට එයින් ඵලක් නොවෙයි.)
28 තවද එය (ඔහුගේ පවුල හා වස්තුවලින්) වෙන්වන මොහොත යැයි ඔහු දන්නේ නම්
29 තවද පාදයක කෙණ්ඩත් අනෙක් පාදයේ කෙණ්ඩත් හා පැටලෙයි නම් (මරණය ඉතා සමීප වන විට ඔහුගේ දෙපා අප්‍රාණික වෙයි. ඔහුගේ සිරුර දරා නොගනී ඔහු මැරුණ වහාම මිනිසුන් ඔහුගේ දේහය සූදානම් කර ගෙන යති. මලක්වරු ඔහුගේ ප්‍රාණය) සූදානම් කර රැගෙන යති.
30 එ දවසේ (ප්‍රාණයන්) ගෙන යනු ලබන්නේ රක්ෂකයා ළඟමය.
31 ඔහු (කුර්ආන්, පණිවිඩය ආදිය) සත්‍ය බව පිළිගත්තේ ද නැත. (ඔහුගේ දෙවියන්ට ඔහු සලාත් කළේ ද නැත. (එහෙයින් ඔහු තම හදවතින් විශ්වාස කළේ ද නැත. තම ශරීරයෙන් යහපත් ක්‍රියා කළේද නැත.)

كَلَّا بَلۡ تُحِبُّونَ ٱلۡعَاجِلَةَ ٢٠ وَتَذَرُونَ ٱلۡأٓخِرَةَ ٢١ وُجُوهٞ يَوۡمَئِذٖ نَّاضِرَةٌ ٢٢
إِلَىٰ رَبِّهَا نَاظِرَةٞ ٢٣ وَوُجُوهٞ يَوۡمَئِذِۭ بَاسِرَةٞ ٢٤ تَظُنُّ أَن يُفۡعَلَ بِهَا فَاقِرَةٞ ٢٥
كَلَّآ إِذَا بَلَغَتِ ٱلتَّرَاقِيَ ٢٦ وَقِيلَ مَنۡۜ رَاقٖ ٢٧ وَظَنَّ أَنَّهُ ٱلۡفِرَاقُ ٢٨ وَٱلۡتَفَّتِ
ٱلسَّاقُ بِٱلسَّاقِ ٢٩ إِلَىٰ رَبِّكَ يَوۡمَئِذٍ ٱلۡمَسَاقُ ٣٠ فَلَا صَدَّقَ وَلَا صَلَّىٰ
٣١ وَلَٰكِن كَذَّبَ وَتَوَلَّىٰ ٣٢ ثُمَّ ذَهَبَ إِلَىٰٓ أَهۡلِهِۦ يَتَمَطَّىٰٓ ٣٣ أَوۡلَىٰ لَكَ
فَأَوۡلَىٰ ٣٤ ثُمَّ أَوۡلَىٰ لَكَ فَأَوۡلَىٰٓ ٣٥ أَيَحۡسَبُ ٱلۡإِنسَٰنُ أَن يُتۡرَكَ سُدًى ٣٦
أَلَمۡ يَكُ نُطۡفَةٗ مِّن مَّنِيّٖ يُمۡنَىٰ ٣٧ ثُمَّ كَانَ عَلَقَةٗ فَخَلَقَ فَسَوَّىٰ ٣٨ فَجَعَلَ مِنۡهُ
ٱلزَّوۡجَيۡنِ ٱلذَّكَرَ وَٱلۡأُنثَىٰٓ ٣٩ أَلَيۡسَ ذَٰلِكَ بِقَٰدِرٍ عَلَىٰٓ أَن يُحۡـِۧيَ ٱلۡمَوۡتَىٰ ٤٠

## سُورَةُ الإنسَانِ

ترتيبها ٧٦ — آياتها ٣١

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

هَلۡ أَتَىٰ عَلَى ٱلۡإِنسَٰنِ حِينٞ مِّنَ ٱلدَّهۡرِ لَمۡ يَكُن شَيۡـٔٗا مَّذۡكُورًا ١
إِنَّا خَلَقۡنَا ٱلۡإِنسَٰنَ مِن نُّطۡفَةٍ أَمۡشَاجٖ نَّبۡتَلِيهِ فَجَعَلۡنَٰهُ سَمِيعَۢا
بَصِيرًا ٢ إِنَّا هَدَيۡنَٰهُ ٱلسَّبِيلَ إِمَّا شَاكِرٗا وَإِمَّا كَفُورًا ٣
إِنَّآ أَعۡتَدۡنَا لِلۡكَٰفِرِينَ سَلَٰسِلَاْ وَأَغۡلَٰلٗا وَسَعِيرًا ٤ إِنَّ
ٱلۡأَبۡرَارَ يَشۡرَبُونَ مِن كَأۡسٖ كَانَ مِزَاجُهَا كَافُورًا ٥

32 එහෙත් ඔහු (දූතයාව) බොරුකර (විශ්වාස කර අවනත නොවී) පසු බැස්සේය.
33 පසුව ඔහු (තම ගමනේ උඩඟු වුවෙකු ලෙස) තම පවුලේ අය වෙතට ගියේය.
34 නුඹට විනාශය ළංවිය. එය ළං විය.
35 පසුවද නුඹට විනාශය ළං විය. එය ළං විය.
36 (නීතිරීති හෝ නැතිනම් පරීක්ෂණ හෝ නොමැතිව) නිකරුණේ ඔහු අත් හරිනු ලබයි' යැයි මිනිසා සිතාගෙන සිටීද?
37 ඔහු (ගර්භයේ) යැවූ ශුක්‍ර බිංදුවක් ලෙස නොසිටියේද?
38 පසුව එය ලේකැටියක් බවට වෙනස් වී (ඒ මගින් ඔහුව) මවා ඇති කළේය.
39 තවද ඔහු මගින් ගැහැණු පිරිමි යන ජෝඩු දෙකක් ඇති කළේය.
40 (මේ සියල්ල කළ) එම (දෙවියා) මරණයට පත් වූ අයව පණ ගන්වන්නට ශක්තිය නො ලබන්නේද? (මන්ද මුලින්ම මැවීමට වඩා නැවත ඇති කිරීම ඉතා පහසුය)

## අත් දහ්ර් / අල් ඉන්සාන්

1 මිනිසාට (ඔහුගේ පියා ආදම් අලෙයිහිස් සලාම් තුමා මැවීම ගැන මෙනෙහි කිරීමට) කාල වකවානුවක් නොපැමිණියේය. (ඔහුගේ ශරීරයට ප්‍රාණය ඇතුල් කිරීමට පෙර එය කිරි මැටිව තිබී පියවරෙන් පියවර

عَيْنًا يَشْرَبُ بِهَا عِبَادُ ٱللَّهِ يُفَجِّرُونَهَا تَفْجِيرًا ﴿٦﴾ يُوفُونَ بِٱلنَّذْرِ وَيَخَافُونَ
يَوْمًا كَانَ شَرُّهُۥ مُسْتَطِيرًا ﴿٧﴾ وَيُطْعِمُونَ ٱلطَّعَامَ عَلَىٰ حُبِّهِۦ مِسْكِينًا
وَيَتِيمًا وَأَسِيرًا ﴿٨﴾ إِنَّمَا نُطْعِمُكُمْ لِوَجْهِ ٱللَّهِ لَا نُرِيدُ مِنكُمْ جَزَآءً وَلَا شُكُورًا
﴿٩﴾ إِنَّا نَخَافُ مِن رَّبِّنَا يَوْمًا عَبُوسًا قَمْطَرِيرًا ﴿١٠﴾ فَوَقَىٰهُمُ ٱللَّهُ شَرَّ ذَٰلِكَ
ٱلْيَوْمِ وَلَقَّىٰهُمْ نَضْرَةً وَسُرُورًا ﴿١١﴾ وَجَزَىٰهُم بِمَا صَبَرُوا۟ جَنَّةً وَحَرِيرًا
﴿١٢﴾ مُّتَّكِـِٔينَ فِيهَا عَلَى ٱلْأَرَآئِكِ ۖ لَا يَرَوْنَ فِيهَا شَمْسًا وَلَا زَمْهَرِيرًا ﴿١٣﴾
وَدَانِيَةً عَلَيْهِمْ ظِلَٰلُهَا وَذُلِّلَتْ قُطُوفُهَا تَذْلِيلًا ﴿١٤﴾ وَيُطَافُ عَلَيْهِم بِـَٔانِيَةٍ
مِّن فِضَّةٍ وَأَكْوَابٍ كَانَتْ قَوَارِيرَا۠ ﴿١٥﴾ قَوَارِيرَا۟ مِن فِضَّةٍ قَدَّرُوهَا تَقْدِيرًا ﴿١٦﴾
وَيُسْقَوْنَ فِيهَا كَأْسًا كَانَ مِزَاجُهَا زَنجَبِيلًا ﴿١٧﴾ عَيْنًا فِيهَا تُسَمَّىٰ سَلْسَبِيلًا
﴿١٨﴾ ۞ وَيَطُوفُ عَلَيْهِمْ وِلْدَٰنٌ مُّخَلَّدُونَ إِذَا رَأَيْتَهُمْ حَسِبْتَهُمْ لُؤْلُؤًا مَّنثُورًا
﴿١٩﴾ وَإِذَا رَأَيْتَ ثَمَّ رَأَيْتَ نَعِيمًا وَمُلْكًا كَبِيرًا ﴿٢٠﴾ عَٰلِيَهُمْ ثِيَابُ سُندُسٍ
خُضْرٌ وَإِسْتَبْرَقٌ ۖ وَحُلُّوٓا۟ أَسَاوِرَ مِن فِضَّةٍ وَسَقَىٰهُمْ رَبُّهُمْ شَرَابًا
طَهُورًا ﴿٢١﴾ إِنَّ هَٰذَا كَانَ لَكُمْ جَزَآءً وَكَانَ سَعْيُكُم مَّشْكُورًا ﴿٢٢﴾ إِنَّا
نَحْنُ نَزَّلْنَا عَلَيْكَ ٱلْقُرْءَانَ تَنزِيلًا ﴿٢٣﴾ فَٱصْبِرْ لِحُكْمِ رَبِّكَ وَلَا تُطِعْ
مِنْهُمْ ءَاثِمًا أَوْ كَفُورًا ﴿٢٤﴾ وَٱذْكُرِ ٱسْمَ رَبِّكَ بُكْرَةً وَأَصِيلًا ﴿٢٥﴾

වෙනස් වී මැව්ම් ස්වරූපය සම්පූර්ණ වීමට වසර හතලිහක් ගත වූ බව සමහර විවරණ වියතුන් ගේ මතයයි) ඔහු (එම කාලය තුළ) සිහිපත් කිරීමට නොවටිනා දෙයක් විය. (ලෝකය මවනු ලැබ බොහෝ කාලයක් ඉකුත් වූ පසුව ආදම් අලෙයිහිස් සලාම් තුමා මවනු ලැබිය. මෙම වැකියෙන් දෙවියන් ප්‍රකාශ කරන්නේ එම පුවත බව තවත් සමහරෙකුගේ මතයයි.)

(2) නියත වශයෙන්ම (ආදම්ගේ පෙළපත වන) මිනිසුන්ව (ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ ම) මිශ්‍ර වූ ශුක්‍රාණු වලින් අපි මැව්වෙමු. (හොඳ නරක නීතිරීති ආදිය ඒ) අපි ඔවුන්ව පරීක්ෂා කිරීම සඳහා (මැව්වෙමු) තවද අපි (ඔවුනට ඉන්ද්‍රියයන් ලබා දී) ඇසිය හැකි අය ලෙසද බැලිය හැකි අය ලෙසද මැව්වෙමු.

(3) ඔහු කෘතවේදී වුවද කෘතවේදී නොවුවද අපි ඔහුට මාර්ගය පෙන්වා දී ඇත්තෙමු. (අපි ඔහුට ඍජු මග මංමුළාව, යහපත් දෑ අයහපත් දෑ ආදිය පැහැදිලි කළෙමු)

(4) නියත වශයෙන්ම අපි ප්‍රතික්ෂේප කරන්නන්ට (ඔවුන්ට දඬුවම් කිරීම සඳහා) දම්වැල්ද (දෑත් බෙල්ලට තබා විලංගු දැම්මට) විලංගුද (තදින් ඇවිලෙන) ගින්නද සූදානම් කර ඇත්තෙමු.

(5) නියත වශයෙන්ම යහපත් අය කපුරු දමා මිශ්‍ර කරන භාජනයෙන් පානය කරති.

(6) එසේ මිශ්‍ර කරන ලද්දේ උල්පතකි. එයින් අල්ලාහ්ගේ ගැත්තෝ පානය කරති. (ඔයේ ජලය ඔවුන් ඇලවල් කපා ගලා යාමට සලස්වන්නාසේ) එය ගලා යාමට සලස්වති. (මෙම මිශ්‍රනය ඔවුහු ස්වර්ගයේ මත්පැන් සමග මිශ්‍රකර පානය කරති)

(7) (ඔවුනට මෙම ප්‍රතිවිපාක පිරිනමන ලදී. මන්ද) ඔවුහු තම භාරයන් (භාර වීමෙන් අනිවාර්ය කරගත් සලාතය, නෝම්බිය ආදිය) ඉටු කරති. තවද ඔවුහු එහි උවදුර විසිරී පැතිරී ඇති දිනයක් ගැන ද (විනිශ්චය දිනය) බියවෙති. (එහි උවදුර අහස පොළොව පුරා පිරී පවති. අහස පැළී යන්නේ එනිසාය. තාරකා හැලෙන්නේය. පොළොව සෙලවෙන්නේය. කඳු තලා කුඩු කෙරෙන්නේය)

(8) තවද ඔවුහු ආහාරය ගැන කැමැත්ත ද (අවශ්‍යතාව ද) තිබියදීත් දුප්පතුන්ට ද අනාතයින්ට ද සිරකරුවන්ටද දෙති.

(9) (ඔවුහු මෙසේ කියති) අපි අල්ලාහ්ගේ තෘප්තිය සඳහාම නුඹලාට ආහාර දෙන්නෙමු. නුඹලාගෙන් ප්‍රති උපකාරය හෝ ස්තුතියක් හෝ අපි බලාපොරොත්තු නොවෙමු. (ඔවුහු ප්‍රතිඋපකාරය හෝ ප්‍රශංසාව හෝ බලාපොරොත්තු නොවී ආහාර දෙති.)

(10) (තවද ඔවුහු මෙසේ කියති) නියත වශයෙන් අපි අපගේ රක්ෂකයාගෙන් (මුහුණු) අප්‍රසන්න (අඳුරුවූ) දුෂ්කර දිනයක් ගැන බිය වෙමු. (එදවසේ භයානක කම නිසා මුහුණු අඳුරුවී ඇස් හා ඇස්බැම් හැකිළී යයි.)

(11) (ලෝකයේ එසේ බියවීම හේතුකොට ගෙන) එ දවසේ උවදුරුවලින් අල්ලාහ් ඔවුන්ව ආරක්ෂා කළේය. තවද (මුහුණු අඳුරුවීම වෙනුවට) ඔවුනට (මුහුණුවල) ප්‍රසන්න භාවය හා (හදවතේ) සතුටද දුන්නේය.

(12) (ලෝකයේදී) ඔවුන් ඉවසිලිවන්තව සිටි හෙයින් ඔවුනට ස්වර්ගය හා පට පිළි ද ඔහු විපාක වශයෙන් පිළිගැන්විය.

(13) එහි ඔවුහු සිංහාසන වල හාන්සි වුවන් ලෙස සිටිති. එහි ඔවුහු උෂ්ණය හෝ තද සීතලය හෝ නොදකිති.

(14) තවද එහි සෙවනැලි (ඔවුනට) සමීපව ඇත්තේය. තවද එහි කැඩිය යුතු (පලතුරු) ඔවුනට පහත් කර දෙනු ඇත. (එය සිටගෙනද වාඩිවීද හාන්සිවීද පහසුවෙන් කඩාගත හැක. දුරස්ථ බව හෝ කටු හෝ ඒවා කඩා ගැනීමට බාධකයක් නොවේ.)

(15) තවද ඔවුනට රිදී භාජන හා කෝප්ප ද පිළිගන් වනු ඇත. (සේවකයෝ මේවා පිළිගන්වති.)

(16) රිදීයෙන් නිමාවූ ගුරුලේත්තුද (ඔවුනට පිරිනැමේ. ඔවුන්ගේ අවශ්‍යතාව අනුව) එය ප්‍රමාණවත් කර ගනිති. (ඔවුන්ගේ පිපාසයට වඩා වැඩිවන්නේ හෝ අඩුවන්නේ හෝ නැත.)

(17) එහි ඔවුනට (මත්පැන්) භාජන පොවනු ලැබේ. එහි මිශ්‍ර කරන ද්‍රව්‍යය අමු ඉඟුරුය.

(18) සන්ජබීල් යනුවෙන් හඳුන්වන උල්පතින් ඔවුනට පොවනු ලැබේ. (සන්ජබීල් යනු පහසුවෙන්ද වේගයෙන්ද දිවිය හැක යැයි තේරුමක් ඇත.)

(19) (ළමා වියද අලංකාරය) සදා වෙනස් නොවන ළමයින් ඔවුන් වටා සැරි සරති. (ඔවුන් වියපත් වන්නේ හෝ මරණයට පත් වන්නේ හෝ නොමැත) නුඹලා ඔවුන්ව දකින්නෙහු නම් ඉහිරවන ලද මුතුයැයි සිතන්නෙහුය. (ඔවුන්ගේ අලංකාරත්වය ද ආකර්ෂණය ද පැහැදිලි පැහැය ද මුතුවලට සමානය)

(20) නුඹලා එහි (ස්වර්ගයේ සිටින අයව අවධානයෙන් යුතුව) බලන්නෙහු නම් (කිව නොහැකි) සතුටක් ද මහා රාජ්‍ය පාලනයක් ද දකින්නෙහුය)

وَمِنَ ٱلَّيۡلِ فَٱسۡجُدۡ لَهُۥ وَسَبِّحۡهُ لَيۡلًا طَوِيلًا ﴿٢٦﴾ إِنَّ
هَٰٓؤُلَآءِ يُحِبُّونَ ٱلۡعَاجِلَةَ وَيَذَرُونَ وَرَآءَهُمۡ يَوۡمًا ثَقِيلًا ﴿٢٧﴾ نَّحۡنُ
خَلَقۡنَٰهُمۡ وَشَدَدۡنَآ أَسۡرَهُمۡۖ وَإِذَا شِئۡنَا بَدَّلۡنَآ أَمۡثَٰلَهُمۡ تَبۡدِيلًا
﴿٢٨﴾ إِنَّ هَٰذِهِۦ تَذۡكِرَةٞۖ فَمَن شَآءَ ٱتَّخَذَ إِلَىٰ رَبِّهِۦ سَبِيلًا ﴿٢٩﴾
وَمَا تَشَآءُونَ إِلَّآ أَن يَشَآءَ ٱللَّهُۚ إِنَّ ٱللَّهَ كَانَ عَلِيمًا حَكِيمًا ﴿٣٠﴾
يُدۡخِلُ مَن يَشَآءُ فِي رَحۡمَتِهِۦۚ وَٱلظَّٰلِمِينَ أَعَدَّ لَهُمۡ عَذَابًا أَلِيمَۢا ﴿٣١﴾

## سُورَةُ المُرۡسَلَاتِ

ترتيبها ٧٧ — آياتها ٥٠

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

وَٱلۡمُرۡسَلَٰتِ عُرۡفٗا ﴿١﴾ فَٱلۡعَٰصِفَٰتِ عَصۡفٗا ﴿٢﴾ وَٱلنَّٰشِرَٰتِ نَشۡرٗا ﴿٣﴾
فَٱلۡفَٰرِقَٰتِ فَرۡقٗا ﴿٤﴾ فَٱلۡمُلۡقِيَٰتِ ذِكۡرًا ﴿٥﴾ عُذۡرًا أَوۡ نُذۡرًا ﴿٦﴾ إِنَّمَا
تُوعَدُونَ لَوَٰقِعٞ ﴿٧﴾ فَإِذَا ٱلنُّجُومُ طُمِسَتۡ ﴿٨﴾ وَإِذَا ٱلسَّمَآءُ فُرِجَتۡ
﴿٩﴾ وَإِذَا ٱلۡجِبَالُ نُسِفَتۡ ﴿١٠﴾ وَإِذَا ٱلرُّسُلُ أُقِّتَتۡ ﴿١١﴾ لِأَيِّ يَوۡمٍ أُجِّلَتۡ
﴿١٢﴾ لِيَوۡمِ ٱلۡفَصۡلِ ﴿١٣﴾ وَمَآ أَدۡرَىٰكَ مَا يَوۡمُ ٱلۡفَصۡلِ ﴿١٤﴾ وَيۡلٞ يَوۡمَئِذٖ
لِّلۡمُكَذِّبِينَ ﴿١٥﴾ أَلَمۡ نُهۡلِكِ ٱلۡأَوَّلِينَ ﴿١٦﴾ ثُمَّ نُتۡبِعُهُمُ ٱلۡأٓخِرِينَ
﴿١٧﴾ كَذَٰلِكَ نَفۡعَلُ بِٱلۡمُجۡرِمِينَ ﴿١٨﴾ وَيۡلٞ يَوۡمَئِذٖ لِّلۡمُكَذِّبِينَ ﴿١٩﴾

21 ඔවුහු ශරීරය කොළ පැහැති ඝන පටපිළි ද සිනිඳු පටපිළි ද (වසාගෙන ඇත.) තවද ඔවුනට රිදීයෙන් නිමාවූ වළලු පළඳවනු ඇත. (සූරා ෆාතිර් හි රන් වළලු පළඳවන බව සඳහන් කරයි. එහෙයින් ඔවුහු මනාප පරිදි දෙකින් එකක් තෝරා ගත හැකි බව මෙහි අරුත වන්නේය.) තවද ඔවුන්ගේ රක්ෂකයා ඔවුනට පිරිසිදු පානය පොවයි. (අබූ කිලාබා, ඉබ්රාහිම් අන්-නකර් යන අය මෙසේ සඳහන් කරයි. ඔවුනට ආහාර පිළිගැන්වෙයි. එය අවසානයේ පිරිසිදු පාන පිළිගැන්වෙයි. එය පානය කළ විට ඔවුන්ගේ උදර සිහින් වෙයි. ඔවුන්ගේ ශරීරයෙන් කස්තූරි වැනි සුගඳක් නික්වෙමින් පවතී.)

22 නියත වශයෙන් මෙය නුඹලාට විපාක වශයෙන් වන්නේය. තවද නුඹලාගේ උත්සාහය කෘතවේදී ලෙස ද ඇත.

23 නියත වශයෙන්ම අපි(ම) කුර්ආනය (කොටස් වශයෙන්) පහළ කළෙමු. (ආදේශ කරන්නන් පවසන්නාක් මෙන් නුඹ මෙය නිර්මාණය කළේ නැත).

24 එබැවින් ඔබේ රක්ෂකයාගේ තීන්දුව ගැන නුඹලා ඉවසහි. ඔවුනතර පව් කාරයින්ට හෝ අධිකව ප්‍රතික්ෂේප කරන්නන්ට හෝ නුඹ යටත් නොවහි.

25 නුඹ නුඹගේ දෙවියන්ගේ නාමය උදේ සවස මෙනෙහි කරහි.

26 තවද රාත්‍රියෙහි එක් කොටසක ඔහුට නුඹ සුජූද් කරහි. තවද ඔහුව රාත්‍රියෙහි දීර්ඝ කාලයක් තස්බීහ් කරහි.

27 නියත වශයෙන් මොවුහු (ප්‍රතිකෙෂ්ප කරන්නන්) මෙලොව ප්‍රිය කරති. ඔවුනට පසුව බරින් යුත් දිනයක් අත් හරිති (එදවසට සූදානම් නොවෙති).

28 අපි ඔවුන්ව මවා (නහර හා පේශි ආදිය මගින්) ඔවුන්ගේ හැඩරුව ශක්තිමත් කළෙමු. අපි මනාප වුවහොත් (මොවුන්ව විනාශ කර මොවුන් වෙනුවට මොවුන්ට වඩා ඉතා අවනත වී කටයුතු කරන) මොවුන් වැනි අයව ගෙන එන්නෙමු.

29 නියත වශයෙන් මේවා උපදෙස්ය. කවරෙක් මනාප වන්නේද ඔහු (මේවා මගින්) තම දෙවියාගේ මාර්ගය තෝරා ගන්නේය.

30 එනමුත් අල්ලාහ් අභිමත කරන්නේ නම් මිස නුඹලා අභිමත නොකරන්නේය. නිශ්චිත වශයෙන්ම අල්ලාහ් ඥානවන්තයෙකුව හා ප්‍රඥාවන්තයෙකුව සිටියි.

31 ඔහු අභිමත කළ අය තමාගේ දායාදයන් තුළ ඔහු ඇතුළු කරවන්නේය. තවද අපරාධකරුවන්ට ඔහු වේදනාකාරී දඬුවම සූදානම් කර ඇත.

# අල් මුර්සලාත්

1 (ආගමේ යහපත් ඒවායැයි) දැනගත් දෑ අනුව එවනු ලැබූ (මලක්වරු) න් මත දිවුරා කියමි.

2 (අල්ලාහ්ගේ අණ කරා) වේගයෙන් හමන සුළඟමෙන් හඹා එන මලක්වරුන් මත දිවුරා කියමි.

3 (වැහි වලාකුළු) විසුරුවාලන (සුළං) මත දිවුරා කියමි.

4 (සත්‍යය හා අසත්‍යය) වෙන්කර පෙන්වන (දේව වැකි මත) දිවුරා කියමි.

5 වහී (දූතයින්ට) ගෙන දෙන (මලක්වරුන්) මත දිවුරා කියමි.

6 (අනුගාමිකයින්ට) ක්ෂමාව සලසා දෙන නැතිනම් (ඔවුනට) අවවාද කරන තත්ත්වයෙන් (එම මලක්වරු වහී දූතයින්ට පිළිගන්වති).

7 (ඉහත සඳහන් කරුණු මත දිවුරා ප්‍රකාශ කරයි.) නියත වශයෙන්ම නුඹලාට පෙරොන්දු වන ඒවා (විනිශ්චය දිනයේ විභාගය, විපාකදී ආදිය) සිදුවන ඒවාය.

8 තාරකාවන්ගේ දීප්තිය අඳුරු කරනු ලබන්නේ නම්

9 තවද අහස් පලා විවෘත කරනු ලබන්නේ නම්

10 තවද කඳු සුනු විසුනු කරනු ලබන්නේ නම්

11 තවද දේව දූතයින්ට (සත්‍ය හා අසත්‍යය වෙන් කර පෙන්වීම සඳහා වේලාව නියම කරනු ලබයි නම් (විනිශ්වය දිනය ඇති වන්නේය)

12 මෙම සිදුවීම් කුමන දිනයක් සඳහා ප්‍රමාද කරනු ලබන්නේද? (එම දවසේ, භයානක දෑ ද, කල කෝලාහලද බහුලව පෙනෙන්නට ඇති නිසා එම දවස දැක ගැත්තෝ විස්මයට පත් වෙති. සෑම දේව දූතයෙක්ම තම අනුගාමිකයින්ට සාක්ෂි දීම සඳහා ඔවුනට මෙම දිනය ප්‍රදානය කර ඇත.)

13 (සත්‍යය හා අසත්‍යය) වෙන් කරනු ලබන දිනයක් සඳහා (මේ සියල්ල ප්‍රමාද කර ඇත) එදවසේ ස්වර්ගවාසීන් හා නිරයේ වැසියෝද වෙන් කරනු ලබති)

14 (මෙසේ) වෙන්කර පෙන්වන දිනය කුමක්දැයි නුඹට පෙන්වා දුන්නේ කුමක්ද? (එය භයානක සිදුවීමකි. එය කිසිවෙකුට තක්සේරු කළ නොහැක)

15 (දේව දූතයින්වද අපගේ වාක්‍ය ද) බොරු කළවුන්ට එදවසේ විපතක්ම වන්නේය.

16 (මෙසේ බොරු කළ) පුරාතනයින්ට (මේ ලොකයේ දීම දඬුවම් ලබා දී) අපි විනාශ නොකළෙමු ද?

أَلَمْ نَخْلُقكُّم مِّن مَّآءٍ مَّهِينٍ ﴿٢٠﴾ فَجَعَلْنَٰهُ فِى قَرَارٍ مَّكِينٍ ﴿٢١﴾ إِلَىٰ قَدَرٍ
مَّعْلُومٍ ﴿٢٢﴾ فَقَدَرْنَا فَنِعْمَ ٱلْقَٰدِرُونَ ﴿٢٣﴾ وَيْلٌ يَوْمَئِذٍ لِّلْمُكَذِّبِينَ ﴿٢٤﴾
أَلَمْ نَجْعَلِ ٱلْأَرْضَ كِفَاتًا ﴿٢٥﴾ أَحْيَآءً وَأَمْوَٰتًا ﴿٢٦﴾ وَجَعَلْنَا فِيهَا رَوَٰسِىَ
شَٰمِخَٰتٍ وَأَسْقَيْنَٰكُم مَّآءً فُرَاتًا ﴿٢٧﴾ وَيْلٌ يَوْمَئِذٍ لِّلْمُكَذِّبِينَ ﴿٢٨﴾
ٱنطَلِقُوٓا۟ إِلَىٰ مَا كُنتُم بِهِۦ تُكَذِّبُونَ ﴿٢٩﴾ ٱنطَلِقُوٓا۟ إِلَىٰ ظِلٍّ ذِى ثَلَٰثِ
شُعَبٍ ﴿٣٠﴾ لَّا ظَلِيلٍ وَلَا يُغْنِى مِنَ ٱللَّهَبِ ﴿٣١﴾ إِنَّهَا تَرْمِى بِشَرَرٍ
كَٱلْقَصْرِ ﴿٣٢﴾ كَأَنَّهُۥ جِمَٰلَتٌ صُفْرٌ ﴿٣٣﴾ وَيْلٌ يَوْمَئِذٍ لِّلْمُكَذِّبِينَ ﴿٣٤﴾
هَٰذَا يَوْمُ لَا يَنطِقُونَ ﴿٣٥﴾ وَلَا يُؤْذَنُ لَهُمْ فَيَعْتَذِرُونَ ﴿٣٦﴾ وَيْلٌ يَوْمَئِذٍ
لِّلْمُكَذِّبِينَ ﴿٣٧﴾ هَٰذَا يَوْمُ ٱلْفَصْلِ جَمَعْنَٰكُمْ وَٱلْأَوَّلِينَ ﴿٣٨﴾ فَإِن كَانَ
لَكُمْ كَيْدٌ فَكِيدُونِ ﴿٣٩﴾ وَيْلٌ يَوْمَئِذٍ لِّلْمُكَذِّبِينَ ﴿٤٠﴾ إِنَّ ٱلْمُتَّقِينَ فِى
ظِلَٰلٍ وَعُيُونٍ ﴿٤١﴾ وَفَوَٰكِهَ مِمَّا يَشْتَهُونَ ﴿٤٢﴾ كُلُوا۟ وَٱشْرَبُوا۟ هَنِيٓـًٔۢا
بِمَا كُنتُمْ تَعْمَلُونَ ﴿٤٣﴾ إِنَّا كَذَٰلِكَ نَجْزِى ٱلْمُحْسِنِينَ ﴿٤٤﴾ وَيْلٌ يَوْمَئِذٍ
لِّلْمُكَذِّبِينَ ﴿٤٥﴾ كُلُوا۟ وَتَمَتَّعُوا۟ قَلِيلًا إِنَّكُم مُّجْرِمُونَ ﴿٤٦﴾ وَيْلٌ يَوْمَئِذٍ
لِّلْمُكَذِّبِينَ ﴿٤٧﴾ وَإِذَا قِيلَ لَهُمُ ٱرْكَعُوا۟ لَا يَرْكَعُونَ ﴿٤٨﴾ وَيْلٌ
يَوْمَئِذٍ لِّلْمُكَذِّبِينَ ﴿٤٩﴾ فَبِأَىِّ حَدِيثٍۭ بَعْدَهُۥ يُؤْمِنُونَ ﴿٥٠﴾

(17) ඔවුනට (විනාශ කරනු ලැබූවන්ට) පසුව අවසානයේ පැමිණි අයව (මක්කමේ ප්‍රතික්ෂේප කළවුන්ව) සම්බන්ධ නොකළෙමු ද? (මක්කාහ්වේ ප්‍රතික්ෂේප කළවුන් ඔවුන්ගේ අඩිපාරේ විත් ඔවුහු ද බොරු කළහ.)
(18) වරද කරුවන්ට අප කරන්නේ එසේය.
(19) (දේව දූතයින්වද අපේ වාක්‍යයද) බොරු කළවුන්ට එදවසේ විපතක්මය.
(20) අප පිළිකුල් වූ ද්‍රව්‍යයකින් නුඹලාව නොමැව්වෙමු ද?
(21) (22) පසුව අප දන්නා දිනයක් දක්වා (මාස නවයක් සම්පූර්ණ වන තෙක්) ආරක්ෂා සහිත ස්ථානයක (ගර්භාෂයේ) නොතැබුමු ද?
(23) පසුව අපි (ඔහුගේ අවයව හා ස්වභාවික ගුණයන් ද) නිර්ණය කළෙමු. (අප) නිර්ණය කරන්නන්ගෙන් ශ්‍රේෂ්ඨයින්ය.
(24) (දේව දූතයින්වද අපගේ වාක්‍යයන්ද) බොරුකළවුන්ට එදවසේ විපතක්මය.
(25) පොළොව වැළඳ (ආරක්ෂා කර) ගත හැකි තත්ත්වයට පත් නොකළෙමු ද?
(26) (නුඹලා) ජීවත්ව සිටිය දී භූමිය (එහි මතුපිටද) මරණයට පත්වූ විට (එහි අභ්‍යන්තරයේද නුඹලාව වැළඳගෙන ආරක්ෂා කළ හැකි ලෙස ඇති නොකළෙමු ද?)
(27) අපි එහි උස් කඳු ඇති කර නුඹලාට ප්‍රණීත ජලය ද නොපෙව්වෙමු ද? (මේ සියල්ල නුඹලාගේ පරලොව නැගිටවීමට වඩා පුදුම දේවල්ය)
(28) (දේව දූතයින්වද අපගේ වාක්‍යයන් ද) බොරු කරන්නන්ට එදවසේ විපතක්මය.
(29) (ඔවුන්ව බලා එදවසේ මෙසේ කියැවෙයි) නුඹලා (කුමන දඬුවමක්) බොරු කළෙහුද ඒ කරා නුඹලා යහු.
(30) (උසට ගොස්) අතු තුනකට බෙදී යන (ගින්නේ) සෙවණේ (දුම යටින්) ගමන් කරහු.
(31) (එය ඔවුනට ලෝකයේ සෙවණැල්ල මෙන් උෂ්ණත්වයෙන්) සෙවණ ලබා දෙන්නේය. නිරයේ ගින්නේ උෂ්ණයෙන් එය ආරක්ෂා කරන්නේද නැත.
(32) නියත වශයෙන් එය මාලිගාවල් සේ (අති විශාල වූ) ගිනිපුපුරු විසි කරමින් ඇත.
(33) නියත වශයෙන්ම එය කහ පැහැති ඔටුවන් මෙන්ය.
(34) (දේව දූතයින්වද අපගේ වාක්‍යයන් ද) බොරු කළවුන්ට එදවසේ විපතක්මය.
(35) ඔවුන් කිසිවෙකු කථා නොකරන දිනයකි.
(36) ඔවුනට (කථා කිරීමට) අනුමැතිය නොලැබේ. (එසේ ලැබුණොත්) ඔවුහු (බේරීමට ) හේතු කීමට පටන් ගන්නහුය.
(37) (දේව දූතයින්වද අපගේ වාක්‍යයන් ද) බොරු කළවුන් එදවසේ විපතක්මය.
(38) මෙය (ජනතාව අතරේ) විනිශ්චය දෙන දිනයකි. (එදවසේ සත්‍යයද අසත්‍යයද පැහැදිළි වන්නේය) අපි (මක්කමේ ප්‍රතික්ෂේප කරන්නන් වූ) නුඹලාවද (පෙර සමාජවල ප්‍රතික්ෂේප කළවුන් වන) පුරාතනයේ අයවද එකට එක් කළෙමු.
(39) (මගේ දඬුවමෙන් බේරීමට) නුඹලා ළඟ කුමක් හෝ කුමන්ත්‍රණ ඇත්නම් ඒ කුමන්ත්‍රණය මට කරහු.
(40) (දේව දූතයින්ව ද අපගේ වාක්‍යයන් ද) බොරු කළවුන්ට එදවසේ විපතක්මය.
(41) නියත වශයෙන්ම බිය බැතිමත් අය (ස්වර්ගයේ) සෙවණැලිවලද උල්පත්වල ද සිටිති.
(42) ඔවුනට මනාප පලතුරුවල ද (රස විඳිමින් සිටිති).
(43) (ඔවුන් දෙස බලා මෙසේ කියවෙයි) නුඹලා කළ දෑ (යහක්‍රියා) හේතුකොටගෙන සතුටින් අනුභව කරහු. තවද පානය කරහු.
(44) නියත වශයෙන්ම යහක්‍රියා කළවුන්ට අපි ඒ අන්දමින් විපාක දෙන්නෙමු.
(45) (දේව දූතයින්ව ද අපගේ වාක්‍යයන් ද) බොරු කළවුන්ට එදවසේ විපතක්මය.
(46) (ලෝකයේ පව් කාරයින් බලා මෙසේ කියැවෙයි) නුඹලා ටික කලක් භුක්ති වින්ද සතුට අත් විඳිහු. නියත වශයෙන්ම නුඹලා වරදකරුවන්ය (අල්ලාහ්ට ආදේශ කළවුන්ය.)
(47) (දේව දූතයින්ව හා අපගේ වාක්‍යයන්) බොරු කළවුනට එදවසේ විපතක්මය.
(48) ඔවුනට නුඹලා රුකූඋ කර(අල්ලාහ්ට සලාතය ඉටු කර)හු'මයි අණ කරනු ලැබුවොත් ඔවුහු රුකූඋ (සලාතය ඉටු) නොකරති.
(49) (දේව දූතයින්වද අපගේ වාක්‍යයන්ද) බොරු කළවුනට එදවසේ විපතක්මය.
(50) කුර්ආනයට පසුව ඔවුහු වෙන කුමන වචනයක් ගැන විශ්වාස කරන්නෙහුද?

# අන්-නබඋ

سُورَةُ ٱلنَّبَإِ
ترتيبها ٧٨ — آياتها ٤٠

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

عَمَّ يَتَسَآءَلُونَ ﴿١﴾ عَنِ ٱلنَّبَإِ ٱلْعَظِيمِ ﴿٢﴾ ٱلَّذِى هُمْ فِيهِ مُخْتَلِفُونَ ﴿٣﴾
كَلَّا سَيَعْلَمُونَ ﴿٤﴾ ثُمَّ كَلَّا سَيَعْلَمُونَ ﴿٥﴾ أَلَمْ نَجْعَلِ ٱلْأَرْضَ مِهَٰدًا ﴿٦﴾
وَٱلْجِبَالَ أَوْتَادًا ﴿٧﴾ وَخَلَقْنَٰكُمْ أَزْوَٰجًا ﴿٨﴾ وَجَعَلْنَا نَوْمَكُمْ سُبَاتًا
﴿٩﴾ وَجَعَلْنَا ٱلَّيْلَ لِبَاسًا ﴿١٠﴾ وَجَعَلْنَا ٱلنَّهَارَ مَعَاشًا ﴿١١﴾ وَبَنَيْنَا
فَوْقَكُمْ سَبْعًا شِدَادًا ﴿١٢﴾ وَجَعَلْنَا سِرَاجًا وَهَّاجًا ﴿١٣﴾ وَأَنزَلْنَا
مِنَ ٱلْمُعْصِرَٰتِ مَآءً ثَجَّاجًا ﴿١٤﴾ لِّنُخْرِجَ بِهِۦ حَبًّا وَنَبَاتًا ﴿١٥﴾ وَجَنَّٰتٍ
أَلْفَافًا ﴿١٦﴾ إِنَّ يَوْمَ ٱلْفَصْلِ كَانَ مِيقَٰتًا ﴿١٧﴾ يَوْمَ يُنفَخُ فِى ٱلصُّورِ
فَتَأْتُونَ أَفْوَاجًا ﴿١٨﴾ وَفُتِحَتِ ٱلسَّمَآءُ فَكَانَتْ أَبْوَٰبًا ﴿١٩﴾ وَسُيِّرَتِ
ٱلْجِبَالُ فَكَانَتْ سَرَابًا ﴿٢٠﴾ إِنَّ جَهَنَّمَ كَانَتْ مِرْصَادًا ﴿٢١﴾ لِّلطَّٰغِينَ
مَـَٔابًا ﴿٢٢﴾ لَّٰبِثِينَ فِيهَآ أَحْقَابًا ﴿٢٣﴾ لَّا يَذُوقُونَ فِيهَا بَرْدًا وَلَا شَرَابًا
﴿٢٤﴾ إِلَّا حَمِيمًا وَغَسَّاقًا ﴿٢٥﴾ جَزَآءً وِفَاقًا ﴿٢٦﴾ إِنَّهُمْ كَانُوا۟
لَا يَرْجُونَ حِسَابًا ﴿٢٧﴾ وَكَذَّبُوا۟ بِـَٔايَٰتِنَا كِذَّابًا ﴿٢٨﴾ وَكُلَّ شَىْءٍ
أَحْصَيْنَٰهُ كِتَٰبًا ﴿٢٩﴾ فَذُوقُوا۟ فَلَن نَّزِيدَكُمْ إِلَّا عَذَابًا ﴿٣٠﴾

(1) ඔවුන් කුමක් ගැන එකිනෙකා විමසා ගනුයේ ද (නබිතුමන්ව ලෝකයට එවා ඒකීයත්වය හා පරලොව ගැන ජනතාවට දැනුම් දී අල්කුර්ආනයේ වැකි කියවා පෙන්වූ විට ප්‍රතික්ෂේප කරන අය .මුහම්මද්ට කුමක් වීද? ඔහු කුමක් සිදුවීද? ඔහු කුමක් මෙලොවට එවා ඒකීයත්වය හා පරලොව ගැන ප්‍රකාශ කර අල්කුර්ආනය කියවා පෙන්වූ විට එම ජනතාව .මුහම්මද්ට කුමක් සිදුවීද? ඔහු කුමක් ගෙනාවෙහිද? යනාදි ප්‍රශ්න ඔවුනතරේ අසන්නට පටන් ගත්හ. එම අවස්ථාවේ අල්ලාහ් මෙම වැකි පහළ කළේය).

(2) උතුම් වූ පුවතක් ගැන (ප්‍රශ්න කර ගනිති. ඒකීයත්වය හා නබිවරයාව සත්‍ය කිරීම පරලොව විශ්වාස කිරීම ආදි පුවත් දැනුම් දෙන කුර්ආනය ගැන ඔවුහු ප්‍රශ්න කර ගනිති.)

(3) එය කෙසේද යත් ඔවුහු ඒ පිළිබඳව ඔවුනතරේ මත භේද ඇති කර ගෙන සිටිති. (එය හුනියමක් කාව්‍යයක් ශාස්ත්‍ර හා පැරැන්නන්ගේ පුරාණයක් යැයි කුර්ආනය ගැන විවිධ මත ප්‍රකාශ කරති.)

(4) එසේ නොවේ. (එසේ නොකියහු) ඔවුහු (බොරු කිරීමේ විපාකය) දැන ගනිති.

(5) ස්ථිර වශයෙන්ම ඔවුහු (එය දැන ගනිති.)

(6) භූමිය අප ඇතිරිල්ලක් නොකළෙමු ද?

(7) (භූමිය නොපැද්දී නොසෙලවී තිබීම සඳහා) කූඤ්ඤ ලෙස අප කඳු ඇති නොකළෙමුද.

(8) අපි (නුඹලාව ගැහැණු පිරිමි වශයෙන්) ජෝඩු ලෙස මැව්වෙමු.

(9) නුඹලාගේ නින්ද (නුඹලාගේ හදවත් ගිමන් හරින) විවේකයක් වශයෙන් ඇති කළෙමු.

(10) (නුඹලාගේ වස්ත්‍රය නුඹලාව වසා ගන්නා සේ) රාත්‍රිය (නුඹලාව ආවරණය කරන) වස්ත්‍රයක් කළෙමු.

(11) තවද අපි දවාල (ආහාර ද) ජීවත් වීමට අවශ්‍ය දෑ ද සොයාගන්නා වේලාවක් ලෙස ඇති කළෙමු.

(12) අපි නුඹලාට ඉහළින් ශක්තිමත් වූ අහස් හතක් පිළියෙල කර ඇත්තෙමු.

(13) තවද ආලෝකය (හා උෂ්ණත්වය) ලබා දිය හැකි පහනක්ද පිළියෙල කළෙමු.

(14) තවද කළු වලාකුළුවලින් අධිකව ඇද හැළෙන ජලයද පහළ කළෙමු.

(15) (එම ජලයෙන් තිරිඟු වැනි) ධාන්‍යයද (අනෙකුත්) ශාකද මතු කිරීම පිණිස (අපි එය පහළ කළෙමු)

(16) (එහි ගස් එකට ගැවී)ඝන වූ උයන් ඇති කිරීම සඳහා ද (අපි ජලය පහළ කළෙමු)

(17) නියත වශයෙන්ම (ජනතාව අතරේ) විනිශ්චය දෙන දිනය (පුරාතනයේ හා පසුව ආ අය සෑම දෙනෙකුටම පොරොන්දු වී) වේලාව නියම කළ දිනයකි.

(18) (ඉස්රාෆීල් අලෛයිහිස් සලාම් තුමා) නළාවෙන් පිඹිනු ලබන දිනයේ (එය සිදුවෙයි එවිට) නුඹලා කණ්ඩායම් කණ්ඩායම් වශයෙන් පැමිණෙන්නහුය.

(19) තවද අහස් (මලක්වරුන් බැසීම සඳහා) විවෘත වී ඒවා දොරටු සහිත බවට පත් වෙයි.

(20) තවද කඳු (ඒවා පිහිටි ස්ථානවලින්) ඉවත් කර දූවිලි බවට පත් කෙරෙයි.

(21) නියත වශයෙන්ම නිරය බලාපොරොත්තුවෙන් සිටී (එහි අධිපතියෝ එහි වේදනාව ලබා දීමට ප්‍රතික්ෂේප කරන්නන්ව බලාපොරොත්තුවෙන් සිටිති.)

(22) එය ආක්‍රමිකතා කරන්නන් යන තැනකි.

(23) කාලය දික් වී පවතින තාක්කල් (සදාකල්) ඔවුහු එහි රැඳී සිටිති.

(24) එහි සිසිල හෝ වෙනත් පානයක් හෝ රස නො විඳිති.

(25) තදින් පැහෙන ජලය ද (නිරයේ වැසියන්ගේ සිරුරෙන් ගලන) සැරව ද හැර (වෙන කිසිවක් රස නොවිඳිති.)

(26) (අල්ලාහ් ඔවුන්ගේ ක්‍රියාවන්ට) ගැළපෙන විපාක දුන්නේය. (පාපයන්ගෙන් ඉතා විශාල වූ ආදේශ කිරීම ඔවුහු කළහ. අල්ලාහ් ඔවුනට ඉතා විශාල වූ දඬුවම දුන්නේ ය.)

(27) නියත වශයෙන්ම ඔවුහු විභාගය බලාපොරොත්තු නොවුවන් ලෙස සිටියහ. (ඔවුන් විනිශ්චය දිනය ගැන විශ්වාස කළේ නැත. එහෙයින් විපාක ගැන ආශා කළේ ද නැත. විභාගය ගැන බිය වුයේද නැත.

(28) තවද අපේ වැකි බොරු කළහ.

(29) අපි සෑම කරුණක්ම (ලව්හුල් නමැති) ලේඛනයේ ලියාපදිංචි කර ඇත්තෙමු. (නැතිනම් මෙම වැකියේ අදහස ඔවුන් කරන සෑම දෙයක්ම මලක්වරුන්ගේ ලේඛනයේ ලියා ඇත්තෙමු.)

(30) (ඔවුන්ව අමතා මෙසේ කියවෙයි.) නුඹලා අත් විඳිහු. අපි දඬුවම හැර (වෙන කිසිවක්) නුඹලාට අධික නොකරන්නෙමු.

(31) නියත වශයෙන්ම බියබැතිකම ඇති අයට

إِنَّ لِلْمُتَّقِينَ مَفَازًا ﴿٣١﴾ حَدَآئِقَ وَأَعْنَٰبًا ﴿٣٢﴾ وَكَوَاعِبَ أَتْرَابًا ﴿٣٣﴾ وَكَأْسًا
دِهَاقًا ﴿٣٤﴾ لَّا يَسْمَعُونَ فِيهَا لَغْوًا وَلَا كِذَّٰبًا ﴿٣٥﴾ جَزَآءً مِّن رَّبِّكَ عَطَآءً
حِسَابًا ﴿٣٦﴾ رَّبِّ ٱلسَّمَٰوَٰتِ وَٱلْأَرْضِ وَمَا بَيْنَهُمَا ٱلرَّحْمَٰنِ لَا يَمْلِكُونَ
مِنْهُ خِطَابًا ﴿٣٧﴾ يَوْمَ يَقُومُ ٱلرُّوحُ وَٱلْمَلَٰٓئِكَةُ صَفًّا لَّا يَتَكَلَّمُونَ
إِلَّا مَنْ أَذِنَ لَهُ ٱلرَّحْمَٰنُ وَقَالَ صَوَابًا ﴿٣٨﴾ ذَٰلِكَ ٱلْيَوْمُ ٱلْحَقُّ فَمَن
شَآءَ ٱتَّخَذَ إِلَىٰ رَبِّهِۦ مَـَٔابًا ﴿٣٩﴾ إِنَّآ أَنذَرْنَٰكُمْ عَذَابًا قَرِيبًا يَوْمَ
يَنظُرُ ٱلْمَرْءُ مَا قَدَّمَتْ يَدَاهُ وَيَقُولُ ٱلْكَافِرُ يَٰلَيْتَنِى كُنتُ تُرَٰبًۢا ﴿٤٠﴾

ترتيبها ٧٩ — سُورَةُ النَّازِعَاتِ — آياتها ٤٦

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

وَٱلنَّٰزِعَٰتِ غَرْقًا ﴿١﴾ وَٱلنَّٰشِطَٰتِ نَشْطًا ﴿٢﴾ وَٱلسَّٰبِحَٰتِ سَبْحًا
﴿٣﴾ فَٱلسَّٰبِقَٰتِ سَبْقًا ﴿٤﴾ فَٱلْمُدَبِّرَٰتِ أَمْرًا ﴿٥﴾ يَوْمَ تَرْجُفُ ٱلرَّاجِفَةُ
﴿٦﴾ تَتْبَعُهَا ٱلرَّادِفَةُ ﴿٧﴾ قُلُوبٌ يَوْمَئِذٍ وَاجِفَةٌ ﴿٨﴾ أَبْصَٰرُهَا
خَٰشِعَةٌ ﴿٩﴾ يَقُولُونَ أَءِنَّا لَمَرْدُودُونَ فِى ٱلْحَافِرَةِ ﴿١٠﴾ أَءِذَا كُنَّا
عِظَٰمًا نَّخِرَةً ﴿١١﴾ قَالُوا۟ تِلْكَ إِذًا كَرَّةٌ خَاسِرَةٌ ﴿١٢﴾ فَإِنَّمَا هِىَ زَجْرَةٌ
وَٰحِدَةٌ ﴿١٣﴾ فَإِذَا هُم بِٱلسَّاهِرَةِ ﴿١٤﴾ هَلْ أَتَىٰكَ حَدِيثُ مُوسَىٰٓ ﴿١٥﴾

(නිරයෙන් ආරක්ෂාව ලබා ස්වර්ගය ලබා ගැනීම මගින්) ජයග්‍රහණය ඇත.

32 උයන්ද මිදි ද (ඔවුනට) ඇත.

33 තවද ඔවුන්ගේ වයසට ගැලපෙන ඔවුන්ගේ ළැම රවුම්ව ගුලි ගැසුන ස්ත්‍රීන් ද(ඔවුනට ඇත.)

34 (මත්පැන්වලින්) පිරී ඇති කුසලාන ද (ඇත.)

35 එහි ඔවුහු (පාපකාරී) අනවශ්‍ය වදන්වලට හෝ බොරුකිරීම් වලට හෝ සවන් නොදෙති.

36 (මෙය) නුඹලාගේ දෙවියන්ගෙන් පිරිනැමෙන විපාක වෙයි. (ඔවුන්ගේ දෙවියන් පොරොන්දු වූ පරිදි) ඔවුන් ප්‍රමාණවත් යැයි කියන තරමට ඔහුගේ විපාක ඔහු පිරි නමයි.

37 (ඔහු) අහස්හිද පොළොවෙ හිද ඒ දෙක අතර ඇති දෑ හිද දෙවියාය. අධික දයාවන්තය. ඔහු සමග කථා කිරීමට කිසිවෙක් ශක්තිය නොලබති. (ඔහුගේ අනුමැතිය ලද අය කථා කරති. අනුකම්පා බස්ද දොඩති)

38 ජිබ්රීල් (අලෛ) තුමාද අනෙකුත් මලක්වරුන්ද පෙළගැසී සිටින දවසේ කවරෙකුට රහ්මාන් වූ (අල්ලාහ්) අනුමැතිය ලබාදී (ලෝකයේ) සත්‍ය කියමින් සිටියහුද ඔවුන් හැර (වෙන කිසිවෙක්) කථා නොකරති.

39 එය (සත්‍ය වශයෙන්ම සිදුවන) ස්ථිර දිනයකි. කවරෙකු මනාප වෙයිද ඔහු (යහක්‍රියා කර) අල්ලාහ් වෙත යන (රැඳෙන) ස්ථානය තෝරා ගත යුතුය.

40 නියත වශයෙන්ම අපි සමීපයෙන් එන වේදනාවක් ගැන නුඹලාට අවවාද කරන්නෙමු. (ඔහුට සූදානම් කර ඇති දඬුවම දැක) මිනිසා තමා කළ ක්‍රියාවන් දැක ප්‍රතික්ෂේප කරන්නා මා පස් වන්නට නොතිබුණේ දැ? යි කියන දිනයේ (එම වේදනාව සිදුවෙයි.)

## අන්-නාසිආත්

1 (පව්කරයින්ගේ ප්‍රාණ) තදබල අන්දමින් අත්පත් කරගන්නා මලක්වරුන් මත දිවුරා (පවසමි).

2 (යහපත් ගැත්තන්ගේ ප්‍රාණ) සැහැල්ලුවෙන් අත්පත් කරගන්නා මලක්වරුන් මත දිවුරා (කියමි).

3 (අල්ලාහ්ගේ අණ රැගෙන පොළොව කරා) වේගයෙන් බසින මලක්වරුන් මත දිවුරා (කියමි)

4 (අල්ලාහ්ගේ අණ ක්‍රියාත්මක කිරීමෙහි) ඉතා පෙරමුණ ගන්නා මලක්වරුන් මත දිවුරා (කියමි). (යහපත් ගැත්තන්ගේ ප්‍රාණ අත්පත් කරගෙන ස්වර්ගය කරා වේගයෙන් යෑම ද මෙයට අයත් වන්නේය)

5 කරුණු සැලසුම් කරන (මලක්වරුන් මත) දිවුරා (කියමි) (මලක්වරුන් සැලසුම් කිරීම යනු අල්ලාහ්ගේ නීති රීති රැගෙන පොළොවට බැසීමත් පොළොවේ වැස්ස සුළඟ ආදිය අල්ලාහ්ගේ අනුමැතිය අනුව ක්‍රියාත්මක කිරීමත්ය.)

6 පොළොව සෙලවිය හැකි දෑ සොලවන දිනයේ (එය පළමු 'සූර්' පිඹින දිනයයි. එහි පිඹිනු ලැබූ විට පොළොව සෙලවී එහි මත ඇති සියල්ල විනාශ වී යයි.

7 ඊළඟට අනෙකුත් සිදුවීම් ද ඒ සමගම පැමිණෙයි. (පසුව සියල්ලෝම නැගිට්ටවනු ලබති.)

8 (විනිශ්චය දිනයේ භයානකකම් ඇසෙන් දුටු නිසා) සමහර හදවත් එදවසේ බියවෙමින් සිටී.

9 ඔවුන්ගේ බැල්ම (භය හේතුකොට ගෙන) බිමට නැඹුරු වී තිබේ. (දෙවියන් ප්‍රතික්ෂේප කරමින් මියගියවුන්ව මෙසේ දැකිය හැක.)

10 (අප මළ පසු) අපි (අපේ මුල් තත්වයෙන්) නැගිටවනු ලබන්නෙමුදැ?යි (විනිශ්චය දිනය ප්‍රතික්ෂේප කරන) ඔවුහු අසති.

11 අප දිරාපත් වූ ඇටකටු බවට පත් වූ පසුත් (නැගිටවනු ලබන්නෙමුදැ'යි අසති.)

12 එසේ නම් එය (අපට ශෝකයද) පසුතැවිල්ලද ඇති කරන නැගිටුවීමක් බවට එය වන්නේ යැයිද ඔවුහු අසති.

13 එය (නැගිටුවන එම සූර් පිඹීම) එකම එක ශබ්දයක් පමණි.

14 ඒ සමගම ඔවුහු (නැගිටුවනු ලැබ) පොළොවේ මතුපිට පෙනී සිටිති.

15 නියත වශයෙන්ම මූසා (අලෛ) ගේ පණිවිඩය නුඹලා වෙත පැමිණියේය.

16 (සෙනා කඳු පාමුල ඇති) තුවා නැමැති ශුද්ධ වූ තැනිතලාවේ ඔහුගේ (මූසාගේ) දෙවියා ඔහුව කැඳ වූ අවස්ථාව සිහිකරනු.

17 (අල්ලාහ් ඔහුව බලා මෙසේ කිය) නුඹ ෆිර්අවුන් වෙත යහි. ඔහු (අක්‍රමිකතා කිරීමෙහි) සීමාව ඉක්මවා ගියේය.

18 නුඹ (ඔහුගෙන්) අසහි. නුඹව (ආදේශ කිරීම වැනි මහා පාපයන්ගෙන්) පිරිසිදු වීමට උනන්දුවක් ඇත්ද?

19 තවද නුඹේ දෙවියන් කරා නුඹට මා මග පෙන්වීම කෙරෙහි ද (උනන්දුවක් තිබේද)

20 පසුව ඔහුට අති මහත් වූ සාධක ඔහු

පෙන්විය. (එය ඔහුගේ අත හෝ හැර මිටිය)
21 ඔහු (මූසාව හා ඔහු කී දෑ ද) බොරු කර වෙනස්කම් කළේය.
22 පසුව ඔහු (විශ්වාස කිරීමෙන්) පසුබට වී අක්‍රමිකතා කිරීමෙහි උත්සාහ දැරීය.
23 ඔහු (ඔහුගේ හූනියම් කරුවන් හෝ ජනතාව) ඒකරාශි කර ඔහු කැඳවීය.
24 ඔහු 'නුඹලාගේ උතුම් දෙවියා මමයැ'යි කීය.
25 අල්ලාහ් ඔහුව පරලොව දඬුවම සඳහා ද (නිරය) මෙලොව දඬුවම සඳහා ද (ගිල්වීම) ග්‍රහණය කර ගත්තේය.
26 නියත වශයෙන්ම එහි (ෆිර්අවුන්ව විනාශ කළ ඉතිහාසය තුළ අල්ලාහ්ව) බිය වන්නන්ට පාඩම් ඇත.
27 මැවීමට දුෂ්කර නුඹලා ද නැතිනම් අහස් ද? (මරණයට පසුව නැවතත් නුඹලාව මැවීම දුෂ්කරද? නැතිනම් පුදුමාකාර දෑ වලින් පිරුණ අති දැවැන්ත වූ අහස මැවීම දුෂ්කර ද?) ඔහු එය මැව්වේය.
28 (පොළොවට) වහලක් සේ ඔහු එය ඔසවා (එහි අඩුපාඩු කිසිවක් නොමැතිව) එය අලංකාරව මැවීය.
29 තවද එහි රාත්‍රිය අන්ධකාරයක් කර (දවාල) එහි දීප්තිය (සූර්යයා මගින්) පිට කළේය.
30 ඉන්පසු (අහස සකස් කළ පසු) පොළොව ඔහු විශාල කළේය.
31 (ඔයවල් හා උල්පත් මගින්) එහි ජලයත් (සතුන් ආහාරයට ගන්නා)එහි ශාකද මතු කළේය.
32 තවද කඳු (පොළොවට) කුඤ්ඤ ලෙස සවිකර ශක්තිමත් කළේය.
33 නුඹලා ද නුඹලාගේ සිව්පා සතුන්ද ප්‍රයෝජන ගැනීම සඳහා (පොළොවෙහි අල්ලාහ් ඒවා ඇති කළේය)
34 (වෙනවර නළාව පිඹීම සිදුවී) ඉතා විශාල පරීක්ෂණයක් විත් ස්වර්ග වැසියන් ස්වර්ගටයද නිරයේ වැසියන් නිරයට ද භාර දෙන වෙලාවේ
35 සෑම මිනිසෙකුම ඔහු කළ දෑ මතක් කරන දවසේ
36 තවද (එය) බැලිය යුත්තන් කා හටත් (නොසැඟවී) නිරය හෙළිකරන දවසයි.
37 (දෙවියන් ප්‍රතික්ෂේප කිරීමෙහිද, පාපයන්හිද) සීමාව ඉක්මවා ගොස්
38 (පරලොවට වඩා) මෙලොව තෝරාගත් අය
39 ඔවුන් යන තැන නිරයයි.
40 (විනිශ්චය දිනයේ තම රක්ෂකයා ඉදිරියේ සිට ගැනීමට සිදුවේ යැයි බිය වී සිතේ ආශාවන්ට (වහල් වී පාපයන් නොකර) තමාව වළක්වා ගත් අය.
41 ඔවුන් යන තැන ස්වර්ගයයි.
42 ඔවුහු නුඹෙන් විනිශ්චය දිනය ගැන එය කවදා පැමිණේදැ'යි ප්‍රශ්න කරති.
43 (නබිවරයාණනි,) ඒ පිළිබඳ දැනුමෙහි නුඹ කුමක සිටින්නෙහිද? (ඒ පිළිබඳව කිසිම දැනුමක්වත් නුඹට නැත)
44 (එය කවදා සිදුවේ වි ද යන්න පිළිබඳව) අවසන් දැනුම නුඹේ දෙවියන් සතුවම ඇත. (එය අන් කිසිවක් නොදනී).
45 නුඹ එයට බිය වන අයට අවවාද කරන්නෙකු පමණය.
46 ඔවුහු එය (තම ඇස්වලින් දැකිය හැකි දිනයේ සොහොනේ) සවස් ජාමයක් හෝ නැතිනම් උදේ ජාමයක් හෝ රැඳී සිටියා සේ (හඟිති.)

إِذْ نَادَىٰهُ رَبُّهُۥ بِٱلْوَادِ ٱلْمُقَدَّسِ طُوًى ﴿١٦﴾ ٱذْهَبْ إِلَىٰ فِرْعَوْنَ إِنَّهُۥ طَغَىٰ ﴿١٧﴾
فَقُلْ هَل لَّكَ إِلَىٰٓ أَن تَزَكَّىٰ ﴿١٨﴾ وَأَهْدِيَكَ إِلَىٰ رَبِّكَ فَتَخْشَىٰ ﴿١٩﴾ فَأَرَىٰهُ
ٱلْـَٔايَةَ ٱلْكُبْرَىٰ ﴿٢٠﴾ فَكَذَّبَ وَعَصَىٰ ﴿٢١﴾ ثُمَّ أَدْبَرَ يَسْعَىٰ ﴿٢٢﴾ فَحَشَرَ
فَنَادَىٰ ﴿٢٣﴾ فَقَالَ أَنَا۠ رَبُّكُمُ ٱلْأَعْلَىٰ ﴿٢٤﴾ فَأَخَذَهُ ٱللَّهُ نَكَالَ ٱلْـَٔاخِرَةِ وَٱلْأُولَىٰٓ
﴿٢٥﴾ إِنَّ فِى ذَٰلِكَ لَعِبْرَةً لِّمَن يَخْشَىٰٓ ﴿٢٦﴾ ءَأَنتُمْ أَشَدُّ خَلْقًا أَمِ ٱلسَّمَآءُ ۚ بَنَىٰهَا
﴿٢٧﴾ رَفَعَ سَمْكَهَا فَسَوَّىٰهَا ﴿٢٨﴾ وَأَغْطَشَ لَيْلَهَا وَأَخْرَجَ ضُحَىٰهَا ﴿٢٩﴾
وَٱلْأَرْضَ بَعْدَ ذَٰلِكَ دَحَىٰهَآ ﴿٣٠﴾ أَخْرَجَ مِنْهَا مَآءَهَا وَمَرْعَىٰهَا ﴿٣١﴾
وَٱلْجِبَالَ أَرْسَىٰهَا ﴿٣٢﴾ مَتَٰعًا لَّكُمْ وَلِأَنْعَٰمِكُمْ ﴿٣٣﴾ فَإِذَا جَآءَتِ ٱلطَّآمَّةُ
ٱلْكُبْرَىٰ ﴿٣٤﴾ يَوْمَ يَتَذَكَّرُ ٱلْإِنسَٰنُ مَا سَعَىٰ ﴿٣٥﴾ وَبُرِّزَتِ ٱلْجَحِيمُ
لِمَن يَرَىٰ ﴿٣٦﴾ فَأَمَّا مَن طَغَىٰ ﴿٣٧﴾ وَءَاثَرَ ٱلْحَيَوٰةَ ٱلدُّنْيَا ﴿٣٨﴾ فَإِنَّ ٱلْجَحِيمَ
هِىَ ٱلْمَأْوَىٰ ﴿٣٩﴾ وَأَمَّا مَنْ خَافَ مَقَامَ رَبِّهِۦ وَنَهَى ٱلنَّفْسَ عَنِ ٱلْهَوَىٰ
﴿٤٠﴾ فَإِنَّ ٱلْجَنَّةَ هِىَ ٱلْمَأْوَىٰ ﴿٤١﴾ يَسْـَٔلُونَكَ عَنِ ٱلسَّاعَةِ أَيَّانَ مُرْسَىٰهَا
﴿٤٢﴾ فِيمَ أَنتَ مِن ذِكْرَىٰهَآ ﴿٤٣﴾ إِلَىٰ رَبِّكَ مُنتَهَىٰهَآ ﴿٤٤﴾ إِنَّمَآ أَنتَ مُنذِرُ
مَن يَخْشَىٰهَا ﴿٤٥﴾ كَأَنَّهُمْ يَوْمَ يَرَوْنَهَا لَمْ يَلْبَثُوٓا۟ إِلَّا عَشِيَّةً أَوْ ضُحَىٰهَا ﴿٤٦﴾

ترتيبها ٨٠ — سُورَةُ عَبَسَ — آياتها ٤٢

# අබස

නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණෝ එක් අවස්ථාවක කුරෙෂි නායකයින්ට ඉස්ලාමය පිළිබඳව ආශාව ඇතුව කථා බස් කරමින් සිටියහ. ඒ අවස්ථාවේ අන්ධ නබි මිතුරෙක වූ අබ්දුල්ලා බින් උම්මි මක්තූම් රළියල්ලාහු අන්හු තුමා ආගම දැන ගැනීමේ අරමුණෙන් ප්‍රශ්න කීපයක් අසන්නට විය. මෙම කථාබස් අතරට පැමිණීම නොරිස්සු නබි තුමාණෝ තම මුහුණ කෝපයෙන් පුපුරවමින් මෙතුමාව නොසලකා හැරියහ. එම අවස්ථාවේ මෙම පරිච්ඡේදය පහළ විය.

1 ඔහු (තම මුහුණ) කෝපයෙන් පුපුරවමින් (නොසලකා) හැරියේය.
2 අන්ධයා ඔහු වෙත පැමිණි නිසා (ඔහු තම මුහුණ කෝපයෙන් පුපරවමින් නොසලකා හැරියේය)
3 (මුහම්මද්) නුඹට කුමක් දැනුම් දුන්නේද? ඔහු (එම අන්ධයා නුඹෙන් ඉගෙන ගෙන ඒ මගින් තම පාපයන්ගෙන් මිදී)පිරිසිදු විය හැක.
4 නැතිනම් (නුඹෙන් ඉගෙන ගත් දැයින්) ඔහු උපදෙස් ලබා ගෙන ඔහුට එම උපදෙස් ප්‍රයෝජනවත් විය හැක.
5 නුඹේ (උපදෙස් පිළිබඳව) අවශ්‍ය නැති අය (කුරෙෂි නායකයින්)
6 නුඹ (නුඹේ මුහුණෙන් ද කථාවෙන් ද) ඔවුන් ඉදිරියේ සිටින්නෙහිය.

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

عَبَسَ وَتَوَلَّىٰٓ ﴿١﴾ أَن جَآءَهُ ٱلْأَعْمَىٰ ﴿٢﴾ وَمَا يُدْرِيكَ لَعَلَّهُۥ يَزَّكَّىٰٓ ﴿٣﴾ أَوْ
يَذَّكَّرُ فَتَنفَعَهُ ٱلذِّكْرَىٰٓ ﴿٤﴾ أَمَّا مَنِ ٱسْتَغْنَىٰ ﴿٥﴾ فَأَنتَ لَهُۥ تَصَدَّىٰ ﴿٦﴾
وَمَا عَلَيْكَ أَلَّا يَزَّكَّىٰ ﴿٧﴾ وَأَمَّا مَن جَآءَكَ يَسْعَىٰ ﴿٨﴾ وَهُوَ يَخْشَىٰ ﴿٩﴾ فَأَنتَ
عَنْهُ تَلَهَّىٰ ﴿١٠﴾ كَلَّآ إِنَّهَا تَذْكِرَةٌ ﴿١١﴾ فَمَن شَآءَ ذَكَرَهُۥ ﴿١٢﴾ فِى صُحُفٍ مُّكَرَّمَةٍ
﴿١٣﴾ مَّرْفُوعَةٍ مُّطَهَّرَةٍۭ ﴿١٤﴾ بِأَيْدِى سَفَرَةٍ ﴿١٥﴾ كِرَامٍۭ بَرَرَةٍ ﴿١٦﴾ قُتِلَ ٱلْإِنسَٰنُ
مَآ أَكْفَرَهُۥ ﴿١٧﴾ مِنْ أَىِّ شَىْءٍ خَلَقَهُۥ ﴿١٨﴾ مِن نُّطْفَةٍ خَلَقَهُۥ فَقَدَّرَهُۥ ﴿١٩﴾ ثُمَّ
ٱلسَّبِيلَ يَسَّرَهُۥ ﴿٢٠﴾ ثُمَّ أَمَاتَهُۥ فَأَقْبَرَهُۥ ﴿٢١﴾ ثُمَّ إِذَا شَآءَ أَنشَرَهُۥ ﴿٢٢﴾ كَلَّا لَمَّا
يَقْضِ مَآ أَمَرَهُۥ ﴿٢٣﴾ فَلْيَنظُرِ ٱلْإِنسَٰنُ إِلَىٰ طَعَامِهِۦٓ ﴿٢٤﴾ أَنَّا صَبَبْنَا ٱلْمَآءَ صَبًّا
﴿٢٥﴾ ثُمَّ شَقَقْنَا ٱلْأَرْضَ شَقًّا ﴿٢٦﴾ فَأَنۢبَتْنَا فِيهَا حَبًّا ﴿٢٧﴾ وَعِنَبًا وَقَضْبًا ﴿٢٨﴾
وَزَيْتُونًا وَنَخْلًا ﴿٢٩﴾ وَحَدَآئِقَ غُلْبًا ﴿٣٠﴾ وَفَٰكِهَةً وَأَبًّا ﴿٣١﴾ مَّتَٰعًا لَّكُمْ
وَلِأَنْعَٰمِكُمْ ﴿٣٢﴾ فَإِذَا جَآءَتِ ٱلصَّآخَّةُ ﴿٣٣﴾ يَوْمَ يَفِرُّ ٱلْمَرْءُ مِنْ أَخِيهِ ﴿٣٤﴾
وَأُمِّهِۦ وَأَبِيهِ ﴿٣٥﴾ وَصَٰحِبَتِهِۦ وَبَنِيهِ ﴿٣٦﴾ لِكُلِّ ٱمْرِئٍ مِّنْهُمْ يَوْمَئِذٍ شَأْنٌ
يُغْنِيهِ ﴿٣٧﴾ وُجُوهٌ يَوْمَئِذٍ مُّسْفِرَةٌ ﴿٣٨﴾ ضَاحِكَةٌ مُّسْتَبْشِرَةٌ ﴿٣٩﴾ وَوُجُوهٌ
يَوْمَئِذٍ عَلَيْهَا غَبَرَةٌ ﴿٤٠﴾ تَرْهَقُهَا قَتَرَةٌ ﴿٤١﴾ أُو۟لَٰٓئِكَ هُمُ ٱلْكَفَرَةُ ٱلْفَجَرَةُ ﴿٤٢﴾

7 ඔවුහු (ඉස්ලාමය පිළිගෙන ආදේශ කිරීම ආදියෙන් ඉවත්ව) පිරිසිදු නොවී සිටීම නුඹට වරදක් නොවේ. (නුඹේ වගකීම පෙන්වාදීම පමණය) මෙවැනි ප්‍රතික්ෂේප කරන්නන් කෙරෙහි නුඹ අවධානය යොමු නොකරහි.

8 (නුඹෙන් දහම ඉගෙන ගෙන සෘජුමග ලබා ගැනීමේ අරමුණෙන් යුතුව) නුඹ වෙතට ඉක්මන්ව පැමිණි අයෙක්

9 ඔහු අල්ලාහ්ට බිය වන්නෙකි.

10 නුඹ ඔහුව නොසලකා හැර (මොවුන් සමග කථා කරන්නෙහිය.)

11 නුඹ එසේ නොකරහි. නියත වශයෙන්ම මෙය (මෙම වැකි) උපදෙස් වන්නේය.

12 කවරෙක් (උපදෙස් ලබන්නා) මනාප වෙයිද ඔහු උපදෙස් ලබයි.

13 මේවා (අල්ලාහ්ගේ) ගෞරවයට පාත්‍රවූ ලේඛනවල (ලව්හුල් මහ්ෆූල් නමැති ඵලකයේ) ඇති ඒවාය.

14 (ෂෙයිතාන්වරුන්ගේ සම්බන්ධය යනාදියෙන්) පිරිසිදු කරන ලද (තත්ත්වය) උසස් කරන ලද (ලේඛනවල ඇත.)

15 (ඒවා අල්ලාහ් අසල සිට වහී රැගෙන එන) දූතයින් (මලක්වරුන්ගේ) අත්වල ඇත.

16 (ඔවුහු අල්ලාහ්ගේ) ගෞරවයට පාත්‍ර වූවන් යහපත් ගැත්තන්ය.

17 (ප්‍රතික්ෂේප කරන) මිනිසා ශාප කරනු ලැබීය. කුමක් ද ඔහුව (මෙතරම් දුරට කළගුණ අමතක කර) ප්‍රතික්ෂේප කරන්නෙකු බවට පත් කළේ?

18 ඔහු (අල්ලාහ්) ඔහුව (ප්‍රතික්ෂේප කරන්නාව) කුමකින් මැව්වේ ද?

19 ඔහු මොහුව ශුක්‍රාණුවෙන් මවා (ඔහුගේ අවයව ඉන්ද්‍රියයන් හා ඔහුගේ ජීවිතයට අවශ්‍ය අනෙකුත් දෑ) නිගමනය කළේය. (මෙසේ පිළිකුල් ද්‍රව්‍යයකින් මවනු ලැබ දෙවරක් මුත්‍රා සිදුරෙන් පිටවුන මෙම මිනිසා කෙසේ නම් උඩඟු විය හැකිද?)

20 පසුව ඔහුට (යහපත හෝ අයහපත තෝරා ගැනිමේ) මාර්ගය පහසු කළෙමු.

21 පසුව ඔහුව මරණයට පත් කර (ඔහුට ගෞරව කිරීම සඳහා) සොහොනෙහි තබන්නෙමු. (ඔහුව සතුන් හා පක්ෂීන් විසින් අනුභව කරනු ලබන්නෙකු ලෙස පොළොව මත වීසි කිරීමට සැලසුවේ නැත.)

22 පසුව ඔහුට මනාප වේලාවක ඔහුව (නැවත) නැගිටුවන්නේය.

23 ඔහු (අල්ලාහ්) ඔහුට අණ කළ දෙය මෙතෙක් ඔහු ඉටු කළේ නැත.

24 මිනිසා ඔහුගේ ආහාරය (අල්ලාහ් එය කෙසේ මැව්වේ දැයි) බැලිය යුතුය.

25 නියත වශයෙන්ම අපි ම ජලය (අහසේ සිට) වැස්සක් ලෙස ඇද හැළුවෙමු.

26 පසුව (බීජ පිපිරී ශාක පැළවීම පිණිස) අපි පොළොව පැළෙන්නට සැලසුවෙමු. (ඉතා කුඩා වූ ද දුබල වූද එම ශාක පොළොව පළාගෙන පිටතට ඒමට සැලසුවෙමු.)

27 අපි එහි (මිනිසුන් ආහාර ලෙස අනුභව කරන) ධාන්‍යයද මතු කළෙමු. (පොළොව පළාගෙන පිටවූ එම ශාක ධාන්‍ය ධාන්‍යය මතු කරන කාලය දක්වා වර්ධනය කළෙමු.) තවද (සතුන් ආහාර ලෙස අනුභව කරන) කුඩා තෘණ වැනි ශාකද ඇති කළෙමු.

28 මිදි ගස් ද සතුන් ආහාරයට ගන්නා කටු ගස් ද මතු කළෙමු.

29 තවද ඔලිව් ගස් ද ඉඳි ගස් ද අපි මතු කළෙමු.

30 (ඉදිගස් වැනි ගස්වලින්)ඝන වූ වතු ද මතු කළෙමු.

31 තවද පලතුරු හා (මිනිසුන් ආහාරයට ගැනීම වගා කිරීම හෝ නොකරන) සතුන් ආහාරයට ගන්නා ගස් ද අපි මතු කළෙමු.

32 නුඹලාද නුඹලාගේ සතුන් ද ප්‍රයෝජනයට ගැනීමේ අරමුණෙන් (මේවා අපි මතු කළෙමු)

33 (කන්) බිහිරි කරවන හඬ (දෙවන පිඹීම) එන අවස්ථාවේ

34 මිනිසා තම සහෝදරයා ද

35 තවද ඔහුගේ මව ද පියා ද

36 තවද ඔහු බිරිය හා දරුවන් ද අතහැර පළා යන දවසේ (මොවුන් මොහුගේ ළඟම නෑදෑයින් ය. මොහුගේ ආදරයටද සුදුසුකම් ලද අයයි. මොවුන් පවා අතහැර ඔහු දුවයි නම් එදවසේ භයානකකම මිස වෙනත් දෙයක් නැත).

37 එදවසේ ඔවුනතර සෑම මිනිසෙකුටම ඔහුගේ නෑදෑයින් අතහැර අවධානය වෙනතකට යොමු කරන කරුණක් ඇත.

38 එදවසේ සමහර මුහුණු දීප්තිමත් ව ඇත.

39 ඒවා සිනාවෙන් හා සතුටින් පිරී පෙනෙයි.

40 එදවසේ ඇතැම් මුහුණ දූහුවිලි නැවී ඇත.

41 ඒවා කළු පැහැය (අඳුර) වසාගෙන සිටී.

42 (කළු මුහුණු ඇති අය) ප්‍රතික්ෂේප කරන්නන් හා දුෂ්ටයින් ඔවුහුය.

## අත්-තක්වීර්

(1) සූර්යයා (ආලෝකය නැතිකර පන්දුවක් බවට පත්කර) හකුළන වේලාවේ
(2) තවද තාරකා (ගැල වී) වැටෙන වේලාවේ.
(3) කඳු (ඒවා දූවිලි බවට පත්කර) ඉවත් කරන වේලාවේ
(4) උදරයේ පැටවුන් දරා සිටින ඔටුවන් (නඩත්තු කරන්නන් නොමැතිව) අතහරිනු ලබන වේලාවේ (මේවා අරාබින්ගේ ඉතා වටිනා සම්පත් නිසා එය සඳහන් කර ඇත. විනිශ්චය දිනයේ භයානක කම හේතුකොට ගෙන මේවා ගැන සලකන්නෙක් නොමැති වන්නේය.
(5) වන සතුන්ව (ඒවායින් සමහරක් සමහරෙකුගෙන් පළි ගැනිම සඳහා) නැගිටුවන දිනයේ.
(6) තවද මුහුද ගිනිගැනෙන (ඒවා දැවෙන ගින්නක් බවට හැරෙන) වේලාවේ
(7) තවද ප්‍රාණ සම්බන්ධ කරන විට (මු:මින්වරුන් 'හූරුල් ඊන්' ස්ත්‍රීන් සමගද ප්‍රතික්ෂේප කරන්නන් ෂෙයිතාන්වරුන් සමග ද සම්බන්ධ කරනු ලබති. හසන් බසරි රහ්මතුල්ලාහි අලෙයිහි තුමා මෙසේ පවසයි. සෑම කෙනෙක්ම ඔවුනොවුන්ගේ කණ්ඩායම් සමග සම්බන්ධ කරනු ලබයි. යුදෙව්වන් යුදෙව්වන් සමග ද ක්‍රිස්තියානින් ක්‍රිස්තියානින් සමගද මු:මින් වරුන් මු:මින්වරුන් සමගද එක්රැස් කරනු ලබයි.)
(8) තවද ජීවමානව මිහිදන් කළ ගැහැණු දරුවන් විභාග කෙරෙන වේලාවේ.
(9) එසේ ඝාතනය කළේ කුමන වරදක් සඳහාදැ? (යි ප්‍රශ්න කෙරේ.)
(10) තවද (කුසල් අකුසල් ලේඛන ගත කළ)
(11) ලේඛන (විභාගය සඳහා) දිග හැරෙන වේලාවේ.
(12) තවද අහස පළනු ලබන වේලාවේ.
(13) තවද නිරයේ ගින්න අවුළුවන වේලාවේ. තවද ස්වර්ගය (බියබැතියෙන් යුත් අයවු)ළංකරවන වේලාවේ (මේවා ලෝකාන්තයේදී සිදුවන සිදුවීම් දොළස වන්නේය. පළමු සිදුවීම් හය මෙලොවදී ද අවසාන සිදුවීම් හය පරලොවදී සිදු වෙන ඒවාය.)
(14) සෑම ආත්මයක්ම (ලේඛන දිග හැරෙන විට) තමන්ගේ ක්‍රියාවන් දැක ගනිති.
(15) (දිවා කාලයේ සූර්යයාගේ ආලෝකය පිටුපස) සැඟවෙන තාරකා මත දිවුරමි.
(16) (ඒවායේ මණ්ඩලවල) දිවීමත් (ඒවා සැඟවෙන වේලාව ආවිට) සැඟවීමත් සලසන (තාරකා මත මම දිවුරමි).
(17) එය පසුබැස යන (එහි අඳුර නැතිවන) වේලාවේ රාත්‍රිය මත දිවුරමි.
(18) (එහි මඳ සුළඟත් සමග) එය ඉදිරියට එන වේලාවේ උදෑසන මත මම දිවුරමි.
(19) නියත වශයෙන්ම මෙය (කුර්ආනය) ගෞරවනීය දූතයෙකු මගින් (කියනු ලබන ) වදනය (ඔහු ජිබ්රීල් අලෙයිහිස් සලාම් වන්නේය.)
(20) ඔහු බලසම්පන්නය. අර්ෂ් හිමි (අල්ලාහ් ළඟ) විශාල පිළිගැනීමක් ද ඇත.
(21) එහි (අහසේ මලක්වරුන්) අවනත වන ඉතාමත් විශ්වාස වන්තයෙකු ද වේ.

سُورَةُ التَّكْوِيرِ — ترتيبها ٨١ — آياتها ٢٩

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

إِذَا ٱلشَّمۡسُ كُوِّرَتۡ ١ وَإِذَا ٱلنُّجُومُ ٱنكَدَرَتۡ ٢ وَإِذَا ٱلۡجِبَالُ
سُيِّرَتۡ ٣ وَإِذَا ٱلۡعِشَارُ عُطِّلَتۡ ٤ وَإِذَا ٱلۡوُحُوشُ حُشِرَتۡ
٥ وَإِذَا ٱلۡبِحَارُ سُجِّرَتۡ ٦ وَإِذَا ٱلنُّفُوسُ زُوِّجَتۡ ٧ وَإِذَا
ٱلۡمَوۡءُۥدَةُ سُئِلَتۡ ٨ بِأَيِّ ذَنۢبٖ قُتِلَتۡ ٩ وَإِذَا ٱلصُّحُفُ نُشِرَتۡ
١٠ وَإِذَا ٱلسَّمَآءُ كُشِطَتۡ ١١ وَإِذَا ٱلۡجَحِيمُ سُعِّرَتۡ ١٢ وَإِذَا ٱلۡجَنَّةُ
أُزۡلِفَتۡ ١٣ عَلِمَتۡ نَفۡسٞ مَّآ أَحۡضَرَتۡ ١٤ فَلَآ أُقۡسِمُ بِٱلۡخُنَّسِ ١٥
ٱلۡجَوَارِ ٱلۡكُنَّسِ ١٦ وَٱلَّيۡلِ إِذَا عَسۡعَسَ ١٧ وَٱلصُّبۡحِ إِذَا تَنَفَّسَ ١٨
إِنَّهُۥ لَقَوۡلُ رَسُولٖ كَرِيمٖ ١٩ ذِي قُوَّةٍ عِندَ ذِي ٱلۡعَرۡشِ مَكِينٖ ٢٠ مُّطَاعٖ
ثَمَّ أَمِينٖ ٢١ وَمَا صَاحِبُكُم بِمَجۡنُونٖ ٢٢ وَلَقَدۡ رَءَاهُ بِٱلۡأُفُقِ ٱلۡمُبِينِ
٢٣ وَمَا هُوَ عَلَى ٱلۡغَيۡبِ بِضَنِينٖ ٢٤ وَمَا هُوَ بِقَوۡلِ شَيۡطَٰنٖ رَّجِيمٖ ٢٥
فَأَيۡنَ تَذۡهَبُونَ ٢٦ إِنۡ هُوَ إِلَّا ذِكۡرٞ لِّلۡعَٰلَمِينَ ٢٧ لِمَن شَآءَ مِنكُمۡ أَن
يَسۡتَقِيمَ ٢٨ وَمَا تَشَآءُونَ إِلَّآ أَن يَشَآءَ ٱللَّهُ رَبُّ ٱلۡعَٰلَمِينَ ٢٩

سُورَةُ الانْفِطَارِ — ترتيبها ٨٢ — آياتها ١٩

(22) (23) නුඹලාගේ මිත්‍ර (මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමා) ඔහුව (ජිබ්රීල් අලෙයිහිස් සලාම් තුමාව) පැහැදිලි වූ පහළ අහසේ දුටුවේය. (අත්තටු 600 කින් යුත් ඔහුගේ නියම ස්වරූපයෙන්ම දුටුවේය. මුජාහිද් රහ්මතුල්ලාහි අලෙයිහි තුමා මෙසේ කියයි. මක්කමේ නැගෙනහිර පිහිටි අජියාද් පෙදෙසේ එතුමාව දුටුවේය.)
(24) ඔහු (මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්) ගුවනේ සිට ඔහු වෙත එන සැඟවුන දෑ පිළිබඳ මසුරුකම් කරන්නෙකු නොවේ. (ඒවායින් කිසිවක් අඩුවෙන් ප්‍රකාශ නොකරන අතර ඒවා දැනුම් දීමේදී නොසැලකිලිමත් ද නොවෙයි.)
(25) මෙය (කුර්ආනය, ගුවනේ සිට තොරතුරු රැස්කර ගෙන එන) පලවා හරිනු ලැබූ ෂෙයිතාන්ගේ වදන් නොවේ.
(26) (පැහැදිලි සෑජුමග අතහැර) නුඹලා කුමන මාර්ගයක ගමන් කරමින් සිටිහුද?
(27) මෙය (කුර්ආන්) ලෝකයාට උපදේශයක් මිස වෙනත් නැත.
(28) මන්ද නුඹලා අතර (සෑජුමග) ස්ථිරව සිටීමට මනාප අයට (මෙය උපදේශයකි)
(29) ලෝකයාගේ රක්ෂකයාණන් වන අල්ලාහ් මනාප වුවහොත් මිස (උපදෙස් ලබන්න) මනාප නොවන්නෙහුය. (අල්ලාහ්ගේ මනාපයෙන් තොරව නුඹලාට සෑජුමග ස්ථාවරම සිටිය නොහැක.)

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

إِذَا ٱلسَّمَآءُ ٱنفَطَرَتۡ ١ وَإِذَا ٱلۡكَوَاكِبُ ٱنتَثَرَتۡ ٢ وَإِذَا ٱلۡبِحَارُ
فُجِّرَتۡ ٣ وَإِذَا ٱلۡقُبُورُ بُعۡثِرَتۡ ٤ عَلِمَتۡ نَفۡسٞ مَّا قَدَّمَتۡ
وَأَخَّرَتۡ ٥ يَٰٓأَيُّهَا ٱلۡإِنسَٰنُ مَا غَرَّكَ بِرَبِّكَ ٱلۡكَرِيمِ ٦ ٱلَّذِي
خَلَقَكَ فَسَوَّىٰكَ فَعَدَلَكَ ٧ فِيٓ أَيِّ صُورَةٖ مَّا شَآءَ رَكَّبَكَ ٨
كَلَّا بَلۡ تُكَذِّبُونَ بِٱلدِّينِ ٩ وَإِنَّ عَلَيۡكُمۡ لَحَٰفِظِينَ ١٠ كِرَامٗا
كَٰتِبِينَ ١١ يَعۡلَمُونَ مَا تَفۡعَلُونَ ١٢ إِنَّ ٱلۡأَبۡرَارَ لَفِي نَعِيمٖ ١٣ وَإِنَّ
ٱلۡفُجَّارَ لَفِي جَحِيمٖ ١٤ يَصۡلَوۡنَهَا يَوۡمَ ٱلدِّينِ ١٥ وَمَا هُمۡ عَنۡهَا بِغَآئِبِينَ
١٦ وَمَآ أَدۡرَىٰكَ مَا يَوۡمُ ٱلدِّينِ ١٧ ثُمَّ مَآ أَدۡرَىٰكَ مَا يَوۡمُ ٱلدِّينِ
١٨ يَوۡمَ لَا تَمۡلِكُ نَفۡسٞ لِّنَفۡسٖ شَيۡـٔٗاۖ وَٱلۡأَمۡرُ يَوۡمَئِذٖ لِّلَّهِ ١٩

## سُورَةُ المُطَفِّفِين

ترتيبها ٨٣ — آياتها ٣٦

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

وَيۡلٞ لِّلۡمُطَفِّفِينَ ١ ٱلَّذِينَ إِذَا ٱكۡتَالُواْ عَلَى ٱلنَّاسِ يَسۡتَوۡفُونَ ٢
وَإِذَا كَالُوهُمۡ أَو وَّزَنُوهُمۡ يُخۡسِرُونَ ٣ أَلَا يَظُنُّ أُوْلَٰٓئِكَ أَنَّهُم
مَّبۡعُوثُونَ ٤ لِيَوۡمٍ عَظِيمٖ ٥ يَوۡمَ يَقُومُ ٱلنَّاسُ لِرَبِّ ٱلۡعَٰلَمِينَ ٦

## අල් ඉන්පිතාර්

1 (මලක්වරුන් බැසීම සඳහා) අහස පැළී යන වේලාවේ
2 තවද තාරකා හැළී වැටෙන වේලාවේ
3 සාගර ගමන් කරවා (ඒවා අතර ඇති තිර ඉවත් කර) එකම සාගරයක් ලෙස වෙනස් වන වේලාවේ
4 සොහොන් පෙරළනු ලැබ (ඒ තුළ සිටින මිනිසුන්ව පිට කරනු ලබන වේලාවේ)
5 සෑම ආත්මයක් ම (කුසල් අකුසල් වලින් පරලොව සඳහා) ඒවා කලින් එවන ලද හා ප්‍රමාද කළ දෑ ද දැන ගනී. (ලේඛන දිග හැරෙන විට ඒවා දැන ගනී)
6 අහෝ මනුෂ්‍යය, ත්‍යාගශීලී වූ නුඹේ දෙවියා ගැන නුඹට රැවැටීම ඇතිකළේ කුමක් ද? (ත්‍යාගශීලීවන්තයකු වූ නුඹේ දෙවියන්ව අමතක කරන තරමට නුඹව රවටා දැමුවේ කුමක් ද?)
7 (නුඹ නැතුව සිටි තත්ත්වයේ) ඔහු නුඹව (ශුක්‍රාණුවෙන්) මවා (නුඹට පෙනීම, ශ්‍රවණය හා බුද්ධිය යනාදිය දී) නුඹව පෙළගස්වා (නුඹට අලංකාර රුවක් දී) ඍජු පෙනුමකින් යුතුව ඔහු ඇති කළේය.
8 ඔහු කුමන හැඩයකින් (නුඹව මැවීමට) මනාප වූයේ ද ඒ හැඩයෙන් නුඹව (නුඹේ සිරුර) බද්ධ කළේය. (ඔහු තෝරාගත් හැඩයේ මැව්වේය. නුඹේ හැඩය නුඹ තෝරාගත් එකක් නොවේ.)
9 (එසේ අල්ලාහ්ගේ විෂයෙහි නොරැවටෙහි.) එහෙත් විපාක දෙන දිනය නුඹලා බොරු කරන්නෙහුය.
10 නියත වශයෙන්ම නුඹලා වෙත (නුඹලාගේ ක්‍රියාවන්) සුරක්ෂිතව ලේඛන ගත කරන මලක්වරුන්ව පත්කර ඇත)
11 (ඔවුහු) ගෞරවනීය අයය. (නුඹලා කරන දෑ) ලිවිය යුතු අය
12 නුඹලා කරන දෑ ඔවුහු දන්නෝය. (අල්ලාහ් ප්‍රකාශ කරයි. නුඹලා පරලොව බොරු කරහුය. ඔහු නුඹලාව විනිශ්චය දිනයේ විභාග කිරීම සඳහා නුඹලා කරන දෑ ලේඛන ගත කිරීම සඳහා මලක්වරුන්ව පත්කර ඇත්තේය.)
13 නියත වශයෙන්ම යහපත කළ කෙනා සතුට ගෙනදෙන (සවර්ගයේ) සිටින්නේය.
14 තවද නියත වශයෙන්ම පව්කාරයෝ නිරයේ සිටින්නෝය.
15 විපාක ප්‍රදානය කරන විනිශ්චය දිනයේ ඔවුහු ඒවාට ඇතුල් වෙති.
16 ඔවුහු එයින් බේරී යන අය නොවන්නෝය. (බේරීය හැකි අය නොවේ)
17 විපාක දෙන දිනය කුමක්දැයි නුඹට දැනුම් දුන්නේ කුමක් ද?
18 අනතුරුව ද විපාක දෙන දිනය කුමක් දැයි නුඹට දැනුම් දුන්නේ කුමක් ද?
19 (එය) කිසිම ආත්මයක් තවත් ආත්මයකට කිසිම ප්‍රයෝජනයක් ඇති නොකරගන්නා දිනයකි. එදින සියලුම කාර්යයත් අල්ලාහ්ට පමණක් හිමිවන්නේය. (ඔහු පමණක් තීන්දු ලබා දෙයි)

## අල්-මුතෆ්ෆිෆීන්

ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමා මෙසේ ප්‍රකාශ කරති. නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන් මදීනාවට පැමිණි කාල වකවානුවේ මදීනාවාසීහු කිරුම් මිණුම් ආදියෙහි දැඩි ලෙස වංචා කරන්නවුන්ව සිටියහ. එම අවස්ථාවේදී අල්ලාහ් මෙම පරිච්ජේදය පහළ කළේය. ඉන්පසු ඒ කටයුත්ත හරියාකාරව ඉටු කළහ.

1 (කිරුම් මිනුම්වල) අඩුවක් කරන අයට ශාප වේවා. (සමහර විට ඔවුන් ළඟ මිනුම් භාණ්ඩ දෙකක් තිබිණ. එකකින් මැන දෙති. අනෙකින් මැන ගනිති.)
2 ඔවුන් වනාහි ඔවුහු (අනෙක් අයගෙන් තමන් භාණ්ඩ ගන්නා විට) මැනගන්නාහු නම් (ප්‍රමාණය) සම්පූර්ණයෙන් ලබා ගනිති.
3 (අනෙක් අයට විකුණන විට) ඔවුනට මැන දෙන්නේ නම් හෝ කිරා දෙන්නේ නම් අඩු කරති.
4 ඔවුහු නැගිටුවනු ලබන්නෝ යැයි ඔවුහු සිතා නොබලන්නෙහුද?
5 භයානක දිනයක (ඔවුහු නැගිටුවනු ලබන්නහු යැයි ඔවුහු සිතා නොබලන්නෙහුද? ඔවුහු විනිශ්චය දිනයේ නැගිටුවනු ලැබ විභාගකරනු ලබන බව සිතා ඔවුන් මෙයින් වැළකී නොසිටි යුතුද?
6 ලෝක වාසීන්ගේ රක්ෂකයාගේ ඉදිරියේ (විභාගය සඳහා ද විපාක සඳහා ද) මිනිසුන් සිටගන්නා දිනයේ (ඔවුහු නැගිටුවනු ලබන්නෙහු යැයි සිතා නොබලන්නෙහුද?)
7 නියත වශයෙන්ම පව්කාරයින්ගේ ලේඛනය 'සිජ්ජීන්'හි ඇත. (කිරුම් මිනුම්වල අඩු කරන්නෝ ද එයට ඇතුල් වෙති.)

كَلَّآ إِنَّ كِتَٰبَ ٱلْفُجَّارِ لَفِى سِجِّينٍ ﴿٧﴾ وَمَآ أَدْرَىٰكَ مَا سِجِّينٌ ﴿٨﴾ كِتَٰبٌ
مَّرْقُومٌ ﴿٩﴾ وَيْلٌ يَوْمَئِذٍ لِّلْمُكَذِّبِينَ ﴿١٠﴾ ٱلَّذِينَ يُكَذِّبُونَ بِيَوْمِ ٱلدِّينِ ﴿١١﴾
وَمَا يُكَذِّبُ بِهِۦٓ إِلَّا كُلُّ مُعْتَدٍ أَثِيمٍ ﴿١٢﴾ إِذَا تُتْلَىٰ عَلَيْهِ ءَايَٰتُنَا قَالَ أَسَٰطِيرُ
ٱلْأَوَّلِينَ ﴿١٣﴾ كَلَّا ۖ بَلْ ۜ رَانَ عَلَىٰ قُلُوبِهِم مَّا كَانُوا۟ يَكْسِبُونَ ﴿١٤﴾ كَلَّآ إِنَّهُمْ
عَن رَّبِّهِمْ يَوْمَئِذٍ لَّمَحْجُوبُونَ ﴿١٥﴾ ثُمَّ إِنَّهُمْ لَصَالُوا۟ ٱلْجَحِيمِ ﴿١٦﴾ ثُمَّ يُقَالُ
هَٰذَا ٱلَّذِى كُنتُم بِهِۦ تُكَذِّبُونَ ﴿١٧﴾ كَلَّآ إِنَّ كِتَٰبَ ٱلْأَبْرَارِ لَفِى عِلِّيِّينَ
﴿١٨﴾ وَمَآ أَدْرَىٰكَ مَا عِلِّيُّونَ ﴿١٩﴾ كِتَٰبٌ مَّرْقُومٌ ﴿٢٠﴾ يَشْهَدُهُ ٱلْمُقَرَّبُونَ
﴿٢١﴾ إِنَّ ٱلْأَبْرَارَ لَفِى نَعِيمٍ ﴿٢٢﴾ عَلَى ٱلْأَرَآئِكِ يَنظُرُونَ ﴿٢٣﴾ تَعْرِفُ فِى
وُجُوهِهِمْ نَضْرَةَ ٱلنَّعِيمِ ﴿٢٤﴾ يُسْقَوْنَ مِن رَّحِيقٍ مَّخْتُومٍ ﴿٢٥﴾
خِتَٰمُهُۥ مِسْكٌ ۚ وَفِى ذَٰلِكَ فَلْيَتَنَافَسِ ٱلْمُتَنَٰفِسُونَ ﴿٢٦﴾ وَمِزَاجُهُۥ
مِن تَسْنِيمٍ ﴿٢٧﴾ عَيْنًا يَشْرَبُ بِهَا ٱلْمُقَرَّبُونَ ﴿٢٨﴾ إِنَّ ٱلَّذِينَ
أَجْرَمُوا۟ كَانُوا۟ مِنَ ٱلَّذِينَ ءَامَنُوا۟ يَضْحَكُونَ ﴿٢٩﴾ وَإِذَا مَرُّوا۟ بِهِمْ
يَتَغَامَزُونَ ﴿٣٠﴾ وَإِذَا ٱنقَلَبُوٓا۟ إِلَىٰٓ أَهْلِهِمُ ٱنقَلَبُوا۟ فَكِهِينَ ﴿٣١﴾
وَإِذَا رَأَوْهُمْ قَالُوٓا۟ إِنَّ هَٰٓؤُلَآءِ لَضَآلُّونَ ﴿٣٢﴾ وَمَآ أُرْسِلُوا۟ عَلَيْهِمْ
حَٰفِظِينَ ﴿٣٣﴾ فَٱلْيَوْمَ ٱلَّذِينَ ءَامَنُوا۟ مِنَ ٱلْكُفَّارِ يَضْحَكُونَ ﴿٣٤﴾

8 සිජ්ජීන් යනු කුමක්දැ?යි නුඹට දැනුම් දුන්නේ කුමක් ද?
9 (එය දුර් ජනයින්ගේ නම් ලියවුන) ලේඛණයකි.
10 එදවසේ බොරු කරන අයට විපතක්මය.
11 ඔවුහු වනාහි විපාක ලබා දෙන (විනිශ්චය) බොරු කරති.
12 එය පව්කාරයන් හා සීමාව ඉක්මවා කටයුතු කරන්නෝ පමණක් බොරු කරති.
13 ඔවුනට (අපේ දූතයා මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් වෙත පහළ කළ) අපේ වැකි කියවා පෙන්වනු ලැබූ විට, ඔවුහු පැරැන්නන්ගේ පුරාණය (ඔවුන්ගේ කටකතායැ)යි කියති.
14 එසේ නොකියහු. එහෙත් ඔවුන් හම්බකරගත් දෑ (පව්) ඔවුන්ගේ හදවත මත මලකඩ මෙන් වසාගත්තේය. (අබූ හුරෙයිරා රළියල්ලාහු අන්හු තුමා මෙසේ දැනුම් දෙයි: ගැත්තෙක් පවක් කළ විට ඔහුගේ හදවතේ කළු පුල්ලියන් වැටෙයි. ඔහු පාප කෂමාව ඇයද එයින් ඉවත්වන්නේ නම් එම කළු පුල්ලිය ඉවත් වී හදවත දීප්තිමත් වෙයි. එසේ නොමැතිව ඔහු දිගටම පව්කරමින් සිටී නම්, කළු පුල්ලි අධික වී ඔහුගේ හදවත වසාගනී. අල්ලාහ් ප්‍රකාශ කරනුයේ මෙයයි.)
15 නියත වශයෙන්ම ඔවුහු ඔවුන්ගේ රක්ෂකයාගෙන් (ඔහුව බැලීමෙන්) වළක්වනු ලබති. (විශ්වාස වන්තයෝ අල්ලාහ්ව බලන්නා සේ මොවුහු නොබලති. ලෝකයේ ඔහුගේ ඒකීයත්වය වැළැක්වූවා සේ පරලොව දී ඔහුව බැලීමෙන්ද වළක්වාලයි.)
16 පසුව ඔවුහු නිරයේ ඇතුල් විය යුතු අයයි.
17 පසුව නුඹලා බොරු යැයි ප්‍රකාශ කරමින් සිටියේ මෙයයි (යැයි ඔවුන් දෙස බලා කියනු ලැබේ.)
18 නියත වශයෙන්ම සුදනන්ගේ ලේඛන 'ඉල්ලියියුන්' නමැති ලේඛන සමග ඇත්තේය.
19 'ඉල්ලිය්යූන්' යනු කුමක් දැ?යි නුමට දැනුම් දුන්නේ කුමක් ද?
20 (එය අල්ලාහ්ට අවනතවූවන්ගේ නම්) ලියැවුන ලේඛනයකි.
21 (අල්ලාහ්ට) සමීපතම අය (මලක්වරු) ඒ අසල මුණගැසෙති. (තවද එය බලති.)
22 නියත වශයෙන් ම කුසල් කළ අය සුවය ලබාදෙන ස්වර්ගයේ සිටිති.
23 ඔවුහු (ස්වර්ගයේ) සිංහාසනවල වාඩි වී (තමන්ට සූදානම් කර ඇති ගෞරවයන් දෙස) බලමින් සිටිති.
24 නුඹලා ඔවුන්ගේ මුහුණේ (ඔවුන් භුක්ති විඳින) සැපතේ මහිමය දැක ගන්නෙහුය.
25 25. (මොවුන්ට පෙර අන් කිසිවෙකු පාවිච්චි නොකළ හැකි පරිදි) මුද්‍රාව තබන ලද පිවිතුරු මත් පැනින් පොවනු ලබති.
26 එහි අවසන් කොටස කස්තූරි සුගන්ධයෙන් යුක්තය. (එය පානය කරන භාජනයෙන් කට ඉවතට ගත් කල එතුළින් කස්තූරි සුගන්ධය නික්මෙයි.) තරගකරන අය ඒ සඳහා (එවැනි විපාක ලබා ගැනීමට) තරග කරහු.
27 එහි (එම මත් පැන්වල) මිශ්‍රකරනු ලබන පානය 'තස්නීම්'ය. (ස්වර්ගයේ පානයන්ගෙන් ඉතා අනර්ඝතම පානයකි.)
28 (එය අල්ලාහ්ට) ඉතා සමීප අය පානය කරන උල්පතකි.
29 නියත වශයෙන්ම වැරදි කළ අය (ප්‍රතික්ෂේප කළ අය) විශ්වාස කළවුන්ව බලා (සමච්චලයෙන්) සිනාසෙමින් සිටියහ.
30 ඔවුන්ව පසුකරමින් යනවිට ඔවුන්ගේ ඇස්වලින් ඉඟිකර (සමච්චල්කර)ති.
31 ඔවුහු (කාෆිර්වරු) තම පවුලේ අය වෙත ආපසු ගියොත් (තමන් විශ්වාසවන්තයින්ට කළ දෑ දැක සතුටුවූවන් ලෙස යති.
32 ඔවුහු ඔවුන්ව (විශ්වාසවන්තයින්ව) දුටුවිට නියත වශයෙන්ම මොවුන් මංමුළා වූවන් යැයි කියති.
33 මොවුන්ව (විශ්වාසවන්තයින්ව) ආරක්ෂා කරන්නන් වශයෙන් ඔවුන්ව එව්වේ නැත. (ඔවුන්ගේ ක්‍රියාවන් දැක ඔවුන්ව යහමඟට ගෙන ඒමේ වගකීම අල්ලාහ් විසින් කාෆිර්වරුන්ට ලබා දුන්නේ නැත.)
34 අද දවසේ (විනිශ්චය දිනයේ) විශ්වාස කළ අය කාෆිර්වරුන්ව බලා සිනාසෙති. (ඔවුන්ට දඬුවම් කිරීමත් දුබලයින් ලෙස යාමත් බලා සිනාසෙති.)
35 ඔවුහු (සවර්ගයේ) සිංහාසනවල වාඩි වී ගෙනම (කාෆිර්වරුන් දඬුවම් කිරීම) බලාගෙන සිටිති.
36 ප්‍රතික්ෂේප කරන්නන්ට ඔවුන් කළ දෑ වලට (සුදුසු විපාක) දෙනු ලැබීය. (ඔවුහු මුස්ලිම්වරුන්ව බලා සිනාසුනහ. මුස්ලිම්වරු අද කාෆිර්වරුන්ව බලා සිනාසෙති.)

عَلَى ٱلۡأَرَآئِكِ يَنظُرُونَ ﴿٣٥﴾ هَلۡ ثُوِّبَ ٱلۡكُفَّارُ مَا كَانُواْ يَفۡعَلُونَ ﴿٣٦﴾

ترتيبها ٨٤ — سُورَةُ الانشِقَاق — آياتها ٢٥

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

إِذَا ٱلسَّمَآءُ ٱنشَقَّتۡ ﴿١﴾ وَأَذِنَتۡ لِرَبِّهَا وَحُقَّتۡ ﴿٢﴾ وَإِذَا ٱلۡأَرۡضُ مُدَّتۡ
﴿٣﴾ وَأَلۡقَتۡ مَا فِيهَا وَتَخَلَّتۡ ﴿٤﴾ وَأَذِنَتۡ لِرَبِّهَا وَحُقَّتۡ ﴿٥﴾ يَٰٓأَيُّهَا
ٱلۡإِنسَٰنُ إِنَّكَ كَادِحٌ إِلَىٰ رَبِّكَ كَدۡحٗا فَمُلَٰقِيهِ ﴿٦﴾ فَأَمَّا مَنۡ أُوتِيَ
كِتَٰبَهُۥ بِيَمِينِهِۦ ﴿٧﴾ فَسَوۡفَ يُحَاسَبُ حِسَابٗا يَسِيرٗا ﴿٨﴾ وَيَنقَلِبُ
إِلَىٰٓ أَهۡلِهِۦ مَسۡرُورٗا ﴿٩﴾ وَأَمَّا مَنۡ أُوتِيَ كِتَٰبَهُۥ وَرَآءَ ظَهۡرِهِۦ ﴿١٠﴾ فَسَوۡفَ
يَدۡعُواْ ثُبُورٗا ﴿١١﴾ وَيَصۡلَىٰ سَعِيرًا ﴿١٢﴾ إِنَّهُۥ كَانَ فِيٓ أَهۡلِهِۦ مَسۡرُورًا ﴿١٣﴾
إِنَّهُۥ ظَنَّ أَن لَّن يَحُورَ ﴿١٤﴾ بَلَىٰٓۚ إِنَّ رَبَّهُۥ كَانَ بِهِۦ بَصِيرٗا ﴿١٥﴾ فَلَآ أُقۡسِمُ
بِٱلشَّفَقِ ﴿١٦﴾ وَٱلَّيۡلِ وَمَا وَسَقَ ﴿١٧﴾ وَٱلۡقَمَرِ إِذَا ٱتَّسَقَ ﴿١٨﴾
لَتَرۡكَبُنَّ طَبَقًا عَن طَبَقٖ ﴿١٩﴾ فَمَا لَهُمۡ لَا يُؤۡمِنُونَ ﴿٢٠﴾ وَإِذَا قُرِئَ
عَلَيۡهِمُ ٱلۡقُرۡءَانُ لَا يَسۡجُدُونَ۩ ﴿٢١﴾ بَلِ ٱلَّذِينَ كَفَرُواْ يُكَذِّبُونَ
﴿٢٢﴾ وَٱللَّهُ أَعۡلَمُ بِمَا يُوعُونَ ﴿٢٣﴾ فَبَشِّرۡهُم بِعَذَابٍ أَلِيمٍ ﴿٢٤﴾
إِلَّا ٱلَّذِينَ ءَامَنُواْ وَعَمِلُواْ ٱلصَّٰلِحَٰتِ لَهُمۡ أَجۡرٌ غَيۡرُ مَمۡنُونِۭ ﴿٢٥﴾

## අල් - ඉන්ෂිකාක්

1 අහස පැළී යන වේලාවේ (අහස පැළීයාම අවසන් දිනයේ සළකුණුවලින් එනම් පෙරනිමිති අතුරින් එකකි.)

2 තවද එහි රක්ෂකයාට එය යටත් විය යුතු වේලාවේ එසේ මෙල්ල වීම එයට අනිවාර්ය කර ඇති ක්‍රියාවකි.

3 4 (කුඩු කරනු ලැබ) පොළොව (සමතලාකර) විශාල කරවනු ලබන වේලාවේ තවද එහි ඇති දෑ (මළවුන්ව) පිටතට තල්ලු කර එය හිස්වෙයි නම්

5 තවද එහි රක්ෂකයාට එය යටත් වන වේලාවේ එසේ එය මෙල්ල වීම එයට අනිවාර්ය කරනු ලැබූ ක්‍රියාවකි.

6 මනුෂ්‍යය, නියත වශයෙන්ම නුඹ අල්ලාහ් (හමුවීම) දක්වා (යහපතේ හෝ අයහපතේ) බරපතල ලෙස උත්සාහ කරන්නේය. එයට පසුව නුඹ (කළ කාර්යයන් සමඟ) ඔහුව හමුවන්නට යන්නෙහිය.

7 කවරහු හෝ (කුසල් අකුසල්) ලේඛනය දකුණතට දෙනු ලබන්නෙහුද (ඔවුන් මු:මින්ය.)

8 පහසු විභාගයක් ලෙස ඔහු විභාග කරනු ලබති. (හාර හාරා අවුස්සමින් විභාග නොකර ඔවුන්ගේ පාපයන් පෙන්වා දෙනු ඇත. පසුව අල්ලාහ් ඔවුන්ට ක්ෂමාව දෙයි. ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය මෙසේ කියන්නීය: විභාගය කවරෙකුගෙන් හාරා අවුස්සා අසනු ලබන්නේද ඔහු දඬුවම් ලබයි යැයි නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණෝ කීහ. තවදුරටත් ඇය මෙසේ පවසන්නීය: අල්ලාහ් පහසු විභාගයක් පවත්වන්නේ යැයි කියා තිබෙනවා නොවේදැ?යි ඇසුවෙමි. එවිට එතුමාණෝ එය (ඔහුගේ පාපයන්) පෙන්වා දීමයි. කවරෙකුගෙන් හෝ හාරා අවුස්සා අසනු ලබයි නම් ඔහු දඬුවම් ලබයි' යැයි පැවසූහ. -බුහාරි, මුස්ලිම්-)

9 ඔහු තම පවුලේ අය වෙත (මට ලැබී ඇති විපාක බලා) සතුටින් යයි.

10 කවරෙකුගේ ලේඛනය කොන්ද පිටුපසින් දෙනු ලැබුවේ ද (ඔහු කාෆිර් හා පව්කාරයින්ය.) (මන්ද ඔහුගේ දකුණත් බෙල්ලට තබා විලංගු දමනු ලබන්නේය. ඔහුගේ වම්අත පසුපසින් පෙනෙයි.)

11 ඔහු විනාශය කැඳවයි. (ඔහුගේ කුසල් අකුසල් ලේඛනය කියවූ වහාම විනාශය කැඳවයි.)

12 තවද ඔහු නිරයට ඇතුල් වෙයි. (ඔහු එයට ඇතුල් වී එහි උෂ්ණයට ඔරොත්තු දෙයි.)

13 නියත වශයෙන්ම ඔහු (සිතේ ආශාවන් පිළිපදිමින් අහංකාර පෙන්වමින්) තම පවුල සමඟ සතුටින් සිටියේය.

14 නියත වශයෙන්ම ඔහු (අල්ලාහ් වෙත) නොයන්නේ යැයි සිතා ගෙන සිටියේය.

15 එසේය (ඔහු අල්ලාහ් වෙතට යන්නේය.) නියත වශයෙන්ම ඔහුගේ රක්ෂකයා ඔහුව බලන්නෙකුව සිටියේය. (ඔහුව ද ඔහුගේ ක්‍රියාවන් ද දන්නා ඔහුට කිසිවක් නොසැඟවෙන්නේය.)

16 රතු වළා මත දිවුරමි.

17 රාත්‍රිය මත ද එය තමා වෙත රැස්කරගත් දෑ මත ද දිවුරමි.

18 එය පූර්ණ වූ වේලාවේ චන්ද්‍රයා මත ද දිවුරමි.

19 නියත වශයෙන්ම නුඹලා නීතියකින් පසු තවත් නීතියකට වෙනස් වී යන්නෙහුය. (පොහොසත්, දුප්පත්, තරුණ හා මහළු ආදී පියවරවල්වලට මාරු වන්නෙහුය.)

20 ඔවුනට කුමක් විද? ඔවුහු විශ්වාස නොකර සිටිති.

21 තවද ඔවුනට කුර්ආනය කියවා පෙන්වුවහොත් ඔවුහු සජදා නොකරති. (කුර්ආනය කියවා පෙන්වන විට ඔවුහු අවනත වී සජදා කිරීමට ඇති බාධාව කුමක් ද?)

22 එහෙත් ප්‍රතික්ෂේප කළවුන් (ඒකීයත්වය, විනිශ්චය දිනය, යහවිපාක හා දඬුවම් යනාදිය තහවුරු කරන කුර්ආනය) බොරු කරති.

23 (ඔවුන්ගේ හදවතේ) ඔවුන් සඟවා ගෙන ඇති දේය අල්ලාහ් මැනවින් දන්නේය.

24 ඔවුනට හිංසාකාරී වේදනාව ඇති බවට සුභාරංචි කියහි. (ඔවුන්ට සමච්චල් කිරීමේ අදහසින් අල්ලාහ් එය සුභාරංචිය යැයි පවසයි)

25 විශ්වාස කර යහ ක්‍රියා කළ අය හැර (ඔවුහු දඬුවම් නොලබති, ඔවුන් සඳහා ඔවුනට කියානොපෑ ප්‍රතිඵල ඇත.)

سُورَةُ الْبُرُوجِ — ترتيبها ٨٥ — آياتها ٢٢

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

وَالسَّمَاءِ ذَاتِ الْبُرُوجِ ﴿١﴾ وَالْيَوْمِ الْمَوْعُودِ ﴿٢﴾ وَشَاهِدٍ وَمَشْهُودٍ
﴿٣﴾ قُتِلَ أَصْحَابُ الْأُخْدُودِ ﴿٤﴾ النَّارِ ذَاتِ الْوَقُودِ ﴿٥﴾ إِذْ هُمْ عَلَيْهَا
قُعُودٌ ﴿٦﴾ وَهُمْ عَلَىٰ مَا يَفْعَلُونَ بِالْمُؤْمِنِينَ شُهُودٌ ﴿٧﴾ وَمَا نَقَمُوا
مِنْهُمْ إِلَّا أَنْ يُؤْمِنُوا بِاللَّهِ الْعَزِيزِ الْحَمِيدِ ﴿٨﴾ الَّذِي لَهُ مُلْكُ
السَّمَاوَاتِ وَالْأَرْضِ ۚ وَاللَّهُ عَلَىٰ كُلِّ شَيْءٍ شَهِيدٌ ﴿٩﴾ إِنَّ الَّذِينَ
فَتَنُوا الْمُؤْمِنِينَ وَالْمُؤْمِنَاتِ ثُمَّ لَمْ يَتُوبُوا فَلَهُمْ عَذَابُ جَهَنَّمَ وَلَهُمْ
عَذَابُ الْحَرِيقِ ﴿١٠﴾ إِنَّ الَّذِينَ آمَنُوا وَعَمِلُوا الصَّالِحَاتِ لَهُمْ
جَنَّاتٌ تَجْرِي مِنْ تَحْتِهَا الْأَنْهَارُ ۚ ذَٰلِكَ الْفَوْزُ الْكَبِيرُ ﴿١١﴾ إِنَّ بَطْشَ
رَبِّكَ لَشَدِيدٌ ﴿١٢﴾ إِنَّهُ هُوَ يُبْدِئُ وَيُعِيدُ ﴿١٣﴾ وَهُوَ الْغَفُورُ الْوَدُودُ ﴿١٤﴾
ذُو الْعَرْشِ الْمَجِيدُ ﴿١٥﴾ فَعَّالٌ لِمَا يُرِيدُ ﴿١٦﴾ هَلْ أَتَاكَ حَدِيثُ الْجُنُودِ
﴿١٧﴾ فِرْعَوْنَ وَثَمُودَ ﴿١٨﴾ بَلِ الَّذِينَ كَفَرُوا فِي تَكْذِيبٍ ﴿١٩﴾ وَاللَّهُ مِنْ
وَرَائِهِمْ مُحِيطٌ ﴿٢٠﴾ بَلْ هُوَ قُرْآنٌ مَجِيدٌ ﴿٢١﴾ فِي لَوْحٍ مَحْفُوظٍ ﴿٢٢﴾

سُورَةُ الطَّارِقِ — ترتيبها ٨٦ — آياتها ١٧

# අල් බුරූජ්

(1) මණ්ඩලවලින් යුත් අහස මත දිවුරමි. (තාරකාවන්ට මණ්ඩල දොළසක් පෙනෙන්නට ඇත.)
(2) තවද පොරොන්දු වූ දිනය මත දිවුරමි. (එය විනිශ්චය දිනයයි.)
(3) (එදින මැවීම් අතුරින්) සාක්ෂි කියන්නන් මත දිවුරමි. තවද (පාපිෂ්ඨ ජනයා කළ ඉතා පහත් වූ අපරාධ අතුරින් ඔවුනට එරෙහිව සාක්ෂිකරුවන් ) සාක්ෂි කියන ලබන දෑ මත දිවුරමි. (ඔවුහු සාක්ෂි සාක්ෂි කියන්නන් මත දිවුරමි. (සාක්ෂි කියයන්නන් විසින් එදවසේ) සාක්ෂි කියනු ලබන දෑ මතද දිවුරමි.
(4) අගල් හිමි අය ශාප කරනු ලැබුවෝය. (ඔවුහු කාෆිර් වූ රජෙකු ද ඔහුගේ හමුදාවද වන්නෝය. ඔහුගේ රටවැසියන් අතර සමහරෙක් විශ්වාස කළ විට ඔවුන් සඳහා විශාල අගල් හාරා එහි ගිනි මොලවා එහි ඔවුන්ව පුළුස්සා දැමූහ. රජු හා ඔහුගේ පිරිවරද බලා ඒ දෙස සිටියදී ම ඔවුහු ද අලුරු වී ගියහ.)
(5) එය ඉන්ධන සහිත ගිණි(වලකි)
(6) ඔවුහු අගල මත වාඩි වී සිටියදීම (ශාප කරනු ලැබූහ.)
(7) (ඊමානය අත්හැරීමට අකැමති වූ අවස්ථාවේ) ඔවුහු මු:මින් වරුන්ව (ගින්නට දැමීමට) සැලසූ දෑ (දඬුවම) ගැන (මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔවුන්ම ඔවුනට විරුද්ධ ඔවුන්ගේ අත්, පා හා දිවවල්) සාක්ෂි කියති.
(8) (සෑම තත්ත්වයකදීම) ප්‍රශංසා කළ යුතු (සියල්ල) අබිබවා යාහැකි අල්ලාහ්ව ඔවුන් විශ්වාස කළ හේතුව හැර (වෙන කිසිවක් සඳහා ඔවුන්ව) මොවුන් වේදනාවට පත්කළේ නැත.
(9) අල්ලාහ් (ඔවුන් විශ්වාසිකයින්ට කළ) සියල්ල බලා සිටින්නෙකි. (මෙම වැකිය එම වල අයිති එවුනට ලබා දෙන දඬුවම පිළිබඳව වූ පොරොන්දුවක් වන අතර මු:මින් වරුන් ලබා දෙන පොරොන්දු ද ප්‍රකාශ කරයි.)
(10) නියත වශයෙන්ම විශ්වාසවන්තයි වන ගැහැණුන්ට ද පිරිමින්ට ද (ඔවුන් ඔවුන්ගේ ආගම අත්හැරීම සඳහා ගින්නේ දමා) පීඩාවට ලක්කර කර (ඒ වෙනුවට) පාපකෂමාව නො ඉල්ලූ අයට නිරයේ වේදනාව ඇත. (ඔවුන්ව ගින්නේ දමා වේදනාවට ලක් කළ නිසා) ඔවුන්ට දවාලන වේදනාව ඇත.
(11) නියත වශයෙන්ම විශ්වාසකර යහක්‍රියා කරනවුන්ට යටින් ඔයවල් ගලා බසින (සවර්ග) උයන් ඇත. ලොකුම ජයග්‍රහණය වන්නේ එයයි.
(12) නියතවශයෙන්ම නුඹේ රක්ෂකයා (අසාධාරණ කරනවුන්ව හා මර්ධනාකාරි ක්‍රියා කරනවුන්ව) ග්‍රහණය කිරීමේදී (ඔහුගේ ග්‍රහණය) ඉතා දැඩිය.
(13) ඔහු (මැවීම් මෙලොව) ආරමභයේ දී මැවුවේය. තවද (මරණයට පත්වූ පසු ඔවුන්ව) නැවත නැගිටුවයි.
(14) ඔහු (තම ගැත්තන් වූ විශ්වාසවන්තයින්ගේ පව්) වඩාත් ක්ෂමා කරන්නාය. (ඒවා මගින් ඔවුන්ව නින්දාවට පත් නොකරයි. ඔහුගේ යහපත් ගැත්තන්ව ඔහු ඉතා ප්‍රිය කරයි.)
(15) ගෞරවාන්විත 'අර්ෂ්' හි හිමිකරුවාය.
(16) ඔහුට මනාප දෙයක් කර නිම කරයි.
(17) (තමාගේ නබිවරුන්ව බොරුකර අල්ලාහ්ගේ දඬුවමට ලක්වූ) පිරිසකගේ තොරතුරු නුඹලා වෙත පැමණියේ ද?
(18) ෆිර්අවුන්ගේ හා සමූද් සමූහයාගේ ද (තොරතුරු නුඹවෙත පැමිණියේද?.)
(19) එහෙත් (මක්කා) ප්‍රතික්ෂේප කරන්නන් (නුඹව ද නුඹ ගෙනආ දෑ ද) බොරු කිරීමෙහි ම නිරතව සිටී. (ඔවුන් පෙර සිටි අයට සිදුවූ පාඩම් උගත්නේ නැත.)
(20) අල්ලාහ් ඔවුනට පසුව (පැරැන්නන්ව දඬුවමට ලක් කළා සේ ඔහුගේ දඬුවමින් ඔවුන්ව ද) වටකරගන්නට හැකියාව ඇත්තෙක් වන්නේය.
(21) එහෙත් එය (ගෞරවාන්විත කුර්ආනයයි. (ඔවුන් කියන හූනියම හෝ ශාස්ත්‍රය හෝ නොවෙයි.)
(22) (එය ෂෙයිතාන්ට අත තියන්න නොහැකි පරිද අල්ලා විසින්) ආරක්ෂා කරනු ලැබූ ලැල්ලේ (ලියවී ඇත).

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ
وَالسَّمَاءِ وَالطَّارِقِ ﴿١﴾ وَمَا أَدْرَاكَ مَا الطَّارِقُ ﴿٢﴾ النَّجْمُ الثَّاقِبُ ﴿٣﴾ إِن كُلُّ
نَفْسٍ لَّمَّا عَلَيْهَا حَافِظٌ ﴿٤﴾ فَلْيَنظُرِ الْإِنسَانُ مِمَّ خُلِقَ ﴿٥﴾ خُلِقَ مِن مَّاءٍ
دَافِقٍ ﴿٦﴾ يَخْرُجُ مِن بَيْنِ الصُّلْبِ وَالتَّرَائِبِ ﴿٧﴾ إِنَّهُ عَلَىٰ رَجْعِهِ لَقَادِرٌ ﴿٨﴾
يَوْمَ تُبْلَى السَّرَائِرُ ﴿٩﴾ فَمَا لَهُ مِن قُوَّةٍ وَلَا نَاصِرٍ ﴿١٠﴾ وَالسَّمَاءِ ذَاتِ الرَّجْعِ ﴿١١﴾
وَالْأَرْضِ ذَاتِ الصَّدْعِ ﴿١٢﴾ إِنَّهُ لَقَوْلٌ فَصْلٌ ﴿١٣﴾ وَمَا هُوَ بِالْهَزْلِ ﴿١٤﴾ إِنَّهُمْ
يَكِيدُونَ كَيْدًا ﴿١٥﴾ وَأَكِيدُ كَيْدًا ﴿١٦﴾ فَمَهِّلِ الْكَافِرِينَ أَمْهِلْهُمْ رُوَيْدًا ﴿١٧﴾

ترتيبها ٨٧ — سُورَةُ الأَعْلَى — آياتها ١٩

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ
سَبِّحِ اسْمَ رَبِّكَ الْأَعْلَى ﴿١﴾ الَّذِي خَلَقَ فَسَوَّىٰ ﴿٢﴾ وَالَّذِي قَدَّرَ فَهَدَىٰ
﴿٣﴾ وَالَّذِي أَخْرَجَ الْمَرْعَىٰ ﴿٤﴾ فَجَعَلَهُ غُثَاءً أَحْوَىٰ ﴿٥﴾ سَنُقْرِئُكَ
فَلَا تَنسَىٰ ﴿٦﴾ إِلَّا مَا شَاءَ اللَّهُ ۚ إِنَّهُ يَعْلَمُ الْجَهْرَ وَمَا يَخْفَىٰ ﴿٧﴾ وَنُيَسِّرُكَ
لِلْيُسْرَىٰ ﴿٨﴾ فَذَكِّرْ إِن نَّفَعَتِ الذِّكْرَىٰ ﴿٩﴾ سَيَذَّكَّرُ مَن يَخْشَىٰ ﴿١٠﴾
وَيَتَجَنَّبُهَا الْأَشْقَى ﴿١١﴾ الَّذِي يَصْلَى النَّارَ الْكُبْرَىٰ ﴿١٢﴾ ثُمَّ لَا يَمُوتُ
فِيهَا وَلَا يَحْيَىٰ ﴿١٣﴾ قَدْ أَفْلَحَ مَن تَزَكَّىٰ ﴿١٤﴾ وَذَكَرَ اسْمَ رَبِّهِ فَصَلَّىٰ ﴿١٥﴾

## අත්-තාරික්

1 අහස මතද රාත්‍රියේ පෙනෙන දෙය මත ද දිවුරමි. (රාතියේ පෙනෙන දෙය වන්නේ තාරකාය. එය රාත්‍රියේ පායා දවාලේ නොපෙනී යන නිසා එයට මෙම වදන භාවිතා කර ඇත.)

2 'තාරික්' යනු කුමක් දැ?යි නුඹට දැන්වූයේ කුමක් ද?

3 (අඳුර) පසාකර ආලෝකය ඇතිකරන තරුවකි.

4 නියතවශයෙන්ම සෑම ආත්මයක්ම එයට ආරක්ෂකයෙන් සිටිති. (ඔවුහු සෑම මිනිසෙකුගේම වචන හා ක්‍රියාවන් ලේඛක ගතකර ආරක්ෂා කරන මලක්වරු වෙති.)

5 මිනිසා ඔහු මවනු ලැබ ඇත්තේ කුමකින්දැ?යි බැලිය යුතුය.

6 පිම්මෙන් මතුවී (ගර්භාහයේ තැන්පත් කරන) ශුක්‍රාණු බිංදුවකින් මවනු ලැබීය. (එය ගැහැණු පිරිමි දෙදෙනාගේ ශුක්‍රාණුවල මිශ්‍රණයකි. මන්ද දෙදෙනාගේ ශුක්‍රාණු මගින්ම මිනිසා මවනු ලැබීය.)

7 එය (ඔහුගේ) කොඳු නාරටියෙන් ද (ගැහැණියගේ) පපු ඇටවලින් ද මතුවන්නේය. (මේ ද්‍රාවණයන් දෙක නොමැතිව ළදරුවෙකු ඇති නොවේ.)

8 නියත වශයෙන් (අල්ලාහ්) ඔහුව නැවත ගෙන ඒමට ද (නැගිටුවීමට ද) ශක්තිය ඇත්තාය.

9 සිත් (ඒවායේ ඇති නිගමනයන් හා සිතුවිලි ද පිටකර දැන ගනු ලබන) පරීක්ෂා කරනු ලබන දිනයේ (ඔහුව නැවත බිහිකරන්නට අල්ලාහ් ශක්තිය ඇත්තාය.)

10 (තමාට ලැබෙන දඬුවමෙන් ආරක්ෂා කර ගැනීමට) ශක්තියක් හෝ (ඔහුව ආරක්ෂා කළ හැකි) උදව් කරුවන් කිසිවෙක් හෝ ඔහුට නොසිටිති.

11 වැසි ඇති අහස මත දිවුරා කියමි.

12 (ගස් හා ශාක වර්ග පැලවීමට පහසුවන පරිදි) පැළීයන භූමිය මත දිවුරා කියමි.

13 නියත වශයෙන්ම මෙය (කුර්ආනය) සත්‍යය ද අසත්‍යය ද වෙන්කර පෙන්වන වචනයකි.

14 එය සමච්චලයට අයත් (වදනක්) නොවේ.

15 නියත වශයෙන්ම ඔවුහු (දේව දූතයින් ගෙන ආ ආගම විනාශ කිරීමට) කුමන්ත්‍රණය කරති.

16 මම ද කුමන්ත්‍රණය කරමි. (ඔවුන්ට බුරුලක් දී පසුව මාගේ ග්‍රහණයට ලක් කර ඔවුන්ගේ කුමන්ත්‍රණයට විපාක දෙන්නෙමි.)

17 නුඹලා ප්‍රතික්ෂේප කරන්නන්ට ටික කාලයක් අවස්ථාව දෙහු. ස්වල්ප කලකට කල්දීමක් ලබා දෙහු.

## අඃලා

1 (නොමැති වදන් ප්‍රකාශ කිරීම තුළින් සුදුසු නොමැති හැම එකකින්ම) උසස් වූ නුඹේ රක්ෂකයාගේ නාමය නුඹ පවිත්‍ර කරහි,

2 ඔහු වනාහි, ඔහු (මිනිසාව) මවා (ඔහුගේ ශරීරය) අලංකාර ලෙස හැඩ ගැස්සුවේය.

3 තවද ඔහු (විවිධාකාර මැවීම් ද) ඇතිකර ඒ හැම එකකටම (ඒවාට අවශ්‍ය දෑ ලබා ගැනීමට) මාර්ගය ද සැලසීය.

4 තවද ඔහු මේච්චලයට අවශ්‍ය බිම් (තණ බිම්) මතු කළේය.

5 පසුව ඔහු ඒවා වියළී ගිය පඬරුල් බවට පත්කළේය.

6 අපි නුඹට කුර්ආනය කියවා පෙන්වන්නෙමු. එය අමතක නොකරන්නෙහිය. (වහීයෙහි ආරම්භයේ ජිබ්රීල් අලෙයිහිස් සලාම් තුමා නබි තුමාණන්ට එය කියවා පෙන්වන විට එතුමාණෝ අමතකවීමට බියෙන් ඉක්මන් වී කියවීමට උත්සාහ කරන්නෝය. ඒ අවස්ථාවේ මෙම වැකිය පහළ විය. අල්ලාහ් එතුමන්ගේ හදවතේ අල් කුර්ආනය සම්පූර්ණයෙන් ආරක්ෂාකර දුන්නේය. එතුමන් කිසිවක් අමතක කළේ නැත.)

7 අල්ලාහ් (නුඹ කුමක් අමතක කළ යුතු දැයි මනාප වන්නේ ද) ඒවා හැර (නුඹ අමතක නොකරන්නෙහිය.) නියත වශයෙන් ඔහු විවෘත දෑ ද සැඟවුන දෑ ද දන්නේය.

8 තවද අපි පහසුව (ආගම කරා මාර්ගය) නුඹට පහසු කරන්නෙමු. (සවර්ගය සඳහා අවශ්‍ය වත්පිළිවෙත් නුඹට පහසු කරන්නෙමු.)

9 (මුහම්මද්,) උපදෙස් ප්‍රයෝජනය වෙයි නම් නුඹ (නුඹට අප දැනුම් දුන් දැයින්) උපදෙස් ලබාගනහි. (උපදෙස් ලබාගත් පසුත් තවදුරටත් උඩගුවෙන් සිතේ ආශාවන් පිළිපදිමින් උපදෙස් අහක දමන අයට නුඹ නැවත නැවතත් උපදෙස් දිය යුතු නැත. පළමු කැඳවීම භේදයකින් තොරව හැම දෙනෙකුටම පොදුවේ කිරීම වගකීමක් වන්නේය.)

10 අල්ලාහ්ට බියවන්නවුන් උපදෙස් ලබාගනියි. (එමගින් ඔවුහු සෑජුමග ද භක්තිය ද වැඩිකර ගන්නේය.)
11 අභාග්‍යවන්තයා එය (පිළිනොගෙන) අතහැර (දුරස්ථ වන්නේය)
12 ඔහු වනාහි අති දැවැන්ත (මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ නිරයේ) ගින්නට ඇතුල් වන්නේය.
13 පසුව ඔහු එහි මරණයට පත් වී (දඬුවමෙන් නොමිදෙන්නේය.) තවද (එහි) සැනසිල්ලේ ජීවත්වන්නේ ද නැත.
14 (ආදේශ කිරීමෙන් හා පාපයන්ගෙන්) පිරිසිදු වූවන් නියත වශයෙන්ම ජය ලබති.
15 තවද ඔහු (තම දිවෙන්) තම දෙවියන්ගේ නාමය මෙනෙහි කර සලාතය ඉටු කරයි.
16 එහෙත් නුඹලා (මෙලොව) පහත් ජීවිතය තෝරා ගන්නෙහුය.
17 පරලොව (ජීවිතය) වැදගත් වූද සදාකාලික වූද එකකි.
18 නියත වශයෙන්ම මෙය (ආදේශ කිරීම ආදියෙන් පිරිසිදු වූ කෙනා ජය ලබන බව) පෙර පුස්තකවල ද ඇත.
19 එනම් ඉබ්‍රාහීම් (අලෛයිහිස් සලාම්) ගේ මූසා (අලෛයිහිස් සලාම්) ගේ පුස්තකවල ද ඇත.

## අල්-ගාසියා

1 (තම භයානක සිදුවීම් තුළින් මැව්ම් සියල්ල) වසාගත හැකි (විනිශ්චය දිනයේ) පුවත (නබිවරයාණනි,) ස්ථිර වශයෙන්ම නුඹ වෙත පැමිණ ඇත.
2 සමහර මුහුණු එදින බියෙන් වෙලී ඇත. (විනිශ්චය දිනයේ ජනතාව කොටස් දෙකකින් පෙනී සිටිති. එක් කොටසක් ඔවුන් වේදනාවට මුහුණ දිය යුතු නිසා බියෙන් සිටී)
3 (ඒවා මෙලොව) වත් පිළිවෙත් රැකීමෙන් වෙහෙසට පත් වී සිටියේය. (නමුත් ඔවුන් ආදේශ කරමින් සිටි හෙයින් ඔවුනට කිසිදු යහපතක් අත් නොවේ.)
4 (එම මුහුණු) දැවෙමින් තිබෙන ගින්නට ඇතුල් වෙයි.
5 අධික ලෙස උණු වී එන උල්පතකින් ඔවුනට පොවනු ඇත.
6 ඔවුනට 'ළරීඋ' නැමැති වියලී ගිය කටුගස්වලින් මිස වෙනත් ආහාරයක් නැත.
7 එය පුෂ්ඨිමත් නොකරන අතර කුසගින්න ද නැති නොකරයි.
8 තවත් සමහර මුහුණු සතුටින් පිරී පවතී. (ඔවුන් දෙවන කොටසයි. ඔවුන් වෙනුවෙන් අල්ලාහ් තබාගෙන ඇති යහපත දැනගත් සැනින් ඔවුන්ගේ මුහුණු දීප්තිමත් වෙයි.)
9 ඒවා තමන්ගේ උත්සාහය පිළිගනී. (ඔවුන්ගේ උත්සාහයට ලැබෙන විපාකය ඔවුහු පිළිගනිති.)
10 ඔවුහු උසස්වූ සවර්ගයේ සිටිති.
11 අනවශ්‍ය (පාපකාරී) වචන ඔවුහු නොඅසති.
12 ඒවායේ ගලායන උල්පත් ඇත.
13 උස්වූ ඇඳන්ද එහි ඇත.
14 ඒවායේ සූදානම් කළ බඳුන් ද ඇත.
15 පිළිවැලින් එකළග කරන ලද කොට්ටෙ ද එහි ඇත.
16 සිහින් ඉරි සහිත අලංකාර ඇතිරිලි ද (එහි ඇත.)

بَلْ تُؤْثِرُونَ ٱلْحَيَوٰةَ ٱلدُّنْيَا ﴿١٦﴾ وَٱلْءَاخِرَةُ خَيْرٌ وَأَبْقَىٰٓ ﴿١٧﴾ إِنَّ
هَٰذَا لَفِى ٱلصُّحُفِ ٱلْأُولَىٰ ﴿١٨﴾ صُحُفِ إِبْرَٰهِيمَ وَمُوسَىٰ ﴿١٩﴾

### سُورَةُ الغَاشِيَةِ

ترتيبها ٨٨ — آياتها ٢٦

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

هَلْ أَتَىٰكَ حَدِيثُ ٱلْغَٰشِيَةِ ﴿١﴾ وُجُوهٌ يَوْمَئِذٍ خَٰشِعَةٌ ﴿٢﴾
عَامِلَةٌ نَّاصِبَةٌ ﴿٣﴾ تَصْلَىٰ نَارًا حَامِيَةً ﴿٤﴾ تُسْقَىٰ مِنْ عَيْنٍ ءَانِيَةٍ ﴿٥﴾
لَّيْسَ لَهُمْ طَعَامٌ إِلَّا مِن ضَرِيعٍ ﴿٦﴾ لَّا يُسْمِنُ وَلَا يُغْنِى مِن جُوعٍ ﴿٧﴾
وُجُوهٌ يَوْمَئِذٍ نَّاعِمَةٌ ﴿٨﴾ لِّسَعْيِهَا رَاضِيَةٌ ﴿٩﴾ فِى جَنَّةٍ عَالِيَةٍ ﴿١٠﴾
لَّا تَسْمَعُ فِيهَا لَٰغِيَةً ﴿١١﴾ فِيهَا عَيْنٌ جَارِيَةٌ ﴿١٢﴾ فِيهَا سُرُرٌ مَّرْفُوعَةٌ ﴿١٣﴾
وَأَكْوَابٌ مَّوْضُوعَةٌ ﴿١٤﴾ وَنَمَارِقُ مَصْفُوفَةٌ ﴿١٥﴾ وَزَرَابِىُّ مَبْثُوثَةٌ ﴿١٦﴾
أَفَلَا يَنظُرُونَ إِلَى ٱلْإِبِلِ كَيْفَ خُلِقَتْ ﴿١٧﴾ وَإِلَى ٱلسَّمَآءِ كَيْفَ
رُفِعَتْ ﴿١٨﴾ وَإِلَى ٱلْجِبَالِ كَيْفَ نُصِبَتْ ﴿١٩﴾ وَإِلَى ٱلْأَرْضِ كَيْفَ
سُطِحَتْ ﴿٢٠﴾ فَذَكِّرْ إِنَّمَآ أَنتَ مُذَكِّرٌ ﴿٢١﴾ لَّسْتَ عَلَيْهِم
بِمُصَيْطِرٍ ﴿٢٢﴾ إِلَّا مَن تَوَلَّىٰ وَكَفَرَ ﴿٢٣﴾ فَيُعَذِّبُهُ ٱللَّهُ ٱلْعَذَابَ
ٱلْأَكْبَرَ ﴿٢٤﴾ إِنَّ إِلَيْنَآ إِيَابَهُمْ ﴿٢٥﴾ ثُمَّ إِنَّ عَلَيْنَا حِسَابَهُم ﴿٢٦﴾

17 (විශාල ශරීරයකින් යුතුව ද ශක්තියෙන් යුතුව ද පුදුමවිය හැකි ගතිගුණෙන් යුතුව ද මවා ඇති) ඔටුවා එය කෙසේ මවා ඇද්දැ?යි ඔවුහු නොබලන්නෙහු ද?
18 තවද (කුළුණු කිසිවක් නොමැතිව ඉහලට නංවා ඇති) අහස, එය කෙසේ උස්සන ලදැ?යි ඔවුහු නොබලන්නෙහුද? (එය ඉහළට නංවා ඇති ආකාරය බුද්ධියට ද දැනුමට ද හසුනොවන්නකි.)
19 තවද (සෙලවීමක් හෝ පැද්දීමක් නොමැතිව සිටුවා ඇති) කඳු, ඒවා කෙසේ සිටුවන ලදැ?යි නොබලන්නෙහුද?
20 (කවුරුත් ප්‍රයෝජනය ලබන අයුරින් විශාල කර ඇති) පොළොව, එය කෙසේ විශාල කර ඇද්දැ?යි (නොබලන්නෙහුද?)
21 (මුහම්මද්,) නුඹ (ඔවුනට) උපදෙස් දෙහි. (එමගින් බිය ඇතිකරවහි.) නුඹ උපදෙස් දෙන්නෙකු පමණය. (නුඹේ වගකීම උපදෙස් දීම පමණකි.)
22 (නුඹ ඔවුනට විශ්වාස කිරීම බලකිරීමට) නුඹ ඔවුනට බලය පාවිච්චි කරන්නෙකු නොවේ.
23 එහෙත් (උපදේශය පිලිගැනීමෙන් තොරව) පිටුපා ප්‍රතික්ෂේප කරන්නන් හැර
24 අල්ලාහ් ඔවුන්ව දැඩි දඬුවම මගින් දඬුවම් කරයි. (එය නිරයේ වේදනාවයි.)
25 ඔවුන් (මරණයෙන් මතු) නැවත එන්නේ අප වෙතය.
26 (විනිශ්චය දිනයේ අප වෙත පැමිණී පසු) ඔවුන්ව විභාග කිරීම (දඬුවම් කිරීම) අපේ වගකීමයි.

ترتيبها ٨٩ — سُورَةُ الفَجْرِ — آياتها ٣٠

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

وَٱلْفَجْرِ ﴿١﴾ وَلَيَالٍ عَشْرٍ ﴿٢﴾ وَٱلشَّفْعِ وَٱلْوَتْرِ ﴿٣﴾ وَٱلَّيْلِ إِذَا يَسْرِ
﴿٤﴾ هَلْ فِى ذَٰلِكَ قَسَمٌ لِّذِى حِجْرٍ ﴿٥﴾ أَلَمْ تَرَ كَيْفَ فَعَلَ رَبُّكَ بِعَادٍ
﴿٦﴾ إِرَمَ ذَاتِ ٱلْعِمَادِ ﴿٧﴾ ٱلَّتِى لَمْ يُخْلَقْ مِثْلُهَا فِى ٱلْبِلَٰدِ ﴿٨﴾
وَثَمُودَ ٱلَّذِينَ جَابُوا۟ ٱلصَّخْرَ بِٱلْوَادِ ﴿٩﴾ وَفِرْعَوْنَ ذِى ٱلْأَوْتَادِ ﴿١٠﴾
ٱلَّذِينَ طَغَوْا۟ فِى ٱلْبِلَٰدِ ﴿١١﴾ فَأَكْثَرُوا۟ فِيهَا ٱلْفَسَادَ ﴿١٢﴾ فَصَبَّ
عَلَيْهِمْ رَبُّكَ سَوْطَ عَذَابٍ ﴿١٣﴾ إِنَّ رَبَّكَ لَبِٱلْمِرْصَادِ ﴿١٤﴾ فَأَمَّا
ٱلْإِنسَٰنُ إِذَا مَا ٱبْتَلَىٰهُ رَبُّهُۥ فَأَكْرَمَهُۥ وَنَعَّمَهُۥ فَيَقُولُ رَبِّىٓ أَكْرَمَنِ
﴿١٥﴾ وَأَمَّآ إِذَا مَا ٱبْتَلَىٰهُ فَقَدَرَ عَلَيْهِ رِزْقَهُۥ فَيَقُولُ رَبِّىٓ أَهَٰنَنِ ﴿١٦﴾
كَلَّا ۖ بَل لَّا تُكْرِمُونَ ٱلْيَتِيمَ ﴿١٧﴾ وَلَا تَحَٰٓضُّونَ عَلَىٰ طَعَامِ
ٱلْمِسْكِينِ ﴿١٨﴾ وَتَأْكُلُونَ ٱلتُّرَاثَ أَكْلًا لَّمًّا ﴿١٩﴾
وَتُحِبُّونَ ٱلْمَالَ حُبًّا جَمًّا ﴿٢٠﴾ كَلَّآ إِذَا دُكَّتِ ٱلْأَرْضُ دَكًّا
دَكًّا ﴿٢١﴾ وَجَآءَ رَبُّكَ وَٱلْمَلَكُ صَفًّا صَفًّا ﴿٢٢﴾ وَجِاىٓءَ يَوْمَئِذٍۭ
بِجَهَنَّمَ ۚ يَوْمَئِذٍ يَتَذَكَّرُ ٱلْإِنسَٰنُ وَأَنَّىٰ لَهُ ٱلذِّكْرَىٰ ﴿٢٣﴾

## අල් ෆජ්ර්

1 අරුණෝදය මත දිවුරා කියමි. (මුජාහිද් රහ්මතුල්ලාහි අලෙයිහි තුමා මෙය හජ් උත්සව දිනයේ අරුණෝදය යැයි ප්‍රකාශ කරයි.)

2 (දුල් හජ් මාසයේ මුල්) දවස් දහය මත දිවුරා කියමි.

3 ඉරට්ටේ සංඛයා මතද ඔත්තේ සංඛයා මතද දිවුරා කියමි. (ඉරට්ටේ සංඛයා යනු 'අයියාමුත්තෂ්රීක්' දවස්හි මුල්ම දින දෙක බව ද ඔත්තේ යනු ඒවායෙහි තුන්වන දිනය බව ද ප්‍රකාශ කර ඇත.)

4 එයට ඉදිරියෙන් එන වෙලාවේ රාත්‍රි කාලය මත දිවුරා කියමි.

5 එය බුද්ධිය ඇත්තාට (විශ්වාසය ඇතිකරන) දිවුරිල්ලක් ඇත. (බුද්ධිය ඇත්තා මේවා මත අල්ලාහ් දිවුරා ප්‍රකාශ කිරීමට සුදුසුකම් ඇති ඒවා යැයි දැනගනී.)

6 නුඹේ දෙවියා 'ආද්' සමූහයාට කෙසේ (දඬුවම්) කළේ දැ?'යි නුඹ නොදන්නෙහිද?

7 මහා බල පරාක්‍රමයෙන් යුත් අයවූ 'ඉරම්' පාරම්පරිකයින්ට ද (ඔහු කුමක් කළේදැ?'යි නුඹ නොදන්නෙහිද? 'ඉරම්' යනු ආද් සමූහයාට තවත් නමකි. 'ඉරම්' යනු ඔවුන්ගේ මුත්තාගේ නම බවත් ඔවුන් ජීවත් වූ ස්ථානයේ නම බවත් ප්‍රකාශ වේ.)

8 ඔවුන් වනාහි, ඔවුන් වැනි අය ගම්මානවල මවනු ලැබුවේ නැත. (ඔවුන්ට සමාන බලසම්පන්න වෙනත් අය සිටින ගම්මානයක් මැවුයේ නැත.)

9 තවද බෑවුමෙහි කඳු (නිවාස ලෙස) හැරූ 'සමූද්' සමූහයාට ද (කුමක් කළේ දැයි නුඹ නොදන්නෙහිද? ඔවුහු කඳු හාරා නිවාස තනා ගනිති. ඔවුන්ගේ කඳු බෑවුම 'හිජ්ර්' නමැති ස්ථානයේ හෝ වාදි අල්-කුරා නමැති ස්ථානයේ ඇත.)

10 විශාල සේනාවකින් යුත් ෆිර්අවුන්ටද (අල්ලාහ් කුමක් කළේ දැයි නුඹ නොදන්නෙහිද?)

11 ඔවුහු වනාහි, ගම්මානවල සීමාව ඉක්මවා කටයුතු කළහ.

12 පසුව ඔවුහු කලහය ද අධික කළහ.

13 නුඹේ රක්ෂකයා ඔවුන් මත (ඔවුන්ගේ කලහකාරකම් හේතුවෙන් බරපතල) දඬුවම (මුදා) හළේය.

14 නියත වශයෙන්ම නුඹේ රක්ෂකයා නිරීක්ෂණය කරමින් සිටී.

15 මිනිසා ඔහුගේ රක්ෂකයා ඔහුව පරීක්ෂා කරන්නට මනාප වී (සම්පත් දී) ඔහුට ගරුකර (ඔහුගේ 'රිස්ක්' -අවශ්‍යතා- සියල්ල දී) ඔහුට දයාවන් පහළ කළහොත් මගේ දෙවියා මට ගෞරවය දැක්වූයේ යැයි කියයි.

16 තවදුරටත් ඔහුව පරීක්ෂා කරන්නට මනාප වී ඔහුගේ 'රිස්ක්' (අවශ්‍යතා) සීමාකර දුනහොත් මගේ රක්ෂකයා මාව නින්දාවට ලක් කළේ යැයි අදහස් කරයි. (මෙය ප්‍රතික්ෂේපකයින්ගේ ගුණාංගයකි. විශ්වාස වන්තයෙකු ඔහුට අල්ලාහ් යහපත් ක්‍රියාවන්ට අනුග්‍රහය දැක්වීම ගෞරවයක් කොට සලකයි. ඔහුට පාපක්‍රියාවන්ට අනුග්‍රහය දැක්වීම නින්දාවක් කොට සලකයි.)

17 එසේ නොවේ, එහෙත් නුඹලා (අල්ලාහ් නුඹලාට දයාව පහළ කළ දැයින් ද) අනාථයින්ට ගෞරව නොකරන්නෙහුය.

18 තවද නුඹලා දුප්පතුන්ට ආහාර දීමට (නුඹලාව හෝ අනෙක් අයව හෝ) නොපොළඹ වන්නෙහුය. (එම දුප්පතුන් නුඹලාගේ කිසිඳු ජීවනාදාරයක් නොමැතිවම ජීවත් වී ඒ තත්ත්වයෙන්ම මරණයට ද පත්වෙති.)

19 තවද නුඹලා (අනාථයින්, ස්ත්‍රීන් හා දුබලයින් වැනි අයගේ) අයිතිය අදික වශයෙන් අනුභව කරහුය..

20 තවද නුඹලා වස්තුන්ට ඉතා තදින් ආශා කරන්නෙහුය.

21 එසේ නොව (එසේ නුඹලා නොකරහු.) පොළොව ඉතා තදින් වැඩිවාර ගණනක් සොලවනු ලැබුවහොත්,

22 තවද (තම ගැත්තන් අතරේ විනිශ්චය දීම සඳහා) නුඹලාගේ රක්ෂකයා ද මලක්වරුද පැමිණියහොත්,

23 තවද එම දවසේ නිරය (ලණුවෙන් ඇද) ගෙන එනු ලැබුවහොත්, එම දිනයේ මිනිසා (ඔහු කළ දෑ) සිහිපත් කරයි. (එදින) සිහිපත් කිරීම කෙසේ නම් (ඔහුට ප්‍රයෝජනයක් වෙයි ද?)

24 මා මගේ (පරලොව) ජීවිතයට (යහපත් ක්‍රියා) පෙරටුකර එවන්න තිබුනා නේදැ? යි පවසයි.

25 එම දිනයේ අල්ලාහ් වේදනාවට ලක් කරන්නා සේ වෙන කිසිවෙක් වේදනාවට ලක් නොකරයි.

يَقُولُ يَٰلَيْتَنِى قَدَّمْتُ لِحَيَاتِى ﴿٢٤﴾ فَيَوْمَئِذٍ لَّا يُعَذِّبُ عَذَابَهُۥٓ أَحَدٌ ﴿٢٥﴾
وَلَا يُوثِقُ وَثَاقَهُۥٓ أَحَدٌ ﴿٢٦﴾ يَٰٓأَيَّتُهَا ٱلنَّفْسُ ٱلْمُطْمَئِنَّةُ ﴿٢٧﴾ ٱرْجِعِىٓ
إِلَىٰ رَبِّكِ رَاضِيَةً مَّرْضِيَّةً ﴿٢٨﴾ فَٱدْخُلِى فِى عِبَٰدِى ﴿٢٩﴾ وَٱدْخُلِى جَنَّتِى ﴿٣٠﴾

## سُورَةُ البَلَد

ترتيبها ٩٠ — آياتها ٢٠

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

لَآ أُقْسِمُ بِهَٰذَا ٱلْبَلَدِ ﴿١﴾ وَأَنتَ حِلٌّۢ بِهَٰذَا ٱلْبَلَدِ ﴿٢﴾ وَوَالِدٍ وَمَا وَلَدَ
﴿٣﴾ لَقَدْ خَلَقْنَا ٱلْإِنسَٰنَ فِى كَبَدٍ ﴿٤﴾ أَيَحْسَبُ أَن لَّن يَقْدِرَ عَلَيْهِ
أَحَدٌ ﴿٥﴾ يَقُولُ أَهْلَكْتُ مَالًا لُّبَدًا ﴿٦﴾ أَيَحْسَبُ أَن لَّمْ يَرَهُۥٓ أَحَدٌ
﴿٧﴾ أَلَمْ نَجْعَل لَّهُۥ عَيْنَيْنِ ﴿٨﴾ وَلِسَانًا وَشَفَتَيْنِ ﴿٩﴾ وَهَدَيْنَٰهُ
ٱلنَّجْدَيْنِ ﴿١٠﴾ فَلَا ٱقْتَحَمَ ٱلْعَقَبَةَ ﴿١١﴾ وَمَآ أَدْرَىٰكَ مَا ٱلْعَقَبَةُ ﴿١٢﴾
فَكُّ رَقَبَةٍ ﴿١٣﴾ أَوْ إِطْعَٰمٌ فِى يَوْمٍ ذِى مَسْغَبَةٍ ﴿١٤﴾ يَتِيمًا ذَا مَقْرَبَةٍ
﴿١٥﴾ أَوْ مِسْكِينًا ذَا مَتْرَبَةٍ ﴿١٦﴾ ثُمَّ كَانَ مِنَ ٱلَّذِينَ ءَامَنُوا۟ وَتَوَاصَوْا۟
بِٱلصَّبْرِ وَتَوَاصَوْا۟ بِٱلْمَرْحَمَةِ ﴿١٧﴾ أُو۟لَٰٓئِكَ أَصْحَٰبُ ٱلْمَيْمَنَةِ ﴿١٨﴾ وَٱلَّذِينَ
كَفَرُوا۟ بِـَٔايَٰتِنَا هُمْ أَصْحَٰبُ ٱلْمَشْـَٔمَةِ ﴿١٩﴾ عَلَيْهِمْ نَارٌ مُّؤْصَدَةٌۢ ﴿٢٠﴾

## سُورَةُ الشَّمْس

ترتيبها ٩١ — آياتها ١٥

26 තවද (දම්වැල්වලින් ද, විලංගුවලින් ද) අල්ලාහ් බඳින්නා සේ කිසිවෙක් නොබඳියි.
27 අහෝ (අල්ලාහ්ව සැකයෙන් තොරව විශ්වාස කර තහවුරු කර) සිත සනසාගත් ආත්මය,
28 නුඹට පිරිනමනු ලබන විපාක පිළිගත්තෙකු සේ නුඹේ රක්ෂකයා වෙත එහි.
29 තවද මගේ (යහපත්) ගැත්තන්(ගේ කණ්ඩායමට) නුඹත් ඇතුල් වෙහි.
30 තවද මගේ සවර්ගයට ඇතුල් වෙහි. (ගෞරවය එයයි. ඊට වඩා වෙනත් ගෞරවයක් නොමැත.)

## අල් බලද්

1 මම මෙම (මක්කම) නගරය මත දිවුරමි. (අල්ලාහ් මෙම ශුද්ධ භූමිය වූ මක්කම එහි අගය දැනුවත් කිරීම සඳහා දිවුරා සිටින්නේය. මන්ද එහි කඃබතුල්ලාහ් ඇත. තවද එය ඉස්මායිල් අලෛයිහිස් සලාම් තුමාගේ ද මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාගේද ගම වන්නේය. එමෙන්ම හජ් නමැදුමෙහි වතාවත් ද ඉටු කරනුයේ එහිය.)
2 නුඹලා මේ ගමට ගොඩ බැස සිටින්නෙහුය. (ජිවත් වන්නෙහුය. මෙම ගම නුඹලා ජීවත්වීම හේතුකොට ගෙන මහිමයෙන් ද ගෞරවයෙන් ද අධික විය.)
3 තවද පියා මත ද ඔහු වැදූ දරුවන් මතද දිවුරමි. (ආදම් අලෛයිහිස් සලාම් තුමා මත ද එතුමාගේ පරම්පරාව මත ද නැත්නම් සෑම ජිවියෙකුගේම දෙමව්පියන් මත ද ඒවා වැදූ දෑ මත ද දිවුරමි.)
4 නියත වශයෙන්ම අපි මිනිසා දුෂ්කරතාවන්ට මුහුණ දිය හැකි පරිදි මැව්වෙමු. (ඔහු මියයන තෙක් මෙලොව බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙයි. ඔහු මියගිය වහාම මිනිවලේ ද පරලොව ජීවිතයේ ද දුෂ්කරතාවන්ට මුහුණ දෙයි.)
5 ඔහු (කුමන පාපයක් කළත්) ඔහුට දඬුවම් කිරීමට කිසිවෙක් ශක්තිමත් නොවන්නෙහු යැයි මිනිසා සිතන්නේද.
6 රැස්කරගෙන සිටි (මහා) වස්තුව මම වියදම කර විනාශ කළෙමි'යි ඔහු කියයි.
7 ඔහුව කිසිවෙකු දුටුවේ නැතැයි ඔහු සිතන්නේ ද? (ඔහු කොතැනක සිට හම්බ කර කෙසේ වියදම් කළේ ද යන්න අල්ලාහ් නොදන්නේ යැයි සිතන්නේ ද?)
8 ඔහුට අප ඇස් දෙකක් ඇති නොකළෙමු ද?
9 තවද දිවක් හා තොල් දෙකක් ඇති නොකළෙමු ද?
10 ඔහුට අප (හොඳ නරක යන දෙකේ) මාර්ග දෙක පෙන්වා නොදුනිමු ද?
11 ඔහු අකබා (බාධක) පසුකර යා යුතු නොවේ ද? (ඔහුටත් අල්ලාහ්ටත් අවනතවීමටත් අතර බාධක වන කරුණු ඉරාදමා පසුකර යා යුතු නොවේ ද?)
12 අකබා (බාධක) යනු කුමක් දැ?යි නුඹට දැන්වූයේ කුමක් ද?
13 (එය) වහලෙකු (නිදහස ලබා දී) මුදවා හැරීමය.
14 නැතිනම් (ආහාර හිඟයක් ඇති) සාගත දිනයක ආහාර දීමයි.
15 ඥාතියෙකු වූ අනාථයෙකුට (පියා නොමැති ළමයෙකුට ආහාර දීමය.)
16 නැතිනම් ඉතාමත් දිළිඳුකමින් යුත් දුප්පතෙකුට (ආහාර දීමය.)
17 (මේවා ඉටුකිරීමෙන්) පසුව ඔහු විශ්වාස කර (යහ ක්‍රියා කර)න්නෙකු විය යුතු නොවේද? (මන්ද මෙ නමැදුම මුඃමින්වරුන්ට පමණක් ප්‍රයෝජනවත් වෙයි. තවද ඔවුන් නමැදුම් වත්පිළිවෙත් කිරීමෙනුත් පාපයන්ගෙන් මිදීමෙනුත් පරීක්ෂණ අවස්ථාවලදීත් ඉවසා ගන්නා ලෙස) තවද එකිනෙකාට ඉවසීම පිළිබඳව උපදෙස් දී (අල්ලාහ් ගේ ගැත්තන්ට) සෙනෙහස දක්වා එතුළිනත් එකිනෙකාට උපදෙස් දෙන අයගෙන් කෙනෙකු බවට ඔවුන් පත්විය යුතු නොවේ ද?
18 ඔවුහුමය (එනම් ඉහත සඳහන් යහපත් ගතිගුණ ඇත්තෝ) දකුණ(පැත්ත)ට හිමි අය වන්නෝ.
19 කවරෙකු අපගේ වදන් ප්‍රතික්ෂේප කළේ ද ඔවුහුමය මෂ්අමාවට (වම් පැත්තට) හිමි අය වන්නෝ. (මෂ්අමා යන වම් පැත්තට හිමි උදවියට සූදානම් කර ඇති ඇවිලෙන ගින්නයි.)
20 ඔවුන් මත (සෑම දිසාවෙන්ම) ආවරණය කළ නිරය ඇත.)

## අෂ්-ෂම්ස්

1 සූර්යයා මත ද එහි දීප්තිය මත ද දිවුරමි. (ලුහා යනු සූර්යයා පහළ අහසින් උදාවී එහි ආලෝකය සම්පූර්ණයෙන් විහිදුවන වේලාවයි.)
2 (සූර්යයා අවරට ගිය පසු) එයට සමීපයෙන් එන තත්ත්වයේ චන්ද්‍රයා මත දිවුරමි.
3 තවද එය (දහවල් කාලයේ සූර්යයාව) පැහැදිලි එකක් බවට පත්කරන දහවල මත දිවුරමි.

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

وَالشَّمْسِ وَضُحَاهَا ﴿١﴾ وَالْقَمَرِ إِذَا تَلَاهَا ﴿٢﴾ وَالنَّهَارِ إِذَا جَلَّاهَا ﴿٣﴾
وَاللَّيْلِ إِذَا يَغْشَاهَا ﴿٤﴾ وَالسَّمَاءِ وَمَا بَنَاهَا ﴿٥﴾ وَالْأَرْضِ وَمَا طَحَاهَا
﴿٦﴾ وَنَفْسٍ وَمَا سَوَّاهَا ﴿٧﴾ فَأَلْهَمَهَا فُجُورَهَا وَتَقْوَاهَا ﴿٨﴾ قَدْ
أَفْلَحَ مَنْ زَكَّاهَا ﴿٩﴾ وَقَدْ خَابَ مَنْ دَسَّاهَا ﴿١٠﴾ كَذَّبَتْ ثَمُودُ
بِطَغْوَاهَا ﴿١١﴾ إِذِ انْبَعَثَ أَشْقَاهَا ﴿١٢﴾ فَقَالَ لَهُمْ رَسُولُ اللَّهِ
نَاقَةَ اللَّهِ وَسُقْيَاهَا ﴿١٣﴾ فَكَذَّبُوهُ فَعَقَرُوهَا فَدَمْدَمَ
عَلَيْهِمْ رَبُّهُمْ بِذَنْبِهِمْ فَسَوَّاهَا ﴿١٤﴾ وَلَا يَخَافُ عُقْبَاهَا ﴿١٥﴾

ترتيبها ٩٢ — سُورَةُ اللَّيْلِ — آياتها ٢١

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

وَاللَّيْلِ إِذَا يَغْشَىٰ ﴿١﴾ وَالنَّهَارِ إِذَا تَجَلَّىٰ ﴿٢﴾ وَمَا خَلَقَ الذَّكَرَ وَالْأُنْثَىٰ ﴿٣﴾
إِنَّ سَعْيَكُمْ لَشَتَّىٰ ﴿٤﴾ فَأَمَّا مَنْ أَعْطَىٰ وَاتَّقَىٰ ﴿٥﴾ وَصَدَّقَ بِالْحُسْنَىٰ ﴿٦﴾
فَسَنُيَسِّرُهُ لِلْيُسْرَىٰ ﴿٧﴾ وَأَمَّا مَنْ بَخِلَ وَاسْتَغْنَىٰ ﴿٨﴾ وَكَذَّبَ بِالْحُسْنَىٰ
﴿٩﴾ فَسَنُيَسِّرُهُ لِلْعُسْرَىٰ ﴿١٠﴾ وَمَا يُغْنِي عَنْهُ مَالُهُ إِذَا تَرَدَّىٰ ﴿١١﴾ إِنَّ عَلَيْنَا
لَلْهُدَىٰ ﴿١٢﴾ وَإِنَّ لَنَا لَلْآخِرَةَ وَالْأُولَىٰ ﴿١٣﴾ فَأَنْذَرْتُكُمْ نَارًا تَلَظَّىٰ ﴿١٤﴾

4 එය (සූර්යයාව, තම අඳුරෙන්) වසා ගන්නා රාත්‍රි කාලය මත දිවුරමි.
5 අහස මත ද එය නිර්මාණය කළ අය මත ද දිවුරමි.
6 පොළොව මත ද (එය සෑම පැත්තකින්ම) සමතලා කර (විශාල කළ) අය මත ද දිවුරමි.
7 ආත්මය මත ද එය සැලසුම් කළ අය මත ද දිවුරමි. (එහි අවයව නිර්මාණය කර ඒවාට ප්‍රාණය ලබා දී ඔහුට මනෝ ශක්තිය ද ලබා දී ආශ්චර්යමත්වූ උපදෙස් ද සකස්කර දුන්නේය. තවද ස්ථිරව සිටිය හැකි ලෙස ද ඇති කළේය. නබි තුමාණෝ මෙසේ පැවසූහ: සෑම දරුවෙකුම ආගම පිළිගත හැකි තත්ත්වයේම උපන්නේය. ඔහුව යුදෙව්වෙක්, ක්‍රිස්තියානියෙක් හා අග්නි වන්දනාකරුවෙක් බවට පත් කරනුයේ ඔහුගේ දෙමව්පියන්ය.)
8 පසුව ඔහු එය(ආත්මය)ට එහි හානි කර දෑ ද එයට දේව බිය ඇතිවිය හැකි කරුණු ද දැනුවත් කළේය.
9 එය පිවිතුරු කළ තැනැත්තා ස්ථිර වශයෙන්ම ජයගත්තේය. (තම සිත පිවිතුරු කර දේව බියෙන් යුතුව එය උසස් කරන්නා පරලොව දී තමාට මනාප වූ සියල්ල ලබාගනී.)
10 එය අපවිත්‍ර කළ තැනැත්තා සථිරවශයෙන් ම පාඩු ලැබුවේය. (පාපයන් මගින් මං මුළාවට පත්කර පහත් තත්ත්වයට සිත ගමන් කරවූ තැනැත්තා පාඩු ලැබුවේය.)
11 'සමූද්' ගෝත්‍රිකයින් වන ඔවුහු (පාපයන්හි) සීමාව ඉක්මවා යාම තුළින් බොරු කළහ.
12 ඔවුනතර ඉතාමත් අභාග්‍යවන්තයා නැගී සිටිය වේලාවේ (බොරු කළහ. ඔහු කුදාර් බින් සාලිබ් නමැත්තාය. සාලිහ් අලෙයිහිස් සලාම් තුමාගේ ඔටුවා ඔහු කැපීය.)
13 අල්ලාහ්ගේ දූතයා අල්ලාහ්ගේ ඔටුවා ද උගේ ජලය ද අතහරිනු (ඒ දෙකට නුඹලා අත නොගසනු) යැයි ඔවුනට කීය.
14 ඔවුහු එය බොරු කළහ. ඔටුවා මරා දැමූහ. ඔවුන්ගේ පාපයන් හේතු කොටගෙන ඔවුන්ගේ රක්ෂකයා ඔවුන් මත (තම දඬුවම) වසා ගැනීමට සලස්වා. (ඔවුන්ව පසට යටකර) එම භූමිය සමතලා කළේය.
15 එහි අවසානය පිළිබඳව ඔහු බියවන්නේ නැත.

## අල් - ලෙයිල්

1 රාත්‍රිය මත දිවුරමි. එය වසාගන්නා වේලාවේ.
2 දහවල මත දිවුරමි. එය පිටවන වේලාවේ.
3 ගැහැණිය හා පිරිමියාව මැවූ අය මත දිවුරමි.
4 නියත වශයෙන් නුඹලාගේ උත්සාහය විවිධාකාරය (ඒවායින් සමහරක් ස්වර්ගයට අයත් වත්පිළිවෙත්ය. තවත් සමහරක් නිරයට අයත් වත්පිළිවෙත් ය. තමාව මුදවා ගැනීමට උත්සාහ කරන්නන් ද සිටී. තමාව විනාශ කර ගන්නට උත්සාහ කරන්නන් ද සිටී.
5 කවරෙකු (තම සම්පත් යහපත් මාර්ගයේ) ලබා දී (තහනම් කළ දැයින්) වැළකී සිටින්නේද
6 තවද (අල්ලාහ් ප්‍රතිවිපාක දෙන්නේ යැයි ඔහුගේ පොරොන්දු) සැබෑ කරමින් විශ්වාස කරන්නේ ද
7 ඔහුට අප පහසුව කරා (යහපත් මාර්ගයේ යාම වැනි කටයුතු) පහසු කරන්නෙමු. (මෙම වදන් අබූ බක්ර් රළියල්ලාහු අන්හු තුමා විෂයෙහි පහළ වූ ඒවාය. අල්ලාහ් වෙනුවෙන් වේදනාවට ලක්වෙමින් මක්කමේ 'කාෆිර්' වරුන් යටතේ සිටි වහලුන් හය දෙනෙකුව මිලට ගෙන එතුමා නිදහස දුන්නේය.)
8 කවරෙකු මසුරුකම් කර (කුසල් පිළිබඳව) අවශ්‍යතාවෙන් තොරව සිටින්නේ ද
9 තවද (අල්ලාහ්ගේ පොරොන්දු) බොරු කරන්නනේද
10 ඔහුට අපි දුෂ්කරතාව කරා (නිරයේ ක්‍රියාවන් කරා) පසුකරන්නෙමු.
11 ඔහු (නිරයට) වැටෙයි නම් ඔහුගේ වස්තුව (අල්ලාහ්ගේ දඬුවම වැලක්වීම සම්බන්ධයෙන්) කිසිඳු ඵලක් නොවන්නේය.
12 නියත වශයෙන්ම (මංමුළාවෙන් තොරව) ඍජු මග පැහැදිලි කිරීම අපේ වගකීමකි. (ෆර්රාහ් රළියල්ලාහු අන්හු තුමා මෙසේ කියයි: ඍජු මග ගමන් කිරීමට යමෙක් උනන්දු වෙයි නම් ඔහුට මගපෙන්වීම අල්ලාහ්ගේ වගකීමකි. තවදුරටත් ඔහු මෙසේ කියයි: කවරෙකු හෝ අල්ලාහ්ව අපේක්ෂා කරයි නම් අල්ලාහ් එම මගෙහි සිටී. අල්ලාහ්ව (ළංකර ගැනීමට) කවරෙකු හෝ ප්‍රිය කරයි නම් ඔහු ඍජු මග ලබන්නේය.
13 නියත වශයෙන්ම පරලොව (ඇති සියලු දෑ) ද මෙලොව (ඇති සියලු දෑ) ද අපට අයත්ය. (අපි කැමති විදිහට ඒවායෙහි කටයුතු කරන්නෙමු.)
14 පිලිස්සී දැවෙන (නිරයේ) ගින්න නුඹලාට මම අවවාද කරමි.
15 ඉතාමත් අභාග්‍ය සම්පන්න තැනැත්තා මිස (වෙන කිසිවෙකු) එහි ඇතුල් නොවෙයි. (ඔහු දෙවියන් ප්‍රතික්ෂේප කළ අය වන්නේය. ඔහු එයට

لَا يَصْلَىٰهَآ إِلَّا ٱلْأَشْقَى ﴿١٥﴾ ٱلَّذِى كَذَّبَ وَتَوَلَّىٰ ﴿١٦﴾ وَسَيُجَنَّبُهَا
ٱلْأَتْقَى ﴿١٧﴾ ٱلَّذِى يُؤْتِى مَالَهُۥ يَتَزَكَّىٰ ﴿١٨﴾ وَمَا لِأَحَدٍ عِندَهُۥ مِن
نِّعْمَةٍ تُجْزَىٰٓ ﴿١٩﴾ إِلَّا ٱبْتِغَآءَ وَجْهِ رَبِّهِ ٱلْأَعْلَىٰ ﴿٢٠﴾ وَلَسَوْفَ يَرْضَىٰ ﴿٢١﴾

## سُورَةُ الضُّحَىٰ

ترتيبها ٩٣ — آياتها ١١

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

وَٱلضُّحَىٰ ﴿١﴾ وَٱلَّيْلِ إِذَا سَجَىٰ ﴿٢﴾ مَا وَدَّعَكَ رَبُّكَ وَمَا قَلَىٰ ﴿٣﴾
وَلَلْءَاخِرَةُ خَيْرٌ لَّكَ مِنَ ٱلْأُولَىٰ ﴿٤﴾ وَلَسَوْفَ يُعْطِيكَ رَبُّكَ
فَتَرْضَىٰٓ ﴿٥﴾ أَلَمْ يَجِدْكَ يَتِيمًا فَـَٔاوَىٰ ﴿٦﴾ وَوَجَدَكَ ضَآلًّا
فَهَدَىٰ ﴿٧﴾ وَوَجَدَكَ عَآئِلًا فَأَغْنَىٰ ﴿٨﴾ فَأَمَّا ٱلْيَتِيمَ فَلَا تَقْهَرْ
﴿٩﴾ وَأَمَّا ٱلسَّآئِلَ فَلَا تَنْهَرْ ﴿١٠﴾ وَأَمَّا بِنِعْمَةِ رَبِّكَ فَحَدِّثْ ﴿١١﴾

## سُورَةُ الشَّرْحِ

ترتيبها ٩٤ — آياتها ٨

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

أَلَمْ نَشْرَحْ لَكَ صَدْرَكَ ﴿١﴾ وَوَضَعْنَا عَنكَ وِزْرَكَ ﴿٢﴾ ٱلَّذِىٓ
أَنقَضَ ظَهْرَكَ ﴿٣﴾ وَرَفَعْنَا لَكَ ذِكْرَكَ ﴿٤﴾ فَإِنَّ مَعَ ٱلْعُسْرِ يُسْرًا ﴿٥﴾ إِنَّ
مَعَ ٱلْعُسْرِ يُسْرًا ﴿٦﴾ فَإِذَا فَرَغْتَ فَٱنصَبْ ﴿٧﴾ وَإِلَىٰ رَبِّكَ فَٱرْغَب ﴿٨﴾

ඇතුල් වී එහි උෂ්ණය අත් විඳී)

16 ඔහු වනාහි (නබිවරුන් ගෙනා සත්‍යයන්) බොරුකර, (ඒවා විශ්වාස කිරීමෙන් හා අවනත වීමෙන්) පසුබට වූවෙකි.

17 (ප්‍රතික්ෂේප කිරීමෙන් තදින්ම වළකින) බිය බැතිකම ඇත්තා එයින් දුරස්ථ කරනු ලබන්නේය. (අල්-වාහිදී නමැත්තා මෙසේ කියයි:- ඔහු අබූ බක්කර් රළියල්ලාහු අන්හු තුමා බව විවරණකරුවන් හැමදෙනාගේම අදහස වන්නේය. එනම් ඔහුගේ විෂයෙහි පහළ වූ මෙම වැකියේ යහපත හැමෝටම පොදුවන්නේය.)

18 ඔහු වනාහි තමාගේ වස්තුව සුවිශුද්ධ විය යුතුයි යන අරමුණින් (අල්ලාහ් වෙනුවෙන්) දෙන්නේය.

19 ඔහුට කිසිවෙකු ප්‍රතිඋපකාර කළයුතු දානයක් ඔහු ළඟ නැත. (අනුන්ගේ ප්‍රති උපකාර බලාපොරොත්තුවෙන් ඔහු දන් නොදෙයි.)

20 ඉතා උසස්වූ ඔහුගේ රක්ෂකයාගේ තෘප්තිය සොයාගැනීම හැර (ඔහු ළඟ වෙන අරමුණක් නැත.)

21 (අල්ලාහ් ඔහුට පිරිනමන ප්‍රතිඵල බලා) ඔහු (පරලොවදී) තෘප්තිමත් වෙන්නේය.

## අල්-ළුහා

නබි තුමාණෝ දින දෙකක් හෝ තුනක් අසනීප වී සිටියහ. ගැහැණියක් එතුමා වෙතට පැමිණ 'මුහම්මද්' ඔබේ ෂෙයිතාන් ඔබව අත්හළ බවට මම අදහස් අදහස් කරමි. මන්ද දින දෙකක් හෝ තුනක් ඔහු ඔබ වෙත ළං වූයේ නැතැ" යි පැවසුවාය. එම අවස්ථාවේ අල්ලාහ් මෙම පරිච්ඡේදය පහළ කළේය.

1 'ළුහා'වෙහි වේලාව මත දිවුරමි. (ළුහා යනු සූර්යයා යටි අහසෙන් මතු වී එන වේලාවයි.)

2 රාත්‍රි කාලය මත දිවුරමි. එය (දවාල) වසාගන්නා වේලාවේ.

3 නුඹේ රක්ෂකයා නුඹව අත් හළේ නැත. (වහිය නවත්වා ඇතැයි කියන්නා කියන අයුරින් නුඹව අත් හළේ නැත.)

4 (නබිත්වයේ මහිමයන් ලෝකයේ ප්‍රදානය කරනු ලැබුවද) පරලොව (ලැබෙන සවර්ගය) නුඹට අගනේය.

5 නුඹේ රක්ෂකයා (ආගමේ ජයග්‍රහණය ද 'හව්ළුල් කව්සර්' නමැති තටාකය, යහ විපාක නිර්දේශීය -අනුකම්පා බස් දෙඩීම- යනාදිය ද) නුඹට දෙන්නේය. එවිට නුඹ තෘප්තිමත් වන්නේය.

6 ඔහු නුඹව පියා නොමැති අනාථයෙකු බව දැක නුඹට යායුතු තැනක් පිළියෙල කර නොදුන්නේ ද?

7 නුඹව ඔහු (ඍජු මාර්ගයෙන්) මුළා වූවෙකු ලෙස දැක (නුඹට අල් කුර්ආනය පහළ කර) ඍජු මඟ නොපෙන්වූයේද?

8 නුඹව ඔහු (පවුලක් සහිත, සම්පත් නොමැති) දුප්පතෙකු ලෙස දැක නුඹට (ජීවනාධාර ලබා දී) පහසුකම් ලබානොදුන්නේ ද?

9 නුඹ අනාථයින්ව (ඔහුට බලය යොදා ඔහුට අසාධාරණ කර) මර්ධනය කරන්නට උත්සාහ නොකරහි. (නුඹ අනාථයෙකුව සිටි බව සිහිපත්කර ඔහුගේ අයිතීන් ලබා දෙහි.)

10 තවද නුඹ යාචකයාව නොඑලවහි. (නුඹ දුප්පතෙකුව සිටි බව සිහිපත් කර ඔහුට දෙහි. නැත්නම් සැහැල්ලු වදන් පවසා යවහි.)

11 නුඹගේ රක්ෂකයාගේ දායාදයන් නුඹ (ජනතාවට) දැනුම් දෙහි. (මන්ද දායාදයන් නොසඟවා පෙන්වා දීමක් ඒවාට කළගුණ සැලකීමක් වන්නේය.)

## අලම් නෂ්රහ්

1 (නබිවරයාණනි,) අප නුඹට නුඹේ හදවත (නබිත්වය පිළිගෙන එහි බර දරාගත හැකි පරිදි) පුළුල් නොකළෙමු ද? (ඒ නිසාම කැඳවුම් මෙහෙය ඉටු කිරීමට ද නබිත්වයේ බර දරාගැනීමට ද වහීය මනනය කර ගැනීමට ද ශක්තිය ලැබුවෙහිය.)

2 නුඹේ බර නුඹෙන් ඉවත දැමුවෙමු. (නුගත් යුගයේ කරමින් සිටි දෑ නුඹෙන් ඉවත් කර ක්ෂමාව දුනිමු.)

3 ඒවා කෙසේ වීදයත් ඒවා නුඹේ පිටකොන්දට බරක් වී තිබුණි.

4 (මෙලොවද පරලොව ද) අපි නුඹගේ තත්ත්වය (විවිධාකාරව) උසස් කර ඇත්තෙමු. (අල්ලාහ් ගැන සාක්ෂි කීම හා නුඹ ගැන සාක්ෂි කීම අනිවාර්ය කිරීම, අදාන් හි නුඹේ නම කියවීම හා නුඹේ නමින් සලවාත් කීම යනාදිය ඉන් සමහරෙකි.)

5 නියත වශයෙන්ම (මෙම) දුෂ්කරතාවත් සමඟ පහසුව ඇත.

6 නියත වශයෙන් (මෙම) දුෂ්කරතාවත් සමඟ පහසුව ඇත.

7 නුඹ (සලාතය හෝ කැඳවීම් මෙහෙවර හෝ යුද්ධය) අවසන් කළෙහි නම් (ප්‍රාර්ථනයේ හා වත්පිළිවෙත්වල) උද්යෝගිමත්ව යෙදෙහි.

## سُورَةُ التِّينِ

ترتيبها ٩٥ — آياتها ٨

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

وَٱلتِّينِ وَٱلزَّيْتُونِ ﴿١﴾ وَطُورِ سِينِينَ ﴿٢﴾ وَهَٰذَا ٱلْبَلَدِ ٱلْأَمِينِ ﴿٣﴾
لَقَدْ خَلَقْنَا ٱلْإِنسَٰنَ فِىٓ أَحْسَنِ تَقْوِيمٍ ﴿٤﴾ ثُمَّ رَدَدْنَٰهُ أَسْفَلَ سَٰفِلِينَ
﴿٥﴾ إِلَّا ٱلَّذِينَ ءَامَنُوا۟ وَعَمِلُوا۟ ٱلصَّٰلِحَٰتِ فَلَهُمْ أَجْرٌ غَيْرُ مَمْنُونٍ ﴿٦﴾
فَمَا يُكَذِّبُكَ بَعْدُ بِٱلدِّينِ ﴿٧﴾ أَلَيْسَ ٱللَّهُ بِأَحْكَمِ ٱلْحَٰكِمِينَ ﴿٨﴾

## سُورَةُ الْعَلَقِ

ترتيبها ٩٦ — آياتها ١٩

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

ٱقْرَأْ بِٱسْمِ رَبِّكَ ٱلَّذِى خَلَقَ ﴿١﴾ خَلَقَ ٱلْإِنسَٰنَ مِنْ عَلَقٍ ﴿٢﴾ ٱقْرَأْ وَرَبُّكَ
ٱلْأَكْرَمُ ﴿٣﴾ ٱلَّذِى عَلَّمَ بِٱلْقَلَمِ ﴿٤﴾ عَلَّمَ ٱلْإِنسَٰنَ مَا لَمْ يَعْلَمْ ﴿٥﴾ كَلَّآ إِنَّ
ٱلْإِنسَٰنَ لَيَطْغَىٰٓ ﴿٦﴾ أَن رَّءَاهُ ٱسْتَغْنَىٰٓ ﴿٧﴾ إِنَّ إِلَىٰ رَبِّكَ ٱلرُّجْعَىٰٓ ﴿٨﴾ أَرَءَيْتَ
ٱلَّذِى يَنْهَىٰ ﴿٩﴾ عَبْدًا إِذَا صَلَّىٰٓ ﴿١٠﴾ أَرَءَيْتَ إِن كَانَ عَلَى ٱلْهُدَىٰٓ ﴿١١﴾ أَوْ أَمَرَ
بِٱلتَّقْوَىٰٓ ﴿١٢﴾ أَرَءَيْتَ إِن كَذَّبَ وَتَوَلَّىٰٓ ﴿١٣﴾ أَلَمْ يَعْلَم بِأَنَّ ٱللَّهَ يَرَىٰ ﴿١٤﴾ كَلَّا لَئِن
لَّمْ يَنتَهِ لَنَسْفَعًۢا بِٱلنَّاصِيَةِ ﴿١٥﴾ نَاصِيَةٍ كَٰذِبَةٍ خَاطِئَةٍ ﴿١٦﴾ فَلْيَدْعُ نَادِيَهُۥ
﴿١٧﴾ سَنَدْعُ ٱلزَّبَانِيَةَ ﴿١٨﴾ كَلَّا لَا تُطِعْهُ وَٱسْجُدْ وَٱقْتَرِب ۩ ﴿١٩﴾

8 තමා (නිරයට බියෙන් ද සවර්ගය කෙරෙහි ආශාවෙන් ද) නුඹේ රක්ෂකයා වෙත යාඥා කරහි.

## අත්-තීන්

1 (මිනිසා ආහාර වශයෙන් ගන්නා) අත්තික්කා මත ද (ඔවුන් තෙල් හිඳගන්නා) ඔලිව් මත ද දිවුරමි. (මේ ගෙඩි දෙක ගැන පවසමින් අල්ලාහ් අදහස් කරනුයේ ඒවා වැවෙන ස්ථානය වන පලස්තීනයයි.)
2 'සීනායි' කන්ද මත ද දිවුරමි. (අල්ලා මූසා අලෙයිහිස් සලාම් සමග කථා කළේ මේ කන්දේ දීය.)
3 අභය ලබා දෙන මෙම නගරය (මක්කම) මත දිවුරමි. (මෙම නගරය ආරක්ෂා සහිත ස්ථානයක් බැවින් මෙයට 'අමීන්' යනුවෙන් සඳහන් කරනු ලැබීය. මූසා තුමා, ඊසා තුමා, මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමා ආදි තිදෙනාටම වහී පහළ වූ ප්‍රදේශ වශයෙන් මෙම ස්ථාන තුනම පෙනෙන්නට ඇති නිසා අල්ලාහ් මේවා මත දිවුරුවේය. ආගම් තුනම මේවායෙහිම පහළ විය. මේවායේ සිටම මිනිසුන්ට සෘජුමග නමැති ආලෝකය විහිදුනේය.)
4 ස්ථිර වශයෙන්ම අපි ලස්සන පෙනුමකින්ම මිනිසාව මැව්වෙමු. (ලස්සන දේහය ඇත්තෙකු ලෙස ද තම ආහාරය තම අතින් අනුභව කරන්නෙකු ලෙස ද සැලසුම් කරන්නෙකු ලෙස ද මැව්වේය. තවද දැනුම හා හැකියාව ඇත්තෙකු ලෙස ද කතාකළ හැකි අයෙකු ලෙස ද මැව්වේය. මේ නිසා අල්ලාහ් මනාප පරිදි ඔහුගේ නියෝජිතයෙකු ලෙස ඔහුට ලෝකයේ ජීවත්විය හැකිවිය.)
5 පසුව ඔහුව පහත් අයගෙන් පහත්ම අය බවට පත් කළෙමු. (වැදගත් රුවකින් මවනු ලැබූ මිනිසා තමන් කළ පාප ක්‍රියාවන් නිසා තිරිසන් සතුන්ටත් වඩා නරක තත්ත්වයට පත් වී ඉතා පහත් තත්ත්වයටම යන්නේය. තවද නිරයේද ඔහු ඉතා පහත් අඩියටම යන්නේය.)
6 විශ්වාස කර යහපත් ක්‍රියාවන් කළ අය හැර (ඔවුහු පහත් තත්ත්වයට තල්ලු කරනු නොලබති. ඒ වෙනුවට ඔවුහු අල්ලාහ්ගේ විශාල වූ සවර්ගයට පිවිසෙන්නෝය. ඔවුනට අඛණ්ඩවූ (සථාවරවූ) ප්‍රතිඵල ඇත.
7 (අහෝ මනුෂ්‍යය, 'නුඹට අල්ලාහ් ලස්සන පෙනුමකින් මැවූ බවත් ඔහුට වෙනස්කම් කර ප්‍රතික්ෂේප කරන අවස්ථාවේ ඉතා පහත් තත්ත්වයට පත්කරන බවත් නුඹ දැනගත් පසුවත්) නුඹව පරලොව බොරු කරන්නෙකු බවට පත්කළේ කුමක් ද?
8 අල්ලාහ් විනිශ්වය කරන්නන් අතර ඉතා (සාධාරණව) විනිශ්වය කරන්නෙකු වූයේ නැද්ද? (වැදගත් පෙනුමකින් මවනු ලැබූ මිනිසා විශ්වාස නොකිරීම නිසා ඉතා පහත් එකෙකු බවට ද විශ්වාස කර යහපත් ක්‍රියා කරන විට ඉතා උසස් එකෙකු බවට ද පත්කරවන්නේය.)

## අල් අලක්

මෙහි මුල් වාක්‍ය පහ මුළින්ම පහළ වූ ඒවාය.
1 (මුහම්මද්, මැවීම් සියල්ල මැවූ) නුඹේ රක්ෂකයාගේ නම ප්‍රකාශ කර (ආරම්භ කරන්නෙකුව) කියවහි.
2 ඔහු මිනිසාව ලේ කැටියකින් මැව්වේය. (ආරම්භයේ ශුක්‍රානු බිංදුවකින් මවා පසුව එය ලේ කැටියක් ලෙස වෙනස් වෙයි. එසේ මිදුන රුධිරය කැටියක් බවට පත්වෙයි.)
3 නුඹ කියවහි. නුඹේ දෙවියා ඉතාමත් පරිත්‍යාගශීලීය. (නුඹ අකුරු නොහඳුනන අයෙකු වුවද නුඹට වාක්‍ය කියවීමට සැලැස්වූයේ ඔහුගේ පරිත්‍යාගශීලීභාවයේ මහිමය නිසාය.)
4 ඔහු පෑනෙන් (ලියන්නට) ඉගැන්වූයේය. (අල්ලාහ් ඉස්ලාමිය ප්‍රචාරය කියවීමට හා ලිවීමට ඇරයුම් කිරීම තුළින් ආරම්භ කළේය. හේතුව ඒ දෙකෙන් ඉතා විශාල ප්‍රයෝජන ඇති නිසාය.)
5 මිනිසාට නොදන්න දෑ ඔහු (අල්ලාහ්) ඉගැන්වූයේය.
6 නියත වශයෙන්ම මිනිසා සීමාව ඉක්මවා ක්‍රියා කරයි.
7 (තම වස්තුව හා ශක්තිය හේතුකොටගෙන අල්ලාහ්ගේ) අවශ්‍යතාව නැතැයි අදහස් කළ නිසා (ඔහු සීමාව ඉක්මවා කටයුතු කරයි.)
8 නියත වශයෙන්ම (මරණයෙන් පසු) නැවත යෑම පවතිනුයේ නුඹේ රක්ෂකයා වෙතමය. (වෙන කෙනෙකු වෙතට නොවේ.)
9 කවරෙකු වළක්වන්නේ ද, ඔහුව නුඹ දුටුවෙහි ද?
10 ගැත්තෙකුව (නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ව) ඔහු සලාතයේ යෙදෙන විට (ඔහු වළක් වන්නේය. ඔහුව නුඹ දුටුවෙහි ද?)
11 ඔහු (මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමා) සෘජුමගෙහි සිටිය ද (ඔහු වැළැක්වීම) නුඹ දුටුවෙහි ද? ඔහු ගෙන් වළක්වනු ලබන ගැත්තා සෘජුමගෙහි සිටිය ද ඔහු වළක් වන්නට උත්සාහ කරයි)
12 නැතිනම් ඔහු (චිත්ත පාරිශුද්ධත්වය, ඒකීයත්වය ආදි නිරයෙන්) ආරක්ෂා කළ හැකි දෑ ගැන විධානය

කළ ද (ඔහු වළක්වන්න උත්සාහ කරයි.)
13 (වළක්වන) ඔහු (අබූ ජහ්ල්, අල්ලාහ්ගේ දූතයාණන් ගෙන ආ දැය බොරු කර (විශ්වාස කිරීමෙන්) පසුබසින විට (ඔහු වළැක්වීමට උත්සාහ දැරීම) නුඹ දුටුවෙහි ද?
14 (ඔහුගේ තත්ත්වය) අල්ලාහ් බලා සිටින බව ඔහු නොදන්නේ ද? (එහෙයින් අල්ලාහ් ඔහුට විපාක දෙන්නේය. මෙසේ තිබිය දී නබිව වළක්වන්නට ඔහු එඩිතරවන්නේ කෙසේ ද?)
15 ඔහු එසේ නොකළ යුතුය. එයින් ඔහු වැළකුණේ නැතිනම් (මෙය ඔහුට අවවාදයකි.) ඔහුගේ නළලේ ඉදිරි රෝමවලින් අල්ලා ඇද වීසිකරන්නෙමු.
16 බොරු කියන, පව්කරන නළලේ ඉදිරි රෝම (අල්වා ඇද වීසිකරන්නෙමු. එම නළලේ ඉදිරි රෝම ඇත්තා පව්කාරයෙකි.)
17 ඔහු තම සභාවට එක්විය හැකි අයව කැඳවත්වා, (අබූ ජහ්ල් නබි තුමන් අමතා මෙම කඳු බෑවුමේ ලොකු සභාවක් ඇත්තේ මටයි යැයි උඩඟුකමින් කීය. එවිට මෙම වැකිය පහළ විය.)
18 අපි (ඔහුව අල්ලා නිරයට දැමීම සඳහා නිරයේ වේදනාව ලබා දෙන දැඩි මලක්වරුන් වන) සබානියාවරුන් කැඳවන්නෙමු.
19 එසේ නොව නුඹ (සලාතය අත්හරින මෙන් නුඹට කැඳවූ විෂයෙහි) ඔහුට යටහත් නොවහි. (නුඹලා ඔහු ගැන නොසලකා) සජ්දා කර (සලාතය ඉටුකර අල්ලාහ්ට)ළංවහු.

## අල් - කද්ර්

1 නියත වශයෙන්ම එය (අල්-කුර්ආනය) අපි අති ගෞරවණීය රාත්‍රියෙහි පහළ කෙළෙමු. (ලව්හුල් මහ්ෆූල් සිට පහළ අහසට මුළුමනින් පහළ කර වසර 23 ක කාලයක් පුරා නබි සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්ට පහළ විය. මෙම රාත්‍රිය කුර්ආනය පහළ වූ මාසය වන රාම්සාන් හි අවසාන දින දහසේ ඇතුළත්ය. එම දිනය සඳහන් කිරීම පිළිබඳව හදීස්වල මතභේද පවතී.)
2 අති ගෞරවනීය රාත්‍රිය කුමක් දැ?යි නුඹට දැනුම් දුන්නේ කුමක් ද? (ලෙයිලතුල් කද්ර්' යැයි නම් කිරීමට හේතුව එම රාත්‍රියේ අල්ලාහ් ඊළඟ අවුරුද්දෙහි සිදුවීම් සැලසුම් කරන බැවින් හෝ මෙම රාත්‍රිය වැදගත්කමින් හා මහිමයෙන් යුත් එකක් වන නිසාය.)
3 ගෞරවනීය රාත්‍රිය මස දහසකට වඩා අගනේය. (එය එක් රාත්‍රියක් වුව ද එහි යහපත් ක්‍රියා කිරීම මාස දහසක් යහපත් ක්‍රියා කිරීමට වඩා අගනේය.)
4 එහි (එම රාත්‍රියෙහි) මලක්වරුන් ද 'රූහ්' (නමින් හඳුන්වන ජිබ්රීල් අලෛයිහිස් සලාම් තුමා) ද (නිර්නය කරනු ලැබූ) සෑම කරුණක්ම ඔවුන්ගේ රක්ෂකයාගේ අණ පරිදි රැගෙන බසිති.
5 එය (එම රාත්‍රිය මුළුල්ලේ ම) ශාන්තියක් වෙයි. (එය සම්පූර්ණයෙන් යහපතක් වන්නේය. ෂෙයිතාන් එහි විපතක් කරන්නට හෝ හිංසාවක් කරන්නට හෝ ශක්තියක් නොලබන්නේය.) අරුණෝදය උදාවනතෙක් (මලක්වරු කණ්ඩායම් කණ්ඩායම් වශයෙන් අඛණ්ඩව බසිමින් සිටිති.)

## අල් - බයියිනා

1 පුස්තකය ලැබුවන් ද (යුදෙව්වන් හා ක්‍රිස්තියානින්)

سُورَةُ القَدۡرِ — آياتها ٥ — ترتيبها ٩٧

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

إِنَّآ أَنزَلۡنَٰهُ فِي لَيۡلَةِ ٱلۡقَدۡرِ ١ وَمَآ أَدۡرَىٰكَ مَا لَيۡلَةُ ٱلۡقَدۡرِ ٢
لَيۡلَةُ ٱلۡقَدۡرِ خَيۡرٞ مِّنۡ أَلۡفِ شَهۡرٖ ٣ تَنَزَّلُ ٱلۡمَلَٰٓئِكَةُ وَٱلرُّوحُ
فِيهَا بِإِذۡنِ رَبِّهِم مِّن كُلِّ أَمۡرٖ ٤ سَلَٰمٌ هِيَ حَتَّىٰ مَطۡلَعِ ٱلۡفَجۡرِ ٥

سُورَةُ البَيِّنَةِ — آياتها ٨ — ترتيبها ٩٨

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

لَمۡ يَكُنِ ٱلَّذِينَ كَفَرُواْ مِنۡ أَهۡلِ ٱلۡكِتَٰبِ وَٱلۡمُشۡرِكِينَ مُنفَكِّينَ
حَتَّىٰ تَأۡتِيَهُمُ ٱلۡبَيِّنَةُ ١ رَسُولٞ مِّنَ ٱللَّهِ يَتۡلُواْ صُحُفٗا مُّطَهَّرَةٗ ٢
فِيهَا كُتُبٞ قَيِّمَةٞ ٣ وَمَا تَفَرَّقَ ٱلَّذِينَ أُوتُواْ ٱلۡكِتَٰبَ إِلَّا مِنۢ
بَعۡدِ مَا جَآءَتۡهُمُ ٱلۡبَيِّنَةُ ٤ وَمَآ أُمِرُوٓاْ إِلَّا لِيَعۡبُدُواْ ٱللَّهَ مُخۡلِصِينَ
لَهُ ٱلدِّينَ حُنَفَآءَ وَيُقِيمُواْ ٱلصَّلَوٰةَ وَيُؤۡتُواْ ٱلزَّكَوٰةَۚ وَذَٰلِكَ دِينُ
ٱلۡقَيِّمَةِ ٥ إِنَّ ٱلَّذِينَ كَفَرُواْ مِنۡ أَهۡلِ ٱلۡكِتَٰبِ وَٱلۡمُشۡرِكِينَ
فِي نَارِ جَهَنَّمَ خَٰلِدِينَ فِيهَآۚ أُوْلَٰٓئِكَ هُمۡ شَرُّ ٱلۡبَرِيَّةِ ٦ إِنَّ
ٱلَّذِينَ ءَامَنُواْ وَعَمِلُواْ ٱلصَّٰلِحَٰتِ أُوْلَٰٓئِكَ هُمۡ خَيۡرُ ٱلۡبَرِيَّةِ ٧

තවද ආදේශ කරන්නන් ද (අරාබියාවේ පිළිම වන්දනා කරමින් ආදේශ කළවුන්) තවද ප්‍රතික්ෂේප කළවුන් ද ඔවුනට පැහැදිලි සාධකය ඔවුන් වෙත පැමිණෙන තෙක් (ඔවුන්ගේ දේව ප්‍රතික්ෂේප කිරීමෙන්) ඉවත්වන්නන් වූයේ නැත. (මෙහි පැහැදිලි සාධකය යැයි ප්‍රකාශ කරනුයේ මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමා හා එතුමා ගෙන ආ දහමය. ඔහු ඔවුන්ගේ මංමුළාව හා නොදැනුවත්කම ඔවුනට පැහැදිලිකර විශ්වාසය කරා ඔවුන්ව කැඳවීය.)
2 (එම සාධකය) අල්ලාහ්ගේ වෙතින් පැමිණි දූතයාණන් (මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමාණන්, වෙනස් කිරීමෙන් හා එයට නව දේවල් ඇතුල් කිරීම ආදියෙන්) පාරිශුද්ධ කරනු ලැබූ පුස්තකය කියවා පෙන්වයි. එය සත්‍යවශයෙන් ම අල්ලාහ්ගේ කථනයයි.)
3 එහි පැහැදිලි නීති ඇත. (එහි ඇති දෑ නිවැරදි නීති හා වාක්‍යයන්ය. සත්‍යයෙන් පිටතට යොමු වූ ඒවා එහි නැත. එහි ඇතිහැම එකක්ම යහමග, ඍජුමග හා ඥානයයි. අල්ලාහ් පහත සඳහන් පරිදි පවසනුයේ මෙයයි. සියළු ප්‍රශංසා අල්ලාහ්ටය. ඔහු තම ගැත්තාට පහළ කළේය. ඔහු එහි ඇදයක් නොතැබුවේය. ඒ වෙනුවට එය ඍජු කළේය. 'සූරා කහ්ෆ්'හි එම වාක්‍ය කවරෙකු හෝ පිළිපදිනම් ඔහු අල්ලාහ්ගේ ඍජුමගෙහි සිටී.)
4 පුස්තකය ලැබුනු අය ඔවුනට පැහැදිලි සාධක

جَزَآؤُهُمۡ عِندَ رَبِّهِمۡ جَنَّٰتُ عَدۡنٖ تَجۡرِي مِن تَحۡتِهَا ٱلۡأَنۡهَٰرُ خَٰلِدِينَ
فِيهَآ أَبَدٗاۖ رَّضِيَ ٱللَّهُ عَنۡهُمۡ وَرَضُواْ عَنۡهُۚ ذَٰلِكَ لِمَنۡ خَشِيَ رَبَّهُۥ ٨

## سُورَةُ الزَّلۡزَلَةِ

ترتيبها ٩٩ — آياتها ٨

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

إِذَا زُلۡزِلَتِ ٱلۡأَرۡضُ زِلۡزَالَهَا ١ وَأَخۡرَجَتِ ٱلۡأَرۡضُ أَثۡقَالَهَا
٢ وَقَالَ ٱلۡإِنسَٰنُ مَا لَهَا ٣ يَوۡمَئِذٖ تُحَدِّثُ أَخۡبَارَهَا ٤
بِأَنَّ رَبَّكَ أَوۡحَىٰ لَهَا ٥ يَوۡمَئِذٖ يَصۡدُرُ ٱلنَّاسُ أَشۡتَاتٗا
لِّيُرَوۡاْ أَعۡمَٰلَهُمۡ ٦ فَمَن يَعۡمَلۡ مِثۡقَالَ ذَرَّةٍ خَيۡرٗا
يَرَهُۥ ٧ وَمَن يَعۡمَلۡ مِثۡقَالَ ذَرَّةٖ شَرّٗا يَرَهُۥ ٨

## سُورَةُ العَادِيَاتِ

ترتيبها ١٠٠ — آياتها ١١

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

وَٱلۡعَٰدِيَٰتِ ضَبۡحٗا ١ فَٱلۡمُورِيَٰتِ قَدۡحٗا ٢ فَٱلۡمُغِيرَٰتِ صُبۡحٗا
٣ فَأَثَرۡنَ بِهِۦ نَقۡعٗا ٤ فَوَسَطۡنَ بِهِۦ جَمۡعًا ٥ إِنَّ ٱلۡإِنسَٰنَ
لِرَبِّهِۦ لَكَنُودٞ ٦ وَإِنَّهُۥ عَلَىٰ ذَٰلِكَ لَشَهِيدٞ ٧ وَإِنَّهُۥ لِحُبِّ
ٱلۡخَيۡرِ لَشَدِيدٌ ٨ ۞ أَفَلَا يَعۡلَمُ إِذَا بُعۡثِرَ مَا فِي ٱلۡقُبُورِ ٩

ලැබුණායින් පසුව මිස ඔවුන් වෙන්වූයේ නැත. (ඔවුන් වෙන්වූයේ ද මතභේද ඇතිකර ගත්තේ ද පැහැදිලි නොමැතිකමින් නොවේ. ඔවුන් වෙන්වූයේ සත්‍යය හෙළිවූවායින් පසු ව ය. අල්ලාහ් මුහම්මද් සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම් තුමන්ව නබිවරයෙකු ලෙස එව්ය. සමහරෙක් එතුමන්ව විශ්වාස කළහ. තවත් සමහරෙක් එතුමන්ව ප්‍රතික්ෂේප කළහ. ඔවුන්ගේ ආගම ද සැබෑ කරමින් පැමිණි දූතයාව විශ්වාස කර පිළිපැදීමේ විෂයෙහි ඔවුන් එකඟවීමට තිබිණි.)

5 (ඔවුනට පහළ කරනු ලැබූ පුස්තකවල ද අල් කුරආනයේ ද) අල්ලාහ්ව නමැදීමට ඔවුනට විධානා කෙරින. (අල්ලාහ්ට කිසිවක් ආදේශ නොකර පාරිශුද්ධව ඔහුව නමදින ලෙසම ඔවුහු අණකරනු ලැබූහ) තවද ඔවුහු සලාතය (අල්ලාහ්ගේ මනාපය පරිදි) ඉටුකිරීම ද (නියමිත වේලාවට) සකාත් දීම ද ඔවුනට අණ කරනු ලැබූහ. එය (මෙම ආගම) ඍජු මාර්ගයේ ආගම වන්නේය. (එය අතහැර ඔවුන් වෙන් නොවිය යුතුය.)

6 නියත වශයෙන් ම පුස්තකය ලැබුවන්ගෙන්ද, ආදේශ කරන්නන්ගෙන් ද ප්‍රතික්ෂේප කළ අය සදාකාලිකව නිරයේ සිටින්නෝය. ඔවුහු මිනිසුන් අතර නරකම අයයි. (මන්ද ඔවුහු ඊර්ෂයාව නිසාද, සීමාව ඉක්මවා යමින් ද සත්‍යය අත් හළහ. එහෙයින් නැවත යන පරලොවෙහි ද නරක අය ලෙසම සිටින්නෝ ය)

7 නියත වශයෙන්ම විශ්වාස කර යහකම් කරන්නේ මිනිසුන් අතර ශ්‍රේෂ්ට අය වෙති.

8 (ඔවුන් විශ්වාස කර යහපත් ක්‍රියා කිරීම වෙනුවෙන්) ඔවුන්ගේ රක්ෂකයා ඉදිරියේ ඔවුන්ගේ ප්‍රතිඵල වන්නේ අද්න් නමැති උයන්ය. ඒවායේ (ගස් හා කාමර යටින්) පහළින් ඔයවල් ගලා බසිමින් පවතී. ඒවායේ ඔවුහු සදාකල් ස්ථිරව සිටින්නෝය. (එයින් ඔවුන් පිටමං වන්නේ හෝ මරණයට පත්වන්නේ හෝ නොමැත.) අල්ලාහ් ඔවුන් ගැන තෘප්තිමත් විය. එය තම රක්ෂකයාට බියවූ අයට හිමිය.

## අස්-සිල්සාල්

1 පොළොව තදින් සෙලවෙන ලෙස සොලවනු ලැබුවහොත් (එම අවස්ථාවේ පොළොවේ කම්පනය නිසා පොළොව මත ඇති සියල්ල කඩා වැටේ)

2 තවද පොළොව එහි බර (මියගිය අය හා එහි භූමදානය කරනු ලැබූ අය) මතු කළහොත් (දෙවන සූර් පිඹින විට මළ අය හැමෝම මතු කරයි.)

3 මිනිසා (තමාට ඇතිවූ කම්පනය හා බිය හේතු කොටගෙන) මෙයට (පොළොවට) කුමක් වීදැ?(සියල්ල පිටතට මතු කළේ මන්දැ?)යි විමසයි.

4 එදින එය තම තොරතුරු සියල්ල දන්වයි. (එය මතුපිට කළ කුසල් හා අකුසල් සියල්ල දන්වයි. ගැත්තන්ට විරුද්ධ සාක්ෂි කිවයුතු නිසා අල්ලාහ් එය කතා කරවයි.)

5 නුඹේ රක්ෂකයා එයට අණකළ නිසා (එය සියළු දෑ දැනුම් දෙයි.)

6 එදින තමන්ගේ ක්‍රියාවන් තමන්ට පෙන්විය යුතු නිසා මිනිසුන් (ඔවුන්ගේ මිනීවළවල් තුළ සිට) විවිධ කණ්ඩායම් වශයෙන් පිටවී එති. (සමහරු දකුණු පසින් යති. සමහරු වම්පසින් යති.)

7 කවරෙකු හෝ එක අනුවක් තරම් කුසල් කර ඇත්නම් එය ද ඔහු (තම ලේඛනයෙහි) දැක ගනී. (ඒ ගැන ඔහු සතුටු වෙයි.)

8 තවද (එසේම) කවරෙකු හෝ අනුවක් තරම්වත් අකුසල් කර ඇද්ද එය ද (ඔහු තම ලේඛනයෙහි) දැකගනී. (එය ඔහුට දුක ඇති කරයි.)

## අල්-ආදියාත්

1 හති හලන හඬ පිටවන තරමට වේගයෙන් දුවන අශ්වයින් මත දිවුරමි. (අල්ලාහ් ඔහුගේ දූතයාට ද විරුද්ධ වූ කාෆිර්වරුන් සමග සටන් කරන විට ප්‍රයෝජනයට ගන්නා අශ්වයින් පිළිබඳව මෙහි සඳහන් වේ.)

2 තවද ගිණි පුපුරු දල්වන අශ්වයින් මත දිවුරමි (වේගයෙන් යන එම අශ්වයින්ගේ පාද ගල්වල ගැටීම නිසා ගිණිපුපුරු විසිවෙයි.)

3 (සතුරන් මත) උදෑසන හදිසි ප්‍රහාර එල්ල කරන අශ්වයින් මත දිවුරමි.

4 එමගින් (වේගයෙන් පහරදීම මගින්) දූවිල්ල අවුස්සන දෑ මත දිවුරමි.

5 (සතුරන් පරාජයට පත්කර ඔවුන්ගේ) සේනාවේ මැදව සිටින අශ්වයින් මත දිවුරමි.

6 නියත වශයෙන් මිනිසා ඔහුගේ රක්ෂකයාව අධික වශයෙන් ප්‍රතික්ෂේප කරන්නෙකි. (ඔහුගේ දයාවන්ට කළගුණ සලකන්නෙකු වශයෙන් මිනිසා නොවන්නේය.)

7 නියතවශයෙන් (ඔහු ප්‍රතික්ෂේප කිරීම හා කළගුණ නොසැලකීම පිළිබඳව) ඔහුම සාක්ෂි දරන්නෙකු වන්නේය.

8 නියත වශයෙන් ඔහු වස්තුව ප්‍රිය කිරීමෙහි ඉතා දැඩිය. (එය සෙවීමෙහිද ලබා ගැනීමෙහි ද ඉතා දැඩි

ලෙස උත්සාහ කරයි.)

9 ඔහු නොදන්නේ ද? මිනීවළවල් තුළ ඇති දෑ පෙරලුවහොත් (ඒවා පිටතට මතු කළහොත්)

10 තවද හදවත් තුළ ඇති දෑ (කුසල් හා අකුසල්) වෙන්කර පෙන්වුවහොත්

11 නියත වශයෙන්ම ඔවුන්ගේ රක්ෂකයා ඒ දවසේ ඔවුන්ව හොඳින් දන්නෙකි' (යි ඔහු නොදන්නෙහිද? සෑම මිනිසෙකු ගැනම ඔවුන් කරන හැම දෙයක්ම අල්ලාහ් මනාව දන්නෙකි. ඒවාට නිසි විපාක ඔහු විනිශ්චය දිනයේ ලබාදෙන බව දැන සිටීම ඉතා වැදගත්ය. එහෙයින් වස්තුව කෙරෙහි ඇති මෝහය ඔවුන් අල්ලාහ්ට කළගුණ සැලකීමෙන් ද ඔහුට නැමදුම් ඉටුකර පරලොවට අවශ්‍ය යහපත් ක්‍රියා කිරීමෙන්ද ඔවුන්ගේ අවධානය වෙනතකට නොහැරවිය යුතුය.)

## අල් කාරිආ

1 (සිත්) තැති ගන්වන දෙය. (මෙය අවසන් දිනයේ නම්වලින් එකකි)

2 තැති ගන්වන්නේ කුමක් ද?

3 තැති ගන්වන්නේ කුමක් දැ? යි නුඹට දැනුම් දුන්නේ කුමක් ද?

4 මිනිසුන් විසිරී ගිය (සීසීකඩ කලබලවී දිශාවක් නොදැන එහා මෙහා යන) මෙරුන් බවට පත්වන දිනයේ (එය සිදුවෙයි.)

5 තවද කඳු සායම් දමන ලද පුලුන් මෙන් වන දිනයේ (එය සිදුවෙයි.)

6 (මහ්ෂර් පිටියේ විභාගයෙන් පසු මිනිසුන්ගේ තත්ත්වය ද ඔවුන් කොටස් දෙකකට බෙදෙන බව ද අල්ලාහ් පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි.) එහෙයින් (එම දිනයේ) කවරෙකුගේ (යහපත් ක්‍රියාවල) ප්‍රමාණය බර වන්නේ ද

7 ඔහු තෘප්තිමත් විය හැකි ජීවිතයක සිටී.

8 කවරෙකුගේ (යහපත් ක්‍රියාවන්හි) ප්‍රමාණය බර සැහැල්ලු වන්නේ ද

9 ඔහු යනතැන 'හාවියා' නමැති නිරයයි. (මෙහි යා යුතු තැන යන්නට මව යන අරුත දෙන 'උම්මු' යන වදන භාවිතා කර ඇත. මන්ද දරුවන් මව ළඟට යන්නා සේ මොවුහු නිරය කරා යන්නෝය.)

10 එය (හාවියා නමැති නිරය) කුමක් දැයි නුඹට දැනුම් දුන්නේ කුමක් ද?

11 එය උෂ්ණාධික (නිරයේ) ගින්නකි.

## අත් තකාසුර්

1 (වස්තුවද දරුවන් ද) අධික කරගෙන උදම් අනන නුඹලාගේ සම්පත් (අල්ලාහ්ට අවනත වී පරලොවට අවශ්‍ය යහපත් ක්‍රියා කිරීමෙන්) නුඹලාගේ අවදානය වෙනතකට යොමු කළේය.

2 නුඹලා මිනීවළවල් මුණගැසෙන තෙක් (නුඹලාට මරණය එනතෙක් එය නුඹලාගේ අවධානය වෙනතකට හරවා ගෙනම සිටී.)

وَحُصِّلَ مَا فِي الصُّدُورِ ﴿١٠﴾ إِنَّ رَبَّهُم بِهِمْ يَوْمَئِذٍ لَّخَبِيرٌ ﴿١١﴾

ترتيبها ١٠١ — سُورَةُ القَارِعَةِ — آياتها ١١

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

الْقَارِعَةُ ﴿١﴾ مَا الْقَارِعَةُ ﴿٢﴾ وَمَا أَدْرَاكَ مَا الْقَارِعَةُ
﴿٣﴾ يَوْمَ يَكُونُ النَّاسُ كَالْفَرَاشِ الْمَبْثُوثِ ﴿٤﴾
وَتَكُونُ الْجِبَالُ كَالْعِهْنِ الْمَنفُوشِ ﴿٥﴾ فَأَمَّا
مَن ثَقُلَتْ مَوَازِينُهُ ﴿٦﴾ فَهُوَ فِي عِيشَةٍ رَّاضِيَةٍ
﴿٧﴾ وَأَمَّا مَنْ خَفَّتْ مَوَازِينُهُ ﴿٨﴾ فَأُمُّهُ هَاوِيَةٌ
﴿٩﴾ وَمَا أَدْرَاكَ مَا هِيَهْ ﴿١٠﴾ نَارٌ حَامِيَةٌ ﴿١١﴾

ترتيبها ١٠٢ — سُورَةُ التَّكَاثُرِ — آياتها ٨

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

أَلْهَاكُمُ التَّكَاثُرُ ﴿١﴾ حَتَّىٰ زُرْتُمُ الْمَقَابِرَ ﴿٢﴾ كَلَّا سَوْفَ
تَعْلَمُونَ ﴿٣﴾ ثُمَّ كَلَّا سَوْفَ تَعْلَمُونَ ﴿٤﴾ كَلَّا لَوْ تَعْلَمُونَ
عِلْمَ الْيَقِينِ ﴿٥﴾ لَتَرَوُنَّ الْجَحِيمَ ﴿٦﴾ ثُمَّ لَتَرَوُنَّهَا
عَيْنَ الْيَقِينِ ﴿٧﴾ ثُمَّ لَتُسْأَلُنَّ يَوْمَئِذٍ عَنِ النَّعِيمِ ﴿٨﴾

3 එසේ නුඹලාව එය නොහැරවිය යුතුය. නුඹලා (පරලොවදී එහි නරක විපාක) දැන ගන්නෙහුය.

4 නැවතත් එය නුඹලාව නොහැරවිය යුතුය. නුඹලා (පරලොවදී එහි නරක විපාක) දැන ගන්නෙහුය.

5 නුඹලා (ලෞකික දේවල් හොඳින් දැන ගන්නා මෙන්ම පරලොවදී කොතැනට යන්නෙහු දැයි) ස්ථිර ලෙස දන්නෙහු නම් (එය නුඹලාගේ අවධානය නොහරවන්නේ ය.)

6 නියත වශයෙන් නුඹලා (පරලොව) නිරය දකින්නෙහුය.

7 පසුව ද එය ස්ථිර වශයෙන්ම ඇස් ඉදිරියෙහිම දකින්නෙහුය.

8 පසුව නියත වශයෙන්ම නුඹලා එදින (අල්ලාහ් විසින් ලබා දුන්නා වූ) දායාදයන් පිළිබඳව විමසනු ලබන්නෙහුය. (පරලොව සඳහා නුඹලා සූදානම් වීමට බාධකවී අවධානය වෙනතකට හැරවූ සැප සම්පත් කුමක් දැයි ඔහු විමසයි. ඔහු ආරක්ෂාව, නිරෝගිකම, විවේකය, රසවත් ආහාර, ප්‍රණීත පානයන්, පිපාසයට බොන සිසිල් ජලය හා සෙවන ලබන නිවස යනාදිය පිළිබඳව නුඹලාගෙන් විමසයි.)

## سُورَةُ العَصۡرِ

ترتيبها ١٠٣ — آياتها ٣

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

وَٱلۡعَصۡرِ ١ إِنَّ ٱلۡإِنسَٰنَ لَفِي خُسۡرٍ ٢ إِلَّا ٱلَّذِينَ ءَامَنُواْ
وَعَمِلُواْ ٱلصَّٰلِحَٰتِ وَتَوَاصَوۡاْ بِٱلۡحَقِّ وَتَوَاصَوۡاْ بِٱلصَّبۡرِ ٣

## سُورَةُ الهُمَزَةِ

ترتيبها ١٠٤ — آياتها ٩

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

وَيۡلٞ لِّكُلِّ هُمَزَةٖ لُّمَزَةٍ ١ ٱلَّذِي جَمَعَ مَالٗا وَعَدَّدَهُۥ ٢
يَحۡسَبُ أَنَّ مَالَهُۥٓ أَخۡلَدَهُۥ ٣ كَلَّاۖ لَيُنۢبَذَنَّ فِي ٱلۡحُطَمَةِ ٤
وَمَآ أَدۡرَىٰكَ مَا ٱلۡحُطَمَةُ ٥ نَارُ ٱللَّهِ ٱلۡمُوقَدَةُ ٦ ٱلَّتِي تَطَّلِعُ
عَلَى ٱلۡأَفۡـِٔدَةِ ٧ إِنَّهَا عَلَيۡهِم مُّؤۡصَدَةٞ ٨ فِي عَمَدٖ مُّمَدَّدَةِۭ ٩

## سُورَةُ الفِيلِ

ترتيبها ١٠٥ — آياتها ٥

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

أَلَمۡ تَرَ كَيۡفَ فَعَلَ رَبُّكَ بِأَصۡحَٰبِ ٱلۡفِيلِ ١ أَلَمۡ يَجۡعَلۡ كَيۡدَهُمۡ
فِي تَضۡلِيلٖ ٢ وَأَرۡسَلَ عَلَيۡهِمۡ طَيۡرًا أَبَابِيلَ ٣ تَرۡمِيهِم
بِحِجَارَةٖ مِّن سِجِّيلٖ ٤ فَجَعَلَهُمۡ كَعَصۡفٖ مَّأۡكُولِۭ ٥

## අල් අස්ර්

(1) කාලය මත දිවුරමි. (අල්ලාහ් මෙම වැකියෙන් කාලය මත දිවුරා ඇත. මන්ද මැවු දෙවියෙකු සිටින බවට එහි පැහැදලි සාක්ෂි ඇත. රාත්‍රිය දවාල යනාදිය නියම සැලැස්මක් යටතේ ගමන් කිරීම අඳුර හා ආලෝකය මාරුවෙන් මාරුවට පැමිණීම එවායින් සමහරකි. මුකාතිල් තුමා මෙයින් අදහස් කරන්නේ අස්ර් වේලාව යැයි අදහස් කරයි.)

(2) නියත වශයෙන්ම මිනිසා පාඩුවේම සිටී. (පාඩුව යනු ආයෝජනය කළ මුදල් අඩුවීමකි.)

(3) විශ්වාසකර යහපත් ක්‍රියාවන් ද කරමින් ද (ඔවුහු පිළිගෙන විශ්වාස කළයුතු) සත්‍යය එකිනෙකා උපදෙස් දෙමින් ද (සත්‍ය යනු අල්ලාව විශ්වාසකර ඔහු ඒකීයත්වයට පත් කිරීමත් ආගමක් ලෙස ඔහු දුන් දෑ පිළිගෙන කටයුතු කිරීමත් ඔහු වැළැක් වූ දැයින් වැළකී සිටීමත්ය.) තවද ඉවසීම ගැන ද එකිනෙකා උපදෙස් දෙමින් ද සිටි අය හැර (ඔවුන් පාඩුවේ නැත. පාපයන්ගෙන් ඈත් වීමේදී ඉවසීම, යහපත් ක්‍රියාකිරීමෙහි ඉවසීම හා පරීක්ෂණයන් හිදී ඉවසීම ආදිය ඉවසීමට ඇතුළත් වන්නේ ය.)

## අල් - හුමසා

(1) ඉදිරිපිට මිනිසුන්ගේ අඩුපාඩු කියමින් ඉන්නා හැම කෙනෙකුටම, පසුපසින් ඕපාදූප කියමින් ඇවිදින හැමකෙනෙකුටම විනාශයක්ම වේවා.

(2) ඔහු කවරෙකු ද යත් වස්තුව රැස්කර එය ගණන් කරමින් සිටින්නාය. (තමා රැස්කරගෙන ඇති වස්තුව ගැන වූ අහංකාරය නිසාත් අනෙක් අයට වඩා තමාට වැදගත්කමක් ඇතැයි අදහස් කිරීම නිසාත් ඔහු අනෙක් අයගේ අඩුපාඩු කියමින් සිටි බව අල්ලාහ් අවධාරණය කරයි.)

(3) (ඔහු තම වස්තුවේ අහංකාරය හේතු කොටගෙන) ඔහුගේ වස්තුව (ඔහු මරණයට පත්නොවී) සදාකාලිකව ඔහුව ජීවත් කරවයි යැයි සිතාගෙන සිටී. (එහෙයින් මරණයෙන් මතු ඇති දෑ ගැන ඔහු නොසිතයි.)

(4) ඔහු සිතන පරිදි නොවේ. ඔහු නියත වහයෙන්ම 'හුතමා' හි දවනු ලබන්නේය. (එය ඔහුව ද ඔහුගේ වස්තුවද පුළුස්සා දමනු ඇත.)

(5) හුතමා යනු කුමක් දැයි නුඹට දැනුම් දුන්නේ කුමක් ද?

(6) (එය) අල්ලා විසින් මොළවනු ලැබූ (නිරයේ) ගින්දරයි.

(7) එය කෙසේද යත් හදවත් තුළට ඇතුල් විය හැකි එකකි. (හදවත් තුළට ගොස් එය වසාගනී මන් ද මංමුළා වූ අරමුණු, නරක සිතුවිලි හා නරක ගතිපැවතුම් වල නිවහන වූයේ ඒ හදවත්ය).

(8) නියත වශයෙන් ම එය ඔවුන් වටකර වසා ගැනීමට සලස්වනු ඇත. (එයින් මිදී පිටව යාමට ඔවුහු ශක්තිමත් නොවෙති.)

(9) දිග කුළුණුවල (ඔහු බඳිනු ලබති. - මුකාතිල් තුමා මෙසේ කියයි. යකඩ කණුවල ඔවුන්ව බැඳ තබනු ඇත. එයින් පිටවීමට හෝ එතුළට සුළං ඇතුල් වීමට හෝ නොහැක.)

## අල් ෆීල්

(1) ඇත් සේනාවන්ට නුඹේ රක්ෂකයා කළ දෙය (දඬුවම් කළ අයුරු) නුඹ නොදන්නෙහි ද? (ඔවුන් ඉතියෝපියාවට අයත් ක්‍රිස්තියානින්ය. ඔවුහු යමන් දේශයට ආහ. පාලනය කළහ. එහි සිට මක්කම විනාශ කිරීමේ චේතනාවෙන් මක්කම බලා ආහ. අල්ලාහ් මෙම පරිච්ඡේදයේ ප්‍රකාශ කර ඇති පක්ෂීන්ව එවා ඔවුන්ව විනාශයට පත් කළේය. එය එක් සාධකයකි. මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමා නබිවරයෙකු වශයෙන් එවීමට වසර 40කට පෙර මෙය සිදුවිය.)

(2) (කඃබාව විනාශ කිරීමට ඔවුන් දැරූ උත්සාහය ද) ඔවුන්ගේ කුමන්ත්‍රණය(ද) ඔහු මංමුළා නොකළේ ද?

(3) තවද ඔහු ඔවුන් වෙනුවෙන් පක්ෂීන් රංචු වශයෙන් එවීය. (ඒවා කලු පැහැති පක්ෂීන්ය. මුහුද දෙසින් ආවේය. සෑම පක්ෂියෙකු ළඟ ගල්කැට තුනක් පෙනෙන්නට තිබිණ. හොටේ ගල්කැටයක් ද පාද දෙකේ ගල් කැට දෙකක් ද විය. ඒවායින් වදින හැම එකක්ම විනාශයට පත්විය.

(4) (ගින්නේ) පුලුස්සන ලද ගල් ඔවුන් මත එවා විසි කරයි. (නිරයේ ගින්නෙහි පුළුස්සන ලද එම ගල්වල ඔවුන්ගේ නම් ලියා තිබිණ. ඔවුන්ගෙන් කෙනෙකුට එම ගල් වදී නම් ඔහුට විනාශය ඇති කරයි. ඒවා කඩල ඇටයක් තරම් විශාල විය.)

(5) (සතුන්) විකා (අහක දැමූ) කොළ බවට ඔවුන්ව ඔහු පත් කළේය.

## سُورَةُ قُرَيْشٍ

ترتيبها ١٠٦ — آياتها ٤

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

لِإِيلَٰفِ قُرَيْشٍ ﴿١﴾ إِۦلَٰفِهِمْ رِحْلَةَ ٱلشِّتَآءِ وَٱلصَّيْفِ
﴿٢﴾ فَلْيَعْبُدُوا۟ رَبَّ هَٰذَا ٱلْبَيْتِ ﴿٣﴾ ٱلَّذِىٓ أَطْعَمَهُم
مِّن جُوعٍ وَءَامَنَهُم مِّنْ خَوْفٍۭ ﴿٤﴾

## سُورَةُ المَاعُونِ

ترتيبها ١٠٧ — آياتها ٧

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

أَرَءَيْتَ ٱلَّذِى يُكَذِّبُ بِٱلدِّينِ ﴿١﴾ فَذَٰلِكَ ٱلَّذِى
يَدُعُّ ٱلْيَتِيمَ ﴿٢﴾ وَلَا يَحُضُّ عَلَىٰ طَعَامِ ٱلْمِسْكِينِ ﴿٣﴾
فَوَيْلٌ لِّلْمُصَلِّينَ ﴿٤﴾ ٱلَّذِينَ هُمْ عَن صَلَاتِهِمْ سَاهُونَ
﴿٥﴾ ٱلَّذِينَ هُمْ يُرَآءُونَ ﴿٦﴾ وَيَمْنَعُونَ ٱلْمَاعُونَ ﴿٧﴾

## سُورَةُ الكَوْثَرِ

ترتيبها ١٠٨ — آياتها ٣

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

إِنَّآ أَعْطَيْنَٰكَ ٱلْكَوْثَرَ ﴿١﴾ فَصَلِّ لِرَبِّكَ وَٱنْحَرْ ﴿٢﴾
إِنَّ شَانِئَكَ هُوَ ٱلْأَبْتَرُ ﴿٣﴾

# කුරෛයිෂ්

1 කුරෛයිෂ්වරුන්ට ප්‍රියමනාප දෙයක් බවට පත්කළ බැවින්

2 ඔවුනට නියං කාලයේ ගමන ද වැසි කාලයේ ගමන ද ප්‍රියමනාප දෙයක් බවට පත් කළ හෙයින් (කුරෛයිෂ්වරු වෙළඳාම තම වෘතිය වශයෙන් කළ අයයි. ඔවුහු වැසි කාලයේ යෙමන් දේශයට ද නියං කාලයේ සිරියා දේශයට ද ගමන් කරති. ඒ ගමන් දෙක නැතිනම් ඔවුන්ගේ ජීවිත ඉතා දුෂ්කරතාවකට මුහුණ පාන්නට සිදුවනු ඇත. කඃබාව සමීපව පිහිටීම තුළින් ඔවුනට ආරක්ෂාව සැළසින. එසේ නොමැති වී නම් ඔවුනට වෙළදාම් කළ නොහැක. මේ දයාවන් දෙක ඔවුනට ප්‍රදානය කළ බැවින් ඔවුන් අල්ලාහ්ව නැමදීමටත්)

3 මෙම නිවසේ (කඃබාවේ) දෙවියන්ව ඔවුන් නමැදීමටත් (මෙතුළ ඔවුන් පිළිම තබාගෙන සිටිය ද ඔහුම ඔවුන්ගේ දෙවියා බව ඔහු දැනුම් දෙයි. මෙම කඃබාව මගින් අරාබිවරු වැදගත් කමක් හිමිකරගෙන සිටියහ.)

4 ඔහු කවරෙකුද යත් (මෙම ප්‍රයෝජන දෙක තුළින්) ඔවුන්ට කුසගින්නට ආහාර ලබා දුන්නේය. (තවද) ඔහු ඔවුන් බියෙන් තොර අය ලෙසටද පත්කළේය. (සෙසු අරාබිවරුන් සමහරෙක් සමහරෙකුට පහර දෙමින් ද අත් අඩංගුවට ගනිමින් ද සිටියහ. එහෙත් කුරෛයිෂ්වරු ඔවුන්ගේ 'හරම්' හි සිටීම හේතුකොට ගෙන ආරක්ෂා කරනු ලැබූහ.

# අල් - මාඌන්

1 (නබිවරයාණනි,) විනිශ්චය දිනය බොරු කරන ඔහුව නුඹ දුටුවෙහිද?

2 ඔහු කවරෙකු ද යත් අනාථයින් ව (ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා ගන්නට නොදී තදින්) පලවා හරින්නෙකි. (නූගත් යුගයේ අරාබීහු ගැහැණුන්ට ද ළමයින්ට ද පවුලේ උරුමයන් නොදුන්හ).

3 ඔහු දුප්පතුන්ට ආහාර දීමට (තමාව හෝ අනුන්ව හෝ) නොපොළොඹවයි. (එය ඔහුගේ මසුරුකම නිසාය.)

4 සලාතය ඉටු කරන්නන්ට විනාශයක්ම වේවා.

5 ඔවුහු කවරහුද යත් ඔවුන්ගේ සලාතය නොසළකා හරිති. (එය ගණන් නොගනිති. සලාතය කළහොත් කුසල් බලාපොරොත්තු නොවෙති. එය අතහළොත් දඬුවමට ද බිය නොවෙති. එහි වේලාව අවසන් වන තෙක් එය නොසළකා හරිති).

6 ඔවුහු (ඔවුන්ගේ සලාතය ද අනෙකුත් යහපත් ක්‍රියා ද ජනතාවට) පෙන්වීමට ම කරන්නෝය.

7 තවද ඔවුහු (අසල්වැසි නිවැසියන්ගෙන් අතමාරුවට ලබාගත්, කැති බාල්දි වැනි) සුළු භාණ්ඩ (නොදී) වළක්වා ගනිති.

# අල් - කව්සර්

1 නියත වශයෙන් අපි නුඹට (හව්ළුල්) කව්සර් (නමැති තටාකය) දුන්නෙමු. (අල්ලාහ් මෙය නබිතුමාට ද එතුමාගේ පිරිසට ද ගෞරවයක් වශයෙන් පිරිනැමීය.)

2 (නුඹලාට අනිවාර්ය කර ඇති සලාතයන්) නුඹේ රක්ෂකයා වෙනුවෙන් සලාත් කර ඔහු වෙනුවෙන් (සතුන්) කැප කරහු. (සමහර මිනිසුන් අනුන්ට සලාතය කරමින් ද අනුන් වෙනුවෙන් සතුන් බිලි දෙමින්ද සිටියහ. අල්ලාහ් තම නබිවරයාට ඔහුටම සලාත් කරන ලෙස ද ඔහු වෙනුවෙන්ම සතුන් කපන ලෙසද අණ කරයි. මෙය හජ් උත්සව දිනයේ සලාතයත් ඉන්පසු දෙන උළ්හියාවත් සඳහන් කරන බව කතාදා, අතාඋ හා ඉක්රිමා යන උතුමන්ලා පවසති.)

3 නියත වශයෙන්ම නුඹව ප්‍රතික්ෂේප කරන්නාම පරම්පරාවක් නොමැති එකෙක් වන්නේය. (අබ්තර් එනම් පරම්පරාවක් නොමැති එකෙක් යනු මිනිසුන් අතර දරුවන් නොමැති අයයි. නබිතුමාගේ පිරිමි දරුවෙකු මියගිය අවස්ථාවේ කාෆිර් වරුන්ගෙන් කෙනෙක් ඔහු පරම්පරාවක් නොමැති කෙනෙක් යැයි කීය. එම අවස්ථාවේ මෙම වැකිය පහළ විය.)

## سُورَةُ الكَافِرُونَ

ترتيبها ١٠٩ — آياتها ٦

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

قُلۡ يَٰٓأَيُّهَا ٱلۡكَٰفِرُونَ ١ لَآ أَعۡبُدُ مَا تَعۡبُدُونَ ٢
وَلَآ أَنتُمۡ عَٰبِدُونَ مَآ أَعۡبُدُ ٣ وَلَآ أَنَا۠ عَابِدٞ مَّا عَبَدتُّمۡ ٤
وَلَآ أَنتُمۡ عَٰبِدُونَ مَآ أَعۡبُدُ ٥ لَكُمۡ دِينُكُمۡ وَلِيَ دِينِ ٦

## سُورَةُ النَّصۡرِ

ترتيبها ١١٠ — آياتها ٣

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

إِذَا جَآءَ نَصۡرُ ٱللَّهِ وَٱلۡفَتۡحُ ١ وَرَأَيۡتَ ٱلنَّاسَ
يَدۡخُلُونَ فِي دِينِ ٱللَّهِ أَفۡوَاجٗا ٢ فَسَبِّحۡ بِحَمۡدِ رَبِّكَ
وَٱسۡتَغۡفِرۡهُۚ إِنَّهُۥ كَانَ تَوَّابَۢا ٣

## سُورَةُ المَسَدِ

ترتيبها ١١١ — آياتها ٥

بِسۡمِ ٱللَّهِ ٱلرَّحۡمَٰنِ ٱلرَّحِيمِ

تَبَّتۡ يَدَآ أَبِي لَهَبٖ وَتَبَّ ١ مَآ أَغۡنَىٰ عَنۡهُ مَالُهُۥ وَمَا
كَسَبَ ٢ سَيَصۡلَىٰ نَارٗا ذَاتَ لَهَبٖ ٣ وَٱمۡرَأَتُهُۥ
حَمَّالَةَ ٱلۡحَطَبِ ٤ فِي جِيدِهَا حَبۡلٞ مِّن مَّسَدِۭ ٥

## අල් කාෆිරූන්

1 (නබිවරයාණනි,) නුඹ කියහු. ප්‍රතික්ෂේප කරන්නනි, (මක්කමේ ප්‍රතික්ෂේප කරන අය නබිතුමන් ළඟට පැමිණ, ඔබ අවුරුද්දක් පුරා අපේ දෙවියන්ව අදහන්න අපි අවුරුද්දක් ඔබේ දෙවියන් අදහන්නෙමු'යි කීහ. එවිට මෙම පරිච්ඡේදය පහළ විය.)

2 නුඹලා අදහන (පිළිමවලට) මම (දැන්) නමැදුම් නොකරමි.

3 නුඹලා (නුඹලගේ දේ ප්‍රතික්ෂේපයේද ආදේශ කිරීමෙහි ද ඉන්න තාක්) මා නැමදුම් කරන දෙය (අල්ලාහ්ව) නො නමදින්නෙහුය.

4 මම නුඹලා නමැදුම් කරන දෑට (අනාගතයේ ද) නො නමදින්නෙමි.

5 නුඹලා (නුඹලාගේ ආදේශයේ ද ප්‍රතික්ෂේපයේ ද ඉන්නතාක් අනාගතයේද) මා නමැදුම් කරන දෙය (අල්ලාහ්)ට නොනමදින්නෙහුය.

6 නුඹලාට නුඹලාගේ ආගම මට මගේ ආගම (නුඹලාගේ ආගම නුඹලා සමඟද මගේ ආගම මා සමග ද තිබුනා වේ.)

## අන් - නස්ර්

(මෙයට සූරතුන් තව්දීඋ (සමුගැනීමේ සූරාව) යනුවෙන් ද කියවේ. ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමා මෙසේ පවසයි.: මෙම සූරාව පහළ වූ විට නබිතුමාණෝ මට මරණ දැන්වීම නිකුත් කෙරිනි' යි කීහ. -අහ්මද්)

1 අල්ලාහ්ගේ උදව්වත් මක්කා ජයග්‍රහණයත් පැමිණෙයි නම් (නුඹේ සතුරන් වන කුරෙයිෂ්වරුන්ට විරුද්ධව අල්ලාහ්ගේ උදව්ව නුඹලාට ලැබී මක්කම ජයග්‍රහණය කරන්නෙහි නම්)

2 තවද මිනිසුන් කණ්ඩායම කණ්ඩායම් වශයෙන් ඉස්ලාමයට ඇතුල්වීමත් දකින්නෙහි නම්. (නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමා මක්කා ජයගත් විට අරාබිවරු මෙසේ කීහ. ඇත් සේනාවේ ප්‍රහාරයෙන් අල්ලාහ් මෙම මක්කා වැසියන්ව ආරක්ෂා කළතත්ත්වයෙන් මුහම්මද් මොවුන්ව ජයගනී නම් ඔබ සැබැවින්ම සත්‍යයෙහි සිටින්නේය. ඔහුව කිසිවෙකු වැළැක්විය නොහැකිය. එහෙයින් ඔවුහු තනි පුද්ගලයින් වශයෙන් ඇතුල් වූ පසු කණ්ඩායම් වශයෙන් ආගමට ඇතුල් වන්නට පටන් ගත්හ. සම්පූර්ණ ගෝත්‍රිකයන් වශයෙන් ද ඇතුල් වූහ.)

3 නුඹේ රක්ෂකයාට ප්‍රශංසා කර (ඔහුව) සුවිශුද්ධ කරහු. තවද ඔහුගෙන් පාප ක්ෂමාව අයැදහු. නියත වශයෙන්ම ඔහු පාපයන්ට අධික කෂ්මාව දෙන්නෙකි. (මෙම පරිච්පේදය නබි තුමන්ගේ කාල සීමාව අවසන්වූ බව සඳහන් කරන්නේ යැයි ඉබ්නු අබ්බාස් තුමා ප්‍රකාශ කරයි. (බුහාරි)

## අල් මසද්

1 අබූ ලහබ්ගේ දෑතම විනාශවේවා, ඔහු ද විනාශ වේවා (ඔහුට විනාශවීමට ශාප කළාක් මෙන්ම ඔහු විනාශයට පත්වූයේය. මොහු නබි තුමාගේ මහප්පාගෙන් කෙනෙකි. ඔහුගේ නම අබ්දුල් උස්සාය.)

2 ඔහුගේ වස්තුව ද ඔහු හම්බ කළ දෑද (ලාභ හා නායක තනතුරු ද අල්ලාහ්ගේ දඬුවමෙන් ආරක්ෂා කිරීමේ විෂයෙහි) කිසිදු ප්‍රයෝජනයක් අත් නොවීය.

3 දළුලා ඇවිලෙන ගින්නෙහි ඔහු ඇතුල් වෙයි. (එහි ඔහුව පුළුස්සා වේදනාවට ලක්කරනු ඇත.)

4 දර අධිකව උස්සාගෙන එන ඔහුගේ බිරිය ද (උම්මු ජමීල්ද නිරයට ඇතුල් වන්නීය. ඇය කැලෑ දර ද කටුද උස්සා ගෙනැවිත් රාත්‍රියේ නබිතුමන් යන එන මග විසිකරන්නීය.)

5 ඉඳි පිත්තෙන් අඹරන ලද ලණුවක් ඇගේ බෙල්ලේ දකින්නට ඇත. (ඈ ළඟ මැණික්වලින් නිමවූ විටිනා මාලයක් දක්නට තිබිණ. ඇය එය මුහම්මද් සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාට එරෙහිව එතුමාව විනාශ කිරීමට ලාත් හා උස්සා යන ව්‍යාජ දෙවිවරු මෙය ලබා දුන් බව ප්‍රකාශ කරමින් සිටියාය.)

## අල් - ඉහ්ලාස්

1 (නබිවරයානණි,) නුඹ කියහු. ඔහු අල්ලාහ් එක්කෙනකි. (ආදේශ කරන්නෝ, ඔබේ දෙවියාගේ පවුල් පරම්පරාව ගැන කියහු යැයි ප්‍රකාශ කළහ. එවිට මෙම පරිච්ඡේදය පහළ විය.)
2 අල්ලාහ් සියල්ලන්ටම (තම අවශ්‍යතාවන් සඳහා) අවශ්‍යවන අයෙකි. (සමද් යනු සියළුම වැදගත් ගුණාංගයන්ගෙන් පරිපූර්ණ වූ අයෙකි)
3 ඔහු (කිසිවෙකුව) ප්‍රසුත කළේ නැත. (කිසිවෙකුගෙන්) ඔහු ප්‍රසූත වූයේ ද නැත. (ඔහු එසේ ප්‍රසූත කරනු ලැබුවේ නම් 'නැත' යන ගුණාංගය ඔහුට ද හිමිවන්නට තිබිණ. මුෂ්රික්වරු(ආදේශ තබන්නන්) හා යුදෙව්වන් 'අල්ලාහ්ගේ දූවරුන්වන් යැයි ප්‍රකාශ කරන මලක්වරුන් විසින් උසෙයිර් තුමාව හෝ ඊසා තුමාව හෝ ඔහු ප්‍රසූත කළේ නැත.)
4 (ඔහුගේ කුමණ ගුණාංගයක වුව ද) ඔහුට සමානව කිසිවෙකු නැත.

## අල් -ෆලක්

1 අරුණෝදයේ රක්ෂකයාගෙන් මම ආරකෂාව පතමි. (ෆලක් යනු සුබහ් වේලාව සඳහන් කරයි. මන්ද රාත්‍රිය එයින් වෙන්වෙයි. නැත්නම් අල්ලාහ්ගේ මැවීම්වලින් වෙන්වී පෙණෙන ධාන්‍යවර්ග, බීජ වර්ග තවද ජීවින් ඇතුළු අනෙකුත් මැවිම් සියල්ල වසාගත හැකි අඳුර ඉවත් කිරීමට ශක්තිය ඇති දෙවිඳුන් වන ඔහුගෙන් ආරක්ෂාව පතන්නෙකුගේ දුෂ්කරතා හා සිත්තැවුල් ද ඉවත් කිරීමට ඉතා ශක්තිය ඇත්තෙකු වන්නේය.)
2 ඔහුගේ මැවීම්වල විපත්වලින් ද ආරක්ෂාව පතමි.
3 රාත්‍රියේ අඳුර පැතිරී ගිය වේලාවේ එහි විපත්වලින් ද (ආරකෂාව පතමි. කැලෑවල සිටින තිරිසන් සතුන් ද විෂකුරු සතුන් ද ඔවුන් ජීවත් වන ස්ථානවලින් පිටතට එන්නේ රාත්‍රි කාලයේය. එමෙන්ම ලෝකයේ පාප ක්‍රියාවල යෙදෙන්නන් ද ඉතා උද්ඝෝෂයකින් යුතුව කටයුතු කරන්නේ රාත්‍රි කාලයේය.)
4 ගැටවලට පිඹ හූනියම් කරන ගැහැණුන්ගේ විපත්වලින් ද (අල්ලාහගෙන් ආරක්ෂාව පතමි. මන්ද ඔවුහු නූල්වල ගැට දමා හූනියම් කරන විට ඒවාට පිඹිති.)
5 ඊර්ෂ්‍යා කරන්නා ඊර්ෂ්‍යා කළහොත් ඔහුගේ විපත්වලින් ද (නුඹෙන් ආරක්ෂාව පතමි. ඊර්ෂ්‍යාව යනු අනෙක් සහෝදරයා ලග ඇති අල්ලාහ්ගේ දයාවෙන් ලැබුන දෑ නැති විය යුතු යැයි ආශා කිරීමයි).

## අන්-නාස්

1 (නබිවරයාණනි,) නුඹ කියහි, මිනිසුන්ගේ රක්ෂකයාගෙන් මම ආරක්ෂාව පතමි. (මිනිසුන්ගේ රක්ෂකයා යන්නෙහි තේරුම ඔවුන්ව මවා ඔවුන්ගේ ක්‍රියාදාමයන් සැලසුම් කර ඔවුන්ගේ සියළුම කාර්යයන් හරියාකාර කරවන්නා යනුයි.)
2 ඔහු මිනිසුන්ගේ රජුය (ඔහුටම සම්පූර්ණ පාලනය ද මැඩ පවත්වා පාලනය කිරීමේ බලය ද හිමි වන්නේය.)

ترتيبها ١١٢ — سُورَةُ الإِخْلَاصِ — آياتها ٤

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

قُلْ هُوَ ٱللَّهُ أَحَدٌ ١ ٱللَّهُ ٱلصَّمَدُ ٢ لَمْ يَلِدْ
وَلَمْ يُولَدْ ٣ وَلَمْ يَكُن لَّهُۥ كُفُوًا أَحَدٌۢ ٤

ترتيبها ١١٣ — سُورَةُ الفَلَقِ — آياتها ٥

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

قُلْ أَعُوذُ بِرَبِّ ٱلْفَلَقِ ١ مِن شَرِّ مَا خَلَقَ ٢ وَمِن
شَرِّ غَاسِقٍ إِذَا وَقَبَ ٣ وَمِن شَرِّ ٱلنَّفَّٰثَٰتِ فِى
ٱلْعُقَدِ ٤ وَمِن شَرِّ حَاسِدٍ إِذَا حَسَدَ ٥

ترتيبها ١١٤ — سُورَةُ النَّاسِ — آياتها ٦

بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَٰنِ ٱلرَّحِيمِ

قُلْ أَعُوذُ بِرَبِّ ٱلنَّاسِ ١ مَلِكِ ٱلنَّاسِ ٢ إِلَٰهِ
ٱلنَّاسِ ٣ مِن شَرِّ ٱلْوَسْوَاسِ ٱلْخَنَّاسِ ٤ ٱلَّذِى
يُوَسْوِسُ فِى صُدُورِ ٱلنَّاسِ ٥
مِنَ ٱلْجِنَّةِ وَٱلنَّاسِ ٦

3 මිනිසුන්ගේ නැමදුමට සුදුසු දෙවියා (එනම් රජු සමහරවිට නමැදුම් ලැබිය හැක. සමහර විට නමැදුම් නොලබා සිටිය හැක. එහෙත් ඉලාහ් යන වදන එහි කිසිවෙකු කොටස් කරුවන් නොවන බව පැහැදිලි කරන්නේය.)
4 5 සැඟවී සිට සැක පහළ කරවිය හැකි ෂෙයිතාන්ගේ විපත්වලින් ද (ආරකෂාව පතමි.) ඔහු ජනතාවගේ සිත්තුළ සැක පහළ කරන්නෙකි (ඔහුව පිළිපදින මෙන් රහස්‍ය ලෙස ජනතාව හට ආරධනා කර, කලහකම් ඇති කරවීම ඔහුගේ පුරුද්ද වන්නේය. සිතේ කලබලය ඇති කරගන්නවුන් කොටස් දෙකකි. පළමුවැන්නන් ජින් වරුන්ය. දෙවැන්නන් මිනිසුන්ය.)
6 මෙවැනි අය ජින්වරුන් හා මිනිසුන් අතරද සිටිති. (ජින් වර්ගයේ ෂෙයිතාන් මුලින් කී පරිදි ජනතාවගේ සිත් තුළ සාංකාවන් ඇති කරති. මිනිස් වර්ගයේ ෂෙයිතාන්වරු හොඳින් උපදෙස් දෙන අයුරින් මිනිසුන්ගේ සිත්තුළ කැළඹිලි ස්වභාවය ඇති කරන්නේය. ඉබ්නු අබ්බාස් තුමා මෙසේ පවසයි. ළදරුවන් ඉපදින විට ඔවුන්ගේ සිත්වල සෙලවීමකින් තොරව ඉපදින්නේ නැත. ඔහු අල්ලාහ්ව සිතන විට ෂෙයිතාන් බැහැරව යයි. අල්ලාහ්ව අමතක කරන විට ෂෙයිතාන් සිතේ කැළඹිලි ඇති කරයි. අල්ලාහ් ෂෙයිතාන්ගේ හැසිරීමෙන් හා ඔහුගේ කුමන්ත්‍රණයෙන් අපව ආරකෂා කරත්වා.)

# මුස්ලිම් වරයෙකුගේ ජීවිතයේ වැදගත් ප්‍රශ්න කීපයක්

**1. මුස්ලිම්වරයෙකු තම ප්‍රතිපත්තීන් කොහි සිට ලබාගනී ද?** අල්ලාහ්ගේ පුස්තකයෙන් හා තම සිතැගි පිරිදි කථා නොකළ නබිවරයාගේ සහීහ් වු හදිස්වලින් ලබා ගන්නේය. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: එය ඔහුට දන්වනු ලබන වහී හැර අන් කිසිවක් නැත. එය සහාබිවරුද සැදැහැවතුන් වු පැරැණ්නන්ද තේරුම්ගත් අයුරින් තේරුම් ගත යුතුය

**2. මත භේදයක් ඇතිවුවහොත් කුමක් වෙත අපි යොමු වෙමු ද?** සෘජු දහම කරා යොමුවෙමු. අල්ලාහ්ගේ දහමද නබි තුමන්ගේ සුන්නාවද මුලාශ්‍රයන් වන්නේය. අල්ලාහ් ප්‍රකාශ කරයි 'නුඹලා කුමක් හෝ ගැටලුවක් ඇති කර ගතහොත් එය අල්ලා වෙත භාර දෙනු" නබි (සල්) තුමාණෝ පවසයි. *මා නුඹලා හට විෂයන් දෙකක් අත් හැරියෙමි, එම විෂයන් දෙක නුඹලා රැක ගන්නා කල් නුඹලා මංමුළාවට පත් නොවේ. අල්ලාහ්ගේ පරිශුද්ධ ග්‍රන්ථය හා ඔහුගේ වක්තෘවරයාගේ සුන්නාවය වේ.* (අල් මුවත්තා)

**3. පරලොව දී විමුක්තිය ලබන කොටස කවරහුද?** රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ. *මගේ සමූහයා කොටස් 73 කට වෙන් වෙති. එක කොටසක් හැර අනෙක් හැමෝම අපායේ සිටිති" එවිට සහාබාවරු අල්ලාහ්ගේ දූතයාණනි: ඔවුහු කවරහුදැ? යි ඇසූහ. එවිට එතුමෝ මා හා මගේ මිතුරන් රකින ප්‍රතිපත්තියෙහි සිටින අය යැයි පිළිතුරු දුන්හ.* (තිර්මිදි) නුඹේ ක්‍රියාවන් පිළිගත යුතුයැයි ඔබ ප්‍රිය කරන්නේ නම් එය පිළිපදින්න. අළුතෙන් වතාවන් ඇති කිරීමෙන් වළකින්න.

**4. යහපත් ක්‍රියා අනුමත වීමට අවශ්‍ය කොන්දේසි කුමක්ද?** 1. අල්ලාහ්ව විශ්වාස කිරීම හා ඔහුව ඒකීයත්වයට පත් කිරීමය" මන්ද ආදේශ කරන්නාගේ යහපත් ක්‍රියා අනුමත නොවේ. 2. පිරිසිදු චේතනාව එනම් යහපත් ක්‍රියා මගින් අල්ලාහ් පිළිබඳ මනාපය ඇති කරගැනීම 3. එහිදි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ව පිළිපැදීම එනම් එතුමාණන් පෙන්වා දුන් පරිදි කිරීම" මේවායින් කුමක් හෝ එකක් නැතිනම් එම ක්‍රියාව අනුමත නොවේ. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි" 'තවද අපි ඔවුහු කළ ක්‍රියාවන් දෙස බලා ඒවා විහිදුනු දුවිලි බවට පත් කළෙමු.

**5. ඉස්ලාමයේ පියවර කොපමණක් ඇත් ද?** එහි පියවරවල් තුනකි. එනම් ඉස්ලාම්" ඊමාන් හා ඉහ්සාන්ය"

**6. ඉස්ලාම් යනු කුමක් ද? එහි කුළුණු කීය ද?** ඉස්ලාම් යනු ඒකීයත්වය මගින් අල්ලාහ්ට අවනතවීමත් ඔහුට යටහත්වීමත් ආදේශ කිරීමෙන් හා ආදේශ කරන්නන්ගෙන් ද ඈත් වී සිටීමත්ය. එහි කුළුණු පහකි. එය රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පහත සඳහන් පරිදි කීහ. *ඉස්ලාම් කරුණු පහක් පදනම් කරගෙන ගොඩනගා ඇත. එනම් නැමදුමට සුදුසු දෙවියා අල්ලාහ් හැර වෙන කිසිවෙකු නැත. මුහම්මද් (සල්) තුමාණන් ඔහුගේ දූතයා බවට සාක්ෂි දැරීම, සලාතය ස්ථාවරව ඉටු කිරීම, සකාත් දීම" කඃබාහ්ව හජ් කිරීම හා රමළාන් මස උපවාසයේ නියැළීම වේ"* (බුහාරි, මුස්ලිම්)

**7. ඊමාන් යනු කුමක් ද? එහි කුළුණු කීය ද?** ඊමාන් යනු සිතෙන් තහවුරු කිරීම ද, කටින් කීමද අවයවවලින් ක්‍රියා කිරීමද වන්නේය. වතාවන් මගින් එය වර්ධනය වන්නේය. පාපක්‍රියා මගින් එය අඩුවෙයි. අල්ලාහ් මෙසේ පවසයි: ඔවුන් ඊමානය සමග තවදුරටත් ඊමානය වර්ධනය කිරයි" රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පැවසුවෙය" *ඊමාන් ශාඛා හැත්තෑ ගණනක ප්‍රමාණයක් යුක්තය. එහි ඉතා උසස් වන්නේ ලා ඉලාහ ඉල්ලල්ලාහ් යන වදනයි. ඉතාමත් පහත්ම එක වන්නේ පාරවල්වල මිනිසුන්ට හානියක් සිදුවිය හැකි දෑ ඉවත් කිරීමයි. ලැජ්ජාව ඊමානයේ ශාඛාවකි.* (මුස්ලිම්) වැදගත් කාලවලදී යහපත් ක්‍රියාවන් පිළිබඳ උනන්දුවත් පාපක්‍රියා පිළිබඳව ඇති වන අලසකමත් ඊමාන් වර්ධනය වීම හා අඩු වීමද තහවුරු කරන්නේය. අල්ලාහ් නියත වශයෙන්ම කුසල් මගින් අකුසල් ඉවත්වේ යැයි ප්‍රකාශ කරයි. ඊමාන්හි කුළුණු හයකි. රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ වදාලහ. *අල්ලාහ්ව ද ඔහුගේ මලක්වරුන්, අල්ලාහ්ගේ ආගම්, ඔහුගේ දූතයින්, අවසන් දිනය හා යහපත හා අයහපත දේවමනාපය පරිදි සිදුවේවි යැයි විශ්වාස කිරීම* (මුස්ලිම්)

**8. ලා ඉලාහ ඉල්ලල්ලාහු යනු කුමක්ද?** නැමදුමේ අයිතිය අල්ලාහ් නොවන දැයින් ඉවත් කර අල්ලාහ්ට පමණක් එය හිමි කිරීම.

**9. අල්ලාහ් අප සමග සිටී ද?** එසේය. අල්ලාහ් ඔහුගේ දැනුම, ශ්‍රවණය" බැලීම, ආරක්‍ෂා කිරීම, ශක්තිය හා මනාපය ආදියෙන් අප සමග සිටී. එහෙත් ඔහුගේ සාත් නැමති ස්වකීයත්වය" මැවීම්වල සාත් සමග මිශ්‍ර නොවෙයි. මැවීම්වලින් කිසිවක් එය වසාගන්නනේද නැත.

**10. අල්ලාහ්ව ඇසෙන් දැකිය හැකි ද?** අල්ලාහ්ව මෙලොවදී ඇසෙන් දැකිය නොහැක. මු:මින්වරු මහ්ෂර්හි ද ස්වර්ගයෙහි ද ඔහුව දකින්නේ යැයි අහ්ලුස් සුන්නා වරුන්ගේ එකම මතයයි. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි" එදින සමහරුන්ගේ මුහුණු ප්‍රසන්නව පවතී. එයින් තම දෙවියන්ව බලමින් සිටී.

**11. අල්ලාහ්ගේ ශුද්ධ නාමයන් ද ඔහුගේ ගුණාංගයන් ද දැන ගැනීමේ ප්‍රයෝජනය කුමක් ද?** අල්ලාහ් තම මැවීම්වලට නියම කළප්‍රථම වගකීම ඔහුව දැන ගැනීමයි. මිනිසුන් ඔහු නිසියාකාරව දැන ගන්නේ නම් ඔහුට නියම අන්දමින් නැමදුම් ඉටු කරන්නේය. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බව නුඹ දැන ගනිවු. අල්ලාහ්ගේ දයාව විශාල යැයි සිතීම ඔහු මත පක්ෂපාතිත්වය දක්වයි" ඔහුගේ දඬුවම දැඩි යැයි සිතිම ඔහු පිළිබඳව වු බිය තහවුරු කරයි" ඔහුම උදව්කරන්නේ යැයි සිතීම කෘතවේදිත්වය ඇති කරයි. ඔහුගේ ශුද්ධ නාමයන් අනුව ද ඔහුගේ ගුණාංගයන් අනුවද ඔහුට නැමදුම් ඉටු කිරීමේ අදහස වනුයේ ඒවායේ තේරුම් දැනගෙන ඒ අනුව කුසල් කිරීමය.

අල්ලාහ්ගේ ශුද්ධ නාමයන් හා ගුණාංගයන් අතුරින් දැනුම, සෙනෙහස, නීතිය ආදි ගුණාංග ගැත්තන් ලගද තිබිය යුතු ඒවාය. තවද යටහත් විම, අවශ්‍යතා ඇතිවීම, අනෙක් අයගෙන් ඇසීම හා නිහතමානිකම ආදිය ගැත්තන් ලග තිබිය යුතු ගුණාංග වන අතර අල්ලාහ් ලග තිබිය නොහැකි දේවල්ය. මැවීම් අතර අල්ලාහ්ට වඩාත් ප්‍රියමනාප වනුයේ ඔහුට කැමති ගුණාංගයන්ගෙන් යුත් තැනැත්තාය.

**12. අල්ලාහ්ගේ අලංකාර නාමයන කුමක් ද?** අල්ලාහ් මෙසේ පවසයි:- අල්ලාහ්ට ලස්සන වු ශුද්ධනාමයන් ඇත. නුඹලා ඒවා මගින් ඔහුව කැඳවහු" රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පවසති:- *නියතවශයෙන්ම අල්ලාහ් හට සියයකට එකක් අඩු වු ශුද්ධ නාමයන් අනූනවයක් ඇත. කවරෙක් ඒවා මනනය කරයිද ඔහු ස්වර්ගයට පිවිසෙන්නේය.* (බුහාරි, මුස්ලිම්)

*මෙම හදීසයේ මනනය යන වචනයේ කරුණු 3ක් අඩංගු වේ.* (1) එහි වචනයන් හා ගණනයන් මනනය කිරීම. (2) එහි අරුතයන් හා හගවන දෙය දැන තේරුම්ගෙන එය විශ්වාස කිරීම. උදා:- අල්-හකීම් යන අල්ලහ්ගේ ගෞරව නාමයේ හගවන අරුතය මෙන් කෙනෙකුගේ සියලු කාර්‍යයන්ම ඔහු අල්ලහ් වෙත භාර දීම, මන්ද සියලු කාර්‍යයන්ම ඔහුගේ තීරණය අනුවම සිදුවන්නේය. (3) එමගින් අල්ලහ් තආලාව කැඳවා දුආ ඉල්ලීම. උදා:- (යා සත්තාර්)ඕ අඩුපාඩුවන් වසන්නා! මාගේ අඩුපාඩුවන් වසනු මැනව. (යා කරීම්) ඕ කීර්තිය හා ගෞරවය ඇත්තා! මාව කීර්තියට හා ගෞරවයට පත් කරනු මැනව. අල්ලාහු තආලා පවසයි. තවද මාගෙන් පසුව කිසිවෙකට නොලැබෙන පාළන වරප්ප්‍රසාදයක් මා හට පිරීනමනු මැනව,නියතවශයෙන්ම නුඹ වරප්ප්‍රසාද පිරීනමන්නාය.

**කවරෙකු කුර්ආනය හා හදීසය විමසා බලන්නේද ඔහු එහි ඇති එම නාමයන් පාඩම් කරගනි. ඒවානම් :-**

| ගෞරව නාමයන් | අරුතයන් |
|---|---|
| **අල්ලහ්** | නැමදුම් ලැබීමට හා ඔහුගේ මැවීම් ඔහුට වහල් භාවයෙන් සිටීමට සුදුසු වන්තයාය. අවනත වීම, යටහත් වීම,රුකූඋ සුජූද් වැනි සෑම අමලයන්ම ඔහු වෙනුවෙන් පමණක් කිරීම. |
| **අර්-රහ්මාන්** | ඔහු අති විශාල දයාව ඇත්තා හා එය මගින් සමස්ථ මැවීමයන්ම ගොණු කරගන්නා බව හගවන, ඔහුට පමණක් ආවේනික වූ නාමයයි. |
| **අර්-රහීම්** | මෙලොව හා පරලොවෙහි මු:මින්වරුන් හට දයාව පහල කර පාපයන් ක්‍ෂමා කරන්නාකි.නැමදුම් ඉටුකිරීම සඳහා ඔහු ඔවුනට මග පහදා දුන්නෙකි.තවද පරලොවේ ඔවුනට ස්වර්ගය පිරිණමා ගෞරවයට පත්කරන්නෙකි. |
| **අල්-අෆ්වු** | ගැත්තන් පාපයන් කර දඬුවමට සුදුසුකම් පෑ අවස්ථාවේ දී දඬුවම් නොකර ඔහුනට ක්‍ෂමාව දෙන්නාය. |

| | |
|---|---|
| අල්-ගෆූර් | ගැත්තන් පාපයන් හෙළිකර ඔහුන්ව නින්දාවට පත්නොකර එය ක්ෂමා කර වසා දමන්නාය. |
| අල්-ගෆ්ෆාර් | ක්ෂමා අයැදින ගැත්තන්ගේ පාපයන් දැඩි ලෙස ක්ෂමා කරන්නා යන අර්ථය හගවන නාමයකි. |
| අර්-රඌෆ් | අපරිමිත දයාවන්තයාය.එම දයාව මෙලොවේ සියළු මැවීම් හටද,පරලොවෙහි මුඃමින්වරුන් හට පමණක් ද ලැබෙන්නේය. |
| අල්-හලීම් | මැවීම් තුලින් සිදුවන පාපයන්වලට එවෙලාවේ දඬුවම් නොදී එය ප්‍රමාද කර,ඒ සඳහා ඔවුන් ඔහු හට ක්ෂමාව අයැදූ කල, ක්ෂමා කරන්නාය. |
| අත්-තව්වාබ් | ගැත්තන් ක්ෂමාව අයැදීමෙන් පසු, එය තම කැමැත්ත අනුව දයාවෙන් පිළිගන්නා. |
| අස්සිත්තීර් | ඔහු තම ගැත්තන්ගේ පාපයන්,අඩුපාඩුවන් ප්‍රසිද්ධකර නින්දාවට ලක් නොකර ක්ෂමා කරනන්නෙකි.තම ගැත්තන් ද ඔවුනගේ හා අන් අයගේ අඩුපාඩුවන් ප්‍රසිද්ධ නොකොට එය සගවාලීම ප්‍රිය කරන්නෙකි. |
| අල්-ගනී | ඔහු හා ඔහුගේ ගුණාංගයන් අංග සම්පූර්ණවූ බැවින් මැවීම්ගෙන් කිසිඳු අවශ්‍යයතාවකින් තොරවූවකි.එරෙහිව මැවීම ඔහු උදෙසා අවශ්‍යයතාවයන් ඇත්තෝය. |
| අල්-කරීම් | අධික යහපත් ඇත්තා,අධික ලෙස අධිකතර(දන්) දෙන්නා,ඔහුගේ කැමැත්තට භාජණය වූවන්හට කැමැති ප්‍රමාණයක් කැමැති අයුරට ඔහුන් ඇසීමෙන් හෝ නොඇසීමෙන් දෙන්නාය.තවද පාපයන් ක්ෂමා කොට අඩුපාඩුවන් සගවන්නාය. |
| අල්-අක්රම් | අධිකතර(දන්) දීමෙහි උසස් තත්වය ලබන්නා.එහි ඔහුට සමව කිසිවෙකු නොමැත.සියළු යහපත ඔහු වෙතින්ම පැමිණේ.යහපත කරන්නාහට ඔහුගේ මහිමයෙන් කුසල් ලබාදෙන්නේය.පාපයන් කරන්නාහට අවස්ථාවන් දී තම යුක්තිය මගත් විභාග කරන්නේය. |
| අල්-වහ්හාබ් | විශාල දන ඇත්තාය.යළි උදව් නොපතා දෙන්නෙකි.තවද නොඅසන්නන්ට ද කිසිඳු අරමුණකින් තොරව දෙන්නෙකි. |
| අල්-ජව්වාද් | තම ගැත්තන්හට විශාල ලෙස උදව් උපකාර කරන්නාය. |
| අල්-වදූද් | තම සෙනෙහෙවන්තයින්හට ආදරය දක්වන්නා. ක්ෂමාව හා දයාව මගින් ගැත්තන්හට ආදරය දක්වන්නා.තවද ඔවුන්ව තෘප්තියට ලක් කරගෙන ඔවුන්ගේ යහ අමලයන් වැළඳ ගන්නාය.පොළොවේ ඔවුන්ට පිළිගැනීමක් ඇති කර දෙන්නෙකි. |
| අල්-මුඃති | තම දනයෙහින් මැවීම්වලට තම කැමැත්ත අනුව කැමැති ප්‍රමාණයක් දෙන්නා.විශේෂයෙන් එයින් වැඩි හරියක්ම තම ස්නේහයට ලක්වූවන්ට දෙන්නාය.මැවීම්වල මැවීම්රටාව හා එහි පෙනුම දෙන්නා ඔහුමය. |
| අල්-වාසිඋ | ඔහු ගුණය අතින් විශාල වන්තයාය.එනිසා මැවීම් ඔහුව ප්‍රශංසාවට ලක්කොට නිම කළනොහැක.ගෞරවය හා පාලනය අතින් විශාල වන්තයාය.අධිකතර(දන්) හා උපහාර අතින් ද විශාල වන්තයාය. |
| අල්-මුහ්සින් | ඔහු තමන්ගෙන් ද තම ගුණාංගයන්ගෙන් ද තම ක්‍රියාවෙන් ද අලංකාරවන්තයෙකි.තවද සියළු මැවීමයක්ම අලංකාරි මැවීම් රටාව අනුව මවන්නාය.තවද තම මැවීම්හට උපහාර දක්වන්නාය. |
| අර්-රාසික් | සියළු මැවීම්වලට රිස්ක් සපයන්නාය. ලෝකයන්ව මැවීමටපෙර ඔවුන්ගේ රිස්කයන් තීන්දු කරන්නාය.ප්‍රමාධයෙන් හෝ එය ඔවුන්හට සැපයීම භාරව සිටින්නාය. |
| අර්-රස්සාක් | ඔහු තම ගැත්තන්හට අධිකලෙස රිස්කය සපයන්නා යනුවෙන් හගවන නාමයකි. ඔවුන් ඔහුගෙන් ඇසීමට පෙර සපයන්නාය. ඔවුන් ඔහුට එරෙහිව ක්‍රියා කළත් ඔවුන්හට රිස්කය සපයන්නාය. |
| අල්-ලතීෆ් | සූක්ෂම ලෙස විෂයන් දැනගන්නා. සැගවුනු කිසිමදෙයක් ඔහුට නොසැගවේ. ගැත්තන් බලාපොරොත්තු නොවූ අන්දමින්, රහසිගතව හා මග කිහීපයකින් යහපත් හා ප්‍රයෝජණයන් ඔවුන් වෙත ගෙන දෙන්නේය. |
| අල්-හබීර් | තම නුවණ මගින් බාහිර දෑ දැනගන්නා මෙන් අභ්‍යන්තර දෑ ද දැනගින්නෙකි. |

| | |
|---|---|
| අල්-ෆත්තාහ් | තම නුවණ හා ඥාණයට ගොනු වන තරම්, තම ආණ්ඩුව,කරුණාව හා රිස්ක් වැනි දායාදයන් විවෘතකර දෙන්නෙකි. |
| අල්-අලීම් | තම ඥාණය තුලින් සැගවුනු නොසැගවුණු, රහසිගත පරහසිගත හා අතීත අනාගත වර්තමාන සිදුවීම් සියල්ලෙහි සම්පූර්ණ දැනුම ඇත්තෙකි.ඔහුට කිසිවක් නොසැග වෙ. |
| අල්-බර්රු | තම මැවීම්හට විශාල උදව් උපහාර කරන්නෙකි. කිසිවකු හෝ ඔහුගේ දායාදයන් ගණනය කර නිම කිරීමට නොහැකි වන්නේය.තවද ඔහු ඔහුගේ පෙරොන්දුවෙහි සත්‍යවන්තයාය.තම ගැත්තන්ගේ පාපයන් ක්ෂමා කර ඔවුන්ය උදව් කර ආරක්ෂා කරන්නෙකි.තවද ඔවුන්ගෙන් සුළු අමලයන් ද පිළිගෙන එය වර්ධනය කරයි. |
| අල්-හකීම් | සියළු දෑ එයට සාපේක්ෂ ස්ථානයේ නිර්මාණය කිරීම.ඔහුගේ සැලැස්මෙහි කිසිදු වැරද්දක් දක්නට නොලැබේ. |
| අල්-හකම් | තම ගැත්තන් අතර යුක්තියෙන් තීන්දු කරන්නෙකි.ඔවුන් කිසිවකුට අයුක්ති නොකරන්නෙකි.ඔහුමය මනුෂ්‍යයන් අතර තීන්දු කිරීම බැවින් අල්-කුර්ආනය පහළ කළේය. |
| අෂ්ෂාකිර් | තමන්ට අවනත වූවන්හට ප්‍රශංසා කර, ඔවුන් කරන යහ ක්‍රියාවන් එය සුළු වුව ද කුසල් ලබා දෙන්නෙකි.තවද ඔහුට ස්තුතිවන්ත වීම් මැනව මෙලොවෙහි අධික කිරීමෙන් හා පරලොවෙහි කුසල් ලබා දීමෙන් ප්‍රති උපකාර කරන්නෙකි. |
| අෂ්ෂුකූර් | ගැත්තන්ගේ සුළු අමලයන් ඔහු හට වර්ධණය වී එයට කිහිප ගුණයෙන් කුසල් ලබා දෙන්නාය.අල්ලහ් ගැත්තන්හට ස්තුතිය පුද කිරීම යනු, ඔවුනගේ අමලයන් පිළිගැන කුසල් ලබා දීම වේ. |
| අල්-ජමීල් | තමන්තුලින් ද තම ගුණාංගයන් හා ක්‍රියාවන්ගෙන් ද අලංකාරවන්තයෙකි.ගැත්තන් තුළ දක්නට ලැබෙන අලංකාරයන් ද ඔහුගේ පිරිනැමීමකි. |
| අල්-මජීද් | උසස් පොලොවෙහි මහිමය,ගෞරවය,අවංකභාවය හා උසස්තත්වය යනාදීන් ඔහු සතුව ඇත්තෙකි. |
| අල්-වලී | ගැත්තන්ගේ අවශ්‍යතාවයන් සපුරා,තම ආණ්ඩුව ක්‍රියා කිරීමට සැලසුම් කරන්නාය. තවද තම ආදර වන්තයින්හට උදව් කරන්නා. |
| අල්-හමීද් | තම අලංකාර නාමයන්වලට,ගුණාංගයන් හා ක්‍රියාවන් හේතු කොට ගැන ප්‍රශංසාවට ලක් වන්නාය.සතුටේදී ද දුකේදී ද ප්‍රශංසාවට ලක් වන්නාය.පොදුවේ සෑම ප්‍රශංසාවකටම සුදුස්සාය,මන්ද ඔහු සෑම සම්පූර්ණත්වය කෙරෙහි වර්ණනා කරනු ලබන්නාය. |
| අල්-මව්ලා | රක්ෂකයා,ආණ්ඩුකාරයා,නායකයා හා තම ආදර වන්තයින්හට උදව් කරන්නා. |
| අන්නසීර් | තම කැමැත්තට ලක් වූ ගැත්තන්හට උදව්කර ස්ථිර කරන්නාය.ඔහුගෙන් උදව් ලැබූවන්හට කිසිවෙකුහෝ ඉක්ම විය නොහැක.තවද ඔහු උදව් නොකරන්නන්හට කිසිවෙකුටහෝ උදව් කළ නොහැක. |
| අස්-සමීඋ | ඔහු සියළු රහස පරහස් කථිකාවන්ම අසන්නාය.සුළු හා මහා ශබ්දයන් ද අසන්නාය.තවද තමාව කැඳවන්නන්හට පිළිතුරු දෙන්නාය. |
| අල්-බසීර් | මෙලොව හා පරලොවෙහි ඇති සියල්ලක්ම එය කුඩා වුව ද විශාල වුව ද,බාහිර හා අභ්‍යන්තරයට ලක්වූවක් වුව ද, එය බලන්නාය. |
| අෂ්-ෂහීද් | තම මැවීම් රැකබලා ගන්නාය.තමා ඒකයකු හා යුක්තිවන්තයා යැයි තමා හට සාක්ෂි කියන්නාය.මූඃමින්වරු ඔහුව ඒකයෙකු යැයි පවසනවිට,ඔවුන් සත්‍යවන්තයින් බව සාක්ෂි දරන්නාය.ඔහුගේ මලෙක්වරුන් හා නබිවරුන්ට සාපේක්ෂව සාක්ෂි දරන්නාය. |
| අර්-රකීබ් | මැවීමයන්ගේ ක්‍රියාවන් කිසි වැරද්දකින් තොරව ඉතා සූක්ෂම ලෙස දැන සිටින්නාය. ඔහුගේ දැනුමෙන් තොරව ඇහි පිල්ලම් ගැසීමක් හෝ සිත් ඇසිරීමක් හෝ නොගිලිහීයයි. |

| | |
|---|---|
| අර්-රකීබ් | ඔහුගේ ක්‍රියාවන්හි ඉතා ආදරවන්තයාය. තම මැවීම් හා සම්බන්ධ දෑ වල සන්සුන්ව ක්‍රියා කරන්නේය.තම ගැත්තන්ව සන්සුන්ව හා ආදරයෙන් මෙහය වන්නාය.ඔවුන්ගේ ශක්තියට ඉක්ම වූ දෙයින් දුෂ්කරයට නොකරන්නාය.එසේම තම ගැත්තන්ගෙන්ද, ආදරය හා සන්සුන්භාවයෙන් යුත්තන්ව ප්‍රිය කරන්නේය. |
| අල්-කරීබ් | ඔහු තම ඥාණය හා දැනුම තුලින් සියළු මැවීම් සමග ඉතා සමීපව සිටින්නේය.තම දයාව හා කරුණාව තුලින් මුඃමින්වරුන් හා සමීපව සිටින්නේය.එහෙත් ඔහු තම අර්ෂයේ සිටින්නේය.ඔහු කිසි විටක මැවීම් සමග මිශ්‍ර නොවෙයි. |
| අල්-මුජීබ් | ඔහුහට ප්‍රාර්ථනා කරන්නා හා අසන්නාවුන්ට ඔහුගේ දැනුම හා ඥාණයට පාත්‍රවන බැවින් පිළිතුරු දෙන්නාය. |
| අල්-මුකීත් | ඔහු ආහාර පානාදිය මවා, තම මැවීම්හට සපයන්නාය.ඔහු කිසිඳු අඩුපඩුවකින් තොරව එය හා ගැත්තන්ගේ අමලයන් ආරක්ෂා කරන්නේය. |
| අල්-හසීබ් | තම ගැත්තන්ගේ මෙලොව පරලොව ඔවුනගේ අවශ්‍යතාවයන් සපුරන්නා. විශේෂයෙන් මුඃමින්වරුන්ට එයින් විශාල කොටසක් ඇත.තවද තම ගැත්තන් මෙලොව කළ ක්‍රියාවන් ගැන ප්‍රශ්න කරන්නාය. |
| අල්-මුඃමින් | තම දූතයින් හා ඔවුන්ව අනුගමනය කළවුන්,ඔවුන් සත්‍යයවන්තයින් බව සාක්ෂි දැරීම තුලින් ද ඔවුන්ට අවශ්‍යය සාධකයන් ලබාදීම තුලින් ද ඔවුන්ව සනාත කරන්නාය.ඔහුමය මෙලොව හා පරලොවහි ආරක්ෂාව දෙන්නාය.අයුක්ති,දඬුවම් හා බිය වැන්නන්ගෙන් පරලොවෙහි මුඃමින්වරුන්ව ආරක්ෂා කිරීමේ වගකීම දෙන්නාය. |
| අල්-මන්නාන් | තම මැවීම්හට අධිකව හා විශාලත්වයෙන් අධිකතර දෙන්නාය. |
| අත්තය්යිබ් | සියළු අඩුපාඩුවන්ගෙන් පරිශුද්ධ වන්නයාය.සම්පූර්ණ අලංකාරය හා පූර්ණත්වය ඔහුට පමණක් හිමිවේ. තම මැවීම්වලට අධික යහපත පතන්නා.ගැත්තන්ගේ කුසල හා යහ අමලයන්ගෙන් පරිශුද්ධ,හලාල් හා පිරිසිදු චේතනාවෙන් ඉටු කරනු ලැබූවන් පමණක් ඔහු පිළිගන්නේය. |
| අෂ්ෂාෆි | සිතට හා ශරීරයට ආරෝග්‍යය ලබාදෙන්නාය.ගැත්තන්ගෙ දැනැහි ඔහු විසින් පහසු කර දුන් ඖෂධ යන්ද දක්නට ලැබෙති. එය තුලින් ආරෝග්‍යය ලබාදීම ඔහු සතුවම වේ. |
| අල්-හෆීළ් | ගැත්තන් හා ඔවුන්ගේ ක්‍රියාවන්, ඔහුගේ මහිමයෙන් හා ශක්තියෙන් ආරක්ෂා කරන්නා. |
| අල්-වකීල් | ලෝවැසියන් මැවීම හා ඔවුන්ගේ අවශ්‍යයතාවයන් සැළසුම් කරන්නාය. ඔවුන්ව ඇති කිරීම හා උදව් කිරීමේ භාරවන්තයාය.<br>උත්සහා කිරීමට පෙර ක්‍රියාව ඔහු වෙත පවරන මුඃමින්වරුන්ගේ භර වන්තයාය.තවද ඔවුන් එහි මග දී ඔහුගෙන් උදව් පතන්නන් හා අනුකූලයට ස්තුතිය පුද කර ප්‍රශංසා කරන්නන් වන්නෝය.ඔවුන්හට කොටස් කරනු ලැබූ දෙයින් තෘප්තිය ලබන්නෝය. |
| අල්-කල්ලාක් | අධික ලෙස මැවීමට ශක්තිය ඇත්තා යන්න හගවන නාමයකි.ඔහු අඛණ්ඩව මවාගෙන සිටින්නාය.මෙම නාමය ඔහුහට නිරණ්තරයෙන් යුක්තව තිබේ. |
| අල්-කාලික් | කිසිඳු ආදර්ශයකින් තොරව මවන්නාය. |
| අල්-බාරිඋ | ඔහුගේ තීන්දුවට අනුව මැවීමට ඇති මැවීම් මවා ඒවා හෙළි කරන්නාය. |
| අල්-මුසව්විර් | ඔහුගේ ඥාණය,දැනුම හා දයාව වන්නට අනුව ඔහු තෝරාගත් රූපයන් මගින් මැවීම් මවන්නාය. |
| අර්රබ්බු | තම දයාවෙන් ගැත්තන්ව පරිපාළනය කර ක්‍රමක්‍රමයෙන් ඇතිකරන්නාය.තම සෙනෙහෙවන්තයින්ගේ හදවත් ද එය ශීලාචාර කිරීම තුලින් පරිපාළනය කරන්නා.තවද ඔහු මවා පාලනය කරන නායකයාය. |
| අල්-අළීම් | ඔහුගේ සාතය,ගුණාංගය හා ක්‍රියාවන්ගෙන් ගෞරවය ඇත්තාය.එනිසා ගැත්තන් ඔහුව ගෞරවයට ලක් කිරීම හා ඔහුගේ අණ හා වැළකීම්හට ගෞරවය කිරීම ද අවශ්‍යය වේ. |

| | |
|---|---|
| අල්-කාහිර් | ඔහු තම ගැත්තන්ව මෙල්ල කර,තමාහට නැමදුම් කරන ලෙස පනවා,උසස්ව සිටින්නාය.තවද සමස්ථ මැවීම්යන්ම ඔහුට යටහත් වී සටිති. |
| අල්-කහ්හාර් | ඉහත සඳහන් ගුණාංගය ඉක්ම වන්නාය. |
| අල්-මුහයිමින් | දෙයක් පාලනය කර බලාගන්නාය. |
| අල්-අසීස් | ශක්තිය තුලින් ලැබෙන ගෞරවය තවත් කෙනෙකුහට අවශ්‍යතාවයෙන් තොරව සිටීමෙන් ලැබෙන ගෞරවය හා කෙනෙකු පාලනයට ලක් කිරීම මගින් ලැබෙන ශක්තිය තුලින් ලැබෙන ගෞරවය හා සියළු ගෞරවයට පාත්‍රවන්නාය.කිසිවකුට ඔහුව අධිකවායාමට නොහැකි අතර ඔහු කිසිවකුහට අවශ්‍යතා නොවන්නෙකි.තවද ඔහුගේ අනුමැතියෙන් තොරව කිසිවක් නොසැළවේ. |
| අල්-ජබ්බාර් | ක්‍රියාවට ලක්වන ඇල්ම ඇත්තා.මැවීම් සියල්ල ඔහුට අවනත වනු ලැබේ.ඔහුගේ තීරණයට යටහත්වේ.තවද අඩුපාඩුවන් පූර්ණ කරන්නාය.දුප්පතුන්ගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන්නාය.අපහසුතාවය පහසු කර දෙන්නාය.ලෙඩ රෝගයෙන් පෙළෙණනන්හට සුවය දෙන්නාය. |
| අල්-මුතකබ්බිර් | සියළු අඩුපාඩුවන්ගෙන් තොර වූ ගෞරව වන්තයාය. තම ගැත්තන්හට අයුක්තිය ඉටු නොකිරීමෙන් උසස් වන්තයාය.තම ගැත්තන්ගෙන් අවනත නොවන්නන්ව අවනත කරවන්නාය.ආඩම්බරවන්තයාය.මෙම ගුණාංගයෙහි කවරෙකු හෝ ඔහුට විරුද්ධවූයේ නම්,ඔහුට දඬුවම් දී අවනක කරවන්නාය. |
| අල්-කබීර් | ඔහුගේ සාතය,ගුණාංගය හා ක්‍රියාවන්හි විශාල වන්තයාය.ඔහුට වඩා විශාල කිසි දෙයක් නොමැත.ඔහුගේ ගෞරවය හා සසඳා බැලීමේ දී සියල්ල කුඩාය. |
| අල්-හයිය්යු | ඔහුගේ ගෞරවය හා විශාල ශක්තියට ද සම වන මෙන් ලජ්ජාව යන ගුණාංගය ඇත්තාය. එය ඔහුගේ අධිකතර,ගෞරවය වැන්නන් මගින් එන ලද ලජ්ජාවයි. |
| අල්-හය්යු | තිරණ්තරයෙන් පූර්ණව ජීවත් වීමේ හැකියාව ඇත්තා.ඔහුට ආරම්භයක් හෝ අවසානයක් හෝ නැත.ලොවෙහි දක්නට ලැබෙන සියල්ලටම ජීවය දෙන්නා ඔහුමය. |
| අල්-කය්යූම් | තම මැවීම්ගේ අවශ්‍යතාවයෙන් තොරව,තමන් තුළම පැවතින්නාය. අහසෙහි,පොළොවෙහි සිටින සියල්ලන්වම පාලනය කරන්නාය.ඔවුන් සියල්ලෝම ඔහු වෙත අවශ්‍යතාවයෙන් යුත්තෝය. |
| අල්-වාරිස් | මැවීම් විනාශ වීමෙන් පසු ඉතිරි වන්නාය.සෑම වස්තුවක්ම උරුමක්කාරයාගේ විනාශයෙන් ඔහු වෙතම පැමිණේ.අප දැනැගි තිබෙන සියල්ල එක් දිනක එහි උරුමක්කාරයා වන අල්ලාහ් වෙතම පැමිණෙන්නේය. |
| අද්-දය්යාන් | මැවීම් සියල්ල ඔහුට අවනත වේ.තවද ගැත්තන් ඔවුන්ගේ ක්‍රියාවන්හට කුලිය ලබාදෙන්නාය.එය යහවිපාක වුව ද එය කිහිප ගුණයෙන් වැඩිකරන්නාය.එය පාපයක් නම්, එයට දඬුවම හෝ ක්ෂමාව දෙන්නාය. |
| අල්-මලික් | අණකිරීම්,වැළකීම් හා ජයගැනීම් වැන්නහුන්ට උරුමක්කාරයාය.මැවීම් අතර ඔහු පමණක් අණකිරීම් හා වැළකීම කරන්නාය.ඔහුගේ ආණ්ඩුව පාලනය කිරීමට හෝ ස්ථිරීමට කිසිවකුගෙන් උදව් නොපතන්නාය. |
| අල්-මාලික් | මූලිකව හා සුදුසුකමින් ආණ්ඩු පාලකයාය.ඔහු හැර මැවීම් කිසිවක් නොතිබි එය මවන අවස්ථාවේදී ද ආණඩුපාලනය ඔහු සතුම තිබුණි.තවද සමස්ථ මැවීම් විනාශවීමෙන් පසු ද මෙම ආණඩුපාලනය ඔහු සතුවේ. |
| අල්-මලීක් | මෙය අල්-මලික් නාමයට වඩා ඉක්ම වූ නාමයකි. |
| අස්-සුබ්බූහ් | සියළු අඩුපාඩුවන්ගෙන් පරිශුද්ධ කරනු ලබන්නා.මන්ද සම්පූර්ණ ගුණාංගය හා අලංකාරය ඔහුට පමණක් ඇත්තාය. |
| අල්-කුද්දූස් | කෙසේ වුවද සියළු අඩුපාඩුවන්ගෙන් පරිශුද්ධ කරනු ලබන්නා.මන්ද පොදුවේ සම්පූර්ණ ගුණාංගයෙන් යුත් තනිකඩයාය.කිසාවෙකු ඔහුට තිඳසුනක් නොවන්නේය. |
| අස්-සලාම් | ඔහුගේ සාතය,ගුණාංගය හා ක්‍රියාවන්හි අඩුපාඩුවෙන් තුරන් වී සිටින්නාය.මෙලොව හා පරලොවෙහි සියළු ශාන්තියන් ඔහු මගින් ද ලැබෙන්නේය. |
| අල්-හක්කු | ඔහු ද ඔහුගේ ගුණාංගයන් හා ක්‍රියාවන්ගෙන් ද ඔහු රක්ෂකයා යන්නෙහි ද කිසිඳු සැකයක් නොමැත්තාය. |

| | |
|---|---|
| අල්-මුබීන් | තම ඒකීයභාවය,දැනුම,ඥාණය හා ශක්තිය යනාදීන් හි ඉතා පැහැදිලි වන්තයාය.තවද තම ගැත්තන්හට යහමග එය පිළිපැදීමට ද, අයහමග එහිත් වැළකීමට ද පහදා දෙන්නාය. |
| අල්-කවිය්යු | ඔහුගේ පූර්ණ ඇල්මෙන් යුත් සීමාවක් නොමැති ශක්ති වන්තයාය. |
| අල්-මතීන් | තම ශක්තියෙහි හා බලයෙහි ස්ථිරවන්තයාය. ඔහුගේ කාර්‍ය්‍යයෙහි ඔහුට තෙහෙට්ටු හෝ දුෂකරතා ඇති නොවේ |
| අල්-කාදිර් | සියල්ලටම ශක්ති වන්තයාය.අහසේ හා පොලොවේ කිසිවක් ඔහුව නොහැකියාවට පත් නොකරති.තවද සියල්ල සිදු කරන්නාය. |
| අල්-කදීර් | ඔහුගේ ශක්තියෙහි සීමාවක් නොමැත්තකි. |
| අල්-මුක්තදිර් | ඔහු තීරණය කළ දේ ක්‍රියා කර,තම දැනුමෙන් තීරණය කළ ආකාරයට මැවීම සඳහා ශක්ති වන්තයාය. |
| අල්-අලීය්යු අල්අඃලා | තම සෑම ක්‍රියාවන්හි ද යටහත් හවයෙන් පාලනය කිරීමෙහි ද තම සාතයෙහි ද උසස්වන්තයාය.සියල්ලම ඔහුගේ පාලනයට හා ශක්තියට පහලින් ඇත.ඔහුට ඉහලින් කිසිවක් නොමැත. |
| අල්-මුතආලි | ඔහුගේ උසස්බාවයට සියල්ල යටහත් වේ. ඔහුට ඉහලින් මුලුමනින්ම කිසිවක් නොමැත.එහෙත් ඔහුට පහලින්ම දක්නට ලැබේ. |
| අල්-මුකද්දිම් | ඔහුගේ ඇල්ම හා ඥාණයට සාපේක්ෂ වන බැවින් විෂයන් ඉදිරිපත් කර එයට අදාල ස්ථානයෙහි තබන්නාය.තවද ඔහුගේ දැනුමට සාපේක්ෂ වන පරිදි මැවීමයන්ගෙන් සමහරක් සමහරට වඩා ඉදිරියෙන් තබන්නාය. |
| අල්-මුඅක්කිර් | ඔහුගේ ඥාණයට සාපේක්ෂ වන බැවින් විෂයන් හට පසු බැමක් ඇති කිරීම සඳහා සමහරක් ඉදිරියට හා තවත් සමහරක් පසුකර තබන්නාය.තවද ගැත්තන් ඔහුහට ක්ෂමාව අයැදීමෙන් දඬුවම ද පසු කරන්නාය. |
| අල්-මුසඃඉර් | භාණ්ඩ මිල හා එහි වටිනාකමෙ හි අඩු වැඩිය සිදුකරන්නාය.තවද මෙය ඔහුගේ දැනුම හා ඥාණයට සාපේක්ෂ වන පරිදම සිදු වේ. |
| අල්-කාබිල් | ඔහු ප්‍රාණය අත්පත් කරන්නාය.තවද ඔහුගේ ස්නේහයට ලක් වූ ගැත්තන්හට පරීක්ෂා කිරීම පිණිස ඔහුගේ දැනුමට සාපේක්ෂව ඔවුන්ගේ ආහාර පානය වළක්වන්නාය. |
| අල්-බාසිත් | තම අධිකතර(දන්) හා දයාව තුලින් තම දැනුමට සාපේක්ෂව ගැත්තන්හට රිස්ක් අභිවෘතිකර පරීක්ෂා කරන්නාය.තවද පාපිෂ්ඨයන්ගේ පාපක්ෂමා අයැදීමට පිළිතුරු දෙන මැනවින් තම දෑත දික්කරන්නාය. |
| අල්-අව්වල් | ඔහුට පෙර කිසිවක් නොතිබී සිටින්නාය.මැවීම් සියල්ල ඔහුගේ මැවීමෙන් පසුව ඇතිවිය.අල්ලාහ් හට ආරම්භයක් නොමැත. |
| අල්-ආකිර් | ඔහුට පසුව කිසිවක් නොසිටිති.ඔහු ඉතිරි වීමත් සමග පොළොවේ සියල්ලෝම විනාශවන්නෝය.පසුව ඔහුවෙත කැඳවණු ලබන්නෝය. අල්ලාහ් හට අවසානයක් නොමැත. |
| අල්-ළාහිර් | අල්ලහ් වස්තූන්වලට ඉහලින් සිටින්නාය.ඔහුට ඉහලින් කිසිවක් නොමැත. සියල්ලක්ම යටහත් කර පාලනය කරමින්, එය මුළුමනින්ම දැන සිටින්නාය. |
| අල්-බාතින් | ඔහු හැර කිසිවක් බිහි නොවේ.ඔහු ඉතා සමීපව සිටින අතර සියල්ලම දැනසිටින්නාය.මවනු ලැබූවන්ගේ දෑස් වලින් ඈත්ව සිටින්නාය. |
| අල්-විත්රු | ඔහු ඒකයෙකි.ඔහුට සමව කිසිවෙකු නොමැත. |
| අස්-සෙය්යිද් | තම ගැත්තන් සියල්ලෝටම නායකයාය.ඔහු ඔවුන්ගේ අධිපතියා හා මවන්නාය.ඔවුන් ඔහුගේ මැවීම් හා ගැත්තන්වන්නොය. |
| අස්-සමද් | නායකත්වය සඳහා සම්පූර්ණත්වය ලබන්නාය.මැවීම් සියල්ලොම තම අවශ්‍යයතාවයන් සඳහා ඔහු වෙත යොමුවන්නෝය.ඔහු ආහාර සපයන්නාය, ඔහුට ආහාර සපයනු නොලබති. |
| , අල්-වාහිදුල් අහද් | සීමාවකින් තොරවූ සම්පූර්ණත්ව ඒකීය භාවයෙන් සිටින්නාය.එහි කිසිවෙකු ඔහුට සම නොවන අතර මෙය ඔහු නැමදුම් ලැබීමට ඒකයෙකු යැයි හගවන්නේය. |
| අල්-ඉලාහ් | නියතවශයෙන්ම නැමදුම් ලැබීමට සුදුස්සාය.සියළු වත්පිළිවෙත්වලට ද ඔහුම සුදුස්සාය. |

**13. අල්ලාහ්ගේ ශුද්ධ නාමයන් හා ඔහුගේ ගුණාංගයන් අතර වෙනස කුමක්ද?** දෙකෙන්ම ආරක්ෂාව පැතිය හැක. දිවුරිය හැක. එහෙත් ඒවා සමහර වෙනස්කම් ඇත. ඒවායින් ඉතා ප්‍රධානතම ඒවානම් 1. ඔහුගේ ශුද්ධනාමයන් සඳහන් කර ඒවායේ වහලෙක් යැයි කිව හැක. ශුද්ධනාමයන් ගෙන් ඔහුව කැඳවිය හැක. උදා:- අබ්දුල් කරීම් කිව හැක. අබ්දුල් කරම් යැයි කිව නොහැක. යාකරීම් යැයි කැඳවිය හැක. යා කරම් යැයි කැඳවිය නොහැක. 2. අල්ලාහ්ගේ ශුද්ධ නාමයන් ගෙන් ඔහුගේ ගුණාංගයන් ගතහැක උදා:-(**අර්රහ්මාන්**) යන නාමයෙන් (**රහ්මත්**) යන ගුණාංගය ගැනීම. එහෙත් ඔහුගේ ගුණාංගයන් ශුද්ධ නාමයන් ගත නොහැක. උදා:- (**ඉස්තිවා**) යන වදනින් (**මුස්තවින්**) යන වදන ගත නොහැක. 3. අල්ලාහ්ගේ ක්‍රියාවන්ගෙ නම් ගත නොහැක. කෝපය යනු අල්ලාහ්ගේ ක්‍රියාවකි. එයින් අල්-ගාලිබ් තරහවන්නා යන නම ගත නොහැක.

**14. මලක්වරුව විශ්වාස කිරීමේ අදහස කුමක්ද?** මලක්වරු යනුවෙන් කොටසක් සිටින බවත් අල්ලාහ් ඔවුන්ව තමන්ට නැමදුම් ඉටු කිරීමට හා තම අණ ක්‍රියාත්මක කිරීම සඳහා මවා ඇති බවත් ස්ථිරව පිළිගැනීමයි. අල්ලාහ් මෙසේ පවසයි. 'ඔවුහු ගෞරවනීය ගැත්තන් වෙති. වචනයෙන් ඔහුට ඉදිරියෙන් නොසිටිති. ඔහුගේ අණ පරිදි ක්‍රියාකරති.' ඔවුන් පිළිබඳ විශ්වාසය පහත සඳහන් කරුණු අන්තර්ගත කරයි. 1. ඔවුන් සිටින බවට විශ්වාස කිරීම 2. ඔවුන්ගේ නම්වලින් අප දැනගත් දෑ විශ්වාස කිරීම. උදා:- ජිබ්රීල්. 3. ඔවුන්ගේ ගුණාංගයන්ගෙන් දැනගත් දෑ විශ්වාස කිරීම උදා:- ඔවුන්ගේ මැවීම් බලවත් ව තිබීම. 4. ඔවුනට නියමිත වැඩ පැවරී ඇති බව විශ්වාස කිරීම උදා:- මලකුල් මවුත්

**15. අල් - කුර්ආන් යනු කුමක්ද?** අල් කුර්ආනය යනු එය කියවීම නැමදුමක් ලෙස සැලකෙන අල්ලාහ්ගේ කථාවයි. ඔහුගෙන් ආරම්භ වී ඔහු වෙතට යන්නේය. අල්ලාහ් අක්ෂරත් සමග ශබ්දයත් සමග කථා කළේය. ජිබ්රීල් (අලෛයිහිස් සලාම්) තුමා එයට සවන් දුන්නේය. එතුමා නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ට මතක් කර දුන්නේය. අහසේ සිට පහළ කරනු ලැබූ ආගම් සියල්ල අල්ලාහ්ගේ කථාවයි.

**16. නබි තුමන්ගේ සුන්නාව අතහැර අල් කුර්ආනයෙන් පමණක් ප්‍රමාණවත් කර ගත හැකිද?** හොඳ නැත. අල්ලාහ් සුන්නාවද අරගන්නා ලෙස අණ කරයි. 'දූතයා නුඹලාට කුමක් දුන්නේද එය අරගනු. ඔහු කුමක් තහනම් කළේ ද එයින් වලකිනු'යි අල්ලාහ් ප්‍රකාශ කරයි. කුර්ආනය විවරණ කිරීමක් ලෙසම සුන්නාව පිහිටි ඇත. ආගමේ විස්තර සුන්නාව මාර්ගයෙන්ම දැනගත හැක. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ. *'දැනගනු නියත වශයෙන්ම මට කුර්ආනය ද එය සමග ඒ හා සමාන එකක්ද දෙනු ලැබීය. දැනගනු මිනිසෙක් තම ඇඳේ බඩ පුරවාගත් තත්ත්වයේ සිට මෙසේ ප්‍රකාශ කරයි" නුඹලා අල් කුර්ආනය තදින් අල්ලා ගනු. එහි හලාල් යැයි පවසා ඇති දෑ හලාල් ලෙසද හරාම් යැයි පවසා ඇති දෑ හරාම් ලෙසද ගනු'* යැයි ප්‍රකාශ කරයි (අබූ දාවුද්)

**17. රසූල් වරුන්ව විශ්වාස කිරීම යන්නෙහි තේරුම කුමක්ද?** අල්ලාහ් සෑම සමූහයකින්ම ඔහුට පමණක් නැමදුම් ඉටු කිරීමටත් ඔහු හැර නමැදුම් කරන ලබන දෑ ප්‍රතික්ෂේප කිරීමටත්" කැඳවිය හැකි දූතයින්ව එවා ඇති බව ස්ථිර වශයෙන්ම විශ්වාස කිරීමයි. ඔවුන් සියළු දෙනාම සත්‍ය වන්තයෝය. විශ්වාස කළ යුතු අයයි. ගෞරවනීය අයයි. විශ්වාසයට සුදුසු අයයි. ඍජු මග ලද අයයි. ඔවුන් තම දූත මෙහෙවර ඉටු කළහ. ඔවුන් මැවීම් අතර ශ්‍රේෂ්ඨයින්ය. ඔවුන් උපතේ සිට විපත දක්වා ආදේශ කිරීම්වලින් පිරිසිදු වූහ.

**18. විනිශ්චය දිනයේ අනුකම්පා බස් දෙඩීම කී ආකාරයකට සිදුවෙයිද?** එය විවිධාකාරය 1. ඒවා අතර ඉතා උසස් වන්නේ *'අෂ් ෂෆාඅතුල් උළ්මා'* වන්නේය. ජනතාව මහ්ෂර්හි' අවුරු පනස් දහසක් තීන්දුව ලැබෙන තෙක් බලා සිටි පසු රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ දෙවියන් ඉදිරියේ අනුකම්පා බස් දොඩමින් ඔවුන් වෙනුවෙන් මැදිහත් වෙති" මෙම අනුකම්පා බස් දෙඩීම රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්)තුමන්ට පමණක් අයිති වන්නේය. මෙය එතුමන්ට පොරොන්දු දෙන ලද 'මකාමුන් මහ්මූද්' වන්නේය. 2. දිව්‍ය ලෝකයේ දොර විවෘත කරන ලෙස අනුකම්පා බස් දෙඩීම (නිර්දේශ කිරීම) යි මුලින්ම ස්වර්ගයේ දොරටුව විවෘත කරනුයේ අප නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ය. මුලින්ම

සමූහයන් අතර ස්වර්ගයට ඇතුල් වන්නේද එතුමන්ගේ සමූහයාය. 3. නිරයට තල්ලු කරන ලෙස තීන්දුව ලබා සිටින පිරිසක්ව නිරයට තල්ලු නොකරන මෙන් ඉල්ලා සිටීම. 4. ඒකීයවාදීන් අතර නිරයට ඇතුල් වූ පව්කාරයින්ව අපායෙන් පිට මං කිරීමට අනුකම්පා බස් දෙඩීම. 5. ස්වර්ග වැසියන් සමහරෙකුගේ තත්ත්වය උසස් කරන මෙන් අනුකම්පා බස් දෙඩීම, පසුව ඇති කරුණු තුන අපේ නබිතුමන්ට පමණක් අයිති නැත. එහෙත් එතුමන්ට එහි ප්‍රමුඛත්වය ඇත. එතුමන්ට පසුව නබිවරු, මලක්වරු, සැදැහැවතුන් හා දිවි පිදුවන්ටද අනුකම්පා බස් දෙඩීමේ අවසරය ලැබේ. 6. විභාගයක් නොමැතිවම ස්වර්ගයට යැවීමට අනුකම්පා බස් දෙඩීම. 7. සමහර කාෆිර් වරුන්ගේ දඬුවම් ලිහිල් කරන මෙන් අනුකම්පා බස් දෙඩීම. මෙය රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමන්ට පමණක් හිමිවෙයි. එතුමාණෝ තම බාප්පා වූ අබූතාලිබ්ගේ දඬුවම ලිහිල් කරන මෙන් ඉල්ලා සිටිති. මේවායින් පසුව ඒකීයත්වය ඇතුව මියගිය සමහරෙකුව කිසිවෙකුගේ අනුකම්පා බස් දෙඩීමකින් තොරව අල්ලාහ් නිරයෙන් නිදහස් කරයි. ඔවුන්ගේ සංඛ්‍යාව අල්ලාහ්ම දනී. ඔහුගේ දයාවෙන් ඔවුහු ස්වර්ගයට යති.

**19. පණ ඇති (ජීවතුන් අතර සිටින) අයගෙන් උදව් අනුකම්පා බස් පැතිය හැකි ද?**

එසේය. ඇසිය හැක. අනෙක් අයට උදව් කිරීම ඉස්ලාම් අනිවාර්ය කරයි. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:- **'නුඹලා දේව බියෙන් ද යහපතින්ද එකිනෙකාට උදව් කරමින් සිටිනු'** රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කරයි. ***ගැත්තා තම සහෝදරයාට උදව් කරන විට අල්ලාහ් ඔහුට උදව් කරයි.*** (මුස්ලිම්) තවද අනුකම්පා බස් දෙඩීම ඉතා විශිෂ්ඨ ක්‍රියාවකි. අල්ලාහ් මෙසේ පවසයි. **'කවරෙකු ලස්සන අනුකම්පා බස් දෙඩීමක් කරන්නේද එයින් ඔහුටද කොටසක් හිමිවෙයි'** රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. ***'ඔබලා අනුකම්පා බස් දොඩනු නුඹලාට ප්‍රතිඵල හිමි වෙයි."*** (බුහාරි)

**ජීවතුන් අතර සිටින අයෙකුගෙන් අනුකම්පා බස් පැතීමට කොන්දේසි කීපයක් ඇත.**

1. ජීවතුන් අතර සිටින අයෙකුගෙන්ම අනුකම්පා බස් දෙඩීමට ඉල්ලා සිටිය යුතුය. මිය ගිය තැනැත්තා තමන්ටම යමක් කර ගැනීමට ශක්තිය නැත්තෙකි. ඔහු අනෙක් අයට උදව් කරන්නේ කෙසේද? අල්ලාහු තආලා පවසයි. **නුඹලා ඔවුන්ව කැඳෙව්ව ද, ඔවුන්ට එය නොඇසෙන්නෝය. එසේ ඔවුනට ඇසුන ද, නුඹලාහට පිළිතුරු නොදෙන්නෝය.** තවද මියගිය තැනැත්තා ජීවත්ව සිටින්නාගේ දුආව බලාපොරොත්තුවෙන් සිටින්නෙකි. එහෙයින් කෙසේ අන් අයගේ දුඇවට පිළිතුරු දීමට හැකි වේද? රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ වදාලහ. ***මනිසෙකු මරණයට පත්වීමෙන්,අමලයන් තුනක් හැර අන් සියළුම අමලයන්ම වසන්ධ වී යන්නේය: නිරන්තර කුලිය පැමිණෙන සඳකාව(දන් නීම),ඔහුට ප්‍රයෝජණය ලබාදෙන දැනුම,ඔහු වෙනුවෙන් දුආව අයැදින යහපත් දරුවා.*** (මුස්ලිම)

2. තමා ඉල්ලන දේ තේරුම් ගත යුතුය. 3. අසනු ලබන්නා ඉදිරියේ සිටිය යුතුය. 4. ඔහු එයට ශක්තිය ඇති අයෙකු විය යුතුය. 5. මෙලොවට සම්බන්ධ දෙයක් විය යුතුය. 6. ආගමෙන් අනුමත කරන ලද හානියක් නොමැති කරුණක් විය යුතුය.

**20. වසීලා කීවැදෑරුම්ද?** එය දෙවැදෑරුම් වෙයි.

**පළමු වැන්න අනුමත වුවකි. එය කොටස් තුනකි.** 1. අල්ලාහ්ගේ ශුද්ධ නාමයෙන් හා ගුණාංගයන්ගෙන් ඔහුගෙන් ම වසීලා පැතීම. 2. යහපත් වත්පිළිවෙත් මගින් ඔහුගෙන් වසීලා පැතීම (ගුහාවේ ගැත්තන් තිදෙනා යහපත් වත්පිළිවෙත් ඉදිරිපත් කර එමගින් වසීලා පැතූ කතාවස්තුව මෙන්) 3. අප ඉදිරියේ ජීවත්ව සිටින යහපත් මුස්ලිම් පුද්ගලයෙකුගේ දුආව මගින් වසීලාව පැතීම.

**දෙවැනි කොටස තහනම් වුවකි:- එය දෙවැදෑරුම් වෙයි.** 1. නබි හෝ වලි වරුන්ගෙන් කෙනෙකුගේ නාමයෙන් පැතීම (යා අල්ලාහ් නුඹේ නබිගේ නාමයෙන් නුඹෙන් අසමි. හුසෛන්තුමාගේ නාමයෙන් පැතීම (යා අල්ලාහ් නුඹේ නබිගේ නාමයෙන් අසමි' යි කියන්නාක් මෙන්ය") රසූල් වරයාගේද වලිවරුන්ගේද තත්ත්වය අල්ලාහ් ඉදිරියේ අති ශ්‍රේෂ්ඨය. සහාබිවරු යහපත් ක්‍රියාවල ඉතා උද්යෝගයකින් සිටියහ. එහෙත් ඔවුහු තමන් අතරේ නබිතුමන්ගේ සොහොන තිබියදිත් තමන්ට සාගතයක් ඇති වුවද නබි තුමන්ගේ නාමයෙන්

වසීලා පැතුවේ නැත. ඒ වෙනුවට එතුමාගේ බාප්පා වු අබ්බාස් (රලි) තුමාගේ ප්‍රාර්ථනය මගින්ම උදව් පැතුහ. 2. නබිවරයාගේ නමින් හෝ වලීගේ නමින් හෝ දිවුරා ඉල්ලිම" මැවීම් කිසිවක් මත දිවුරා අල්ලාහ්ගෙන් ඇසීමට වඩා බරපතලය.

**21. පරලොව ගැන විශ්වාස කිරීමේ තේරුම කුමක් ද?** විනිශ්චය දිනය අනිවාර්යයෙන් ඇති වේ යැයි ස්ථිර වශයෙන් විශ්වාස කිරීමයි. මරණය, ඉන්පසු ඇති වන කබ්රයේ අර්බුදය, එහි වේදනාව, එහි සැපත, සූර් පිඹීම අල්ලාහ්ගේ විභාගය සඳහා මිනිසුන් සිටගැනීම, ලේඛන දිග හැරීම, තරාදිය, සිරාත්" හවිළ්, මැදිහත්වීම, අනුකම්පා බස් දෙඩීම ඉන්පසු ස්වර්ගයට හෝ අපායට යාම ආදි දෑ පිළිබඳ විශ්වාසය ද මෙයට අයත් ය.

**22. ලෝකාන්තයේ සළකුණු කවරේද?** රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. නුඹලා සළකුනු දහයක් දකින තුරු අවසන් දිනය නොපැමිණෙන්නේය. දුම" දජ්ජාල්" සතා" ඉර බටහිරින් උදාවීම" ඊසාතුමාගේ පැමිණීම" යඃජූජ් මඃජූජ්" නැගෙනහිරෙන් එකක්" බටහිරෙන් එකක් හා අරාබි කරයේ අනෙකක් වශයෙන් පොළොව පැලී කිඳා බසිනා සිදුවීම් තුනක් හා අවසානයේ යෙමන් දේශයේ ගින්නක් හටගෙන මිනිසුන්ව 'මහ්ෂර්' කරා එලවයි" (මුස්ලිම්)

**23. ලොව ජනතාවට ඇතිවන ඉතා විශාලතම ෆිත්නාව කුමක් ද?** රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. 'ආදම් (අලෙයිහිස් සලාම්) තුමාව මැවීමටත් අවසන් දිනයටත් අතර 'දජ්ජාල්' ට වඩා ෆිත්නාව(අර්බුදය)ක් තවත් නැත. (මුස්ලිම) ඔහු මිනිසෙකි. ඔහුගේ නලලේ කාෆිර් යනුවෙන් කොටා ඇත. ඔහුගේ දකුණු ඇස අන්ධය. ඇස ඉදිරියට නෙරා කපු ගෙඩියක් සේ පෙනෙයි. ඔහු යහපත් ගැත්තෙකු බව කියයි. පසුව නබිවරයෙකු යැයි වාද කරයි. ඊළඟට තමා දෙවියෙකු යැයි වාද කරයි. ඔහුව පිළිගන්නා ලෙස කියයි. ජනතාව ඔහුව ප්‍රතික්ෂේප කරන්නෝය. ඔහු ආපසු යයි. ඔහුත් සමග ජනතාවගේ සියලු සම්පත් ඔහු පසුපසින් ඇදී යයි. ජනතාව හිස් අතින් අසරණ වෙති. නැවත ඔහු පැමිණ මිනිසුන්ව කැඳවයි. එවිට ඔවුන් ඔහුව විශ්වාස කරති. ඔහු අහසට අණ කරයි. එය වැසි වස්සවයි. පොළොවට අණ කරයි. එය ගස් කොළන් පැළවීමට සලස්වයි. ඔහු ජලය හා ගින්දර ගෙන එයි. ඔහුගේ ගින්න ජලයයි. ජලය ගින්නයි. මුඃමින්වරු සෑම සලාතයක දීම ඔහුගේ අර්බුදයෙන් ආරක්ෂාව පැතිය යුතුය. ඔහුව මුණ ගැසීමෙන් වැළකිය යුතුය. ඔහුව මුණගැසීමට සිදුවුවහොත් ඔහු වෙනුවෙන් සූරතුල් 'කඃෆ්' හි මුල් කොටස කියවිය යුතුය. රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ තවදුරටත් මෙසේ කීහ. *'කවරෙකු හෝ දජ්ජාල් ගැන ආරංචි වුවහොත් ඔහුගෙන් ඈත් විය යුතුය. මිනිසෙක් ඔහු වෙතට පැමිණෙයි. ඔහු ඉදිරිපත් කරන සමහර සැක කටයුතු කරුණු නිසා ඔහුව මුඃමින් යැයි සිතා අනුකරණය කරයි.* (අබූදාවූද්)

ඔහු පොළොව මත දින හතලිහක් සිටී. ඒවායින් දිනයක් වසරක් මෙන් ද තවත් දිනයක් මාසයක් මෙන් ද තවත් දිනයක් සතියක් මෙන්ද වෙයි. අනෙක් දවස් අපේ දිනයන් මෙන් වෙයි. මක්කම හා මදීනාව හැර අනෙක් හැම ගමකටම යයි. ඊසා(අලෙයිහිස් සලාම්) තුමා පැමිණ ඔහුව ඝාතනය කරයි.

**24. ස්වර්ගය හා නිරය දැන් තිබේ ද?** එසේය. අල්ලාහ් මිනිසුන්ව මැවීමට පෙරම ඒවා මැවීය. ඒවා කිසිවිටක විනාශ නොවන්නේය. අල්ලාහ් තම දයාවෙන් ස්වර්ගය සඳහාම සමහරෙකුව මැව්වේය. තම නීතිය අනුව නිරයට ම තවත් සමහරෙකුව මැවුවේය. එක එකා කුමක් සඳහා මවනු ලැබුවෝ ද ඔවුන්ට ඒ මග ලිහිල් කරනු ලබන්නෝය.

**25. කද්ර් හෙවත් පෙරම්ණුම විශ්වාස කිරීමේ තේරුම කුමක්ද?** සෑම යහපතක් හා අයහපතක්ම අල්ලාහ්ගේ මනාපය පරිදි ද, අභිමතය පරිදි ද සිදුවන්නේය. ඔහුට ප්‍රියමනාප දෙය කරන්නේය. රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. *"නියතවශයෙන්ම අල්ලහ් අහස් හි ද පොළොවෙහිද සිටින අයට දඬුවම් කරන්නේ නම් ඔවුන්ට අසාධාරණයක් නොවන අයුරින් දඬුවම් කරන්නේය. ඔවුනට ඔහු දයාව පහළ කරන්නේ නම් එය ඔවුන්ගේ යහ ක්‍රියාවලට වඩා අගනේය. නුඹ අල්ලාහ්ගේ මාර්ගයේ උහද් කන්ද තරම් වියදම් කළත් නුඹ කද්රය හෙවත් පෙරම්ණුම විශ්වාස කරන තෙක් නුඹට*

ලැබෙන දෑ නුඹෙන් ඈත් නොවන්නේය. නුඹට නොලැබෙන දේ නුඹට හිමි දෙය නොවන්නේය"යි විශ්වාස කරන තෙක් අනුමත නොකරන්නේය. මේවායින් තොරවූ විශ්වාසයක් ඇතුව මිය යන්නේ නම් නිරයට ඇතුල් වන්නෙහුය. (අහ්මද්,අබූ දාවුද්)

'කද්ර්' පිළිබඳ විශ්වාසය කරුණු හතරකින් යුක්තය. 1. අල්ලාහ් සෑම දෙයක්ම සම්පූර්ණයෙන්ද විස්තරාත්මකව ද දන්නා බව විශ්වාස කිරීම. 2. අල්ලාහ් ඒවා ලව්හුල් මහ්ෆූල්හි ලියා ඇති බව විශ්වාස කිරීම" රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. "අල්ලාහ් අහස් හා පොළොව මැවීමට වසර පනස් දහසකට පෙරම මැවීම් පිළිබඳ සැලැස්ම ලියා නිමා කළේය. (මුස්ලිම්) 3. කිසිවෙකුගෙන් බාධා කර වැළැක්විය නොහැකි වූ ඔහුගේ ප්‍රියමනාපය ද කිසිවක් විසින් නොහැකි තත්ත්වයට පත් කළ නොහැකි ඔහුගේ ශක්තිය ද විශ්වාස කිරීම. ඔහු ප්‍රියමනාප වූ (සිතූ) දේ සිදුවෙයි. ඔහුගේ ප්‍රියමනාපය නොමැතිව කිසිවක් සිදු නොවේ. 4. සියළු දෑ මවන්නා අල්ලාහ්ය. ඔහු හැර අනෙක් සියල්ල ඔහුගේ මැවීමයි.

**26. මැවීම්වලට ශක්තිය හා ප්‍රියමනාප (සිතුම්) ඇත් ද?** එසේය. මිනිසාට ප්‍රියමනාපයද, පෞද්ගලික කැමැත්තද ඇත. එහෙත් ඒවා අල්ලාහ්ගේ ප්‍රියමනාපයෙන් වෙන් වන්නේ නැත. අල්ලාහ් මෙසේ කියයි:- අල්ලාහ් ප්‍රියමනාප වූ දෙයක් හැර නුඹලා ප්‍රියමනාප නොවන්නෙහුය. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. 'නුඹලා යහපත් ක්‍රියා කරනු. සෑම දෙයක්ම ඒවා කුමක් සඳහා මවනු ලැබුවේ ද එය කිරීමට උදව් කරනු ලබයි.' (බුහාරි, මුස්ලිම්) අල්ලාහ් හොඳ නරක වෙන් වශයෙන් දැන ගැනීමට අපට විචක්ෂණ බුද්ධියද, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය ඉන්ද්‍රියන් ද ලබා දුන්නේය. සොරකම් කර අල්ලා එය මා කෙරෙහි ප්‍රියමනාප වුයේ යැයි කියන්නා බුද්ධිමතෙකු නොවේ. මේ වදන මිනිසුනට කී පමණින් ඔවුහු ඔහුට ක්ෂමාව නොදෙති. නුඹට දඬුවමක් අල්ලාහ් මනාප විය යැයි කියා ඔහු දඬුවම් කරනු ලබයි. කද්ර් නම් පෙරමිණුම හේතු දැක්වීම සුදුසු නොවේ. අල්ලාහ් මෙසේ කියයි:- අල්ලාහ් ප්‍රියමනාප වුයේ නම් අපි ද අපේ මුතුන් මිත්තෝද ආදේශ නොකරන්නෙමු" අපි කිසිම දෙයක් හරාම් නොකරන්නෙමු'යි මුෂ්රික්වරු ප්‍රකාශ කරති. මොවුන්ට පෙර සිටියවුන්ද බොරු කරමින් සිටියේ මෙසේය.

**27. ඉහ්සාන් යනු කුමක් ද?** ඉහ්සාන් ගැන විමසූ අයෙකුට රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පිළිතුරු දුන්හ. නුඹ අල්ලාහ්ව දකින්නා සේ ඔහුට නැමදුම් ඉටු කිරීමයි" නුඹ ඔහුව නොදැක්කද ඔහු නුඹව බලයි. (මුස්ලිම්) ඉස්ලාම් දහමේ පියවරවල් තුන අතුරින් එයම උසස් වන්නේය.

**28. තව්හීද් හි කොටස් කීයක් වෙයිද?** එහි කොටස් තුනකි 1. තව්හීදුර් රුබූබියියා, අල්ලාහ්ගේ (මැවීම, පණ ගැන්වීම ආදි) ක්‍රියාවන්හි ඔහුව ඒකීයත්වයට පත් කිරීම, දේව ප්‍රතික්ෂේපකයින් නබිතුමාගේ පැමිණීමට පෙරම මෙය පිළිගෙන සිටියහ. 2. තව්හීදුල් උලූහියියා (සලාතය, භාර හා සදකා ආදි නැමදුම්වලදී අල්ලාහ්ව ඒකීයත්වයට පත් කිරීම" නැමදුම් වතාවත් වලදී අල්ලාහ් ව ඒකීයත්වයට පත් කිරීම සඳහාම රසූල්වරුන් එවනු ලැබූහ. දහම් පහළ විය. 3. තව්හීදුල් අස්මාඋ වස්සිෆාත් අල්ලාහ් ද ඔහුගේ දූතයා ද අල්ලාහ්ට පැවරූ ලස්සන ශුද්ධ නාමයන් හා උස් වූ ගුණාංගයන් ද අර්ථ විකෘති නොකර හිස් දෙයක් නොකර ඒ අයුරින්ම - පිළිගැනීමයි.

**29. 'වලි' යනු කවරෙක් ද?** වලී යනු අල්ලාහ්ට බිය වූ යහපත් ගැත්තන් වූ මුඃමින් වරුන්ය. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. 'නියත වශයෙන්ම අල්ලාහ් ගේ සෙනෙහෙවන්තයින්ට බියක් ද නැත. ඔවුහු දුකට ද පත් නොවෙති. ඔවුහු විශ්වාස කළවුන් ලෙස ද දේව බිය ඇත්තවුන් ලෙස ද සිටිති.' රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. 'මගේ වලි අල්ලාහ්ද මුඃමින් වරුන්ගෙන් සැදැහැවන්තයින් ද වෙති. (බුහාරි, මුස්ලිම්)

**30. නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමන්ගේ මිත්‍රයින් කෙරෙහි අපගේ යුතුකම කුමක් ද?** ඔවුන්ට ආදර කිරීමත් ඔවුන් ගැන තෘප්තිමත් වන ලෙස ප්‍රාර්ථනා කිරීමත්ය. අපගේ සිත ද දිව ද ඔවුන් පිළිබඳව දොස් සිතීමෙන් හෝ දොස් කීමෙන් පිරිසිදු කර ගැනීම හා ඔවුනතර ඇති වූ ප්‍රශ්න (ගැටුම්) පිළිබඳව වැරදි අදහස් ඇති කර ගැනීමෙන් වැළකීමත්ය.

ඔවුහු පව්වලින් ආරක්ෂාව ලැබුවන් නොවෙති. එහෙත් ඔවුහු දහමේ කරුණක් විමර්ශනය කර යම් තීරණයක් ඇති කර ගතහොත් ඔවුන්ගේ තීරණය නිවැරදි නම් ඔවුනට විපාක දෙකක් හිමිවෙයි. වැරදි නම් ඔවුන් කළ විමර්ශනය සඳහා ඔවුනට එක විපාකයක් ඇත. ඔවුන්ගෙන් යම් වැරදි සිදුවුවහොත් එය මකාදමන තරම් සුවිශේෂනයන් ද ඔවුන් තුළ දක්නට ලැබුණි. ඔවුන්ගෙන් එකිනෙකා අතර තරාතිරම වෙනස් වේ. ඔවුන්ගෙන් ඉතාමත් සුවිශේෂවන්තයා **අබූබකර්,උමර්,උස්මාන්,අලී,තල්හා,සුබයිර්,අබ්දුර් රහ්මාන් ඉබ්නු අව්ෆ්,සඅද් බින් අබී වක්කාස්,සර්ද් බින් සයිද්, අබූ උබයිදා බින් ජර්රාහ්** ඔවුන්ගෙන් පසු අනෙක් මුආජිර්වරුන් පසුව බද්ර් යුද්ධයට සහභාගි වූ මුආජිර්වරුන් හා අන්සාරිවරුන් පසුව අනෙක් අන්සාරිවරුන් පසුව අනෙකුත් සහාබාවරුන්ය. රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමෝ *'මගේ මිතුරන්ට නොබනිනු" මගේ ආත්මය කවරෙකු සතුවෙයිද ඔහු මත දිවුරා කියමි. නුඹලාගෙන් එකෙක් උහද් කන්ද තරම් වියදම් කළ ද ඔවුන් වියදම් කළ එක 'පතක්' (අත් දෙක එකට ලං කර අරගන්නා ප්‍රමාණය) හෝ 'පත්' භාගයක් තරම් හෝ විපාකයක් ලබා නොගන්නේය.* (බුහාරි, මුස්ලිම්) තවද පැවසුවේය. *කවෙරෙකු මාගේ මිතුරන්ට බනින්නේ ද, ඔහු හට අල්ලාහ් ඔහුගේ මලාඉකාවරුන් හා සියළු ජනයින්ගේ ශාපය ඇති වේ.* (ටබරානී)

**31. රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට ප්‍රශංසා කිරීමේදී එතුමන්ට හිමි තත්ත්වය ඉක්මවා යා හැකි ද?** මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් අල්ලාගේ මැවීම් අතර ඉතා ශ්‍රේෂ්ඨ කෙනෙක් යන්නෙහි කිසිදු සැකයක් නොමැත. එහෙත් කිතුණු භක්තිකයින් මර්යම්ගේ පුත් ඊසා (අලෙයිහිස් සලාම්) තුමාණන්ව සීමාව ඉක්මවා ප්‍රශංසා කළා සේ ප්‍රශංසා කිරීමෙන් වැළකීය. මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් පැවසූහ. *කිතුණු භක්තිකයින් මර්යම්ගේ පුත් ඊසා (අලෙයිහිස් සලාම්) තුමාණන්ව සීමාව ඉක්මවා ප්‍රශංසා කළා සේ නුඹලා මාව ප්‍රශංසාවට ලක් නොකරනු. මා ඔහුගේ ගැත්තෙකි. මම අල්ලාහ්ගේ ගැත්තෙකු හා දූතයෙකු යැයි නුඹලා කියනු.* (බුහාරී)

**32. පුස්තකය ලැබූ අය මුඃමින්වරුද?** යුදෙව්වන්ද කිතුණුවන්ද අනෙකුත් භක්තිකයින් මුඃමින්වරු නොවෙති. ඔවුහු ඔවුන්ගේ දහම්වල නිවැරදි මූලධර්මයන් පිළිපැද්දත් එය එසේමය. මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ව නබිවරයා ලෙස එවූ පසුව ඔවුන් තම පැරණි දහම අත්හැර ඉස්ලාමය නොපිළිගත්තේ නම් **ඔවුන්ගෙන් එය පිළිගනු නොලැබේ. ඔවුහු පරලොවදී පාඩු ලද්දෝ වන්නෝය.** 'මුස්ලිම්වරයෙකු ඔවුහු දෙවියන් ප්‍රතික්ෂේප කළ අයෙකු යැයි විශ්වාස නොකළහොත් හෝ ඔවුන්ගේ දහම වැරදි එකක් යන්නෙහි සැකයක් උපදවා ගතහොත් හෝ ඔහුද දේව ප්‍රතික්ෂේපකයකු යැයි අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් දුන් තීන්දුවට මොහු පටහැනිව කටයුතු කරන්නේ ද ඔහුට පොරොන්දු වූ ස්ථානය නිරයේ ගින්නයි. 'රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ. *'මුහම්මද්ගේ ආත්මය කවරෙකුගේ අතේ ඇත්ද ඔහු මත දිවුරා කියමි. මෙම සමූහයා අතර යුදෙව්වෙක් හෝ කිතුණුවෙක් හෝ මා ගැන ආරංචි වී" මාව විශ්වාස නොකරයි ද ඔහු නිරයට යන්නේය.'* (මුස්ලිම්)

**33. කාෆිර්වරුන්ට අසාධාරණ කළ හැකිද?** යුක්තිමත්ව ක්‍රියා කිරීම අණ වාරපය වන අතර අසාධාරණ කිරීමෙන් තහනම් කර ඇත. අල්ලාහු තආලා පවසයි. **නියතවශයෙනම නුඹලා යුක්තියෙන් හා උපහාරව ක්‍රියා කරන මෙන් අල්ලාහ් නුඹලාහට අණ කරයි.** රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ අල්ලාහ් මෙසේ පැවසූ බව ප්‍රකාශ කරනු ලැබේ. *'අසාධාරණ කිරීම මා කෙරෙහි තහනම් කළෙමි. නුඹලාටද නුඹලා අතර අසාධාරණ කර ගැනීම තහනම් කළෙමි. නුඹලා අසාධාරණකම් කර නොගනු.* (මස්ලිම)

නියතවශයෙන්ම විනිශ්වය දිනයේ අයුක්තියට ලක්වූ පුද්ගලයා අයුක්තිය කළ පුද්ගලයාගේන පලි ගනීයි. නබි(සල්)තුමාණන්,බන්කොලොත්කරුවා කවුරුන් දැයි නුඹලා දන්නෙහු ද? *යනුවෙන් ඇසුවේය.එවිට ඔහුගේ මිත්‍රයින්,අපගෙන් බන්කොලොත්කරුවා යනු කවරෙකුට දිර්හමු(මුදල්) හා ධන සම්පත් නොමැත්තේ ද ඔහුමය.යනුවෙන් පිළිතුරු දුන්නෙ!ය.එවිට නබි(සල්)තුමාණන් පැවසුවේය.මාගේ සමූහයේ බන්කොලොත්කරුවා යනු, ඔහු*

*විනිශ්චය දිනයේ ඔහුගේ සලාතය, උපවාසය, හා සකාතය රැගෙන පැමිණේ.පසුව ඔහුට එරෙහිව සමහරු පැමිණ ඔහු බැන වැදුනු බව,දොස් පැවරූ බව,අන් අයගේ ධන මුදල් විනාශ කළ බව,අන් අයගේ රුධිර ගැලූ බව හා පහර දුන් බව චෝදනා එල්ල කරයි. එසේ චෝදනා එල්ලකළවුන් හට ඔහුගේ යහ ප්‍රතිඵලයන් දෙනු ලැබේ.තවද ඔහුගේ යහ ප්‍රතිඵල,චෝදනාවන් හිලව් කිරීමට පෙර නිම වූයේ නම්,ඔවුන්ගේ අයහා ප්‍රතිඵල ඔහු මත දමා නිරයට විසිකරනු ලැබේ.* (මුස්ලිම්) විනිශ්චය දිනයේ එකිනෙකා පලිගෙන හිලව් කිරීම මනුෂ්‍යයින් අතර පමණක් නොව අන් සත්වයින් අතර ද සිදුවේ.

**34. බිද්අත් යනු කුමක් ද?** ඉබුනු රජබ (රහ්මතුල්ලාහි අලෙයිහි) පවසයි. ෂරීආහ්වෙ(දහමෙ)හි කිසිම මූලාශ්‍රයකට සම්බන්ධ නොවන අළුතෙන් ඇතිකරගත් වත්පිළිවෙත්ය" ෂරීආවෙහි එයට යම් මූලාශ්‍රයක් ඇත්නම් භාෂිතයෙන් එය අළුත් දෙයක් වුවද ආගමික වශයෙන් එය අළුත් (බිද්අත්) දෙයක් නොවන්නේය.

**35. දහමෙ හොඳ බිද්අත් නරක බිද්අත් යැයි දෙකක් ඇත් ද?** ආගමික වශයෙන් බිද්අත් හැම එකක්ම අල්-කුර්ආනයේ හෙළා දැක ඇත. රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. '*කවරෙකු හෝ අප දහමේ නැති දෙයක් ඇති කළහොත් එය ප්‍රතික්ෂේප කෙරෙන්නේය.*' (බුහාරි" මුස්ලිම්) තවදුරටත් මෙසේ ද පැවසූහ. '*අලුතින් ඇතිකළ හැම දෙයක්ම බිද්අත් වන්නේය. බිද්අත් හැම එකක්ම මංමුළාවකි..* (අහ්මද්) ඉමාම් මාලික් (රහ්මතුල්ලාහි අලෙයිහි) දහම සම්බන්ධ බිද්අත් ගැන පහත සඳහන් පරිදි පැවසීය. 'කවරෙකු හෝ හොඳ යැයි සිතා ඉස්ලාමයෙහි අළුත් දෙයක් ඇති කළහොත් ඔහු මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට තම දූත මෙහෙවරේ කුමන්ත්‍රණය කළ බව අදහස් කළ අයෙකු වන්නේය. මන්ද අල්ලාහු තආලා පවසයි. '**අද දවසේ නුඹලාට නුඹලාගේ දහම මම සම්පූර්ණ කළෙමි. මගේ දයාව නුඹලාට සම්පූර්ණ කළෙමි.**'

භාෂාමය අදහසින් බිද්අතයට ප්‍රශංසා කරන සමහර හදීස් ඇවිත් ඇත. ඒවා ආගමේ තිබී අත් හැරුණු සමහරක් නැවත කරන මෙන් දිරිගන්වන හදීසයන්ය. '*කවරෙකු හෝ ආගමික යම් යහපත් ක්‍රියාවක් ආරම්භ කළහොත් ඔහට එහි ප්‍රතිඵලය ද එයට පසු එය කරන අයගේ ප්‍රතිඵල ද ලැබෙයි. ඔවුන්ගේ ප්‍රතිඵලවලද අඩුවක් නොවේ*' (මුස්ලිම) උමර් (රළියල්ලාහු අන්හු) තුමාණනගේ තරාවීහ් සලාතය සම්බන්ධයෙන් -මෙය හොඳ බිද්අතයකි- යන වදන ද මෙම ගණයට අයත් වේ. මන්ද තරාවීහ් සලාතය රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් රාත්‍රි තුනක් ඉටු කළේය. තවද මෙය ඉටු කරන මෙන් පොලඹුවෙය. පසුව මෙය අනිවාර්‍යය වේ යන බියෙන් අත්හැරයේය. පසුව උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන්ගේ කාලයේ ඔහු මිනිසුන් රැස්කර නැවතත් තරාවීහ් සලාතයේ මෙහෙය වුනේය.

**36. කුහකකම කී වැදෑරුම් වේ ද?** දෙකකි.

**1. ප්‍රතිපත්තියට සම්බන්ධ වූවකි (මහා කුහකය).** දේව ප්‍රතික්ෂේපය සිතේ සඟවාගෙන ඉස්ලාමය පිටතට පෙන්වීමයි. මෙය මිනිසාම මිනිසාව ඉස්ලාමයෙන් ඉවත ලයි. මේ තත්ත්වයෙන්ම කෙනෙකු මියගියහොත් ඔහු කුෆ්ර්හිම මිය යන්නේය. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. 'නියත වශයෙන්ම මුනාෆික්වරු නිරයේ පහළම තට්ටුවේ සිටින්නෝය' අල්ලාහ්ව ද මු:මින්වරුන්ව ද රැවටීමට උත්සාහ දැරීම මු:මින්වරුන්ව සමච්චලයට ලක්කිරීම මුස්ලිම්වරුන්ට විරුද්ධව කාෆිර්වරුන්ට සහාය දීම තම යහපත් ක්‍රියා තුළින් ලෞකික අවශ්‍යතා අපේක්ෂා කිරීම ඔවුන්ගේ ගුණාංගයන්ගෙන් කීපයකි.

**2. ප්‍රායෝගික (ක්‍රියාකාරි) කුහක කම (කුඩා කුහකය)** :- මෙම ක්‍රියාව තුළින් මිනිසා ඉස්ලාමයෙන් ඉවත නොවුව ද, මෙයට පාපක්ෂමා නොඅයැදීමෙන් මහා කුහකයට ඇතුලු විය හැක. බොරුකීම" පොරොන්දු කඩ කිරීම ගිවිසුම් කඩකිරීම හා විශ්වාසයට ද්‍රෝහිකම් කිරීම යනාදිය ඔවුන්ගේ ලක්ෂණයන්ය. ඒවායින් කිසිම ගුණාංගයක් නුඹ තුළ ඇති නොවී වගබලා ගත යුතුය. කුහක කමට බියෙන් සිටීම මුස්ලිම්වරයෙකුගේ වගකීමකි. සහාබිවරු කුහකකමට බියෙන් සිටියහුය. ඉබ්නු අබී මුලෙකා (රහ්මතුල්ලාහි අලෙයිහි) මෙසේ පැවසීය. සහාබිවරුන්ගෙන් තිස්දෙනෙකුව මම මුණ ගැසුනෙමි. ඔවුහු හැම කෙනෙක්ම තමන් තුළ

කුහකකම ඇතිවීම පිළිබඳව බියෙන් පසු වූහ.' ඉබ්‍රාහීම් අත්තයියම් (රහ්මතුල්ලාහි අලෙයිහි) මෙසේ ප්‍රකාශ කරයි: 'මගේ කතාව මගේ පැවත්මත් සමග සසඳන විට මම බොරුකාරයෙක් වේදෝ යැයි බියවෙමි' හසනුල් බස්රිතුමා මෙසේ පැවසීය. 'කුහක කමට බියවන්නේ මු:මින්ය. කුහකයා එයට නොබියව සිටී' උමර් (රළියල්ලාහු අන්හු) තුමා හුදෙයිෆා (රළියල්ලාහු අන්හු) තුමාගෙන් 'අල්ලාහ් මත දිවුරා ඔබගෙන් අසමි" රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මාවත් මුනාෆික් කෙනෙකු යැයි ඔබට පැවසුවේදැ? යි විමසූහ. එවිට ඔහු 'නැතැ'යි පවසා මින්මතු මම කිසිවෙකු පිරිසිදු වන්නයින් යැයි නොකියමි'යි පැවසීය.

**37. අල්ලාහ් සතුව මහා පාපයන් ලෙස සැලකෙන්නේ කුමක් ද?** අල්ලාහ්ට ආදේශ කිරිමයි" අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. 'නියත වශයෙන්ම ආදේශ කිරීම මහා අසාධාරණයකි' රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාගෙන් *පාපයන්ගෙන් ලොකුම පාපය කුමක් දැ?'යි අසනු ලැබූ විට 'අල්ලාහ් නුඹව මවා ඇති තත්ත්වයෙන් ඔහුට ආදේශ කිරීමයි' යැයිපිළිතුරු දුන්නේය.* (බුහාරි' මුස්ලිම්)

**38. ආදේශ කිරීම කී වැදෑරුම් ද?** දෙවැදෑරුම් වෙති.

1.- **ඉස්ලාමයෙන් ඉවත් කෙරෙන මහා ආදේශය** :- එය අල්ලාහ් ක්ෂමා නොකරන්නේය. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. 'නියත වශයෙන්ම අල්ලාහ් ඔහුට ආදේශ කිරීම ක්ෂමා නොකරයි. අනෙක්වා ඔහු මනාප අයට ක්ෂමා කරයි. **මෙහිදී ආදේශ කිරීම සිව්වැදෑරුම් වෙයි.** 1. ප්‍රාර්ථනා වෙදී ආදේශය 2. අරමුණේ ආදේශය 3. වත්පිළිවෙත්වල ආදේශය 4. ආදරය කිරිමෙහි ආදේශය" අල්ලාහ්ට ආදරය කරන්නා සේ තවත් කෙනෙකුට ආදරය කිරීම"

2.- **කුඩා ආදේශය**:- මෙය කරන්නා ඉස්ලාමයෙන් ඉවත් නොකෙරෙයි. මෙය දෙවැදෑරුමක් වෙති.

**(අ) බාහිර** :- එය වචන හා සම්බන්ධ විෂයක් වන අල්ලහ් හැර අන් දෙයක් මත ද්වුරීම, අල්ලහ් සිතන දෙය ද නුඹ සිතන දෙය ද ක්‍රියා වේ. යනුවෙන් පැවසීම. හෝ ක්‍රියාව හා සම්බන්ධ විෂයන්.එනම් දුක් කරදර දුරුවීම සඳහා නූල් පැලදීම, සුභ අසුභ නිමිති බැලීම.

**(ආ) අභ්‍යන්තර** :- මෙය සිතීම,අදිෂ්ඨානය හා ඇල්මෙ යි ඇතිවන ෂිර්කයන්.එනම් මුනිව්වාව වැනි දේවල් ය.

**39. මහා 'ෂිර්ක්' හා කුඩා ෂිර්ක් අතර වෙනස කුමක්ද?** මහා ෂිර්ක් කළ තැනැත්තා ඉස්ලාමයෙන් ඉවත් කරනු ලබන්නේය. නිරයේ සදාකාලිකව දමනු ලබන්නේය. එහෙත් කුඩා ෂිර්ක් කරන්නා ඉස්ලාමයෙන් ඉවත් කරනු නොලබයි. නිරයේ සදාකාලිකව දමනු ලබන්නෝද නැත. මහා ෂිර්ක් සියලුම කුසල් මකා දමන්නේය. එහෙත් කුඩා ෂිර්ක් කුමන යහ ක්‍රියාවකට සම්බන්ධ වූයේ ද එය පමණක් මකා දමයි. කුඩා ෂිර්ක් අල්ලාහ්ගෙන් ක්ෂමාව අයැදීමෙන් පමණක් ක්ෂමා කරනු ලබන්නේ ද? එසේ නැතුව අල්ලාහ් මනාප වුවහොත් ඔහු කැමැත්තෙන්ම ක්ෂමා කරයි ද? යන්න මත භේදයට තුඩුදෙන කරුණකි. කෙසේ වෙතත් කුඩා ෂිර්ක් ද භයානකය.

**40. මෙයින් ආරක්ෂා විමට මගක් ඇත් ද?** එසේ කටයුතු කළහොත් එයට ප්‍රතිකර්මයක් ඇත් ද? මුණිව්වාවෙන් ආරක්ෂාවීමට යහක්‍රියාමගින් අල්ලාහ්ගේ තෘප්තිය ලබාගැනීමට අපේක්ෂා කළ යුතුය. ඒ සඳහා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ යුතුය. රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා මෙසේ ප්‍රකාශ කළහ. *'මිනිසුනි" නුඹලා මෙම ආදේශය ගැන බිය වනු" එය කුහුඹුවෙකු ගමන් කරනවාට වඩා ඉතා අදෘෂ්‍යමානය.' එවිට එතුමාගෙන් 'කුහුඹුවෙකු ගමන් කරනවාට වඩා එය සැඟවුණ (අදෘෂ්‍ය) දෙයක් නම් එයින් අප ආරක්ෂා වනුයේ කෙසේදැ'යි ප්‍රශ්න කරනු ලැබිය" (අල්ලාහුම්ම ඉන්නා අඋඃදුබික මින් අන්-නුෂ්රික බික ෂෙයිඅන් නඃලමහු වනස්තඃෆිරුක ලිමාලා නඃලමු)* (අහ්මද්)

**තේරුම**-: යා අල්ලාහ්" අපි දැනුවත්ව නුඹට ආදේශ කිරීමෙන් නුඹෙන් ආරක්ෂාව පතමු. අපි නොදන්නා දෑ වෙනුවෙන් නුඹෙන් ක්ෂමාව අයදින්නෙමු'යි නුඹලා පවසනු යැයි පිළිතුරු දුන්හ. අල්ලාහ් නොවන දෑ මත දිවුරුවහොත් එය පිළිබඳ ප්‍රතිකර්මයක් වශයෙන් රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා පහත සඳහන් පරිදි පැවසූහ. එනම් *'ලාත්" උස්සා මත දිව්රුවහොත් ඔහු ලා ඉලාහ ඉල්ලල්ලාහ් යැයි කිව යුතුය.* (බුහාරි' මුස්ලිම්)

**ග්‍රහදෝෂ බැලීමට ප්‍රතිකර්ම සඳහා රසූල්** (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ පහත සඳහන් පරිදි පැවසූහ. '*කවරෙකුට හෝ නරක අපලයක් යම් අවශ්‍යතාවක් බාධා කළේ නම් ඔහු ආදේශ කළේය. 'එවිට එයට ප්‍රතිකර්මය කුමක්දැ'යි විමසීන. එවිට එතුමාණෝ (අල්ලාහුම්ම ලා හයිර ඉල්ලා හයිරුක. වලා තයිර ඉල්ලා තයිරුක. වලා ඉලාහ ගයිරුක)*

(අහ්මද්)

**තේරුම**-: යා අල්ලාහ් නුඹෙන් එන යහපතට වඩා යහපතක් නැත. නුඹේ මනාපයෙන් තොරව කිසිම අපලයක් කිසිවක් නොකරයි. නුඹ හැර වෙනත් දෙවියෙක් නොමැත' යි ප්‍රකාශ කළහ.

**41. කුෆ්ර් (දේව ප්‍රතික්ෂේපය) කී වැදෑරුම් වෙයිද?** - දෙවැදෑරුම්වේය.

1.- (ඉස්ලාමයෙන් බැහැරවීම) මහා කුෆ්රය. එය පස්වැදෑරුම් වෙයි. 1. බොරු කිරීම 2. සැබෑ කිරීමත් සමග ආඩම්බරය පෙන්වීම 3. සැක කිරීම 4. නොසලකා හැරීම 5. කුහක කම"

2.- කුඩා කුෆ්රය" මෙය මුස්ලිම්වරයෙකු ඝාතනය කිරීම ආදියෙන් සිදුවිය හැකි දෑය" මෙයින් ඉස්ලාමයෙන් පිටමං නොවෙයි.

**42. භාරවීමේ නීතිය කුමක් ද?** රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ භාරවීම පිළිතුල් කළහ. *එය කිසිදු යහපතක් ගෙන නොඑන්නේයැ'යි පැවසූහ.* (බුහාරි)

මෙය අල්ලහ් වෙනුවෙන් පිරිසිදු චේතනාවෙන් භාරවීමය. අල්ලාහ් වෙනුවෙන් භාරනොවී 'වලීවරුන් හා සොහොන්වලට භාරවීම 'හරාම්(තහනම්)ය" එය ඉටු නොකළ යුතුය.

**43. ශාස්ත්‍රකරුවන් වෙත යාමේ නීතිය කුමක් ද?** මෙය තහනම් ය. කවෙරෙකු හෝ ඔවුන් වාදකරන සැඟවුණ දැනුම සැබෑ නොකර යම් යහපතක් හා ප්‍රයෝජණයක් බලාපොරොත්තුවෙන් යන්නේ ද, දින හතලිහක සලාතය පිළිගනු නොලබන්නේය. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ. '*කවරෙකු හෝ ශාස්ත්‍රකරුවෙකු වෙත ගොස් යම් දෙයක් ගැන ඇසුවොත් ඔහුගේ රාත්‍රි හතලිහක සලාතය පිළිගනු නොලැබේ"* (මුස්ලිම්) ඔහු වෙත ගොස් ඔවුන් වාදකරන සැඟවුණ දැනුම සැබෑ යැයි පිළිගතහොත් මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාගේ ආගම ප්‍රතික්ෂේප කළේය. *කවරෙකු හෝ ශාස්ත්‍ර කරුවෙකු ළඟට පැමිණ ඔහු කියන දෙය සැබෑ කළහොත් මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්)ගේ ආගම ප්‍රතික්ෂේප කළේය.* (අබු දාවුද්)

**44. තාරකා මුල්කරගෙන වැස්ස සෙවීම කුඩා හෝ ලොකු ෂිර්කයක් වනුයේ කවදාද?** කවරෙකු හෝ අල්ලාහ්ගේ මනාපයෙන් තොරව වැස්ස වැස්සවීමේ හැකියාව තරුවලට ඇතැයි විශ්වාස කිරීම මහා ෂිර්ක්ය" අල්ලාහ්ගේ මනාපය පරිදි වැස්ස වසී" වැස්ස වැසීමට තරුව හේතුවක් විය. එම තරුව පායන විට වැස්ස වැසිය යුතු යැයි අල්ලාහ් සැලසුම් කළේයැ යි විශ්වාස කිරීමත් පාපයකි. එය කුඩා" ෂිර්ක් එකකි. මන්ද කිසිදු හේතුවකින් තොරව තරුව හේතුවක් කර ගත්තේය. එහෙත් කාලය දැන ගැනීමටත් වැසි වසින කාලය දැන ගැනීමටත් තරු සාධකයක් ලෙස භාවිතා කර ගැනීම වරදක් නොවේ.

**45. මුස්ලිම් නායකයා විෂයෙහි අපගේ යුතුකම් කවරේද?** මනාප අමනාප හැම අවස්ථාවකට ඔහුට අවනතවීම අපේ යුතුකමයි. ඔවුන් අසාධාරණ කළ ද ඔවුනට විරුද්ධව කුමන්ත්‍රණ නොකළ යුතුය. ඔවුනට විරුද්ධව ප්‍රාර්ථනා නොකළ යුතුය. ඔවුන් ඍජු මග යාමට ද සුදනන් වීමට ද ප්‍රාර්ථනා කළ යුතුය. ඔවුන් පාප ක්‍රියාවක් සඳහා අණ නොකරන තෙක් ඔවුනට අවනත විය යුතුය. පාපයන්හි ඔවුනට අවනත නොවිය යුතුය. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. '*නුඹට පිටට පහරදුන්න ද නුඹේ වස්තුව පැහැරගෙනු ලැබුව ද නායකයාට අවනත වනු"* (මුස්ලිම්)

**46. අල්ලාහ්ගේ අනුමැතිය හා තහනම පිළිබඳව (හික්මත්) අරමුණ ගැන ඇසිය හැකි ද?** ඔව්" ඇසිය හැකිය. තම විශ්වාසය වර්ධනය කර ගැනීම සඳහා ඇසිය හැක. එසේ නොමැතිව එය දැනගෙන පසුව විශ්වාසකමේ හෝ යහපත් ක්‍රියාකිරීමේ අරමුණෙන් නොඇසිය යුතුය. කිසිම ප්‍රශ්න කිරීමකින් තොරව ඒ අන්දමින්ම විශ්වාස කිරීම විශ්වාසයේත්" අවනතවීමේත් උසස් භාවය පෙන්නුම් කරන්නකි" සහාබිවරුන්ගේ විශ්වාසය එසේම විය.

**47. නුඹට යම් යහපතක් සිදුවුවහොත් එය අල්ලාහ්ගෙන් පැමිණි දෙයකි. යම් අයහපතක් සිදුවූවොත් එය නුඹෙන් පැමිණි දෙයකි. යන කුර්ආන් වැකියේ තේරුම කුමක් ද?** මෙතැනදී යහපත ගැන මනාපවීම නිඃමත් නැමැති දයාවයි. අයහපත යනු පරීක්ෂණයයි. සියල්ල අල්ලාහ්ගෙන්ම සිදුවන්නේය. යහපත අල්ලාහ් වෙත භාර කෙරෙයි මන්ද ඒ යහපත මගින් අල්ලාහ්ම උදව් කළේය. අයහපත ඔහු දන්නා යම් සියුම් කටයුත්තක් සඳහා මැවීය. ඒ අනුව එය ඔහුගේ යහ ක්‍රියාවකි. මන්ද ඔහු අයහපතක් නොකරන්නේය. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. *'යහපත් සියල්ල නුඹ සතුවම ඇත. අයහපත නුඹ ළග නොමැත'* **(මුස්ලිම)** ගැත්තන්ගේ ක්‍රියාවන් අල්ලා විසින් මවනු ලැබූ අතර මිනිසුන්ගේ උත්සාහය ද වන්නේය. අල්ලාහ් මෙසේ මෙසේ ප්‍රකාශ කරයි.
**කවරෙකු (තමා විසින් දන්) දී බිය භක්තියෙන් කටයුතු කර යහපත් දෑ සැබෑ කරන්නෝද ඔහුට අපි සවර්ගයේ මාවත පහසු කරන්නෙමු. කවරෙකු මසුරුකම් කරමින් අල්ලාහ්ගෙන් තමාට කිසිවක් අවශය නැතැ'යි සිතන්නේද (නිරයේ) මාර්ගය පහසු කරන්නෙමු.**

**48. කෙනෙකු නම් කර 'ෂහීද්' යැයි කිව හැකිද?** කෙනෙක් තවත් කෙනෙකුට 'ෂහීද් යනුවෙන් කීම ඔහු ස්වර්ග වැසියෙක් යැයි කීම හා සමානය. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා විසින් යම් කෙනෙකු නම් කර ඔහු ස්වර්ග වැසියෙක් හෝ නිරයේ වැසියෙක් යැයි කිවහොත් හැර පුද්ගලයෙකු නම් කර ඔහු ස්වර්ග වැසියෙක් හෝ නිරයේ වැසියෙක් යැයි තීරණය නොකළ යුතු බව සුන්නත් වල් ජමාඅත් වරුන්ගේ ප්‍රතිපත්තියයි. මන්ද යම් මිනිසෙකුගේ යථාර්තය සැගවුණ දෙයකි. යහපත් ක්‍රියා ඒවායේ අවසානය අනුවම ඔහු කුමන තත්ත්වයේ මිය ගියේ ද ඔහුගේ අරමුණ කුමක් වී ද යන්න අපි නොදනිමු. අල්ලාහ් පමණක් ඒවා ගැන දනී. එහෙත් යහපත කළ තැනැත්තාට ස්වර්ගය හිමිවිය යුතු යැයි බලාපොරොත්තු වෙමු. අයහපත කළ තැනැත්තා නිරයට යාවි යැයි බියවෙමු.

**49. මුස්ලිම් වරයෙකු බලා 'කාෆිර්' යැයි තීරණය කළ හැකිද?** මුස්ලිම්වරයෙකුගෙන්" කුෆ්රු" ෂිර්ක් නිෆාක් යනාදය ප්‍රසිද්ධියේ නොමැතිව ඔහුව කාෆිර් කියා හෝ මුෂ්රික් කියා හෝ මුනාෆික් කියා හෝ තීරණය කිරීම හොඳ නැත. ඔහුගේ අභ්‍යන්තරය අල්ලාහ්ටම භාර කරමු.

**50. 'කඃබා' නොවන දේවල් පැදකුණු කළ හැකි ද?** පොළොවේ තවාෆ් කිරීමට අනුමත එකම ස්ථානය කඃබාවයි. එය හැර වෙන කිසිවක් නොමැත. වෙන කිසිවක් (එය කොතරම් උසස් වුවත්) කඃබාවට සම නොකළ යුතුය.

# සිත හා සම් බන්ධ අමලයන් (ක්‍රියාවන්)

අල්ලාහු තආලා සිත මවා එය කණ්ඩායමෙ නායකයෙකු ලෙස ද,ශරීරයේ අංගයන් එහි සේනාව බවට ද පත්කළේය. නායකත්වය හොඳවීමෙන් සේනාව හොඳවන්නෝය.නබි (සල්) තුමාණෝ වදාලහ,***නියතවශයෙන්ම ශරීරයේ මස් කැබැල්ලක් තිබෙ,එය හොඳ වීමෙන් මුළු ශරීරයම හොඳවන්නේය,එය නරක් වීමෙන් ශරීරය ද නරක් වන්නේය.දැනගහු එය හදවතයි.*** (බුහාරි,මුස්ලිම)

එය අල්ලහ් කෙරෙහි විශ්වාසය,ඔහුගේ බිය හෙ ඔහුව ප්‍රතික්ෂේප කිරීම,ආදේෂ කිරීම හෙ! කුහක කම ඇතිවන ස්ථානය වෙ. නබි (සල්) තුමාණෝ ***තම හදවත තුන්වරක් සංඥාකොට -තක්වා- නැමැති දේව බියෙහි ස්ථානය මෙය වෙ.***යනුවෙන් පැවසුවෙය. (මුස්ලිම)

- ඊමාන් යනු සිතින් ඒකීයත්වය සම්පූර්ණයෙන් ස්ථිර කිරීම, දිවෙන් පැවසීම හා සිත් හා ශරීර අංගයන් මගින් අමල් කිරීම වෙ. හදවත විශ්වාස කර සත්‍යය කරන්නේය,එහි ප්‍රතිඵලය වනුයේ දිව මගින් ෂහාදා කලිමාව පැවසීම වෙ.පසුව සිත ආශාවෙන්,බියෙන් හා ප්‍රීතියෙන් තම අමලයන් ඉටු කරති.එමෙන්ම දිව අල්ලාහු තආලාව සිහි කිරීම,කුර්ආනය පාරායනා කිරීමත් අතර ශරීරයේ අංගයන් රුකූඋ,සුජූද් වැනි අමලයන් සඳහා සෙළවෙන්නේය.ශරීරය හදවත අනුගමනය කරති.එනිසා හදවතෙහි කුමක් තිබෙ ද එය කෙසේ හෙ! ශරීරය තුළින් පිට වෙ.
- සිත් හා සම්බන්ධ අමලයන් යනුවෙන් අදහස් කරනු ලබන්නේ, සිත ස්ථානයක් කරගෙන එය සමග බැඳීපවතින අමලයන්ය.එයින් ඉතා අගනාම දෑ අල්ලාහු තආලාව විශ්වාස කිරීම,එය සත්‍යය කිරීම,අවනත වීම හා පිළිගැනීමය.තවද තම රක්ෂකයා වන අල්ලහ් සමග ගැත්තාගේ සිත සම්බන්ධ වීමෙන් ඇතිවන ආදරය, බිය,අපේක්ෂාව,අල්ලාහ් වෙත හැරීම,ඔහු හට තම විෂයන් පැවරීම,ඉවසීම.නිශ්චිත විශ්වාසය හා දේව බිය වනාහීන් ද මෙ ගණයට අයත් වෙ.

සිත් හා සම්බන්ධ අමල්වලට එරෙහිව ක්‍රියා කරන සෑම දෙයක්ම සිතෙහි ඇතිවන රෝග වන්නේය.එනම් මුනිවුවාව පිරිසිදු චෙතනාවට ද,සැකය නිශ්චිත විශ්වාසයට ද,කෝපය ආදරයට ද විරුද්ධ වන්නේය.අප අපගේ සිත ශීලාචාරය කිරීමට අමතකවීමෙන් එය පාපයන්ගෙන් ගිලී විනාශයට පත්වන්නේය. නබි (සල්) තුමාණෝ පැවසුවෙය,නියතවශයෙන්ම ගැත්තෙක් පවක් කළ විට ඔහුගේ හදවතේ කළු පුල්ලියන් වැටෙයි. ඔහු පාපක්ෂමාව අයැද එයින් ඉවත්වන්නේ නම් එම කළු පුල්ලිය ඉවත් වී හදවත දීප්තිමත් වෙයි. එසේ නොමැතිව ඔහු දිගටම පව්කරමින් සිටී නම්, කළු පුල්ලි අධික වී ඔහුගේ හදවත වසාගනී. අල්ලාහ් ප්‍රකාශ කරනුයේ මෙයයි.( එසේ නොකියනු. එහෙත් ඔවුන් හම්බකරගත් දෑ (පව්) ඔවුන්ගේ හදවත මත මලකඩ මෙන් වසාගත්තේය.) (තිරුමදී) තවද පැවසුවෙය. පැදුරු ගෙතීම සඳහා එකපිට එක තබන ඉරටු මෙන්, හදවතට පිත්නාව(ෂෙයිතාන්ගේ පෙලඹුම) පැමිණෙනු ඇත.කුමන හදවත එය ඇතුලු කර ගන්නේ ද,එහි මත කළුයියයි ලපයක් ඇති වෙ. කුමන හදවත එය මගහරින්නෙ ද,එහි මත සුදු ලපයක් ඇතිවෙ.අවසානයේ දී හදවත් දෙකක් බවට පත් වෙ.ප්‍රථමය, මෙම අහස පොළොව තිබෙන කල් පිත්නාව තුළින් කිසිදු හානියක් නොකරනු ලබන අතිශුද්ධ සුදු පැහැයෙන් යුත් හදවතයි.අනෙක කනපිට පෙරලන ලද භාජනයක් මෙන්ය.එය තුළ කිසිදු යහපතක් ඇතුලු නොවීමත් සමග කිසිදු අයහපතක් මග නොහැරේ.තවද ඉච්චාවන්ගෙන් කුමක් ඇතුලු කරනු ලබන්නේ ද, එය ද ඇතුලු කිර ගනියි. (මුස්ලිම)

- ගැත්තන් ශරීර අංගයන් තුළින් ඉටුකරන අමලයන්වලට වඩා, සිත් තුළින් ඉටුකරනු ලබන අමලයන් දැනගැනීම ඉතා අනිවාර්‍යය හා වැදගත් වන්නේය.එනම් එය මුල් ද ශරීර අංගයන් කඳ ද වෙ.තවද එයට සම්පූර්ණ ප්‍රයෝජණය ලබා දී නිමාවට ද පත් කරති. නබි (සල්) තුමාණෝ! පැවසුවෙය,නියතවශයෙන්ම අල්ලහ් නුඹලාගේ රූපයන් හෙ ධන සම්පත් දෙස නොබලන්නේය.එහෙත් නුඹලාගේ හදවත් හා අමලයන් දෙස පමණක් බලන්නේය (මුස්ලිම්)

තවද හදවත සිතීම හා දැනුමෙහි ස්ථානය වෙ.මෙ නිසාද පිරිසිදු චෙතනා,නියතතාවය හා විශ්වාසය වැනි විෂයන් මිනිසාගේ සිත් තුළ පතිතවීමෙන් අල්ලහ් සතුව ඔවුනගේ තරාතිරම ද වෙනස් වෙ.හසනුල් බසරි රහිමහුල්ලාහු තුමා පවසයි,මා අල්ලහ් මත දිවුරා කියන්නෙමි: අබූ බකර්(රළි)තුමා තම සලාතයෙන් හෙ! තම උපවාසයෙන් අන් සහාබාවරුන්ට වඩා ඉදිරියෙන් නොසිටයේය. එහෙත් නියතවශයෙන්ම ඔහු ඔවුන්ට වඩා ඉදිරියෙන් සිටීමට තුඩුදුන් හේතුව නම්,ඔහුගේ සිතෙහි පතිත වූ විශ්වාසයම වෙ.

ශරීර අංගයන් තුළින් ඉටුකරනු ලබන අමලයන්වලට වඩා සිත් තුළින් ඉටුකරනු ලබන අමලයන් බොහෙ! අවස්ථාවල දී සුවශේෂ වන්නේය. 1=සිතෙහි ඇති වන සමහර සිතුවිලි තුළින් අංගයන් මගින් සිදුවන අමලයන් ද විනාශවී නොපිළිගනු ලබන්නේය. උදා:=මුනිවුවාවත් සමග කරනුලබන අමලයන්. 2=සිත් මගින් ඉටු කරනු ලබන අමලයන් ද මුල වෙ,එයට එරහිව උවමනාවෙන් තොරව අංගයන්ගේ සෙලවීම් හා පිටවන වචනවලට දුවම් ද නැත. 3=මෙය ස්වර්ගයේ මිනිසාගේ තරාතිරම උසස් කිරීමට කාරණයක් වන්නේය.උදා:=කෙලෙස් දුරු කිරීම. 4=එය අංගයන් තුළින් ඉටු කරන අමලයන්වලට වඩා ඉතා අපහසු ,දුෂ්කර අමලයන් ය.ඉබ්නු මුන්කදිර් රහිමහුල්ලාහු තුමා පවසයි:මා වසර හතලිහක් දුක් කරදර පීඩනයට ලක්වීමෙන් පසුව ද මාගේ සිත ශීලාචාර වුනේය. 5=මෙය අලංකාර සිතුවිලි මතු කරන්නේය.උදා:= අල්ලහ් වෙනුවෙන් ආදරය කිරීම. 6=මෙය මහා අධික කුසල්වලට පාත්‍ර වන්නේය.අබුද්දර්දා (රළි)තුමා පවසයි:නුඹ කෙටි වෙලාවක් සිතනු. එය නුඹ මුළුයි රැයම සලාතයේ යෙදීමට වඩා උතුම් වෙ. 7=මෙය අංගයන් සෙලවිල්ලට ලක්කරන කාරනයක් වන්නේය. 8=මෙය ශරීරයෙන් ඉටු කරනු ලබන අමල්වලට අධික කුසල් හෝ!එය අඩු කිරීමට හෝ! විනාශ කිරීමට කාරනයක් වන්නේය.උදා:= සලාතයෙ අල්ලහ් සතුව බිය ඇතිවීම. 9=මෙය සමහර අවස්ථාවන්හි දී අංගයන් මගින් ඉටු කරනු ලබන අමල්වලට හිලව්වක් වන්නේය. උදා:=කෙනෙකු සතුව ධන සම්පත් නොමැති වුවත්,දන් දීමට අදිෂ්ඨානය කිරීම. 10=මෙයට ලැබෙන කුසල් සීමා රහිතය. 11=අංගයන් මගින් අමල් කිරීමට අපහසු වී නොහැකි වුව ද,මෙහි කුසල් ඉදිරියට මතු වන්නේය. 12=තවද මෙය අංගයන් මගින් ඉටු කරනු ලබන අමලයන්වලට පෙර හෝ එයත් සමග සිටති.

අංගයන් ක්‍රියාත්මක වීමට පෙර සිතෙහි ඇතිවන අවස්ථාවන් කිහිපයක්. 1=(الهاجس) එක් වෂයක් සිතට ඇතුලුධීවීමෙන් ඒ පිළිබදව ඇතිවන සිතුවිලි. 2=(الخاطرة) සිතෙහි රැදෙනු ලබන සිතුවිලි. 3=(حديث النفس) එක් දෙයක් කිරීම හෙ!නොකිරීම යන සැකය මත ඇතිවන සිතුවිලි. 4=(الهمّ) එක් දෙයක් කිරීම සඳහා සිත එකග කිරීම. 5=(العزم) දෙයක් කිරීම සඳහා ඇතිවන ස්ථිර අදහස. ප්‍රථම අවස්ථාවන් තුනෙහි යහපත් හෙ!අයහපත් සිතුවිලි තුළින් කුසල් අකුසල් නොලැබෙ.සිවුවන අවස්ථාවෙයහපතක් සිතීමෙන් කුසල් ලියනු ලැබෙන අතර පාපයක් සිතීමෙන් අකුසල් නොලියවෙ.එය ස්ථිර වී පස්වන අවස්ථාවට ඇතුලුධීවීමෙන්,යහපත් සිතුවිලි මගින් කුසල් ලැබෙන අතර එය පාප සිතුවිල්ලක් නම්,එය ක්‍රියා නොකළද අකුසලක් ලැබෙන්නේය.මන්ද එක් ක්‍රියාවක් කිරීමට ශක්තිය ලබා එය කිරීමට ද ස්ථිර අදහස් තබා පසුව ඔහු එය නොකළද,එය කළ හා සමානය.අල්ලාහු තආලා ප්‍රකාශ කරයි (මු:මින්වරුන් සම්බන්ධයෙන් අයහපත පැතිරවීම ප්‍රිය කරනවුන්,නියතවශයෙන්ම ඔවුන්ට දරුණු දුවම් ඇත) නබි (සල්) තුමාණෝ!පැවසුවෙය.මුස්ලිම්වරු දෙදෙනෙකු අසිපත් ඔසවා මුණගැසෙන්නේ නම්,ඝාතනය කරන්නා ද කරනු ලබන්නා ද නිරයේ සිටති.එවිට මා ඇසුවෙමි:අල්ලාහු තආලාගේ දූතයානනි,ඔවුන්ගෙන් කෙනෙකු ඝාතනය කළ තැනැත්තාය. ඝාතනයට ලක් වූ තැනැත්තාගේ තත්වය කුමක්ද? එවිට නබි (සල්) තුමාණෝ! පැවසුවෙය:මොහුද ඔහුව ඝාතනය කිරීමෙ ආශාවෙන් සිටයේය. (බුහාරි)

කෙනෙකු පාපයක් කිරීමට ස්ථිරයෙන් අදහස් කොට පසුව එය මගහැරීමෙන් අවස්ථාවන් හතරකට ලක්වන්නේය. 1=අල්ලහ් තආලාගේ බිය මත නොකිරීම. මෙයට කුසල් හිමිවන්නේය. 2=මනුෂ්‍යයින්ගේ බියෙන් නොකිරීම.මෙම අවස්ථාවෙ ඔහු පාපියෙකු වන්නේය.මන්ද පාපයක් නොකර මග හැරීම නැමදුමක් වන අතර එය අල්ලහ් වෙනුවෙන් පමණක් විය යුතුය. 3=පාපයක් කිරීමට අවශ්‍යය උත්සාහය නොකරන අතර එම පාපය කිරීමට නොහැකියාවෙන් මගහැරීම.මොහුද ඔහුගේ අදහසේ නියතතාවය සඳහා පාපියෙකු වන්නේය. 4= පාපයක් කිරීමට අවශ්‍යය උත්සාහය කර, පසුව එයට නොහැකි වීමෙන් එය මගහැරීම.ඔහු ඔහුගේ අදහසේ නියතතාවය හා උත්සාහය සඳහා මෙම පාපය ඔහු නොකිරීමත් සමග, ඔහුට සම්පූර්ණ අකුසල සටහාන් කරනු ලැබෙ.එහෙයින් අදහස් සමග ක්‍රියාව ද එකතු වීමෙන්,ඔහු නියතවශයෙන්ම දුවමට ලක්වනවා ඇත.කෙනෙකු යම් පාපයක් කර,මෙම පාපය කිරීමට යළි අවස්ථාවක් ලැබුනේනම් මා යළි මෙය කරමි.යන ස්ථිර අදහසින් සිටය දී ඔහුට එය කිරීමට අවස්ථාව නොලැබුනද,ඔහු එම පාපයේ රැදී සිටයා මෙන් සටහන් වෙ.තවද ඔහුට දුවම්ද ලැබෙනවා ඇත.

# සිත හා සම්බන්ධ අමලයන් කිහිපයක්

**අදිෂ්ඨානය (අන්නියා)** යනු අදිෂ්ඨාන කිරීම යන අදහස දෙයි.නියතයෙන් තොරව අමලයන් පිළිනොගැනේ. නබි (සල්) තුමාණෝ! පැවසුවේය.*සෑම අමලයක්ම නියතය මුල් කරගෙනම වේ.සෑම මිනිසෙකුම ඔහු අදිෂ්ඨානය කරන දෙය ලැබෙන්නේය.* (බුහාරි,මුස්ලිම්)
ඉබ්නු මුබාරක් (රහ්)තුමා පවසයි: බොහෝ!කුඩා අමලයන්,නියතය තුළින් එහි විපාකය අධික වේ. තවත් බොහෝ!විශාල අමලයන්, නියතය තුළින් එහි විපාකය කෙට වේ. පුලෛල් (රහ්) පවසයි:අල්ලහ් ඔබගෙන් බලාපොරොත්තු වන්නේ නියතයයි.එමෙන්ම ඔබ ඉටුකරන අමලය අල්ලහ් වෙනුවෙන් නම්,එයට ඉඛ්ලාස් යනුවෙන් කියනු ලැබේ. එනම්පිරිසිදු චේතනාවත් සමග අල්ලහ් වෙනුවෙන් පමණක් එම ක්‍රියාව කිරීම.අල්ලහ් හැර අන් අය වෙනුවෙන් එම ක්‍රියාව කරනු ලබයි නම් එයට මුනිව්වාව හා කුහකය යනුවෙන් කියනු ලැබේ.

**ප්‍රයෝජනය:=** ආගමේදැනුම උගතුන් හැර අන් සියළුදී මනුෂ්‍යයින්ම විනාශයේ සිටන්නේය.දැනගත් දැනුමෙන් අමල් කරන්නන් හැර අන් සියළුදී උගතුන්ම විනාශයේ සිටන්නේය.පිරිසිදු චේතනාවෙන් තොරව අමල් කරන්නන් හැර අන් සියල්ලෝම විනිශයේ සිටන්නේය.

**ක්‍රියාවන් වර්ග 3කින් යුක්තය. 1=පාපයන්:** එක් පාපයක් කරන අවස්ථාවේ අප තබන යහා නියතය,එම පාපය කුසල් බවට පත් නොකරයි.හෙවත් එම පාපය සමග නරක නියත් එකතුවීමෙන්, එහි දුර්විපාකය කිහිප ගුණයකින් වැඩි වේ. **2=අනුමැති කරනු ලද්දන්:** අනුමැති කරන ලද ක්‍රියාවන් හි නියතයක් හෝ!නියත් කිහිපයක් මගින් හෝ!එය නැමදුම්බවට පත් කළ හැක. **3=වත්පිළිවෙත්:** මෙය පිළිගැනීමට හා කුසල් කිහිපගුණයෙන් වැඩි වීමට මුන්ව්වා රහිත වු යහ නියත් අවශ්‍ය වේ.[1] ඔහු එය මුනිව්වාවට කළේ නම්, පාපියෙකු වී කුඩා ෂිර්කයට ලක් වන්නේය.සමහර විටක එය ඔහුව මහා ෂිර්කයට ද තල්ලු කරති.

**මුනිව්වාව වර්ග 3කට බෙදේ:= 1=** අමලය කිරීම සඳහා තුඩු දුන් හේතුව මුනිව්වාව වීම.මෙය ෂිර්කයන්ගෙන් එකක් වන අතර ඔහුගේ නැමදුම ද පිළිනොගැනේ.
**2=** අල්ලහ් වෙනුවෙන් අමලයක් ආරම්භ කර පසුව එහි මුනිව්වාව ඇතිවීම.මෙහි දී ආරම්භය හා අවසානය අතර බැඳීමකින් තොර වු සදකා වැනි අමලයක් නම්, ආරම්භය පිළිගනු ලැබෙන අතර අවසානය නොපිළිගැනේ.එහෙත් ආරම්භය හා අවසානය අතර බැඳීමක් හා සම්බන්ධයක් ඇති සලාතය වැනි අමලයක් නම්,එය අවස්ථාවන් දෙකකට ගොණු වේ. (1) ඔහු

---

[1] නබි (සල්)තුමාණන් පැවසුවේය.කවරෙකු යහපතක් කිරීම සඳහා ස්ථිරයෙන් අධිෂ්ඨානය කර,පසුව එය නොකිරීමෙන් ද, අල්ලාහු තආලා ඔහුහට සම්පූර්ණ යහ විපාකයක් ලියන්නේය.එසේ ඔහු එය කිරීමෙන් දහ ගුණයේ සිට හත්සිය තෙක් හෝ! ඊට වැඩියෙන් ගුණ කර විපාකයන් ලබාදෙන්නේය. තවද කවරෙකු අයහපතක් කිරීම සඳහා ස්ථිරයෙන් අධිෂ්ඨානය කර,පසුව එය නොකිරීමෙන්, අල්ලාහු තආලා ඔහුහට ද සම්පූර්ණ යහ විපාකයක් ලියන්නේය. එසේ ඔහු එය කිරීමෙන් දුර්විපාකයක් පමණක් ලියන්නේය. (බුහාරි,මුස්ලිම්)
තවද පැවසුවේය.මෙම සමුහයට උපමාව වනුයේ සිව් තැනැත්තන් මෙන් ය.ප්‍රථම තැනැත්තා අල්ලාහ් ඔහුට ධනය හා දැනුම ලබා දී,එම දැනුම මගින් අමලයන් ඉටුකරන අතර තම ධනය ද එයට අදාල ස්ථානවල වැය කළේය.අනෙක් තැනැත්තා අල්ලාහ් ඔහුට ධනයෙන් තොරව දැනුම පමණක් ලබා දුන්නේය.ඔහු පවසන්නේය=මා හටද ඔහු මෙන් ධනය ඇත් නම්,ඔහු කරන අයුරින් මා ද යහ අමල් කරමි. නබි (සල්)තුමාණන් පැවසුවේය,ඔවුන් දෙදෙනා කුසළෙහි එක හා සමානවන්නෙ!ය. තවත් තැනැත්තෙකු අල්ලාහ් ඔහුට දැනුමෙන් තොරව ධනය පමණක් ලබා දුන්නේය.ඔහු එය නොසුදුසු ස්ථානයේ වැය කර විනාශ කරන්නේය. තවත් තැනැත්තෙකු අල්ලාහ් ඔහුට දැනුම ද, ධනය ද ලබා නොදුන්නේය. ඔහු පවසන්නේය=මා හටද ඔහු මෙන් ඇත් නම්,ඔහු කරන අයුරින් මා ද කරමි. නබි (සල්)තුමාණන් පැවසුවේය, ඔවුන් දෙදෙනා පාපයෙහි එක හා සමානවන්නෙ!ය.(අත්තිරුමිදි) මෙම හදීසයේ දෙවන හා සිව්වන තැනැත්තන් දෙදෙනා ඔවුන්ට කළ හැකි දෑ කළේය, එයයි ස්ථිර අධිෂ්ඨානය හා පැතුම වේ. තවද එය ඔවුන්ගේ මුඛයෙන් ද=මා හටද ඔහු මෙන් ඇත් නම්,ඔහු කරන අයුරින් මා ද කරමි= මෙලෙස පිටවීම තුළින් කුසල හා පාපයෙහි ඔවුන් සමග එකතු කරනු ලැබූණි. ඉබ්නු රජබ් රහිමහුල්ලාහ් තුමා මෙසේ පවසයි: හදීසයේ පවසන ලද වාක්‍යය= ඔවුන් දෙදෙනා කුසළෙහි එක හා සමානවන්නෙ!ය= යන්නෙහි අදහස වනුයේ, ඔවුන් දෙදෙනා කිහිප ගුණයෙන් වැඩිවන කුසළයෙන් තොරව,ප්‍රධාන කුසළයෙන් පමණක් එකතු වෙන බවය. තවද කිහිප ගුණයෙන් වැඩිවන කුසළයෙන් හිමවන්නේ,අධිෂ්ඨානයත් සමග අමල් කරන්නාට පමණියි. එමෙන්ම මොවුන් දෙදෙනා සෑම අතින්ම කුසළයෙන් සමාන වන්නේනම්,එම හදීසයේ මෙලෙස පැමිණිය යුතුය.= කවරෙකු යහපතක් කිරීම සඳහා ස්ථිරයෙන් අධිෂ්ඨානය කර,පසුව එය නොකිරීමෙන් ද අල්ලාහු තආලා ඔහුහට දහ ගුණයේ සිට...=මෙය හදීසයට විරුද්ධ වේ.

මුනිවුචාවෙන් වැළකීමට උත්සහා කිරීම.මෙය තුළින් ඔහුගේ අමලයට බලපෑමක් ඇති නොවේ. (2) මුනිවුචාවෙන් සිත සැනසීම.මෙමගින් නැමදුම සම්පූර්ණයෙන් විනාශ වේ.

3= අමලය කිරීමෙන් පසුව මුනිවුචාව ඇති වීම.මෙය අමලය හෝ!එය කරන්නාට බලපෑමක් ඇති නොකරන සිත් කලහකමක් හා සැකයක් පමණී.මෙවන් හැර තවත් රහසිගතවූ මුන්වුචාවන් කිහිපයක් ඇත.එය දැන වැළකී සිටීම අප මත අනිවාර්‍යය වේ.

**කවරෙකු මෙළොවෙහි යමුඅවශ්‍යතාවයක් සපුරාලීම පිණිස යහ අමලයක් කරන්නේ ද,ඔහුට ලැබෙන යහාවිපාකය හෝ!දුර්විපාකය ඔහුගේ නියතය හා සමාන වේ.මෙය අවස්ථා 3කින් යුක්තය.**

1= එම යහ අමලය කිරීමේඅරමුණ,මෙළොව පමණක් ලබා ගැනීමය.උදා:=කුසල නොසලකා මුදල් වෙනුවෙන් පමණක් මින්සුන්හට සලාතය(ඉමාමතය) ඉටු කිරීම.නබි (සල්)තුමාණෝ!පැවසුවේය. ***කවරෙකු අල්ලහ්ගේ තෘප්තිය වෙනුවෙන් පමණක් ඉගෙන ගතයුතු දැනුමක්,මෙළොවෙහි ආදායමක් සඳහා ඉගෙන ගන්නේ ද,විනිශ්චය දිනයේ ඔහු ස්වර්ගයේ සුවඳ ද නොලබයි.***

(අබූදාවූද්)

2= අල්ලහ්ගේ තෘප්තිය හා මෙළොවෙහි ආදායමක් සඳහා අමලය කිරීම.ඔහු ඊමානයේ හා ඉ:ලාසයේ අඩු තත්වයේ සිටන්නෙකුය.උදා:=වෙළෙඳාමුකිරීමත් සමග හජ් කර්තව්‍යය ඉටු කිරීම.ඔහුගේ ඉ:ලාසය අනුව යහවිපාකයන් ලැබෙනවා ඇත.

3= අල්ලහ්ගේ තෘප්තිය පතා පමණක් අමල් කිරීම.එහෙත් ඔහුගේ අමලය දිරිගැන්වීම සඳහා,එයට යමුවැටුපක් ලබා ගැනීම.මේඅවස්ථාවේදී නොඅඩු වූ සම්පූර්ණ කුසල් ඔහුට හිමිවන්නේය. නබි (සල්)තුමාණෝ!වදාලහ.**නුඹලා වැටුප් ලබාගැනීමෙන් ඉතා සුදුසුම දෙය වනුයේ,දේව ග්‍රන්ථයයි.**(බුහාරි)

**දැනගහුයී!** පිරිසිදු චේතනාවෙන් අමල් කරන්නන් තරාතිරම කිහිපයකින් යුක්ත වේ. 1=පහත් තත්වය: කුසල අපේක්ෂාකොට දුවමට බයෙන් අමල් කිරීම. **2=මැදි තත්වය:** අල්ලහ්ගේ අණට කීකරුවී පිළිතුරු දීම හා ඔහුට ස්තුතිය පුද කිරීම පිණිස අමල් කිරීම. **3=උසස් තත්වය:** අල්ලහ් ආදරය,ඔහුව ගෞරවයට පත් කරීම හෝ! ඔහුට බිය වීම මත අමල් කිරීම.මෙය සිද්දීක්වරුන්ගේ තරාතිරම වන්නේය.[1]

**◗ පාපක්ෂමා අයැදීම (අත්තව් බා)** පාපයක් කළ සැනින්ම එයට තවුබා කිරීම අනිවාර්‍යය වේ.මන්ද පාපයන් කිරීම මිනිසාගේ ස්වභාවයයි.නබි (සල්)තුමාණෝ!පැවසුවේය. **ආදමුගේ පත්‍රයින් සියල්ලෝ!ම පාපිෂ්ඨයින්ය.එම පාපිෂ්ඨයින්ගෙන් ඉතා උතුමුඅය තවුබා කරන්නය.**

(තිරුමදි)

තවද පැවසුවේය.**නුඹලා පාපයන් නොකරන කළ,අල්ලාහ් නුඹලාව විනාශ කරන්නේය.පසුව පාපයන් කරන සමූහයක් බිහි කර,ඔවුන් අල්ලාහ්ගෙන් ක්ෂමා අයැදී,අල්ලාහ් ඔවුන්හට පාපක්ෂමා කරයි.** (මුස්ලිම)

තවුබා කිරීමට පමාවීම,එම පාපයෙහි දිගටම නිරතවී සිටීම වරදකී.තවද ෂෙයිතාන් මනුෂ්‍යයින්හට බාධාවන් 7ක් තබා ඇත. එයින් එකකින් හෝ!ජය ලැබීමට උත්සහා කරන්නේය.එක් බාධාවකින් ජය නොලැබූ කළ දෙවැන්නට මාරුවන්නේය.එනම් 1= අල්ලහ්හට ආදේෂ කිරීම හා ඔහුව ප්‍රතික්ෂේප කිරීමේබාධාව. 2= එයට නොහැකි වීමෙන්, ඉස්ලාමයේ මූලික ප්‍රතිපත්තියේ බිද්අතය(ඉස්ලාමයේ අලුත් ක්‍රියාවන් බිහි කිරීම) ඇති කර නබි(සල්)තුමා

---

[1] අල්ලාහු තආලා පවසයි (**නුඹගේ තෘප්තිය පතා මා නුඹවෙත සීඝ්‍ර වුණෙමි**) යනුවෙන් මූසා අලෛහිසලාම් තුමා පැවසුවාය.එනම් මූසා අලෛහිසලාම් තුමා, අල්ලාහ්ගේ කැඳවීමට පිළිතුරු දීම පමණක් ඔහුගේ අශාව නොවූයේය. එරෙහිව අල්ලහ්ගේ තෘප්තිය පැතීමේ ආශාවෙන් ද ඔහුහට මුණගැසීම පිණිස සීඝ්‍ර වුණේය. දෙමව්පියන්හට කීකරුවීම ද මෙලෙසිනි.මෙය තත්වයන් තුනකින් යුක්ත වේ.

**1=පහත් තත්වය.** ඔවුන්හට අකීකරු වීමේදුවමට බයෙන් ද,කීකරු වීමේ කුසළට ආශාවෙන් ද, ඔවුන්ගේ යුතුකම ඉටු කිරීම.

**2=මැදි තත්වය.** අල්ලහ්හට අවනතවීම සඳහා ද,ඔවුන් අපහට කළ උපහාර සඳහා ද ඔවුන්ගේ යුතුකම ඉටු කිරීම.

**3=උසස් තත්වය.** අල්ලහ්ගේ අණ පිළිපැද,ඔහුගේ ආදරය හා ගෞරවය වෙනුවෙන් ඔවුන්ගේ යුතුකම ඉටු කිරීම.

හා ඔහුගේ මිත්‍රයන්ගේ මගෙන් නොමග යැවීම තුළින් බාධාව ඇති කරයි. 3= එයට නොහැකි වීමෙන්,මහා පාපයන්හි යොමු කිරීම තුලින් බාධාව ඇති කරයි. 4= එයට නොහැකි වීමෙන්,කුඩා පාපයන් තුළින් බාධාව ඇති කරයි. 5= එයට නොහැකි වීමෙන්, මුබාහාත් (ඉස්ලාමය අනුමත කළ දෑ නමුත් එය කිරීම අනිවාර්‍යය නොවෙ) ක්‍රියාවන් අධිකව කිරීම තුළින් බාධාව ඇති කරයි. 6= එයට නොහැකි වීමෙන්,ඉමහත් කුසල් හා සුවිශේෂ වතාවත් හා නැමදුම්වලින් තොර වූ වෙනත් නැමදුම්වල යොමු කිරීම තුළින් බාධාව ඇති කරයි. 7= එයට නොහැකි වීමෙන්,මනුෂ්‍යය හා පින්වරුන්ගෙන් යුක්තවූ ෂෙයාතානයන් ඔහු මත පැවරීමෙන් බාධා ඇති කරන්නේය.

**පාපයන් ගණ කිහිපයකින් යුක්ත වෙ:=**

**1= මහා පාපයන්:** මෙළොවෙහි -හද්- නැමති දූ'වම හෙ!පරළොවෙහි අවවාදයන් හෙ! අල්ලහ්ගේ කෙ!පයට හා ශාපයට භාජන වීම හෙ!ඔහුගෙන් ඊමානය ගිළිහී යාමට ලක් වන පාපයන් ය.

**2= කුඩා පාපයන්:** ඉහත සඳහන් දූ'වම්වලට ලක් නොවන පාපයන් කුඩා පාපයන් ය.හෙවත් සමහර කරුණු හේතු කොට ගෙන කුඩා පාපයන් මහා පාපයන් බවට පත් වෙ.එනම්,කුඩා පාපයෙහි දිගටම නිරත වී සිටීම,එය යළි යළි කිරීම,එය සුළුයී දෙයක් යැයි සිතීම, එය කිරීමත් සමග පුරසාරම් දෙඩීම හා එය බාහිරව කිරීම.

සූර්‍යයා බටහිරින් උදාවීමට පෙර හෙ!මරණ වියේ සිටන්නාගේ ප්‍රාණය උගුරු දණ්'ය තෙක් පැමිණීමට පෙර,තව්බා කරන සෑම පාපීන්ගේ තව්බාවම පිළි ගැනේ.එහෙයින් තම තව්බාවෙ සත්‍යව සිටීම තුළින්,ඔහුගේ සියළුයී පාපයන් එය අහසේ මුදුන තෙක් වුව ද,යහ විපාක බවට පත් කරන ලද කුලිය මෙන් ඔහුට ලැබෙ.

**තව්බාව පිළිගනු ලැබීම සඳහා සමහර කොන්දේසීන්:**

1= පාපයෙන් ඈත් වීම. 2= එම ක්‍රියාව පිළිබඳව දුක් වීම. 3= අනාගතයේ ද එම පාපය නොකරමි යන ස්ථිර අදිෂ්ඨානය.තවද එය ගැත්තෙකු හා සම්බන්ධ දෙයක් නම්,යළි එය ඔහු වෙත භාර දීම.[1]

**තව්බා කිරීම හා සම්බන්ධයෙන් මනුෂ්‍යයන් පඩිතරම්4කින් යුක්තය.** 1=ඔහු තව්බා කිරීමෙන් පසුව යළි එම පාපය කරා නොහැරී ජීවිතාන්තය දක්වා තම තව්බාවෙ ස්ථිරව සිටීම.මෙය ද තව්බාවෙ නියතතාවය වෙ.තවද ඔහු යහවිපාකයන් සඳහා ප්‍රමුඛත්වය ලබන්නා වන්නේය.මෙයට-තව්බා නසූහා-යනුවෙන් කියනු ලැබෙ.තවද ඔවුන් සන්සුන්ගත හා ශාන්තිය ඇති වූ සිත් ඇත්තෝය. 2=ඔවුන් තව්බා කිරීමෙන් පසු ඉතා වැදගත්,සුවිශේෂ අමලයන් හි නිරත වෙ.තවද කඩින් කඩ ඔවුන් කරා පැමිණෙන පාපයන්ගෙන් නොමිදෙන අතර එය ඕනෑකමින් නොකරයි.නමුත් එම පාපය කිරීම සඳහා ඔවුන්ට ස්ථිර අදහසක් නොමැති අතර එය තුළින් ඔවුන් විභාගයට ලක් කරනු ලබන්නේය.තවද ඔවුන් එම පාපය කරන සෑම අවස්ථාවන්වලදීම තම හදවතට දොස් පවරා දුක්වී එයින් මිදීම සඳහා ස්ථිර උත්සාහයේ නිරත වන්නේය.ඔවුන් තම ආත්මාවට දොස් පවරන සිත් ඇත්තුන්ය. 3= ඔවුන් තව්බා කිරීමෙන් පසු යම් කාලයක් එම තව්බාවෙස්ථිරයෙන් සිටන්නෙ!ය.පසුව සමහර පාපයන්ගේ තණ්හාව ඉහල නැගී යළි එහි යොමු වන්නේය.එහෙත් ඔහුගේ නැමදුම් හා වතාවත්වල අඩුපාඩු නොකරයි.තවද වෙනත් පාපයන් කිරීමට ශක්තිය හා කැමැත්ත තිබීමත් සමග එය මග හරියි.ඔවුන් සමහර පාපයන් කෙරෙහි ඇති තන්හාවෙ හේතුවෙන් පාපයන් කිරීම සඳහා

---

[1] නබි(සල්)තුමාගෙන් දැනුම්දෙනු ලැබුණි,ඔහු පැවසුවෙය.අල්ලහ් සතුව සටහන් පුස්තක තුනක් ඇත.පුස්තකයක්,එය අල්ලහ් සැලකිල්ලට නොගනී.තවත් පුස්තකයක් එයින් මග නොහරී.තවත් පුස්තකයක්,එහි තිබෙන දෑ අල්ලහ් ක්ෂමා නොකරයි.අල්ලහ් ක්ෂමා නොකරන පුස්තකය,අල්ලහ්හට ආදේශ කිරීමය.අල්ලාහු තආලා පවසයි (නියතවශයෙන්ම එය,කවරෙකු අල්ලහ් හට ආදේශ කරන්නේ ද නිෂ්චිතයෙන්ම අල්ලහ් ඔහුට ස්වර්ගය තහනම් කරන්නේය,තවද ඔහුගේ නවාතැන නිරය වෙ.) ඔහු සැලකිල්ලට නොගන්නා පුස්තකය,ගැත්තා තම ආත්මාවට කරගත් අපරාධය වන ඔහු හා අල්ලහ් අතර ඇති දෑ. නියතවශයෙන්ම අල්ලහ් එය ක්ෂමා කොට මග හරින්නේය.මග නොහරින්නා පුස්තකය, ගැත්තන් එකිනෙකාහට කරගත් අපරාධයන් වෙ.එයට කිසිදු සැකයකින් තොරව කිසාස් යන පලියටපලි ගැනීම වෙ.(අහ්මද්) මෙහි දුර්වලයක් ඇත.

ඉදිරිපත් වන අතර පසුව එයට තවුබා කළ හැක යන කීමෙන් සිත සනසා එහි නිරත වෙ.මොවුන් පසුව යැයි පවසන සිත් ඇත්තෝය.ඔවුන්ගේ අවසානය ඉතා භයානකය.තවද තවුබාවට පෙර මරණය පැමිණීමට ද ඉඩ ඇත.සියළුයී ක්‍රියාවන්ම අවසානය මුල් කර ගෙනය. 4= ඔහු තවුබා කරීමෙන් පසු කෙට කලක් එහි ස්ථිරව සිට,යළි එම පාපයෙහි ගිලී ආරම්භ කරයි.මෙයට තවුබා කිරීම හෝ!යළි නොකරමි යන සිතුවිල්ල ද ඔහුගේ සිතෙහි ඇති නොවෙ.මොවුන් තුළ අයහපත අණ කරන සිත දක්නට ලැබෙ.තවද මොවුන්ගේ අවසානය ඉතා භයානක විය හැකි යන බිය ඇත.

◗ **සත්‍යය (අස්සිදක්)** මෙය සිත හා සම්බන්ධ සෑම අමලයකටම අත්තිවාරමක් වන්නේය.මෙය තේරුම් 6කින් උපයෝ!ගි කරනු ලැබෙ. 1= වචනයේ සත්‍යය. 2= චෙතනාව හා ඇල්මෙහි සත්‍යය. 3= නියතතාවයේ සත්‍යය. 4= පොරොන්දු ඉටු කිරීමේ සත්‍යය. 5= අමලයේ සත්‍යය.එනම් එහි බහිර හා අභ්‍යන්තරය එකග වීම.උදා:=සලාතයේ අල්ලහ් මත බිය ඇති වීම. 6= දහමේසෑම කටයුත්තම ඉටු කිරීමේ සත්‍යය.මෙය ඉතා උසස් හා ගෞරවනීය විෂයකි.උදා:= අල්ලහ් කෙරෙහි බිය,අපේක්ෂා,ගෞරවය,කෙලෙස් දුරු කිරීම, තෘප්තිය, කාර්‍යයන් ඔහු මත පැවරීම හා ආදරය කිරීම ආදී සිත හා සම්බන්ධ සෑම අමලයන්හිම සත්‍යය.ඉහත සඳහන් දෑ තුළින් කවරෙකු වර්ණනා කරනු ලබන්නේ ද ඔහු සිද්දීක් හෙවත් ඉතා සත්‍යයවන්තයාය.මන්ද ඔහු එම සත්‍යයේ උසස් තත්වය කරා පැමිණීම පිණිස.

නබි(සල්)තුමාණෝ!මෙසේ වදාලහ.නුඹලා සත්‍යය ජීවිතයේ අවශ්‍යම දෙයක් කරගනු.එනම් නියතවශයෙන්ම සත්‍යය යහපතට මග පහදයි,යහපත ස්වර්ගයට මග පහදයි,මිනිසෙක් සත්‍යය පමණක් කථාකර තව දුරටත් සත්‍යය පමණක් කථා කිරීමට උත්සහා කරයි නම්,අල්ලහ් තමන් සතුව සිද්දීක් කෙනෙකු වශයෙන් ඔහුව සටහන් කරයි. (බුහාරි,මුස්ලිම්)

කවරෙකුහට සත්‍යය අපැහැදිලි වී,තම සිත් ඉච්චාවෙන් තොරව අල්ලහ් වෙනුවෙන් එය සොයන්නේ ද,අල්ලහ් ඒ සඳහා ඔහුට මග පහදා දෙන්නේය.එය ඔහුට නොලැබුනේ නම්,අල්ලහ් ඔහුගේ නිදහසට කරුණ පිළිගන්නේය.

මෙයට විරුද්ධ පදය අසත්‍යය වෙ.සිතෙහි තිබෙන අසත්‍යය දිව කරා ගොස් එය විනාශයට පත් පත්වන්නේය.පසුව එහි සිට ශරීර අංගයන් කරා ගොස් ඒවායින් සිදුවන අමලයන් විනාශයට පත් පත්වන්නේය. කෙසේ දිව මගින් පිටවන වචනයන් විනාශයට පත් වුවා මෙන්.අවසානයේ දී ඔහුගෙන් පිටවන වචන,ක්‍රියා හා අවස්ථාවන් සියල්ලෙහි අසත්‍යය පැතිරී ඔහු විනාශයට පත්වන්නේය.

◗ **ආදරය (අල්මුහබ් බා)** අල්ලහ්,ඔහුගේ දූතයානන් හා මු:මින්වරු මත තබන ලද ආදරය තුළින් ඊමානයේ සුවය ලබාගත හැක. නබි(සල්)තුමාණෝ!මෙසේ වදාලහ.***කවරෙකුහට විෂයන් 3ක් තිබෙ ද,ඔහු එය තුළින් ඊමානයේ සුවය විදගනී.අල්ලහ් හා ඔහුගේ දූතයානන්ට වඩා වෙනත් දෙයක් ඔහුගේ ආදරයට ලක් නොවීම. අල්ලහ් වෙනුවෙන්ම පමණක් මිනිසෙකුහට ආදරය කිරීම.ගින්නට තල්ලු කිරීම පිළිකුල් කරන්නා මෙන්,අල්ලහ් ඔහුව කුෆ්රයෙන් මුදවාගත් පසු නැවත කුෆ්රය කරා යෑම පිළිකුල් කිරීම.*** (බුහාරි,මුස්ලිම්)

**ආදරය නැමති ගස සිටවා පිරිසිදු චෙතනාව තුළින් හා නබි(සල්) තුමාව අනුගමන කිරීම තුළින් ජලය දැමුවෙ නම්,අල්ලහ්ගේ අනුමැතිය අනුව හොඳ පළතුරු හා කෑම වර්ග බෝ!වෙ.මෙය වර්ග 4කි.**

1= අල්ලහ් මත ඇති වන ආදරය.මෙය ඊමාන් හි අත්තිවාරම වෙ.

2= අල්ලහ්ගේ විෂයන් හි ආදරය කිරීම හා පිළිකුල් කිරීම.මෙය වාජිබ් වෙ.[1]

---

[1] එකට එක් වී ආදරයෙන් සෙනෙහසෙන් හා වෙන් වී පිළිකුල් සහිතව ජීවත් වීම යන විෂයන් හි මනුෂ්‍යයින් තෙවැදෑරුමක් වෙන්නෙ!ය. 1=පිළිකුල් රහිතව පිරිසිදු සිතින් ආදරය කරනු ලබන්නෙ!: ඔවුන් නබි වරුන් හා සිද්දීක් වරුන් වන පරිශුද්ධ මු:මින්වරුන් ය.ඔවුන්ගෙන් නබි(සල්)තුමා හා ඔහුගේ බිරියන් ,දියනියන් හා මිත්‍රයින් ප්‍රමුකත්වය ලබන්නෝය. 2= මුලුමනින්ම වෙන් වී ජීවත්වනු ලබන්නෙ!.ඔවුන් ආගම පහළ වුවන්,ආදේශ කරන්නන් හා කුහකයින් යන කාෆිර් වරුන්ය. 3=එක් අවස්ථාවකදී ආදරයෙන් ද තවත් අවස්ථාවකදී පිළිකුල් සහිතව ද ජීවත් වනු ලබන්නෙ!.තවද ඔවුන්ගේ පාපයන්

3= අල්ලහ් සමගත් ආදරය කිරීම.එනමු අල්ලහ් නොවන දෙයක් අල්ලහ් සමග එක්කොට ආදරය කිරීම.කෙසේ ආදේෂ කරුවන් ඔවුන්ගේ පිළිමයන් ආදරය කරන්නේ ද.මෙය ෂිර්කයේ අත්තිවාරම වෙ.

4= ස්වභාවික ආදරය.උදා:=දෙමවු පියන් හා ළමුන් අතර ඇති වන ආදරය.මෙයට අනුමැතිය ඇත. නබ(සල්)තුමාණෝ!මෙසේ වදාලහ.*නුඹ මෙළොවෙහි පරදේශියෙක් මෙන් ජීවිතය ගතකරහු. අල්ලහ් නුඹව ආදරය කරයි.* (ඉබ්නු මාජා)

**◗ සියළු කාර්‍යයන් අල්ලහ් මත පැවරීම (අත්තවක්කුල්)** අපට අවශ්‍ය දෑ සපුරාලීමෙ හෙ! පිළිකුල් කරන දෑ මගින් වැළකී සිටීම හා සම්බන්ධව අල්ලහ්හට පූර්ණ විශ්වාසය තබා,දහමෙ අනුමැති ඇති ක්‍රියාවන් කිරීමත් සමග අපගේ සිත ඔහු හට භාර කර විශ්වාස තැබීම තවක්කුල් නමු වෙ.අපගේ සිත ඔහුහට භාර නොදීම ඒක දේව විශ්වාසයේ අඩුපාඩුවකි.තවද අපගේ අවශ්‍යතාවයන්ට අවශ්‍ය කාරණාවන් නොකිරීම අපගේ නොහැකියාව හා නුවනේ අඩුව ය. තවක්කුලයේ ආරම්භය වනුයේ ක්‍රියාව කිරීමට පෙර ය.මෙය වර්ග 3කි. 1=වාජිබු හෙවත් අනිවාර්‍යය: අල්ලහ් හැර අන් කිසිවෙකුට කළ නොහැකි විෂයන්,ඔහු මත පමණක් තවක්කුල් තැබීම. උදා:= රෝගය සුව කිරීම. 2=හරාමු හෙවත් තහනමු: මෙය දෙවර්ගයකි. (1) මහා ෂිර්කය:මෙය කාරණයන් මත පූර්ණ විශ්වාසය තැබීම.එය ස්වභාවයෙන්ම අපට යහපතක් ලබා දීම හෙ! අයහාපත් වලින් වළක්වයි යනුවෙන් සිතීම.[1] (2) කුඩා ෂිර්කය: තම ජීවනෙ!පායට තවත් කෙනෙකු කාරණයක් වන බැවින්,රිස්ක් හී විශ්වාසය ඔහු මත තැබීම.

3=ජාඉස් හෙවත් අනුමැතිය: තමන්ට කළ නොහැකි විෂයක් අන් අයට පවරා ඔහු මත විශ්වාස තැබීම. උදා:=මිල දී ගැනීම හා විකිණීම.එහෙත් මෙසේ පැවසීමට අනුමැතිය නැත-මා අල්ලහ් හට ද පසුව ඔබට ද පවරමි.නමුත්-මා ඔබට පවරන්නෙමි-යනුවෙන් පැවසිය හැක.

---

සඳහා වෙන් වී සිටීම. කාෆිර්වරුන් හට ආදරය දැක්වීම දෙවැදෑරුමකි. 1=ඉස්ලාමයෙන් පිටමං වීම හා දහම අත්හැර යාමට සිදු වීම.එනමු ඔවුන්ගේ ආගමු දහම සඳහා ඔවුන් හට උදවු කිරීම.2=හරාමු වු දෙයකි එහෙත් දහමෙන් පිටමං නොවෙ.එනමු ඔවුන්ගේ මෙළොව විෂයන් හි ඔවුන් හට උදවු කිරීම.මෙහි එක් දෙයක් පැහැදිළිව දැනගැනීම ඉතා අවශ්‍ය වෙ.එනමු කාෆිර්වරුන් හට ආදරය දැක්වීම හා ඔවුන්ව පිළිකුල් කිරීම අතර වෙනස්කමු ඇත.සිතින් ඔවුන් මත ආදරයෙන් තොරව, ඔවුන් මතැති බියෙන් තොරව හොදාකාරව සිටීම.තවද ඔවුන්ගේ දුබලයින් හට ආදරය කිරීම හා ඔවුන් සමග ඉතා ආදරයෙන් හා සිනිඳුවෙන් කථා කිරීම එක් විෂය කි.මෙය හා සම්බන්ධව අල්ලහ් පවසයි. (**දහම සම්බනධයෙන් නුඹලා සමග යුධ නොවදින්නන්,නුඹලාගේ ස්ථානයෙන් නුඹලාව පිටුමං නොකරන්නන් හට නුඹලා යහපත් කර ඔවුන් සමග යුක්තියෙන් ජිවත් වීමෙන් අල්ලහ් නුඹලාව නොවළක් වන්නේය.**) ඔවුන්ව පිළිකුල් කිරීම තවත් විෂය කි. මෙය හා සම්බන්ධව අල්ලහ් පවසයි. ( **විශ්වාසවන්තයි" නුඹලා මගේ ද නුඹලාගේ ද සතුරන්ව මිතුරන් නොකරගනු. ආදරය නිසා (නබිතුමාගේ තොරතුරු) ඔවුන්හට ලබා දෙන්නෙහුය.**) නබ(සල්) තුමාණන් මදීනා යුදෙවුවන් සමග සිටයා මෙන්,ඔවුන් හට ආදර දැක්වීමෙන් තොරව පිළිකුල් කිරීමත් සමග ගනු දෙනු තුළින් යුක්තියෙන් සිටය හැක.

[1] අප කරන කාරණ කාර්‍යයන් තවක්කුලයට එරෙහි වෙද? මෙය වර්ග කිහිපයකින් යුක්තවෙ. 1=නොමැතිව තිබෙන ලද ප්‍රයෙ!ජණයක් ලබා ගැනීම.මෙය තෙවර්ගයකි. (අ) ස්ථිර කාරණය.උදා:=ළමුන් ප්‍රසුති කිරීම සඳහා විවාහ කිරීම.මෙම කාරණය අත්හැරීම මෙ!ඩකමක් වන අතර මෙය තවක්කුල් ද නොවෙ. (ආ) ස්ථිර නොවන කාරණය,එහෙත් බොහෙ! විටක එය නොමැතිව එම විෂය නොසිදුවෙ.උදා:=ආහාර පාන ආදිය සැළසුම් නොකොට කාන්තාරයේ ගමන් කරන්නා. ඔහුගේ ක්‍රියාව ද තවක්කුල් නොවන්නේය.ගමන් යෑමෙ දී අවශ්‍ය ආහාර පාන ආදිය රැගෙන යාමෙ අණ කිරීමු පැමිණ ඇත.නබ(සල්) තුමාණන් ද මදීනාවට ගමන් කළ අවස්ථාවෙ ඔහුට අවශ්‍ය ආහාර පාන හා මග පෙන්වන්නෙකු රැගෙන ගියේය.(ඉ)ස්ථිර රහිතව එක් විෂයක් ලබා ගැනීමෙ කාරණයක් වශයෙන් සැකයට ලක් වීම.උදා:=ව්‍යාපාරය වැනි විෂයන් හි සූක්ෂම ලෙස සැලැසුමු කිරීම.මෙය කිරීම හෙ! මුදල් ඉපයීම අත් හරීම තවක්කුලයට එරෙහි නොවන්නේය. උමර්(රළි) තුමා පැවසුවෙය:පොළොවෙහි බීජය සිටවා පසුව අල්ලහ් මත තවක්කුල් තබන්නා,ඔහුම ය තවක්කුල් වන්තයා වන්නේය. 2=තිබෙන දෙය රැකීම.හලාල් වු ආහාරයන් ලබන්නෙකු අනාගථ අවශ්‍යතාවය සඳහා එය එක්රැස් කිරීම තවක්කුලයට එරෙහි නොවෙ.විශේෂයෙන් මෙය ගෘහ මූලිකයන් හට කළ හැක.මන්ද නබ(සල්) තුමාණන් බනු නළීර් ගෙ!ත්‍රිකයන් තුළින් ලැබුණු රට ඉඳි ගස් වකුණා එමගින් තම පවුලේ අය සඳහා වසරකට අවශ්‍යය ආහාර රැස් කළේය. 3= සිදුවීමට නොහැකි අයහාපතින් වැළැකීමට උත්සහා කිරීම. අයහාපතක් වැළැකීමට උත්සහා කිරීම තවක්කුලයට විරුද්ධ නොවන්නේය.උදා:= සන්නාහය ඇඳීදීම,ඔටුවන් ගැට ගසා තැබීම යන ක්‍රියාවන් කර එය මත විශ්වාසය නොතබා,අල්ලහ් මත විශ්වාසය තැබීම. 4= සිදුවී තිබෙන ලද අයහාපත වැළකීම.මෙය වර්ග 3කි. (අ)කාරණය ස්ථිර වීම.උදා:=පිපාසය සඳහා ජල පානය කිරීම.මෙය නොකර සිටීම තවක්කුලයට අදාල නොවෙ. (ආ)කාරණය ඉතා විශාල බලාපොරොත්තු ඇත්තෙකි.උදා:=රෙ!ගය සුව කිරීම සඳහා ඇණීමෙන් ලේ පිටතට ගැනීම.මෙය කිරීම ද තවක්කුලයට විරුද්ධ නොවෙ.මන්ද නබ(සල්) තුමාණන් ලෙඩ රෙ!ග සඳහා ඖෂධ කරන මෙන් අණ කළේය.(ඉ)සැක සහිත කාරණයන්.උදා:=ආරෙ!ග්‍යව සිටන අවස්ථාවෙ දී ඖෂධ පාවිච්චි කිරීම.මෙය මලුමනින්ම තවක්කුලයට එරෙහි වෙ.

**ස්තුතිය (අෂ්ෂුකුර්)** ගැත්තෙකු තම රකෂකයා වන අල්ලාහ්ව සිතින් විශ්වාස කිරීම තුළින් ද දිවෙන් ඔහුට ප්‍රශංසා කිරීම තුළින් ද ශරීර අංගයන් ගෙන් නැමදුම් ඉටු කිරීම තුළින් ද,ඔහු විසින් ලබාදුන් දායාදයන් හි ප්‍රතිබිම්බය හෙළිවීම ෂුකුර් වෙ. සිත්,දිව හා ශරීර අංගයන් තුළින් ස්තුති පුද කිරීම්සිදු වෙ.එනම් දායාදයන් සියල්ල ඔහුගේ නැමදුම් හා වතාවත්වල උපයෙ!ගි කිරීමයි.

**ඉවසීම (අස්සබ් රු)** එය අප වෙත පැමිණෙන ලද සෑම දුක් කරදරයන්ම අල්ලාහ් හැර වෙනත් කෙනෙකුහට පැමිණිලි නොකිරීම. අල්ලාහු තආලා පවසන්නේය. (තවද නියතවශයෙන්ම ඉවසිලි වන්තයාන්හට ඔවුන්ගේ කුලිය ඔවුන්හට කිසිදු ගණනයකින් තොරව සම්පූර්ණ කරනු ලැබෙ.) නබි(සල්) තුමාණෙ! පැවසුවෙය.*කවරෙකු දුක් කරදරයන් වල ඉවසිලිමත්ව ක්‍රියා කරන්නේ ද,අල්ලාහ් ඔහුව ඉවසිලි වන්තයෙකු බවට පත් කරන්නේය.තවද ඉවසිල්ලට වඩා උතුම් වු දායාදයක් කිසිවකුට නොලැබෙ.* (බුහාරි,මුස්ලිම්)

**උමර්(රළි)තුමා පවසයි.මාහට ඇති වු සියළුම දුක් කරදර අතරින් දයාවන් 4ක් මට තිබුණි.** 1= එය මාගේ දහමෙ ඇති නොවුණි 2= එය තෘප්තියත් සමග දරාගැනීමෙන් මා තහනම් නොවුනෙමි. 3= එය ඉතා විශාල මහගයියියියි දෙයක් නොවුණි. 4= එමගින් කුසල ද බලාපොරොත්තු වුනෙමි.

ඉවසීම තරාතිරම්තිහිපයකින් යුක්ත වෙ. 1=පහත් තරාතිරම: දුක් කරදරයන් පිළිකුල් කිරීමත් සමග එය කිසිවකුට පැමැණිලි නොකිරීම. 2= මැදි තරාතාරම: එය තෘප්තියෙන් දරා,අන් අයහට පැමිණිලි නොකිරීම. 3= උසස් තරාතිරම: එය ඉවසා අල්ලාහ්හට ප්‍රශංසා කිරීම.කෙනෙකු අපරාධයට ලක් වී.අපරාධ කළ තැනැත්තාට එරෙහිව ඔහු දුආ කළේ නම්,ඔහු ඔහුගේ විරෙ!ධතාවයෙන් ජයගෙන තම අයිතිය ලබා ගත්තේය.නමුත් ඔහු ඉවසීමෙන් ඈත් වුනේය.

ඉවසීම දෙවර්ගයකි: 1= ශරීරය හා සම්බන්ධ.මෙය පැහැදිළි කරීම අපගේ අරමුණ නොවෙ.
2= සිත හා සම්බන්ධ.එය ස්වභාවික ආශාවන් හා රාග වලට එරෙහිව ක්‍රියා කිරීමය.[1]

මෙළොවෙහි ගැත්තෙකු ලබා ගන්නා සෑම දෙයක්ම වර්ග 2කින් යුක්ත වෙ. 1=තම කැමැත්තට සාපේක්ෂ වීම: මෙහි දී අල්ලාහ්ට එරෙහිව පාපයන් නොකර ඔහුට ස්තුතිය පුද කිරීම හා ඔහුගේ යුතුකම් ඉටුකිරීම සඳහා ඉවසීම අවශ්‍යය වෙ. 2=ඔහුගේ කැමැත්තට එරෙහි වීම: මෙය තෙවර්ගයකි. (1)අල්ලාහ්ගේ නැමදුම් හා ඇදහීම්වල ඉවසිල්ල.මෙහි ෆර්ළු ක්‍රියාවන් කිරීම වාජිබ්වන අතර නෆිල් ක්‍රියාවන් කිරීම මුස්තහබ්වෙ. (2) පාප ක්‍රියාවක් අත්හැරීමෙ ඉවසිල්ල.මෙහි හරාම් වු දෑ අත්හැරීම වාජිබ් වන අතර මක්රූ වු දෑ අත් හැරීම මස්තහබ් වෙ. (3) අල්ලාහ් තආලාගේ කද්රු හෙවත් ඉරණම අනුව සිදුවීම පිණිස ඉවසිල්ල.මෙහි එකිනෙකා හට පැමිණිලි කිරීමෙන් දිව වළක්වා ගැනීම හෙ! අල්ලාහ් තආලාගේ කද්රයට එරෙහිව ක්‍රියා කිරීම,කෝ!ප වීම යනාදීන් තුළින් සිත වැළකීම හෙ! ඔහුගේ තෘප්තියට එරෙහි වු ක්‍රියාවන් වන මළ ගෙයක දී කෑ ගසා හ්'ම,කම්මුලට ගැසීම හා කමිස සාක්කු ඉරීම යනාදීන් ගෙන් වළක්වා ගැනීම වාජිබ් වෙ. තවද අල්ලාහ් අපට සැළසුම් කළ කද්රයෙහි සිත් තෘප්තිය ඇති කිරීම මුස්තහබ් වෙ.

පොහොසත්ව අල්ලාහ් හට ස්තුතිය පුදකරන්නා හා දුගීව ඉවසීමෙන් සිටින්නා යන දෙදෙනාගෙන් උතුම්කවරෙහුද? පොහොසතා අල්ලාහ්ගේ නැමදුම වෙනුවෙන් ධනය වැයකරන්නේ හෙ!එය වෙනුවෙන් ධනය එකතු කරන්නෙකු නම් ඔහු දුප්පතාට වඩා උසස්

---

[1] මෙම ඍණයට අයත් ඉවසීම කුසය හා අපගේ වැසිය යුතු සථාන(ලිංගය හෙ!යෙ!නි)යේ ආශාවන් දුරු කිරීම සඳහා වුයේ නම්,එය පත්තිනි කමෙන් යුක්ත වු ඉවසීම යනුවෙන් කියනු ලැබෙ. එම ඉවසීම යුද්ධයක සිදුවුයේ නම්,එයට වීරය යනුවෙන් කියනු ලැබෙ. කෝ!පය දුරු කිරීම සඳහා නම්,එයට ශාන්තිය යනුවෙන් කියනු ලැබෙ.එක් විෂයක් සැගවීම සඳහා නම්,රහස් සැගවීම යනුවෙන් කියනු ලැබෙ.ජීවිතයට අත්‍යවශ්‍ය දෑ අත් හැරීම නම්,කෙලෙස් දුරු කිරීම යනුවෙන් කියනු ලැබෙ.ජීවිතයේ සුළුඩීව හෙ! ඉවසිල්ලෙන් ක්‍රියා කිරීම නම්, සිත් සැනසීම යනුවෙන් කියනු ලැබෙ.

වන්නේය.එහෙත් ඔහු එය මුබාහ් (දහම අනුමතකළ දෑ) හී වැයකරන්නේ නම්,දුප්පතා උතුම් ය.නබි (සල්)තුමාණෝ!පැවසුවේය, *කෑම අනුභවකර ස්තුතිය පුදකරන්නා, ඉවසීමෙන් උපවාසය රකින්නා හා සමානය.* (අහ්මද්)

◗ **තෘප්තිය (අර්රිළා)** එනම්එක් දෙයක් මත සිත සනසා සෑහීමට පත්වී තෘප්ති විදීමය.එයට අදාල ස්ථානය වනුයේ,ක්‍රියාවක් සිදුවීමෙන් පසුව ය. අල්ලාහු තආලාගේ තීරණයෙහි තෘප්ති විඳීම,ඔහුට සමීපව සිටින්නන්ගේ තරාතිරම්වල උසස්ම තරාතිරමයි.මෙයයි ආදරය හා තවක්කුල් හි ප්‍රතිඵලය වේ.අප පිළිකුල් කරන දෙයක් පැමිණීමේ දී එය තුරන් කිරීම සඳහා අල්ලාහ් හට දුආ ඉල්ලීම මෙයට විරුද්ධ නොවේ.

◗ **සිත් බිය (අල් කුෂූඋ)** එනම් අල්ලාහු තආලාහට ගෞරව කිරීමත් සමග සිත සිනිඳු වී යටහත් වීමය.හුදෙෆා(රළි)තුමා පැවසුහ:මා නුඹලාහට කුහකයෙන් යුත් බියෙන් අවවාද කරමි.කුහකයෙන් යුත් බිය යනු කුමක් දැයි ඔහුගෙන් අසනු ලැබුණි.එය =ශරීරය බියවත්ව හා සිත නොබියවත්ව නුඹ දැකීම=යනුවෙන් පැවසුවේය.තවද ඔහු පැවසුවේය,=නුඹලාගේ දහමෙහි ප්‍රථමයෙන් ඉවත්වනුයේ සිත් බියයි.බියෙන් යුතුව ආරම්භ කරනලද සෑම අමලයක්ම,එහි කුසළ බිය හා සමාන වේ.උදා-සලාතය. නබි (සල්) තුමාණන් සලාතය **ඉටුකරන තැනැත්තෙකු ගැන පවසන අවස්ථාවේදී** =ඔහුගේ සලාතයේ ඔහුට දෙකෙන් පංගුවක් ද හතරෙන් පංගුවක් ද පහෙන් පංගුවක් ද...දහයෙන් පංගුවක් ද හැර කුසල් නොලැබේ.එහෙත් සමහර අවස්ථාවන් වල බිය මුළුමනින්ම නොමැති වීමෙන් කුසළයක් හෝ! නොලැබෙන්නේය.

◗ **අපේක්ෂාව (අර්රජාඋ)** එනම් අල්ලාහු තආලාගේ දයාව විශ්වාස සහිතව බලාපොරොත්තුවීම ය. විපැතුම මෙහි විරුද්ධ පදය වේ.අපෙක්ෂාවෙන් අමල් කිරීම බියෙන් අමල් කිරීමට වඩා උතුම් වේ.මන්ද එය තුළින් අල්ලාහ් මත යහපත් අදහස් මතු වේ.අල්ලාහු තආලා පවසයි *ගැත්තන් මා ගැන කෙසේ සිතන්නේ ද මා එසේම වෙමි.* (මුස්ලිම්) මෙය තත්වයන් දෙකකින් යුක්ත වේ.

**උසස් තත්වය**= අමලය කිරීමෙන් පසු අල්ලාහු තආලාගේ කුසළ හා දයාව අපෙක්ෂා කිරීම.ආඉෂා (රළි) තුමිය විමසීය= යා රසූලුල්ලාහ් (**ඔවුන් කළ දෑ ඔවුන්ගේ සිත් ගැසීම් හා බියෙන් යුක්තව කළෝය**) යනුවෙන් අල්ලාහ් පවසන්නෙහි අදහස,ඔවුන් අල්ලාහ්ගේ බියෙන් යුතුව සොරකම්කිරීම,අනාචාරයේ යෙදීම හා මත්පැන් බීම වනාහීන් ද?එයට ඔහු *,එසේ නොවේ සිද්දීක් (ඉතා සත්‍යයවන්තයා) ගේ දැරියඹ හෙවත් ඔවුන්ගේ තත්වය කෙසේ නම්, අල්ලාහ් ඔවුන්ගෙන් පිළිනොගනී යන බියෙන් ද සලාතය,උපවාසය සදකාවන් යනාදීන් ඉටු කළෙ!ය.* (**යහා විපාකයන් කරා සීඝ්‍ර වන්නන් ඔවුන්මය**) යනුවෙන් පැවසුවේය. (අත්තිරුමිදි)

**පහත් තත්වය**= අල්ලාහු තආලාගෙන් ක්ෂමාව අපේක්ෂා කිරීමත් සමග පාපයන් කරීම.කවරෙකු තවුබාව අත්හැර,පාපයෙහි නිරතවීමත් සමග අල්ලාහු තආලාගේ දයාව අපේක්ෂා කරන්නේ ද,මෙය සිදුනොවන බලාපොරොත්තුවක් මිස අපේක්ෂාවක් නොවන්නේය.ප්‍රථම තත්වයේ සිටින්නන් ප්‍රශංසාවට ලක්වන්නන් වන අතර දෙවෙන්නන් එයට විරුද්ධය.මු:මින්වරයා යහපතක් කර බිය වන්නෙකි.කුහකයා පාපයක් කර ද නොබිය වන්නෙකි.

◗ **බිය (අල් හව් ෆ්)** එනම් පිළිකුල් කරන ලද දෙයක් සිදුවිය හැක යන බියෙන් සිතින් දුක්වීම වේ. සුරක්ෂිත භාවය එහි විරුද්ධ පදය වේ.බිය අපේක්ෂාවට එරෙහිවන දෙයක් නොවන අතර එය සිත් බිය ඇති කර අමලයන් කිරීම සඳහා පොලඹවන්නේය. අපේක්ෂාව ආශාව ඇති කර අමලයන් කෙරෙහි පොලඹවන්නේය.තවද අපේක්ෂාව,බිය හා ආදරය යනාදීන් එක්කොට අමල් කිරීම ඉතා අවශ්‍ය වේ.ඉබ්නු කය්යුම් රහිමහුල්ලාහු තුමා පවසයි=සිත අල්ලාහ් කරා ගමන් කිරීමේදී එය පක්ෂියක් හා සමානය, ආදරය එහි හිස වේ.බිය හා අපේක්ෂාව එහි අත්තටු දෙක වේ. බිය සිතෙහි පතිත වීමෙන් මනෝ! ඉච්චාව අඵයී වී යන අතර මෙළොව ආශාවන් ද දුරස් වී යන්නේය.

● **වාජිබ්වන බිය**= අල්ලාහ් තහනම් කළ දෙයින් වැළකී, අනිවාර්‍යය කළ දෑ ඉටු කිරීම සඳහා ඇති වන බිය.

• **මුස්තහබ්වන බය**=පිළිකුල් කරන ලද දෙයින් වැළකී,මුස්තහබ්වූ දේ කිරීම සඳහා ඇති වන බය.

**අල්ලාහු තආලාගෙන් තොරව ඇතිවන බය කිහිප වර්ගයෙන් යුක්තවෙ.**

**1= මහා ෂිර්කය: ඔහු අපගේ රක්ෂකයා යන බය =** මෙය අල්ලාහ් හට පමණක් තිබිය යුතු බය වන අතර ඔහු හැර වෙනත් කිසිවකුට බය වීම මහා ෂිර්නය වෙ.පිළිම වන්දනයින් තම පිළිමයන් ඔවුන්ට අයහපතක් කරති යනුවෙන් බයවන්නාක් මෙන්.

**2= කුඩා ෂිර්කය: වළක්වනු ලැබූ බය =** වාජිබ් වූ ක්‍රියාවක් හෝ! තහනම් කරනු ලැබූ ක්‍රියාවක් මනුෂ්‍යයින්ගේ බියෙන් නොකිරීම.

**3= අනුමැතිය ඇති බය =** එය ස්වභාවික බයයි. උදා=නරියන්,සිංහයන් වනාහීන් හට ඇති බය.

◗ **කෙලෙස් දුරු කිරීම (අස් සුහුද්)** එනම් යමක ඇතිවන ආශාව,එයට වඩා උතුම් දෙයක් මත හැරවීම වෙ.මෙළොවින් කෙලෙස් දුරු කිරීම,ශරීරයට හා සිතට විවෙකයක් ලබාදෙන අතර එහි ආශාව ඇති වීමෙන් දුක් කරදර මගින් සිත පිරීයන්නේය.මෙළොවෙහි ආශාව සියළුම පාපයන්වලටම මුල් වන්නේය.එහි අප්‍රියත්වය සියළුම නැමදුම්වලට කාරණයක් වන්නේය. කෙලෙස් දුරු කිරීම යනු මෙළොව ආශාවන් සිතෙන් ඉවත් කිරීම වන අතර එම ආශාව සිතෙහි තබාගෙන තම දෑතින් පිට කිරීම නොවෙ.මෙය නුවන නැතිවුන්ගේ ක්‍රියාවය. නබි (සල්)තුමාණෝ පැවසුවෙය.=***යහපත් ගැත්තෙකුගෙන් යුත් ධනය, යහපත් ධනයන්ගෙන් හොඳ වුනි.*** (අහ්මද්)

**එක් දුප්පතෙකු හට ධනයත් සමග අවස්ථාවන් පහක් දක්නට ලැබෙ.**

1= ධනයෙහි ඇති බැරෑරුම් කම හා ඒ තුළින් සිදුවන දුර්විපාකයන්ගෙන් ඈත්වීම සඳහා ද ඒ මතතැත් කෝපය සඳහා ද එහින් පලායාම.මෙඅවස්ථාවුන්ට මුන්ෂ්වරයෙ!, කෙලෙස් දුරු කරන්නෙ!යනුවෙන් කියනු ලැබෙ.

2= එය ලැබීම පිණිස සතුටට පත් නොවන්නේය.තවද හිරිහැරයක් වන අයුරින් එය පිළිකුල් ද නොකරන්නේය. මෙ අවස්ථාවුන්ට තෘප්ති වන්තයින් යනුවෙන් කියනු ලැබෙ.

3=ඒ මතැති ආශාව පිණිස එය ලැබීමෙන් සතුටට පත්වන්නේය.නමුත් එය උත්සහා කර ලබාගැනීමෙආශාව නොතිබෙ,එනම් එය ඉබෙලැබීමෙන් සතුටට පත්වන අතර එය උත්සහා කර ලබාගැනීමට සැළකිල්ලක් නොදක්වන්නාය. **මොහු ලැබීමෙන් සිත් සැනසිල්ල ලබන්නා ය.**

4=නොහැකියාවෙන් එය සෙවීම අත්හරින අතර එයට හැකි වීමෙන් ආශාවීම.එය ලබාගැනීමට මගක් ලැබීම පිණිස එය ලබාගැනීමෙදැඩි ලෙස උත්සහා කිරීම. **මෙඅවස්ථාවුන්ට තණ්හාව යනුවෙන්**

5=බලකිරීම් වෙනුවෙන් එය සෙවීම. උදා:ආහාර හා ඇඳුම්නොමැතිව, කුසගින්නෙන් හා නිර්වස්ත්‍රව සිටන්නා. මොහු බලකිරීමමට ලක් වූ තැනැත්තා ය.

# නිහඬ සංවාදයක්

අබ්දුල්ලාහ් නමැත්තෙක් අබ්දුන් නබි නමැත්තෙකුව මුණ ගැසුනේය. ඔහු තමාව නබිවරයාගේ ගැත්තෙකු යැයි නම් කිරීම ගැන හෙළා දැක්කේය. අල්ලාහ් හැර වෙන කවරෙකු ගැත්තෙක් විය හැකිද?යි අසා ඔහුගෙන් 'නුඹ අල්ලාහ් නොවන යමක් අදහන්නේ දැ?'යි ඇසුවේය.

**අබ්දුන් නබි :-** නැහැ. මා මුස්ලිම් අල්ලාහ් නොවන කිසිවකට මම නැමදුම් නොකරමි.

**අබ්දුල්ලාහ් :-** එසේ නම් ක්‍රිස්තියානින් අබ්දුල් මසීහ් යනුවෙන් නම් තබන්නාක් මෙන් මෙවැනි නමක් තබාගත්තේ මන්ද? ක්‍රිස්තියානින් එසේ නම් තැබීම ගැන පුදුම විය යුතු නැත. මන්ද ඔවුහු ඊසා (අලෙයිහිස් සලාම්)තුමාව අදහති. නුඹේ නම ඇසුන වහා නුඹ නබිවරයාට නමැදුම් ඉටුකරන බව වහාම අදහස් කෙරෙයි. මෙය මුස්ලිම්වරයෙකුගේ ප්‍රතිපත්තිය නොවේ. ඔහුගේ ප්‍රතිපත්තිය නබිවරයා අල්ලාහ්ගේ ගැත්තෙකු හා දූතයෙකු යන්නයි.

**අබ්දුල්නබි:-**මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා මිනිසුන් අතර ශ්‍රේෂ්ඨයෙකි. රසූල්වරුන්ගේ නායකයාය. එතුමා නමින් අභිවෘද්ධිය ලබා ගැනීමටත්" ඔහුගේ නමින් අල්ලාහ්ට සමීප වීමටත් එතුමාගේ අනුකම්පා බස් දෙඩීම ලබා ගැනීටමත් මෙසේ නම් තබන්නෙමු. නුඹ පුදුම නොවෙනු. මගේ සහෝදර අබ්දුල් හුසෛන් ඊට පෙර මගේ පියා අබ්දුර් රසූල් මෙසේ නම් තැබීම ආදියෙන් මිනිසුන් අතර පුරුද්දක් විය. අපේ මුතුන්මිත්තන් ද එසේමය. ප්‍රශ්නය විශාල නොකරහි" ආගම ඉතා පහසු දෙයකි.

**අබ්දුල්ලාහ්:-** මෙය පෙරට වඩා ලොකු වරදකි. අල්ලාහ් නොවන්නන්ගෙන් ඔවුන්ට කළ නොහැකි දේවල් ඇසීම සුදුසු නැත. ඔහු අල්ලාහ්ගේ දූතයෙකු විය හැක. හුසෛන් (රළියල්ලාහු අන්හු) වැනි යහපත් ගැත්තන් විය හැක. නමුත් මෙය අපට අණකර ඇති ඒකීයත්වයටත් කලිමා තව්හීදයටත් සම්පූර්ණයෙන් පටහැනිය.

මෙවැනි නම් තැබීමේ ඵල විපාක ගැන නුඹට පැහැදිලි කිරීමට ප්‍රශ්න කීපයක් නුඹෙන් අසමි. සත්‍යය පැහැදිලි කර යහපත් දෙය විධානය කර අයහපත් දෙයින් වැළැක්වීම හැර මගේ වෙන කිසිදු අරමුණක් නැත. අල්ලාහ්ගෙන්ම උදව් පතමි. ඔහු මතම විශ්වාසය තබමි. වැරදිවලින් මිදීමට හෝ යහපතක් කරන්නට හෝ අල්ලාහ්ගේ මනාපය නොමැතිව නොහැක. පළමුවෙන් කුර්ආනයේ වැකි දෙකක් නුඹට සිහි කරමි. (මු:මින්වරුන් අතර ඔවුනට තීන්දු දීමට අල්ලාහ් වෙතට හා ඔහුගේ දූතයා වෙතට ඇරයුම් කරනු ලැබුවහොත් ඔවුන් කියනුයේ 'අපි සවන් දුනිමු. අවනත වීමු' යන්නයි) තවද (නුඹලා අතර කුමක් හෝ ආරවුලක් ඇතිවුවහොත් නියත වශයෙන්ම නුඹලා අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කරන්නවුන් වන්නෙහු නම් එය අල්ලාහ් වෙත ද ඔහුගේ දූතයා වෙත ද භාර දෙනු)

**අබ්දුල්ලාහ්:-** නුඹ අල්ලාහ්ව ඒකීයත්වයට පත් කරන්නෙකු ලෙස ද නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙන දෙවියෙකු නොමැති බවට සාක්ෂි දරන්නෙකු ලෙස ද පැවසුවෙහිය. මට එහි තේරුම මඳක් පැහැදිලි කළ හැකි ද?

**අබ්දුල්නබි:-** ඒකීයත්වය යනු, අල්ලහ් නිරන්තරයෙන්ම සිටන්නෙකු බව ද, ඔහුම අහස හා පොළොව මවා ඇති බව ද, ලෝකයන්ගේ පණ ගන්නා හා පණ දෙන්නා ඔහුම ය යනුවෙන් විශ්වාස කිරීම.තවද ඔහුම මැවීම් සියල්ලට ආහාර සපයන්නා, එහි සියලු දැනුම ඇත්තා හා ශක්ති වන්තයා ය.

**අබ්දුල්ලාහ්:-** මෙය පමණක් ඒකීයත්වය වෙයි නම් ෆිර්අවුන් හා ඔහුගේ සමූහයා ද අබූජහ්ල් ද ඒක දේව වාදීන් විය යුතුව තිබිණ. ආදේශ කරන බොහෝ දෙනෙකු මෙන් මොවුහු ද නුඹලාගේ අදහස දැන සිටියහ. දේවත්වය ගැන වාද කළ ෆිර්අවුන් ද ලෝකය ක්‍රියා කරවන්නේ අල්ලාහ් යැයි පිළිගත්තේය. අල්ලාහ් මෙසේ පවසයි. (ඔවුන්ගේ සිත් ඒවා සත්‍ය යැයි පිළිගත්ත ද අසාධාරණ ලෙස ද උඩගු වූවන් ලෙස ද ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ.) ඔහු ගිලෙන අවස්ථාවේ ඔහු ළඟ මෙම විශ්වාසය තිබුණු බව පැහැදිලි විය. එහෙත් නබිවරුන් එවනු ලැබුවේ ද ආගම පහළවූයේ ද කුරෙෙෂ්වරුන් සමග යුද්ධ කරනු ලැබුවේ ද ඉබාදත් මගින් අල්ලාහ්ව ඒකීයත්වයට පත් කිරීම සඳහාය. ඉබාදත් යනු අල්ලාහ්ට මනාප අභ්‍යන්තර හා බාහිර සෑම වචනයක් හා ක්‍රියාවක්ම අන්තර්ගත වූ එකකි.ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වැකියේ ඇති 'ඉලාහ්' යන්නෙහි තේරුම නැමදුමට සුදුසු දෙවියා යන්නය.

**අබ්දුල්ලාහ්:-** නූහ් නබිවරයාගේ සිට රසූල්වරුන් මෙම ලෝකයට එවනු ලැබුවේ මන්දැයි නුඹ දන්නෙහිද? අල්ලාහ්ට පමණක් නැමදුම් ඉටුකිරීමටත් ඔහුට ආදේශ කිරීමෙන් ජනතාව වැළැක්වීමටත් එවනු ලැබූහ.

**අබ්දුල්ලාහ් :-** නූහ් නබි (අලෛ) ගේ සමූහයා ආදේශ කිරීමට හේතුව කුමක් ද?

**අබ්දුන් නබි :-** මා නොදනිමි

**අබ්දුල්ලාහ් :-** නූහ් නබිවරයාගේ සමූහයා වද් සුවා" යගුස්" යඌක්" ආදී යහපත් ගැත්තන් විෂයෙහි" සීමාව ඉක්මවා ගිය බැවින් අල්ලාහ් එම සමූහයා වෙත නූහ් (අලෛයිහිස් සලාම්) තුමාව එව්වේය.

**අබ්දුන්නබි :-** වද්" සුවා. ඔහු කාෆිර් වූ පාලකයින්ගේ (නම් නොවේ. යහපත් ගැත්තන්ගේ නම් බව කියන්නෙහිද?

**අබ්දුල්ලාහ් :-** එසේය. යහපත් ගැත්තන්ය. නූහ් (අලෛයිහිස් සලාම්) තුමාගේ සමූහයා ඔවුන්ව දේවත්වයෙන් සැලකූහ. අරාබිවරු ඔවුන්ව පිළිපැද්දෝය. ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා දන්වන හදීසයක මෙය තහවුරු කෙරෙයි. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. *'නූහ් නබිවරයාගේ කාලයේ නැමදුම් කළ පිළිම පසු කාලයේ අරාබීන් සතුව තිබිණ. 'වද්' යනු දව්මතිල් ජන්නතයේ සිටි 'කල්බු' නමැති සමූහයාගේය. සුවා හුසෛල් සමූහයාට ද යගුස් මුරාද් සමූහයාට ද තිබිණ. පසුව එය 'සබා' නමැති ගමේ බනී කතීබ් සමූහයාට මාරු විණ. 'යඌක්' හමතාන්ට ද 'නස්ර්' හිමියර් වරුන්ට ද තිබිණ. මේවා නූහ් නබිගේ සමූහයා අතර ජීවත් වූ යහපත් ගැත්තන්ගේ නම්ය. ඔවුන් මියගිය පසු ඔවුනට පිළිම අඹා ඔවුන්ගේ නමින් සභාවල තබන මෙන් ෂෙයිතාන් ඔවුන්ව පෙළඹ වීය. ඔවුන් එසේ කළහ. එහෙත් ඔවුන් ඒවාට නැමදුම් කළේ නැත. ඔවුන් මිය ගොස් දැනුම ද වෙනස් වූ විට ඒවා නමදිනු ලැබීය.* (බුහාරී)

**අබ්දුන්නබි :-** මෙය පුදුම පුවතක් වන්නේය.

**අබ්දුල්ලාහ් :-** එයටත් වඩා පුදුම පුවතක් කියන්න ද? අවසන් දූත මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ව පාපක්ෂමාව, පැදකුණු කිරීම. සර්, හජ්, හා සදකා නමැති යහක්‍රියා කරමින් සිටි සමූහයකට එවීය. එහෙත් ඔවුන් ඔහුගේ මැවීම්වලින් සමහරක් ව (මලක්වරු හා ඊසා නබි වැනි යහපත් ගැත්තන්ව) ඔහුටත් ඔවුන්ටත් අතර තැරැව් කරුවන් බවට පත්කරගෙන සිටියහ. ඔවුහු අපි මොවුන් මාර්ගයෙන් අල්ලාහ්ට සමීප වෙන්නට උත්සාහ දරමු. ඔවුන් අල්ලාහ්ගෙන් අප වෙනුවෙන් අනුකම්පා බස් දෙඩීම අපි ප්‍රිය කරමු. 'යි කියන්නෝය. අල්ලාහ් මුහම්මද් නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ව (ඔවුන්ගේ පියාවූ) ඉබ්‍රාහිම් (අලෛයිහිස් සලාම්) තුමාගේ දහම අළුත් කරවන්නට එවීය. එතුමාණෝ .මෙය අල්ලාහ්ට පමණක් අයිතිය. ඔහු හැර වෙන කිසිවෙකුට මේ පිළිබඳව තත්ත්වයක් නොමැති. ඔහුම මැව්වේය. ඔහුට ආදේශයක් නොමැත. ආහාර සපයන්නා ඔහු හැර අන් කිසිවෙකු නොමැත. අහස් හත ද ඒවායේ ඇති දෑ ද භූමි හතද ඒවායේ ඇති දෑ ද ඔහුටම අයත් ය. ඒ සියල්ල ඔහුගේ පාලනයේම ඇත. ඔවුන් නැමදුම් කරන ඒ පිළිම පවා ඒවා ගැන දන්නේයැ'යි ඔවුන්ට දැන් වූහ.

**අබ්දුන් නබි :-** මෙය භයානයක පුවතක් වන්නේය. මෙයට යම් සාක්ෂි තිබේ ද?

**අබ්දුල්ලාහ් :-** සාක්ෂි අවශ්‍ය තරම් ඇත. අල්ලාහ් මෙසේ පවසයි. (නුඹලාට අහසෙන්ද පොළොවෙන් ද ආහාර සපයන්නා කවරෙක් ද? (නුඹලාගේ) ඇස් හා කන්වලට ශක්තිය සපයන්නා කවරෙක් ද? මලානික දැයින් ප්‍රාණවත් දෑ ද ප්‍රාණවත් දැයින් මාලානික දෑද මතු කරන්නා කවරෙක් ද? ක්‍රියාවන් සැලසුම් කරන්නා කවරෙක් දැ?"යි (නබිවරය) නුඹ අසනු" වහාම ඔවුහු අල්ලාහ් යැයි පිළිතුරු දෙති. එසේ නම් නුඹලා බියභක්තියෙන් කටයුතු නොකළ යුතුද?) තවද (නුඹලා දන්නෙහුනම් මෙම පොළොවත් එහි සිටින අයත් අයිතිවන්නේ කාහටදැ?' යි නුඹ අසනු. අල්ලාහ්ටමයැයි ඔවුහු පිළිතුරු දෙති. එසේ නම් නුඹලා හොඳ අවබෝධයක් ඇතිකර නොගන්නෙහු දැ?'යි අසනු. අහස් හතේ දෙවියාද දැවැන්ත අර්ෂිහි දෙවියා ද කවරෙක් දැ?'යි නුඹ අසනු. අල්ලාහ්මයැයි ඔවුහු පිළිතුරු දෙති. එසේ නම් නුඹලා

ඔහුට බියෙන් කටයුතු නොකරන්නෙහුද?'යි අසනු. සියලු දෑහි පාලනය කවරෙකු අතේ ද? ඔහු සියල්ල පාලනය කරයි" එහෙත් ඔහු මත පාලනය කිරීමට කිසිවෙකු නොවන්නේ ය" ඔහු කවුද?' නුඹලා දන්නෙහු නම් (පවසනු)' යි අසනු. එවිට ඔවුහු මෙය අල්ලාහ්ටම අයත්ය යැයි පවසන්නෝය.) එකල මුෂ්රික්වරු 'හජ්' හි ඔවුන්ගේ තල්බියාවේදී 'ලබ්බෙක් ලා ෂරීකලක යැයි කී පසු ඉල්ලා ෂරීකන් හුව ලක තම්ලිකුහු වමා මලක" (නුඹට ආදේශ නැත. නුඹට අයිති කොටස්කරුවා හැර) යන්න ද එක් කර ගනිති. ලෝකයේ බලය පවත්වන්නා අල්ලාහ් බව ඔවුන් පිළිගත්ත ද එය ඔවුන්ව ඉස්ලාමයට එක් කළේ නැත. මලක්වරුන්, යහපත් ගැත්තන් හා නබිවරුන් මාර්ගයෙන් අල්ලාහ්ට සමීප වීමට ඔවුන් කැමතිවීම නිසා ඔවුන්ගේ ප්‍රාණයද වස්තුව ද අගයක් නොවීමට හේතුවිය. එහෙයින් සියලුම පැතුම් අල්ලාහ් වෙතට ම යොමු කළ යුතුය. භාර වීම්, කපා බිලිදීම් හා උදව් පැතීම් ආදි හැම එකක්ම අල්ලාහ්ට පමණක් ඉටුකළ යුතු නැමදුම්ය.

**අබ්දුන් නබි :-** ඔබ අදහස් කරන අන්දමට ඒකීයත්වය යනු අල්ලාහ් සිටීමත් ඔහු ලොව බලය යෙදවීමත් පිළිගැනීම පමණක් නොවේ නම් තව්හීද් යනු කුමක් ද?

**අබ්දුල්ලාහ් :-** රසූල්වරුන්ට ලැබූ, මුෂ්රික් වරුන් පිළිනොගත් තව්හීදය නමැදුම්වලින් අල්ලාහ්ව ඒකීයත්වයට පත් කිරීමයි. ප්‍රාර්ථනය, භාරවීම කපා බිලිදීම උදව් පැතීම හා ආරක්ෂාව අයැදීම ආදි වත්පිළිවෙත්වලින් කිසිවක් අල්ලාහ් නොවන අයට ඉටුකළ නොයුතුය. 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' හි අරුතය එයයි. කුරෙයිෂ් මුෂ්රික්වරුන් අතරේ තිබුණු 'ඉලාහ්' යන්න මෙවැනි නැමදුම්වලට මනාප වන්නෙකු යන අරුත තිබිණ. එය මලක්" නබි" ගසක් හෝ ජින්විය හැක. නමුත් ඉලාහ් යනු මැවිය හැක්කා" පාලනය කරන්නා යන අරුත ඔවුන් ලග නොතිබුණ. ඒවා කරන්නේ අල්ලාහ් පමණක් බව ඔවුහු කලින්ම දැන සිටියහ. නබිතුමාණෝ" ඔවුන්ව ප්‍රකාශ කිරීමට පමණක් සීමා නොකට ඒකීයත්වය ක්‍රියාත්මක කරන ලෙස කැඳවූහ.

**අබ්දුන්නබි:-** කුරෛෂ් මුෂ්රික්වරු අද ජීවත්වන මුස්ලිම්වරුන් අධික සංඛයාවකට වඩා 'ලා ඉලාහ ඉල්ලලාහ්' යන කලිමාවේ අරුත දැන සිටියෙහු'යි කියන්නෙහිද?

**අබ්දුල්ලාහ්:-** ඔව්" සිතට වේදනාවක් ගෙන දෙන සත්‍යය එයයි. එම මෝඩ කාෆිර්වරුන් රසූල්වරයා මෙම කලිමාව තුළින් නැමදුම් කටයුතුවලදී අල්ලාහ්ව ඒකීයත්වයට පත් කිරීමත් අල්ලාහ් හැර අනෙක් නැමදුම් ඉටුකරන සියල්ලෙන් ඉවත් වී සිටීමත් ප්‍රිය කරන්නේ යැයි දැන සිටියහ. මන්ද රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා නුඹලා ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් කිවහු'යි කී විට (සියලුම දෙවියන් එකෙක් බවට පත් කළේ ද? එය ආශ්චර්ය ජනක සිද්ධියකි යැයි ඔවුහු පැවසූහ) එදා නූගත් යුගයේ ජීවත්වූ කාෆිර්වරුන්ට මෙය වටහා ගැනීමට හැකි වුවද ඉස්ලාමය ගැන වාදකරන අද ජනතාව මෙය වටහා නොගැනීම ආශ්චර්යයකි. එතෙන් කලිමාවේ අර්ථය අවබෝධ නොකර ගෙන කටින් පමණක් ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් යැයි සිතාගෙන සිටිති. ඔවුනතර විචක්ෂණ බුද්ධිය ඇති අය 'අල්ලාහ් හැර මවන්නනෙකු ආහාර සපයන්නෙකු හා ක්‍රියාවන් සැලසුම් කරන්නෙකු නොමැතැ'යි සිතති. එහෙත් කුරෙයිෂ් කාෆිර්වරු මොවුන්ට වඩා කලිමාවේ තේරුම දැන සිටියහ.

**අබ්දුන් නබි:-** මා අල්ලාහ්ට ආදේශ කළේ නැත. මැවීම, ආහාර සැපයීම, යහපත කිරීම හා අයහපත කිරීම සම්බන්ධව අල්ලාහ් හැර අන් කිසිවෙක් නොමැත. ඔහුට ආදේශයක් නැත. අලි, හුසෙයින් (රළියල්ලාහු අන්හු) තුමා හා අබ්දුල් කාදර් ජෙයිලානි (රහ්මතුල්ලාහි අලෛයිහි)තුමා පමණක් නොව රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාට පවා තමන්ට යම් යහපතක් හෝ අයහපතක් කිරීමට නොහැකැයි විශ්වාස කරමි. එහෙත් මා පව්කාරයෙකි. යහපත් ගැත්තන්ට අල්ලාහ් ලග විශේෂත්වයක් ඇත. ඒ මගින් එතුමන්ලා මා වෙනුවෙන් අනුකම්පා බස් දොඩන මෙන් ඉල්ලමි.

**අබ්දුල්ලාහ්:-** කලින්ම මෙයට පිළිතුරු දුන්නෙමි. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ කවරෙකු සමග සටන් කළෝ ද ඔවුහු ද මෙය පිළිගෙන සිටියහ. ඔවුන්ගේ පිළිම වලට මෙලොව කිසිවක් කළ නොහැකි බව දැන සිටියහ. ඔවුහු ද ඒවායේ මැදිහත්වීම බලා පොරොත්තු වූහ. මේවාට අල්-කුර්ආනයෙන් පිළිතුරු දුනිමි.

**අබ්දුන් නබි:-** එහෙත් මේ වැනි පිළිම වන්දනා කරුවන්ට පහළ වූ ඒවාය. නබිවරුන් හා යහපත් ගැත්තන් පිළිමවලට කෙසේ සම කළ හැකි ද?

**අබ්දුල්ලාහ්:-** නූහ් නබි (අලෛයිහිස් සලාම්) තුමාගේ කාලයේ තිබුණාක් මෙන් මෙම පිළිමවලින් සමහරක් යහපත් ගැත්තන්ගේ නම් තැබූ ඒවා බව ඔබ දන්නෙහිය. එම කාෆිර්වරුන් අල්ලාහ් ඉදිරියේ ඒවාට විශේෂත්වයක් ඇතැයි සිතා ඔවුන්ගේ මැදිහත්වීම බලාපොරොත්තු වූහ. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: (ඔහු හැර ආරක්ෂකයින්ව ගෙන සිටින අය, ඔවුන් අපව අල්ලාහ් හට සමීපය කරතියි, යනුවෙන් තොරව අප ඔවුනට නැමදුම් ඉටු කළේ නැතැ) යි( ප්‍රකාශ කරති")

නබිවරුන්වද යහපත් ගැත්තන් ව ද පිළිම බවට පත් කරන්නේ කෙසේදැ?' යි ඇසුවෙහිය. නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමෝ එවනු ලැබූ එම කාෆිර්වරුන්ගෙන් සමහරෙක් යහපත් ගැත්තන් වෙත ප්‍රාර්ථනා කරමින් සිටියහ.

((අල්ලාහ් හැර) මොවුහු කාහට ප්‍රාර්ථනා කරන්නහු ද ඔවුහු තම රක්ෂකයා ලඟ ඔවුනතරින් කවරෙකු ඉතා සමීප දැයි සමීපතාව සොයති. ඔහුගේ දයාව කෙරෙහි ද ඇලුම් කරති. ඔහුගේ දඬුවමට ද බිය වෙති. නියත වශයෙන්ම නුඹේ රක්ෂකයාගේ දඬුවම අවවාද කරන ලද්දකි.) සමහරු ඊසා (අලෛයිහිස් සලාම්) ඔහු ඉදිරියේ ද ඔහුගේ මව ඉදිරියේ ද ප්‍රාර්ථනා කරමින් සිටියහ. ('මර්යම්ගේ පුත් ඊසා" ඔබ මිනිසුනට අල්ලාහ්ව අතහැර මා හා මගේ මව දෙවිවරුන් දෙදෙනෙකු වශයෙන් ගන්නා ලෙස නුඹ පැවසුවෙහි ද යනුවෙන් අල්ලාහ් ඊසාට ප්‍රකාශ කළ අවස්ථාව සිහිපත් කරන) සමහරු මලක්වරුන්ට ප්‍රාර්ථනා කරමින් සිටියහ. (ඔවුන් හැමෝම එක්රැස් කර පසුව 'මලක්වරුන්ගෙන් නුඹලාව නමදිමින් සිටියේ මොවුන් දැ' යි අසයි) මෙම වැනි ගැන අවධානය යොමු කරනු. පිළිම හා යහපත් ගැත්තන්ට ප්‍රියකළ හැමෝම කාෆිර් වරුන් ලෙසම අල්ලාහ් ගණන් ගනී. නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ ඔවුහු හැම දෙනෙකු සමගම සටන් කළහ.

**අබ්දුන්නබි:-** කාෆිර්වරු ඒවායින් යහපතක් සිදුවීම බලාපොරොත්තුවන්නේය" නමුත් මම ස්ථිරව අල්ලාහ් පමණක් විශ්වාස කරමි. ඒවා ගැන අල්ලාහ් වෙතම බලාපොරොත්තු තබමි. යහපත් ගැත්තන්ට ඒ කිසිවක්
කළ නොහැක. එහෙත් අනුකම්පා බස් දෙඩිය යුතු බව පමණක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වෙමි.

**අබ්දුල්ලාහ්:-** කාෆිර්වරුන් කී ඒ කාරණයම ඔබද කියන්නෙහිය. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි:- (තමන් කිසිදු යහපතක් හෝ අයහපතක් කර ගත නොහැකි අල්ලාහ් නොවන දෑ නමදිති. ඔවුහු 'මේවා අප මෙන් අල්ලාහ් ඉදිරියේ අනුකම්පා බස් දොඩන ඒවායැ'යි ද පවසති)

**අබ්දුන්නබි:-** මා අල්ලාහ් හැර කිසිවෙකුට නැමදුම් කළේ නැත. ඔවුන්ගෙන් ප්‍රාර්ථනා කිරීම හෝ ළංවීම නැමදීමක් නොවන්නේය.

**අබ්දුල්ලාහ්:-** මම නුඹෙන් අල්ලාහ්" ඔහුට පමණක් සුවිශුද්ධ කරන මෙන් නුඹට අනිවාර්ය කළේ නැද්දැ?'යි අසමි. අල්ලාහ් මෙසේ පවසයි. (අල්ලාහ්ට නැමදුම සුවිශුද්ධ කළවුන් ලෙස ඍජුමග ඉදිමින් අල්ලාහ් නමදින ලෙසම ඔවුහු අණ කරනු ලැබුහ)

**අබ්දුන්නබි:-** ඔව් මට අනිවාර්ය කළේය.

**අබ්දුල්ලාහ්:-** එසේනම් අල්ලාහ් නුඹ කෙරෙහි අල්ලාහ් අනිවාර්ය කළ ඒ වගකීම ගැන මට තේරුම් කළ හැකිද?

**අබ්දුන් නබි:-** මෙම ප්‍රශ්නය තුළින් ඔබ කුමක් බලාපොරොත්තු වන්නෙහි දැ?යි මට තේරුම් ගත නොහැක. මදක් තේරුම් කළ හැකිද?

**අබ්දුල්ලාහ්:-** මගේ පැහැදිලි කිරීමට සවන් දෙනු. අල්ලාහ් මෙසේ පවසයි. (නුඹලාගේ දෙවියන් වෙත නිහතමානීවද පෞද්ගලිකව ද ප්‍රාර්ථනා කරනු. නියත වශයෙන්ම ඔහු සීමාව ඉක්මවන්නන්ව ප්‍රිය නොකරයි) ප්‍රාර්ථනය යනු අල්ලාහ්ට ඉටු කරන නැමදුමක් නොවේ ද?

**අබ්දුන්නබි:-** ඔව්" එය නැමදුමේ අත්තිවාරමය. 'ප්‍රාර්ථනාව යනු ඉබාදත්' යැයි හදීසයේ ඇත. (අබූ දාවූද්)

**අබ්දුල්ලා:-** එය ඉබාදතයක් බව නුඹ දැනගෙන පිළිගත් පසු නුඹේ අවශ්‍යතාවයකට දිවා රාත්‍රී ඔහු කෙරෙහි ඔහුගේ දයාව බලාපොරොත්තු වෙමින් ඔහුගේ දඬුවමට බිය වුවෙකු ලෙස ඔහු වෙත ප්‍රාර්ථනා කර පසු එම කාරණය සඳහාම නබිවරයෙකු වෙත හෝ මලක්වරයෙකු හෝ සොහොනක භූමිදානය වී සිටින යහපත් ගැත්තෙකු වෙත ප්‍රාර්ථනා කළේ නම් නුඹ නැමදුමේ ආදේශයක් නොකළේද?

**අබ්දුන්නබි:-** ඔව් ආදේශ කළ අයෙකු වෙමි. එය පැහැදිලිය.

**අබ්දුල්ලාහ්:-** තවත් උදාහරණයක් දෙස බලමු:- (**නුඹේ දෙවියා වෙනුවෙන් සලාතය කර සතා කපා බිලිදෙනු**) යැයි අල්ලාහ් ප්‍රකාශ කරයි. මෙයට අවනත වී නුඹ සතා කැපුවොත් එය නැමදුමක් නොවන්නේද?

**අබ්දුන්නබි:-** ඔව් එය නැමදුමකි.

**අබ්දුල්ලාහ්:-** එසේ නොමැතිව නබිවරයෙකුට හෝ ජින් කෙනෙකුට කපා බිලිදීම එය නමැදුමේ ආදේශයක් නොවන්නේ ද?

මම නුඹට ප්‍රාර්ථනය හා කපා බිලිදීම පිළිබඳව උදාහරණයක් වශයෙන් කීවෙමි. මන්ද ප්‍රාර්ථනය යනු වචනයෙන් ඉටු කරන ඉබාදත්වලින් ඉතා වැදගත් එකක් වන්නේය. කපා බිලිදීම ශාරීරිකව ඉටු කරන නැමදුම් වලින් ප්‍රධාන තැනක් ගනී. නැමදුම් යනු ඒ දෙක පමණක් නොවේ. භාරවීම, දිවුරීම, උදව් පැතීම හා ආරක්ෂාව පැතීම ආදිය ද එයට අයත් වන්නේය. ඔවුන් පිළිබඳ කුර්ආන් වැකි පහළ වූ ඒ මුෂ්රික්වරු මලක්වරුන්ව, යහපත් ගැත්තන්ව, ලාත් හා වෙනත් දේවල් ද නැමදුම් කරමින් සිටියහ.

**අබ්දුන්නබි:-** ඔව් එසේම කරමින් සිටියහ.

**අබ්දුල්ලාහ්:-** ප්‍රාර්ථනා කිරීම කපා බිලිදීම උදව් පැතීම ආරක්ෂාව පැතීම ආදිය හැර ඔවුන්ගේ නැමදුම පවතුණේ ද? ඔවුහු ද තමන් අල්ලාහ්ගේ ගැත්තන්, ඔහුගේ පාලනය යටතේ සිටින්නෙමු යැයි සිතූහ. තවද ඔහුට කරුණු සැලසුම් කරන්නේය'යි විශ්වාස කළහ. එහෙත් ඒවාට අල්ලාහ් ඉදිරියේ ඇතැයි අදහස් කරන තත්ත්වයන් සඳහා ඔවුහු ඒවාට ප්‍රාර්ථනා කළහ. මේවා ඉතා සාමාන්‍ය දේවල්ය.

**අබ්දුන්නබි:-** අබ්දුල්ලාහ, ඔබ රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ අනුකම්පා බස් දෙඩීම එනම් මැදිහත්වීම ප්‍රතික්ෂේප කරන්නෙහි ද?

**අබ්දුල්ලාහ්:-** නැහැ මා ප්‍රතික්ෂේප කළේ නැත. මගේ පියා ද මව ද එතුමා වෙනුවෙන් කැප කරමි. එතුමාණෝ මැදිහත් වී කතා කරන්නේය" එතුමෝ අනුකම්පා බස් දෙඩීම අනුමත විය යුත්තකි. එතුමන්ගේ අනුකම්පා බස් දෙඩීම්හි (මැදිහත්වීමේ) අයිතිකරු අල්ලාහ්ය. (**සියලුම අනුකම්පා බස්වල අයිතිය අල්ලාහ්ට ඇතැ'යි ඔබ කියනු**) ඔහු අනුමත කළ පසුවම කවුරුත් අනුකම්පා බස් දෙඩිය හැක. (**ඔහුගේ අනුමැතිය නොමැතිව ඔහු වෙත අනුකම්පා බස් දොඩන්නේ කවරෙක් ද?**) අල්ලාහ්ගේ අනුමැතිය ලද අයට හැර අනුකම්පා බස් දෙඩිය නොහැක. (**ඔහු මනාප වූ අයට හැර ඔවුහු අනුකම්පා බස් නො දොඩති**) ඔහු ඒකීයත්වය හැර පිළිගන්නේ නැත. (**කවරෙකු හෝ ඉස්ලාම් නොවන ආගමක් වශයෙන් සොයයි නම් ඔහුගෙන් එය අනුමත නොවෙයි**) යනාදී අල්කුර්ආන් වැකි මගින් අනුකම්පා බස් දෙඩීම් සියල්ල අල්ලාහ් සතු බවත් ඔහුගේ අනුමැතිය රහිතව අනුකම්පා බස් දෙඩිය නොහැකි බවත් නබිවරයා හෝ අනෙක් අය හෝ අල්ලාහ්ගේ අනුමැතිය ලද අයට පමණක් එසේ කළ හැකි වුවද අනුකම්පා බස් දෙඩීමෙහි සම්පූර්ණ අයිතිය අල්ලාහ්ට අයත් බවත් පැහැදිලි වන්නේය. මම ද එතුමන්ගේ අනුකම්පා බස් දෙඩීම බලාපොරොත්තු වෙමි. යා අල්ලාහ් එතුමන්ගේ අනුකම්පා බස මට නොවරද්දනු මැන. මා වෙනුවෙන් එතුමන් අනුකම්පා බස් දෙඩීම අනුමත කරනු මැන.

**අබ්දුන්නබි:-** කාගෙන් වුවද ඔහු ලග නොමැති දෙයක් නොඉල්ලිය යුතු යැයි අපි එකගතාවකට පත්වීමු. අල්ලාහ් නබිවරයාට අනුකම්පා බසට අවසර දී ඇත්තේය. එනිසා එතුමාගෙන් අප ඉල්ලීම ආදේශයක් නොවන්නේය.

**අබ්දුල්ලාහ්:-** අල්ලාහ් අනුකම්පා බස තහනම් නොකළේ නම් ඔබේ වාදය නිවැරදිය. අල්ලාහ් මෙසේ පවසයි. (**අල්ලාහ් සමග කිසිවෙකු නොකැඳවනු**) අනුකම්පා බස පැතීම නැමදුමකි

නබිවරයාට අනුකම්පා බස දුන්නේ අල්ලාහ්ය. ඔහු නොවන කිසිවෙකුගෙන් එය නොඅසනු.' 'එය තහනම් කළේද අල්ලාහ්මය. අල්ලාහ් නබිවරයකු නොවන අයට ද අනුකම්පා බස් දොඩති. අල්ලාහ් ඔවුනට අවසර දී ඇත්තේය. එහෙයින් මම ඔවුන්ගෙන් අසන්නෙමි 'යි කියන්නෙහිද? නුඹ එසේ ඇසුවහොත් අල්ලාහ් තහනම් කළ යහපත් ගැත්තන්ට නැමදුම් ඉටු කරන්නෙකු වන්නෙහිය. එසේ නොවුවා නම් අල්ලාහ් ඔවුනට දුන් නිසා මම ඉල්ලමි යන නුඹේ වාදය වැරදි වන්නේය.

**අබ්දුන්නබි:-** මා අල්ලාහ්ට කිසිවක් ආදේශ කළේ නැත. යහපත් ගැත්තන්ට එක්වීම ෂිර්ක් නොවන්නේය.

**අබ්දුල්ලාහ්:-** අල්ලාහ් ආදේශ කිරීම කාමයේ වරදවා හැසිරීමට වඩා ඉතා තදින් තහනම් කළේය. එය අල්ලාහ් ක්ෂමා නොකරන බව නුඹ පිළිගන්නෙහිද?

**අබ්දුන්නබි:-** ඔව් එය පිළිගනිමි. එය අල්ලාහ්ගේ ශුද්ධ වාක්‍යවල පැහැදිලිවම ඇත.

**අබ්දුල්ලාහ්:-** අල්ලාහ් තහනම් කළ ආදේශය නුඹ ලග නොමැති බව කීවෙහිය. එම ආදේශය කුමක්දැ?යි මට පැහැදිලි කළ හැකිද?

**අබ්දුන්නබි:-** ආදේශ යනු පිළිම වන්දනාවයි. ඒ කරා ළංවීමය. එවායින් ඇසීම ඒවාට බියවීම යනාදියයි.

**අබ්දුල්ලාහ් :-** පිළිම වන්දනාව යන්නෙහි අර්ථය කුමක් ද? කුරෙයිෂි කාෆිර්වරු" ගස් හා ගල් ඒවා මවන්නේය. ඒවා ආහාර සපයන්නේය. ප්‍රාර්ථනා කරන්නන්ගේ කටයුතු පෙළ ගස් වන්නේයැ'යි විශ්වාස කළෝද? ඔවුන් එසේ විශ්වාස කළේ නැතිබව ඔබ කළින්ම පිළිගත්තෙහිය.

**අබ්දුන්නබි:-** මා එසේ අදහස් කළේ නැත. කවරෙකු හෝ ගසක් ලග හෝ ගලක් ලග හෝ සොහොන්වල මතුපිට ඇති ගොඩනැගිල්ල වෙත හෝ ප්‍රාර්ථනය කළහොත් ඒවා වෙනුවෙන් කැපුවහොත් ඒවා අල්ලාහ් වෙත ළංකරවන්නේය. එම අභිවෘද්ධියෙන් (ආනිශංසවලින්) අල්ලාහ් විපත්වලින් ආරක්‍ෂා කරයි යැයි අදහස් කළහොත් එයම පිළිම වන්දනාවක් වන්නේය.

**අබ්දුල්ලාහ්:-** ඔබ සත්‍යය කීවෙහිය. එහෙත් එයම ඔබ ගල් ලග ද සොහොන් මත ගොඩනැගිලි ලග ද කරන ක්‍රියාවන් ආදේශ කිරීම පිළිම වන්දනාව යැයි කීවෙහිය. ආදේශ කිරීමක් නොවන බව ද කීයන්නෙහි ද?

**අබ්දුන්නබි:-** ඔව් මගේ අදහස එයයි.

**අබ්දුල්ලාහ්:-** එසේ නම් නබිවරුන්, මලක්වරන් හා යහපත් ගැත්තන්ව විශ්වාස කිරීම තහනම් කරන" එසේ කරන අය කාෆිර් වරුන් යැයි කියන කුර්ආන් වැකි කොහිද? නුඹට ඒවා කළින් ම මම කියවා පෙන්නුවා නොවේද?

**අබ්දුන්නබි:-** මලක්වරුන් ලග ද නබිවරුන් ලගද ප්‍රාර්ථනා කරන්නවුන් එයින් කාෆිර් වුයේ නැත. ඔවුහු මලක්වරුන් අල්ලාහ්ගේ ගැහැණු දරුවන්ය. ඊසා (අලෛයිහිස් සලාම්) අල්ලාහ්ගේ පුතා යැයි කී නිසාම කාෆිර් වුහ. අප අබ්දුල් කාදිර් අල්ලාහ්ගේ පුතා කියා හෝ සෙයිනබ් අල්ලාහ්ගේ ගැහැණු දැරිය කියා හෝ කිවේ නැත.

**අබ්දුල්ලාහ්:-** අල්ලාහ්ට දරුවන් ඇති කිරීම තනිකරම 'ෂිර්ක්' ක්‍රියාවකි. අල්ලාහ් මෙසේ පවසයි. ('නබි වරයාණනි" නුඹ කියහි: අල්ලාහ් ඔහු එක් අයෙකි. ඔහු අවශ්‍යතා නැත්තෙකි. ඔහු (කිසිවකු) ප්‍රසූත කළේ නැත. ඔහු කිසිවෙකුගෙන් ප්‍රසූත වුයේ ද නැත') (අහද් යන අසම සම යන්නයි. සමද් යනු අවශ්‍යතාවන්ගෙන් තොරවු සෙස්සන් අවශ්‍යතාව සොයන කෙනෙක් යන්නය) මෙය කවරෙකු හෝ ප්‍රතික්ෂේප කළහොත් කාෆිර්(දේව ප්‍රතික්ෂේපකයෙකු) වන්නේය. අල්ලාහ් මෙසේ පවසයි. (අල්ලාහ් තමන්ට දරුවෙක් ඇති කර ගත්තේ නැත. ඔහු සමග (වෙනත්) දෙවියෙකු ද නැත. එසේ සිටියේ නම් සෑම දෙවියෙක්ම තමන් මැවු දෑ තමා සමග ගෙන ගොස් සමහරෙක් සමහරෙකුව අභිබවා යන්නෝය.) මෙම ආයතයේ කුෆ්ර් වර්ගයන් දෙක වෙන් කොට කියා ඇත. මෙයට තවත් සාධකයක් තමා (ලාත්) නැමැති පිළිමය නැමදුම් කරමින් සිටය වුන් ,එය පුරුෂයෙකු වුව ද එහෙත් එය අල්ලාහ්ගේ පිරිමි දරුවා යැයි

නොපැවසුවේය. එසේම පින්වරුන්ට නැමදුම් කළ වුන් ද එසේ නොකළහ.එහෙයින් මද්හබ් හතරෙහි ඉමාම්වරු මුර්තද් වීම සම්බන්ධයෙන් කථා කරන පාඩමේදී මුස්ලිම්වරයෙක් අල්ලාහ්ට පුතෙක් ඇතැයි කීවොත් ඔහු කාෆිර්(දේව ප්‍රතික්ෂේපකයකු) වන්නේය" අල්ලාහ්ට ආදේශ කළ තැනැත්තාද කාෆිර් වන්නේ යැයි ද වෙන් වශයෙන්ම ප්‍රකාශ කරන්නෝය.

**අබ්දුන්නබි:-** එහෙත් අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. (**දැනගනු (නියත වශයෙන්ම අල්ලාහ්ගේ සෙනෙහෙවන්තයින්ට බියක් නැත. ඔවුහු ශෝකයටද පත් නොවන්නෝය. ඔවුහු විශ්වාස කර දේව බිය ඇත්තන්ව සිටියහ.**)

**අබ්දුල්ලාහ්:-** අපි එය පිළිගනිමු. එය සත්‍ය යැයි කියමු. එහෙත් ඔවුහු නමදිනු නොලබන්නෝය. එම දේව සෙනෙහෙවන්තයින්වූ මුත්තකින් ව අල්ලාහ් සමග එක්කිරීමත්" ඔවුන්ව අල්ලාහ් සමග එක්කර නැමදුම් ඉටු කිරීමත් අපි හෙළා දකින්නෙමු. ඔවුනට ආදරය කිරීම, ඔවුන්ව පිළිපැදීම ඔවුනට (ෂරීආවට සුදුසු පරිදි) ප්‍රාතිහාර්යයන් සිදුවේවි යැයි විශ්වාස කිරීම නුඹේ යුතුකමකි. 'බිද්අත්' කරුවෝ ඔවුන්ගේ ප්‍රාතිහාර්යයන් සම්පුර්ණයෙන් ප්‍රතික්ෂේප කරන්නෝය. අල්ලාහ්ගේ ආගම මධ්‍ය ස්වභාවයෙන් යුතු එකකි. මංමුළාවන් දෙක අතර ඍජු මගක් ඇත්තකි. බාතිල් දෙක අතර සත්‍යයකි.

**අබ්දුන්නබි:-** (අල්-කුර්ආනය සඳහන් කරන) එම කාෆිර්වරු කලිමාව නොපිළිගත් අයයි. අල්ලාහ්ගේ දූතයාණන්ව බොරු කරන්නන්ය. අවසන් දිනය (පරලොව) ප්‍රතික්ෂේප කරන්නන්ය. අල්-කුර්ආනය ප්‍රතිකෙෂ්ප කළ අතර එය හූනියමක් යැයි කීහ. අපි කලිමාව පිළිගත්තෙමු. අල්-කුර්ආනය සත්‍යක් යැයි කියමු. පරලොව පිළිගනිමු. සලාතය ඉටු කරමු. උපවාසය රකින්නෙමු. එසේ තිබිය දී අපවත් ඔවුන් වගේ යැයි ඔබ කෙසේ කියන්නේහිද?

**අබ්දුල්ලාහ්:-** මිනිසෙක් එක් කරුණක දී නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ව සැබෑ කර තවත් කරුණක දී බොරු කළහොත් ඔහු ඉස්ලාමයට ඇතුල් නොවන්නේ යැයි මත භේදයෙන් තොරව ආගමික වියතුන් පිළිගෙන ඇත. අල්-කුර්ආනයේ කොටසක් පිළිගෙන සලාතය ප්‍රතික්ෂේප කිරීමද, ඒකීයත්වය හා සලාතය පිළිගෙන සකාතය ප්‍රතික්ෂේප කිරීමද ඒකියත්වය සලාතය හා සකාතය පිළිගෙන උපවාසය ප්‍රතික්ෂේප කිරීමද ඒ සියල්ල පිළිගෙන 'හජ්' ප්‍රතක්ෂේප කිරීම ද ඔහු කාෆිර් වීමට ප්‍රමාණවත් වන්නේය. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ කාලයේ හජ් කරන්නට සමහරෙක් ප්‍රතික්ෂේප කළ විට ඔවුන් පිළිබඳව අල්ලාහ් (**එයට නියමිත මාර්ගයේ ගමන් කරන්න ශක්තිය ඇති මිනිසුනට අල්ලාහ් වෙනුවෙන් එම නිවසට ගොස් හජ් කර්තව්‍යය ඉටු කිරීම අනිවාර්යය. එහෙත් කවරෙකු හෝ මෙය ප්‍රතික්ෂේප කළහොත් නියත වශයෙන්ම අල්ලාහ් ලෝකයාගේ අවශ්‍යතාවක් නොමැත්තෙකුව සිටී**) යන වැකිය පහළ කළේය. විනිශ්චය දිනය සඳහා නැගිටුවීම යමෙක් ප්‍රතික්ෂේප කළහොත් ඔහු කාෆිර් වන බව වියතුන්ගේ ඒකමතික තීරණයයි. මේ නිසාම ඉස්ලාමයේ කොටසක් පිළිගෙන තවත් කොටසක් පිළි නොගැනීමෙන් යමෙකු කාෆිර් වන්නේ යැයි අල්-කුර්ආනය තදින්ම ප්‍රකාශ කරයි. ඉස්ලාමයේ කොටසක් පිළිගෙන තවත් කොටසක් ප්‍රතික්ෂේප කරන්නා කාෆිර් යැයි ඔබ පිළි ගන්නෙහි ද?

**අබ්දුන්නබි:-** ඔව් පිළිගනිමු. එය කුර්ආනයේ පැහැදිලිව ඇත.

**අබ්දුල්ලාහ්:-** එක් කරුණකදී නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්)තුමාණන් කියන දේ පිළිගෙන සලාතය අනිවාර්ය බව ප්‍රතික්ෂේප කළහොත් එසේත් නොමැතිනම් සියල්ල පිළිගෙන විනිශ්චය දිනයේ නැගිට්ටුවීම පමණක් ප්‍රතික්ෂේප කළහොත් ඔහු කාෆිර් වන බව සියලු මද්හබ්වල ඒකමතික තීරණයයි. කුර්ආනයද එසේම පවසයි. මෙය ඔබ නියත වශයෙන්ම පිළිගනිනු. නබිවරයාණන් ගෙන ආ වගකීම්වලින් සලාතය, සකාත්, හජ් සියල්ලට වඩා ඉතා වැදගත් වන්නේ ඒකීයත්වයයි. ඔබ දැනගනු. නබිවරයාණන් ගෙන ආ මේවායෙහි කුමක් හෝ එකක් ප්‍රතික්ෂේප කරන්නා කාෆිර් වන්නේය. එහෙත් සියළුම රසූල්වරුන් ගෙන ආ ඒකීයත්වය ප්‍රතික්ෂේප කරන්නා කාෆිර් නොවන්නේ මන්ද? සුබ්හානල්ලාහ් මෙය කොතරම් ලොකු මෝඩකමක්ද? නබිතුමාගේ මිතුරන් යමාමාහි බනු හනීෆා ගෝත්‍රිකයින් සමග කළ සටන ගැන සිතා බලනු. එම බනු හනීෆා ගෝත්‍රිකයින් නබිතුමා සමග ඉස්ලාමය පිළිගෙන සිටියහ. අල්ලාහ්

හැර වෙනත් දෙවියෙක් නොමැති බවත් මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ඔහුගේ දූතයෙකු බවද පිළිගෙන සිටියහ. ඔවුහු සලාතය ඉටු කරන අදාන් කියන අයද වූහ.

**අබ්දුන්නබි:-** එහෙත් ඔහු බොරුකාරයෙකු වූ මුසෙයිලමාව නබිවරයෙකු යැයි වාද කළහ. අපි මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාගෙන් පසු නබිවරයෙකු නැතැයි කියමු.

**අබ්දුල්ලාහ්:-** එහෙත් ඔබ අලි (රළියල්ලාහු අන්හු)තුමාව, අබ්දුල්කාදිර් ජීලානිතුමාව හා සමහර නබිවරුන්ව ද මලක්වරුන්ව ද අල්ලාහ්ගේ තත්ත්වයට උසස් කරන්නෙහුය. සාමාන්‍ය මිනිසෙකුව නබිවරයෙකුගේ තත්ත්වයට උසස් කරන්නාම කාෆිර්ය. ඔහුට කලිමාව ප්‍රයෝජනවත් නොවේ නම් මිනිසාව අල්ලාහ්ගේ තත්ත්වයට උසස් කරන්නාගේ තත්ත්වය කුමක් වෙයි ද? අලි (රළියල්ලාහු අන්හු)තුමා දඬුවම් දුන් අයද තමන්ව මුස්ලිම් වරුන් යැයි කියමින් ම සිටියහ. ඔවුහු අලි (රළියල්ලාහු අන්හු)තුමාගේ ආධාර කරුවෝය. සහාබිවරුන්ගෙන් දැනුම ලබා ගත් අයයි. නුඹලා අබ්දුල් කාදිර් ජීලානා මත තබා ඇති විශ්වාසය ඔවුහු අලි (රළියල්ලාහු අන්හු) තුමා මත තබා ගෙන සිටියහ. සහාබිවරු ඔවුන් සමග යුද්ධ කළ යුතු යැයි ඒකමතිකව තීරණය කළේ මන්ද? සහබාවරු මුස්ලිම්වරන්ව කාෆිර්වරුන් බවට පත් කරතියි යි ඔබ සිතන්නෙහිද? අබ්දුල් කාදිර් ජීලානි (රහ්මතුල්ලාහි අලෙයිහි) වගේ අය මත මෙසේ විශ්වාස කළාට කමක් නැහැ. අලි (රළියල්ලාහු අන්හු)තුමා මත මෙසේ විශ්වාස කිරීම නරක යැයි ඔබ සිතන්නෙහි ද? පැරැන්නන් ෂිර්ක්කයද නබිවරයා වහා කුර්ආනය බොරු කරනවා ද පරලොව ප්‍රතික්ෂේප කිරීමද එක්කර නිසා කාෆිර් යනු. මුර්තද් යන මාතෘකාව යටතේ පාඩමක් සකස් කර එහි මුර්තද් යනු මුස්ලිම් වූ පසු කාෆිර් වූ තැනැත්තා යැයි සියලුම මද්හබ්වල ආගමික වියතුන් තම පොත්වල සඳහන් කළහ. තවද 'කුෆ්ර්' ඇති විය හැකි බොහෝ කරුණු ද සඳහන් කර ඇත්තෝය. එය කරන්නාම ඉස්ලාමයෙන් පිටමං කරයි. ඔවුහු ඉතා අල්ප කරුණු පවා සඳහන් කරන්න අමතක නොකළහ. අල්ලාහ්ගේ අමනාපයට තුඩුදෙන වදනක් සිතේ ජනිත නොකර කටින් පමණක් ප්‍රකාශ කිරීම සමච්චලයට කියන සමහර වදන් පවා උදාහරණ වශයෙන් පෙන්වා ඇත්තෝය. (**නුඹලා අල්ලාහ්වද ඔහුගේ සාධකද ඔහුගේ දූතයාව ද සමච්චල් කරන්නෙහුද?නුඹලා හේතු නොකියනු. නියතවශයෙන්ම නුඹලා විශ්වාස කළ පසු ප්‍රතික්ෂේප කළ අය වන්නෝය**) ඔවුන් තබුක් සටනේ දි නබිතුමාත් සමග සිටි අයයි. වදනක් ප්‍රකාශ කර අපි සමච්චලයට කී වෙමු යි කී අයයි. ඔවුන් දෙස බලා මුස්ලිම් වූ පසු කාෆිර් වූ අයයි යනුවෙන් අල්ලාහ් ප්‍රකාශ කරයි. ඉස්රායීල්වරු සමාදනයේ දහම විශ්වාසකළවුන්, උගතුන් හා යහපත් ගැත්තන්ව සිටිය ද අපට (**දෙවියෙකු ඇති කර දෙත්වා යි ඇසුහ**) ඒ වගේම නබි මිතුරන්ගෙන් සමහරෙක් 'අපට (එකල මුෂ්රික් වරුන්ට තම ආයුධ එල්ලා තබා එතැන නැමදුම් කරන අරමුණින් නවාතැන්ගන්නා අයට ගසක් තිබුණා සේ) එල්ලා තබන ගසක් ඇති කර දෙනු මැනවි'යි ඇසූ විට 'මෙය ඉස්රායීල්වරු ඔවුන්ට දෙවිවරුන් සිටින්නා සේ (**අපටත් දෙවිවරුන්ව ඇති කර දෙනු මැනවි**) යි කිවා සේ වන්නේය' යි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ දිවුරා ප්‍රකාශ කළහ.

**අබ්දුන්නබි:-** ඉස්රායීල්වරුන් ද නබිවරයා ලග 'අපට එවැනි ගසක් ඇති කර දෙන්නැ'යි ඉල්ලූ අය ද එසේ ඇසූ නිසා කාෆිර් වුයේ නැත.

**අබ්දුල්ලාහ් :-** ඉස්රායීල්වරු හෝ නබිවරයාගෙන් එසේ ඇසූ අය හෝ එය කළේ නැත. එසේ කළානම් ඔවුහුද කාෆිර් වන්නේය. රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා එය තහනම් කළ විට එතුමාට අවනත නොවී එවැනි ගසක් තෝරා ගත්තහු නම් නියත වශයෙන්ම ඔවුන් කාෆිර් වන්නට තිබුණි.

**අබ්දුන්නබි:-** මට තවත් සැකයක් ඇත. එය උසාමා (රළියල්ලාහු අන්හු) තුමාගේ සිද්ධියයි. කලිමාව කී පුද්ගලයාව ඝාතනය කළ විට 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යැයි කී පසුවත් ඔහුව ඝාතනය කළෙහිදැ? යි නබි තුමාණෝ ඔහුට තර්ජනය කළහ. (ග්‍රන්ථය මුස්ලිම්) ඔබ කී කරුණු හා මෙම සිදුවීම් දෙක සසඳන්නේ කෙසේ ද?

**අබ්දුල්ලාහ්:-** යුදෙව්වන් 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන කලිමාව පවසද්දිම නබිතුමාණෝ ඔවුන් සමග යුද්ධ කළහ. ඔවුන්ව සිරභාරයට ගත්හ. බනූ හනීෆා ගෝත්‍රිකයින් 'ලා ඉලාහ

ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ් යනුවෙන් කියමින් - සලාතය කරමින් සිටියදීම නබි සහගාමීහු ඔවුන් සමග යුද්ධ කළහ. අලි (රළියල්ලාහු අන්හු) තුමා දඬුවම් කළ අයද එසේම සිටියහ. විනිශ්චය දිනය සඳහා නැගිටුවීම ප්‍රතික්ෂේප කරන්නා කලිමාව කීවත් ඝාතනය කරනු ලබයි. කලිමාවේ ප්‍රධාන කුළුණුවලින් එකක් හෝ ප්‍රතික්ෂේප කළ තැනැත්තාද ඝාතනය කරනු ලබන බව නුඹ පිළිගන්නෙහිය. එසේ නම් ඉස්ලාමයේ උපාංගවලින් එකක් ප්‍රතික්ෂේප කළවිට කලිමාව ප්‍රයෝජනයක් නොවෙද්දී ඉස්ලාමයේ මූලිකාංගවලින් එකක් වූ තව්හීදය ප්‍රතික්ෂේප කරන විට කලිමාව කෙසේ ප්‍රයෝජනවත් වෙයිද? මෙම හදීස්වල අර්ථය නුඹ හරියාකාරව තේරුම් නොගත් බව පෙනී යයි.

**උසාමා (රළියල්ලාහු අන්හු)** තුමා ඉස්ලාමය වාද කළ කෙනෙකුව තම ජීවිතයට ආදරයෙන් (මරණ බියෙන්) කලිමාව කීවේ යැයි සිතා ඝාතනය කළේය. යමෙක් ඉස්ලාමය පිටතින් පෙන්වූ විට එයට වෙනස් තත්ත්වයක් ඔහුගෙන් බාහිරව දකින තෙක් ඔහුට කිසිවක් කළ නොහැකිය" ඔහුගේ තත්ත්වය තහවුරු කරගන්නා තුරු ඔහුට කිසිවක් නොකළ යුතු බව පැහැදිලි කරයි. ඉස්ලාමයට වෙනස් පැවැත්මක් ඔහු තුළ ඇත්නම් ඔහු ඝාතනය විය යුතුය. 'කලිමාව කියන තෙක් ඔවුන් සමග සටන් කරනු' යි හදීසය කී රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාව කවාරිජ්වරුන් විෂයහි 'ඔවුන්ව කොහි දුටුවත් ඝාතනය කරනු' යි පැවසූහ. (බුහාරි) ඔවුහු ඉතා අධිකව නමැදුම් ඉටු කරන්නන් වූහ. ඔවුන් නැමදුම් කරන ආකාරය දුටු සහාබිවරු තමන් කරනුයේ අල්පයක් යැයි සිතූහ. ඔවුහු දැනුම ලබාගත්තේ සහාබිවරුන්ගෙන්ය. ඔවුන්ගෙන් දහමට පටහැනි ක්‍රියාවන් සිදුවුන විට ඔවුන් පැවසූ කලිමාව හෝ ඔවුන්ගේ අධිකවූ නමැදුම් කරන ආකාරය දුටු සහාබිවරුන්ගෙන්ය. ඔවුන්ගෙන් ආගමට පටහැනි ක්‍රියාවන් සිදුවුන විට ඔවුන් පැවසූ කලිමාව හෝ ඔවුන්ගේ අධිකවූ නැමදුම් හෝ තමන් මුස්ලිම්වරුන් යැයි ඔවුන්ගේ වාදය හෝ ඔවුන් ඝාතනය වීමෙන් ඔවුන්ව ආරක්ෂා කළේ නැත.

**අබ්දුන්නබි:-** මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ජනයා තමන් වෙනුවෙන් මැදිහත් වී උදව් කරන ලෙස පතා ආදම්" නූහ්" මූසා" ඊසා වෙත යයි අවසානයේ මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්)තුමා වෙත යයි" මෙම හදීසයෙන් අල්ලාහ් හැර සෙසු අයගෙන් උදව් පැතීම් ෂිර්ක් නොවන බව තහවුරු වෙනවා නොවේ ද?

**අබ්දුල්ලාහ්:-** මෙය සත්‍යය කනපිට පෙරළන්නකි. ජීවත්ව සිටින අයෙකුගෙන් ආරක්ෂාව පැතීම අප ප්‍රතික්ෂේප කළේ නැත. අල්ලාහ් මෙසේ පවසයි. (ඔවුන්ගේ සමූහයාට අයත් ඔහු (මූසා) ඔහුගේ සතුරන්ට අයත් කෙනෙකුට විරුද්ධව ආධාර පැතීය) යුධමය අවස්ථාවන් හිදී ද වෙනත් අවස්ථාවලදී ද මිනිසෙක් තම ආධාර කරුවන්ගෙන් ආරක්ෂාව පැතීම පිළිබඳව කිසිදු විරුද්ධත්වයක් නොමැත. අපි විරුද්ධ වන්නේ 'වලිවරුන්ගේ සොහොන් අබියස කෙරෙන ආරක්ෂාව පැතීමත් ඔවුන් අදෘශ්‍යමානව සිටිය දී ඔවුන්ට කළ නොහැකි දෑ ඔවුන්ගෙන් ඉල්ලීමත්ය. මිනිසුන් නබිවරුන්ගෙන් විනිශ්චය දිනයේ ඉල්ලා සිටින්නේ විභාග කිරීම ඉක්මන් කරවා ස්වර්ග වැසියන් 'මහ්ෂර්' දුෂ්කරතාවලින් මිදී සහනයක් ලබා ගැනීම සඳහා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන ලෙසය. නුඹේ කථාවට සවන්දිය හැකිව, ජීවත්ව සිටින යහපත් ගැත්තෙකු ඉදිරියට ගොස් නුඹ වෙනුවෙන් ප්‍රාර්ථනා කරන ලෙස ඉල්ලීම වරදක් නොවේ. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් ජීවත්ව සිටිය දී නබි තුමාගේ මිතුරන් එතුමන් වෙත ගොස් මෙසේ ඉල්ලා සිටියහ. එහෙත් එතුමන් මියගිය පසුව කිසිවෙක් එතුමන්ගේ සොහොන් අබියසට ගොස් කිසිවක් නොඉල්ලූහ. පැරැන්නන් සොහොන් ළඟට ගොස් තමන් වෙනුවෙන් දුආ ප්‍රාර්ථනා කිරීම හෙළා දැක්කෝය.

**අබ්දුන්නබි:-** ඉබ්‍රාහිම් (අලෙයිහිස් සලාම්) තුමා ගිනිමැලියට දමනු ලැබූ අවස්ථාවේ ජිබ්රීල් (අලෙයිහිස් සලාම්) තුමා අහසේ පෙනී සිට යම් අවශ්‍යතාවක් ඇද්ද?' යි ඇසීය. ජිබ්රීල් (අලෙයිහිස් සලාම්) තුමාගෙන් ආරක්ෂාව පැතීම 'ෂිර්ක්' නම් ජිබ්රීල් (අලෙයිහිස් සලාම්) තුමා එසේ අසන්නට නොතිබුණි.

**අබ්දුල්ලාහ් :-** මෙය ද පළමු පැනයට සමාන එකකි. පළමුවෙන් මෙය කිසිම සාක්ෂියක් නොමැති කියමනකි. එය සත්‍යයක් යැයි ගත්තද ජිබ්රීල් (අලෙයිහිස් සලාම්) තමන්ට හැකි යමක් කරන අදහසින් ඇසීය. (**ශක්ති සම්පන්න ඔහු ඔහුට ඒවා ඉගැන්විය**) ඉබ්‍රාහීම් තුමාව දමනු ලැබූ එම ගින්න ද එය වටා පිටාවේ තිබුණු භූමිය ද, කඳුද නැගෙනහිර හෝ බටහිර දිසාවට විසිකර දමන මෙන් අල්ලාහ් අණ කළේ නම් එයද එතුමාට නොහැකි කාර්යයක් නොවේ. මෙය ධනවතෙක් නැති බැරි මිනිසෙකුට මුදලින් උපකාරයක් කරන්න ඇසූ විට 'මට අවශ්‍ය නැහැ. මම අල්ලාහ්ගේ උපකාරය එනතෙක් ඉවසා සිටිමි'යි කීවා සේය. එහෙත් අද සොහොන් අබියස කෙරෙන 'ෂිර්ක්' කොතරම් දුරට ගිහින්ද?

**'මගේ සොයුරාණනි" මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමන්ව එවනු ලැබූ එදා සමාජය කළ 'ෂිර්ක්' අද මිනිසුන් කරන 'ෂිර්ක්'කය ට වඩා පහත සඳහන් කරුණු තුනකින් ඉතා පහසු ඒවා විය.**

1. පැරැන්නෝ පහසුකම් ඇතුව සිටියදීම අල්ලාහ්ට ආදේශ කළහ. දුෂ්කරතාවක් ආවිට අල්ලාහ් වෙත පමණක් යොමු වූහ. ඔවුන් ගැන අල්ලාහ් පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි. (**ඔවුහු නැව් නැගිනා විට ආගම අල්ලාහ්ට පමණක් සුවිශුද්ධ කළවුන් සේ ඔහුට ප්‍රාර්ථනා කරති. ඔවුන්ව ආරක්ෂා කර ගොඩට ගෙන ආ විට ඔවුහු ආදේශ කරන්නන් බවට පත් වෙති. 'කඳුකර මෙන් රළ ඔවුන්ව වටකර ගත් විට ආගම අල්ලාහ්ට සුවි ශුද්ධ කළවුන් සේ අල්ලාහ්ට ප්‍රාර්ථනා කරති. ඔවුන්ව ආරක්ෂා කර ගොඩට ගෙන ආවිට ඔවුන්ගෙන් සමහරෙක් මධ්‍යස්තව සිටිති. ගුණමකුවන්වූ මහා ද්‍රෝහීන් විනා අන් කිසිවෙක් අපගේ සාධක ප්‍රතික්ෂේප නොකරති.**) රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා ඔවුන් සමග යුද්ධ කළ එම මුෂ්රික්වරු ඓශ්වර්යමත්ව සිටින විට අල්ලාහ් සමග අනෙක් අයගෙන්ද ප්‍රාර්ථනා කරති. එහෙත් දුෂ්කරතා ඇති වූ විට අනෙක් සියල්ල අතහැර අල්ලාහ්ට පමණක් ප්‍රාර්ථනා කරති. එහෙත් ඓශ්වර්යයෙන් හා දුප්පත් කමින් සිටින හැම අවස්ථාවක ම අද මුෂ්රික්වරු අල්ලාහ් නොවන්නන් ලග ප්‍රාර්ථනා කරති. දුකක් පැටලුන විට යා රසූලුල්ලාහ්, යා හුසෛන් යා මුහියද්දීන් යැයි කියති. මෙය තේරුම් ගත් උදවිය කොහිද?

2. පැරැණ්නන් අල්ලාහ්ට සමීප වූ රසූල්වරුන්, මලක්වරුන් හා වලිවරුන්ගෙන් ප්‍රාර්ථනා කළහ. නැතිනම් අල්ලාහ්ට වෙනස්කම් නොකරන ගස් හා ගල් වලට ඇරයුම් කළහ. එහෙත් අද මුෂ්රික් වරු මිනිසුන් අතර මහා පාපතරයින්වම කැඳවති. යහපත් ගැත්තන් අතර හෝ අල්ලාහ්ට වෙනස්කම් නොකළ ගල් හා ගස් මත විශ්වාස තබන්නා පව්කිරීම ඇස්පනාපිට දැක ද ඔහු මත විශ්වාස කරන්නාට වඩා උසස්ය.

3. නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමන්ගේ කාලයේ මුෂ්රික් වරුන්ගේ ෂිර්ක් පැවතුනේ තව්හීදුල් උලූහිය්යාවේ පමණක්ය. තව්හීදුර් රුබූබිය්යාවේ තිබුණේ නැත. එහෙත් අද කාලයේ ෂිර්ක් තව්හීදුල් උලූහිය්යා වේ පමණක් නොව එයටත් වඩා තව්හීදුර් රුබූබිය්යාවේ ඇත. මැවීම, පණ ගැන්වීම මරණයට පත් කිරීම ස්වභාව ධර්මයෙන් සිදු කරන බව ඔවුහු අදහස් කරති.

මුලින් කී දැයින් දැනගත් වැදගත් නීතියක් ගැන ප්‍රකාශ කර මගේ කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙමි. ඒකීයත්වය යනු තහවුරු කිරීම, කටින් ප්‍රකාශ කිරීම, හා අවයව වලින් ක්‍රියාත්මක කිරීම යන කරුණු තුනෙන් ඒකාබද්ධව ඇති විය යුතුය මේවායින් එකක් හෝ අත් හැරුණු විට මුස්ලිම් විය නොහැක. තව්හීදය දැනගෙන ඒ අනුව ක්‍රියා නොකළේ ෆිර්අවුන් හා ඉබ්ලීස් වැනි කාෆිර්ය. හැමෝටම වරදින කරුණක් ඇත. එයනම් 'මෙය සත්‍යයයි. එහෙත් අපට කරගත නොහැක" මෙය ගමේ නැත. ගමේ අයගෙන් විය හැකි විපත් ගැන සලකා ඔවුන් සමග සහයෝගයෙන් යා යුතුව ඇතැ යි හේතු පැවසීමයි.

'කුෆ්ර්' හි නායකයින්ගෙන් වැඩි පිරිසක්ද මෙසේ සත්‍යය දැනගෙනත් මෙවැනි සමහර හේතු දක්වමින් එය අත් හළහ. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි (**ඔවුහු අල්ලාහ්ගේ සාධක වෙනුවට අල්ප වූ දෙයක් ගත්හ. නියත වශයෙන් ම ඔවුන් කරමින් සිටින කාර්යය නරක එකකි**) කවරෙකු හෝ තව්හීදය තේරුම්ගෙන හිතෙන් පිළිනොගෙන බාහිර වශයෙන් තව්හීදයට

අනුව කටයුතු කළහොත් ඔහු මුනාෆික්ය. ඔහු කාෆිර්ටත් වඩා නරක අයෙකි. අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. (ඔවුහු නියත වශයෙන්ම කුමක හෝ නිරයේ පහත මාලයේ සිටිති.) ඔවුනට උදව් කරන කිසිවෙකුව නොදකින්නෙහුය.'

මිනිසුන් කථා කරන දෑ නුඹ අවධානය කරන්නේ නම් මෙය හොඳින් දැනගන්නෙහිය. සත්‍ය දැන ලෝකයේ සිදුවන එක පාඩුවක් නිසා එය අත් හරින්නෝය. මොවුහු කාරූන්ට සමාන අයයි. තවත් සමහරෙක් කාරූන් මෙන් නිලතලවලට බියෙන් අත් හරින්නෝය. තවත් සමහරෙක් ෆිර්අවුන් මෙන් පාලනය නැතිවේ යැයි බියෙන් අත්හරින්නෝය. කුහකයින් මෙන් බාහිර පෙනුමෙන් තව්හීදය පිළිපදින අයව ද ඔබ දකින්නෙහිය. ඔහු ඔහුගේ සිතෙන් පිළිපදින තව්හීදය කුමක්දැ?'යි ඇසුවහොත් ඔහු කිසිවක් නොදන්නේය.

**අල් කුර්ආනයේ වැකි දෙකක් ගැන නුඹ හොඳින් දැනගත යුතුය.**

එකක් කලින්ම දැන්වූ වැකිය. එනම්:- (නුඹලා හේතු නොකිවහි. විශ්වාස කළ පසු නුඹලා ප්‍රතික්ෂේප කළ අය වුවෙහුය.)' රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) සමග රෝමානුවන් විරුද්ධව සටන් කර සමච්චලයට කී එක වචනයක් හේතු කොටගෙන 'කාෆිර්' වුවහු නම් ධනය හා බලය නොලැබී යාවි යැයි බියෙන් හෝ යම් කෙනෙකුගේ හිත සතුටු කිරීමට 'කුෆ්ර්' සම්බන්ධ වදනක් කියන්නා කොතරම් තදබල කුෆ්ර් හි වැටේ දැයි තේරුම් ගනු. සමච්චලයට කියන්නා අනෙක් අයව හිනැස්සවීමට හිතෙන් විශ්වාස නොකරම කියයි. එහෙත් ජනතාවට බියෙන් හෝ එවුන් ලඟ ඇති දෙයකට ආසාවෙන් හෝ කථා කරන්නේ නම් (ෂෙයිතාන් නුඹලාට දිළිඳුකම පොරොන්දු වෙයි. පාපය විධානය කරයි) යන වැකිය අනුව ෂෙයිතාන්වම සැබෑ කරවයි. ෂෙයිතාන්ගේ අනතුරු ඇඟවීමට බියවෙයි. (ෂෙයිතාන් තම හිතවතුන් ව බිය ගන්වයි.) අල්ලාහ්ගේ වචනය විශ්වාස කළේ නැත. (අල්ලාහ් ඔහුගේ දයාව හා පාපක්ෂමාව ද මහිමය ද පොරොන්දු වෙයි) ඔහුගේ අනතුරු ඇඟවීමට බිය වුයේ නැත. (නුඹලා මුඃමින්වරු නම්,ඔවුනට බිය නොවී මාහට බිය වහු)මෙවැනි අය අල්ලාහ්ගේ 'වලි' ව සිටීමට සුදුසු ද නැත්නම් ෂෙයිතාන්ගේ 'වලි' ව සිටිමට සුදුසු ද?

දෙවැන්න (කවරෙකු විශ්වාස කළ පසු අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන්නේද (ඔහුට අල්ලාහ්ගේ කෝපය ඇත") ඔහුගේ හිත විශ්වාසයෙන් සැනසීමට පත්ව තිබියදී කවරෙකු බලහත්කාරයකට හසුවන්නේද ඔහු හැර" එහෙත් කවරෙකුගේ හිත කුෆ්රයෙන් විශාලත්වයට පත් ව ඇත් ද ඔහුට අල්ලාහ්ගේ කෝපය පහළ වන්නේය. ඔවුනට දරුණු වේදනාවද ඇත.) යන වැකියෙන් හිත විශ්වාසය තහවුරු වී ඇති තත්ත්වයක බලහත්කාරයකට හසුවුන අයට පමණක් අල්ලාහ් ක්ෂමා කරන බව පවසයි. අනෙක් අය යමකට බියෙන් හෝ යමකට ආසාවෙන් හෝ යම් කෙනෙකුව සතුටු කරවීමට හෝ රට හෝ පවුල හෝ සතුටු කරවීමට හෝ කළේ නම් හෝ සමච්චලයට කළේ නම් ඔහු කාෆිර් වන්නේය.

බලහත් කාරව හසුවන්නා ක්ෂමාව ලබයි. එහෙත් බලපෑම් කිරීම ක්‍රියාවන්ගෙන් පමණක් සිදුවිය යුතුය. සිතෙන් විශ්වාස කරන කරුණු අතින් සිදුවිය නොහැක. (එය ඔවුන් පරලොවට වඩා මෙලොව ජීවිතයට කැමතිවූ නිසා ද ප්‍රතික්ෂේප කරන අයව අල්ලාහ් මග නොපෙන්වන නිසා ද වේ.) යන වැකිය ඔවුන් දඬුවම් කරනු ලැබීම ඔවුන්ගේ ප්‍රතිපත්තිය නොදැනුවත්කම දහම අප්‍රිය වීම හා කුෆ්රය ප්‍රිය කිරීම ආදි කරුණු නිසා නොවේ. මෙලොව දේවල් දහමට වඩා වැදගත් යැයි ගත් නිසා බව පැහැදිලිව ප්‍රකාශ කරයි. මා මෙතරම් ප්‍රකාශ කළ පසුත් නුඹ නුඹේ ප්‍රතිපත්තිය අතහැර අල්ලාහ්ගෙන් ක්ෂමාව අයදින්න අකැමති ද? මන්ද මෙය ඉතා භයානක කාරණයක් බව නුඹ දැනගත්තෙහිය.

**අබ්දුන්නබි:-** අල්ලාහගෙන් මම ක්ෂමාව ඉල්ලමි. නැමදුම සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැත. මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා ඔහුගේ දූතයාණන් බව සාක්ෂි දරමි. අල්ලාහ් හැර මම නැමදුම් කරමින් සිටි සියල්ල ප්‍රතික්ෂේප කළෙමි. මගේ පෙර පව් සියල්ල ක්ෂමා කරන ලෙස ද ඔහුගේ සෙනෙහස හා දයාව මුල්කරගෙන මට ආදරය දක්වන ලෙසද මා මරණයට පත්වෙන තෙක් නිවැරදි ප්‍රතිපත්තිය මත ස්ථාවරව තබන ලෙස ද අල්ලාහ්ගෙන් ආයාචනා කරමි. නුඹ මට කළා වූ මෙම උපදේශය වෙනුවෙන් ද මම සිටි

තත්ත්වයෙන් මා මුදවා ගත් හේතුවෙන් ද අල්ලාහ් නුඹට යහපත් ප්‍රතිඵල ලබා දෙත්වා! නියත වශයෙන් මම ඒ ප්‍රතිපත්තියේ සිටියේ නම් කිසිවිටක ජය නොලබමි.
අවසාන වශයෙන් නුඹෙන් ඉල්ලීමක් කරමි. ජනතාව බහුල වශයෙන් කරනු ලබන සමහර වැරදි මට පෙන්වා දෙනු.
**අබ්දුල්ලාහ් :-** හොඳයි මාගේ කීමට සවන් දෙනු!
❖ කුර්ආන් හදීසයෙන් යම් මත භේදයක් දැනුනහොත් ෆිත්නා අරමුණෙන් හෝ එහි අනෙක් අර්ථ සොයමින් හෝ මත භේදයට තුඩු දුන් දෑ පිළිපදින ප්‍රතිපත්තියක් නුඹලාට නොතිබිය යුතුය.
සැබැවින්ම එහි අදහස අල්ලාහ් හැර අන් කිසිවෙක් නොදනිති. දැනුමෙහි ඉතා ප්‍රබල වූ සියල්ල අල්ලාහ්ගෙන් පහළ වූ ඒවාය. එය අපි එසේම විශ්වාස කරමු'යි කියන පිරිසක් සමග සිටියහි. මත භේදයක් ඇති දෑ පිළිබඳව රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. '*නුඹට සැකයක් ඇති වුවොත් සැකයක් ඇති නොවන දෙසට එය යවනු.'* (අහ්මද් , තිර්මදී) '*කවරෙකු සැක දේවල් වලින් ඈත් වන්නේද ඔහු තම දහමටද ගෞරවයට ද ආරක්ෂාව ලබා ගත්තේය. කවරෙකු සැක දෑ කෙරෙහි යොමුවන්නේද ඔහු හරාම්හි ඇතුල් විය.* (බුහාරි, මුස්ලිම්) '*පව යනු නුඹේ සිතේ ජනිත වී මිනිසුන් එය නොදැකිය යුතු යැයි ප්‍රිය කරන දෙයයි.* (මුස්ලිම්) '*නුඹේ සිතෙන් ආගමික තීන්දුව අසනු. (එසේ තුන් වරක් ප්‍රකාශ කළ නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ හොඳ යනු නුඹේ හිත ඒ පිළිබඳව සැනසීමට පත්විය හැකි දෙයයි. නරක යනු නුඹේ සිතේ ජනිත වී එය කිරීම ගැන නුඹ දෙගිඩියාවක් ඇති කර ගත් දෙයයි. මිනිසුන් තීන්දු දුන්නද නුඹේ සිතෙන් තීන්දුව අසනු"* (අහ්මද්)
❖ සිතේ ආසාවන් පිළිපැදීම ගැන නුඹට අවවාද කරමි:- (**තම දෙවිඳුන්ව හිත කියන පරිදි ගත් අයව නුඹ නොදැක්කෙහිද?**)
❖ තනි පුද්ගලයෙකුට හෝ අදහස්වලට හෝ හිතුවක්කාර වීම ගැන අවවාද කරමි :- පැරැන්නන්ගේ ජීවන ක්‍රමය සත්‍යය පිළිගැනීමට බාධාවක් විය හැක" සත්‍යය යනු මිනිසෙකුගේ නැතිවූ භාණ්ඩයකි" එය කොහිදී දුටුවද වහාම රැගෙන යාමට සුදුස්සා ඔහුය" අල්ලාහ් මෙසේ පවසයි":- (**අල්ලාහ් පහළ කළ දෙය පිළිපදිනු" යි ඔවුනට කියනු ලැබුවොත් ඔවුහු 'අපි අපගේ පැරැන්නන් කුමක් කරනු දුටුවෙම් ද එයම අපත් කරන්නෙමු" යි කියති" ඔවුන්ගේ පැරැන්නන් කිසිවක් තේරුම් නොගෙන සෘජු මඟ නොලද අය වුව ද**)
❖ කාෆිර්වරුන්ට සමානවීම ගැන නුඹට අවවා ද කරමි" සෑම අර්බුදයකටම මුල මෙයයි" රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ" '*කවරෙකු හෝ තවත් සමූහයක් අනුකරනය කරන්නේ ද ඔහු ඔවුනට අයත් කෙනෙකු වන්නේය'* (අබූ දාවූද්)
❖ අල්ලාහ් නොවන දෑ කෙරෙහි විශ්වාස කිරීම ගැන අවවාද කරමි" අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි (**කවරෙකු අල්ලාහ් විශ්වාස කරයි ද අල්ලාහ් ඔහුට ප්‍රමාණවත්ය**)
❖ අල්ලාහ්ට වෙනස්කම් කිරීම පිළිබඳව කිසිම මැවීමක් පිළිනොපදිනු රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලලම්) තුමාණෝ මෙසේ පවසති '*මැවුම්කරු හට වෙනස්කම් කිරීම විෂයෙහි මැවීම්වලට අනුගමනය නොකළ යුතුය"'* (තිර්මදී)
අල්ලාහ් ගැන වරදවා නොසිතනු රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ හදීස් කුදිස්හි අල්ලාහ් පැවසූ බව කීහ '*මගේ ගැත්තා මා ගැන සිතන තැන මම සිටිමි'* (බුහාරි" මුස්ලිම්)
❖ දුෂ්කරතා නොපැමිණීමට හෝ ඇති දෙයක් ඉවත් වීමට හෝ වළළු හා නූල් පැලඳීම ගැන අවවාද කරමි"
❖ ඇස්වහ නැතිකිරීම සඳහා සුර පැලඳීම ගැන අවවාද කරමි" මන්ද එය ෂිර්ක් ය. රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. '*කවරෙකු හෝ යමක් එල්ලා ගනී ද ඔහු ඒ කරා යොමු කෙරෙයි"'* (තිර්මදී)
❖ ගස්" ගල්" පැරණි සලකුණු (සොහොන්) ගොඩනැගිලි මගින් අභිවෘද්ධිය සෙවීම ගැන අවවාද කරමි"

❖ පලාපල බැලීම ගැන අවවාද කරමි“ එය ෂිර්ක් ය. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ. *පලාපල බැලීම ෂිර්ක්යැ(යි තුන් වරක්) කීහ.* (අහ්මද්” අබූදාවූද්)

❖ හූනියම් කරුවන් හා ශාස්ත්‍රකරුවන් ගැන විශ්වාස කිරීම ගැන අවවාද කරමි“ ඔවුහු තමන්ට සැගවුන දෑ පිළිබඳව දැනුම ඇතැයි අදහස් කරති“ තහඩුවල ’රාසි’ පෙන්වති“ කෙනෙකුගේ භාග්‍යය හා අභාග්‍යය ගැන දැනුම් දෙති“ ඔවුන්ව විශ්වාස කිරීම ’ෂිර්ක්’ය සැගවුන දෑ පිළිබඳව අල්ලාහ් හැර අන් කිසිවෙක් නොදනිති“

❖ වැස්ස වැසීම තාරකාවන්ට හෝ කාලවලට පැවරීම ගැන අවවාද කරමි“ එය ෂිර්ක්’ය“ ඒවා අල්ලාහ්ටම භාර කළ යුතුය“

❖ කවුරු හෝ වේවා අල්ලාහ් නොවන දෑ මත දිවුරීම ගැන අවවාද කරමි“ එය ද ’ෂිර්ක්’ය. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ“ *’කවරෙකු අල්ලාහ් නොවන දෙයක් මත දිවුරයි ද ඔහු කාෆිර් වූයේය“ නැතිනම් ආදේශ කරුවෙක් වූයේය“* (අහ්මද්” අබූ දාවූද්) නබිවරයා මත” විශ්වාසවන්ත කම” වගකීම් ගෞරවය මත දිවුරීම ආදිය මෙයට අයත්ය“

❖ කාලය” සුළග” සූර්යයා” සිසිල” උෂ්ණ ආදියට බැනීම ගැන අවවාද කරමි“ ඒවා මවා ඇත්තේ අල්ලාහ්ය“ ඒවාට බැනවැදීම අල්ලාහ්ට බැනවැදීමකි“

❖ යම් කිසි දෙයක් (විපතක්) සිදු වූ පසු ’මෙසේ කටයුතු කළා නම් එසේ නොවන්නේයැ’යි කීම ගැන අවවාද කරමි“ එය ෂෙයිතාන්ට දොර විවර කරයි“ අල්ලාහ්ගේ සැලැස්මට විරෝධය පෑමක් ද වන්නේය“ යම් දෙයක් සම්බන්ධව නුඹ එය අල්ලාහ් සැලසුම් කළේය“ ඔහුට මනාප දෙයක් සිදුවෙයි” යැයි කියහි“

❖ සොහොන් පිටි මස්ජිද් (සලාතය කරන ස්ථාන) බවට පත් කර ගැනීම ගැන අවවාද කරමි“ ’සොහොන් ඇති කිසිම මස්ජිදයක සලාතය නොකළ යුතුය“ රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මරණ මංචකයේ දී පැවසූ බව ආයිෂා (රළියල්ලාහු අන්හා) තුමිය මෙසේ පැවසුවාය“ *’අල්ලාහ්ගේ ශාපය යුදෙව් හා ක්‍රිස්තියානින් මත පහළ වේවා“ ඔවුහු ඔවුන්ගේ නබිවරුන්ගේ සොහොන් සලාතය කරන ස්ථාන බවට පත්කර ගත්හ“ ඔවුන් කළ දෑ එතුමාණෝ හෙළා දුටහ“ එසේ නොකළාහු නම් එතුමන්ගේ සොහොන ද මතු වන්නේය’* (බුහාරි” මුස්ලිම්)

තවද රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ“ *’නුඹලාට පෙර සිටි අය ඔවුන්ගේ නබිවරුන්ගේ හා යහපත් ගැත්තන්ගේ සොහොන් මස්ජිදයක් බවට පත්කර ගත්හ“ නුඹලා සෙහොන් මස්ජිද් බවට පත් නොකරනු“ එයින් මම නුඹලාව වළක්වමි’* (අබූ අවානහ්)

❖ නබිවරයාණන්ගේ හෝ යහපත් ගැත්තන්ගේ මාර්ගයෙන් වසීලා සොයන ලෙස රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළ බවට දක්වන (ගොතන ලද) හදීසය පිළිබඳව අවවාද කරමි“ ඒවා ගොඩනගාගත් ඒවාය“ උදා :- (“නුඹලා මගේ තත්ත්වය මත වසීලා සොයනු“ අල්ලාහ් ළග මගේ තත්ත්වය ඉතා උසස්ය“), (නියත වශයෙන්ම“ අල්ලාහ් සෑම වලීකෙනෙකුගේ සොහොනක් මතම මලක්වරයෙකුව යොදවා ඇත“ ඔහු මිනිසුන්ගේ අවශ්‍යතාවන් සපුරාලයි“), (නුඹලාගෙන් කෙනෙකු ගලක් ගැන හොඳ සිතුවිල්ලක් ඇතිකර ගත්ත ද එයින් ඔහුට යහපතක් වෙයි“)

❖ නබි උපන් දිනය” මි:රාජ්” බරාත් රාත්‍රිය ආගමික වත්පිළිවෙත් නමින් පවත්වන උත්සව ගැන අවවාද කරමි“

ඒවා අලුතින් නිර්මාණය කරගත් ඒවාය“ රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා හෝ එතුමන්ට අපට වඩා අධිකව සෙනෙහස දැක්වූ සහාබිවරුන් හෝ ඒවා කළේ නැත“ ඔවුහු අපට වඩා යහපත් ක්‍රියාවල උද්යෝගයෙන් කටයුතු කළ අයයි“ ඒවා දහමේ යහපත් ක්‍රියා වූයේ නම් ඔවුන් ඒවා කිරීමෙහි ප්‍රමුඛත්වය ගන්නට තිබිණි“

# ලා ඉලාහා ඉල්ලල්ලාහු

**මෙම කලිමාව කුලුණු දෙකකින් යුක්ත ය. ප්‍රථමය-** ලා ඉලාහා-නැතිබව ප්‍රකාශ කිරීම, එනම් නැමදුම් ලැබීමට සුදුස්සා කිසිම දෙවියෙකු නැති බව ප්‍රකාශ කිරීම. **දෙවැන්න-** ඉල්ලල්ලාහ්-ඇතිබව ප්‍රකාශ කිරීම, එනම් නැමදුම් ලැබීමට සුදුස්සා අල්ලහ් පමණක් සිටන බව ප්‍රකාශ කිරීම. අල්ලාහු තආලා පවසයි. **ඉබ්රාහීම් ඔහුගේ පියා හා සමූහයාට කීවේය. නියතවශයෙන්ම නුඹලා නැමදුම් කරන්නාගෙන් මා නිදහස් වෙමි.මාගේ මැවුම් කරුවා හැර, නියතවශයෙන්ම ඔහු මා හට යහමග පහදා දෙන්නෙකි.** අල්ලාහු තආලාහට නැමදුම් ඉටු කිරීමෙන් සෑහීමට පත්විය නොහැක, එහෙත් ඔහු හැර අන් කිසිවෙකුට නැමදුම් නොකර ඔහුට පමණක් නැමදුම් ඉටු කිරීම අනිවාර්‍යය වේ.තවද මෙ ආකාරයෙන් නැමදුම් ඉටු කිරීම තුළින් තව්හීදය(ඒක දේවත්වය) නිශ්චත වේ.

- **ස්වර්ගයේ යතුර 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්'ය" එසේ නම් එය පැවසූ හැම කෙනෙකුම ස්වර්ගයට යාමට සුදුසුකම් ලබන්නෙහුද?**

වහබ් ඉබ්නු මුනබ්බිහ් තුමාගෙන් 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' සවර්ගයේ යතුර නොවේ දැ'යි අසන ලදි" එවිට එතුමා 'ඔව්' එහෙත් හැම යතුරකට ම දැති ඇත" දැති හරියට ඇති යතුර නුඹ ගෙන එන්නෙහි නම් එය විවෘත කළ හැක" නැතිනම් විවෘත කළ නොහැක"

මෙම දැති කුමක්දැ?යි පැහැදිලි කරන හදීස් බොහොමයක් ඇවිත් ඇත. *'කවරෙකු මෙම කලිමාව පිරිසිදු සිතෙන් පවසන්නේද'"""""" 'කවරෙකු සිතෙන් තහවුරු කර සැබෑකර පවසන්නේ ද"""""* මෙවැනි බොහෝ හදීස් ඇත" එම කලිමාවේ අදහස මරණය දක්වා එහි සථිරව සිටීම එහි අදහසට හිස නැවීම" ආදිය මගින් ස්වර්ගයට ඇතුල් විය හැකි යැයි දැනුවත් කරයි.

**ආගමික වියතුන් විවිධ සාක්ෂි පදනම් කරගෙන එම කලිමාව සවර්ගයේ යතුර වීමට එය ප්‍රයෝජනවත් වීමට විවිධ කොන්දේසි ඉදිරිපත් කර ඇත" එම යතුරේ දැති එම කොන්දේසි වන්නේය"**

**❶ තේරුම දැන ගැනීම -** ඕනෑම වචනයකට තේරුමක් ඇත" දේවත්වය අල්ලාහ් නොවන දෑ වලින් ඉවත්කර අල්ලාහ්ට පමණක් අයිතිකර දීම යන තේරුම දැන් අවබෝධ කරගැනීම වගකීමකි" එනම් නමැදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැත" අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි" 'දැනගනිමින්ම සත්‍ය තුළින් සාක්ෂි කී අය හැර' රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ" *'කවරෙකු හෝ නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැතැ'යි දැනගත්තෙකු ලෙස මිය යයි නම් ඔහු සවර්ගයට පිවිසෙයි"* (මුස්ලිම්)

**❷ 'යකීන්'** එහි තේරුම කිසිම සැකයකට තුඩු නොදී කුතුහලයකින් තොරව සිතේ තහවුරුකර ගැනීම" මු:මින්වරුන් ගැන අල්ලාහ් මෙසේ ප්‍රකශ කරයි" 'නියතවශයෙන් විශ්වාසවන්තයින් අල්ලාහ්ව ද ඔහුගේ දූතයාව ද විශ්වාසකර සැකයෙන් තොරව ඉඳ ඔවුන්ගේ වස්තුවෙන් ද ප්‍රාණයෙන් ද අල්ලාහ්ගේ මාර්ගයේ පිහාද් කළ අයයි" කටින් කීම පමණක් ප්‍රමාණවත් නැත" සිතෙන් තහවුරු කිරීම අත්‍යවශ්‍ය ය" නැතිනම් එය මුළුමනින්ම 'නිෆාක්' වන්නේය" රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ" *'අල්ලාහ් හැර නැමදුමට සුදුසු දෙවියෙක් වෙනත් නැතැයි කියා ද මා ඔහුගේ දූතයා බවද සාක්ෂි දරමි" මේ කරුණු දෙකේ සැකයක් ඇති නොකර කවරෙකු අල්ලාහ්ව හමුවන්නේ ද ඔහු සවර්ගයට ඇතුල් වන්නේය""*

(මුස්ලිම්)

**❸ පිළිගැනීම** මෙම කලිමාවේ අර්ථය දැනගෙන සිතෙන් තහවුරු ද කරයි නම් එහි ප්‍රතිචාරය එළිදැක්විය යුතුය" මෙම කලිමාව පිළිගැනීම තුළින්ම එය ඇතිවිය හැක" කවරෙකු ඒකීයත්වයේ කැඳවීම ප්‍රතික්ෂේප කරන්නේ ද (උඩගුකමින් හෝ මුරණ්ඩුකමින් හෝ ඊර්ෂ්‍යාවෙන් හෝ කමක් නැත) ඔහු කාෆිර් වන්නේය" උඩගුකමින් එය පිළිගැනීම ප්‍රතික්ෂේප කළ අය ගැන අල්ලාහ් සඳහන් කිරීමේදී **'ඔවුනට නැමදුමට සුදුසු දෙවියා අල්ලාහ් හැර කිසිවෙකු නැතැ" යි කියනු ලැබුවොත් ඔවුහු උඩගු වෙති'යි කියයි"**

**❹ ඒකීයත්වයට සම්පූර්ණයෙන් අවනතවීම :-** මෙය ඔහුගේ විශ්වාසය දැනගැනීමේ උරගල ද බාහිර පෙනුම ද වන්නේය" අල්ලාහ් ආගම වශයෙන් අනුමත කළ දෑ පිළිගෙන

කටයුතු කිරීම තුළින් ද ඔහු තහනම් කළ දෑවලින් ඉවත්වීම තුළින් ද මෙය තහවුරු කළහැක" අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි" '**කවරෙකු යහපත කළ අයෙකු සේ අල්ලාහ් කරා හිස පහත් කරයි ද ඔහු ශක්තිමත් ලණුව අල්ලා ගත්තේය" ක්‍රියාවන්ගේ අවසානය අල්ලාහ් වෙතමය"**

**❺ සත්‍යය කිරීම:-** මෙම කලිමා ප්‍රකාශ කිරීමෙහි සැබෑ ලෙස කටයුතු කිරීම සිත බොරු කරද්දී කටින් ප්‍රකාශ කරන්නා කුහකයෙක් වෙයි" **මුනාෆික් ගැන අල්ලාහ් 'ඔවුන්ගේ සිතේ නැති දෙයක කටින් කියයි' යැයි සඳහන් කරයි"**

**❻ ආදරය කිරීම :-** මුඃමින්වරයෙකු මෙම කලිමාවට අනුව කටයුතු කරයි ඒ අනුව කටයුතු කරන අයව ද ප්‍රිය කරයි" ගැත්තෙකු තම දෙවියන්ට සෙනෙහස දැක්වීමේ සළකුණු වන්නේ ඔහු සිතේ ආශාවන්ට පටහැනි වුව ද අල්ලාහ්ගේ මනාපයට අයත් දෑවලට ප්‍රමුඛත්වය දීම" අල්ලාහ් ට හා ඔහුගේ දූතයාණන්ට සෙනෙහස දක්වන අයට සෙනෙහස දැක්වීම ඔවුනට විරුද්ධවන්නන්ට ප්‍රිය නොකිරීම" රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාව පිළිපැදීම එතුමාගේ මගපෙන්වීම පිළිගැනීම ආදියයි"

**❼ පිරිසිදු චේතනාව :-** එම කලිමාව ප්‍රකාශ කිරීම තුළින් අල්ලාහ්ගේ තෘප්තියම අපේක්ෂා කිරීම අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි '**නැමදුමට අල්ලාහ්ට සුවිශුද්ධ කර" ඍජු මග බැස ඔහුට නමැදුමට ඉටුකරන ලෙසම ඔවුනට අණ කර ඇත"** රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ" '***අල්ලාහ්ගේ තෘප්තිය පතා කවරෙකු එම කලිමාව පවසන්නේ ද අල්ලාහ් ඔහුට නිරය තහනම් කරන්නේය"*** (බුහාරි) මරණය දක්වා මෙම කොන්දේසි මත එම කලිමාවේ සථාවරව සිටිය යුතුය"

## මුහම්මදුර් රසූලුල්ලාහ්

මියගිය තැනැත්තා මිනිවලේ පරීක්ෂණයට ලක්වෙයි" එහි දී ඔහුගෙන් ප්‍රශ්න අසනු ලබයි" ඒවාට පිළිතුරු දුනහොත් ජය ලබයි" නැතිනම් විනාශ වෙයි" එම ප්‍රශ්නවලින් එකක් වනුයේ **නුඹේ නබිවරයා කවරෙක් ද?** යන්නෙනි" එහි කොන්දේසි සපුරාලන්න හැකි කෙනාට පමණක් එයට පිළිතුරු දිය හැක" අල්ලාහ් මිනිවලේ ඔහුගේ පිළිතුර දැනුවත් කර ඔහුගේ දිව සථාවර කරවයි" වස්තුව හෝ දරුවන් හෝ උදව් නොකරන දවසේ ඔහු ප්‍රයෝජනය ලබයි" **එහි කොන්දේසි පහත සඳහන් පරිදි වේ.**

**❶ මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් විධානය කළ කරුණුවලදී එතුමන්ට අවනත වීම :-**

අල්ලාහ් එතුමන්ට අවනත වන මෙන් අපට අණකරයි" ඔහු මෙසේ ප්‍රකාශ කරයි" '**කවරෙකු රසූල්වරයාට අවනත වන්නේ ද ඔහු අල්ලාහ්ට අවනත වුයේය"** තවදුරටත් මෙසේ කියයි" '**නුඹ කියව් නුඹලා අල්ලාහ්ට සෙනෙහස දක්වන්නෙහු නම් මාව පිළිපදිනු" අල්ලාහ් නුඹලාට සෙනෙහස දක්වයි"** තවදුරටත් රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ '***මගේ සමූහයා සියල්ලෝම සවර්ගයට යති" වෙන් වූ අය හැර යැයි කීහ" වෙන්වූ අය කවරහු දැ?" යි අසන ලදි" මාව අනුගමනය කරන්නා සවර්ගයට යයි" මට වෙනස්කම් කරන්නා වෙන්ව යයි"*** (බුහාරි) කවරෙකු නබිතුමන්ට ආදරය කරන්නේ ද ඔහු අනිවාර්යයෙන් එතුමන්ව අනුගමනය කළ යුතුය" ආදරයේ ප්‍රතිඵලය අනුගමනය කිරීමයි" එතුමන් අනුගමනය නොකර එතුමන්ට ආදරය දක්වන බව යමෙක් කියයි නම් ඔහු බොරු කාරයෙකි"

**❷ එතුමා දැන්වූ කරුණු තුළින් එතුමන්ව සැබෑ කරවීම :-**

කවරෙකු හෝ එතුමන් මාර්ගයෙන් සාක්ෂි ඇතුව ආ එකක් තමන්ගේ හිතේ ආශාවන්ට වහල්වී බොරු කළහොත් ඔහු අල්ලාහ්ව ද රසූල්ව ද බොරු කළේය. මන්ද නබි තුමන් බොරු හා වැරදිවලින් ආරක්ෂාව ලැබුවේය" අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි '**ඔහු සිය කැමැත්තෙක් කිසිවක් ප්‍රකාශ නොකරයි'**

**❸ එතුමන් වැළැක්වූ දෑ වලින් වැළකීම :-** පාපයන්ගෙන් අති මහත්වූ 'ෂිර්ක්' හා අනෙකුත් මහා පාපයන්" කුඩා පාපයන් හා එතුමන් ප්‍රතික්ෂේප කළ දෑ ඇතුළු පාපයන් සියල්ලෙන්

ඇත්වී සිටීම අවශ්‍ය වන්නේය˝ මුස්ලිම්වරයෙකු තම නබිවරයාට සෙනෙහස දක්වන තරමට ඔහුගේ විශ්වාසය අධික වෙයි˝ විශ්වාසය අධික වූ විට යහපත් ක්‍රියා කිරීම ඔහුට ප්‍රිය වෙයි˝ දේව ප්‍රතික්ෂේප කිරීම හා පාපයන් ඔහුට අප්‍රිය වෙයි˝

**❹ අල්ලාහ් ඔහුගේ නබිවරයා මගින් දහම ලෙස පෙන්වා දුන් දෑ තුළින් හැර අල්ලාහ්ට නැමදුම් නොකළ යුතුය :-**

නැමදුම් වත්පිළිවෙත් කිසිවක් අළුතෙන් ඇතිකර ගැනීම තහනම්ය˝ කුමක් අනුමැතිය ලබා ඇද්ද එය පමණක් නැමදුම ලෙස ඉටුකළ හැක˝ රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ˝' **කවරෙකු හෝ අප විධානය නොකළ යමක් කරයි නම් එය අනුමත නොවන්නේය** (මුස්ලිම්)

පාඩමක් දැන ගනු˝ නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමන්ට සෙනෙහස දැක්වීම නුඹට අනිවාර්ය වගකීමකි˝ හුදෙක් මනාපය පමණක් ප්‍රමාණවත් නොවේ˝ ඔබේ ප්‍රාණය ඇතුළු සියල්ලට වඩා නුඹට ඉතා සෙනෙහසක් ඇති කෙනෙක් විය යුතුය˝ කෙසේ ද යත් යමෙක් යමක් ආදරය කරන්නට පටන් ගන්නේ ද ඔහු එය ඉදිරියට තබා ඒහා සමානව කටයුතු කරන්නට පටන් ගනී˝

**සටහන** :- නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ට ආදර සෙනෙහස දක්වන්නට කවරෙකු සැබැවින්ම කටයුතු කරයි ද ඔහු තුළින් එම සලකුණු පහළ වෙයි˝ එනම් තම වචනය හා ක්‍රියාවෙහි එතුමන්ගේ ප්‍රතිපත්තීන් පිළිපදින අතර ඔහුගේ හොඳ තත්ත්වයේ ද නරක තත්ත්වයේ ද මනාප අමනාප හැම අවස්ථාවකම එතුමන්ගේ අණට කීකරු වී එතුමන් වැළැක්වූ දැයින් වැළකී˝ එතුමන්ගේ විනයගරුකභාව ශික්ෂාකාමීව පිළිපදින්නෙකුව ද දැකිය හැක˝ මන්ද අවනත වීමත් පිළිපැදීමත් ආදරයේ ප්‍රතිචාරය වන්නේය˝ ඒ දෙකෙන් තොර ආදර සෙනෙහස සැබෑ එකක් නොවනු ඇත˝

**නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ට ආදර සෙනෙහස දැක්වීමේ සලකුණු කීපයක් මෙසේය˝**

(1) එතුමන්ට අධිකව මතක් කිරීම˝ එතුමන්ගේ නමින් සලවාත් කීම කවරෙකු යමකට ආදරය කරයි ද ඔහු එය අධිකව සිහිපත් කරයි˝ (2) එතුමන්ව මුණගැසීමට ආසා කරයි˝ සෑම ආදර වන්තයෙක්ම තම ආදරවන්තයාව හමුවීමට ආසා කරයි˝ (3) එතුමන්ව සිහිපත් කරන විට එතුමන්ට ගරු කිරීම˝ (ඉෂ්හාක් තුමා මෙසේ කියයි˝ නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමන්ගේ මරණයට පසු එතුමන්ගේ මිත්‍රයෝ සිතේ බිය උපදවා ප්‍රමෝදයට පත්වී ඇති තත්ත්වයට පත්වූහ˝ (4) එතුමන් ප්‍රිය නොකළ අයව ප්‍රිය නොකර විරුද්ධවූවන්ට විරුද්ධ වී කුහකයින් හා බිද්අත් කරුවන්ගෙන් එතුමන්ගේ සුන්නාට වෙනස්කම් කරා දහමේ නවීන දේවල් ඇති කළ අය ඈත් කිරීම (5) එතුමන්ගේ පවුලේ අය˝ බිරියන් හා දරුවන් හා එතුමන්ගේ මුහාජිර්˝ අන්සාරි මිතුරන් ඇතුළු එතුමන් ආදරය කළ හැම කෙනෙකුටම ආදරය දැක්වීම ඉහත සඳහන් අයව ප්‍රිය නොකරන අයව අපද ප්‍රිය නොකිරීම හා ඔවුනට දෝෂාරෝපණ කරන්නන්ගෙන් ද ඈත්වී සිටීම˝ (6) එතුමන්ගේ යහපත් ගතිගුණ අපේ ජීවිතයට රැගෙන ඒ අනුව ජීවත්වීම නබි තුමෝ යහපත් ගතිගුණ අතින් මානව සංහතියේම ප්‍රදීපාගාරයක් වූහ˝ එමනිසාම ආයිෂා (රළියල්ලාහු අන්හා) මව්තුමිය දේව දූතයාගේ ගුණය අල් කුර්ආනය විය යැ'යි පැවසුවාය˝ එනම් කුර්ආනය අණ නොකළ කිසිවක් එතුමා නොකරයි˝

එතුමන්ගේ ගුණය ගැන සලකා බලන විට එතුමාණෝ මිනිස් සමාජය තුළ ඉතාමත් එඩිතර පුද්ගලයෙක් වූහ˝ යුද්ධමය අවස්ථාවල ඉතා අවදානම් තත්ත්වයන්හිදී ද එඩිතරව සිටියහ˝ තවද ඉතාමත් දානපතියෙකු ලෙසද රාමසාන් මාසයේ රාත්‍රි නැමදුමෙහි යෙදෙන්නෙකු ලෙසද යහගුණ දේශකයෙකු ලෙස ද පෞද්ගලිකව කිසිවෙකුගෙන් පලිනොගත්හ˝ දෙවියන්ගේ කටයුතුවලදී මිනිසුන් අතර ඉතාමත් පුරෝගාමියෙක් වූ අතර නිවස තුළ සැඟවී සිටින කණ්‍යා ස්ත්‍රියකට වඩා ලැජ්ජාශීලි ද වූහ˝ තම පවුල හා සෑම ජීවයෙක් ගැන කරුණාව දැක්වූ මහා කාරුණිකයෙකු ද වූ අතර තවත් අනන්ත අප්‍රමාණ ගුණ යහපත්කම්වලින් පෝෂණය වී සිටියහ˝

# පිරිසිදු කම

ඉස්ලාමයේ දෙවන වගකීම වන සලාතය පිරිසිදුකමින් තොරව ඉටු නොවේ" ජලය හෝ පස් නොමැතිව පිරිසිදු විය නොහැක"

**ජලයේ ප්‍රභේද** :- 1" **තාහිර්** ජලය අති පිරිසිදු ජලයයි" අනෙක් ඒවා ද පිරිසිදුකළ හැකි එකකි" එය කිළිට ද නජීසය ද ඉවත් කරයි" 2" **නජීස්"** නජීස් සමග මිශ්‍ර වු සුළු ප්‍රමාණයේ ජලය හා නජීස් නිසා පාට" රසය හා ගඳ ආදියෙන් වෙනස් වු අධික ජලය"

**විශේෂ සටහන** :- අධික ජලය නජීස් නිසා එහි පාට රසය හා සුවඳ ආදියෙන් කුමක් හෝ එකක වෙනසක් ඇතිවුවහොත් පමණක් නජීස් වෙයි" සුළු ජලයේ නජීස් වැටුනු විහා නජීස් වෙයි"

කුල්ලත් දෙකක් (සාමාන්‍යයෙන් ලීටර් 210ක් පමණ) වු ජලය අධික ජලය නමින් හැඳින්වේ"

**භාජන** :- රන්" රිදී හැර අනෙක් සෑම පිරිසිදු භාජනයක්ම පාවිච්චි කළ හැක" රන් රිදී භාජනවලින් පිරිසිදු කළ ද පිරිසිදු වෙයි" එහෙත් එය වරදකි" කාෆිර්වරුන්ගේ භාජන හා ඇඳුම් නජීස් යැයි ස්ථිර වශයෙන් ම දැන ගන්නා තෙක් පාවිච්චි කළ හැක"

**මළ සතුන්ගේ හම්** :- මළ සතාගේ හම නජීස්ය" මළ සතුන් දෙවැදෑරුම් වෙයි" 1" එහි මස් කෑමට අනුමත නොවු සතුන් 2" කෑමට අනුමත වුව ද නො කැපු සතුන් මේවායේ හම් පදම් කරනු ලැබු විට වියලි ඒවා පාවිච්චි කළ හැක" නෙතමන ඒවා පාවිච්චි කළ නොහැක"

**මල මුත්‍ර පිරිසිදු කිරීම** :- පෙර පසු විවරයන්ගෙන් යමක් පිටවුවහොත් පිරිසිදු කිරීම අවශ්‍ය වෙයි. ජලයෙන් පිරිසිදු කරන දෑ 'ඉස්තින්ජා' යනුවෙන් ද ගල්කැටවලින් පිරිසිදු කරන දෑ 'ඉස්තිජ්මාර්' යනුවෙන්ද ව්‍යවහාර වේ. ගල්වලින් පිරිසිදු කරන්නේ නම් එය පිරිසිදුවු ද ජලය උරාගත හැකිවුද ආහාර ද්‍රව්‍යයක් නොමැති වු එකක්ව ද වියයුතුයි. ඒ සඳහා ගල් කැට තුනක් හෝ ඊට අධික ප්‍රමාණයක් අවශ්‍යය. වැසිකිළි වැසිකිළි යන්නා අධික වේලාවක් වැසිකිළියේ ඉඳීමෙන් වැළකිය යුතුය" ජලාස" මංමාවත්" මිනිසුනට සෙවන දෙන ගස් හා පළතුරු ගස් යට මලමුත්‍රා කිරීම නුසුදුසුය"

**දත් මැදීම** :- 'අරාක්' වැනි සුමුදු දැහැටිකුරුවලින් දත් මැදීම සුන්නත් වෙයි. සලාතය, කුර්ආනය කියවීම, වුළු, නින්දෙන් අවදිවීම, මස්ජිදයට හෝ නිවසට ඇතුල් වීම, කටේ දුගඳක් ඇතිවීම ආදි අවස්ථාවන් හි එය ප්‍රධාන සුන්නතයකි. දත් මැදීම හා පිරිසිදු කිරීම දකුණෙන් ආරම්භ කළ යුතුය. එසේ කිරීම සුන්නතයකි"

**වුළුහි අනිවාර්ය (ෆර්ල්) ඒවා** :- 1" මුහුණ සේදීම" (කට කැලැත්තීම හා නාසයට ජලය ඇතුළත් කිරීම ද එයට අයත්ය") 2" ඇඟිලි තුඩු වල සිට වැලමිට දක්වා අත සේදීම 3" හිස සම්පූර්ණයෙන් කන්දෙකත් සමග ජලයෙන් පිරි මැදීම 4" ඇස්වටය ඇතුළුව දෙපාදය සේදීම 5" ඉහත කී ඒවා අනුපිළිවෙලින් කිරීම 6" එක දිගට කිරීම

**වුළුහි සුන්නත්** :- දත් මැදීම" මුහුණ සේදීමට පෙර කටකැලැත්තීම හා නාසයට ජලය ඇතුල් කිරීම " උපවාසයේ නියැළෙන අය කට කැලැත්තීම හා නාසයට ජලය ඇතුල් කිරීම ප්‍රවේසමෙන් ඉටු කිරීම" ඝණකමින් යුත් යටි රැවුල ඇඟිලිවලින් පීරා සේදීම" ඇඟිලි කුරු අතුල්ලා දෙවන" තුන්වන වාරයක් සේදීම" දකුණු අතින් නාසයට ජලය ඇතුල් කර වම්මතින් සුරා දැමීම" වුළුව සම්පූර්ණයෙන් ඉටු කිරීම" වුළු කිරීමෙන් පසු එහි 'දුආ' ප්‍රාර්ථනය කිරීම"

**වුළුහි වාජිබ් (අවශ්‍යම දෑ)** :- බිස්මියෙන් ආරම්භ කිරීම" නින්දෙන් අවදි වු තැනැත්තා ජලයේ අත ගිල්වන්නට පෙර අත්දෙක (වැලිමිටෙන් පහළ) සෝදා ගැනීම ආදියයි"

**වුළු කරන පිළිවෙල** :- වුළූ කරන බව සිතේ ධාරණය කරගෙන බිස්මි කීම" පසුව ඉදිරිපස අත්දෙක සේදීම" කට කලත්තා නාසයට ජලය ඇතුල් කිරීම" මුහුණ සේදීම (මුහුණේ සීමාවන් :- දිගින් හිසේ කෙස් පැලවුන ස්ථානයේ සිට නිකටේ යටි පෙදෙස දක්වා" පළලෙන් කන්දෙක අතර ප්‍රදේශයයි") පසුව වැලමිට දක්වා අත් දෙක සේදීම" නළලේ අවසානයේ හිසේ ආරම්භයේ සිට උකුණුවල දක්වා හිස සම්පූර්ණයෙන්ම ජලයෙන් පිරි මැදීම (කණෙන් ඉහල සුදු පැහැති කොටස ද හිසට අයත්ය") දබරැඟිලි දෙක කණ් තුළට යවා මහපටඇඟිලි දෙකෙන් කන්දෙකේ පිට පැත්ත පිරිමැදීම" පසුව පා දෙක ඇස් වටය දක්වා සේදීම"

**සැලකිල්ලට ගත යුතුයි :-** යටි රැවුල තුනීවට ඇත්නම් රැවුල තුළ හමද සේදිය යුතුයි" යටි රැවුල ඝණකමට ඇත්නම් රැවුල පිරා සේදීම ප්‍රමාණවත්ය"
හුෆ් දෙක මත මස්හු කිරීම (ජලයෙන් පිරිමැදීම) 'හුෆ් යනු හම්වැනි දැවලින් නිම වූ පාවහන්ය" කම්බිලි වැනි දැවලින් නිම වූ ඒවානම් ඒවාට 'ජව්රබ්' (මේස්) කියනු ලැබේ" වුළු කිරීමේදී පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ වී ඇත්නම් මේවා මත ජලයෙන් පිරිමැදීම ප්‍රමාණවත්ය" **1"** (පාදදෙක සෝදා) වුළු සහිතව සිටින විට පැළඳිය යුතුය" **2"** තයම්මුම් නොව" ජලයෙන් කරන ලද වුළු විය යුතුය" **3"** පාදයේ අනිවාර්යයෙන් සේදිය යුතු ප්‍රදේශ වැසී තිබිය යුතුය" **4"** අනුමත එකකින් නිමාවූ ඒවා විය යුතුය" **5"** පිරිසිදු ඒවා විය යුතුය"

**හුෆ් දෙක මත මස්හු කළ යුතු ප්‍රමාණය :-** පා ඇඟිලිවල සිට ඇස්වටයේ පිටපැත්තෙන් ඉහළ ප්‍රදේශය" අතැඟිලි දිග හැර ඇඟිලිවලින් මස්හු කරනු ලැබේ"
දකුණ මුල් නොකර පාද දෙකම එකවර කිරීම වැදගත්ය"
හුෆ්ෆෙහි යටි පැත්ත හෝ විලුඹ හෝ මස්හු නොකළ යුතුය" කුෆ් මස්හු නොකර සේදීම" හුෆ්නය නවා කිරීමද මක්රූහ් වෙයි"

**තලප්පාව :-** පහත සඳහන් කොන්දේසි මත තලප්පා මත ද ජලයෙන් පිරිමැදිය හැක" **1"** තලප්පා පැළඳීම පිරිමයෙකු විය යුතුය" **2"** හිසේ ප්‍රදේශය සම්පූර්ණයෙන් වැසී තිබිය යුතුය" **3"** වුළු කරන අවසථාවේ පමණක් කළ යුතුය" **4"** ජලයෙන් කෙරෙන වුළුවක් විය යුතුය"

**මොට්ටැක්කිලිය :-** පහත සඳහන් කොන්දේසි මත මොට්ටැක්කිලිය මත ද ජලයෙන් පිරිමැදිය හැක" **1"** ගැහැණුන්ට අයත් එකක් විය යුතුය" **2"** වුළු කරන අසථාවක් විය යුතුය" **3"** වතුරෙන් කෙරෙන වුළුවක් විය යුතුය" **4"** උගුර යටින් ඔතන ලද එකක් වීම **5"** හිසේ කවදත් වැසෙන ප්‍රදේශය වසා තිබිය යුතුය" තලප්පා" මොට්ටැක්කිලිය යනාදියෙන් වැඩිහරියක් මස්හු කළ යුතුය" මස්හු කරන්නට අනුමතවූ කාලය :- ගමේ පදිංචිව සිටින කෙනෙකු නම් එක්දවස මස්හු කිරීමට අනුමත ලබයි" එක් මගියෙකු නම් කෙටිකර සලාතය කරන්නට අනුමත කරන ලද **(ගමනේදුර කි"මී" 85)** ගමනේ යෙදී ඇත් නම් ඒ සඳහා දහවල් තුනක හෝ රාත්‍රි තුනක කාලය තුළ මස්හු කරන්නට අනුමැතිය ලබයි"

**කාලයේ ආරම්භය :-** ගමේ පදිංචිව සිටින්නෙකු නම් මස්හු පැලදගත් පසු පළමුවෙන් වුළු අවලංගු වන කාලයේ සිට ආරම්භ වී පහුවදා එම වේලාව දක්වා පවතී" **(පැය 24ක්)** (මගියෙකුට දින තුනක්)

**සටහන :-** ගමනේ දී මස්හු ආරම්භකර ගමට පැමිණියොත් හෝ ගමෙන් ආරම්භකර පසු ගමන් කළහොත් හෝ ආරම්භ කළ වේලාවේ සැකයක් පහළ වුවහොත් හෝ ගමේ සිටින්නෙකුට අයත් නීතිය පිළිපදියි"

**ජබීරත් :-** ජබීරත් යනු ඇටකටු බිඳුණු විටක එයට තබා බඳිනු ලබන ලෑල්ලයි" පහත සඳහන් කොන්දේසි තුන අනුව එය ජලයෙන් පිරිමැදිය හැක" **1"** අවශ්‍යතාව උඩ එය බැඳිය යුතුය" **2"** අවශ්‍ය ප්‍රදේශය ඉක්මවා නොයා යුතුය" **3"** එය ජලයෙන් පිරිමැදිය යුතු අතර අනෙක් ප්‍රදේශ සේදිය යුතුය" අවශ්‍ය ප්‍රදේශයට වඩා එය ඉක්මවා ඇත්නම් එය ඉවත් කළ යුතුය" ඉවත් කිරීමෙන් යම් ආපදාවක් ඇතිවේ යන බිය නම් ජලයෙන් පිරිමැද ගත හැක"

**වුළු අවලංගු වන දෑ:- 1"** පෙර පසු විවරයන්ගෙන් පිටවන දෑ ඒවා :- වාතය හෝ මල" මුත්‍රා වැනි නජීස් විය හැක" **2"** නින්ද හෝ ක්ලාන්තය වැනි දැයින් පියවි සිහියෙන් තොරවීම වාඩිවී සිටියදී හෝ සිටගෙන සිටියදී ඇතිවන කෙටි නින්ද හැර **3"** මලමුත්‍රා සුපුරුදු මාර්ගවලට අමතර මාර්ගයන්ගෙන් පිටවීම" **4"** මලමුත්‍රා නොවන නජීස් වූ ද්‍රව්‍යයක් අධික වශයෙන් පිටවීම (රුධිරය වැනි දෑ) **5"** ඔටු මාංශ ආහාරයට ගැනීම **6"** තිරයෙන් තොර ලිගුව ඇල්ලීම **7"** ගැහැණිය පිරිමියෙකුව හෝ පිරිමියා ගැහැණියෙකුව තිරයෙන් තොරව රාගික හැඟීමෙන් ඇල්ලීම **8"** දහමෙන් පිටමං වීම"

**සටහන:-** කවරෙකුට හෝ වුළු කළ බව ස්ථිරවී" එය බිඳීගියේ දැයි සැකයක් ඇති වූ විට හෝ එය බිඳුණු බව සථිරවී ඉන්පසු වුළු කළා ද? නැද්දැයි සැකයක් ඇති වූවිටක සථිරවූ දෑ අරගත හැක" සැකය අත්හළ යුතුය"

**ස්නානය** :- නෑම අනිවාර්ය කරන දෑ 1“ අවදිව සිටිය දී හැඟීමෙන් යුතුවද නින්දේදි හැඟීමෙන් යුතුව හෝ හැඟීමකින් තොරවද ශුක්‍රාණු පිටවීම 2“ පිරිමියෙකුගේ චර්ම ඡේදනය කළ සීමාව දක්වා ගැහැණියකගේ යෝනිය තුළට ඇතුල් වීම (ශුක්‍රාණු පිටනොවුවත් කමක් නැත“) 3“ කාෆිර්වරයෙකු ඉස්ලාමයට ඇතුල් වීම“ 4“ මාසික ඔසප් වීම 5“ ප්‍රසූතියේ රුධිරය පිටවීම 6“ මුස්ලිම්වරයෙකු මරණයට පත්වීම“

**නෑමේදී අනිවාර්ය කරුණු** :- අනිවාර්ය නෑම ඉටුකරන අරමුණෙන් කට හා නාසය ආදියේ ඇතුළත ද ශරීරය සම්පූර්ණයෙන් ද ජලයෙන් සේදුන විට නෑම ඉටු වන්නේය“ එහෙත් නෑම සම්පූර්ණ වීමට පහත සඳහන් කරුණු ද ඉටු විය යුතුය:- 1“ නිය්යත් (සිතුවිල්ල) 2“ බිස්මි කීම 3“ අත්දෙක භාජනයට දමන්නට පෙර සොදා ගැනීම 4“ ලිඟුව හා අපිරිසිදු (පිළිකුල් දෑ ගෑවුන) ප්‍රදේශ සෝදාගැනීම 5“ වුළු කර ගැනීම 6“ පළමුවෙන් හිසමතට තුන්වරක් ජලය වත් කිරීම 7“ පසුව ශරීරයේ සෙසු ප්‍රදේශවලට ජලය වත් කිරීම 8“ අත් දෙකෙන් ශරීරය ඇතිල්ලීම“

**වුළු නොමැතිව නොකළ යුතු ක්‍රියා** :- 1“ කුර්ආනය ස්පර්ශ කිරීම“ 2“ සලාතය ඉටු කිරීම 3“ තවාෆ් (කඃබාහ්ව පැදකුණු) කිරීම“

**නෑම අනිවාර්ය වූ අයෙක් ඉහත සඳහන් දෑ සමග පහත සඳහන් දෑ ද නොකළ යුතුය“**

1“ කුර්ආනය කියවීම 2“ මස්ජිදයේ රැඳී සිටීම නෑම අනිවාර්ය වූ අයෙක් වුළු රහිතව නිදාගැනීම ද නානවිට ජලය නාස්ති කිරීමෙන් ද වැලකී සිටිය යුතුය“

**තයම්මුම් හා එහි කොන්දේසි** :-

1. ජලය පාවිච්චි කළ නොහැකිවීම 2“ දූවිල්ල ඇති නොපිළිස්සු පිරිසිදු පස් ලබාගැනීම“

**තයම්මුමෙහි පර්ල් (අනිවාර්ය ක්‍රියා)** 1“ මුහුණ පිරිමැදීම 2“ වැලම්ටෙන් පහළ අත් දෙක මැණික් කටුව දක්වා පිරිමැදීම 3“ කී පරිදි අනුපිළිවෙලින් කිරීම 4“ එකදිගට කිරීම

**තයම්මුම් අවලංගු වන කරුණු**

1“ වුළු අවලංගු වන සියලු ක්‍රියාවන් 2“ ජලය නොමැති නිසා තයම්මුම් කර ඇත්නම්” ජලය ලබාගැනීම 3“ ජලය පාවිච්චි කළ නොහැකි තත්ත්වයක සිටි අයෙක් පාවිච්චි කළහැකි තත්ත්වයට පත්වීම“

**තයම්මුම්හි සුන්නත්** :- 1“ නෑම වෙනුවට තම්මුම් කරන්නා අනුපිළිවෙලින් හා එකදිගට ඉටු කිරීම“ 2“ අවසාන මොහොත දක්වා ප්‍රමාද කිරීම“ 3“ වුළු කිරීමෙන් පසු කරන ප්‍රාර්ථනා හා දික්ර් ආදිය ඉටුකිරීම“

**සටහන** :- අත් දෙක වැඩි වාර ගණනාවක් පොළොවට ගැසීමෙන් වැළකීම“

**තයම්මුම් කරන පිළිවෙල** :- චේතනාව හා බිස්මි කීමත් සමග අත්දෙක පස් මත තට්ටු කර” පසුව දෑතේ ඇතුල් පැත්තෙන් (අල්ලෙන්) මුහුණ හා යටිරැවුල පිරිමැදීම“ පසුව වම් අල්ලෙන් දකුණු අතේ මැණික් කටුවේ පිට පැත්ත හා දකුණු අල්ලෙන් වම් අතේ මැණික් කටුවේ පිටපැත්ත පිරිමැදිය යුතුය“

**නජීසය ඉවත් කිරීම** :- එය තුන්වැදෑරුම් වෙයි“

1“ (පණ ඇති) සතුන් :- ඒවා දෙවැදෑරුම්ය“

(1) **නජිස් වූ ඒවා“** එනම් බල්ලා” ඌරා හා ඒවා ප්‍රසූත කළ දෑය. තවද කෑමට අනුමත නොවූ පක්ෂීන් හා බළලුන්ට වඩා විශාල සතුන් ය. ඔවුන්ගේ මල මුත්‍රා, වමනය,දහඩිය” කිරි හා කෙල යනාදින් නජස් වේ.

(2) **පිරිසිදු දෑ“ ඒවා** තුන් වැදෑරුම්ය“ (අ) මිනිසා ඔහුගේ දහඩිය” කෙල” ශුක්‍රාණු” තවද මල”මුත්‍රා” මදි (ශුක්‍රාණුව පෙර දියරය) හා රුධිරය හැර අනෙකුත් අපද්‍රව්‍ය” ගැහැණියගේ යෝනියේ තෙතමනය“ (ආ) කෑමට අනුමත කරන ලද සතුන්ගේ මල” මුත්‍රා” ශුක්‍රාණු” කිරි දහඩිය හා කෙල“ (ඇ) වළක්වා ගැනීමට අපහසු (බළලා” මීයා වැනි) සතුන්ගේ කෙල හා දහඩිය”

2“ මළ ප්‍රාණීන් :- මිනිසා” තණකොළ පෙත්තා” මාළුවා” රුධිරය ගලා නොයන සතුන් හැර අනෙක් හැම මළ සතෙකුම නජීස්ය“

3“ අනෙකුත් භෞතික ද්‍රව්‍ය:- පළමුවෙන් ප්‍රකාශ කළ දෑ හැර අනෙක් භෞතික ද්‍රව්‍යයක්ම පිරිසිදු ඒවාය“

**සටහන :** රුධිරය” සැරව” ආදිය නජීස්ය“ පිරිසිදු සතෙකුගේ ඉහත සඳහන් අප ද්‍රව්‍ය මඳක් තැවරී තිබුණේ නම්” සලාතයේදි ඔහුට ක්ෂමාව ලැබේ“ මාළු, කපන ලද සතෙකුගේ මාංශයෙහි නහරවල රැඳී ඇති රුධිරය පිරිසිදුය. කෑමට අනුමත කළ සතාගේ ශරීරයෙන් ජීවත්ව සිටිය දී කපාගත් දෑ නජීස්ය“ ගර්භාෂයෙන් ගත් රුධිර කැටය හා මාංශ කැටය ද නජීස්ය.නජීස් ඉවත් කරන්න අධිෂ්ඨානය (නියයත්) අවශ්‍ය නැත“ වැස්ස ආදියෙන් නජීස් ඉබේම ඉවත් වුවහොත් පිරිසිදු වන්නේය“ නජීසය අතින් ඇල්ලීම හෝ ඒ මත ගමන් කිරීම නිසා වුළු අවලංගු නොවේ“ නජීසය හා එය ගෑවුන තැන ද පිරිසිදු කළ යුතුය“

**නජීස් ගෑවුන තැන පිරිසිදු වීමට කොන්දේසි තුනක් ඇත:-**

1“ මනා පිරිසිදු වූ ජලයෙන් සේදිය යුතුය“ 2“ මිරිකා දැමිය හැකි දෙයක් නම් මිරිකා දැමිය යුතුය“ 3“ සේදීමෙන් පමණක් ඉවත් කළ නොහැකි නජීසය පහුරුගා ඉවත් කළ යුතුය“ 4“ බල්ලාන් හා සම්බන්ධ නජීසයක් නම් හත් වරක් සේදිය යුතුය“ එක වරක් පස් හා සබන් දමා සේදිය යුතුය“

**අවධානය යොමුකළ යුතු සමහර කරුණු** :-පොළොවේ ඇති නජීසය” මුත්‍රා වැනි ද්‍රව්‍යයක් වෙයි නම් නජීසය” එහි පාට හා ගඳ ඉවත්වන තෙක් ජලය වත්කිරීම ප්‍රමාණවත්ය“ මළ වැනි ඝන ද්‍රව්‍යයක් නම් එයත් එය තිබුණ සලකුණත් පළමුවෙන් ඉවත් කළ යුතුය“ නජීස් තිබුණ ස්ථානය දැනගත නොහැකි නම් ඒ ප්‍රදේශයම සේදිය යුතුය“ සුන්නත් සලාතයට වුළු කරගත් විට එයින් ෆර්ල් සලාතය ද ඉටු කළ හැක“ නිදාගත් විට හෝ වාතය පිටවුවහොත් සලාතයට වුළු කිරීම හැර කිසි තැනක් සේදිය යුතු නැත.

# ගැහැණුන්ගේ සුපුරුදු මාස් ශුද්ධිය පිළිබඳ නීතීන්

## හයිල් හා ඉස්තිහාලා :-

| නිතරීතීන් | තීන්දු |
|---|---|
| ගැහැණියකට හයිල් හෙවත් මාස් ශුද්ධිය ඇතිවන අවම වයස් සීමාව අවුරුදු නවයකි“ | එයට කළින් ඇයගේ යෝනියෙන් රුධිරය මතුවෙයි නම් එයට 'ඉස්තිහාලා' නමින් හැඳින්වෙයි“ මාස්ශුද්ධිය සඳහා වැඩි වයසට සීමාවක් නැත. |
| මාස්ශුද්ධිය පවතින අවම කාලය පැය 24කි“ | එයට වඩා අඩු කාලයක් පවතී නම් එය 'ඉස්තිහාලා' වෙයි. |
| එය පවතින ඉතා අධික කාල සීමාව වන්නේ දින 15කි“ | එම කාලයට අධිකව පවතීනම් එයද 'ඉස්තිහාලා' වෙයි. |
| මාස් ශුද්ධිය දෙකක් අතර කාලය දින 13කි. | දින 13කට කලින් රුධිරය පිටවෙයි නම් එය ද 'ඉස්තිහාලා' වෙයි“[1] |
| ගැහැණුන්හට සාමාන්‍යයෙන් මාස්ශුද්ධිය පවතින කාලය | දින හයක් හෝ හතකි. |
| බොහෝ දුරට මාස්ශුද්ධි දෙකක් අතර කාලය | දින 23ක් හෝ 24කි. |
| දරු ප්‍රසුති අවස්ථාවේ දී පිටවන රුධිරය මාස්ශුද්ධි රුධිරය ද? | ගර්භනි කාන්තාවන්ගෙන් පිටවන දම්පාට[2] හා කහපාට[3] රුධිරය ද 'ඉස්තිහාලාය. |
| කාන්තාවක් තමා පිරිසිදුවූ බව දැනගන්නේ කෙසේද? | මෙ හා සම්බන්ධව කාන්තාවන් ගණ දෙකකින් යුක්ත වේ. 1. ඇය සුදු පැහැති ද්‍රාවණය දකින්නී නම් ඇය පිරිසිදු වූවාය. 2. රුධිරය කහපාට හෝ බොර පාටින් නොමැතිව යෝනිය වියලි ස්වභාවයෙන් යුක්තනම් ඇය පිරිසිදු වූවාය. |
| පිරිසිදු වූ පසු කාන්තාවකගේ යෝනියෙන් පිටවන ද්‍රාවණය“ | එය සිනිඳුවට ඇලෙන සුළුනම් එය පිරිසිදුය. රුධිරයක් ලෙස“ කහපාටට හෝ දුඹුරු පාටට ඇත්නම් එය නජීස්ය. මේ සියල්ල තුළින් වුළු බිදීය යි. මේ හැර සෙසු දෑ දිගටම සිදුවේ නම් එය 'ඉස්තිහාලා' වෙයි. |
| යෝනියෙන් පිටවන බොර පාට හා කහපාට | මේවා මාස්ශුද්ධියත් සමග අඛණ්ඩව පවතී නම් එය ද මාස්ශුද්ධියේ නීතියට අයත්ය. තනිව පිටවෙයි නම් 'ඉස්තිහාලා' වෙයි. |
| සුපුරුදු කාල සීමාවට කලින් පිරිසිදුවීම | සුපුරුදු කාලසීමාවට කලින් රුධිරය නවතී නම් ඇය පිරිසිදු වූවා යැයි සැලකේ. |
| සුපුරුදු කාලයට පෙර හෝ පසුව රුධිරය පිටවීම | ඔසප් භාවයට අවශ්‍ය ලක්ෂණ සහිතව පළමු ශුද්ධිය ඇති වී දින 13කට වැඩි නම් එයද මාස්ශුද්ධියක් ලෙස ගණන් ගැනේ.එසේ නැතිනම් එය 'ඉස්තිහාලා' වෙයි. |
| සුපුරුදු කාලයට වඩා වැඩියෙන් හෝ අඩුවෙන් රුධිරය පිටවීම | දින 15ක් ගත නොවූවා නම් එයද මාස්ශුද්ධිය මෙන්ම ගණන් ගැනේ. |
| කාන්තාවකට දින ගණනාවක් අඛණ්ඩව රුධිර පිටවෙයි නම් | එවැනි ගැහැණුන්හට ඔවුන්ගේ කරුණු තුනක් දැකිය හැක:-<br>1“ සෑම මාසයකම හයිල් ඇති වන දිනය හා පවතින කාලය දැනගත යුතුය“ ඇගේ රුධිරය ඒකකාකාරව හෝ වෙනස් ස්වරූපයකින් ඇත“ මෙවැනි කාන්තාවක් නියමිත කාලය දක්වා මාස්ශුද්ධිය ලෙසද ඊටපසු 'ඉස්තිහාලා' ලෙසද ගණන් ගත යුතුය“<br>2“ සෑම මාසයකම ශුද්ධිය ඇතිවන දිනය දන්නීය“ එහෙත් කොතරම් කාලයක් පවතී දැයි නොදන්නීය“ ඇය සුපුරුදු දිනයේ සිට දින 6ක් හෝ 7ක් හයිල් ලෙස ගණන් ගත යුතුය“<br>3“ සෑම මාසයකම හයිල් ඇතිවන දිනය නොදන්නීය“ එහෙත් පවතින කාලය දන්නීය“ ඇය සෑම චන්ද්‍ර මාසයකම ආරම්භයේ සිට නියමිත කාලය මාස් ශුද්ධිය ලෙස ගණන් ගන්නීය. |

---

[1] හයිල් හෙවත් දරු ප්‍රසුතිය වැනි හේතුවකින් තොරව නිරෝගිව සිටිය දී පිටවෙන රුධිරය“ ස්වභාවිකම පිටවන රුධිරයයි. අකාලයේ පිටවන රුධිරය 'ඉස්තිහාලා' නම් වේ“

**ඒ දෙක අතර වෙනස :-** මාස් ශුද්ධියේ දී පිටවන රුධිරය කළු පැහැයට හුරු තද රතුපාටින් යුත් ඝනත්වයකින් හා දුගඳකින් යුක්තය. මෙය කඩින් කඩ පිටවෙයි. 'ඉස්තිහාලා' කළු පැහැයෙන් තොර රුධිරයක් හා දුගඳ රහිත ඝනත්වයෙන් තොර වූ එකක් ද වෙයි.

**මාස්ශුද්ධිය කාලයේ** උපවාසයේ නියැලීම, සලාතයේ යෙදීම, කඃබාව පැදකුණු කිරීම, කුර්ආනය කියවීම හා ඇල්ලීම, මස්ජිදයේ රැඳී සිටීම, සංසර්ගයේ යෙදීම හා දික්කසාද වීම ආදිය තහනම්ය

[2] දම්පාටට හුරු යොනියෙන් ගලන රුධිරය

[3] කහ පැහැයට හුරු යෝනියෙන් ගලන රුධිරය“

# නිෆාස් හෙවත් දරු ප්‍රසූතියෙන් පසුව පිටවන රුධිරය

| නීතරීතීන් | තීන්දු |
|---|---|
| කාන්තාවකට දරු ප්‍රසූතියෙන් පසුව රුධිරය පිට නොවෙයි නම් | ඇයට ප්‍රසූතිය කළ කාන්තාවන්ට අයත් කිසිදු නීතියක් ක්‍රියාත්මක නොවේ“ ඇයට නෑම අනිවාර්ය නැත“ උපවාසය අවලංගු වන්නේ ද නැත“ |
| ප්‍රසූතියේ සලකුණු දැන ගැනීම | ප්‍රසූතියට මදක් කලින් කැක්කුමක් සමග පිටවන රුධිරය හා දියරය ආදිය ’ඉස්තිහාලා’ වෙයි“ |
| ප්‍රසූතියේ දී පිටවන රුධිරය | දරුවා බිහිවීමට කළින් හෝ කොටසක් පිටතට ඇවිත් තිබුණ ද මෙය ප්‍රසූති ශුද්ධියක් යැයි කිව හැක“ මෙම කාලයේ සලාතය හිලව් කළ යුතු නැත“ |
| ප්‍රසූත ශුද්ධිය ආරම්භ වන්නේ කවදා ද? | ළදරුවා සම්පූර්ණයෙන් පිටතට ආපසු ප්‍රසූත ශුද්ධිය ආරම්භවෙයි“ |
| නිෆාස් නම් ප්‍රසූත ශුද්ධියේ අවම කාලය කොපමණ ද? | අවම කාලය කියා කිසිවක් නොමැත“ ප්‍රසූතියත් සමග රුධිරය නවතී නම් වහාම ස්නානය කර සලාතය කළ හැක“ දින හතලිහක් දක්වා බලාපොරොත්තුවෙන් සිටිය යුතු නැත“ |
| නිෆාස් හි වැඩිම කාලය කොපමණ ද? | දින හතලිහකි“ ඊට වඩා වැඩි නම් එය ගණන් නොගැනේ“ දින හතලිහක් ගතවූ පසු ස්නානය කරගෙන සලාතයේ යෙදිය හැක“ දින 40 ඉක්මවා එන රුධිරය ගර්භනී අවස්ථාවට පෙර මාස්ශුද්ධි කාලයේ රුධිරයට සමාන නම් එයද මාස් ශුද්ධියක් සේ ගණන් ගත හැක“ |
| නිවුන්නු දරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ප්‍රසූති කරන කාන්තාව, | පළමු දරුවා පිටතට ආගමන්ම ශුද්ධි කාලය ආරම්භ වන්නේය“ |
| අඩුමාසයෙන් ලැබෙන ප්‍රසූතයෙන් පසු එන රුධිරය | ළදරුවා කුසේ දින 80ක් ඉක්මවා සිටියේ නම් එම රුධිරය ’ඉස්තිහාලා’ වෙයි“ දින 90ක් ඉක්මවා සිටියේ නම් එය ප්‍රසූත ශුද්ධියකි“ දින 80-90 ක් අතර කාලයක් සිටියේ නම් එම ගර්භය මිනිස් රුවක් ලැබුවේ නම් එය ප්‍රසූත කළ පසු එන රුධිරය ප්‍රසූති ශුද්ධියයි“ මිනිස් රුව ලබා නොමැතිනම් ’ඉස්තිහාලා’ වෙයි“ |
| දින 40ක් ඇතුළත ශුද්ධ වීම නැවතී පසුව නැවතත් එයිනම් | දින 40ක් ඇතුළත රුධිරය නවතී නම් ස්නානය කර සලාතය ඉටුකළ යුතුය“ දින 40ක් ඇතුළත නැවත රුධිරය එයිනම් එය ද ප්‍රසූත ශුද්ධියක් ලෙස ගණන් ගැනේ“ |

**සැලකිල්ලට ගතයුතු කරුණු:-** ✸ හිරු අවරට යාමට කලින් කාන්තාවකට මාස් ශුද්ධිය හෝ ප්‍රසූත ශුද්ධිය නැවතුනහොත් ඇය එදවසේ ලුහර්” අසර් සලාත දෙක හිලව් (කලා කළ යුතුය)“ එසේම හිරු උදාවට කලින් නැවතුනේ නම් එදින මග්රිබ් හා ඉෂා සලාත දෙක හිලව් කළ යුතුය“ ✸ සලාතයක වේලාව ආරම්භ වී සලාතය කරන්නට පෙර කාන්තාවකට මාස් ශුද්ධිය හෝ ප්‍රසූත ශුද්ධිය ඇතිවුයේ නම් ඇය එම සලාතය හිලව් වශයෙන් ඉටුකළ යුතු නැත. ✸ මාස් ශුද්ධිය හෝ ප්‍රසූති ශුද්ධියෙන් පසුව ස්නානය කරන විට කොණ්ඩ ගොතා ඇත්නම් එය අනිවාර්යයෙන් දිග හැරිය යුතුය“ අනෙක් අනිවාර්ය ස්නානවලදී එසේ දිග හැරීම අවශ්‍යය (අනිවාර්ය) නැත“ ✸ මාස් ශුද්ධියේ දී හෝ ප්‍රසූති ශුද්ධි කාලයේ ඇයගේ (යෝනිය) සංසර්ගයට භාවිතා නොකළ යුතුය“ ශරීරයේ අනෙක් අවයවයන්ගෙන් සතුටු විඳිම කළ හැක“ ✸ ’ඉස්තිහාලා’හි සිටින කාන්තාවක් සමග සංසර්ගයේ යෙදීමෙන් වැළකිය යුතුය. සැමියාට අත්‍යවශ්‍ය නම් වරදක් නැත“ ✸ ’ඉස්තිහාලා’ ඇති කාන්තාවක් සෑම සලාතයකදීම නෑම සතුටුදායකය“ අපහසු නම් ලුහර් අසර් දෙකට එක වරක් ද මග්රිබ් ඉෂා දෙකට එක වරක් ද ස්නානය කළ යුතුය“ එකතුව තුන්වරක් නාගත යුතුය“ එයද අපහසුනම් එකරවක් ස්නානය කර අනෙක් වේලාවල්වල වුළු කරගන්නීය“ එයද අපහසුනම් සෑම වෙලාවකදී වුළූ පමණක් කරගන්නීය“ ✸ කාන්තාවක් හජ්” උම්රාව හෝ උපවාසය සම්පූර්ණයෙන් ඉටුකිරීමේ චේතනාවෙන් ඇය මාස්ශුද්ධිය ප්‍රමාද කිරීම සඳහා යම් ඖෂධයක් ගැනීම ඇයගේ ශරීරයට හානිකර නොවෙයි නම් එසේ කිරීම වරදක් නොවේ“

# ඉස්ලාම් හි ස්ත්‍රීන්ගේ ස්ථාවරය

ඊමාන් හා යහ අමලයන් කිරීම යනාදීන් හි අල්ලහ් පුරුෂයින් හට කුමන මහිමයන් හා කුසලයන් ලබාදෙන්නේ ද,එමෙන්ම ඔහු ස්ත්‍රීන්ට ද එම මහිමයන් හා කුසලයන් ලබාදෙන්නේය. නබි(සල්)තුමාණන් පැවසුවේය. **ස්ත්‍රීන් පුරුෂයින්ගේ එක කුසේ උපන් දරුවන් ය.** (අබූ දාවුද්)

ඇයට තම අයිතිය අසා ලබා ගැනීමට හා තමාට සිදු වූ අයුක්තිය වෙනුවෙන් පැමිණිලි කිරීමට ද ඇයට අයිතිය ඇත.දහමේ ඔවුන් දෙදෙනා අතර වෙනස් කම් පෑ නීති රීතීන් හැර අන් සෑම නීති රීතීන්හිම ස්ත්‍රී පුරුෂ දෙපාර්ශයම සම වන්නේය.එවන් නීති රීතීන් ඉතා සුළුයියිවෙන් ම දක්නට ලැබේ.ඔවුනොවුන්ගේ මූලික දක්‍ෂතාවය අනුවම ඔවුන් අතර නීති රීතීන් ඇති කරනු ලැබේ. අල්ලාහු තආලා පවසයි.**මවන්නා නොදනී ද? ඔහු හදවත්හි සගයියියිවා ඇති සියුම් කරුණු ද දැනගත හැක්කෙකි.**

ස්ත්‍රීන්ටම ආවේනික වූ සමහර වගකීම්ඇත.එමෙන්ම පුරුෂයින්ට ද ආවේනික වූ සමහර වගකීම් ද ඇත.ඉන් එකා අනෙකාගේ වගකීම් තුළ ඇතුලුවීමෙන් ජීවිතයේ ප්‍රශ්න මතුවීමට ඉඩ ඇත. ස්ත්‍රිය වශයෙන් ඇයට තම නිවස තුළ සිටම, පුරුෂයෙකුට ලැබෙන කුසල් මෙන් ඇයට ද ලබාගැනීමට අවස්ථාවන් ඇත. අස්මා බින්ති යසීද් නැමැති කාන්තාවක්, නබි(සල්)තුමාණන් තම මිත්‍රයින් සමග සිටන අවස්ථාවේ ඔහු වෙත පැමිණ මෙසේ කීවාය: නබි තුමාණනී මාගේ දෙමව්පියන් නුඹට අවනත වෙන්නෙ හු. මා ස්ත්‍රීන් වෙනුවෙන් හා මා හට දැනුමක් ලබාගැනීම පිණිස පැමිණියෙමි.අවනතවීම්සියල්ල නුඹටම හිමිවේ.මා නුඹ වෙත පැමිණීම දැන සිටන හෝ නොදැන සිටන නැගෙනහිර හා බටහිර අතර ඇත් සියලුම කාන්තාවන් නුඹගේ වදන මත ඇත්තෝය. නියතවශයෙන්ම අල්ලාහ් නුඹව සත්‍යය දෙමින් මෙලොව සිටන ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම දූතයෙකු ලෙස එව්වේය. නුඹව ද නුඹව එවූ අල්ලහ්ව ද අපි විශ්වාස කළෙමු. කාන්තාවන් වන අපි නිවැස්තුළ ඇතුලු වී සිටන්නෙමු. නුඹලාගේ ආශාවන් ඉෂ්ඨ කරන ස්ථානයක් හා ළමුන් බිහි කරන්නන් වශයෙන් සිටන්නෙමු. පුරුෂයන් වන නුඹලා ජුම්ආ හා ජමාඅත් සලාතයන්, රෝගීන්ගේ සුව විමසීමට යෑම, ජනාසාවේ සහභාගි වීම, හජ් එකකට වඩා අධිකව කිරීම යනාදීන්ගෙන් සුවිශේෂත්වයට ලක්වන්නෝය.තවද එවන් දෑ වලට වඩා ඉස්ලාමය වෙනුවෙන් කෙරෙනු ලබනු ඉතා උසස් පරිශුද්ධ යුද්ධයන් ද නුඹලාට ඇත. පුරුෂයින් වන නුඹලා හජ්,උම්රා හා පරිශුද්ධ යුද්ධයන් වෙනුවෙන් පිටවුවහොත්,අපි නුඹලාගේ ධන සම්පත් ආරක්‍ෂා කරන්නෙමු. නුඹලාගේ ඇඳුම් මසා දෙන්නෙමු. නුඹලාගේ දරුවන් නුඹලා වෙනුවෙන් රැකබලාගන්නෙමු. නමුත් යා රසූලල්ලාහ්, නුඹලාහට ලැබෙන කුසල මෙන් අපට ලැබෙන්නේ නැද්ද? එවිට නබි තුමාණන් තම මිත්‍රයින් දෙස බලා, **දහම හා සම්බන්ධව මෙ කාන්තාව ප්‍රශ්න කළ ආකාරයට වඩා ඉතා අලංකාර ලෙස ප්‍රශ්න කළ යම් කාන්තාවකගේ වදන් නුඹලා ඇසී ඇත් ද?** යනුවෙන් ඇසුවේය. එයට ඔවුන් කාන්තාවක් මෙලෙසින් ප්‍රශ්න කරයි යන්න අපි නොසිතුවෙමු අල්ලහ්ගේ දූතයානණී, යනුවෙන් පිළිතුරු දුන්නෝ ය. පසුව නබි තුමාණන් ඇය දෙස බලා, **ස්ත්‍රිය නුඹ හැරී යනු.තවද නුඹ හා සිටන කින්තාවන් හට මෙය දැනුම්දෙනු. නුඹලාගෙන් යමෙකු තම සැමියාගේ අවශ්‍යයතාවයන් ඉතා හොඳාකාරයෙන් සපුරාලීම, ඔහුගේ තෘප්තිය පැතීම සඳහා ක්‍රියා කිරීම හා ඔහුගේ කැමැත්තට අනුව තමාව සලස්වා ගැනීම, ඉහත සඳහන් අමලයන්ට සම වේ,** යනුවෙන් පැවසුවේය. එවිට එම ස්ත්‍රිය ඉතා සන්තෝෂයෙන් =ලා ඉලාහා ඉල්ලල්ලාහු= හා තක්බීර් කියමින් යළි හැරී ගියාය. (බයිහකී) තවද සමහර කාන්කාවන් පැමිණ නබි (සල්) තුමාණන්හට අල්ලහ්ගේ දූතයානණී, පුරුෂයින් අල්ලහ්ගේ පාදයේ පරිශුද්ධ යුද්ධය කිරීමේ අවස්ථාව ලබාගත්තෝය. එම පරිශුද්ධ යුද්ධයන් හි කුසල අපට ද හිමිවන යම් අමලයන් ඇත් ද? යනුවෙන් ඇසුවෝය, එවිට නබි තුමාණන් **නුඹලාගෙන් යමෙකු තම නිවසේ කටයුතු හරියාකාරව කිරීම තුළින් අල්ලහ්ගේ පාදයේ පරිශුද්ධ යුද්ධ කරන්නාගේ කුසල ලබාගත හැක.** (බයිහකී) තවද කාන්තාවක් තම ඥාති කාන්තාවකට උදව්උපකාර කිරීම වෙනුවෙන් අල්ලාහ් බොහෝ කුසල් තබා ඇත. නබි (සල්) තුමාණෝ වදාලහ :**කවරෙකු දූවරුන් දෙදෙනෙකුට හෝ සහෝදරියන් දෙදෙනෙකුට හෝ ගැහැණු ඥාතීන් දෙදෙනෙකුට අල්ලාහ් ඔවුන්හට මගක් පහදා දෙන තුරු හෝ ඔහුගේ මහිමයෙන් ඔවුන්ව පොහොසත් කරන තුරු, ඔහු ඔවුන් වෙනුවෙන් වියදම් කරන්නේ නම්,ඔවුන් දෙදෙනා ඔහුට නිරයට ඇතුල් වීමෙන් බාධාවක් බවට පත් වන්නේය.** (අහ්මද්,තබ්‍රානී)

## ස්ත්‍රීන් හා සම් බන්ධ සමහර නීතීන් රීතීන්

❖ පුරුෂයෙකු තමාට විවාහ කිරීමට අනුමැතිය ඇති ස්ත්‍රියක් සමග මහ්රම්[1] කෙනෙකු නොමැතිව තනිවම සිටීම තහනම් වේ. නබි (සල්) තුමාණෝ වදාලහ: ***එක් පුරුෂයෙකු තමාට විවාහ කළ නොහැකි ස්ත්‍රීන් හැර අන් ස්ත්‍රීන් සමග තනි නොවයි.*** (බුහාරි,මුස්ලිම්)

❖ මස්ජිදයේ සලාතය ඉටු කිරීම සඳහා ස්ත්‍රීන්ට අනුමැතිය ඇත.එසේ යාමෙන් ෆිත්නා (අනවශ්‍යය පෙලඹුම්) ඇති වේ නම්,එය මක්රූහ් වේ. ආයිෂා (රළි) තුමිය පවසන්නීය: ***මෙ යුගයේ කාන්තාවන් ඇතිකරගත් වෙනස්කම්ගැන නබි(සල්) තුමාණන් දන්නෙහු නම්,කාන්තාවන් මස්ජිදයට පැමිණීමෙන් වළක්වයි.කෙසේ බනු ඉස්රාඊල් වරුන්ගේ ස්ත්‍රීන් වැළක්වනු ලැබුවේ ය.*** (බුහාරි,මුස්ලිම්)

පුරුෂයින් මස්ජිදයේ සලාතය ඉටු කිරීම ඔවුන්ගේ කුසල කිහිප ගුණයකින් අධික කරන්නා මෙන්,කාන්තාවන් නිවසේ සලාතය ඉටු කිරීමෙන් කුසල් කිහිප ගුණයකින් අධික වේ. එක් කාන්තාවක් නබි (සල්) තුමා වෙත පැමිණ,අල්ලහ්ගේ දූතයාණනී ***මා නුඹත් සමග සලාතය ඉටු කිරීම ප්‍රිය කරමි*** ***යැයි පැවසුවාය.එයට නබි (සල්) තුමාණන්*** ***නුඹ මා සමග සලාතය ඉටු කිරීම ප්‍රිය කරන බව මා දනිමි,එහෙත් නුඹගේ නිවසේ ඇති කාමරයේ සලාතය ඉටු කිරීම සඳහා වෙන් කර ඇති ස්ථානයේ සලාතය ඉටු කිරීම, කාමරයේ(වෙනත් තැන්වල) සලාතය ඉටු කිරීමට වඩා උතුම් වේ. නුඹ නුඹගේ කාමරයේ සලාතය ඉටු කිරීම,නිවසේ මැදහරියේ සලාතය ඉටු කිරීමට වඩා උතුම් වේ. නුඹ නුඹගේ නිවසේ මැදහරියේ සලාතය ඉටු කිරීම,අන් මස්ජිදයන්වල සලාතය ඉටු කිරීමට වඩා උතුම් වේ. නුඹ අන් මස්ජිදයන්වල සලාතය ඉටු කිරීම,මාගේ මස්ජිදයේ සලාතය ඉටු කිරීමට වඩා උතුම් වේ.*** යනුවෙන් පැවසුවේය. (අහ්මද්) තවද පැවසුවේය, ***ස්ත්‍රීන්හට මස්ජිදයන්ගෙන් ඉතා උතුම්ම ස්ථානය තම නිවස ය.*** (අහ්මද්)

❖ එක් ස්ත්‍රියකට හජ් උම්රාව වැනි අමලයන් ඇයට මහ්රම් වූ පුරුෂයෙකු ලබාගැනීමෙන් තොරව අනිවාර්‍යය නොවන්නේය. මහ්රම් වූ පුරුෂයෙකු නොමැතිව ඇය ගමන් කිරීම ද තහනම් වේ. නබි (සල්) තුමාණන් පැවසුවේය, ***එක් කාන්තාවක් දින තුනකට වඩා අධික දුරක් මහ්රම් කෙනෙකුගෙන් තොරව ගමන් නොකරයි.*** (බුහාරි,මුස්ලිම්)

❖ කාන්තාවක් මිනි වළ සියාරත් කිරීම(බැහැ දැකීම)ට යාම හා මළ නිවසේ අවසන් කටයුතු සඳහා සහබාගි වීම ද තහනම් වේ. ***මිනි වළ සියාරත් කරන ස්ත්‍රීන්ව අල්ලාහ් ශාප කරන බව*** නබි තුමාණන් පැවසුවේය.තවද උම්මු අතියියා (රළි)තුමිය පවසන්නිය, ***අපි ජනාසාවක් (මිනියක්) අනුගමන කර යෑමෙන් වළක්වනු ලැබුනෙමු.එම වැළකීම අපමත අවශ්‍යය වැළකීමක් බවට නොතිබුණි.*** (මුස්ලිම්)

❖ කාන්තාවක්හට ඔවුන්ගේ හිස කෙස් කුමණ පැහැයකින් හෝ වර්ණ ගැල්වීමට අනුමැතිය ඇත.නමුත් කලු පැහැයෙන් වර්ණ ගැල්වීම මක්රූහ් වන අතර එමගින් යම් පුරුෂයෙක්ව රවටා විවාහ කිරීම සඳහා කරන්නේ නම්, එය තහනම් වේ.

❖ අල්ලහ් පවසා ඇති ආකාරයෙන් කාන්තාවකගේ අනුප්‍රාප්තික(උරුමයෙන් ලැබෙන) දේපලේ කෙටස ඔවුන්වෙත සම්පූර්ණයෙන් දීම අනිවාර්‍යය වේ. ***කවරෙකු අනුප්‍රාප්තික දේපල ලබාගැනීමට සුදුසුකම් පෑ තැනැත්තෙකුගේ අනුප්‍රාප්තික දේපලහි වංචා කරන්නේ ද,අල්ලහ් ස්වර්ගයේ ඇති ඔහුගේ අනුප්‍රාප්තික දේපල උදුර ගනියි.*** යනුවෙන් නබි(සල්)තුමාණන් පැවසූ බව ප්‍රකාශ කරනු ලැබේ. (ඉබ්නු මාජා)

❖ බිරියක් වෙනුවෙන් කෑම බීම්,ඇඳුම් පැළඳුම්,ඉඳුම් හිටුම් ආදිය ලබාදීම සැමියා මත අනිවාර්‍යය වේ. අල්ලාහු තආලා පවසයි,පොහොසත් අය තම පොහොසත අනුව වියදම්

---

[1] කාන්තාවට මහ්රම්වන අය යනු,ඇය ඔවුන්ව නිරන්තරයෙන්ම විවාහ කිරීමට තහනම් වූ අය වේ. ඔවුන් පහත දැක් වේ. ඇයගේ පියා පියාගේ පියා (සීයා)මෙසේ ආරෝහණ ක්‍රමයට ඉහළට යයි. ඇගේ පුතා, පුතාගේ පුතා (මුණුබුරා)මෙසේ අවරෝහණ ක්‍රමයට පහළට යයි. ඇයගේ සහෝදරයන් හා ඔවුන්ගේ පිරිමි දරුවන්. සහෝදරියගේ පිරිමි දරුවන්, මහප්පා,මාමලා, සැමියාගේ පුතා(මෙසේ ආරෝහණ ක්‍රමයට ඉහළට යයි),ඔහුගේ පුත්තුන්(මෙසේ අවරෝහණ ක්‍රමයට පහළට යයි),කිරි බීමෙන් තුළින් ඥාතීන් වූ පියා,පුතා හා සහෝදරයා,දැරියගේ සැමියා හා මවගේ සැමියා.

කරයි.කවරෙකු අපොහොසත්ව සිටින්නේ ද ඔහු අල්ලාහ් ඔහුට ලබාදුන් දෙයින් වියදම් කරයි. වැන්දඹුවක්ව සිටින කාන්තාවක්හට වියදම් කිරීම,ඇගේ පියා, සහෝදරයා හෝ පිරිමි දරුවා මත අනිවාර්‍ය වෙ. ඇයට ඥාතීන් කිසිවෙකු හෝ නොමැත්නම්, සෙසු අය ඇය හට වියදම් කිරීම සුන්නත්වෙ. නබි(සල්)තුමාණන් පැවසුවෙය, *වැන්දඹුවන් හා දිළිඳු අය වෙනුවෙන් උපකාර කිරීමට පෙනී හිටින්නන් අල්ලාහ්ගේ පාදයේ පරිශුද්ධ යුද්ධ කරන්නා මෙන් හෝ රාත්‍රිය පුරා සිටගෙන නැමදුමෙ නියැලී දහවල් පුරා උපවාසය රකින්නා මෙන් වෙ.* (බුහාරී,මුස්ලිම්)

❖ කාන්තාවක් යළි විවාහ නොවන තුරු. ඇගේ කුඩා දරුවන් ඇයම රැකබලාගැනීමෙ සුදුසු කම ලබන්නීය.එම දරුවන් කුඩාව සිටින තුරු ඔවුන්ගේ වියදම මව වෙත දීම,පියාමත අනිවාර්‍ය වෙ.

❖ කාන්තාවන් විශේෂයෙන් තරුණ කාන්තාවන් හා ෆිත්නාවට අවස්ථා ඇති අය, පිරිමින්ට සලාම් කීම ආරම්භ නොකරයි.

❖ කාන්තාවන් සෑම ජුම්ආ දිනයකම රහසිගත පෙදෙසේ හා කිහිල්ලේ රෝම ඉවත් කිරීම හා නියපොතු කැපීම සුන්නත් වෙ.එය දින හතලියකට වඩා අධික කාලයක් අත්හැරීම මක්රූහ් වෙ.

❖ ඇහි බැම සහිතව මුහුණේ රෝම ඉවත් කිරීම තහනම් වෙ. නබි(සල්)තුමාණන් පැවසුවෙය, *මුහුණේ රෝම ඉවත් කරන කාන්තාවන් හා ඉවත් කරනු ලබන කාන්තාවන් හට අල්ලාහ් ශාප කරන්නේය.* (අබූදාවූද්)

**දුක්විම :=**

❖ ගැහැණියක් ඇගේ ස්වාමියා මිය යෑම වෙනුවෙන් මිස වෙනත් අයෙක් මිය යෑම වෙනුවෙන් දින තුනකට වඩා දුක්විම තහනම් වෙයි. නබි(සල්) තුමාණන් පැවසුවෙය, *අල්ලාහු තආලා හා අවසාන දිනය විශ්වාස කරන කාන්තාවකට තම සැමියා හැර සෙසු අය මිය යාමෙන් දින තුනකට වඩා දුක අත් විඳිය නොහැක.* (මුස්ලිම්) එහෙත් ඇය තම සැමියා මිය යාම වෙනුවෙන් මාස 4ක් හා දින 10ක් දුක්විම අනිවාර්‍ය. තවද ඇය දුක අත් විඳින කාලයේ අලංකාර දෑ ද සුවඳ විලවුන් ද භාවිතා නොකළ යුතුය. තවද මුදු හා වෙනත් ආභරණ කිසිවක් නොපැළඳිය යුතුය. එහෙත් නියපොතු කැපීම රෝම ඉවත් කිරීම නෑම ආදිය අනුමතය. දුකින් ගත කරන කාලය තුළ කළුයි පැහැයෙන් හෝ සුදු පැහැයෙන් යුත් ඇඳුමකින් සැරසී සිටීම අනිවාර්‍ය නොවේ. ඇය කුමන නිවසක සිටිය දී තම සැමියා මිය ගියේ ද එම නිවසේම ඉද්දා ඉඳීම ඇයට අනිවාර්‍ය වෙ. යම් අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් හැර එම නිවසෙන් තවත් තැනකට යාම තහනම් වෙ.

❖ කාන්තාවක් හිස හුගැම තහනම් වෙ.පුරුෂයින්ට හෝ කාෆිර්වරුන්ට සම නොවන සේ කොටට කපාගත හැක.මන්ද *පිරිමින්ට සම වන කාන්තාවන් හට නබි (සල්)තුමාණන් ශාප කළහ.*(තිරුමිදි) තවද නබි (සල්)තුමාණන් පැවසුවෙය, *කවරෙකු එක් කණ්ඩායමට සම වන්නේ ද,ඔහු ද ඔවුන්ගෙන් කෙනෙකු වන්නේය.* (අබූදාවූද්)

❖ කාන්තාවක් නිවසින් බැහැරව යන අවස්ථාවෙ,තම ශරීරය වසාගැනීම අනිවාර්‍ය වෙ.ඒ හා සම්බන්ධ කොන්දේසීන් පහත දැක් වෙ. (1) ශරීරය සම්පූර්ණයෙන් වැසෙන මෙන් තිබිය යුතුයි. (2) එම ඇඳුම ආකර්ෂණීයව නොතිබීම. (3) ශරීරය නොවැසුනු මෙන් සිනිඳුව නොතිබීම. (4) තදව නොමැතිව විශාලව තිබීම. (5) සුවඳ විලවුන් නොතැවරී තිබීම. (6) පුරුෂයින්ගේ ඇඳුමට සම නොවීම. (7) අන්‍ය ආගමික ස්ත්‍රීන්ගේ ඇඳුමට සම නොවීම. (8) ප්‍රබලත්වය ඇතිකරන ඇඳුමක් නොවීම.

**සෙසු අය සමග කාන්තාවකගේ අව්රතය(ශරීරයේ වැසිය යුතු ස්ථානයන්) වර්ග තුනකි.** (1) සැමියාගේ ඉදිරියේ:= සැමයා ඇයගේ ශරීරයේ කුමන ස්ථානයක් වුව ද බැලීමට අනුමැතිය ඇත. (2) කාන්තාවන් හා මහ්රම් වු පුරුෂයින්ගේ ඉදිරියේ:= ඔවුන් ඉදිරියේ මුහුණ,අත් දෙකේ හා පාදයේ ඉදිරිපස හා බෙල්ල යනාදීන් සාමාන්‍යය වශයෙන් පිටවන කොටස හෙලිකළ හැක. (3) මහරම් නොවන අන්‍යය පුරුෂයින් ඉදිරියේ:= ඔවුන් ඉදිරියේ විවාහය හෝ බෙහෙත්

කිරීම වැනි අවශ්‍යය තාවයකින් තොරව අන් අවස්ථාවන් වල සම්පූර්ණයෙන් ශරීරය වසා ගැනීම අනිවාර්‍යය වෙ. මන්ද කාන්තාවගේ ෆිත්නාව ඇගේ මුහුණ පෙන්වීමෙ තිබෙ. ෆාතිමා බින්ති මුන්දිර් (රළි) තුමය පවසයි: **අපි අපගේ මුහුණ පිරිමින්ගේ ඉදිරියේ වසා ගත්තෙමු.** (හාකිම්) තවද ආයිෂා (රළි) තුමය පවසයි: **අපි නබි (සල්) තුමාණන් සමග ඉහ්රාම් බැද සිටන අවසථාවෙ, අප අසලින් ව්‍යාපාර කණ්ඩායමක් ගමන් කළ විට අපගේ මොට්ටැක්කිලිය මගින් මුහුණ වසාගත්තෙමු.ඔවුන් අපව පසු කළ විට යළි මුහුණ විවෘත කළෙමු.** (අබූදාවූද්)

**ඉද්දා :=**

❖ ඉද්දා ඉටු කරන ගැහැණුන් විවිධ වේ. (1) සැමියා මළ ගර්භනි ගැහැණිය:- සැමියාගේ මරණයේ සිට දරුවා ප්‍රසුති කරන තෙක් ඉද්දා පිළිපැදිය යුතුය. (2) සැමියා මළ ගැහැණිය:- මෙම ගැහැණිය මාස 4ක් හා දින 10 ක් ඉද්දා පිළිපැදිය යුතුය. (3) තලාක් කියනු ලැබූ මාස්ශුද්ධිය ඇතිවිය හැකි සාමාන්‍ය ගැහැණියක්:= මාස්ශුද්ධි තුනක් ඇතිවෙන තෙක් ඉද්දා සිටිය යුතුය. තලාක් කීමත් සමග මාස්ශුද්ධි තුනක් සිදුවී පිරිසිදු වීමත් සමග ඉද්දා අවසන් වෙයි. (4) මාස්ශුද්ධිය ඇතිනොවන ගැහැණිය:- ඇයගේ ඉද්දා කාලය මාස තුනකි.

❖ ඉද්දා කාලයේ මුදවා ගතහැකි පරදි තලාක් කියනු ලැබූ ගැහැණිය තම සැමියා සමග දිගටම සිටීම යුතුකමකි. ඉද්දා අවසන් වන තෙක් සැමියා ඇයව සිතු මනාපයේ බැලීමත් ඇය සමග තනිව සිටීමත් අනුමතය. මෙසේ සිටීමෙන් සමහර විට ඒ දෙදෙනා අතර අල්ලාහ් සිත් අමනාපය නැතිකර සමගිය ඇති කළ හැක.

❖ තවද ඉද්දා සිටින කාන්තාව මුදවා ගැනීම සඳහා බිරිඳ වෙත සැමියා =නුඹව මා ආපසු භාර ගතිමි=යි කීම හෝ ඇය සමග සංසර්ගයේ යෙදීම ප්‍රමාණවත් ය. එම ගැහැණියගේ මනාපය ඇතුව ඒවා සිදුවිය යුතු යැයි අනිවාර්‍යය නොවේ.

❖ භාරකරුවෙක් (වලී) නොමැතිව ගැහැණියක් විවාහ වීම:= නබි(සල්) තුමාණන් පැවසුවෙය.***තම භාරකරුවෙක් නොමැතිව කාන්තාවක් විවාහ වෙයි නම්, ඇගේ විවාහය වලංගු නොවේ.ඇගේ විවාහය වලංගු නොවේ.ඇගේ විවාහය වලංගු නොවේ.*** (අබූදාවූද්)

❖ කාන්තාවකට බොරු කොණ්ඩ (හවරි) බැඳීම එයට අනුබල දීම හා පච්ච කෙටීම එයට අනුබල දීම ද තහනම් වෙ. මෙම ක්‍රියාවන් දෙක මහා පාපයට ඇතුලත් ය. නබි(සල්) තුමාණන් පැවසුවෙය.***බොරු කොණ්ඩා (හවරි) බඳින්නන් හා එයට අනුබල දෙන්නන්ව ද පච්ච කොටන්නන් හා එයට අනුබල දෙන්නන්ව ද අල්ලාහ් ශාප කරයි.*** (බුහාරි,මුස්ලිම්)

❖ ගැහැණියක් අවශ්‍යය හේතුවකින් තොරව තම සැමයාගෙන් දික්කසාද වීමට ඉල්ලීම තහනම් වෙ. නබි(සල්) තුමාණන් පැවසුවෙය. ***අවශ්‍ය හේතු කිසිවක් නොමැතිව යම් ගැහැණියක් තම සැමියාගෙන් දික්කසාදය ඉල්ලයි නම් ඇයට සවර්ගයේ සුගන්ධය පවා අහිමි වෙයි.*** (අබූදාවූද්)

❖ කාන්කාවක් තම සැමයාහට අවනතවීම අනිවාර්‍යය වෙ.විශේෂයෙන් ඔහු ඇයව යහනට එන ලෙස කැඳවන අවස්ථාවෙ. නබි(සල්) තුමාණන් පැවසුවෙය.තම ***සැමියා යහනට එන ලෙස කැඳවා ඇය එය ප්‍රතික්ෂේප කරන්නී නම්, එලිවනතුරු මලක්වරු ඇයට ශාප කරමින් සිටිති.*** (බුහාරි,මුස්ලිම්)

❖ ගැහැණියක් ඇය යන මගේ අන්‍යය පිරිමින් පැමණේ යැයි දැන සුවඳ විලවුන් තවරාගෙන පිටතට යාම තහනම් වෙ. නබි(සල්) තුමාණන් පැවසුවෙය. ***යම් ගැහැණියක් සුවඳ විලවුන් තවරාගෙන පිරිසක් මැදින් යන්නේ නම් ඇය ගණිකාවකි.*** (අබූදාවූද්)

# සලාතය

ගමක සිටින පිරිමි අයට **අදාන් හා ඉකාමත්** ෆර්ල් ක්‍රියායා වෙයි" තනිවම හා මගීන්ට සුන්නත් වන්නේය" ගැහැණුන්ට මක්රූහ් වෙයි" සලාතයට නියමිත වේලාව පැමිණෙන තෙක් ඒවා නොකළයුතුය" ෆජ්ර් වේලාවට පමණක් මධ්‍යම රාත්‍රියෙන් පසු පළමු අදාන් කිව හැක"

**සලාතයේ කොන්දේසි** :- 1" ඉස්ලාම් 2" සිහි බුද්ධිය ඇත්තෙකු වීම. 3" විචක්ෂණ බුද්ධිය 4" හැකියාව ඇත්තන් පිරිසිදු කරගැනීම
5" වේලාව ප්‍රවේශ වීම" **ලුහර් සලාතයේ වේලාව** හිරු මුදුනෙන් ඇල වූ වේලාවේ සිට යම් භාණ්ඩයක සෙවනැල්ල එහි උසට සමානව දිස් වෙන තෙක්" එයත් සමගම **අසර් සලාතයේ වේලාව** ආරම්භ වෙයි" යම් භාණ්ඩයක සෙවනැල්ල එය මෙන් දෙගුණයක් දික්වෙන තෙක් අසර් සලාතයට ඉටු කිරීමට වැදගත්වූ වේලාවයි" හිරු අවරට යන තෙක් එය ඉටු කිරීමට අනුමත වේලාවයි" හිරු අවරට යාමත් සමග '**මග්රිබ් සලාතයේ වේලාව** ආරම්භ වෙයි" බටහිර අහසේ රතු පැහැය මැකී ගියවිට '**ඉෂා සලාතයේ ' වේලාව** ආරම්භ වෙයි" මැදියම් රැය තෙක් එය වැදගත් වේලාවයි" අරුණෝදය දක්වා මෙය දික්වෙයි" අරුණෝදයත් සමග **ෆජ්ර් සලාතයේ ' වේලාව** ආරම්භවෙයි" සූර්ය උදාවත් සමග ෆජ්ර් සලාතයේ වේලාව නිමාවෙයි"
6" හැකි අය ශරීරයේ පැහැය නොපෙණෙන ලෙස තම රහසග පෙදෙස (අව්රත්) [1] ඇඳුමකින් වසා ගැනීම. පිරිමින් වයස 10ට වැඩි අයගේ අව්රතය (රහසග පෙදෙස) පෙකනියේ සිට දනිස්ස දක්වාය" ගැහැණුන්ගේ මුහුණ හා මැනික් කටුවෙන් පහළ අත්දෙක හැර අනෙක් හැම අංගෝපාංගයක්ම අව්රතය යි"
7" හැකියාවක් ඇත්තා සලාතය කරන ස්ථානය" ඇඳුම හා ශරීරය නජීස්වලින් පිරිසිදුව තබාගත යුතුය" 8" හැකියාවක් ඇත්තා කිබ්ලාව ඉලක්ක කර ගත යුතුය" 9. අදිෂ්ඨානය.

**සලාතයේ ෆර්ල් (අනිවාර්ය ක්‍රියා)**

සලාතයේ ෆර්ල් දහහතරකි :-

1" ශක්තිය ඇත්තා ෆර්ල් සලාතයේ දි සිට ගැනීම 2" ඉහ්රාම් තක්බීර් කීම 3" ෆාතිහා කීම 4" සෑම රකඅතයකම රුකූඋ කිරීම 5" රුකූඋවෙන් නැගිටීම 6" රුකූඋවෙන් පසුව සිටගැනීම 7" අවයව හතක් බිම තබා සජ්දා කිරීම 8" සජ්දා දෙක අතර කෙටි වාඩිවීම 9" අවසාන අත්තහියියාතය 10" ඒ සඳහා වාඩිවීම 11" අවසාන අත්තහියියාතයේ නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්)තුමාණන්ගේ නමින් සලවාත් කීම 12" පළමු සලාම් කීම 13" හැම අනිවාර්ය (ෆර්ල්) ක්‍රියාවකම රැඳී සිටීම 14" පර්ල් ක්‍රියා සඳහන් පරිදි අනුපිළිවෙලින් කිරීම

**මෙම ෆර්ල් ක්‍රියාවන්ගෙන් තොරව සලාතය ඉටු නොවේ" හිතාමතාම හෝ අමතක වීමකින් මෙම ක්‍රියාවන්ගෙන් එකක් අත හැරෙයි නම් එම රක්අතය සම්පූර්ණ නොවේ"**

**සලාතයේ වාජිබ් (අවශ්‍යම ක්‍රියා)**

**සලාතයේ අවශ්‍යම (වාජිබ්) ක්‍රියා අටකි** :- 1" පළමු තක්බීරය හැර අනෙක් තක්බීර් 2" ඉමාම් හෝ තනිවම සලාතයේ යෙදන්නා 'සමිඅල්ලාහු ලිමන් හමිදාහ්' යැයි පැවසීම" 3" රුකූවෙන් නැගිටෙන විට රබ්බනා ලකල් හම්දු යැයි කීම" 4" රුකූඋවේදි එක්වරක් 'සුබ්හාන රබ්බියල් අලීම්' යැයි කීම 5" සජ්දාවෙහි එක්වරක් සුබ්හාන රබ්බියල් අඃලා' යැයි කීම" 6" සජ්දා දෙක අතර 'රබ්බිග් ෆිර්ලි' යැයි කීම" 7" පළමු අත්තහියියාතය කියවීම" 8" ඒ

---

[1] **අව්රත් (කෙනෙකුගේ ශරීරයේ වැසිය යුතු අංග)** අව්රත් යනු කෙනෙකුගේ ශරීරයේ පිටතට පෙනීම ඔහු නොරුස්සන ලැජ්ජාව ඇති කරවන ශරීර අංගයි. මෙහි කථා කරනු ලබන්නේ සලාතයට හා තවාෆය ට අවශ්‍ය අව්රතය ගැනයි. වයස දහය සම්පූර්ණ පිරිමියෙකුගේ අව්රතය, පෙකනිය හා දණහිස අතර ප්‍රදේශයයි. වයස හතේ සිට දහය දක්වා පිරිමි ළමයින්ට අව්රතය වන්නේ පෙර පසු ද්වාරයන්ය (මලමුත්‍රා අවයව). වැඩිවියට පත් නිදහස් කාන්තාවකගේ අව්රතය ඇගේ මුහුණ, මැණික්කටුව (ඇස් වටයෙන් පහළ පාද හැර ශරීරයේ අනෙක් සියළුම ප්‍රදේශ වෙයි. එහෙයින් වැලමිටෙන් පහළ පිටත පෙනෙන ලෙස කාන්තාවක් සලාතය හෝ තවාෆ් කරයි නම් එය පිළි නොගැනේ. අව්රතය සලාතයෙන් බාහිරව ද වැසීම අනිවාර්යය. අඳුරේ හෝ තනිව සිටින විට පවා අවශ්‍යතාවෙන් තොර ඒවා විවෘත කිරීම මක්රූහ්ය. එහෙත් වෛද්‍ය ප්‍රතිකාර හා චර්ම ඡේදය වැනි අවස්ථාවල ඒවා විවෘත කළ හැක.

සඳහා වාඩිවීම“ මෙම වාජිබ් ක්‍රියා හිතාමතා අත් හැරියොත් සලාතය නිෂ්ඵල වන්නේය“ අමතක වීමකින් අත් හළොත් සජ්දා කළයුතුය“

**සලාතයේ සුන්නත්** :- ඒවා වාචිකව ද ක්‍රියාවෙන් ද කළ යුතු ඒවා ඇත“ ඒවායින් යමක් හිතාමතා අත්හළහොත් සලාතය නිෂ්ඵල නොවේ“

**වාචිකව ඉටුකළ යුතු සුන්නත්** :- (ෆාතිහාවට කලින් කියන) 'ඉස්තිෆ්තාහ්' දුආ කීම“ අඌදු කීම” බිස්මි කීම ආමීන් කීම“ ශබ්ද නගා කරන සලාතයෙහි දී ශබ්ද නගා ආමීන් කීම” ෆාතිහාවට පසු කුර්ආනයේ කුමක් හෝ සූරාවක් කියවීම“ (සලාතය මෙහෙයවනු ලබන මඃමූම් ශබ්දනගා නොකිව යුතුය“ තනිවම සලාතයේ යෙදෙන විට ශබ්ද නගා කියවීමට අනුමැතිය ඇත“) රබ්බනා ලකල් හම්දු කීමෙන් පසු හම්දන් කසීරන්“““““ යන දික්රය සම්පූර්ණයෙන් කීම” රුකූඋ” සුජූදු” මධ්‍යස්ථ වාඩිවීම ආදියෙහි 'තස්බීහ්' එකකට වැඩි වාර ගණනක් කීම සලාම් දීමට පෙර දුආ ප්‍රාර්ථනා කිරීම“

**ක්‍රියාවන් පිළිබඳ සුන්නත්** :- ඉහ්රාම් තක්බීර් අවස්ථාවේ ද රුකූවලට යාමේදීත් රුකූඋ සිට නැගිටීමේදීත්“ තුන්වන රකඅතයට නැගිටීමේදීත්” දෑත එසවීම“ සිටගෙන සිටියදී වම් අතට ඉහළින් දකුණත පපුවට පහළින් තබා ගැනීම“ සුජූද කරන ස්ථානයට බැල්ම හෙළීම“ පාද දෙක ඈත්කර තබාගැනීම“ සජ්දාවේදී අත්ල දෙක නළල” නාසය දනිස් දෙක බිම තැබීම” සජ්දාවේදී අත් දෙක ඉලදෙකේ නොගෑවී තබා ගැනීම” කුසය කලවාහි නොගෑවී තබා ගැනීම“ කලවා බත්කෙණ්ඩයෙන් ඈත්කළයුතු අතර දණිස් දෙක ද ඈත් කර තබාගැනීම පාද කෙළින් තබා ඇඟිලිවල ඇතුල් පැත්ත බිම ගෑවෙන සේ තබා ගැනීම“ ඇතැඟිලි දිගහැර ඇතුල් පැත්ත බිමට තදවන සේ උරහිස්වලට කෙලින් තබා ගැනීම“ නැගිටෙනවිට ඇඟිලි නවා බිමට තබා නැගිටීම“ මධ්‍යස්ථ වාඩිවීමේදී හා පළමු අත්තහියියාවේදී” 'ඉෆ්තිරාස්' ඉරියව්වෙන් වාඩිවීම“ අවසාන අත්තහියියාවේ දී 'තවර්රුක්' ඉරියව්වෙන් වාඩිවීම මධ්‍යස්ථ වාඩිවීමේ දී හා අත්තහියියාත් වාඩිවීමේ දී ඇඟිලි දිගහැර ලංකර පාද මත තබා ගැනීම“ දකුණු අතේ සුලැඟිල්ල හා වෙදැඟිල්ල මොලවා මැද ඇඟිල්ල හා මහ පටැඟිල්ල නවා මුද්දක් සේ තබා ගෙන (අල්ලාහ්ගේ නම කියැවෙන විට හා දුආ ප්‍රාර්ථනයේ දි) දබරැඟිල්ල දිගහැර සංඥා කිරීම සලාම් කීමේදී දකුණු පසට හා වම් පසට හිස හැරවීම“ දකුණෙන් ආරම්භ කිරීම

**අමතක වීම වෙනුවෙන් සජ්දා කිරීම** :- සලාතයේ දී කියවිය යුතු කියමනක් එයට සුදුසු නැති තැනක කියෙව්ම සඳහා සජ්දා කිරීම සුන්නත්ය“ උදාහරණයක් වශයෙන් සජ්දාවේදී කුර්ආන් පාඨයක් කියවීම වැනිය” සුන්නත් ක්‍රියාවක් අතහැරීම” රුකූඋ” සුජූද්” සිටගැනීම වැනි ඉරියව්වක් වැඩියෙන් හෝ අඩුවෙන් කිරීම සලාතය අවසාන වීමර පෙර සලාම් කීම” අර්ථය වෙනස්වන අන්දමින් කුර්ආනය කියවීම හා අවශ්‍ය දෙයක් කෙරෙහි සැකයක් ඇතිවීම ආදියේ දී සජ්දා කළ යුතුය“ සලාමයට පෙර හෝ පසුව සජ්දා කිරීම“ සජ්දාව අමතක වී වේලාව ගතවුවහොත් සජ්දා කිරීම අවශ්‍ය නැත“

**සලාතය කිරීම** :- සලාතයේදී කිබ්ලාව බලා සිටගෙන 'අල්ලාහු අක්බර්' යැයි කීම“ ඉමාම් එම තක්බීරය හා අනෙක් තක්බීර් ද මඃමූන්වරුන්ට ඇසෙන සේ ශබ්ද නගා කියයි“ සෙසු අය නිහඬව කියති“ තක්බීර් ආරම්භ කරන විට දෑත උරහිස් දක්වා කෙලින් එසවීම පසුව වම් අත මත දකුණු අත තබා ගනී“ සජ්දා කරන ස්ථානයට බැල්ම හෙළයි“

හදීසයේ (**සුබ්හානකල්ලාහුම්ම වබි හම්දික වතබාරකස්මුක වතආලා ජද්දුක වලා ඉලාහ ගයිරුක**“) 'ඉස්තිෆ්තාහ්' හි දුආ වලින් එකක් කියයි“ පසුව ඉමාම් අඌදු බිස්මි කියයි“ (මේවා නිහඬව කියයි“) පසුව ෆාතිහාව කියයි“ සලාතයේ ඉමාම් හඬව ඉන්න අවස්ථාවල දී මඃමූම් ෆාතිහාව කීම මුස්තහබ්වේ“ ඉමාම් නිහඬව කියන විට මඃමූම් කීම වාජිබ් වෙයි“ පසුව කුර්ආනයේ කුමක් හෝ කොටසක් කියයි“ සුබ්හු සලාතයේදී **තිවාලුල් මුෆස්සල්** මඃරිබ් සලාතයේ දි **කිසාරුල් මුෆස්සල්** අනෙක් සලාතයන්හි දී **අව්සාතුල් මුෆස්සල්** වලින් කොටසක් කියවීම සුන්නත් වෙයි“ 'තිවාලුල් මුෆස්සල්' යනු සූරතුල් කාෆ් සිට අම්ම සූරා දක්වා ද“ 'අව්සාතුල් මුෆස්සල්' අම්මා සූරාවේ සිට ලුහා දක්වා“ 'කිසාරුල් මුෆස්සල්' ලුහා සිට අන්නාස් දක්වා ද වෙයි“ ඉමාම් සුබ්හු සලාතයේදී ද මඃරිබ් හා ඉෂා සලාතයෙහිදි පළමු රක්අත් දෙකේ ද

ශබ්ද නගා කියයි“ අනෙක් අවස්ථාවල නිශ්ශබ්දව කියයි“ ඉන්පසු 'අල්ලාහු අක්බර්' කියා දෑත උරහිස්වලට කෙලින් ඔසවා රුකූඋ කරයි“ අත් දෙකේ ඇඟිලි විහිදුවා දනිස් මත තබා” කොන්ද කෙලින් කර හිස එයට සමාන්තරව නවයි“ පසුව 'සුබ්හාන රබ්බියල් අලීම්' යැයි තෙවරක් කියයි“ පසුව 'සමිඅල්ලාහු ලිමන් හමීදාහ්” කියමින් හිස ඔසවයි“ එවිට පළමු තක්බීරයේ මෙන් අත් ඔසවයි“ පසුව

(**රබ්බනා වලකල් හම්දු හම්දන් කසීරන් තෛයිබන් මුබාරකන් ෆීහි මිල්අස් සමාවාති වමිල් අල් අර්ලි වමිල්අ මාෂිඃත මින් ෂෙයිඉන් බඃදු**) යැයි කියයි“ පසුව තක්බීර් කියමින් සුජූද් කරයි“ එහි දී **සුබ්හාන රබ්බියල් අඃලා** යනුවෙන් තෙවරක් කියයි“ ඔහුට මනාප නම් වැඩි කරගනී“ නැත්නම් අවශ්‍ය ප්‍රාර්ථනාවන් කරගනී“ පසුව තක්බීර් කියමින් නැගිට වම්පාදය නවා ඒ මත වාඩි වී දකුණු පාදය ඇණ තබා ඇඟිලි කිබ්ලාව දෙසට සිටින සේ පිටතට නවා තබා ගනී“ එසේ නැතිනම් පාද දෙක නවා ඒ මත තට්ටම තබා වාඩි වී ඇඟිලි කිබ්ලාව දෙසට හැරී තිබෙන මෙන් නවා තබා ගනී“ පසුව (**රබ්බිඃෆිර්ලී**) යි තෙවරක් ප්‍රකාශ කර මනාපනම් (වර්හම්නී වජ්බුර්නී වර්ෆඃනී වර්සුක්නී වන්සුර්නී වහ්දිනී වආෆිනී) යන ප්‍රාර්ථනය එක්කර ගනී“ පසුව සුජූද් දෙක කලින් කළ ආකාරයෙන්ම කරයි“ පසුව තක්බීර් කියා නැගිට දෙවන රකඅතය ද පළමු ආකාරයමෙන්ම ඉටු කරයි“ දෙවන රකඅතය අවසානයේ අත්තහියියාතය සඳහා වාඩි වෙයි“ දෑතේ ඇඟිලි දිගහැර ළංකරමින් කලව මත තබයි“ දකුණු අතේ සුලැඟිල්ල හා වෙදැඟිල්ල මොලවා මැද ඇඟිල්ල හා මහපටැඟිල්ල වලල්ලක් මෙන් හදා ඒ මත දබරැඟිල්ලෙන් සංඥා කරයි“ පසුව අත්තහියියාත් කියයි“

(**අත්තහියියා තු ලිල්ලාහි වස්සලවාතු වත්තයියිබාතු අස්සලාමු අලෙයික අය්යුහන් නබිය්යු වරහ්ම තුල්ලාහි වබරකාතුහු අස්සලාමු අලෙයිනා ව ආලා ඉබාදිල්ලා හිස් සාලිහීන් අෂ්හදු අල්ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වර සූලුහු**) යි“ රක්අත් තුනක් හෝ හතරක් ඇති සලාතයන් නම් තක්බීර් කියමින් නැගිට සිටී“ පළමු රක්අතය වගේම ඉතිරි රක්අත් ඉටුකරයි“ එහෙත් ශබ්දනගා නොකියයි“ සිටගෙන ෆාතිහා පමණක් කියයි“ පසුව අවසාන අත්තහියියාතයට වාඩි වෙයි“ වම් පාදය නවා දකුණු පාදය යටින් පිටතට දමා වාඩිවෙයි“ දකුණු පාදය ඇණ තබාගනී“ අත්තහියියාත් දෙකක් ඇති සලාතයක දෙවනුව මෙසේ වාඩිවීම සුන්නත් වෙයි“ පසුව අත්තහියියාතයේ මුලින් කී කොටස කියා (**අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් ව අලා ආලි මුහම්මදින් කමා සල්ලෙයිත අලා ඉබ්‍රාහීම වඅලා ආලි ඉබ්‍රාහීම ඉන්නක හමීදුන් මජීද්“ අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්‍රාහීම ව අලා ආලි ඉබ්‍රාහීම ඉන්නක හමීදුන් මජීද්**' යැයි කියයි“

(**අඌදු බිල්ලාහි මින් අදාබින්නාර් වඅදාබිල් කබ්ර් වෆිත්නතිල් මහ්යා වල්මමාති වෆිත්නතිල් මසීහිද් දජ්ජාල්**) යන ප්‍රාර්ථනය ද හදීස් හි ඇති වෙනත් ප්‍රාර්ථනා ද කියයි“ පසුව සලාම්” දෙකක් කියයි“ දකුණු පසට හිස හරවා 'අස්සලාමු අලෛකුම් වරහ්ම තුල්ලාහ්' යනුවෙන් ද පසුව වම් පසට හිස හරවා එසේම කියයි“ පසුව හදීස් හි එන දික්ර් කරයි“[1]

**රෝගියාගේ සලාතය** :- කෙනෙකුට සිටගෙන සලාතය කළ නොහැකිනම් හෝ සිටගෙන සලාතයේ යෙදීමෙන් රෝගය අධික වෙයිනම් වාඩිවී සලාතය ඉටුකළ හැක“ එයටත් නොහැකිනම් එක්

---

[1] අස්තඃෆිරුල්ලාහ් යැයි තුන්වරක් ප්‍රකාශ කර අල්ලාහුම්ම අන්තස්සලාම් ව මින්කස් සලාම් තබාරක්ත යාදල් ජලාලි වල් ඉක්රාම් ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්, ලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ් ලා ඉලාහ ඉල්ලල්ලාහු වලා නඃබුදු ඉල්ලා ඉය්යාහු ලහුන්නිඃමතු වලහුල් ෆළ්ළු වලහුස් සනාඋල් හසන් ලා ඉලාහ ඉල්ලල්ලාහු මුඛ්ලිසීන ලහුද්දීන වලව් කරිහල් කාෆිරූන් අල්ලාහුම්ම ලා මානිඅ ලිමා අඃතෙයිත වලා මුඃතිය ලිමා මනඃත වලා යන්ෆඋ දල්ජද්දු මින්කල් ජද්දු

**සුබ්හු මග්රිබ් සලාතයන්ට පසු** කලින් 'දික්ර්' සමග ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු ලහුල් මුල්කු වලහුල් හම්දු යුහ්යී වයුමීතු වහුව අලාකුල්ලි ෂෙයිඉන් කදීර් යන්න“ දහවරක් කියයි“ ඉන්පසු සුබ්හානල්ලා 33 වරක් අල්හම්දු ලිල්ලාහ් 33 වරක් අල්ලාහු අක්බර් 33 වරක් කියා 100 සම්පූර්ණ කිරීම සඳහා ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්“ යනුවෙන් කියයි“ පසුව 'ආයතුල් කුර්ෂිය' ද කුල් සූරා තුන ද කියයි“ සුබ්හු හා මග්රිබ්වලට පසුව එම සූරාවන් තුන ද කියයි“

ඇලයකට ඇලවී ඉටුකළ හැක“ එයටත් නොහැකිනම් උඩුබැලි අතට දිගාවී ඉටුකළ හැක“ සුජුද් රුකූඋ නොකළ හැකි අය සංඥා කළ හැක“ සලාත අතහැරනොත් ඒවා ඉටු කර ගතයුතුය“ සෑම සලාතයක්ම නියමිත වේලාවට ඉටු නොකළ හැකි නම් ලුහර් සමග අසරය ද මඃරිබ් සමග ඉෂාව ද එකට එක්කර ඉටුකළ හැක“

**මගියාගේ සලාතය** :- ගමන් කරන දුර කි“මි“ 80 වැඩි වී ගමන ද අනුමත එකක් වෙයිනම් රක්අත් හතර දෙකක් වශයෙන් කෙටිකර සලාතයේ යෙදිය හැක. එක ස්ථානයක දින හතරක් (සලාත 20ක්) රැඳී සිටින්නේ නම් එම ස්ථානයේ දී රක්අත් හතරක්ම ඉටු කළ යුතුය“ කෙටිනොකළ යුතුය. මගියා ගමේ අයෙක් පිටුපසින් සලාතයේ (මඃමුන් ලෙස) යෙදුනහොත් හෝ ගමේදී හෝ ගමනේ දී අමතක වුන සලාතයක් හිලව් වශයෙන් ඉටුකිරීමේ දී හෝ රක්අත් හතරක්ම ඉටු කළ යුතුය“ මගියාට කෙටි කිරීම වැදගත් වුව ද කෙටිනොකර ද ඉටු කළ හැක“

**ජුමුආ සලාතය:-** එය ලුහරයට වඩා වැදගත්ය“ එය තනි සලාතයකි“ ලුහරය කෙටිකිරීමක් නොවේ“ එය රක්අත් හතරක් ලෙස ඉටුකළ නොහැක“ ජුම්ආ සලාතය සමග අසරය එක්කර සලාතයේ යෙදීමට කළ නොහැක“

**විත්රු** :- විත්රු සලාතය” සුන්නත් වෙයි“ එයට සුදුසු කාලය ඉෂා වේලාවේ සිට ෆජරු දක්වා වන්නේය“ මෙය අවම වශයෙන් රකඅත් එකක් ද උපරිම 11ක් ද වෙයි“ සෑම රක්අත් දෙකකට වරක් සලාම් දීම වැදගත්ය“ 04ක්” 06ක් හෝ 08ක් එක සලාමය යටතේ සලාතයේ යෙදිය හැක“ පසුව එක රක්අතයක් ඉටුකර ’ඔත්තේ’ කළ හැක“

එසේම තුනක්” පහක් හා හතක් වශයෙන් ඔත්තේ වශයෙන් ද සලාතය ඉටු කළ හැක“ සලාතය සම්පූර්ණ කරන්නා අවම වශයෙන් සලාම් දෙකකින් යුතුව රක්අත් තුනකි“

**ජනාසා සලාතය** :- මියගිය මුස්ලිම් සහෝදරයෙකු නෑවීම” කෆන් ඇන්දවීම සලාතයේ යෙදීම“ උස්සාගෙන යාම හා භූමදානය කිරීම ෆර්ල් කිෆායා වන්නේය“ යුධ පිටියක මියගිය යුධ සෙබලෙකු නෑවීම හෝ කෆන් ඇන්දවීම නොකෙරෙයි“ සලාතය කර මරණයට පත් අයුරින්ම භූමදානය කරනු ලැබේ“ පිරිමියෙකුගේ මෘත දේහය සම්පූර්ණයෙන් වැසෙන අන්දමින් එතීමට ප්‍රමාණවත් සුදු රෙදි තුනක් ද කාන්තාවක් වේට්ටිය” මොට්ටැක්කිලිය හැට්ටය හා සම්පූර්ණයෙන් එතිය හැකි සුදු රෙදිකඩ දෙකක් ඇතුළු රෙදි කෑලි පහක් ද කෆන් සඳහා භාවිතා කෙරේ“ ඉමාම් හෝ තනිව සලාතයේ යෙදෙන කෙනෙක් පිරිමි දේහයේ හිස අසල ද කාන්තා දේහයේ පපුව අසල ද සලාතය සඳහා සිට ගනී“ දෑත් ඔසවා තක්බීර් හතරක් පැවසේ“ පළමු තක්බීරයේ දී අඋඌදු බිස්මි සමග ෆාතිහාව නිහඬව කියයි“ දෙවන තක්බීරයෙන් පසු නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් නමින් සලවාත් කීම තුන්වන තක්බීරයට පසු මියගිය අය වෙනුවෙන් ප්‍රාර්ථනා කරනු ඇත“ හතරවන තක්බීරයෙන් පසු මඳක් ඉවසා සිට දකුණු පසට හැරී සලාම් කියනු ඇත“

මිනීවල රියනකට වඩා උසට ගොඩ කිරීම එයට සුණු තැවරීම“ එය සිප ගැනීම“ එය සුවඳවත් කිරීම ඒ මත ලිවීම” වාඩිවීම” ඇවිදීම” පහන් දැල්වීම එය (තවාෆ්) පැදකුණු කිරීම” ඒ මත මස්ජිද් නිර්මාණය කිරීම මියගිය අය මස්ජිදය තුළ භූමදානය කිරීම ආදිය තහනම්ය“ කබ්රය මත නිර්මාණය කර ඇති ’කුබ්බාව’ බිඳ දැමීම වගකීමකි“

❖ මියගිය අය වෙනුවෙන් සැනසිලි බස් දෙඩීමට විශේෂ වදන් නොමැත“ ’නුඹේ විපාක අල්ලාහ් සම්පූර්ණ කරත්වා” නුඹේ ආත්මයට ක්ෂමා කර අල්ලාහ් ශාන්තිය ලබා දෙත්වා“ ආදිය ප්‍රමාණවත්ය“ කාෆිර් වරයෙකු නම් ඔහුට ’නුඹේ ප්‍රතිඵල අල්ලාහ් සම්පූර්ණ කරත්වා’යි පැවසිය හැක“

❖ තමා මියගියහොත් තම පවුලේ අය විලාප නගතියි යැයි දන්නේ නම් එසේ නොකළ යුතු බවට ඔවුනට වසිය්යත්(මියයාමට පෙර කරන උපදෙස) කළ යුතුය“ නැතිනම් ඔවුන්ගේ විලාප නැගීම තමන්ට දඬුවම් විඳින්නට සිදුවෙයි“

❖ ඉමාම් ෂාෆිර් (රහ්මතුල්ලාහි අලෙයිහි) මෙසේ කියයි“ අනෙක් අය සැනසිලි බස් දොඩති’යි බලාපොරොත්තුවෙන් පවුලේ අය රැස්වී සිටීම මක්රූහ් වෙයි“ ජනාසාව භූමදානය කළ සියළු දෙනා තම තමන්ගේ අවශ්‍යතාවන් (සඳහා විසිරී යා හැක“)

❖ මළ ගෙදර අයට ආහාර පිසදීම සුන්නත් වෙයි" ඔවුන් පිසින ආහාර අනුභව කිරීමත් එහි පැමිණෙන අයට ආහාර පිසීමත් මක්රූහ්ය"

❖ මුස්ලිම්වරයෙකුගේ කබ්රය (සොහොන) බැලීම සුන්නත් වෙයි" කාෆිර්ගේ කබ්රය බැලීම වරදක් නොවේ" කාෆිර් මුස්ලිම්වරයෙකුගේ කබ්රය බැලීම තහනම් නැත"

**කනත්තට ගිය අයෙකු:-** (අස්සලාමු අලෙයිකුම් දාර කවුමින් මු:මිනීන් හෝ අස්සලාමු අලෙයිකුම් අහ්ලද් දියාරි මිනල් මු:මිනීන්" ව ඉන්ෂා අල්ලාහු බිකුම් ලලාහිකුන් යර්හමුල්ලා හුල් මුස්තක්දිමීන මින්නා වල් මුස්තඃකිරීන් නස් අලුල්ලාහ ලනා වලකුම් අල්-ආෆියහ් අල්ලාහුම්ම ලා තෆ්තින්නා බඃදහුම් වඃෆිර්ලනා වලහුම්) යැයි කියයි"

**අර්ථය:-** මු:මින්වරුනි" නුඹලාට ශාන්තිය ඇතිවේවා" ඉන්ෂා අල්ලාහ් අපි ද නුඹලා සමග ඇවිත් එක්වන්නෙමු" අපට පෙර ගියවුන්ට ද පසුව එන්නන්ටද අල්ලාහ් දයාව පහළ කරත්වා" අපට ද නුඹලාට ද අල්ලාහ් දයාව පහළ කරත්වා" යා අල්ලාහ් ඔවුන්ට ලබාදෙන යහ විපාක අපට නො වරද්දහු මැනව" ඔවුනට පසුව අයව ෆිත්නාවෙහි යොමු නොකරනු මැනව" අපට ද ඔවුනට ද ක්ෂමා කරනු මැනව"!

කෆන්හි කුර්ආන් වැකි ලිවීමෙන් නජීස් වීමට ඉඩ ඇති හෙයින් එය තහනම් වෙයි" එසේ කිරීම කුර්ආනයට නින්දා කිරීමක් වන අතර එසේ ලිවීමට කිසිදු සාක්ෂියක් ද නැත"

රසූල් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ එක් මෘත දේහයකට පහත සඳහන් පිරිදි ප්‍රාර්ථනා කළහ"

අල්ලාහුම්මඃෆිර්ලහු වර්හම්හු ව ආෆිහි වඃෆු අන්හු ව අක්රිම් නුසුලහු ව වස්සඃ මුද්කලහු" වග්සිල්හු බිල්මාඉ වස්සල්ජි" වල් බරද් වනක්කිහි" මිනල් ඛතායාය කමා නක්කයිතස් සව්බල් අබ්යල මිනද් දනස් ව අබ්දිල්හු දාරන් කයිරන් මින් දාරිහි වසව්ජන් මින් සව්ජිහි" වඅද්හිල්හුල් ජන්නත ව අඉද්හු මින් අදාබිල් කබ්රි වමින් අදාබින්නාර්"

යා අල්ලාහ් මොහුට ක්ෂමාව ලබා දී දයාව පහළ කරත්වා" නුඹ හට ආගන්තුකයෙකු ලෙස පැමිණ ඇති" එම අමුත්තාට ගරු කරනු මැන" ඔහු ඇතුළත් වී ඇති ස්ථානය විශාල කරත්වා" ජලයෙන් ද" අයිස් කැටවලින් ද ඔහුව සෝදනු මැන" සුදු රෙද්ද කුණුවලින් පිරිසිදු කරන්නා සේ පාපයන්ගෙන් ඔහුව පිරිසිදු කරනු මැන" ඔහුට ඔහු සිටි නිවසට වඩා වැදගත් නිවසක් දෙනු මැන" ඔහුගේ (පවුලට වඩා වැදගත් පවුලක් ලබා දෙනු මැන" ඔහුගේ අඹු (සැමියාට) වඩා වැදගත් අඹුවන් (සැමියෙක්) ලබා දෙනු මැන" ඔහුව ස්වර්ගයට ඇතුල් කරත්වා ඔහුව කබ්රයේ දඬුවමින් ද අපායේ දඬුවමින් ද ආරක්ෂා කරනු මැන"

**අවුරුදු සලාතය:-** එය ෆර්ල් කිෆායා වන්නේය" එයට නියමිත වේලාව ලුහා සලාතයේ වේලාවයි" 'ලුහර්' වේලාවට පසුව අවුරුද්ද බව දැනගත්තේ නම් පසුදින එය ඉටුකළ හැක" එහි කොන්දේසි කුත්බා දේශනය හැර අනෙක්වා ජුම්ආවට අයත් කොන්දේසි මෙන් වේ" අවුරුදු සලාතයට පසු හෝ පෙර පිට්ටනියේ නෆීල් සලාත් නොපැවැත්වේ"

**සලාත ක්‍රමය :-** රක්අත් දෙකක් ඇත" පළමු රක්අතයේ අඋඌදු බිස්මි කියන්නට පෙර දැත ඔසවා තක්බීර් 7ක් කියනු ඇත" දෙවන රක්අතයේ තක්බීර් පහකි" මේවා ශබ්ද නගා කීමෙන් පසු අඋඌදු බිස්මි සමග ෆාතිහා සූරාව ද පසුව 'සබ්බි හිස්ම' සූරාව ද ශබ්ද නගා කියන අතර දෙවන වර 'ගාසියා' සූරාව කියනු ලැබේ" ජුමුආවේ මෙන් කුත්බා දෙකක් දේශනා කරන අතර මෙහි දී අධිකව තක්බීර් කියනු ඇත" මෙසේ කීම සුන්නත්ය" සාමාන්‍ය නෆීල් සලාතයන් මෙන් අවුරුදු සලාතය ඉටුකළත් ප්‍රමාණවත් ය" හේතුව තක්බීර් හා අනෙකුත් ඒවා ද සුන්නත් වේ"

**ග්‍රහණ සලාතය :-** එයද සුන්නත්ය" එයින් නියමිත වේලාව සූර්ය ග්‍රහණය හෝ චන්ද්‍ර ග්‍රහණය ආරම්භයේ සිට අවසාන දක්වාය" වේලාව අවසන් වූ පසු එය කලා (හිලව්) නොකරනු ඇත" එය රක්අත් දෙකකි" පළමු රක්අතයේ ෆාතිහාව ශබ්දනගා ද තවත් දිග සූරාවක් ද කියයි" පසුව දිග වේලාවක් රුකූඋ කරයි" පසුව සමිඅල්ලාහු ලිමන් හමිදා කියා නැගිට සුජූද් නොකර නැවතත් ෆාතිහාව හා දිග සූරාවක් කියයි" පසුව දිග 'රුකූඋ' එකක් කර නැගිට දිග සුජූද් දෙකක් කරයි" මේ අයුරින් දෙවන රකඅතය ද සලාතය කර අත්තහියයාත් කියා සලාම්

කියයි“ පළමු රැකුළුවට පසුව එක් මඃමුන්වරයෙකු පැමිණ එකතු වුයේ නම් ඔහුට එම රක්අතය ගණන් ගනු නොලැබේ“

**වැස්ස ඉල්ලා සලාතයේ යෙදීම** :- නියගය ඇතිවී වැසිඑල නොලැබී ගියවිට ඒ සඳහා සලාතයේ යෙදීම සුන්නත්ය“ එය ඉටු කරන වේලාව කරන ආකාරය හා නීති යනාදියෙන් අවුරුදු සලාතයට සමානය“ එහෙත් සලාතයට පසුව එක කුත්බා දේශනයක් පමණක් කරනු ඇත“ කුත්බා දේශනය අවසානයේ කාලය මාරුවීමේ සංකේතයක් වශයෙන් ඇගේ ඇඳුම පෙරලා ඇඳීම සුන්නත්ය“

**නෆීල් සලාතයන්** :- නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් පස්වේල අනිවාර්ය සලාතයට අමතරව දිනපතා නෆීල් රකඅත් දොළහක් සලාත් කර ඇත“ ඒවා සුබ්හු සලාතයට පෙර රකආත් 2” ලුහර් සලාතයට පෙර රකආත් 4- පසුව රකආත් 2” මග්රිබ් සලාතයට පසු රකආත් 2“ ඉෂා සලාතයට පසුව 2” මේවාට අමතරව පුරුද්දක් වශයෙන් ම නොව නෆීල් වශයෙන් සලාත් කළ බව ද සාධක සහිත හදීස් මගින් දැනගත හැක. ඒවා ලුහර්” අස්ර් හා ජුම්ආවලට පෙර රක්අත් 4“ ලුහර්” මඃරිබ් හා ඉෂාවලට පසුව 4“ මග්රිබ් බාංගු (අදාන්) කී පසු 2 ක් හා විත්ර්වලින් පසුව 2ක් යනුවෙනි“

**සලාතයන් කිරීමට තහනම් වූ වේලාවන්** :- නබිතුමාණන් විසින් තහනම් කළ වේලාවල්වල සුන්නත් සලාතයන් සම්පූර්ණයෙන් හෝ අඩුවෙන් හෝ ඉටු කිරීම තහනම් වේ“ එම වේලාවන් නම්:-

1“ සූර්ය උදාවේ සිට (අපේ දැක්ම අනුව) එක ර්යක ප්‍රමාණයෙන් ඉහළට නගින තෙක්“

2“ සූර්යයා අහසේ මුදුනට විත් එය බටහිර දෙසට හැරෙන තෙක් (ලුහර් වේලාව ආරම්භ වන තෙක්)

3“ අසර් සලාතය ඉටු කළ පසු හිරු අවරට යන තෙක්

එහෙත් හේතුගතවු සලාතයන්හි සුන්නත් සලාත මේ වේලාවන්හිදි ඉටු කළ හැක. උදා:- මස්ජිදයට පඬුරක් වශයෙන් (මස්ජිදයට ඇතුල් වු විට කරන සලාතය), තවාෆ් හි සුන්නත් රක්අත් දෙක, සජදා තිලාවත් හා ස්තුතිය සඳහා කරන සජදා

❖ **මස්ජිද් පිළිබඳව නීති** :- අවශ්‍යතාවන්ට අනුව මස්ජිද් නිර්මාණය කිරීම සාමාන්‍ය යුතුකමකි. ඒවා අල්ලාහ්ට වඩාත් ප්‍රියමනාප ස්ථානයන්ය.

මස්ජිද්වල අත්පුඩි ගැසීම සංගීතය” තහනම් නිසැදැස් හා ගීත ගායනා කිරීම ගැහැණු පිරිමි මිශ්‍රව හැසිරීම සංසර්ගයේ යෙදීම වෙළදාම් කිරීම ආදිය තහනම්ය“ මස්ජිදය තුළ කෙනෙක් වෙළදාම් කරණු දුටුවොත් ’අල්ලාහ් නුඹේ වෙළෙදාමෙහි ලාභ ලබා නොදෙත්වා’ යැයි කීම සුන්නත් වේ“ තවද අස්ථානගතවු භාණ්ඩයක් මස්ජිදය තුළ සෙවීම ද තහනම්ය“ එවැනි කෙනෙකුව දුටුවොත් ’අල්ලාහ් නුඹට එම භාණ්ඩය ලබා නොදෙත්වා’යි කීම සුන්නත් වෙයි“

**පහත සඳහන් දෑ මස්ජිදය තුළ අනුමත ඒවාය** (ඔවුන්ගෙන් මස්ජිදයට හානියක් නොවන)ළමයින්ට ශිල්ප ඉගැන්වීම” නිකාහ්(විවාහ) සිදුකිරීම” ගැටළු විමසා සමථයට පත්කිරීම” අනුමත ගායනා ගැයීම” ඉඃතිකාෆ් ඉඳීම එහි සිටින අය හා සෙසු අය එහි නිදා ගැනීම” අමුත්තන් හා රෝගීන් රාත්‍රියේ නවාතැන් ගැනීම හා දහවල් විවේක ගැනීම“

මස්ජිදය තුළ කණ්ඩායම් ගැසී කෑකෝ ගැසීම” තර්ක විතර්කවල යෙදීම සීමාව ඉක්මවා කථා කිරීම” පිළිකුල් සහිත කථා හඬයී නගා කීම” අවශ්‍යතාවක් නොමැතිව එය ගමන් මගක් කර ගැනීම ආදියෙන් වැළකීම සුන්නත් වන්නේය“ ලෞකික දේවල් එතුළ කථා කිරීම මක්රූහ්ය. එහි බුමුතුරුණු” පහන් හා එහි විදුලිය මගුල් හා අවමගුල් නිවෙස් අලංකාරයට යොදා නොගත යුතුය“

# සකාත් (අනිවාර්ය බද්ද)

**සකාත් දියයුතු දෑ :-**

කරුණු හතරකින් සකාත් අනිවාර්ය වෙයි“ 1“ ගවයින් එළුවන් ඔටුවන් ආදි සතුන්“ 2“ මහපොළෙවෙන් පැලවෙන ශාඛ“ පලතුරු 3“ රන් රිදී ආදිය 4“ වෙළඳ ද්‍රව්‍ය

**සකාත් අනිවාර්ය වීමට කොන්දේසි:-**

පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ වුවිමෙන් පමණක් යම් භාණ්ඩයකට සකාත් අනිවාර්ය වේ“

1“ (භාණ්ඩයේ අයිතිකරු) මුස්ලිම් වීම 2“ නිදහස් පුද්ගලයෙකු වීම 3“ එම භාණ්ඩය සකාත් නියමවීමට අවශ්‍ය ප්‍රමාණය තිබීම 4“ අයිතිකරුට එම භාණ්ඩයේ සම්පූර්ණ අයිතිය හිමිවීම 5“ පොළොවේ වැවෙන ද්‍රව්‍ය හැර අනෙක්වා වසරක් සම්පූර්ණ වී තිබීම

**ගව“ එළු“ ඔටු ආදි සතුන් වෙනුවෙන් සකාත් :-** ඒවාට සකාත් නියම වීමට කොන්දේසි දෙකක් ඇත“ 1“ අවුරුද්දක් පුරා හෝ අවුරුද්දේ වැඩිකාලයක් මේච්චල් බිම්වල (වියදමකින් තොරව නිදැල්ලේ තණ කා) වැඩිය යුතුය“ 2“ ඒවා වැඩවලට නොයොදවා ඒවා වර්ධනය වී පැටව් හා කිරි ලබාගැනීමේ අරමුණෙන් යුත් පට්ටියක් විය යුතුය“ වෙළඳාම අරමුණු කරගෙන ඇති කරන සතුන්ට වෙළඳ භාණ්ඩවලට අයත් සකාත් දිය යුතුය“

**ඔටුවන් පිළිබඳ සකාත් විස්තර ඇතුළත් වගුව**

| ඔටුවන්ගේ සංඛ්‍යාව | 1 - 4 | 5 සිට 9 | 10 - 14 | 15 - 19 | 20 - 24 | 25 - 35 | 36 - 45 | 46 - 60 | 61 - 75 | 76 - 90 | 91 - 120 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සකාත් විස්තර | සකාත් නැත | 1 එළුවෙක් | එළුවන් 02 | එළුවන් 03 | එළුවන් 04 | බින්තු මහාල් | බින්තු ලබුන් | හික්කත් | ජසඅත් | බින්තු ලබුන් 02 | හික්කත් 02 |

ඔටුවන් සංඛ්‍යාව 120 ට වඩා අධිකව ඇතිනම් සම්පූර්ණ සංඛ්‍යාව 50න් බෙදා සෑම පහකටම හික්කත් එකක් හෝ 40න් බෙදා සෑම 40කටම බින්තු ලබුන් 1ක් දිය යුතුය“

**ඉහත සඳහන් ඔටුවන්ගෙන් අවශ්‍ය වයස් සීමාවන්**

බින්තු මහාල් - අවුරුද්දක් සම්පූර්ණ ගැහැණු ඔටුදෙනුන්
බින්දු ලබුන් - අවුරුදු දෙකක් සම්පූර්ණ ගැහැණු ඔටුදෙනුන්
හික්කත් - අවුරුදු තුනක් සම්පූර්ණ ගැහැණු ඔටුදෙනුන්
ජසඅත් - අවුරුදු හතරක් සම්පූර්ණ ගැහැණු ඔටුදෙනුන්

ගවයින්ට අයත් සකාත් විස්තර ඇතුළත් වගුව

| ගව සංඛ්‍යාව | 1-29 | 30-39 | 40-59 |
|---|---|---|---|
| සකාත් විස්තර | සකාත් නැත“ | තබීඋ - හෝ තබීඅත් | මුසින්නා හෝ මුසින්නත් |

ගවයින්ගේ සංඛයාව 60ක් හෝ එයට වැඩි නම් සම්පූර්ණ සංඛයාව 30න් බෙදා සෑම තිහකටම තබීඋ එකක් හෝ 40න් බෙදා සෑම 40කටම මුසින්නත් එකක් දියයුතුය“

**ඉහත සඳහන් ගවයින්ගේ වයස් විස්තරය**

තබීඋ (පිරිමි) තබීඅත් (ගැහැණු) අවුරුද්ද සම්පූර්ණ වූ ඒවා“
මුසින්නා (පිරිමි) මුසින්නත් (ගැහැණු) අවුරුදු දෙකක් සම්පූර්ණවූ

**එළුවන්ට අයත් සකාත් විස්තර ඇතුළත් වගුව**

| එළුවන්ගේ සංඛයාව | 1-39 | 40-120 | 121-200 | 201-399 |
|---|---|---|---|---|
| සකාත් විස්තර | සකාත් නැත“ | 01 එළුවෙක් | එළුවන් - 02 | එළුවන් -03 |

එළුවන්ගේ සංඛ්‍යාව 400ක් හෝ ඊට වැඩි නම් එය 100න් බෙදා සෑම සියයකටම 01 එළුවෙකු බැගින් දියයුතුය“
සකාත් දියයුතු එළුවන්ගේ වයස මාස හයක් සම්පූර්ණ බැටළුවන් අවුරුද්දක් සම්පූර්ණවූ එළුවන්

**පහත සඳහන් එළුවන්ට සකාත් නැත“**

ඇසක් අන්ධ පැටවා නඩත්තු කළ යුතුව සිටී ගැබ්ගෙන සිටී වටිනාකමින් අධිකය වයසින් වැඩි

❖ **පොළවේ වැවෙන ද්‍රව්‍ය සඳහා සකාත් :-**

**මහපොළොවේ වැවෙන සියළුම ධාන්‍ය හා පළතුරු වර්ග සඳහා පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ වෙයිනම් සකාත් දියයුතුය“**

1" භාවිතයේ ඇති මිනුම් භාණ්ඩවලින් මැන (ඉක්මනින් නරක් නොවී) කල්තබාගත හැකි දෑ" (උදා:- ධාන්‍යවර්ගවලින් සහල්" තිරිඟු සහ බාර්ලි ආදිය" පළතුරු වලින් රටඉඳි හා මිදි භාජනවලින් මැනිය නොහැකි රැස්කර තබා නොගත හැකි" (උදා) එළවළු" එලා වර්ගවලින් සකාත් දියයුතු නැත"

2" සකාත් සඳහා නියමිත (නිසාබ්) ප්‍රමාණය සපුරා තිබීම මෙයින් අවම නිසාබ් ප්‍රමාණය කි"ග්‍රෑ" 653කි"

3" යම්දෙයක සකාත් දිය යුතු කාලය එළඹෙන විට සකාත් දිය යුතු පුද්ගලයාට අයිතිව තිබීම" ඒවා පළතුරු වශයෙන් හෝ ධාන්‍ය වශයෙන් හෝ ආහාරයට ගැනීමට සුදුසු තත්ත්වයේ තිබියදීම සකාත් නියම වේ" එනම් පළතුරු රතු හෝ පැහැ ගැන් වී මෝරා තිබිය යුතු අතර ධාන්‍ය වර්ග ද මෝරා වියලිව තිබිය යුතුය"

**දියයුතු ප්‍රමාණය :-** වැසිදිය හෝ වාරි ක්‍රමයට මෙහෙයක් නොමැතිව (ජලය සපයන්නෙකු සේ) ජලය සපයා ඇතිනම් ඒවායින් දහයෙන් එකක් (10) :10- සකාත් දිය යුතුය" ළිඳකින් වතුර ඉසින්නෙකු සේ ඉතා වෙහෙසට පත්වී ජලය සපයන්නේ නම්" විස්සෙන් එකක් (5) :5- දියයුතුය" අවුරුද්දේ සමහර දිනවල වෙහෙසවී ද තවත් සමහර දිනවල පහසුවෙන් ද ජලය සපයා ඇතිනම් දෙකෙන් කොයි ක්‍රමය අධිකවන්නේ ද ඒ අනුව සකාතය නියම වේ"

❖ **රන් රිදී ආදියෙහි සකාත් විස්තර:-** රත්තරන් ග්‍රෑම් 85ක් හා රිදී ග්‍රෑම් 595ක බර ඇති වන තෙක් ඒවාට සකාත් නියම නොවේ" මුදල් කාසි හා නෝට්ටු ඒවායේ වටිනාකම රන්" රිදී ආදියෙහි සකාත් නියම විය යුතු අවම නිසාබ් ප්‍රමාණය වන්නේය" එවිට සකාත් අනිවාර්ය වෙයි" (එනම් රත්‍රන් ග්‍රෑම් 85 රිදී ග්‍රෑම් 595 ආදියෙහි එවකට වෙළඳ පොළේ මිල ගණන් බලා දෙකේ වටිනාකමින් යුත් ධනය කෙනෙකු ළඟ ඇතිනම් එම මුදලට සකාත් දිය යුතුය" රන්" රිදී හා මුදල් ආදියට දිය යුතු සකාත් ප්‍රමාණය 40න් එක් පංගුවකි" (2"5)

පරිහරනය සඳහා රන් රිදී ආභරණ ඇතිනම් ඒවාට සකාත් දිය යුතු නැත" කුලියට දී ආදායම් ලැබීමේ හො රැස්කර තැබීමේ අරමුණෙන් කළ ඒවාට සකාත් දිය යුතුය"

පුරුදු පරිදි භාවිතය සඳහා නිමාකළ ආභරණ පාවිච්චිය ගැහැණුන්ට අනුමැතිය ඇත" තවද භාජනවල රිදී තරමක් මිශ්‍ර කර ගැනීමට අනුමැතිය ඇත" පිරිමින්ට සම්පූර්ණයෙන් රිදියෙන් නිමවූ මුදු හා ඇස් කණ්නාඩි වැනි සුළු ප්‍රමාණයේ භාණ්ඩ භාවිතයට අනුමැතිය ඇත" රත්තරන් ගත් විට සුළුවශයෙන් හෝ භාජනවලට එය භාවිතා කළ නොහැක" ගැහැණුන්ට සමාන අයුරින් නොව ඇඳුමක බොත්තම් වැනි ඉතා සුයියියිථ ප්‍රමාණයේ භාණ්ඩ භාවිතා කිරීමේ අනුමැතිය පිරිමින්ට ඇත"

කෙනෙකු ළඟ ඇති මුදල් ප්‍රමාණය අඩු වැඩිවීමට ඉඩ ඇත" මේනිසා අවුරුද්දේ යම් දිනයක් තීරණය කරගෙන අවුරුදු පතා එමදිනයට තමන් ළඟ ඇති ධනය ගණන් බලා 2"5 සකාත් දිය හැක" එයින් සමහරක් අවුරුද්දක් අසම්පූර්ණ වුවද කමක් නැත" මාස්පතා ලබන වැටුප" ඉඩම් හා නිවාස කුලියට දීමෙන් ලැබෙන ආදායම කොතරම් විශාල ප්‍රමාණයක් වුව ද එයින් යමක් ඉතිරි නොකළේ නම් එයට සකාත් දිය යුතු නැත" ඉතිරි කරන්නේ නම් එයට සකාත් දිය යුතුය" මුලින් කී පරිදි තනි තනිව වසරක් සම්පූර්ණ වූ බව ගණන් ගැනීම අපහසුනම් නියමිත දිනයක් තීරණය කරගෙන සියල්ල ගණන් බලා දිය යුතුය"

**ණය වෙනුවෙන් සකාත්:-**

යම් ධනවතෙකුට ණයක් දී එම ණය ආපසු ලැබුනේ නම් ගතවූ කාලය කොතරම් වුවද එයට ගණන් බලා සකාත් දිය යුතුය" නැතිබැරි කෙනෙකුගෙන් අය කර නොගත හැකි ණයක් ඇතිනම් එයට සකාත් අනිවාර්ය නොවේ" හේතුව ඒ මුදල අයිතිකරුගේ අයිතියට ලැබී නොමැත"

❖ **වෙළඳ භාණ්ඩ සඳහා සකාත්:-** පහත සඳහන් කොන්දේසි හතර අසම්පූර්ණ නම් ඒවාට සකාත් දිය යුතු නැත" 1" එම භාණ්ඩයට අයිතිකරුවෙක් වීම 2" ඒවායින් වෙළඳාම් කිරීමේ තීරණයක් තිබිය යුතුය" 3" ඒවායේ වටිනාකම (සකාත් දියයුතු) නිසාබ් ප්‍රමාණය සම්පූර්ණ විය යුතුය" එනම් රන් රිදී ආදියෙහි නිසාබ්හි අවම ප්‍රමාණය" 4" අවුරුද්දක් සම්පූර්ණ වීම

මෙම කොන්දේසි සම්පූර්ණ නම් වෙළෙඳ භාණ්ඩ සඳහා සකාත් දිය යුතුය“ ඒවායේ 'නිසාබය' සම්පූර්ණ කිරීම සඳහා රන් රිදී හා මුදල් ද ඇත්නම් ඒවා ද වෙළඳ භාණ්ඩ සමග එක්කළ යුතුය“

නිවෙස්” ඇඳුම් හා වාහන යනාදිය තම පාවිච්චියට ගැනීමට තීරණය කළවිට සකාත් දිය යුතු නැත“ ඒවා විකිණීමට තීරණය කළ විට ඒවා වෙළඳ භාණ්ඩ ලෙස ගණන් ගත යුතු අතර එයට වාර්ෂිකව දිනයක් නියම කරගත යුතුය“

**සකාතුල් ෆිත්ර්:-** උපවාස උත්සව දිනයේ (රාත්‍රියේ හා දහවලේ) තමාටත් තම පවුලේ අයටත් ප්‍රමාණවත් ආහාරය සඳහා වියහියදම් තිබී එයට වඩා අමතරව කෙනෙකු ළග මුදල් තිබේ නම්” ඔහුට සකාතුල් ෆිත්ර් අනිවාර්ය වන්නේය“ එක ගැහැණියකට හෝ පිරිමියෙකුට දිය යුතු ප්‍රමාණය එම ගමේ ප්‍රධාන ආහාර ද්‍රව්‍යයෙන් කිලෝ 2¼ කි“ සකාතුල් ෆිත්ර් නියමවූ කෙනෙකු තමාගේ නඩත්තුවට ඇතුළත් වන අයට උත්සව (අවුරුදු උත්සව) දවසේ රාත්‍රියේ ඒවා දියයුතුය“ අවුරුද්ද දවස උදෑසන අවුරුදු සලාතයට පෙර එය දීම වැදගත්වෙයි“ අවුරුදු සලාතය අවසන් වන තුරු එය ප්‍රමාද කිරීම නුසුදුසුය“ අවුරුදු දිනයට දවසක් දෙකක් කළින් ද එය දියහැක“ කීප දෙනෙකුට හෝ එක් අයෙකුට වුවද දිය හැක“ එක් අයෙකුගේ කොටස කීප දෙනෙකුට වුවද දිය හැක“

**සකාතය ඉටුකිරීම:-** සකාත් නියම වූ විට ප්‍රමාද නොවී එය හැකි ඉක්මණින් දිය යුතුය“ කුඩා ළමයින් හා පිස්සු රෝගීන් සතු වත්කම් සඳහා ඔවුන්ගේ භාරකරුවන් දිය යුතුය“ සකාත් දීමේ දී එය ප්‍රසිද්ධ කිරීමත් එහි අයිති කරුවන් අතින්ම දීමත් සුන්නත් වෙයි“

විචක්ෂණ බුද්ධිය හා පියවි සිහියෙන් යුත් කෙනෙකු තම සකාතය දෙන බවට අධිෂ්ඨාන කරගැනීම අනිවාර්යය“ සකාත් දෙන කෙනෙකු තමා සාමාන්‍ය පරිදි දන් දෙන සිතුවිල්ලෙන් මුළු ධනයම බෙදා දුන්න ද එය සකාත් නොවේ“ එක වස්තුවක් සඳහා දිය යුතු සකාතය එම ගමේම සුදුස්සා තෝරා ගැනීම ඉතා වැදගත්ය“ එහෙත් ගමේන් පිටතට දීම සාධාරණ ප්‍රතිඵල අත්වේ යැයි හැගේ නම් එවැනි අයට දිය හැක“

භාණ්ඩයකට නියමිත සකාත්හි නිසාබ් සම්පූර්ණ නම් එයට අදාළ සකාතය අවුරුදු දෙකකට අවශ්‍ය ප්‍රමාණය කළින්ම ගෙවීමට ද හැක“

**සකාත් ලැබීමට සුදුසු කණ්ඩායම් අට:-**

1“ දිළින්දන් 2“ දුප්පතුන් 3“ සකාත් රැස්කිරීමේ සේවයේ යෙදෙන්නන් 4“ සකාත් දීම හේතුකොට ගෙන ඒ පිළිබඳව හිත ඇදී ඉස්ලාමයේ තවදුරටත් ස්ථාවරත්වයක් ඇති කර ගත හැකි උදවිය 5“ (නිදහස ප්‍රකාශ කර තිබුණද එය ලබාගැනීම මුදල් නැති) වහළුන් 6“ ණයකාරයින් 7“ දෙවියන්ගේ මාර්ගයේ සටන් කරන්නන් 8“ මගීන්

මොවුන් හැම කෙනෙකුටම ඔවුන්ගේ අවශ්‍යතාවන්ට අනුව සකාත් අරමුදලින් ලබාදිය හැක“ එහෙත් තෙවන කණ්ඩායමට අයත් සකාත් රැස්කිරීමේ සේවයේ යෙදෙන්නන්ට ඔහුගේ සේවයට ගැලපෙන කුලියේ ප්‍රමාණය ගෙවනු ඇත“ ඒ අනුව අතමිට තියෙන අයද එය ලබාගත හැක“ පාලකයකු ජනතාවගෙන් කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් සකාත් ලබා ගන්නේ නම් එය ඉටු වෙයි“ ඔහු සාධාරණව හෝ අසාධාරණව හෝ කටයුතු කළ ද කමක් නැත“ කාෆිර්” වහල්ලු” ධනවතුන් සකාත් දෙන්නන්ගේ නඩත්තුවට ඇතුල් වන්නන් හා බනු හාෂිම් පෙළපතේ අයට සකාත් දිය නොහැක“ සකාත් ගැනීමට නොසුදුසු කෙනෙකුට සකාත් දී පසුව ඔහුගේ තත්ත්වය හෙළි වූයේ නම්” එම සකාතය ඉටු නොවේ“ එහෙත් දුප්පත් අයෙකු යැයි සකාත් දුන්පසු ඔහු ධනවතෙක් බව හෙළිවුවද එය ඉටු වෙයි“

**අනිවාර්ය නොවන සුන්නත්වූ දානයන් :-** *නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ“ 'නියත වශයෙන්ම මු:මින් වරයෙකුගේ මරණයෙන් පසුවද ඔහුගේ කුසල්වලින් අඛණ්ඩව ප්‍රතිඵල ලැබෙන දෑ වන්නේ” ඔහු උගන්වා පතුරුවා හැරිය දැනුම“ ඔහු අතහැර ගිය යහපත් දරුවන් හා ඔහුගේ උරුමක්කරුවන්ට දායාද කළ අල්-කුර්ආන් ඔහු නිර්මාණය කළ මස්ජිද් (පල්ලි) මගියන් සඳහා ඔහු නිර්මානය කළ විශ්‍රාමශාළා ඔහු නිර්මානය කළ ඔය / ගංගා (ජලාශ) ඔහු නිරෝගිව සිටින විට ඔහු දුන් දානයන්* (ඉබ්නු මාජා)

# උපවාසය

වැඩිවියට පත් පියවි සිහියෙන් යුත් උපවාසය රැකීමට ශක්තිය ඇති මාසශුද්දිය හා ප්‍රසූත ශුද්ධියෙන් පිරිසිදු වූ තත්ත්වයේ (ගැහැණුන්) ආදි සෑම මුස්ලිම්වරයෙකුටම රාම්ළාන් මස උපවාසය රැකීම අනිවාර්ය වෙයි“ උපවාසය රැකීමට ශක්තිය ඇත්නම් එය හුරු කිරීමේ අරමුණෙන් කුඩා දරුවන්ටද උපවාසය රකින ලෙස දිරිගැන්වීම යහපත්ය“

**රාමළාන් මාසයේ ආරම්භය පහත සඳහන් කරුණු දෙකෙන් එකක් දැන ගත හැක.**

1“ වැඩිවියට පත් පියවි සිහියෙන් යුත් යහපත් චරිතයකින් හා ආගමික වතාවන්හි නියැලුන විශ්වාස කළහැකි සාධාරණ මුස්ලිම්වරයෙකු මුල් හඳ දැකීම (ගැහැණියක් වුව ද කමක් නැත”)

2“ (සඳ නොදුටු විට) ෂඃබාන් මාසය දින තිහක් සහිත මාසයක් ලෙස සම්පූර්ණ කළ හැක”

සෑම දවසකම සුබ්හු (ෆජ්ර්) සලාතයේ සිට හිරු අවරට යන තෙක් උපවාසය රැකිය යුතුය“ අනිවාර්ය උපවාසය සඳහා කලින් දිනයේ රාත්‍රියේම අධිෂ්ඨානය කරගැනීම අනිවාර්ය වෙයි“

**උපවාසය අවලංගුවන ක්‍රියාවන්**

1“ **බිරිඳ සමග සංසර්ගයේ යෙදීම:-** මෙසේ උපවාසය බින්ද කෙනා එයට හිලව් වශයෙන් නැවත ඇල්ලීමත් වරදට ප්‍රතිකර්මය කිරීමද අවශ්‍යය“

**ඒ පිළිබඳ ප්‍රතිකර්මය මෙසේය:** :-වහලෙකු නිදහස් කිරීම” එය කළ නොහැකි නම් අඛණ්ඩව මාස දෙකක් උපවාසය රැකීම එයත් කළ නොහැකි නම් දුගියන් 60 දෙනෙකුට ආහාර සැපයිය යුතුයි“

2“ **ශුක්‍රාණු පිටවීම:-** සිපගැනීම” කුමක් හෝ කාමාශාවෙන් ස්පර්ශ කිරීම” ස්වයං තෘප්තියේ යෙදීම ආදියෙන් සුක්‍රාණු පිටවුවොත් උපවාසය බිදෙයි“ නින්දේදි ශුක්‍රාණු පිටවීම හේතුවෙන් උපවාසයට කිසිදු හානියක් සිදු නොවේ“

3“ **හිතාමතාම අහාර ගැනීම පානය ගැනීම:-** එහෙත් අමතක වීමකින් සිදුවූයේ නම් උපවාසය නොබිදේ“

4“ **රුධිරය පිටකිරීම:-** ලේ දන්දීම පිණිස හෝ අධික රුධිරය පිටකිරීම සඳහා රුධිරය පිටකරන්නේ නම් උපවාසය බිදේ“ එහෙත් වෛද්‍ය පරීක්ෂණයක් සඳහා හෝ නොදැනුවත්ව හෝ රුධිරය පිටවූයේ නම් උපවාසය නොබිදේ“ උදා :- ඉබේ නාසයට මගින් හෝ තුවාලයකින් රුධිරය පිටවීම“

5“ **හිතාමතාම වමනය කිරීම:-** නමුත් ඉබේම වමනය ඇතිවීමෙන් උපවාසය නොබිදේ“

මාර්ගයේ ගමන් කරන විට දූවිල්ල මුඛ මාර්ගයෙන් ඇතුල්වී උගුරට යාම හෝ සාමාන්‍යයෙන් නාසයට ජලය ඇතුල් කරන විට” කට කලත්තන විට ජලය උගුරට යාම” සිත අවුස්සන එකක් ගැන සිතමින් සිටිය දී සුක්‍රානු පිටවීම“ නින්දේදී ශුක්‍රානු පිටවීම හා යමෙකුගේ උත්සාහයෙන් තොරව රුධිරය හෝ වමනය පිටවීම ආදියෙන් උපවාසය නොබිදේ“

රාත්‍රිය යැයි සිතා යමෙක් ආහාර ගත්පසු එය දහවල බව දැනගත් විට එයට හිලව්වශයෙන් පසු දිනක උපවාය රැකිය යුතුය“ 'ෆජ්ර්' වේලාව පැමිණියේ යැයි සිතා යම්කෙනෙක් රාත්‍රියේ ආහාර ගැනීම නිසා උපවාසයට හානියක් සිදු නොවෙයි“ තවද හිරු අවරට ගියේ යැයි සිතා (හිරු අවරට යාමට පෙර) ආහාර ගත්තේ නම් එය ඔහු හිලව් වශයෙන් පසු දිනක උපවාසය රැකිය යුතුය“

**උපවාසය අත්හැරීමට අනුමත නීති:-** සාධාරණ හේතුවකින් තොරව රම්ළාන් මාසයේ උපවාසය අත්හැරීම තහනම්ය“ ප්‍රසූති හා මාසශුද්ධිය ඇතිවූ කාන්තාව ද ආරක්ෂා කළ යුතු දෙයක් විපතින් බේරා ගැනීම සඳහා ද උපවාසය අත්හැරීමට සිදුවුවහොත් එසේ අත්හැරීම අනිවාර්යය“ සලාතය කෙටිකර ඉටුකිරීම ට අවශ්‍ය දුර ප්‍රමාණයක්  ගමන් කරන මගියෙක් උපවාසය ඇල්ලීම ඔහුට වෙහෙස ගෙනදෙයි නම් ඔහු උපවාසය අත්හැරීම සුන්නත් වෙයි“ එසේම දවල් කාලයේ ගමෙන් පිටත් වී ගමනක් යන අයෙකුට ද තමාට හෝ තම දරුවාට හානියක් වේ යැයි සිතන ගර්භනී මවකට හා කිරි මවකට ද උපවාසය අත්හැරීමට අනුමැතිය ඇත“ ඉහත සඳහන් හැම කෙනෙකුම තමන් අත් හළ උපවාසය නැවත හිලව් වශයෙන් පසු දිනක ඉටුකළ යුතුය“ (තමන්ට නොව) තම දරුවාට පමණක් හානියක් වේ යැයි බියෙන් උපවාසය අත්හළ කාන්තාව එම උපවාසය හිලව් වශයෙන් ඉටුකළ යුතු අතර සෑම උපවාසයකටම එක් දුප්පතෙකුට ආහාර  දිය යුතුය“

**මහළු බව” සුව කළ නොහැකි රෝග ආදිය** නිසා උපවාසය අල්ලන්නට නොහැකි වූ අය අත්හළ හැම උපවාසයක් වෙනුවෙන්ම එක් දුප්පතෙකුට අත්හළ එක් උපවාසය බැගින් ආහාර දිය යුතුය“ එමෙන්ම අත්හළ උපවාසය හිලව් වශයෙන් පසු දිනක කළ යුතු නැත“

**උපවාසය කලා (හිලව්) කළ යුතු කෙනෙකු** සාධාරණ හේතුවක් උඩ ඊළග වසරේ රමළාන් මාසය දක්වා ප්‍රමාද කර” ඔහු එය කලා කළහොත් ප්‍රමාණවත්ය“ එහෙත් සාධාරණ හේතුවක් නොමැතිව එසේ ප්‍රමාද කළහොත් කලා ඉටුකරන අතර සෑම උපවාසයක් වෙනුවෙන්ම එක් දුප්පතෙකු බැගින් ආහාර ද සැපයිය යුතුය“ සාධාරණ හේතුවක් උඩ එසේ ප්‍රමාද කළ අයෙක් ඊට කලින් මියගියහොත් ඒ වෙනුවෙන් කිසිවක් කළයුතු නැත“ සාධාරණ හේතුවක් නොමැතිව එසේ කලා කිරීම ප්‍රමාද කළ අයෙක් අතරතුර මිය ගියහොත් (ඔහු වෙනුවෙන්) සෑම උපවාසයකටම එක් උපවාසයකට එක් දුප්පතෙකු බැගින් ආහාර සැපයිය යුතුය“ අසනීපය හේතුකොට යම් කෙනෙක් උපවාසය අත්හළ තත්ත්වයේ මියගියහොත් පවුලේ අය එම උපවාසය ඇල්ලීම සුන්නත් වන්නේය“ එමෙන්ම ඔහු භාර වූ උපවාසය හා අනෙක් වත්පිළිවෙත් පිළිබඳව භාරයන් ද, ඥාතීන් ඉටුකිරීම සුන්නත්ය“

**සාධාරණ හේතු මත උපවාසය අත්හළ අයෙකුට** එහි සහනයට හේතුවූ කරුණ දහවල් කාලයේ ගෙවී ගියහොත් ඉතිරි කාලය උපවාසය රකින්නෙකු මෙන් ගතකර නැවත එම දවසට නියමිත උපවාසය 'කලා' (හිලව්) කළ යුතුය“ තවද කාෆිර් කෙනෙකු දවල් කාලයේ ඉස්ලාමය වැළඳගන්නා විට ද” ශුද්ධියෙන් කාන්තාවක් පිරිසදු වන විටද මෙම නීතිය පිළිපැදිය යුතුය“ ඒ එක්කම උපවාසය අත්හළ රෝගියෙකු සුවය ලැබීම” මගියා තම ගමන නිමාකර ගැනීම” ළමයෙකු වැඩිවියට පත්වීම හා උමතුවක් සුවවීම ආදි තත්ත්වයන් හිද මේ නීතියම පිළිපැදිය යුතුය“ රමළාන් මාසයේ උපවාසය නොඅල්ලා එම රමළාන් මාසයේම වෙනත් උපවාසද ඉටුකළ නොහැක“

**සුන්නත් උපවාසය** :- සුන්නත් උපවාසවලින් ඉතා වැදගත් වන්නේ දවසක් හැර දවසක් උපවාසය ඇල්ලීමයි“ තවද සතියේ සඳුදා හා බ්‍රහස්පතින්දා දිනවල ද මාස්පතා දින තුනක ද උපවාසය ඇල්ලීම සුන්නත්ය“ එයිනුත් ඉතා වැදගත් වනුයේ චන්ද්‍ර මාසයේ (ඉස්ලාම් මාස ගණනය) 13” 14” 15 වෙනි දිනවල උපවාසය ඇල්ලීමයි“ මුහර්රම්” ෂඃබාන් ආදි මාසවල වැඩි ප්‍රමාණයක් උපවාසය ඇල්ලීම ද සුන්නත් වෙයි“ එමෙන්ම ආෂුරා” අරෆා හා ෂව්වාල් මස දින හයක් උපවාසය ඇල්ලීමද සුන්නත් වෙයි“ තනිව රජබ් මාසයේ පමණක් හෝ සිකුරාදා පමණක්” සෙනසුරාදා පමණක් උපවාසය ඇල්ලීම මක්රූහ් වෙයි“ තවද අහස පැහැදිලිව තිබුණ ද සඳ දුටුබව තහවුරු නොවූ ෂඃබාන් 30 වැනි දින (උපවාසය පිළිබඳව සැක සහිත දින) උපවාසය ඇල්ලීම මක්රූහ්'ය“

**උපවාසය ඇල්ලීමට තහනම් දවස්** :- උපවාසය(නෝම්බි) අවුරුද්ද හා හජ් අවුරුද්ද යන දෙදින ද 'අය්යාමුත්තෂ්රීක්' නමැති දුල්හජ් මාසයේ 11” 12” 13 සඳ දිනවල ද උපවාසය ඇල්ලීම තහනම් ය එහෙත් කිරාන් හෝ තමත්තු ක්‍රමයේ හජ් ඉටුකර ඒ හෙතුවෙන් උපවාසය අල්ලන්නට අවශ්‍ය කෙනෙකුට අය්යාමුත් තෂ්රීක් දිනවල විශේෂ අනුමැතියක් ඇත“

**වැදගත් සටහන්**

- උපවාසය ඇල්ලිය යුතු කෙනෙකුට ෆජර්වලට කලින් මහ කිලිට ඇතිවී නම් (ගැහැණුන් මාස් ශුද්ධියෙන් පිරිසිදු වීම හෝ කුමක් හෝ මගක් ජනාබත් ඇතිවීම වැනි) ස්නානය නොකර සහර් කර සුබ්හු සලාතයට බාංගු කී පසු නාගෙන සලාතයට යා හැක“ මේ හේතුවෙන් උපවාසයට කිසිදු හානියක් නොවේ“
- සියල්ලන් සමග එක්වී උපවාසය ඇල්ලීමේ අරමුණින් කාන්තාවක් මාස් ශුද්ධිය ප්‍රමාද කරගැනීමට වෛද්‍යවරයෙකුගෙන් ප්‍රතිකාර ලබාගත හැක“ එහෙත් එයින් අතුරු ආපදා ඇති නොවේ යැයි වගකීමක් හා විශ්වාසයක් තිබිය යුතුය“
- උපවාසය රකින අයෙක් කෙළ හා උගුර තුළ ඇතිවන සෙම ගිලීමෙන් උපවාසය නොබිඳේ“
- නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ පහත සඳහන් පරිදි පැවසූහ“ (උපවාසය මුදවන වේලාව පැමිණි වහා) ප්‍රමාද නොවී උපවාසයෙන් මිදී” සහර් කිරීම (හැකි තරම් දුරට) ප්‍රමාද කරමින් ද කටයුතු කරන තෙක් මගේ සමූහයා යහපත් ලෙසම සිටින්නෝය“ (අහ්මද්) යුදෙව්වන් හා කිතුණුවන් උපවාසය ප්‍රමාද කර මිදෙන නිසා (එයට වෙනස් ලෙස) අපගේ ජනතාව උපවාසය මිදීම ඉක්මන් කරන තෙක් මෙම දහම (අනෙක් දහම්වලට වඩා) ගෞරවනීය හා මහිමයෙන් යුත් උත්තරීතර ලෙස වැජඹෙන්නේය” (අබූ දාවූද්)
- උපවාස මුදවන අවස්ථාවේ දුආ ප්‍රාර්ථනාවන්හි යෙදීම සතුටුදායක ය“ නබි (සල්ලල්ලාහු

අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ" 'නියත වශයෙන්ම උපවාසය රකින්නෙකුට උපවාසය මුදවන විට ප්‍රතික්ෂේප නොකරන අනුමත කෙරෙන ප්‍රාර්ථනාවක් ඇත" (ඉබ්නු මාජා) හදීස්වල උපවාසයන් මුදවනවිට කීමට ඇති ප්‍රාර්ථනාවන්ගෙන් නබි තුමන් කළ පහත සඳහන් ප්‍රාර්ථනය ද එකකි" 'දහබල් ළමඋ වබ්තල්ලතිල් උරූකු වසබතල් අජ්රූ ඉන්ෂා අල්ලාහ්" (පිපාසය සංසිඳින" නහර තෙත්විය" අල්ලාහ් මනාප වී නම් ප්‍රතිඵල අනිවාර්යය වනු ඇත")

❖ හොඳට නොවියලි ඉදුනු රට ඉඳි ගෙඩියකින් උපවාසය මිදීම සුන්නත් වෙයි" එය නොලැබේ නම් වියැලුණු ඉඳි ගෙඩියක් මගින් හෝ එයත් නොලැබී නම් ජලයෙන් උපවාසය මිදීම සුන්නත් වෙයි"

❖ උපවාසය අල්ලන්නා ඇසට සුර්මා දැමීමෙන් හා ඇසට හෝ කණට උව බිංදු දැමීමෙන් වැළකී සිටීම හොඳය" මෙසේ කිරීමෙන් උපවාසය බිඳෙනු ඇතැයි සමහර වියතුන්ගේ මතයක් ඇති නිසා එයිනුත් වැළකීම වඩා හොඳය" එහෙත් වෛද්‍ය ප්‍රතිකාර වගේ දෙයක් නම් කළාට වරදක් නැත" එසේ කණට හෝ ඇසට දමණ උව බිංදුවල රස උගුරට දැනුන ද උපවාසයට හානියක් සිදු නොවේ"

❖ උපවාසය රකින්නෙක් දවසේ ඕනෑම අවස්ථාවක දත් මැදිය හැක" බලවත් සාධක සාක්ෂි සහිත අදහස් අනුව එය මක්රූහ් නොවේ"

❖ උපවාසය රකින්නෙකු ඕපාදූප කීම" කේලම් කීම" බොරු කීම වැනි පිළිකුල් ක්‍රියා අනිවාර්යයෙන් අත්හළ යුතුය" කවරෙකු හෝ බැන වදීනම් 'නියතවශයෙන්ම මම උපවාසයේ නියැළෙන්නෙකු වෙමි'යි කියා ඇත් වී යා යුතුය" දිව හා අනෙක් අවයවයන් ද පාපයන්ගෙන් ආරක්ෂා කරගන්නට උපවාස රකින්නෙකු වග බලා ගනී" නබි තුමාණෝ මෙසේ කීහ" ***"බොරු කීමත් ඒ අනුව කටයුතු කිරීමත් කවරෙකු අත් නොහළේ ද ඔහුගේ (උපවාසයෙන්) ආහාරය හා පානය අත්හැරීමෙන් අල්ලාහ්ට කිසිදු අවශ්‍යතාවක් නොමැත"*** (බුහාරි)

❖ උපවාසය රැකගෙන සිටියදී සංග්‍රහයකට ආරාධනා කරනු ලැබුවහොත් (ඔහු ගොස්) සංග්‍රහ කරන්නාට ප්‍රාර්ථනා කිරීම සුන්නත් වෙයි" උපවාසයේ නියැළී නැතිනම් අනුභව කිරීම සුන්නත් වෙයි"

❖ ලෙයිලතුල් කද්ර් යනු අවුරුද්දක ඉතාමත් වැදගත් රාත්‍රියකි" එය රමළාන් මාසයේ අවසාන රාත්‍රි දහය තුළ එන එකකි" (එයිනුත් 27 වැනි දිනයේ එම රාත්‍රිය ඒමට බොහෝ දුරට ඉඩ ඇතැයි සමහරු කියා ඇත") එම රාත්‍රියේ කරනු ලබන යහක්‍රියාවන් මාස දහසක් යහකම් කරනවාටත් වඩා අගනේය" එය හඳුනාගැනීමට සමහර සලකුණු ඇත" එවායින් සමහරක් පහත සඳහන්වේ"

- එදින උදෑසන සූර්යයා අධික කිරණ නිකුත් නොකර සුදු පැහැයෙන් පෙනෙයි"
- එදින කාලගුණය වැඩි උෂ්ණත්වයක් හා වැඩි සිසිලකින් තොරව මධ්‍යස්ථව පවතී"

සමහර විට මුස්ලිම් වරයෙක් තමා නොදැනුවත්වම එම රාත්‍රියට ප්‍රවේශ විය හැක" එහෙයින් ලෙයිලතුල් කද්ර් රාත්‍රියට පිවිසීමේ අරමුණෙන් යුතුව රමළාන් මාසය මුළුල්ලේම යහපත් කටයුතුවල යෙදිය යුතුය" එහි සෑම රාත්‍රියකම වත්පිළිවෙත් වල නොවරදවා යෙදිය යුතුයි" එහි අවසාන දින දහය සුවිශේෂය"

තවද ඉමාම්වරයෙකු සමග රාත්‍රි සලාතයේ යෙදුන කෙනෙකු එම ජමාඅත් සලාතය අවසන් වනතුරු සහභාගි විය යුතුය" එවිට ඔහුට රාත්‍රිය මුළුල්ලේ වතාවත් කළ කුසල් ලියවෙයි" කෙනෙකු සුන්නත් උපවාසයක් අල්ලන්නේ නම් එය ඔහුට සුන්නත්ම වන්නේය" අනිවාර්ය නොවන්නේය" ඔහු එය හිතාමතා අත්හරින්නේ නම් එය වරදක් නොවේ" එය කලා (හිලව්) කළ යුතු ද නැත"

ඉ:තිකාෆ්:- ඉ:තිකාෆ් යනු වත්පිළිවෙත් ඉටුකිරීමේ අරමුණෙන් පියවි සිහියෙන් යුත් මුස්ලිම්වරයෙකු මස්ජිදයේ රැඳී සිටීමයි" ඉ:තිකාෆ් හි නිරත වන අයෙකු මහා කිලිටෙන් වැළකී සිටීම එහි කොන්දේසියකි" තවද ඔහු කෑම බීම වැසිකිලි කැසිකිලි යාම සාමාන්‍ය නෑම වැනි කටයුතුවලට මිස මස්ජිදයෙන් බැහැරව නොයා යුතුය" අවශ්‍යතාවෙන් තොරව මස්ජිදයෙන් බැහැරව යාම හා සංසර්ගයේ යෙදීම ඉ:තිකාෆය බිඳ දමයි" සාමාන්‍යයෙන් හැම අවස්ථාවකම ඉ:තිකාෆ් ඉඳීම සුනන්නත් වන්නේය" එයිනුත් රමළාන් මාසයේ ඉඳීම අති විශේෂ වන්නේය" රමළාන් මාසයේ අවසන් දින දහයේ ඉ:තිකාෆ් ඉඳීම සියල්ලට වඩා ඉතා විශේෂ වන්නේය" ඉ:තිකාෆ් ඉටුවීමට අවම කාලය මඳ වේලාවකි" එහෙත් දවසකට නොඅඩුව ඉඳීම සතුටුදායකය" විවාහ වූ කාන්තාවක් සැමියාගේ අනුමැතිය රහිතව ඉ:තිකාෆ් නොඉඳිය යුතුය" ඉ:තිකාෆ් ඉන්න අයෙකු වත්පිළිවෙත්වල නිරතවීමත් අනුමත කාර්යයන්හි පවා අධිකව නිරත නොවීමත් තමන්ට අනවශ්‍ය දෑවලින් වැළකී සිටීමත් සුන්නත් වන්නේය"

# හජ් හා උම්රාව

**පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ නම් කොනෙකුගේ ජීවිතයේ එක් වරක් හජ් හා උම්රාව ඉටු කිරීම අනිවාර්ය වේ.**

1. මුස්ලිම් වීම 2. පියවි සිහියෙන් යුක්තවීම 3. වැඩිවියට පත්ව සිටීම 4. නිදහස් පුද්ගලයෙකු වීම 5. එම වතාවත් ඉටු කිරීමට අවශ්‍ය පහසුකම් තිබීම (එනම් ගමනට අවශ්‍ය වාහන, ගමන් වියදම් ඇත්තෙකු වීම) තවද කාන්තාවකට අතිරේක වන හයවන කොන්දේසියක් ද ඇත. එනම් ඇය සමග යාමට ඇගේ ස්වාමි පුරුෂයා හෝ මහරම් කෙනෙකු අවශ්‍යය. මහ්රම් යනු එම කාන්තාව කිසිවිටක විවාහ කරගත නොහැකි පිරිමියෙකි. මහරම් නොමැතිව ගැහැණියක් හජ් ඉටු කළ ද එය අනුමත වෙයි. එහෙත් ඇය මහ්රම් නොමැති ගමනේ යෙදුන වරදට (පාපයට) ලක් වන්නීය.

හජ් අනිවාර්ය වු අයෙක් (එය ඉටු නොකර) අසනීප වී මරණයට පත් වුවහොත් ඔහුගේ වස්තුවෙන් හජ් උම්රා සඳහා වු වියදම වෙන් කර එය ඉටු කළ යුතුය. උමතු වූ අයෙකු හෝ කාෆිර් කෙනෙකු ඉටු කරන හජ් පිළිගනු නොලැබේ. එහෙත් කුඩා ළමයෙක් හෝ වහලෙක් ඉටු කරන හජ් පිළිගැනේ. එහෙත් ඉස්ලාමයේ අනිවාර්ය හජ් වශයෙන් එය පිළි නොගැනේ.

**ඉහ්රාම් නියයත් (අධිෂ්ඨානය) තැබීම:-**

ඉහ්රාම් නියයත් තැබීම සූදානම් වන කෙනෙකු මුලින්ම ස්නානය කර පිරිසිදු වී සුවඳ විලවුන් තවරා ගැනීම සුන්නත් වන්නේය. ඉන්පසු මසන ලද ඇඳුම් ඉවත් කර පිරිසිදු සුදු පැහැති වේට්ටියක් හා උඩුකය වැස්මක් ඇඳගනු ඇත. පසුව (ලබ්බෙයික් අල්ලාහුම්ම උමරතන්) හෝ (ලබ්බෙයික් අල්ලාහුම්ම හජ්ජන්) හෝ (ලබ්බෙයික් අල්ලාහුම්ම හජ්ජන් වඋම්රතන්) යැයි කටින් ප්‍රකාශ කර (තමා ඉටු කරන්නට යන්නේ හජ් ද උම්රාවද එසේ නොමැතිනම් දෙකමද) සිතේ අධිෂ්ඨානය කර ගනී. තමාගේ මෙම නැමදුම ඉටු කර නිමා කිරීමට කුමක් හෝ බාධකයක් වේ යැයි බියවුවහොත් එම ස්ථානයේම "මට ඇති වු බාධකය හේතුවෙන් මම ඉහ්රාමයෙන් ඉවත් වන්නෙමි"යි අධිෂ්ඨානය කරමින් ප්‍රකාශ කිරීම කොන්දේසියක් වශයෙන් පැනවේ.

**එනම් හජ් නැමදුම ඉටු කරන්න, ඉදිරිපත් වන අයෙකු පහත සඳහන් ක්‍රම තුනෙන් එකක් අනුගමනය කළ හැක. ඒවා නම් 'තමත්තුඋ', 'ඉෆ්රාදු', 'කිරාන්' ආදියයි. ඒවායින් ඉතා වැදගත් වනුයේ තමත්තුඋ ක්‍රමයයි.**

**තමත්තුඋ:-** හජ් නැමදුමට අදාල මාසවල පළමුවෙන් උම්රාහ්ව සඳහා නියමිත ඉහ්රාම්වලට නියයත් (අධිෂ්ඨානය) තබා ගෙන එය පළමුවෙන් ඉටු කර අවසන් කළ පසු එම අවුරුද්දේම හජ් පිළිබඳව ඉහ්රාම් නියයත් තැබීමයි.

**ඉෆ්රාද්:-** හජ්වලට පමණක් ඉහ්රාම් අධිෂ්ඨානය තැබීම

**කිරාන්:-** උම්රාහ්ව සඳහා හෝ හජ් හා උම්රා දෙකටම එකවරම අධිෂ්ඨානය තබා එම උම්රාවේ තවාෆය ආරම්භ කරන්නට පෙර හජ් අවස්ථාව පැමිණීමයි.

හජ් සඳහා අධිෂ්ඨානය කරගෙන වාහනයේ නැගී පිටත් වන කෙනෙක් පහත සඳහන් පරිදි තල්බියාව කියන්නට පටන් ගනී.

(ලෙබ්බෙයික් අල්ලාහුම්ම ලබ්බෙයික් ලෙබ්බෙයික් ලා ෂරීකලක ලෙබ්බෙයික් ඉන්නල් හම්ද වන්නිඃමත ලක වල් මුල්ක් ලා ෂරීක ලක්) තල්බියාව අධිකව කීමත් කාන්තාවන් හැර අන් අය ශබ්දය උස් හඬින් කීමත් සුන්නත් වන්නේය.

**ඉහ්රාම් සහිත අවස්ථාවේ තහනම් දෑ:-** 1. කෙස් ඉවත් කිරීම 2. නියපොතු කැපීම 3. පිරිමි උදවිය නොමැසූ ඇඳුම් ඇඳීම. එහෙත් වේට්ටිය වැනි නොමැසූ ඇඳුම් නොලැබුණ දුෂ්කර අවස්ථාවක දිග කලිසමක් වැනි මැසූ ඇඳුමක් ඇඳගත හැක. තවද සාමාන්‍ය පාවහන් නොලැබුන විට සපත්තුවක උඩ කොටස කපා පහළ කොටස පාවිච්චි කළ හැක. මෙවැනි අවස්ථාවක වන්දියක් නියම නොකෙරෙයි. 4. පිරිමි හිස වැසීම 5. ශරීරයේ හෝ ඇඳින වස්ත්‍රයේ සුවඳ විලවුන් තැවරීම 6. කෑමට අනුමත කැලෑ සතුන්ව දඩයම් කිරීම. 7. විවාහ ගිවිස ගැනීම (විවාහ කරදීම තහනම්ය. එහෙත් එය කළ නිසා වන්දියක් ගෙවිය යුතු නැත) 8. ලිංගය නොවන ශරීරයේ අනෙක් අවයව රාගයෙන් ස්පර්ශ කිරීම. එළුවෙක් කපා දන්දීම හෝ දින තුනක් උපවාසය ඇල්ලීම හෝ දුප්පතුන් 6 දෙනෙකුට ආහාර දීම ආදිය එයට නියමිත දඬුවම් වන්දියයි. 9. සංසර්ගයේ යෙදීම. ඉහ්රාමයෙන් ඉවත් වන අවස්ථා දෙකෙන් පළමු අවස්ථාවට කලින් මෙය කළහොත් හජ් කිරීම අහෝසි වී යයි. එහෙත් ඔහු දිගටම හජ් ක්‍රියාවන් වල යෙදීමත් ඊළග අවුරුද්දේ එය හිලව් වශයෙන් ඉටු කිරීමත් ඔටුවෙක් කපා මක්කමේ දුප්පතුන්ට බෙදා දීමත් ඔහුගේ වගකීම වන්නේය.

මෙම ක්‍රියාව ඉහ්රාමයෙන් ඉවත් වන පළමු අවස්ථාවට පසුව කළේ නම් ඔහුගේ හජ් නොබිඳෙන්නේය" එහෙත් ඔහු ඔටුවෙකු කපා දන් දිය යුතුය" තවද උම්රා නැමදුමෙහි යෙදී සිටින අයෙකු සංසර්ගයේ යෙදුනේ නම් එම උම්රාව බිඳී යයි" ඔහු එළුවෙකු කැපීමත් එම උම්රාහ්ව නැවත හිලව් කිරීමත් ඔහුගේ වගකීමයි" ඉහ්රාමයේ තහනම් කළ ක්‍රියාවන්ගෙන් සංසර්ගය හැර අනෙක්වා කුමක් කළ ද හජ් හෝ උම්රාව නොබිඳේ" ඉහ්රාමයේ තහනම් කළ මෙම ක්‍රියාවන්ගෙන් මැසූ ඇඳුම් ඇඳීම හැර අනෙක් ඒවායින් ගැහැණු හා පිරිමි එක සමානය" එහෙත් ගැහැණුන් මැසූ ඇඳුම් ඇඳිය හැකි වුව ද අත් හා මුහුණ වැසීම තහනම් ය"

**සිදුවන වැරදි වෙනුවෙන් ප්‍රතිකර්ම දෙයකාර වෙයි"** 1" කෙනෙකුගේ මනාපය පරිදි තෝරා ගැනීම 2" අනුපිළිවෙලින් එකක් නොහැකි නම් අනෙක ඉටු කිරීම.

1" කෙස් ඉවත් කිරීමසුවඳ තවරා ගැනීම" නිය කැපීම" හිස වැසීම මැසූ ඇඳුම් ඇඳීම ආදිය සඳහා ප්‍රති කර්මයි" ඒවා සඳහා ප්‍රතිකර්ම (වන්දි ) වන්නේ දින තුනක් උපවාසය රැකීම එක් කෙනෙකුට කි" 1 1/2 බැගින් දුප්පතුන් 6 දෙනෙකුට ආහාර දීම එළුවෙක් කපා දන් දීම" දඩයමේ යාම වෙනුවෙන් ප්‍රතිකර්ම වන්දිය වනුයේ" ඝාතනය කරනු ලැබූ සතාට සමාන සතුන්ගෙන් (එළු" ගව හා ඔටුවන්ගෙන්) එකෙකු කපා දන් දීමයි" එයට සමාන සතෙකු නොලැබුණේ නම් එම සතාගේ වටිනාකමට අදාල මුදල බෙදා දීමයි"

2" තමත්තුඋ හෝ කිරාන් ක්‍රමය අනුව හජ් ඉටු කරන්නාට වරදට වන්දි (ප්‍රතිකර්මයක්) ලෙස එක එළුවෙකු ද සංසර්ගයේ යෙදීම වෙනුවෙන් ඔටුවෙකු ද කපා දිය යුතුය" එම සතුන් කැපීමට අපහසු වී නම් හජ් සමයේ ම උපවාස තුනක්ද ආපසු තම ගමට ගොස් උපවාස හතක්ද රැකිය යුතුය" තවද සතුන් කපා බෙදා දීමත් ආහාර ප්‍රදානය කිරීමත් හරම් හි ජීවත්වන දුප්පතුන්ට පමණය"

**මක්කා නගරයට ඇතුල් වීම:-** හජ් ඉටු කිරීමේ අරමුණෙන් යන අයෙක් ශුද්ධ මස්ජිදුල් හරමයට ඇතුල් වීමේදි සෙසු මස්ජිද්තුළට ඇතුල් වීමෙදී කියන පැතුම ම කියයි" පසුව ඔහු තමත්තුඋ ක්‍රමයට හජ් ඉටු කරන අයෙකු නම් පළමුවෙන් උම්රාවට නියමිත තවාෆය කරයි" ඉෆ්රාද් හෝ කිරාන් ක්‍රමය අනුව හජ් ඉටු කරන්නෙකු නම් කවාඉල් කුදූම් (මක්කාවෙන් පිටත සිට මස්ජිදුල් හරමයට ඇතුල් වන අයෙක් ප්‍රථමයෙන් ඉටු කරන තවාෆය) ආරම්භයේ ම ඉටු කරයි" තවාෆ් කරන්න ආරම්භ කරන අයෙක් තම උඩුකය වැස්මෙන් මැද කොටස තම දකුණු උරහිස යටින් ද එහි කොන්දෙක තම වම් උරහිසට උඩින් ද දමා ගනී"

ඊලඟට හජ්රුල් අස්වද් ගල (බිස්මිල්ලාහ් අල්ලාහු අක්බර්) යැයි ප්‍රකාශ කර තම කටින් සිප ගනී" නැතිනම් යම් භාණ්ඩයකින් ස්පර්ශය කර එම භාණ්ඩය සිප ගනී" එසේත් නැත්නම් දකුණු අතින් සංඥා කරයි" තවාෆයේ සෑම වටයක දීම මෙසේ කරගනී" පසුව කඃබාව තම වම්පසට සිටින සේ එය සත්වරක් පැදකුණු කරයි 7 වරක් දිවීමේදී පළමු වට තුනේදි හැකිතරම් දුරට 'රමල්' දිවීම දුවයි" සෙසු වට සාමාන්‍ය ලෙස යයි" 'රමල්' දිවීම යනු පාද තැබීමේදි පාද ළං ළංව තබමින් තරමක් ඉක්මණින් දිවීමයි" තවාෆ් කරන කෙනෙකු කඃබාවේ 'රුක්නුල් යමානි' නමැති මුල්ලට කෙලින් එනවිට හැකිනම් එයට අත තබයි" එයටත් ඊලඟ මුල්ලටත් අතරේ (රබ්බනා ආතිනා ෆිද්දුන්යා හසනතන් වෆිල් ආඛිරති හසනතන් වකිනා අදාබන් නාර්) යනුවෙන් කියයි" වටයේ සෙසු ස්ථානවල දී තමාට කැමති පැතුමක් කරගනී" තවාෆ් කර අවසන් වූ පසු හැකිනම් මකාමු ඉබ්‍රාහිම් පසුපස සිට රක්අත් දෙකක් සලාතය කරගනී" පළමු රකඅතයේ සූරා කාෆිරූන් ද අනෙක් රකඅතයේ සූරතුල් ඉක්ලාස් ද කියයි" ඉන්පසු සම්" සම් ජලය පානය කරයි" එය අධිකව පානය කිරීම වැදගත් ය" ඉන්පසු හජ්රුල් අස්වද් ගල කරා පැමිණ එයට අත තබා සිප ගැනීමෙන් පසු මුල්තසම් යන ස්ථානයේ දුආ ප්‍රාර්ථනා කරයි" 'මුල්තසම්' යනු හජ්රුල් අස්වද් හා කඃබාවේ දොරටුව අතර වූ කුඩා ස්ථානයකි"

මේවා ඉටුකර නිමාවූ පසු සඊ) කිරීම සඳහා සෆා කන්දට නැග අල්ලාහ් ආරම්භ කළ දෙයින් මම ආරම්භ කරම්'යි පවසා 'ඉන්නස් සෆා වල් මර්වතමින් ෂආඉරිල්ලා""""" යැයි ආරම්භ කරන කුර්ආන් වැකිය කියා (අල්ලාහු අක්බර් ලා ඉලාහ ඉල්ලල්ලාහු වල්ලාහු අක්බර්) යැයි තක්බීර් කියා එහි සිට කඃබාව බලා තම දෑත් ඔසවා ප්‍රාර්ථනා කරයි" ඉන්පසු සෆා කන්දේ සිට බැස මර්වා නැමති ස්ථානය බලා ගමන් කරයි" එසේ ගමන් කරන විට කොළ පැහැති පහන් දෙකක් අතර මඳක් වේගයෙන් ගමන් කරයි" අනෙක් තැන්වලින් සාමාන්‍ය පරිදි ගමන් කරයි" මර්වා

කන්දට නැගීමෙන් පසු සෆා කන්දේ කළ දේවල්ම කරයි˝ පසුව සෆා කන්දේ සිට පැමිණියා සේ මර්වාව බලා ගමන් කරයි˝ මෙසේ සෆා˝ මර්වා අතරේ 7 වරක් එහා මෙහා හැල්ලේ දුවයි˝ සෆා සිට මර්වා දක්වා එක් වරක් ලෙස ද මර්වා සිට සෆා දක්වා එක් වරක් ලෙස ද ගණන් ගැනේ˝ සඊ කිරීමෙන් පසු තම කෙස් සම්පූර්ණයෙන් බූ ගෑම හෝ සම්පූර්ණයෙන් කැපීම දෙකෙන් එකක් කරයි˝ මෙහි 'තමත්තුඋ' ක්‍රමයට උම්රාව ඉටු කරන අය හැර අනෙක් අය සම්පූර්ණයෙන් හිස බූ ගෑම යහපත්ය˝ ඔහු එම උම්රාවෙන් පසු හජ් කිරීමට තිබීම මෙයට හේතුවයි˝

කිරාන් හෝ ඉෆ්රාද් ක්‍රමයට හජ් ඉටු කරන්නා තවාෆුල් කුදූම්ට පසු හජ් උත්සවය දිනයේ ජම්රතුල් අකබාවට ගල් ගසන තෙක් ඉහ්රාමයෙන් ඉවත් නොවෙයි˝ ඉහත කී තවාෆ˝ සඊ දෙකෙන්ම පිරිමින් මෙන්ම ගැහැණුන් ද අනුගමනය කරයි˝ එහෙත් තවාෆ හා සඊයේද ගැහැණුන් 'රමල්' දිවීම සුදුසු නොවේ˝

**හජ් කරන ආකාරය:-** දුල්-හජ් මාසයේ 8 වෙනි චන්ද්‍ර දිනය වූ තර්වියා නමැති දිනයේ ඉහ්රාම් තත්ත්වයේ නොමැති අයෙක් මක්කමේ ඔහු නැවතී සිටින ස්ථානයෙන් ඉහ්රාම් අධිෂ්ඨාන ඇතුව පිටත් වී 9 වෙනි දින මිනාවේ නැවතීම සඳහා යයි˝ 9 වෙනි දින උදෑසන එහි සිට අරෆාව බලා පිටත්ව යයි˝ එහි ලුහර් සලාතයේ වේලාව පැමිණි විට එහි දී ලුහර් හා අසර් සලාත දෙක එක්කර කෙටිකර ඉටු කරයි˝ උර්නා බෑවුම හැර අරෆා පිටියේ අනෙක් සෑම ස්ථානයක් ම හජ් සඳහා නැවතීම ට සුදුසු ස්ථාන වන්නේය˝ අරෆාවේ නවාතැන් ගන්න අයෙක් (ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්) යන දික්රය අධිකව කියයි˝ තවද අල්ලාහ්ගේ දයාව ලබා ගැනීම සඳහා දුආ ප්‍රාර්ථනාවන්හි ද පාප ක්ෂමාව අයැදීමෙහිද අධිකව යෙදෙයි˝ හිරු අවරට යාමත් සමග මුස්දලිෆාව බලා හෙමින් සීරුවේ යයි˝ එසේ යන අතර මග තල්බියාව කියන ගමන් දික්ර් ආදිය ද කියයි˝ මුස්දලිෆාවට ගිය වහා එහි දී මඃරිබ් හා ඉෂා සලාත දෙක එක්කර කෙටිකර ඉටු කිරීමෙන් අනතුරුව එහිම නවාතැන් ගනී˝ පසුදින සුබහ් සලාතයට නියමිත වේලාව පැමිණි විට සලාතය ඉටුකර පැහැදිලි ආලෝකය උදාවන තෙක් එහි දුආ ප්‍රාර්ථනයෙහි යෙදෙයි˝ ඉන්පසු සූර්ය උදාවට පෙර මුස්දලිෆාවෙන් පිටත් වෙයි˝ යන අතර මග වාදි මුහස්සිර් නමැති ස්ථානයට පැමිණි විට හැකිනම් ඉතා වේගයෙන් එම ස්ථානය පසුකර යයි˝ පසුව මිනාවට පැමිණි වහා පළමුවෙන්ම ජම්රතුල් අකබාවට ගල් ගසයි˝ ඇඟිල්ලෙන් විදිය හැකි (මුංඇටයටත් වෙඩි උණ්ඩයටත් අතර ප්‍රමාණයේ) කුඩා ගල්කැට 7 ක් විසි කරයි˝ සෑම ගලක්ම වීසිකරන විට අත ඔසවා වීසි කරන අතර තක්බීරය ද කියයි˝ විසිකරන ගල් එහි ඇති කුළුණේ නොවැදුන ද එම කුළුණ වටා බැඳ ඇති තාප්පය තුළට වැටීම අනිවාර්යය˝ (එහෙත්) දැනට එය තාප්පයක් ලෙසම නිර්මාණය කර විශාල කර ඇති බව සඳහන් කළ යුතුය˝) ජම්රාවට ගල් ගැසීම ආරම්භ කළ විට තල්බියාව නතර කරගනී˝ ඉන්පසු තම කුර්බානය කපා දන්දෙයි˝ ඒත් සමගම හිස බූ ගෑම හෝ කපා ගැනීම කරයි˝ එනමුත් හිස බූ ගෑම ම ඉතා වැදගත් වෙයි˝ ගල් ගසා අවසන් වී හිසකෙස් කැපීමෙන් අනතුරුව ඉහ්රාමයේ දී තහනම් කරන ලද අඹුසැමි ඇසුර හැර අනෙක් හැම දෙයක්ම අනුමත වන්නේය˝ මෙය ඉහ්රාමයෙන් ඉවත්වන ප්‍රථම අදියරයි˝ මෙයට අත්තහල්ලුල් අව්වල් යැයි කියැවේ˝

ඉන් අනතුරුව මිනාවට ආපසු ගොස් එහි අනිවාර්යයෙන් නැවතිය යුතු රාත්‍රිවල එහි නවාතැන් ගනී˝ තවද එහි නැවති සිටින දිනවල සෑම දිනකම ලුහර් වේලාව පැමිණි විට ජම්රාවට ගොස් දිනකට ගල් හත බැගින් ගල් ගසයි˝ පළමුවෙන් ජම්රතුල් ඌලාවට ගල් ගසා මඳක් ඉදිරියට ගොස් නැවති ප්‍රාර්ථනා කරයි˝ පසුව මැද තිබෙන ජම්රතුල් වුස්තාවට ද ගල්ගසා එසේම ප්‍රාර්ථනා කරයි˝ අනතුරුව ජම්රතුල් අකබාවට ගල් ගසන ඔහු එහි නොරැඳෙයි˝ දෙවන දිනයේ මෙසේම ජම්රාවන්ට ගල් ගසයි˝ තුන්වෙනි රාත්‍රියේ එහි නොරැඳී වේලාසනින් යාමට ඔහු මනාප වූයේ නම් දෙවන දිනයේ හිරු අවරට යාමට පෙර මිනාවෙන් පිටවෙයි˝ එහෙයින් දොළොස් වන දිනයේ රාත්‍රි මිනාව තුළ සිටින විට හිරු අවරට ගියේ නම් එදින රාත්‍රි මිනාවේ නැවතී සිටීමත් පසු දින ගල් ගැසීමත් ඔහුට අනිවාර්ය වෙයි˝ එහෙත් ජනගහණය නිසා ඇති වූ තදබදය හේතුකොට ගෙන එදින හිරු අවරට යාමට පෙර ඔහුට යා නොහැකි වූයේ නම් රාත්‍රියේ මිනාවෙන් පිටව යාම වරදක් නොවේ˝ කිරාන් ක්‍රමයට හජ් ඉටු කරන්නාද ඉෆ්රාද් ක්‍රමටය හජ් ඉටු කරන්නා වැනිය˝

එහෙත් ඔහු තමත්තුඋ ක්‍රමයට හජ් ඉටු කළ අයෙකු මෙන් කුර්බානියක් දිය යුතුය˝ හජ් අවසන් වූ පසු නිවෙස් කරා යාමට මනාප අයෙක් අවසාන වශයෙන් කඃබාව නැරඹීමට 'තවාෆුල් විදා'

සමුගැනීමේ තවාෆ් නොකර මක්කමෙන් පිට නොවෙයි“ එහෙත් මෙම සමුගැනීමේ තවාෆය මාස්ශුද්ධිය හෝ ප්‍රසූතිය තත්ත්වයේ පසුවෙන කාන්තාවන්ට අනිවාර්ය නොවේ“ සමුගැනීමේ තවාෆය අවසන් කළ පසු මක්කමේ වෙළදාම වැනි කටයුතුවල නිරත වුවහොත් නැවත සමුගැනීමේ තවාෆය කළ යුතුය“ තවද සමුගැනිමේ තවාෆය නොකර මක්කමෙන් පිට වී ටික දුරක් ගිය කෙනෙක් නැවත පැමිණ 'තවාෆ්' කළ ද එය පිළිගැනේ“ එහෙත් ඔහු අධික දුරක් ගමන් කළේ නම් එම තවාෆය වෙනුවට කුර්බානයක් දිය යුතුය“

**හජ්හි රුකුන් නමැති වගකීම්** - **4කි** එනම්:-” 1“ ඉහ්රාම් (හජ් නැමදුම ආරම්භ කරන බවට) අධිෂ්ඨාන කර ගැනීම“ 2“ අරෆාවෙහි නැවතීම 3“ තවාෆ් කිරීම (මෙය තවාෆුල් ඉෆාළා හෝ තවාෆුල් සියාරා නමින් හැඳින් වෙයි) 4“ සර් කිරීම (සෆා” මර්වා කඳු දෙක අතර හැල්ලේ දිවීම)

**හජ්හි අත්‍යවශ්‍ය වගකීම** - **7කි** එනම්:- 1“ ඉහ්රාම් අධිෂ්ඨානය සඳහා නියමිත මීකාත් නමැති ස්ථානයේ සිට අධිෂ්ඨානය කිරීම 2“ අරෆා හි (හිරු අවරට යනතෙක්) රැඳී සිටීම 3“ මුස්දලිෆාහි (රාත්‍රියේ අඩකටත් අඩු පසු කාලය දක්වා) රැඳීම 4“ අය්යාමුත් තෂ්රීක් (නමැති දුල්-හජ් 11”12” 13) දිනවල රාත්‍රි කාලයන් හි මිනාවෙහි රැඳී සිටීම“ 5“ ජම්රාවන්ට ගල් ගැසීම“ 6“ හිසකෙස් කැපීම හෝ මුඩු කිරීම“ 7“ සමුගැනීමේ තවාෆ් කිරීම“

**උම්රාවෙහි රුකුන් (වගකීම් )** - **3කි**:- එනම්” 1“ මීකාත්හි සිට ඉහ්රාම් අධිෂ්ඨානය කර ගැනීම“ 2“ උම්රාවට අයත් තවාෆය කිරීම. 3. උම්රාවට අයත් සර් කිරීම.

**තවාෆ් ඉටු වීමට අවශ්‍ය කොන්දේසි** - **13කි**“ එනම්:-

1“ මුස්ලිම් වරයෙකු වීම 2“ පියවි සිහියෙන් යුක්තවීම 3“ ඒ පිළිබඳව අධිෂ්ඨානය කිරීම 4“ තවාෆයට අවශ්‍ය වේලාවට පිවිසීම 5“ අව්රතය (වැසිය යුතු අංග) වසා ගැනීම 6“ කුඩා කිළිටෙන් පිරිසිදු වීම (කුඩා ළමයින්ට මෙම කොන්දේසිය නැත“) 7“ ස්ථිර වශයෙන් වට හතක් සම්පූර්ණ කිරීම 8“ කඃබාව තම වම්පසට සිටින සේ තවාෆ් කිරීම මෙයින් වටයක් හෝ වැරදුනේ නම් එය නැවත ඉටු කිරීම“ 9“ තවාෆ් කරන විට පසුපසට නොයා සිටීම 10“ ශක්තිය ඇති අය පයින් ම ගමන් කිරීම“ 11“ තවාෆයේ වට එක දිගටම ඉටු කිරීම“ 12“ මස්ජිදුල් හරම් මස්ජිදය තුළ තවාෆ් කිරීම 13“ හජ්රුල් අස්වද් ගල අසලින් තවාෆය ආරම්භ කිරීම“

**තවාෆ්හි සුන්නත් දෑ**:- හජ්රුල් අස්වද් ගල සිප ගැනීම හෝ යම් භාණ්ඩයකින් ස්පර්ෂ කර එය සිප ගැනීම” හජ්රුල් අස්වද් ගල සිප ගන්නා විට තක්බීර් කීම” කඃබාවේ මුල්වලින් එකක් වූ රුකුනුල් යමානිය ඇල්ලීම” කලින් සඳහන් කළ 'රමල්' දුවන ස්ථානවල වේගයෙන්ද සාමාන්‍යයෙන් ගමන් කරන ස්ථානවල සැහැල්ලුවෙන්ද ගමන් කිරීම“ තවාෆයේ දී දික්ර්” ප්‍රාර්ථනා යනාදිය කීම” කඃබාවට ළංවී තවාෆ් කිරීම” තවාෆ් අවසන් වූ පසු මකාමු ඉබ්‍රාහිම්ය ට පසුපස සිට සුන්නත් රකඅත් දෙකක් ඉටු කිරීම“

**සර්වල කොන්දේසි** - **9කි**“ ඒවානම්:- 1“ මුස්ලිම් කෙනෙකු වීම 2“ පියවි සිහියෙන් යුක්ත වීම 3“ ඒ සඳහා නිය්යත් (අධිෂ්ඨානය) කිරීම“ 4“ අඛණ්ඩව දුව අවසන් කිරීම“ 5“ ශක්තිය ඇති අයෙක් පයින්ම යාම“ 6“ වට හතක දිවීම සම්පූර්ණ කිරීම“ 7“ සෆා හා මර්වා කඳු අතර දුර සම්පූර්ණයෙන් තරණය කිරීම“ 8“ හරියාකාරව තවාෆ් කිරීමෙන් පසුව මෙය ආරම්භ කිරීම. 9“ ඔත්තේ සංඛ්‍යාව සෆා වෙන්ද ඉරට්ටේ සංඛ්‍යාව මර්වාවෙන්ද ආරම්භ කිරීම

**සර්යෙහි සුන්නත්**:- කිලිටෙන් හා අපිරිසිදුතාවෙන් වැළකී සිටීම” (අව්රාත්) වැසිය යුතු අවයව වසා ගැනීම” සර්යෙහි අතර මග දුආ දික්ර් ආදියෙහි යෙදීම” නියමිත ස්ථානවල වේගයෙන් ද සාමාන්‍යයෙන් ද ගමන් කිරීම” සෆා මර්වා කඳු මතට නැගීම” තවාෆ් හා සර් දෙක අතර වෙන් නොවී අඛණ්ඩව කර අවසන් කිරීම“

**සටහන** :- ජම්රාවල ගල් ගසන විට එක් දිනක විසි කළයුතු ප්‍රමාණය එම දිනයේම විසි කර අවසන් කිරීම වැදගත් වේ“ එහෙත් එය පසුවදාට කල් දමා ඊළඟ දවසේදී විසි කළ හැක“ හැම දවසකට එක්කර අයියාමුත්-තෂ්රීක් අවසන් දිනයේ විසි කළ ද එය ඉටුවෙයි“

**උළ්හිය්යා**:- උල්හිය්යා දීම ප්‍රධාන සුන්නතයකි“ තම උළ්හිය්යාව දීමට තීරණය කළ අයෙක් දුල්-හජ් මාසයේ ආරම්භයේ සිට එය කපන තෙක් තම ශරීරයේ කෙස් හෝ නියපොතු ඉවත් කිරීම තහනම් වේ“

**අකීකා**:- මෙය සුන්නත් ක්‍රියාවකි“ පිරිමි ළමයෙකුට එළුවන් දෙදෙනෙකු ද ගැහැණු ළමයෙකුට එළුවෙකු ද අකීකා සඳහා කපනු ලැබේ“ ළමයා ඉපදී දින 7 දී එය කැපීම සුන්නත් වේ“ තවද 7 වෙනි

දිනයේ එම ළමයාගේ හිස කෙස් කපා ඒ බරට රිදී දන් දීම ද නම් තැබීමද සුන්නත්ය“ අබ්දුල්ලාහ් අබ්දුර් රහ්මාන් යන නම් ඉතා වැදගත් වෙයි“ අබ්දුන් -නබි” අබ්දුර් -රසූල් යනුවෙන් නම් තැබීම තහනම්ය“ අකීකා දිනය උළුහියියා දිනයට යෙදුනේ නම් එකක් ඉටු කිරීම ප්‍රමාණවත්ය“

**සටහන** :- මස්ජිදුන් නබවියට යන අයෙක් පළමුවෙන් පඬුරු වශයෙන් රක්අත් 2ක් සලාතයේ යෙදෙයි“ ඉන්පසු ගෞරවනීය නබිතුමාණන් භූමදානය කර ඇති කිබ්ලාව පිටුපා කබ්රය (මිනිවල) දෙස බලා බැල්මත් හිසත් පහත් කර නබිතුමාණන්ව දකින්නා සේ සිත තුළ භක්තියක් හා ගෞරවයක් සහිතව (අස්සලාමු අලෛකුම් යා රසූලුල්ලාහ්) යනුවෙන් සලාම් කියයි“ තවත් අඩිකව යමක් කියන්නේ නම් එය අගනේය“ ඊළගට රියනක් පමණ පසෙකට ගොස් අබූ බක්කර් (රලියල්ලාහු අන්හු) තුමාණන්ට (අස්සලාමු අලෙක යා අබාබක්රිනිස් සිද්දීක්) යනුවෙන්ද උමර් (රලියල්ලාහු අන්හු) තුමාට (අස්සලාමු අලෙයික යා උමරල් ෆාරූක්) යනුවෙන් ද සලාම් කියා යා අල්ලාහ් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් සමග සේවය කළ නිසාද ඉස්ලාමයට සේවයක් කළ නිසාද එතුමන්ලාට යහපත් විපාක ලබා දෙන්වා'යි දුආ ප්‍රාර්ථනා කරයි“ ඉන්පසු කිබ්ලාව බලා කබ්ර් (මිණීවලවල්) ඔහු වම් පසට වන සේ සිටගෙන ප්‍රාර්ථනා කරයි“

## අනුපිළිවෙලින් හජ් නැමදුම ඉටු කරන ආකාරය පෙන්වන කෙටි වගුව

| නැමදුම් ක්‍රමය | තමත්තුඋ | කිරාන් | ඉෆ්රාත් |
|---|---|---|---|
| ආරම්භය: ඉහ්රාම් නිය්යත් තැබීමත් තල්බියා කීම ආරම්භ කිරීමත් | තමත්තුඋ ක්‍රමයට හජ් ඉටු කරන බවට කටින් කියා සිතේ අදිටන් කර ගැනීම | හජ් උම්රා දෙකම ඉටු හජ් කරන බවට සිතේ අදිටන් කර ගැනීම | හජ් ඉටු කරන බවට කටින් පවසා සිතේ අදිටන් කර ගැනීම |
| පසුව | උම්රාවේ තවාෆය කිරීම | මස්ජිදුල් හරාමය දුටු වහා කරන තවාෆුල් කුදූම් කිරීම | මස්ජිදුල් හරාමය දුටු වහා කරන තවාෆුල් කුදූම් කිරීම |
| පසුව | උම්රාවේ සඊ කිරීම (සෆා මර්වා කඳු අතර හැල්ලේ දිවීම) | හජ්හි සඊ | හජ්හි සඊ |
| පසුව | හිසකෙස් කැපීම හෝ මුඩු කිරීම මේ සමග ඉහ්රාමයෙන් සම්පූර්ණ යෙන් ඉවත්වේ“ | ඉහ්රාමය සමග තව දුරටත් සිටී | ඉහ්රාමය සමග තව දුරටත් සිටී |
| දුල්-හජ් 8 වන දින ලුහරයට පෙර | මක්කාවේ සිට හජ් සඳහා ඉහ්රාම් අදිටන් සමග මිනාවට යාම | මිනාවෙන් පිටත්වීම | මිනාවෙන් යාම |
| 9 වෙනි දින සූර්ය උදාවෙන් පසු | අරෆාවට ගොස් අසරය ඉදිරියට ගෙන එක්කොට දෙකම කෙටි කොට සලාතය ඉටු කිරීම“ ඉන්පසු හිරු අවරට යන තෙක් දුආ ප්‍රාර්ථනාවේ නියැලීම“ | | |
| හිරු අවරට ගිය පසු | මුස්දලිෆාවට ගිය වහා මග්රිබ් හා ඉෂා සලාතය එක්කර කෙටිකර සලාතය ඉටු කිරීම“ තවද රාත්‍රියෙන් අඩක් පමණ හැකි පමණ එහි රැඳී සිටීම සුන්නත් වෙයි“ | | |
| 10 වෙනි දින (උත්සව දින ෆජ්ර් වේලාවටත් සූර්ය උදාවටත් අතර | මිනාවට ගොස් ජම්රතුල් අකබාවට ගල් ගැසීම | | |
| | කුර්බාන් කැපීම | කුර්බාන් කැපීම | ᵕᵕᵕᵕᵕᵕᵕᵕ |
| | හිසකෙස් කැපීම හෝ මුඩු කිරීම” ඉන්පසු තවාෆුල් ඉෆාලා කිරීම මේ තුනෙන් දෙකක් කිරීමෙන් ඉහ්රාමෙන් පළමු ඉවත් කිරීමද කෙරේ“ | | |
| | හජ්හි සඊය කිරීම | ᵕᵕᵕᵕᵕᵕᵕᵕ | ᵕᵕᵕᵕᵕᵕᵕᵕ |
| 11” 12 වෙනි දිනවල ප්‍රමාධ වන අය 13 වෙනි දිනයේද- | ලුහර් සලාතයේ වේලාව පැමිණි විට 1 වෙනි 2 වෙනි හා තුන් වෙනි යනුවෙන් අනුපිළිවෙලට ජම්රාවන්ට ගල් ගැසීම | | |
| මක්කමේ සිට ගමන් අරඹන විට | (තවාෆුල් විදා:) සමුගැනීමේ තවාෆය කිරීම ප්‍රසූත මාසික ශුද්ධිය ඇති ගැහැණුන් මෙය කළ යුතු නැත“ | | |

# පොදුවේ සමහර උපදේශයන්

✷ **සමහර කරුණු පාපයන්ට** ප්‍රතිකර්ම වශයෙන් ද ඒවා ක්ෂමා කිරීමට හේතුවක් වශයෙන්ද ඇත“ ඒවායින් සමහරක් මෙසේය“ අල්ලාහ්ගෙන් පාප ක්ෂමාව අයැදීම” සැබැවින්ම සිත් තැවුලෙන් තව්බා කිරීම” යහපත් ක්‍රියා කිරීම” පරීක්ෂණ ඇති වීම” අනෙක් අය අප වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම” දන්පින් කිරීම” මෙම කරුණු ක්‍රියාත්මක වීමෙන් පසු ද ඔහුගේ පාපයන් ඉතිරි වී අල්ලාහ් ඒවා ක්ෂමා නොකළහොත් කබ්ර් (මිනීවලේ) හෝ පරලොවේදී අල්ලාහ් ඔහුට එම පාපයන්ට ප්‍රමාණවත් පරිදි වේදනාව ලබා දෙයි“ නිවැරදි ඒකීය ප්‍රතිපත්තිය මත ඔහු මිය ගියේ නම්” ඉන්පසු ඔහු ස්වර්ගයට යයි“ එහෙත් (කුෆ්ර්) දේව ප්‍රතික්ෂේපය (ෂිර්ක්) දෙවියන්ට ආදේශ කිරීම (නිෆාක්) කුෆ්ර් සඟවා ගෙන මුස්ලිම් මෙන් රඟපෑම ආදි තත්ත්වයන්ගෙන් කුමක් හෝ එකක් ඇතුව ඔහු මිය ගියේ නම් අවසානයක් නොමැති නිරයේ ඔහු ගත කරයි“

**පාපයන් නිසා මිනිසාට බොහෝ නරක ප්‍රතිඵල ලැබෙන්නේය“ ඒවානම් :-** ✷ පාපයන් නිසා සිතට ඇතිවන හානි:- එම පාපයන් හිතේ අඳුරත්” නින්දාවත්” රෝගයත් එක්තරා හිස් භාවයත් ඇති කරන්නේය“ තවද එම හිත අල්ලාහ්ගෙන් වෙන් කිරීමට ද සමත් වන්නේය“ අනතුරුව කෙනෙකුගේ ආගමික කටයුතුවලදී ද මෙවන් බොහෝ හානිවලට මං පාදන්නේය“ තවද යහපත් ක්‍රියාවලින් වළක්වන අතර නබිතුමන් මලක්වරුන් හා මුඃමින්වරුන්ගේ ප්‍රාර්ථනා ලැබීමේ භාග්‍යය ද නැති කරන්නේය“ ✷ රිස්ක් නමැති මිනිස් ජීවිතයට අවශ්‍ය අවශ්‍යතාවන්ට පාපයන් නිසා සිදුවන හානි:- ඒවා එම රිස්කය බාධාකර භාග්‍යය ඉවත් කර වස්තූන් විෂයෙහි අභිවෘද්ධිය ද මකා දමන්නේය“ ✷තනි පුද්ගලයෙකුට පාපයන් නිසා ඇතිවන හානි:- ඒවා ඔහුගේ ජීවිත කාලයේ අභිවෘද්ධිය මකා දමන අතර ඔහුගේ ජීවිතයේ දුෂ්කරතාව ඇති කර ඔහුගේ අවශ්‍යතා සපුරා ගැනීමේ දුෂ්කර තත්ත්වයක් ද ගෙන එන්නේය“ ✷යහපත් ක්‍රියාවන් විෂයෙහි පාපයන් නිසා ඇති වන හානි:- එම යහපත් ක්‍රියා පිළිගැනීම (අනුමත වීම)ට ඒවා බාධක වන්නේය“ ✷ පාපයන් නිසා සමාජයකට ඇතිවන හානි:- ඒවා ජනතාව අතරේ නිර්භය ආරක්ෂිත භාවය ඉවත් කරන අතර භාණ්ඩවල මිල අධික වීම ද ඇති කර අයහපත් පාලකයින්” සතුරන් ආදීන්ගේ අසාධාරණ හා වැස්ස නැතිවීම වැනි තවත් බොහෝ හානිවලට මුහුණ පාන්නට සිදුවන්නේය“

✷ **සන්සුන් සිතකින් සතුටින් ජීවත් වීමත්** දුකෙන් තොර ජීවිතයක් ගොඩනගා ගත යුතු බවත් හැම කෙනෙකුගේම අභිලාෂයයි“ ප්‍රීතිමත් ජීවිතයක් ගත කළ හැක්කේ මෙතුළින්ය“ එවැනි ජීවිතයක් ගොඩ නැගෙන්න ආගමික හා ස්වභාවික වැදගත් කරුණු ද ඇත“ මේ හැම එකක්ම එකට පිහිටෙන්නේ දේව විශ්වාසවන්තයින්ට පමණය“ එම කරුණුවලින් සමහරක් පහත සඳහන් වෙයි“ 1“ අල්ලාහ්ව විශ්වාසකිරීම (දේව විශ්වාසය) 2“ අල්ලාහ් අණ කළ දේවල් පිළිගෙන තහනම් කළ දැවලින් ඉවත්වීම 3“ වචනයෙන්” ක්‍රියාවෙන් හා වෙනත් විවිධ මාර්ගවලින් අනුන්ට පිහිටවීම 4“ යහපත් ක්‍රියාවන්හි ආගමික හා ලෞකික ප්‍රයෝජනවත් අධ්‍යාපන කටයුතුවල නිරතවීම 5“ සිදුවී අවසන් වු හෝ මතුවට සිදුවීමට ඇති දෑ ගැන සිත සිතා කාලය නාස්ති නොකර වත්මන් කටයුතුවල උනන්දුවෙන් කටයුතු කිරීම 6“ අල්ලාහ්ව අධික ලෙස (දික්ර්) මෙනෙහි කිරීම 7“ එළිපිට හා රහස්‍ය වු අල්ලාහ්ගේ දායාදයත් මතුකර පෙන්වීම 8“ ජීවිතයේ තරාතිරම් හා සැප පහසුකම් ආදියේදි අපට පහළ සිටින අය දෙස බැලීම 9“ ශෝකය උදාවන කරුණු ඉවත් කර සතුට ඇති කරන ක්‍රියාවන් කිරීමට උත්සාහ කිරීම 10“ ශෝකය ඉවත් කිරීම සඳහා නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන් කළ ප්‍රාර්ථනයන් මගින් අල්ලාහ්ගේ උපකාරය ලබා ගැනිමට සරණ පැතිම“

පහත සඳහන් නබි වදනට අවධානය යොමු කරන්න“ ’යම් කෙනෙකුට කුමක් හෝ දුකක් ඇති වී පහත සඳහන් ප්‍රාර්ථනය කළේ නම්” අල්ලාහ් ඔහුගේ දුක නැති කර සතුට ලබා දෙයි“ ඒ ප්‍රාර්ථනාව මෙසේය“ ’අල්ලාහුම්ම ඉන්නී අබ්දුක” වබ්නු අබ්දික” වබ්නු අමතික” නාසියතී බියදික මාලින් බිය්ය හුක්මුක අද්ලුන් බිය්ය කළාඋක“ අස්අලුක බිකුල්ලි ඉස්මින්” හුව ලක සම්මෙයිත බිහි නෆ්සක අව් අල්ලම්තහු අහදන් මින් හල්කික අව් අන්සල්තහු බී කිතාබික අව් ඉස්තඃසර්ත බිහී ෆී ඉල්මිල් ගයිබි ඉන්දක අන් තජ්අලල් කුර්ආන රබීඅ කල්බී වනුර සද්රී වජලාඅ හුස්නී වදහාබ හම්මී)

**ඉබ්‍රාහිම් අල්-හව්වාස් (රළියල්ලාහු) අන්හු තුමා පහත සඳහන් පරිදි ප්‍රකාශ කළේය"**

**වෛතසික රෝගයන්ට පස්වැදෑරුම් බෙහෙත් ඇත"** 1" අල්කුර්ආනය අවබෝධයෙන් කියවීම" 2" බඩ පිරෙන්නට නොකා කුසගින්න අත් විඳීම 3" රාත්‍රි නැමදුමේ යෙදීම (තහජ්ජුද්) 4" රාත්‍රි අන්තිම ජාමයේ අල්ලාහ්ගෙන් ඉතා බැගෑපත්ව ඉල්ලා සිටීම (ප්‍රාර්ථනා කිරීම) 5" දේව සෙනෙහස ලැබූ යහපත් අය සමග එක් වී සිටීම

✷ **විවාහවීමට අවස්ථාවක් ආශාවක්** ඇති තැනැත්තා දුරාචාරයේ හැසිරේ යැයි බියක් නොමැති නම්" ඔහු විවාහ වීම සුන්නත් වේ" එහෙත් ඔහු දුරාචාරයේ හැසිරේ යැයි බියක් ඇත්නම් ඔහු විවාහ වීම අනිවාර්ය වෙයි" ආශාවක් නොමැති අයෙක් විවාහ වීම අනුමතය විවාහය අනිවාර්ය අවස්ථාවකි" හජ් නැමදුමට වඩා එයට ප්‍රමුඛත්වය දිය යුතුය" තවද අන්‍ය ගැහැණුන්ව බැලීම තහනම්ය" වැඩිවියට පත් ගැහැණුන් දෙසද මුහුණේ රැවුල නොවැවුන පිරිමි ළමුන් දෙසද ආශාවෙන් බැලීම සුදුසු නැත" එසේම සතෙකු දෙසද ආශාවෙන් බැලීම ද සුදුසු නැත.

**පිරිමියෙක් ගැහැණියක විවාහ කර ගැනීමට පහත සඳහන් කොන්දේසි අවශ්‍යය.**

1" විවාහ ගිවිස ගැනීමේදි ගැහැණු පිරිමි දෙපාර්ශවයේම එකගත්වය තිබිය යුතුය" එහෙයින් ගැහැණු ළමයින් වැඩිපුර සිටින අයෙක් මගේ දූවරුන්ගෙන් කෙනෙකුව ඔබට විවාහ කර දෙමි'යි කීමෙන් එම ගිවිසුම වලංගු නොවේ"

2" පියවි සිහියෙන් යුත් නියමිත වයසට පැමිණි ධනය හා වස්තුව පාලනය කළ හැකි ආගමික ක්‍රියා කලාප හොඳින් ඇති ස්වාමි පුරුෂයෙකුගේ කැමැත්ත පරිදි ද එය සිදුවිය යුතුය"

3" මනාලියගේ ඉස්ලාමයේ නීත්‍යානුකූල භාර කාරයා වන 'වලි' මගින් ඇයව විවාහ කර දිය යුතුය"

එහෙයින් කාන්තාවක් තමන් විසින්ම විවාහ ගිවිස ගැනීමත් ඇගේ භාර කාරයෙකු නොවී තවකෙක් විවාහ කර දීමත් සුදුසු නැත" ඇයට ගැලපෙන අයෙකුව විවාහ කර දීමට වලි අකමැති අවස්ථාවක වලි නොවන අයෙකු විවාහ කර දිය හැක"

කාන්තාවක් විවාහ කර දීමට බලයලත් වලි වරුන්ගේ විස්තරය මෙසේය" ඇයගේ පියා (ඔහු නොමැති විට) පියාගේ පියා" (සීයා) ඊළගට ඔහුගේ පියා (මෙසේ ආරෝහණ ක්‍රමයට ඉහළට යයි) ඊළගට ඇගේ පුතා" පුතාගේ පුතා (මුණුබුරා) (මෙසේ අවරෝහණ ක්‍රමයට පහළට යයි) ඊළගට ඇගේ එක්කුස උපන් සහෝදරයා ඊළග පිය පාර්ශවයේ සහෝදරයා (එනම් ඇගේ සහ ඔහුගේ පියා එක් කෙනෙකි" මව්වරු දෙදෙනෙකි) ඊළගට සහෝදරයාගේ පුතා වශයෙන් පහළට යයි"

4" සාක්ෂි:- පියවි සිහියෙන් යුත් වැඩිවියට පත් සාධාරණ පිරිමින් දෙදෙනෙක් සාක්ෂි දීම අවශ්‍යය"

5" විවාහ ගිවිස ගන්නා ගැහැණිය හා පිරිමියා අතර විවාහ වීමට ඇති බාධක කිසිවක් නොමැති විය යුතුය. යම් (මහ්රම්) ඥාති සම්බන්ධතා වැනි.

✷ **අයෙක් විවාහවීමට තහනම් ගැහැණුන්**

**1" කිසිවිටක විවාහ නොවිය හැකි අය:- මෙය විවිධාකාරය :-**

1" පිරිමියෙකුට පාරම්පරික (ලේ නෑකම් ඇති) ඥාති ගැහැණුන්:- එනම් මව" මවගේ මව (මෙසේ ඉහළට යයි) දුව" දුවගේ දුව (මෙසේ පහළට යන නෑ කම්) එක්කුස උපන් සහෝදරිය සහෝදරියගේ දුව සහෝදරියගේ දුවගේ දුව මෙසේ පිරිමි සහෝදරයින්ගේ දුවගේ දුව (මෙසේ පහළට යන හැම ගැහැණු ළමයෙක්ම) මවගේ සහෝදරිය පියාගේ සහෝදරිය" (මවගේ හා පියාගේ සහෝදරියන් මෙසේ පහළට යන හැම ගැහැණුන්ම)

2" පිරිමියෙකුට කිරිබොන නෑදෑකමින් එන ගැහැණුන්:- මෙය පාරම්පරික ලේ ඥාතිත්වයට සමානය"

3" විවාහය මත ඇති ඥාති ගැහැණුන්:- එනම් බිරිඳගේ මව" ඇගේ මව පියාගේ මව්වරු" පියාගේ බිරිඳ" දෙගුරුන්ගේ පාර්ශවයේ සියලාගේ භාර්යාවන් පුත්තු හා මුණුබුරන්ගේ භාර්යාවන් කෙනෙකුගේ බිරිඳකගේ ගැහැණු දැරියන් (මෙසේ පහළට දුවන හැම ඥාති ගැහැණියෙක්ම)

**2" ස්ථිර වශයෙන් නොව තාවකාලිකව මහ්රම් වන ගැහැණුන් දෙවැදෑරුම්ය :-**

(අ) එකවර විවාහ නොවිය හැකි සමහර ගැහැණුන් - උදා:- එක්කුස උපන් සහෝදරියන් දෙදෙනා තවද ගැහැණියක් හා ඇගේ මවගේ සහෝදරි (කුඩම්මා) හෝ පියාගේ සහෝදරිය (නැන්දා)
(ආ) තව කෙනෙකුගේ බිරිඳක්ව සිටින කාන්තාව“
සටහන :- එකෙකු අකැමති කාන්තාවක් විවාහ කරගන්නා ලෙස ඔහුගේ දෙමව්පියන් ඔහුට බල නොකළ යුතුය“ එවැනි අවස්ථාවක දෙගුරුන්ට අවනත වීම“ ඔහුට අනිවාර්ය නොවේ මේ හේතුවෙන් ඔහු දෙමව්පියන් ට හිංසා කළ අයෙකු නොවන්නේය“
✷ තලාක් (දික්කසාදය) මාස් ශුද්ධිය හෝ ප්‍රසූතියට සූදානම් ගැහැණුන් හෝ සැමියා සමග සංසර්ගයේ යෙදී පිරිසිදුව සිටින කාන්තාවක 'තලාක්' කිරීම තහනම්ය“ (එය පාපයක් වුව ද) දික්කසාදය වලංගු වන්නේය. තවද අදාල හේතුවක් නොමැතිව 'තලාක්' කීම හෙලා දැකිය යුක්තකි“ (මක්රූහ්) එහෙත් අවශ්‍ය නම් තලාක් කීමට අනුමැතිය ඇත“ විවාහ සම්බන්ධයේ දිගටම සිටීමේ (සැමියා බිරිඳ අතරේ අන්‍යෝන්‍ය සුහදතාවක් නොමැති කමින් ඇතිවන) දුෂ්කරතාවටද හිරිහැරයට ද ගොදුරු වූ අයෙක් 'තලාක්' කීම සුන්නත්ය“ බිරිඳ තලාක් කිරීමේ විෂයෙහි දෙමව්පියන්ට අවනත වීම අවශ්‍ය නැත“ තම බිරිඳ තලාක් කියන්න සිතන අයෙක් (එකම අවස්ථාවේ) එකවරකට අධිකව තලාක් කීම තහනම්ය“ ඒත් එක්කම (තමා ඇය සමග සංසර්ගයේ නොයෙදී) පිරිසිදු තත්ත්වයේ ඇය සිටින විට තලාක් කීම යුතුකමකි“ එය ද එකවරක් පමණක් තලාක් කියා එයට වඩා අධික වාර ගණනක් නොකියා ඉද්දා අවසන් වන තෙක් එසේම ඉන්නට ඉඩ හරි“ මෙසේ තලාක් කියනු ලැබූ කාන්තාවක් ඇය සිටින නිවසෙන් පිටවීමත් සැමියා ඇයව ඉද්දා අවසන් වන තෙක් පිටමං කිරීමත් තහනම්ය“ තවද තලාක් කටින් කීමෙන් ඉටු වෙයි සිතෙන් සිතීමෙන් පමණක් ඉටු නොවේ“
✷ දිවුරුම් :- දිවුරුම කඩකළ වරදට ප්‍රතිකර්ම නියම වීමට පහත සඳහන් කොන්දේසි හතර අවශ්‍යය“
1“ දිවුරීමේ අරමුණෙන් දිවුරුම ප්‍රකාශ කිරීම :- එහෙයින් අයෙක් දිවුරීමේ අරමුණෙන් තොරව කටින් පමණක් ප්‍රකාශ කිරීම දිවුරීමක් නොවේ“ මෙවැනි දිවුරුම් අනවශ්‍ය දිවුරුම් නමින් හැඳින්වෙයි“ දිවුරුම් අරමුණක් නොමැතිව සාමාන්‍යයෙන් කථා කරමින් සිටිය දී 'අල්ලාහ් මත දිවුරමි' යන්න“ ඔව් එසේමය“ එසේ නොවේ ආදි වශයෙන් වචන කියවෙන්නා සේය“
2“ අනාගතයේ සිදුවිය හැකි කරුණක් ගැන දිවුරීම“ :- එහෙයින් නොදැනුවත්කම නිසා සිදුවී අවසන් දෙයක් ගැන හෝ තමා කියන දේ සත්‍ය යැයි සිතා දිවුරීම දිවුරීමක් නොවන්නේය“ දැකගෙන බොරුවට දිවුරීම (මහා පාපයකි“ මෙය හදීස්හි අල්-යමීනුල් ඝමූස් යනුවෙන් ප්‍රකාශ වෙන දිවුරුමයි) හෝ තමා සත්‍යයක් කියන බව සිතාගෙන පසුව සිදුවිය හැකි දෙයක් ගැන දිවුරා එම කරුණ එයට වෙනස් දෙයක් බව දැනගත් විට එය දිවුරුමක් නොවේ“
3“ බල කිරීමකින් තොරව තමන්ගේ ස්වකීය කැමැත්තෙන් දිවුරීම
4“ කළ දිවුරීම කඩ කිරීම“ එනම් අත්හරින බවට දිවුරූ දෙයක් නැවත කිරීම හෝ කරන බවට දිවුරූ දෙයක් අත් හැරීම එහෙත් යමෙක් දිවුරන විට නීතියෙන් යම් සහනයක් ලැබුණහොත් පහත සඳහන් කොන්දේසි දෙක ඇත්නම් ඔහුට වරදට ප්‍රතිකර්ම නියම වන්නේ නැත“
1“ දිවුරුමත් සමගම (ප්‍රමාධයක් හෝ භේදයක් නොමැතිව) නීතියෙන් අවසර දිය යුතුය“
2“ එම විශේෂ අවසරයත් සමග දිවුරුම සම්බන්ධ කරන අරමුණ තිබිය යුතුය“ 'අල්ලාහ් මත දිවුරමි ඔහු මනාපනම්' යැයි පවසන්නාක් මෙන්“
යම් යම් කරණු සඳහා දිවුරා එයට වෙනස් ලෙස කටයුතු කිරීම යහපතක් හා ප්‍රයෝජනයක් ඇතිනම් දිවුරුම බිඳ දමා කටයුතු කිරීම වැදගත් යැයි අදහස් කරන එම කරුණ කිරීම සුන්නත් වන්නේය“ එම දිවුරිල්ල බිඳ දැමීම වෙනුවෙන් ප්‍රතිකර්මයක් කරයි“
දිවුරිල්ල බිඳීම හේතුකොට ගෙන ඉටු කළ යුතු ප්‍රතිකර්ම මෙසේය :- එක් අයෙකුට කි“ 1 1/2 බැගින් දුප්පතුන් දස දෙනෙකුට ආහාර සැපයීම හෝ ඔවුනට ඇඳුම් ලබාදීම හෝ වහලෙකු මුදවීම“ එසේ කළ නොහැකි නම් දින තුනක් එක දිගට උපවාසය රැකීම ආහාර හෝ ඇඳුම් සපයන්නට හැකියාවක් ඇති අයෙකු උපවාසය රැකීම වරදට පිළියමක් නොවන්නේය“ වරදට පිළියම දිවුරිලි කැඩීමට පෙර හෝ පසුව ඉටු කළ හැක“ කවරෙකු වැඩිවාර ගණනක්

දිවුරිලි කළ ද වරදට එක් පිළියමක් සෑහේ“ එහෙත් කරුණු කීපයක් සඳහා දිවුරිලි කර ඇත්නම් පිළියම් ද කීපයක් කළ යුතුය“

**✷ භාරය” භාර ඔප්පු කිරීම** :- භාරවීම් විවිධාකාර වේ.

1“ **පොදුවේ භාර වීම:-** එනම් යමෙක් මට සුවය ලැබුවහොත් මම දෙවියන් වෙනුවෙන් භාරයක් ඔප්පු කරමි'යි යමක් සඳහන් නොකර ප්‍රකාශ කිරීම වැනි මෙයින් ඔහුට සුවය ලැබුණු වහා දිවුරිල්ල කඩ කළාට අවශ්‍ය පිළියම ඉටු කළ යුතුය“

2“ **හිතුවක්කාරව තරහෙන් භාරවීම:-** එනම් යමක් නොකර බාධා කිරීම හෝ එය කිරීමට පොළඹවීමේ අරමුණෙන් භාරය කොන්දේසියකට සම්බන්ධ කිරීම උදා:- කෙනෙක් අනෙකා දෙස බලා මා නුඹත් සමග කථා කළොත් අනිවාර්යයෙන් අවුරුද්දක් උපවාසය රකිනවා'යි කියන්නාක් මෙනි“ එහෙයින් ඔහු එම පුද්ගලයා සමග කථා කළොත් ඔහු අනිවාර්ය කරගත් එම ක්‍රියාව කළ යුතුය“ නැතිනම් දිවුරුමක් කඩ කළ පිළියම ඉටු කළ යුතුය“

3“ **අනුමත හොඳ දෙයක් භාර වීම:-** උදා:- 'අල්ලාහ් වෙනුවෙන් මගේ ඇඳුම ඇඳීම මට අනිවාරයය'යි ප්‍රකාශ කරන්නාක් වැනිය“ එහෙයින් ඔහු එම ඇඳුම ඇඳීම හෝ දිව්රිල්ල කඩකළ පිළියම ඉටු කිරීම යන දෙකෙන් එකක් ඉටු කළ යුතුය“

4“ **පිළිකුල් සහගතදෙයක් භාරවීම:-** උදා:- මගේ භාරය අල්ලාහ් වෙනුවෙන් තලාක් කීම මට අනිවාර්ය වේ යැයි ප්‍රකාශ කිරීම“ ඔහු එම කාර්යය නොකර සිටිය යුතු අතර දිවුරිල්ල කඩකළ පිළියම ඉටු කළ යුතුය“ එසේ කිරීම සුන්නත් වේ“ එහෙත් ඔහු එම කාර්යය කළහොත් දිව්රිල්ල කඩකළ පිළියමක් අවශ්‍ය නැත“

5“ **පාපකාරී දෙයක් භාර වීම:-** උදා:- මා සොරකම් කිරීම අල්ලාහ් වෙනුවෙන් මට අනිවාර්ය වේ' යැයි කීම“ ඔහු එය ඉටුකිරීම තහනම් වේ“ එහෙත් දිවුරිලි කඩකළ පිළියම ඔහු ඉටු කරයි“ ඔහු එම කාර්යය කළහොත් පාපයක් අත්වෙන අතර දිවුරිල්ල කඩකළ පිළියම් ඔහුට නියම නොවේ“

6“ **නැමඳුමට සම්බන්ධ දෙයක් භාරවීම:-** උදා:- 'මම අල්ලාහ් වෙනුවෙන් මෙසේ සලාතයේ යෙදීම මට අනිවාර්ය වේ' යැයි දේව දයාව ලැබීමේ අරමුණෙන් කීම' මෙය රෝගියෙක් සුවය ලබන අරමුණෙන් ඇති කර ගන්නා කොන්දේසියකට සම්බන්ධ කළහොත් එය ඉටු වුවහොත් තමන් වූ භාරය ඔප්පු කළ යුතුය“

**✷ කිරි පෙවීමේ ඥාතිත්වය** :- පාරම්පරික පාර්ශවයෙන් විවාහ වීමට තහනම් නෑදෑකම් වැනි පහත සඳහන් කොන්දේසි තුන ඇත්නම් කිරිබොන නෑදෑකම් ද තහනම් වෙයි“

1“ එම කිරි දරුවාගේ මාර්ගයෙන්ම කිරි ඉනිය යුතුය“

2“ ළමයා ඉපිද දෑවුරුදක් ඇතුළත එම දරුවා කිරි බී තිබිය යුතුය“

3“ නිසැකව පස්වතාවක් හෝ ඊට වැඩි වාර ගණනක් කිරි බී තිබිය යුතුය“ වරක් යනු මවගේ තනපුඩුවේ කට තබා උරන්න පටන්ගෙන කට ඉවතට ගන්නා තුරුය“ කුස පිරෙන්නට අවශ්‍ය නැත“ තවද කිරි නෑකමට නඩත්තු වියදම් නොදිය යුතු අතර වස්තුවෙන් කොටස් අයිතියක් ද නොමැත“

**✷ වසිය්යත් (අන්තිම කැමැත්ත)** :- යමෙක් කවරෙකුට හෝ අදාල සාක්ෂියක් නොමැතිව යමක් දීමට ඇත්නම් ඔහු තම මරණයෙන් පසු එම අයිතිකරුට එය ලබා දෙන මෙන් වසිය්යත් කිරීම සුන්නත් වෙයි“ එහෙයින් ඔහු තම වස්තුවෙන් 1/3 (තුනෙන් එකක්) උරුමක්කරුවෙක් නොවන තම ඥාතියෙකු වූ දුප්පත් කෙනෙකුට දෙන මෙන් වසිය්යත් කිරීම සතුටු දායකය. එවැනි කෙනෙක් නැතිනම් කවරෙකු හෝ දිළින්දෙක්“ ආගමික උගතෙක්“ යහපත් පුද්ගලයෙකු යන අයගෙන් කෙනෙකුට වසිය්යත් කරයි“ තම වස්තුවෙන් කොටසක් හිමිවිය යුතු කෙනෙකුට වසිය්යත් කිරීම සුදුසු නොවේ“ එහෙත් ඔහුගේ උරුමක්කරුවන් අතමිට ඇති අය නම් වසිය්යත් කළාට කමක් නැත. එයට ඔහුට අයිතියක් ඇත“ තවද උරුමක්කරුවන් 1/3 (තුනෙන් එකක්)ට වඩා වසිය්යත් නොකළ යුතුය“ එහෙත් තම උරුමක්කරුවෙකුට වසිය්යත් කර මරණයෙන් පසු අනෙක් උරුමක් කරුවන් මනාප නම් එය අනුමත වන්නේය“

වසිය්යත් කළ අයෙක් මම (වසිය්යතය) ඉල්ලා අසකර ගතිමි“ එය බිඳ දැම්මෙමි“ වෙනස් කළෙමි යන වදන් කීමෙන් එම වසිය්යතය අවලංගු වන්නේය. තවද කෙනෙකු තම වසිය්යතය

(අන්තිම කැමැත්ත) ආරම්භයේ පහත සඳහන් පරිදි ලියා තැබීම සතුටුදායකය“ 'බිස්මිල්ලාහ් ‘““ මෙය අභවලා (තමාගේ නම) කරනු ලැබූ වසියයතයයි“ මම (නැමදුමට සුදුස්සා) අල්ලාහ් හැර වෙන කිසිවෙකු නැත“ ඔහු ඒකියෙකි“ ඔහුට ආදේශයෙක් නැත“ තවද මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් ඔහුගේ ගැත්තා ද දූතයෙකු ද වන්නේය යැයි ද ස්වර්ගය නිරය ආදිය සත්‍ය බවත් අවසන් දිනය සත්‍ය බවත් එය සිදුවීම පිළිබඳව කිසිදු සැකයක් නොමැති බවත් නියත වශයෙන්ම අල්ලාහ් මිනිවල්වල භූගතව සිටින්නන් සියල්ලෝම විනිශ්චය දිනයේ නැගිටුවීම සත්‍ය බවටත් සාක්ෂි දරමි“ තවද මම අතහැර යන මගේ උරුමක්කරුවන් අල්ලාහ්ට බියවී කටයුතු කරන ලෙසත් ඔවුනතර භේදය ඉවත්කර එක්සත්කම වර්ධනය කරගෙන ජීවත් වන ලෙස ද ඔවුන් සත්‍ය දේව විශ්වාස වන්තයින් වෙයි නම් අල්ලාහ්ට හා ඔහුගේ දුතයාණන්ට අවනත වන ලෙස ද වසියයත් කරමි“ ඒ සමග ඉබ්‍රාහිම් යඃකූබ් (අලෙයිහිමස් සලාම්) තුමන්ලා තම පුතුන්ට කළ අවසන් ඔවදන් ද වසියයත් කරමි“ **මගේ දරුවනි” අල්ලාහ් නුඹලාට ඉස්ලාමය තෝරාදී ඇත්තේය“ එහෙයින් නුඹලා මුස්ලිම්වරුන් වශයෙන් මිස මිය නොයනු“**

✷ **නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් වෙනුවෙන් සලවාත් කීම** :- සලවාත් සලාම් දෙකෙන් එකක් නොකියා දෙකම එකට කීම වැදගත්ය“ තවද නබිවරුන් නොවන අයට තනිව සලවාත් කියනු නොලැබේ“ එය මක්රූහ් උදා:- අබූබක්ර් (අලෛහිස්සලාම්” සල්ලල්ලාහු අලෛහිවසල්ලම්) යැයි කීම වැනිය“ එහෙත් නබිවරුන් සමග එකට ඒමේදී කිව හැක“ යා අල්ලාහ් මුහම්මද් නබිතුමාණන්ට ද එතුමන්ගේ පාරම්පරිකයන්” මිතුරන්” භාර්යාවන් හා පවුලේ අය මතද සලවාත් කියනු මැනව'යි කියන්නාක් වැනිය“ අබූහනිෆා” මාලික්” ෂාෆිර්” අහ්මද් වැනි අයට රලියල්ලාහු අන්හු හෝ රහ්මහුල්ලාහ් යැයි කියනු ඇත“

✷ **සතුන්ව ආහාර සඳහා කැපීම** :- ගොඩ ජීවත්වන කෑමට අනුමත වු කැපිය හැකි හැම සතෙකුවම ක්‍රමානුකූලව කැපීමෙන් පසුවම ආහාරයට ගත යුතුය“ කැපීමට කොන්දේසි 4ක් ඇත“ ඒවානම් :-

1“ කපන තැනැත්තා පියවි සිහියෙන් සිටිය යුතුය“ 2“ කපන ආයුධය නිය” දත් ආදියෙන් නිම නොවූ ඒවා විය යුතුය“ ඒ දෙකෙන් කැපීම නොසුදුසුය“ 3“ උගුරු දණ්ඩ” ගලනාලය බෙල්ලේ පැති නහර දෙක හෝ දෙකෙන් එකක් කැපී යා යුතුය“ 4“ කැපීමට ආරම්භ කරන විට බිස්මිල්ලාහ් යැයි කීම (අරාබි නොවන භාෂාවන්ගෙන්ද බිස්මි කිව හැක“) ඒ සමග තක්බීර් කීම ද සුන්නත් වෙයි“ අමතක වීමෙන් බිස්මි නොකීවොත් කමක් නැත“ (එහෙත් අමතකවීම සුදුසු නොවේ“)

✷ **දඩයම් කිරීම** :- ස්වභාවිකවම කැලේ ජීවත් වන කෑමට අනුමතවු කපා ගැනීමට අපහසු සතෙකු දඩයම් කළ හැක. එය ආහාරය වැනි අවශ්‍යතාවන්ට ප්‍රයෝජනයට ගැනීම අනුමතය. විනෝදයට හා සෙල්ලමට එසේ කිරීම මක්රූහ් වෙයි දඩයම් සතා ලුහුබැඳීම නිසා මිනිසුන්ගේ භෝගවලට හා දේපල වලට එම සතුන්ගෙන් අලාභයක් වෙයිනම් එය තහනම්ය. පහත සඳහන් කොන්දේසි හතර ඇත්නම් දඩයම් කළ සතාව ආහාරයට ගත හැක“

1“ කැපීමට අනුමත සතාව දඩයම් කළ යුතුය“

2“ ඒ සඳහා භාවිතා කරන ආයුධය ෂරීආවේ අනුමත එකක් විය යුතුය“ එනම් ඊය හා හෙල්ල වැනි තියුණු ආයුධ විය යුතුය“ තවද දඩයම පුහුණු කළ රාජාලියා හා බල්ලන් ගෙන්ද දඩයම් කළ හැක“

3“ දඩයම්කරු එය කරන අරමුණෙන් ක්‍රියාත්මක විය යුතුය“ එනම් දඩයම් කරන ආයුධය හෝ සතාව දඩයම් කරන අරමුණෙන් යැවිය යුතුය“ එහෙයින් ඔහුගේ අරමුණ රහිතව ඔහු නොයවා ස්වෙච්චාවෙන් එම සතුන් විසින් දඩයම් කරගෙන පැමිණියොත් එය අනුභව කළ නොහැක“

4“ ආයුධය හෝ පුහුණු කළ සතාව යවන විට බිස්මිල්ලාහ් යැයි කිව යුතුය“ දඩයම් කිරීමේදී අමතක වීමෙන් හෝ බිස්මිය අතහළ නොහැක“ එසේ අත්හැරුණෝ නම් දඩයම් කළ එම සතාව අනුභව කළ නොහැක“

✷ **ආහාර (මෙහි ආහාර පාන සියල්ල ඇතුළත් වෙයි) :-** යම් දෙයක් අනුභව කිරීමට අනුමත එකක් විය යුතු බව සාමාන්‍ය තත්ත්වයයි“ එය අනුභව කළ නොහැකැ’යි නීතියක් පැනවෙන තෙක් එය අනුභව කළ හැකි බව මෙයින් පෙනේ“ එහෙයින් පහත සඳහන් කොන්දේසි තුන ඇත්නම් අනුමත වන්නේය“

1“ එය පිරිසිදු වීම“ 2“ එය අනුභව කිරීමෙන් විපතක් හෝ හානියක් සිදු නොවීම“ 3“ එය පිළිකුල් සහගත නොවීම“

මළ සතුන් හා ලේ” ආදිය අපිරිසිදු දෑ සැම එකක්ම තහනම් වෙයි“ ඒ මෙන්ම විෂ වැනි අනතුරුදායක ඒවාද මල මුත්‍රා උකුණන් හා මැක්කන් වැනි ආදි පිළිකුල් සහගත ඒවාද තහනම්ය“ ගොඩබිම ජීවත්වන සතුන්ගෙන් පහත සඳහන් ඒවා හරාම් (තහනම්) වෙයි“

තම දඩයම් දත්වලින් දඩයම් කර අනුභව කරන සිංහයා” කොටියා” වෘකයා” ව්‍යාඝ්‍රයා” බල්ලා” ඌරා” වඳුරා” බළලා (ඌ මිනිස් සමාජය හා ජීවත් වුවද) නරියා” හා ලේනා වැනි සතුන්“

පක්ෂීන් අතර තම පාදයේ නියපොතුවලින් දඩයම් කරන රාජාලියා” උකුස්සා” ගරුඩා” බකමූණා ආදිය ද මැරුණු සතුන්ගේ මාංශ අනුභව කරන (රාජාලි” උකුස්සා) ආදි පක්ෂීන්ද නගර ප්‍රදේශවල ජීවත්වන අරාබීන් අපිරිසිදු යැයි සලකන වව්ලන්” මීයන්” දෙබරුන්” මී මැස්සන්” මැස්සන්” සමනළයා” ඉත්තෑවා හා සර්පයින් ආදිය ද එමෙන්ම පණුවන්” බඹරුන් හා හූණා ආදිය ද හරාම් (තහනම්)ය“ තවද ෂරීආවේ ඝාතනය කරන ලෙස අණ කරනු ලැබූ සියල්ල (ගෝනුස්සන් වැනි) හෝ ෂරීආවෙන් එය ඝාතනය කිරීම තහනම් කළ සියල්ල (කුහුඹුවන් වැනි) අනුභව කිරීමට අනුමත එකක් අනුමත නොකළ එකක් සමග එක් වී ප්‍රසූත කළ සත්වයින්ද (බූරු කොටියා හා ව්‍යාඝ්‍රයා එක්ව දැමූ පැටවුන් වැනි) මේ සියල්ල හරාම්(තහනම්)ය“ එහෙත් කෑමට අනුමත සතුන් දෙවර්ගයක් එක්ව ලද පැටවුන් අනුභව කළ හැක“ උදා:- ගෝනා හා අශ්වයා එක්ව ප්‍රසූත කළ කොටළුවා වැනි සතුන්“

තවද ෂරීආහ්වේ ඒ පිළිබඳ නීතිය සඳහන් නොවුවද අරාබි රටේ ජනතාව නොදත් ඒවාවුද සතුන් ගත් කළ අරාබියේ මක්කා මදීනා වැනි ප්‍රදේශවල ඇති සතුන්ගෙන් මොවුනට ඉතා සාපේක්ෂ සතුන්ගේ නීතියම මේවාට ද වලංගු වේ“ එහෙයින් හලාල් නැත්නම් හරාම් වූ සතාට සමාන වූයේ නම් එයට අදාල නීතිය වලංගු වෙයි“ එහෙත් හරාම් හලාල් යන ගැටළු දෙකම එකවර එකම අවස්ථාවක මතුවුවොත් හරාම් යන්නටම මුල්තැන දිය යුතුය“ ඉහත සඳහන් දෑ හැර අනෙක් සියල්ල අනුමත වන්නේය“ ඒවා අතර සිව්පාවුන් වූ එළුවන්” ගවයින්” ඔටුවන්” ආදිය ද අශ්වයා වන සතුන් වන සීබ්‍රා” හාවා” කැලෑමීයා තලගොයා හා මුවා ආදිය ද පක්ෂීන්ගෙන් ඔටු පක්ෂියා” කුකුළා” මොණරා කොබෙයියා” චූටි කුරුල්ලා තාරාවා ආදිය ද ජලජ පක්ෂීන්ද ජලයේ ජීවත්වන ගෙම්බා” සර්පයා” කිඹුලා ආදිය හැර අනෙක් එවාද ඇතුළත් වෙයි“

අපිරිසිදු පොහොර හා ජලයෙන් වවා ගන්නා ලද භෝග හා පළතුරුවල එම පොහොරවල හෝ ජලයේ දුගඳ එයිනම් එය හරාම්ය“ එසේ නොවුයේ නම් හලාල් වෙයි“ තවද අඟුරු” පස්” කිරිමැටි ආදිය ද නොපිසූ ලූණු” සුදුලූණු ආහාරයට ගැනීම මක්රූහ්ය“ කෙනෙකුට කුසගින්න ඇති වී දැරිය නොහැකිව ඉතා අනතුරුදායක තත්ත්වයක් උදාවුවොත් තම ජීවතය බේරා ගැනීමට ප්‍රමාණවත්තරම් කුමක් හෝ කෑම සුදුසුය“

✷ ඉස්ලාමය ප්‍රතික්ෂේප කරන්නන්ගේ අවුරුදු උත්සවවලට සහභාගිවීමත් ඔවුනට අවුරුදු සුබ පැතුම් යැවීමත් මුලින්ම ඔවුනට අප ආචාර කිරීමත් තහනම්ය“ එහෙත් පළමුවෙන් ඔවුන් අපට සලාම් කීවේ නම් ’වඅලෛකුම්’ යැයි පිළිතුරු දීම යුතුකමකි“

එමෙන්ම දේව ප්‍රතික්ෂේපකයින්ටද බිද්අත් කරුවන්ටද ගෞරව කිරීම පිණිස නැගිට සිටීම තහනම්ය“ ඔවුනට අතට අත දීම මක්රූහ් වෙයි“ තවද ඉස්ලාමීය ෂරීආ සම්බන්ධ යහපත් අදහසින් පමණක් ඔවුනට සහන බස් කීමත් රෝග සුවදුක් විමසීමත් අනුමතය“

# ඉස්ලාමීය ක්‍රමයට මැතිරීම

අල්ලාහ්ගේ න්‍යායයන් ගැන අවධානය යොමු කර සිතන අයෙක් මෙලොව ජීවිතයේ පරීක්ෂණ හා ගැටළු ඇතිවීම අල්ලාහ්ගේ නියමය පරිදි යැයි දැන ගනී" අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි" 'නියත වශයෙන්ම අපි නුඹලාව භය හා කුසගින්න (සාගතය) ධන සම්පත්" ප්‍රාණයන් හා පළතුරු ආදිය අඩු කිරීම ආදියෙන් එකකින් පරීක්ෂා කරන්නෙමු" තවද (නබිවරයාණෙනි" මේ වෙනුවෙන්) ඉවසිලිවන්ත අයට නුඹ ශුභාරංචි කියනු" යහපත් ගැත්තන් මිනිසුන් අතරේ පරීක්ෂණ ඇතිවීමට අවස්ථාව අඩු අය යැයි සමහරෙකු අදහස් කිරීම වැරදිය" එසේ නොව කෙනෙකුට පරීක්ෂණ පැමිණීම ඔහුගේ ඊමානය ශක්තිමත් බවට සාක්ෂියකි" මන්ද නබිතුමන්ගෙන් 'මිනිසුන් අතරින් වඩාත් පරීක්ෂණවලට ගොදුරු වන්නේ කවරහුදැ?යි විමසීන" එවිට මෙසේ පැවසුහ 'නබිවරුන්" ඉන්පසු අනෙක් යහපත් ගැත්තන්" ඉන්පසු මිනිසුන්ගෙන් වැදගත්කමේ අනුපිළිවෙලට' (ග්‍රන්ථය ඉබුනු මාජා)

මිනිසෙකුගේ ආගමික ළබැඳියාව අනුව ඔහු පරීක්ෂණයට ලක් වන්නේය" කෙනෙකුගේ ස්ථිර විශ්වාසය හා ආගමික ළබැඳියාව කොතරම් දුරට ඇත් ද ඒ තරමට ඔහුගේ පරීක්ෂණය ද අධික වෙයි" ඒවායේ අඩුවක් වේ නම් පරීක්ෂණය ද ලිහිල් වෙයි"
තවද කෙනෙකුට රෝගයක් වැනි පරීක්ෂණ ඇති වෙයි නම් අල්ලාහ් ඔහුට ප්‍රිය කරන බවට සංකේතයකි" නබිතුමාණෝ මෙසේ පැවසූහ" 'නියත වශයෙන්ම අල්ලාහ් යම් පිරිසක් මත ආදරය කරන්නේ නම් ඔවුනට පරීක්ෂණ ඇති කරයි" (අහ්මද්) තවද එය අල්ලාහ් යමෙකුට යහපත මනාප වූ බවට ද සළකුණකි" මන්ද නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ" 'අල්ලාහ් තම ගැත්තාට යහපත මනාප වූයේ නම් මෙලොව දී ඔහුට අවශ්‍ය දඬුවම කලින්ම ලබා දෙන්නේය" තවද අල්ලාහ් තම ගැත්තාට අයහපතක් මනාප වූයේ නම් ඔහුට අවශ්‍ය දඬුවම ප්‍රමාද කර විනිශ්චය දිනයේ දී ලබා දෙයි" (තිර්මිදි) තවද පරීක්ෂණ කුඩා වුවද ඒවා පාපයන් සඳහා වරදට පිළියම් වන්නේය" නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ" 'මුස්ලිම්වරයෙකුට කටුවක් ඇණෙන තරමට හෝ එයට වඩා අධික ප්‍රමාණයෙන් යම් අපහසුතාවක් ඇති වුවහොත් ගසක් එහි කොළ හලන්නාක් මෙන් අල්ලාහ් එම අපහසුතාව මගින් ඔහුගේ පව් ඉවත් කරන්නේය" (බුහාරි" මුස්ලිම්)
එහෙයින් පරීක්ෂණයට ඇතුල් වෙන මුස්ලිම්වරයා යහපත් මිනිසෙකු නම්" එම පරීක්ෂණය ඔහුගේ පෙර පව් සඳහා පිළියමක් හෝ තත්ත්වයන් උසස් කිරීමට හේතුවක් විය හැක" එම මිනිසා පාපිෂ්ඨයෙකු නම්" එය ඔහුගේ පාපයන්ට පිළියමක් ලෙස ද ඒවායේ භාරධූරකම ඔහුට දැනුවත් කරන්න ද හේතුවන්නේය" සර්ව බලධාරි අල්ලාහ් මෙසේ කියයි" 'මිනිසුන් (පාපයන්) කළ දෑ හේතුකොටගෙන සාගරයේ ද ගොඩබිමේ ද අර්බුද හට ගත්තේය"

**මිනිසුනට ඇතිවන පරීක්ෂණ විවිධාකාරය**

(අ) හොඳ දෑ මගින් ඇතිවන පරීක්ෂණ (ධන සම්පත් අධික වීම වැනි)
(ආ) නරක දෑ මගින් ඇති වන පරීක්ෂණ (භය" සාගතය හා සම්පත් විනාශ වීම වැනි)
අල්ලාහ් මෙසේ කියයි '(දුකෙන් යුත්) අයහපත් දෑ මගින් ද (සැපෙන් යුත්) යහපත් දෑ මගින් ද පරීක්ෂණ කිරීම සඳහා නුඹලාව අපි පරීක්ෂා කරන්නෙමු" රෝග හා මරණ ආදියෙන් පරීක්ෂා කිරීමත් මෙයට අයත් ය" මේ දෙකම ඇතිවීම ප්‍රධාන හේතුව වනුයේ ඇස්වහ හා ඊර්ෂ්‍යාව හේතුවෙන් හූනියම් කිරීමය" නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ" අල්ලාහ්ගේ 'කලා' නමැති කලින් නියම කරන ලද ඉරණමෙන් පසු මගේ උම්මත් අධිකව මරණයට පත් වන්නේ ඇස් වහ නිසාය" (අත්තයාලිසි)
**ආරක්ෂාවට අවශ්‍ය මාර්ග:-** ඇස්වහ හූනියම් ආදිය ඇතිවීමට පෙර ඒවායින් ආරක්ෂාව ලබාගැනීමට අවශ්‍ය මාර්ග අප දැන සිටීමත් ඒවා ක්‍රියාත්මක කිරීමත් අවශ්‍යය" මේවාට මාර්ග බොහෝ ඇත" ඉන් සමහරක් මෙසේය" ✴ ඒකීයත්ව ප්‍රතිපත්තිය යටතේ මෙලොව සියලුම පරිපාලනයන් අල්ලාහ් සතුවම පවතින බවට විශ්වාසය තදින් ඇතිකර ගැනීම හා යහපත් වත්පිළිවෙත් අධිකව ඉටු කිරීම" ✴ අල්ලාහ් පිළිබඳව හොඳ සිතුවිලි ඇති කරගත යුතු අතර ඔහුගේ භාරයේම කාර්යයන් භාර කිරීම" එහෙයින් කුමක් හෝ හෙතුවක් මත ඇස්වහ හෝ

රෝගයක් තමන්ට ඇතිවීම සිතා සිතා කලබල වී දුක් නොවිය යුතුය“ මන්ද තමා රෝගයකින් පෙළෙන බවට ඇති වන මානසික අසහනය බලවත් රෝගයකි“ වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් විශේෂඥයින් බොහෝ දෙනෙක් පහත සඳහන් පරිදි ප්‍රකාශ කරති“ ශරීරයේ අවයවවල ඇතිවන රෝගවලින් තුනෙන් දෙකකට අධික ප්‍රමාණයක් ගැන බලන විට යථාර්ථයෙන් සම්පූර්ණයෙන්ම නොමැති රෝගයක් ඇති බවට අනවශ්‍ය ලෙස සැක උපදවමින් මානසික හේතූන් මත ඇතිවන ඒවාය“ ✷ ඇස්වහ ඇතිවන හා හූනියමට ප්‍රසිද්ධ මිනිසුන් මගහැර කටයුතු කිරීම“ මෙය පෙර සුදානමක අඩිතාලම මත විනා බියකින් නොවේ“ ✷ තමා විශ්මයට පත්වන යමක් දුටුවිට අල්ලාහ්ව සිහිපත් කරමින් එයට අභිවෘද්ධිය පතා ප්‍රාර්ථනා කිරීම නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පහත සඳහන් පරිදි ප්‍රකාශ කළහ“ **'නුඹලාගෙන් කෙනෙක් තමා ලග හෝ තම වස්තුව ම හෝ තම සහෝදරයා ලග තමාට රිසි යමක් දුටුවහොත් එහි අභිවෘද්ධිය ඇති වීමට ප්‍රාර්ථනා කරගනු“ මන්ද ඇස්වහ සත්‍යයකි“** (හාකිම්) එනම්:- 'අල්ලාහ් ඔබට අභිවෘද්ධිය ඇති කරත්වා' යි ප්‍රාර්ථනා කිරීමයි“ ✷ මදීනාවේ වැවෙන 'අජ්වා' නමැති ඉඳි ගෙඩිවලින් 7ක් උදෙන්ම මුලින්ම කෑම හූනියමෙන් ආරක්‍ෂා වෙන මාර්ගවලින් එකකි“ ✷ අල්ලාහ්ගෙන්ම අබය පතා ඔහු වෙත අපේ කාර්යයන් භාර කර ඔහු ගැන හොඳ සිතුවිලි ඇතිකර ගැනීම“ තවද හූනියම් ඇස්වහ ආදියෙන් ඔහුගෙන් ආරක්ෂාව පතා උදේ සවස දික්ර් (භාවනා) කර ආරක්‍ෂාවට අවශ්‍ය ප්‍රාර්ථනා ආදිය නොවරදා කර ගැනීම“

පහත සඳහන් කරුණු දෙකේදීම තහවුරු කරගෙන නියමිත දික්ර් කියවීමෙන් අල්ලාහ්ගේ මනාපය පරිදි ඒවා වැඩියෙන් හෝ අඩුවෙන් ප්‍රයෝජනවත් විය හැක“ 1“ එම දික්ර් අල්ලාහ්ගේ මනාපය ඇත්නම් නියත වශයෙන් ම ප්‍රයෝජනවත් වන බව ද ඒවා විෂයෙහි ප්‍රකාශ වී ඇති මහිමයන් ද ප්‍රතිඵල ද සත්‍ය බව ස්ථිරව විශ්වාස කිරීම“ 2“ ඒවා කටින් ප්‍රකාශ කරන අතර ඒ කරා දෙසවන් ද සිත ද යොමුකර සම්පූර්ණ අවධානයෙන් යුතුව කිව යුතුය“ මන්ද මේවා ප්‍රාර්ථනාවන් වන්නේය“

සිතෙන් අවධානය යොමු නොකර කටින් පමණක් කරන ප්‍රාර්ථනාවන් අනුමත නොවන බව සාධක සහිත නබිවදන් වලින් ප්‍රකාශිතය“

**උදේ සවස දික්ර් සඳහා නියමිත වේලාවන්:-** උදේ දික්ර් සුබහ් සලාතයෙන් පසුවත් සවස දික්ර් අසර් සලාතයෙන් පසුවත් කළ යුතුය“ නියමිත වේලාවල්වල ඒවා කිරීමට අමතක වුවහොත් මතක් වූ වහාම කළ යුතුය“

**ඇස් වහ වැනි දෙයක් ඇතිවූ බවට සලකුණු:-** වෙදකමට හා ෂරීආ පිළිබඳ මැතිරීම්වලටත් අතර කිසිදු ගැටුමක් නැත“ මන්ද ශරීර අවයවවල ඇතිවන රෝගවලටත් මානසිකව ඇති වන රෝගයන්ටත් අල් කුර්ආනයේ බෙහෙත් ඇත“ යමෙක් ශාරීරික රෝගයක් නොමැතිව නිරෝගීමත්ව සිටියදී ඔහුගේ ශරීරයේ පහත සඳහන් සලකුණු දකින්න ඇත්නම් ඒවා ඇස්වහ ආදිය පිළිබඳව ලක්ෂණ තිබිය හැක“

හිසේ තැන් තැන්වල මාරුවෙන් මාරුවට හැදෙන හිසරදය" මුහුණ කහ පැහැ ගැනීම" අධිකව මුත්‍රායාම හෝ දහඩිය දැමීම" කෑම අරුචිය" ශරීර අවයව වෙනදා නොමැති පරිදි සිසිල්වීම හෝ උණුසුම් වීම" තවද ඉබේම වෙව්ලීම" හදගැස්ම" උරහිස් දෙකේ හෝ කොන්දේ පහළ ප්‍රදේශයේ තැන් මාරු වී කැක්කුම ඇතිවීම" සිත හිරවුන තත්ත්වයක් හෝ ශෝකයක් ඇතිවීම" නින්ද නැතිකම" සුපුරුදු තත්ත්වයට වෙනස් අන්දමින් කෝපය හා භය නිසා මුසපත්වීම" ඇනුම වැඩිපුරයාම" කම්මැලි ස්වභාවය අනෙක් අයගෙන් ඈත්වී තනිව සිටීමේ කැමැත්ත" අධිකව නිදාගැනීමේ කැමැත්ත" වෛද්‍ය අංශයෙන් අවබෝධ කර නොගත හැකි කරුණු පැහැදිලි නොමැති නිරෝගිකම පිළිබඳ ගැටළු තවත් බොහෝ ඇත“ රෝගයේ බලවත් තත්ත්වය දුර්වලකම හේතුකොට ගෙන මෙම සලකුණු සියල්ලම හෝ කීපයක් තිබිය හැක“

**මුස්ලිම්වරයෙකු දේව විශ්වාසයෙහිද චිත්ත ධෛර්යයෙහි ද ඉතාමත් ශක්තිමත්ව සිටිය යුතුය“** තමාට රෝග වැළඳී ඇති බවට අනුමාන කිරීමක් හෝ සැකයක් ඔහු තුළ නොතිබිය යුතුය“ ඉහත සඳහන් සලකුණු කිසිවක් ඇති වූ පමණින් තමා රෝගියෙකු යැයි සිත චංචල නොකරගත

යුතුය“ මන්ද රෝගයක් ඇතැයි සැකයක් තහවුරු කර ගැනීම සුවකළ නොහැකි රෝගවලින් එකක් වන්නේය“

මෙම සලකුණු සමහරෙකු නිරෝගිව සිටින විට ද ඇතිවීමට පුළුවන“ තවත් සමහරෙකුගේ ඊමානයේ දුබලතාවද මෙයට හේතුවක් විය හැක“ උදා:- සිතේ දැඩිබව දුක හා ඇත් වී තනිව සිටීම ආදිය ගත හැක“ එහෙයින් මෙවැනි සලකුණු පහළ වුවහොත් එහෙයින් මෙවැනි තත්ත්වයන් උදාවන්නේ නම් අල්ලාහ් සමග ඇති සබඳතාව නැවත සොයා බලා නිවැරදි කර ගත යුතුය“

**ඇස්වහ[1] නිසා ඇති වු රෝගයට අල්ලාහ්ගේ මනාපය ඇත්නම් පහත සඳහන් මාර්ග දෙකින් එකක් මගින් ප්‍රතිකාර කර සුවය ලබා ගත හැක“**

1. කවරෙකුගෙන් ඇස්වහ සිදුවුයේ දැයි දැන සිටින අවස්ථාවක,ඔහුට ස්නානය කරන මෙන් පවසා,ඔහු ස්නානය කළ ජලය හෝ ඔහු භාවිතා කළ හෝ ඔහුගේ ශරීරයේ ස්පර්ෂ වු යම් දෙයක් මිශ්‍රකර නෑම හා එම ජලය බීම. 2. කවරෙකුගෙන් ඇස්වහ සිදුවුයේ දැයි නොදැන සිටින අවස්ථාවක ප්‍රාර්ථනා කිරීම” කුර්ආන් පාඨයක් මැතිරීම හෝ ශරීරයේ අපිරිසිදු රුධිරය ඉවත් කිරීම වැනි දෙයක් මගින් සුවය ලබා ගැනීමට උත්සාහ කළ හැක“

**හූනියම[2] හේතුකොට ගෙන රෝගාතුර වුයේ නම් අල්ලාහ්ගේ මනාපය ඇත්නම් පහත සඳහන් මාර්ගවලින් එකකින් ප්‍රතිකාර කර සුවය ලබා ගත හැක“**

1“ **හූනියම කළ ස්ථානය දැන ගැනීම:-** ඒ තත්ත්වයෙන් එම භාණ්ඩය අතට අසුවුවහොත් සූරා අන්නාස්” අල් ෆලක්” දෙක මතුරා එහි ගැටලිහා ගින්නේ දමා දවාලීම“ 2“ **ඉස්ලාමීය ක්‍රමයට මැතිරීම:-** මෙය විශේෂයෙන් කුර්ආන් වැකි මගින්ම කෙරෙයි“ සූරා අන්නාස්” අල් ෆලක්” බකරා ආදි සූරාවන් ද වෙනත් සමහර සූරාවන් ද කියා මැතිරීම (එහි විස්තරය මෙහි සඳහන් කර ඇත“)

3“ හූනියම කැපීම මෙය දෙයාකාරයි“ 1“ තහනම් ක්‍රමය:- එනම් හූනියමක් මගින් හූනියම කැපීම“ තවද එය කැපීම සඳහා හූනියම් කරුවන් සොයා යාම“ 2“ අනුමත 'හලාල්'වු ක්‍රමය:- එනම් මසන් ගසේ කොළ 7 ක් ගෙන ගල් දෙකක් අතර තබා ඒවා තලා පොඩිකර එහි අල්-කාෆිරූන්” අල්-ඉක්ලාස්” අල්-ෆලක්” අන්-නාස්” තුන්වරක් මතුරා ඉන්පසු එය ජලයේ මිශ්‍රකර බීම හා එම ජලයෙන් නෑම” අල්ලාහ්ගේ මනාපය පරිදි සුවය ලැබෙන තෙක් මෙය නැවත නැවත කිරීම (මුස්නද් අබ්දුර්-රස්සාක්)

4“ හූනියම ශරීරයෙන් ඉවත් කිරීම:- එය බඩේ ඇත්නම් විරේක වීමට බෙහෙතක් දී විරේක කරවීම ශරීරයේ වෙනත් තැන්වල ඇත්නම් ලේ ඉවත් කිරීම.[3]

---

[1] ඇස්වහ:- මෙය ෂෛයිතාන්ලාගේ මාර්ගයෙන් අල්ලාහ්ගේ අවසරය පරිදි ඇති වෙන්නකි. ඇස්වහ ඇති කරන්නා කෙනෙකු ලග තිබෙන කුමක් හෝ වැදගත්කමක් ගැන විමතියට පත්වන විට හෝ වර්ණනා කරන විට නරක ෂෛයිතාන්ලාද ඒ හා එක් ව, ඇස්වහ ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය දික්ර්, සලාතය වැනි විෂයන්හි නොයෙදෙන විට ඒ පුද්ගලයාට ඇස්වහ ඇති වේ. යන බුහාරි ග්‍රන්ථයේ සඳහන් සහීහ් හදීසය මෙයට සාක්ෂි වශයෙන් පෙන්වා දිය හැක. මුස්නද් අහමද් ග්‍රන්ථයේ සටහන්ව ඇති මෙම හදීසයෙහි වෙනත් දැනුම් දීමක 'නරක ෂෛයිතාන්ද මිනිසෙකුගේ ඊර්ෂයා සහගත හැගීමද ඇස්වහ ඇතිවීමේදී එක්වෙයි' යනුවෙන් -සඳහන් වෙයි. මෙය ඉමාම් ඉබ්නු හජර් (රහ්මතුල්ලාහි අලෙයිහි) සත්‍ය හදීස් යැයි ප්‍රකාශ කර ඇති අතර මෙය තහවුරු කරන වෙනත් හදීස් ද ඇත. එකක් ගැන පුදුම වීමට හෝ එය වර්ණනා කිරීමට ඇසෙන් බැලීමට සිදුවන නිසා එයට 'ඇස්වහ' යන වදන භාවිතා වෙයි. ඇසෙන්ම එවැනි ආපදාවක් සිදුවන නිසාම නොවේ. අන්ධයෙකුගෙන් ද එවැනි ආපදාවන් සිදුවිය හැක.

[2] හූනියම්:- හූනියම යනු සමහර මන්ත්‍ර ජපකිරීම හෝ සමහර ගැට ගැසීමේ ආදියෙන් කරන්නකි. එය කරනු ලබන්නාගේ ශරීරය” මනස හා බුද්ධිය ආදියෙන් එකකට කෙළින්ම බලපායි. හූනියම සත්‍යයකි. එය මායාවක් නොවේ. ජීවිත හානිය” රෝගාතුර වීම” අඹු සැමියන් අතර ලිංගික ඇසුර අපහසුවීම හෝ ඔවුනතර භේදයක් ඇතිවීම ආදිය මෙයින් සිදුවෙයි. හූනියම් කිරීමේද දේව ආදේශය ප්‍රතික්ෂේපය වැනි ක්‍රියාවන් ද මහා පාපයන් ලෙස ගණන් ගන්නා ක්‍රියාවන් ද සිදුවේ.

[3] නබි තුමාණෝ පහත සඳහන් පරිදි කීහ“ 'නුඹලා අසනීපවලදී කරන ප්‍රතිකාරවලින් වැදගත් වන්නේ ලේ ඇද පිට කිරීමය“ (මෙය රුධිර ගමන වැඩි කිරීමට කරන ප්‍රතිකාරයකි“) මෙම ප්‍රතිකාරය මගින් අල්ලාහ් ශරීර අවයව සම්බන්ධ විවිධ රෝග ද පිළිකා” හූනියම හා ඇස්වහ නිසා ඇතිවන රෝගාදියද නැතිකර සුවය ලබා දෙන්නේය“ නිදර්ශනයක් වශයෙන් වු බොහෝ සත්‍ය සිදුවීම් මෙයට සාක්ෂි වශයෙන් ඇත.

**මැතිරීමට අවශ්‍ය කොන්දේසි:-**
1“ අල්ලාහ්ගේ ශුද්ධනාමයෙන් හා ඔහුගේ ගුණාත්මක භාවය ප්‍රකාශ කර මැතිරීම”
2“ අරාබි බසින් හෝ තේරුම් ගත හැකි වෙනත් භාෂාවකින් වීම“ 3“ මතුරන වැකිවලින් පමණක් සුවය නොලැබෙන බවත් සුවය ලබා දෙනුයේ අල්ලාහ් පමණක් බවත් ස්ථිර වශයෙන්ම විශ්වාස කිරීම“

**(මතුරන්නාට) ජප කරන්නාට අවශ්‍ය කොන්දේසි:-** 1“ ඔහු මුස්ලිම් වරයෙකු හා යහපත් දේව බිය ඇත්තෙකු වීම අවශ්‍යය“ ඔහු කොතරම් දුරට දේව බිය ඇත්තෙකු වන්නේ ද එතරමට ඔහුගේ මන්තරයේ ඵල අත්වෙයි“ 2“ මතුරන විට සැබෑ මනසකින් යුතුව මනසත් දිවත් අල්ලාහ් වෙතට යොමුවීම“ කෙනෙකු තමන් තමන්ටම මතුරා බැලීම ඉතා වැදගත්ය“ මන්ද වෙන කෙනෙකුගේ මැතිරීමේදි ඔහුගේ සිත අන් අතකට යොමු විය හැක“ එපමණක් නොව කෙනෙකුගේ අවශ්‍යතාව හා ඔහුගේ යථාර්ථය ඔහු විසින්ම දැන ගන්නා තරමට තව කෙනෙක් වටහා ගැනීම අසීරුය“ අනතුරු දායක තත්වයක සිට කැඳවන්නාට සවන් දී පිළිතුරු සපයන බව අල්ලාහ් පොරොන්දු වෙයි“

**මතුරනු ලබන්නා(ආතුරයාට) අවශ්‍ය කොන්දේසි:-**
1“ යහපත් මුඃමින් වරයෙකුව ඔහු ඉදිම සතුටු දායකය“ විශ්වාසයේ තරමට ප්‍රතිඵල අත්වෙයි“ සර්ව බලධාරි අල්ලාහ් මෙසේ කියයි“ **'විශ්වාසවන්තයින්ට සුවය ලබා ගත හැකි ලෙස ද දයාවක් ලෙස ද ඇති දෑ අපි අල්-කුර්ආනයෙන් පහළ කර ඇත්තෙමු“ අක්‍රමිකතා කරන්නාවුන්ට මෙය පාඩුවක්ම මිස (වෙනත් දෙයක්) වැඩි නොකරන්නේය“**
2“ තමාට සුවය ලබා දෙනමෙන් අල්ලාහ්ගෙන් සැබෑ සිතෙන් ආයාචනා කර සරණ පැතීම“
3“ සුවය ලැබිය යුතු යැයි ඉක්මන් නොවිය යුතුය“ මන්ද මැතිරීම යනු ප්‍රාර්ථනාවයි“ ප්‍රාර්ථනය අනුමත විය යුතු යැයි ඉක්මන් වන විට සමහර විට එය අනුමත නොවී යා හැක“ නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ පහත සඳහන් පරිදි කීහ“ ***'නුඹලාගෙන් කෙනෙක් මා ප්‍රාර්ථනා කළත් අනුමත නොවුයේ යැයි පවසා ඉක්මන් නොවී සිටින තාක් ඔහුගේ ප්‍රාර්ථනාව අනුමත වීමට ඉඩ ඇත“*** **(බුහාරි“ මුස්ලිම්)**

**මතුරා බලන ක්‍රම බොහෝ ඇත:-** 1“ කුමක් හෝ මතුරා මඳක් කෙළත් සමග පිඹීම 2“ පිඹීමෙන් තොරව මැතිරීම“ 3“ ඇඟිල්ලේ කෙළ තවරා එම ඇඟිල්ල තබා එයින් කැක්කුම ඇති තැන පිරි මැදීම“ 4“ කැක්කුම ඇති තැන පිරිමදින ගමන් මැතිරීම“

**රෝගියෙකුට මතුරා බැලිය හැකි අල්-කුර්ආන් වැකි හා නබිවදන් :-** සූරා ෆාතිහා ආයතුල් කුරුෂි” සූරා බකරාවේ අවසන් වැකි දෙක” අල් කාෆිරූන්” අල් ෆලක්” අන්නාස් යන සූරාවන්ය“

﴿ ٱللَّهُ لَآ إِلَٰهَ إِلَّا هُوَ ٱلْحَىُّ ٱلْقَيُّومُ ۚ لَا تَأْخُذُهُۥ سِنَةٌ وَلَا نَوْمٌ ۚ لَّهُۥ مَا فِى ٱلسَّمَٰوَٰتِ وَمَا فِى ٱلْأَرْضِ ۗ مَن ذَا ٱلَّذِى يَشْفَعُ عِندَهُۥٓ إِلَّا بِإِذْنِهِۦ ۚ يَعْلَمُ مَا بَيْنَ
1 أَيْدِيهِمْ وَمَا خَلْفَهُمْ ۖ وَلَا يُحِيطُونَ بِشَىْءٍ مِّنْ عِلْمِهِۦٓ إِلَّا بِمَا شَآءَ ۚ وَسِعَ كُرْسِيُّهُ ٱلسَّمَٰوَٰتِ وَٱلْأَرْضَ ۖ وَلَا يَـُٔودُهُۥ حِفْظُهُمَا ۚ وَهُوَ ٱلْعَلِىُّ ٱلْعَظِيمُ ﴾
﴿ ءَامَنَ ٱلرَّسُولُ بِمَآ أُنزِلَ إِلَيْهِ مِن رَّبِّهِۦ وَٱلْمُؤْمِنُونَ ۚ كُلٌّ ءَامَنَ بِٱللَّهِ وَمَلَٰٓئِكَتِهِۦ وَكُتُبِهِۦ وَرُسُلِهِۦ لَا نُفَرِّقُ بَيْنَ أَحَدٍ مِّن رُّسُلِهِۦ ۚ
وَقَالُوا۟ سَمِعْنَا وَأَطَعْنَا ۖ غُفْرَانَكَ رَبَّنَا وَإِلَيْكَ ٱلْمَصِيرُ ﴿٢٨٥﴾ لَا يُكَلِّفُ ٱللَّهُ نَفْسًا إِلَّا وُسْعَهَا ۚ لَهَا مَا كَسَبَتْ وَعَلَيْهَا مَا ٱكْتَسَبَتْ ۗ
رَبَّنَا لَا تُؤَاخِذْنَآ إِن نَّسِينَآ أَوْ أَخْطَأْنَا ۚ رَبَّنَا وَلَا تَحْمِلْ عَلَيْنَآ إِصْرًا كَمَا حَمَلْتَهُۥ عَلَى ٱلَّذِينَ مِن قَبْلِنَا ۚ رَبَّنَا وَلَا تُحَمِّلْنَا مَا لَا طَاقَةَ
2 لَنَا بِهِۦ ۖ وَٱعْفُ عَنَّا وَٱغْفِرْ لَنَا وَٱرْحَمْنَآ ۚ أَنتَ مَوْلَىٰنَا فَٱنصُرْنَا عَلَى ٱلْقَوْمِ ٱلْكَٰفِرِينَ ﴾
3 ﴿ فَسَيَكْفِيكَهُمُ ٱللَّهُ ۚ وَهُوَ ٱلسَّمِيعُ ٱلْعَلِيمُ ﴾
4 ﴿ يَٰقَوْمَنَآ أَجِيبُوا۟ دَاعِىَ ٱللَّهِ وَءَامِنُوا۟ بِهِۦ يَغْفِرْ لَكُم مِّن ذُنُوبِكُمْ وَيُجِرْكُم مِّنْ عَذَابٍ أَلِيمٍ ﴾
5 ﴿ وَنُنَزِّلُ مِنَ ٱلْقُرْءَانِ مَا هُوَ شِفَآءٌ وَرَحْمَةٌ لِّلْمُؤْمِنِينَ ۙ وَلَا يَزِيدُ ٱلظَّٰلِمِينَ إِلَّا خَسَارًا ﴾
2 ﴿ وَإِذَا مَرِضْتُ فَهُوَ يَشْفِينِ ﴾ 1 ﴿ أَمْ يَحْسُدُونَ ٱلنَّاسَ عَلَىٰ مَآ ءَاتَىٰهُمُ ٱللَّهُ مِن فَضْلِهِۦ ﴾

---

1 (ෆසයක් ෆී කුහුමුල්ලාහු වහුස් සමීඋල් අලීම්)
2 (යා කව්මුනා අජිබු දා ඉයල්ලාහි වආමිනු බිහි යග්ෆිර්ලකුම් මින් දුනුබිකුම් වයුජිර්කුම් මින් අදාබින් අලීම්)
3 (වනු නස්සිලු මිනල් කුර්ආනි මා හුව ෂිෆාඋන් වරහ්මතුන් ලිල් මුඃමිනීන් වලා යසීදුල්ලාලිමීන් ඉල්ලා කසාරා)

[4]﴿قُلْ هُوَ لِلَّذِينَ ءَامَنُوا۟ هُدًى وَشِفَآءٌ﴾ [3]﴿وَيَشْفِ صُدُورَ قَوْمٍ مُّؤْمِنِينَ﴾
[6]﴿فَٱرْجِعِ ٱلْبَصَرَ هَلْ تَرَىٰ مِن فُطُورٍ﴾ [5]﴿لَوْ أَنزَلْنَا هَٰذَا ٱلْقُرْءَانَ عَلَىٰ جَبَلٍ لَّرَأَيْتَهُۥ خَٰشِعًا مُّتَصَدِّعًا مِّنْ خَشْيَةِ ٱللَّهِ﴾
[7]﴿وَإِن يَكَادُ ٱلَّذِينَ كَفَرُوا۟ لَيُزْلِقُونَكَ بِأَبْصَٰرِهِمْ لَمَّا سَمِعُوا۟ ٱلذِّكْرَ وَيَقُولُونَ إِنَّهُۥ لَمَجْنُونٌ﴾
﴿وَأَوْحَيْنَآ إِلَىٰ مُوسَىٰٓ أَنْ أَلْقِ عَصَاكَ ۖ فَإِذَا هِىَ تَلْقَفُ مَا يَأْفِكُونَ ﴿١١٧﴾ فَوَقَعَ ٱلْحَقُّ وَبَطَلَ مَا كَانُوا۟ يَعْمَلُونَ ﴿١١٨﴾ فَغُلِبُوا۟ هُنَالِكَ
وَٱنقَلَبُوا۟ صَٰغِرِينَ﴾[8]
﴿قَالُوا۟ يَٰمُوسَىٰٓ إِمَّآ أَن تُلْقِىَ وَإِمَّآ أَن نَّكُونَ أَوَّلَ مَنْ أَلْقَىٰ ﴿٦٥﴾ قَالَ بَلْ أَلْقُوا۟ ۖ فَإِذَا حِبَالُهُمْ وَعِصِيُّهُمْ يُخَيَّلُ إِلَيْهِ مِن سِحْرِهِمْ أَنَّهَا تَسْعَىٰ ﴿٦٦﴾
فَأَوْجَسَ فِى نَفْسِهِۦ خِيفَةً مُّوسَىٰ ﴿٦٧﴾ قُلْنَا لَا تَخَفْ إِنَّكَ أَنتَ ٱلْأَعْلَىٰ ﴿٦٨﴾ وَأَلْقِ مَا فِى يَمِينِكَ تَلْقَفْ مَا صَنَعُوٓا۟ ۖ إِنَّمَا صَنَعُوا۟ كَيْدُ سَٰحِرٍ ۖ وَلَا
يُفْلِحُ ٱلسَّاحِرُ حَيْثُ أَتَىٰ﴾[9]
[11]﴿ثُمَّ أَنزَلَ ٱللَّهُ سَكِينَتَهُۥ عَلَىٰ رَسُولِهِۦ وَعَلَى ٱلْمُؤْمِنِينَ﴾ [10]﴿فَأَنزَلَ ٱللَّهُ سَكِينَتَهُۥ عَلَيْهِ وَأَيَّدَهُۥ بِجُنُودٍ لَّمْ تَرَوْهَا﴾
[12]﴿فَأَنزَلَ ٱللَّهُ سَكِينَتَهُۥ عَلَىٰ رَسُولِهِۦ وَعَلَى ٱلْمُؤْمِنِينَ وَأَلْزَمَهُمْ كَلِمَةَ ٱلتَّقْوَىٰ﴾
[13]﴿لَّقَدْ رَضِىَ ٱللَّهُ عَنِ ٱلْمُؤْمِنِينَ إِذْ يُبَايِعُونَكَ تَحْتَ ٱلشَّجَرَةِ فَعَلِمَ مَا فِى قُلُوبِهِمْ فَأَنزَلَ ٱلسَّكِينَةَ عَلَيْهِمْ وَأَثَٰبَهُمْ فَتْحًا قَرِيبًا﴾
[14]﴿هُوَ ٱلَّذِىٓ أَنزَلَ ٱلسَّكِينَةَ فِى قُلُوبِ ٱلْمُؤْمِنِينَ لِيَزْدَادُوٓا۟ إِيمَٰنًا مَّعَ إِيمَٰنِهِمْ﴾

**හදීස්වලින් ප්‍රකාශිත ඒවා:-**

(අස් අලුල්ලාහල් අලීම රබ්බල් අර්ෂිල් අලීම් අන් යෂ්ෆීක ) 7 වරක් (අර්ථය - ගෞරවනීය අර්ෂ්හි රක්ෂිතයාණන්වූ අල්ලාහ් වෙත නුඹව සුවපත්කරන මෙන් ඉල්ලමි.

(උර්දුක බිකලිමාතිල්ලාහිත් තාම්මති මින් කුල්ලි ෂෙයිතානින් වහාම්මාතින් වමින් කුල්ලි අයිනින් ලාම්මතින්) 3 වරක් (අර්ථය:- අල්ලාහ්ගේ පරිපූර්ණ වදන් මගින් ෂෙයිතාන්ගේ හානියෙන් අනෙකුත් විෂ සතුන් හා ඇස්වහ යනාදියේ හානිවලින්ද නුඹව ආරක්ෂා කරන මෙන් අල්ලාහ්ගෙන් ඉල්ලමි)

(අල්ලාහුම්ම රබ්බන්නාසි අද්හිබිල් බඃස ඉෂ්ෆි අන්තෂ්ෂාෆි ලා ෂිෆාඅ ඉල්ලා ෂිෆාඋක්" ෂිෆාඅන් ලා යුගාදිරු සකමා) 3 වරක් (අර්ථය:- දෙවියනි" මිනිසුන්ගේ රක්ෂකයාණනි" රෝගය ඉවත් කර සුවකර මැන" රෝග නිවාරණය ලබා දෙන්නා නුඹමය" නුඹගේ රෝග නිවාරණය හැර වෙනත් නිවාරණයක් නැත" රෝගය අත නොහරින සුවයක් ඇති කරනු මැන

(අල්ලාහුම්මද්හිබ් අන්හු හර්රහා වබර්දහා වවසබහා) 1 වරක් (අර්ථය: දෙවියනි" එහි උෂ්ණය ද එහි සිසිල ද එහි දුෂ්කරතාවන් ද ඔහුගෙන් ඉවත් කරනු මැන"

(බිස්මිල්ලාහි උර්කීක මින්කුල්ලි දා ඉන් යඃදීක වමින් ෂර්රි කුල්ලි නෆ්සින් අව් අය්නින් හාසිදින් අල්ලාහු යෂ්ෆීක් බිස්මිල්ලාහි උර්කීක) 3 වරක් (අර්ථය අලලාහ්ගේ නාමයෙන් නුඹට

---

[4] (අම් යහ්සුදුනන්නාස අලාමා ආතාහුමුල්ලාහු මින් පළ්ලිහි)
[5] (වඉදා මරිළ්තු ෆහුව යස්ෆීනි)
[6] (වයෂ්ෆි සුදූර කවුමින් මුඃමිනීන්)
[7] (කුල් හුව ලිල්ලදීන ආමනු හුදන් වෂිෆාඋන්)
[8] (ලවු අන්දල්නා හාදල් කුර්ආන අලා ජබලින් ලරඅයිතහු කාසිඅන් මුතසද්දිඅන් මින් කස්යතිල්ලාහ්)
[9] (ෆර්ජිඉල් බසර හල් තරා මින් ෆුතූර්)
[10] (වඉන් යකාතුල්ලදීන කෆරූ ලයුස්ලිකූනක බිඅබ්සාරිහිම් ලම්මා සමිඋෘ දික්ර වයකූලූන ඉන්නහු ලමජ්නූන්)
13 (සුම්ම අන්දලල්ලාහු සකීනතහු අලා රසූලිහි ව අලල් මුඃමිනීන්)
[11] (වඅව්හයිනා ඉලා මූසා අන් අල්කි අසාක ෆඉදා හිය තල්කෆු මා යඃෆිකූන්) (ෆවකඅල් හක්කු වබතල මා කානූ යඃමලූන්) (ෆගුලිබූ හුනාලික වන්කලබූ සාගිරීන්)
12 කාලූ යා මූසා ඉම්මා අන් තුල්කිය වඉම්මා අන්නකූන අව්වල මන් අල්කා, කාල බල් අල්කූ ෆඉදා හිබාලුහුම් ව ඉසිය්යුහුම් හුහය්යලු ඉලය්හි මින් සිහ්රිහිම් අන්නහා තස්ආ, ෆඅව්ජස ෆී නෆ්සිහි කිෆ්යතන් මූසා, කුල්නා ලාතකෆ් ඉන්නක අන්තල් අඃලා, වඅල්කි මා ෆී යමීනික තල්කෆ් මා සනඋෘ ඉන්නමා සනඋෘ කයිදු සාහිරින් වලා යුෆ්ලිහුස් සාහිරු හයිසු අතා
14 (ෆඅන්දලල්ලාහු සකීනතහු අලෙයිහි වඅය්යදහු බිජුනූදින් ලම් තරව්හා)
15 ෆඅන්දලල්ලාහු සකීනතහු අලා රසූලිහි ව අලල් මුඃමිනීන වඅල්සමහුම් කලිමතත් තක්වා)
[16](ලකද් රළියල්ලාහු අනිල් මුඃමිනීන ඉද් යුබායිඋෘනක තහ්තස් සජරති ෆඅලිම මාෆී කුලූබිහිම් ෆ අන්දලස් සකීනත අලෙයිම් වඅසාබහුම් ෆත්හන් කබීරා)
[17] (හුවල්ල දී අන්දලස් සකීනත ෆී කුලූබිල් මුඃමිනීන ලියස්දාදූ ඊමානන් මඅ ඊමානිහිම්)

මතුරමි. නුඹට වේදනාව ගෙන දෙන සියලුම රෝගයන්ගෙන් සෑම ජීවිතයෙකුගේම හානිවලින් ද ඊර්ෂ්‍යා කරුගේ ඇස්වහ හානියෙන්ද අල්ලාහ් නුඹව සුව කරත්වා. අල්ලාහ්ගේ නාමයෙන් නුඹට මතුරා බලමි) වේදනාව ඇති තැන අත තබා පහත සඳහන් පරිදි මතුරන්න.
(හස්බියල්ලාහු ලා ඉලාහ ඉල්ලාහුඅලෛහි තවක්කල්තු වහුව රබ්බුල් අර්ෂිල් අලීම්) 7 වරක්
අර්ථය:- දෙවියනි මට ඔබ ප්‍රමාණවත්ය. නැමදුමට සුදුසු දෙවියා ඔහු හැර අන් කිසිවෙක් නොමැත. ඔහු මතම විශ්වාසය තැබුවෙමි. ඔහු ගෞරවනීය අර්ෂිහි රක්ෂිතයාය.
(බිස්මිල්ලාහ්) තුන්වරක් (අල්ලාහ්ගේ ශුද්ධ නාමයෙන් ) (මතුරමි) (අඌදුබිඉස්සතිල්ලාහි වකුද්රතිහි මින් ෂර්රිමා අජිදු වඋහාදිරු) 7 වරක් (අල්ලාහ්ගේ වටිනාකම මත ද ඔහුගේ ශක්තිය මතද මා දුක්විඳින ආපදාවලින් අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතමි.)

**විශේෂ සටහන් කීපයක්**

1 කෙනෙකුගේ ඇස්වහ හේතුකොටගෙන හානියක් සිදුවුවොත් ඔහුගේ මුත්‍රා පානය සුවය ලැබෙන බවටද ඔහු මළහොත් එම ඇස්වහ ඉවත් වෙන බවටද සමහර සාක්ෂි නොමැති ප්‍රවෘත්ති ඇත. ඒවා විශ්වාස නොකළ යුතුය.

2 ඇස්වහ ඇති නොවීමට සම් වැනි දේවල්වලින් නිමවන ලද යන්ත්‍ර ද මාල වළළු වැනි දේවල් පැලඳීමෙන් ද වැළකිය යුතුය. නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ පහත සඳහන් පරිදි ප්‍රකාශ කළහ. 'යමෙක් යම් දෙයක් එල්ලා ගනී නම් ඔහු එම දේ වෙතම භාර කරනු ලබයි (තිර්මිදි) එහෙත් අල් කුර්ආනයෙහි වැකි ලියවුන සුර එල්ලා ගැනීම පිළිබඳව වියතුන් අතර මතභේද පවතී. කෙසේ වෙතත් එයින් වැළකීම ම වැදගත් වෙයි.

3 (තබාරකල්ලාහ්) (මාෂා අල්ලාහ්) යැයි ලිවීම. කඩුව. කැත්ත හා ඇස්වැනි දෑ ඇඳ තැබීම අල්කුර්ආන් පිටපතක් වාහනයේ තබා ගැනීම කුර්ආන් වැකි ලියා නිවසේ එල්ලා තැබීම මෙවැනි ක්‍රියාවන්ගෙන් ඇස්වහ නැතිකළ නොහැක. ඒ වෙනුවට මෙවැනි ක්‍රියා තහනම් කළ සුර දැමීම වැනි ක්‍රියාවන්ද එක් වීමට ඉඩ ඇත.

4 සමුහයක් එක් වී මැතිරීම නබි ක්‍රමයට පටහැනිය. එයින් ලැබෙන ප්‍රතිඵලයද දුර්වල එකක් වන්නේය. ශබ්ද පටි හඬයී නංවා තමන් නොමතුරා සිටීමද මෙසේ මය. හඬයී පටි මගින් මෙවාට සවන් දීමට ද කුසල් ඇත. එහෙත් යම් වත්පිළිවෙතකට අධිෂ්ඨානය කිරීම (එය සිතෙන් සිතීම) මෙයින් සිදු නොවේ. මතුරන්නා එම සිතුවිල්ලෙන් සමග මැතිරීම කොන්දේසියයි.

5 මතුරා ප්‍රතිකාර කරන විට සුවය ලබන තෙක් නැවත නැවත මැතිරීම සුන්නත් වෙයි. එහෙත් එසේ මැතිරීමෙන් රෝගියාට වෙහෙසක් හා දුෂ්කරතාවක් ඇතිවුනේ යැය හැඟෙන්නේ නම් ඔහුව වෙහෙසට පත් නොකර ඔහු එය අඩුකර ගනී. එසේ අදාල සාක්ෂි නොමැතිව යම් සංඛ්‍යාවක් (වාරගණනක්) අඩුකර ප්‍රාර්ථනාවන් හා වැකි කියවීම නොසුදුසුය.

6 මතුරන අයෙක් කුර්ආන් මගින් කියවා බලා හූනියම් මාර්ග භාවිතා කරන බව දැන ගැනීමට සමහර සළකුණු ඇත. එහෙයින් ඔහු ආගමික භක්තියක් ඇති අයෙකු බවට කරන රඟපෑම දැන අප නොරැවටිය යුතුය. මෙවැනි අය කුර්ආන් වැකි කියවා අපට නොදැනීම හූනියම් වැකි මුමුණන්නට පටන් ගන්නේය. තවද අනෙක් අය රවට්ටන අදහසින් යුතුව මස්ජිදය සමග සම්බන්ධයක් දක්වයි. ඒවගේම අප ඉදිරියේ 'දික්ර්'වලද යෙදෙයි. මෙවැනි තත්ත්වයන් දැක අප නොරැවටී සිටිය යුතුය.

**හූනියම් හා ඇස් බැන්දුම් ආදිය කරන්නන් පිළිබඳ අයගේ සළකුණු :-** ✷ තමා ලඟට පැමිණෙන රෝගීන්ගෙන් රෝගීයාගේ හෝ ඔහුගේ මවගේ නම අසති. සැබවින්ම රෝගියාගේ නම දැන සිටීමත් නොදැන සිටීමත් ඔහුගේ රෝගයට ප්‍රතිකාර කිරීමෙහි කිසිදු වෙනසක් ඇති නොකරයි. ✷ ජින් (භූතයන්ට) කපා බිලිදීමට අවශ්‍ය බව පවසා නියමිත සත්වයෙකු ගෙන එන ලෙස පවසති. සමහරවිට උගේ රුධිරය රෝගියාගේ ශරීරයේ ද තවරති. ✷ තේරුමක් නොදන්නා සැබැවින්ම එයට තේරුමක් ඇත්තේ ම නැති අක්ෂර ස්වරූපයෙන් ලියා දෙති. ✷ චතුරශ්‍රාකාර වගුවල සමහර අකුරු හා අංක ලියූ කඩදාසි ලෙඩාට දෙති. ✷ අඳුරු කාමරයක වෙන කිසිවෙකුගේ සම්බන්ධයක් නොමැතිව තනිකර තබති. ✷ නියමිත කාල සීමාවකට ජලය පාවිච්චි නොකළ යුතු යැයි ලෙඩාට අනිවාර්ය කරති. ✷ පොළොව භාරා

එහි කුමක් හෝ වලලන මෙන් යමක් දෙති“ එසේ නැත්නම් කඩදාසි කැබැල්ලක් හාර දී එය පුළුස්සා දුම් අල්ලන මෙන් කියති“ ✷ කිසිවෙකු නොදන්නා රෝගියාගේ රහස් තොරතුරු ඔහු කීමට පෙර ඔහුගේ ගමේ තොරතුරු ද කියති“ රෝගියා කෙලින්ම හෝ දුරකථනයෙන් හෝ ලිපි මගින් සම්බන්ධ වූ පමණින් ඔහුගේ රෝග ලක්ෂණ දැන ගනිති“

**7** භූතයින් මිනිස් සිරුර තුළට ඇතුල් වී ඔහු හා සංකලනය වීම සාර්ථක දෙයක් බව සුන්නත් වල් ජමාඅත් අයගේ ප්‍රතිපත්තියයි“ පහත සඳහන් දේව වැකිය එයට සාක්ෂියක් ලෙස ගත හැක“ ‘**පොලී කන අය ෂෙයිතාන්ගේ ග්‍රහණය නිසා සිහිසුන්වුවන් බවට ඔහු කවරෙකුව පත් කරන්නේ ද එවැනි අය නැගිටින්නා සේ මිස (පරලොවදී) නොනැගිටෙන්නෝය**“

අල්-කුර්ආන් විවරණ වියතුන් හැමදෙනෙකුම මෙම වැකියේ එන අල්-මස්සු යන වදන භූතයින්ගේ ග්‍රහණය නිසා කෙනෙකුට ඇතිවන උමතුව වැනි තත්ත්වයට සඳහන් කරන්නේ යැයි ඒකමතිකව තීරණය කරති“

**සමජ්තය** :- හූනියම් කියා යමක් ඇත. එහි යථාර්තය අනුමානය. අල්ලාහ් මෙසේ පැවසීය : **ඔවුන්ගේ හූනියම නිසා ඒවා ගිලගන්නා සේ ඔවුනට පෙණින.**’ එයින් හානියක් වන බව කුර්ආන් හදීස් මගින් දැනගත හැක. එය මහා පාපයකි. රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ පැවසුවේය. **විනාශයට පත්කරන ක්‍රියා හතකින් නුඹලා වැළකී සිටිහු.** ඒවා කුමක්දැ?යි සහාබිවරු ප්‍රශ්න කළහ. එවිට රසූල් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ ‘**අල්ලාහ්ට ආදේශ කිරීම” හූනියම් කිරීමැ**’**යි** පිළිතුරු දුන්හ“ (බුහාරි” මුස්ලිම්) තවද අල්ලාහු තආලාගේ වාක්‍යය වන **කවරෙකු එය මිල දී ගන්නේ ද, ඔවුනට පරලොවේ කුසිදු කොටසක් හිමි නොවන බව ස්තිර වශයෙන් ඔවුන් දැන සිටන්නෝය.** මෙය වර්ග දෙකකි. (අ) ගැටවලට පිඹීම හා මන්ත්‍ර කිරීම තුළින් හූනියම් කරනු ලබන්නාහට අයහපතක් ඇති කිරීම සඳහා. හූනියම් කරන්නා ෂෛතාන්ගෙන් උදව් පතයි. (ආ) හූනියම් කරනු ලබන්නාගේ ශරීරයේ, නුවනේ, සිතුවිල්ලේ හා ආශාවේ ප්‍රතික්‍රියා ඇති කරන සමහර ඖෂධයන්, ඒ තුළින් හූනියම මාරුවේ, මගහැරේ නැතහොත් විනාශ වේ යනාදියන් කියා හූනියම් කරනු ලැබූ තැනැත්තාව විශ්වාසයට ලක් කිරීම. මෙහිදී ප්‍රථම වර්ගය ෂිර්ක් ය. මන්ද හූනියම් කරන්නා අල්ලාහු තආලාව ප්‍රතික්ෂේප කරන තුරු ෂෛතාන් ඔහුට උදව් නොකරයි. තවද මෙය කුසලයන් විනාශයට පත් කරන මහා පාපයකි. සෑම දෙයක්ම අල්ලාහු තආලාගේ තීරණය අනුවම සිදු වේ.

# ප්‍රාර්ථනා කිරීම

මවනු ලැබූ සියල්ලෝම දෙවියන්ගේ අවශ්‍යතාව ඇත්තෝය“ එහෙත් සර්ව බලධාරී අල්ලාහ් තම ගැත්තාගෙන් කිසිදු අවශ්‍යතාවක් නොමැති කෙනෙකි“ 'නුඹලා මාව අමතා ප්‍රාර්ථනා කරනු“ නියත වශයෙන්ම මම නුඹලාගේ ප්‍රාර්ථනයට පිළිතුරු දෙමි'යි අල්ලා ශුද්ධ කුර්ආනයේ ප්‍රකාශ කරයි“ **නියත වශයෙන්ම මාව අමතා මා වෙත ප්‍රාර්ථනා කර නැමදුම් ඉටු කිරීම අතහැර සිටින්නවුන් නින්දිතයින් වී නිරයට ඇතුල් වන්නේය**“ තවද නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ ***'කවරෙකු හෝ අල්ලාහ්ගෙන් නොඉල්ලයිනම් ඔහු කෙරෙහි අල්ලාහ් කෝපවන්නේය'යි*** කීහ“ මෙපමණක් නොව අල්ලාහ් තමාගේ ගැත්තන් තමන්ගේ අවශ්‍යතා ඔහුගෙන් ඉල්ලනවිට අල්ලාහ් සතුටු වෙයි“ අවශ්‍යතාවක් ගැන නැවත නැවත ප්‍රාර්ථනා කරන්නන්ට අල්ලාහ් ප්‍රිය කරයි“ තවද ඔවුන්ව ඔහු තමාට සමීප කර ගනී“

නබි මිතුරන් මෙම සත්‍යය අවබෝධ කර ගෙන සිටියහ“ ඒ නිසාම ඔවුහු තම අවශ්‍යතාව ලොකු වුවත් කුඩා වුවත් එය අල්ලාහ්ගෙන් අසති“ ඒ වගේම ඔහුගේ මැවීම් ඉදිරියේ ඔවුන්ගේ අවශ්‍යතා ඉදිරිපත් කළේ නැත“ ***'මගේ ගැත්තන් මා ගැන ඇසුවහොත් මම නියත වශයෙන්ම සමීපව සිටිමියි පවසනී'*** යන වැකියට අනුව ඔවුන් අල්ලාහ් කෙරෙහි ඇති කරගත් සම්බන්ධයත් ඔහුටත් ඔවුන්ටත් අතර සම්බන්ධයත් මෙයට හේතුවිය“

ප්‍රාර්ථනයට අල්ලාහ් වෙත වැදගත් තැනක් ඇත“ එය අල්ලාහ් වෙත ඉතා ගෞරවාන්විත හා අගය ඇති ක්‍රියාවකි“ සමහර විට එය ඔහුගේ සැලැස්ම වෙනස් කිරීමට ද හේතු වන්නේය“ පිළිගැනීමට හේතුවිය හැකි කරුණු ඇති අතර බාධා නැති වුවහොත් නිසැකවම මුස්ලිම්වරයෙකුගේ ප්‍රාර්ථනයට එක් කළ අයෙකුට ලැබෙන්නේමය“ ***'මුස්ලිම් වරයෙක් පාපක්‍රියාවක් ගැන හෝ ලේ නෑකමක් බිඳ ගැනීම ගැන හෝ නොවන දෙයක් ප්‍රාර්ථනා කරන්නේ නම් අල්ලාහ් කරුණු තුනකින් එකක් ඔහුට ලබා දෙන්නේය“ එක්කෝ ඔහුගේ ප්‍රාර්ථනාව මෙලොවදීම ඉටු කරයි“ නැතිනම් එම ප්‍රාර්ථනයේ කුසල් රැස්කර තබාගෙන පරලොව දී යහපත් විපාක ලෙස පිළිගන්වයි“ එසේත් නැතිනම් ඔහුගේ ප්‍රාර්ථනය වෙනුවට (ඔහුට සිදුවීමට තිබුණ) විපත්තියක් ඉවත් කරයි“ මෙයට සවන් දුන් 'නබි මිතුරෝ' එසේ නම් අපි අධිකව ප්‍රාර්ථනා කරමු'යි කීහ“ එවිට නබි තුමාණෝ අල්ලාහ් ලග (දීමට) ඉතා අධිකව ඇතැ'යි කීහ'*** (අහ්මද් දිර්මිදි)

**ප්‍රාර්ථනා දෙවැදෑරුම් වෙයි“** 1“ වත්පිළිවෙත් ස්වභාවයේ ඇත“ උපවාසය“ සලාතය“ වැනි දෑ 2“ අවශ්‍යතාව අරමුණු කර ගෙන ප්‍රාර්ථනයක් ලෙස ම ඉල්ලීම

**කුමක් කිරීම වැදගත් දැයි යන ක්‍රියාවන් අතර වර්ගීකරණය** කුර්ආනය කියවීම“ දික්ර් කිරීම“ ප්‍රාර්ථනා කිරීම යන දෑ වලින් වඩාත් වැදගත් වන්නේ කුමක්ද?යි අප සලකා බැලීමේදී කුර්ආනය කියවීම වඩාත් උචිතය“ ඊළගට දික්ර් කිරීම“ ප්‍රාර්ථනා කිරීම යනාදියයි“ එහෙත් සමහර අවස්ථාවල මෙම වර්ගීකරණයෙහි වෙනස්කම් ඇතිවිය හැක“ මන්ද 'අරෆා' පිටියේදී රැස්වන්නන් එදා එම ස්ථානයේ දී කුර්ආනය කියවීමට වඩා ප්‍රාර්ථනා කිරීම වැදගත්ය“ තවද පස්වේල සලාතයන්හි පහත සඳහන් දික්ර් කිරීම කුර්ආනය කියවීමට වඩා වැදගත්ය“

**ප්‍රාර්ථනා පිළි ගැනීමට අදාල හේතුන්:-** මේවායින් එළිපිට හා අභ්‍යන්තර (පෞද්ගලික) යැයි දෙකකි ඇත“

1“ එළිපිට ඉටුවිය යුතු කරුණු:- සලාතය ඉටු කිරීම“ දන්දීම ආදී යහපත් ක්‍රියා ඉටු කිරීමෙන් පසු ප්‍රාර්ථනා කිරීම“ ප්‍රාර්ථනා කරන විට පහත සඳහන් විනය හා ඒවා ඉදිරිපත් කළයුතු ක්‍රියා දාමයන් ගැන ද සැලකිලිමත් විය යුතුය“ කිබ්ලාවට මුහුණ ලා සිටීම දෑත් එසවීම අල්ලාහ්ට ප්‍රශංසා කිරීම“ නබිතුමන්ට ආරම්භයේත් මධ්‍යයේත් අවසානයේත් සලාවාත් කීම“ තම පාපයන් පිළිගැනීම“ අල්ලාහ් ලබාදුන් දායාදයන්ට ස්තුති කිරීම යනාදියයි“ ආරම්භයේ අල්ලාහ්ට ප්‍රශංසා කරමින් අප කරන ප්‍රාර්ථනයට අදාල ඔහුගේ ශුද්ධ නාමයන් හා ගුණාත්මක භාවයන් ඉදිරිපත් කළ යුතුය“ ස්වර්ගය අසන විට ඔහුගේ දයාව මාර්ගයෙන් ඉල්ලිය යුතුය“ අසාධාරණකාරයෙකුට විරුද්ධව දුආ ප්‍රාර්ථනා කරන විට දයාවන්ත හා පිහිටවන්නා වැනි ගුණයන් සිහිපත් කළ යුතුය“

තවද නබිවදන්හි ප්‍රාර්ථනා පිළිගැනේවි යැයි නියම කර ඇති සමහර වේලාවන් ප්‍රයෝජනයට ගැනීමත් විවෘත හේතුවලින් සමහරක් වේ“ ඒවා බොහොමයක් ඇත“ සෑම දවසකම අල්ලාහ් පහළ අහසට බසින රාත්‍රියේ තුන්වන ජාමය වූ අවසන් කාලය (සහර් කරන කාලය) අදාන් හා

ඉකාමත් අතර වේලාව” වුළු කළ පසුව” සජ්දා කරන විට” අත්තහියියාත්හි සලාම් දීමට පෙර” සලාතය අවසානයේදී” කුකුළන් හඬලයීන විට” ගමන් කරන විට ආදිය එයින් සමහරෙකි“ තවද අසාධාරණයට ලක්වුවෙකුගේ ප්‍රාර්ථනාව දෙමව්පියන් දරුවන් වෙනුවෙන් කරන ප්‍රාර්ථනාව” තම සහෝදරයා නැති අවස්ථාවක ඔහු වෙනුවෙන් කරන ප්‍රාර්ථනාව සතුරා සමග සටනේ යෙදී සිටියදී කරන ප්‍රාර්ථනාව අනුමත වීමට ඉතාමත් ඵලදායි අවස්ථාවන් වෙයි“ මෙයට අමතරව සතියේ ජුමුආ දවස එදින අවසන් භාගය” මාසවලින් රම්ළාන් මස ද (විශේෂයෙන් සහර් කරන හා උපවාසයෙන් මිදෙන වේලාව) ලෙයිලතුල් කද්ර් රාත්‍රිය අරෆා දවසේ කරන පැතුම් මස්ජිද් වලද කඃබාවේ හජ්රුල් අස්වද් ගල හා කඃබා දොරටුව අතර මුස්තසම් නමැති ස්ථානයේ දී” මකාමු ඉබ්‍රාහිම් ස්ථානයේ” ’සෆා මර්වා’ කඳු මත සිටියදී” හජ් සමයේ අරෆා” මිනා” මුස්තලිෆා ආදි ස්ථානාවල දී” සම් සම් ජලය පානය කරන විට ද මෙසේ විශේෂ ස්ථානවල හා අවස්ථාවල කරන ප්‍රාර්ථනා අනුමත වීමට ඉඩ ඇත“

2“ අභ්‍යන්තර (පෞද්ගලික) හේතු සමහරක්:- ප්‍රාර්ථනා කරන්න පෙර සැබෑම තව්බාව කර ගැනීම” නිසියාකාර නොවන අසාධාරණ ලෙස ලබාගත් භාණ්ඩ ඒවායේ අයිති කරුවන්ට භාරදීම” ආහාර” පාන ඇඳුම් හා නිවෙස් හලාල් බවට පත් කර ගැනීම“ යහපත් ක්‍රියා අධිකව කිරීම” තවද ප්‍රාර්ථනා කරන විට හදවතින් පසුතැවිලි වෙමින් ඉල්ලා සිටීම අල්ලාහ් මත විශ්වාසය තබා ඔහු වෙතම අභය සොයා සියළු කටයුතු ඔහුටම භාර කර ප්‍රාර්ථනාව පිළිගැනේ වි යැයි ස්ථාවරව ආයාචනාත්මකව නැවත නැවත ඇසිය යුතුය“

**ප්‍රාර්ථනාව පිළිගැනීමට බාධක වන කරුණු:-** සමහරවිට කෙනෙකු ප්‍රාර්ථනා කර එය පිළිනොගෙන හෝ ඉටුවීම ප්‍රමාද වී යාමට ඉඩ ඇත“ එයට විවිධ හේතූන් ඇත“ ඉන් සමහරක් පහත සඳහන් වෙයි“ ✷අල්ලාහ් සමග සෙසු අයව ද එක් කරමින් අවශ්‍යතා ඉල්ලීම“ ✷ප්‍රාර්ථනාවෙහි අනවශ්‍ය විග්‍රහයන් කීම (උදා:- නිරයෙන් ආරක්ෂාව පැතීමෙන් ප්‍රමාණවත් නොවී එහි උෂ්ණය අඳුර හා දුෂ්කරතා යැයි විස්තර කිරීම“) ✷මුස්ලිම් වරයෙකු තමාට හෝ අනුන්ට හෝ විරුද්ධව අසාධාරණව ප්‍රාර්ථනා කිරීම” පාපයක් හෝ ඥාතිත්වය බිඳීමක් ගැන ඉල්ලීම හා තම අවශ්‍යතාව අල්ලාහ් මනාප නම් දෙන ලෙස ඉල්ලීම (උදා:- යා අල්ලාහ් නුඹට මනාප නම් ක්ෂමාව දෙනු මැනැ’යි කීම) ✷ප්‍රාර්ථනය ඉටු විය යුතු බවට ඉක්මන් වීම ✷ප්‍රාර්ථනයෙහි සිත නොයොදවා වෙනත් සිතුවිල්ලක් ඇතුව ප්‍රාර්ථනා කිරීම” තවද අල්ලාහ් ඉදිරියේ විනය ගරුක නොවී ප්‍රාර්ථනා කරන පුද්ගලයකු දුටු නබිතුමාණෝ ’මොහු ඉක්මන් විය’ යැයි කීහ“ මෙම සහාබිවරයාට හෝ වෙනත් අයෙකුට නබි මාණෝ මෙසේ කීහ“ ’නුඹලාගෙන් අයෙකු සලාතයේ යෙදුනු විට පළමුව අල්ලාහ්ට ප්‍රශංසා කර ඉන්පසු නබි මත සලවාත් කීමෙන් අනතුරුව තමාට මනාප දෙයක් ප්‍රාර්ථනා කළ යුතුය“ ✷වෙනස් කළ නොහැකි බවට අල්ලාහ් තීන්දු කළ දෙයක් ගැන ඉල්ලීම (මෙලොව සදාකල් ජීවත් වීමට අසන්නාක් මෙන්) ✷ප්‍රාර්ථනාවෙහි අලංකාර වදන් යොදා අසීරුවෙන් වෙහෙසට පත්වීම“ අල්ලාහ් මෙසේ කියයි“ නුඹලාගේ දෙවියන්ට නිහතමානිව ද (පහත් හඬක්) සෙමෙන් (ප්‍රාර්ථනා කර) අමතනු“ නියත වශයෙන්ම ඔහු සීමාව ඉක්මවන්නනන්ට ප්‍රිය නොකරයි“ ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු)තුමා මෙසේ පවසයි ’ප්‍රාර්ථනා කරන විට කලබලකාරීත්වය නුඹ අත් හරින්න මන්ද නබිතුමා හා මිතුරන් එයින් වැළකී ප්‍රාර්ථනා කරනු මම දුටිමි“ (බුහාරි) ✷ප්‍රමාණයට වඩා හඬ වැඩි කිරීම” අල්ලාහ් මෙසේ පවසයි“ ’(නබිවරයාණනි)නුඹ නුඹේ ප්‍රාර්ථනායෙහි සීමාව ඉක්මවා හඬ නැගීමද එය ඉතා පහත්ව හඬ නැගීමද නොකරන්න“ මේ දෙක අතර මධ්‍යස්ථ හඬක් නුඹ තෝරා ගන්න’ මෙම වැකිය ගැන අදහස් දැක්වු ආයිෂා (රළියල්ලාහු අන්හා) තුමිය මෙය ප්‍රාර්ථනා කිරීම සම්බන්ධයෙන් පහළ වු බව කීවාය“

**ප්‍රාර්ථනා කරන්නා පහත සඳහන් පරිදි එය අනුපිළිවෙලට පෙළ ගස්වා ගැනීම සතුටුදායකය“** (අ) අල්ලාහ්ට ප්‍රශංසා කිරීම” (ආ) නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ට සලවාත් කීම“ (ඇ) පාපය පිළිගෙන තව්බා කිරීම“ (ඈ) අල්ලාහ්ගේ දයාවට ස්තුති කිරීම“ (ඉ) තමාගේ අවශ්‍යතා ඉදිරිපත් කර ඉල්ලීම“

(මෙහිදි අර්ථවත්වු විවිධ කරුණු අන්තර්ගත කෙටි වු ප්‍රාර්ථනාවන් ද නබි තුමාණන් හා මුල් කාලයේ යහපත් ගැත්තන් කළ සාධක සහිත ප්‍රාර්ථනා තෝරා ගෙන ඒවාද කියවිය හැක“) අවසානයේ සලවාත් සමග ප්‍රාර්ථනය නිමා කළ යුතුය“

# පාඩම් කරගත යුතු වැදගත් ප්‍රාර්ථනාවන් කීපයක්

| දුආාව පවසන අවස්ථාවන් | ණබි (සල්) තුමාණන් පැවසූ දුආාවන් හා එහි අරුතයන් |
|---|---|
| නිදාගැනීමට පෙර හා පසුව | නින්දට පෙර:- ***බිස්මිකල්ලාහුම්ම අමුතු ව අහ්යා*** (යා අල්ලාහ් නුඹේ නාමයෙන් මරණයට පත්වෙමි“ තවද ප්‍රාණය ලබමි. නැගිට්ට වහා :- ***අල්හම්දු ලිල්ලාහිල්ලදී අහ්යානා බඃද මා අමාතනා ව ඉලෙහින් නුෂූර්*** (මාව නිදාගන්න සලස්වා ඇහැරවන ලද අල්ලාහ්ටම සියලු ප්‍රශංසා” නැවත නැගිටවනු ලැබ රැස්කරනු ලබන්නේ ඔහු වෙතටමය. |
| නින්දේදී තිගැස්සී නැගිට්ටොත් | *අඋඃදු බි කලිමාතිල්ලාහිත් තාම්මාති“ මින් ගළබිහි වඉකාබිහි වමින් ෂර්රි ඉබාදිහි වමින් හමතා දිෂ්සෙයාතීනි“ වඅන් යහ්ළුරූන්* (අල්ලාහ්ගේ පූර්ව වදන්වලින් ඔහුගේ කෝපයෙන් හා දඬුවමෙන් ආරක්ෂාව පතමි“ තවද ඔහුගේ ගැත්තන්ගේ හානි හා ෂෛතාන් වරුන්ගේ හොල්මන් කිරීම් තවද (ෂෛතාන්) මා වෙත සමීප වීම පිළිබඳව ආරක්ෂාව පතමි“ |
| නිදාගත් තැනැත්තා සිහින දුටුවහොත් | නුඹලාගෙන් කෙනෙක් සතුටුදායක සිහිනයක් දුටහොත් එය අල්ලාහ්ගෙන් පහළ වූවකි“ එහෙයින් ඒ ගැන අල්ලාහ්ට ප්‍රශංසා කර ඒ සිහිනය සෙසු අයට කියන්න“ අසතුටුදායක සිහිනයක් දුටහොත් එය ෂෙයිතාන් වෙතින් ආ එකකි“ එයින් විය හැකි හානියෙන් (අල්ලාහ්ගෙන්) ආරක්ෂාව පතන්න“ තවද එය කිසිවෙකුට නොකියන්න“ එසේ කළ විට ඔහුට එයින් හානියක් නොවෙයි“ |
| නිවසෙන් බැහැරව යාම | *අල්ලාහුම්ම ඉන්නී අ ඌදුබික අන් අළිල්ල අව් උළල්ල අව් අදිල්ල අව් උදල්ල අව් අල්ලිම අව් උල්ලම අව් අජ්හල අව් යුජ්හල අලය්ය* (යා අල්ලාහ් මා මුළාවීම” මා මුලා කිරීම” වැරදීම” වරදට ලක්වීම කිසිවෙකුට අසාධාරණය කිරීම” මට යමෙක් අසාධාරණය කිරීම” මා නුගත් වීම හා නුගත් ලෙස කටයුතු කරවීම ආදි සියල්ලෙන් නුඹෙන් ආරක්ෂාව පතමි“) |
| මස්ජිදයට ඇතුල් වීම | දකුණු පාදය ඉදිරියට තබා මෙම දුආ:- ප්‍රාර්ථනා කරන්න *බිස්මිල්ලාහ් වස්සලාමු අලා රසූලිල්ලාහ්” අල්ලාහුම්මග්ෆිර්ලී තුනූබී වෆ්තහ්ලී අබ්වාබ රහ්මතික* (අල්ලාහ්ගේ නාමයෙනි” අල්ලාහ්ගේ දූතයාණන් මත ශාන්තිය අත්වේවා යා අල්ලාහ් මගේ පාපයන්ට ක්ෂමාව දෙනු මැන“ නුඹේ රහ්මත් නැමති දයාවන්හි දොරටු විවෘත කර දෙනු මැන“) |
| මස්ජිදයෙන් පිටව යාමේදී | මස්ජිදයෙන් පිටව යන අයෙකු වම්පාදය ඉදිරියට තබා පහත සඳහන් පරිදි කියන්න“ *බිස්මිල්ලාහ් වස්සලාමු අලා රසූලිල්ලාහ්“ අල්ලාමග්ෆිර්ලි තුනූබි වෆ්තහ්ලි අබ්වාබ ෆළ්ලික* (අල්ලාහ්ගේ නාමයෙනි” අල්ලාහ්ගේ දූතයාණන් මත ශාන්තිය අත්වේවා යා අල්ලාහ් මගේ පාපයන්ට ක්ෂමාව දෙනු මැන“ නුඹේ ෆළ්ලු නමැති භාග්‍යයන්හි දොරටු විවෘත කර දෙනු මැන“) |
| විවාහයකදී සුබ පැතීම | *බාරකල්ලාහු ලක වබාරක අලෙයික වජමඅ බයිනකුමා ෆී කයිරින්* (අල්ලාහ් නුඹලාට දයාව පහළ කරත්වා නුඹලා මත ඔහුගේ අභිවෘද්ධිය පහළ කරත්වා යහපත් ක්‍රියාවල දෙදෙනාවම එක් කරත්වා) |
| කුකුළා හැඬලීම හෝ බූරුවා කෑ ගහන හඬ ඇසුන විට | බූරුවාගේ හඬ නුඹලාට ඇසුන විට ෂෙයිතාන්ගෙන් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පතනු මන්ද ඌ ශබ්ද කරණුයේ ෂෙයිතාන්ව දැකීමෙන් පසුය“ කුකුළා හඬලන හඬ ඇසුනහොත් අල්ලාහ්ගේ දයාව පතනු“ මන්ද එය හඬලනුයේ මලක්වරුන්ව දුටුවිටය“ රාත්‍රි කාලයේ බල්ලන් බුරන විටද බූරුවන් හඬ නගන විටද අල්ලාහ්ගේ ආරක්ෂාව පතනු“ |
| අල්ලාහ් වෙනුවෙන් නුඹව කෙනෙකු ප්‍රිය කරන බව කී විට | අනස් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ කියයි“ තවත් මිනිසෙකු නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් අසල සිටින විට තවත් මිනිසෙක් එහි පැමිණියේය“ එවිට ඔහු ’අල්ලාහ්ගේ දූතයාණනි”’ මම ඔහුව ප්‍රිය කරමි’යි කීය“ වහා නබි තුමාණෝ ’ඒ බව ඔහුට කීවෙහිද?’යි ඇසූහ“ ඔහු ’නැහැ’යි පිළිතුරු දුන් විට නබි තුමාණෝ ඔහු වෙතට ගොස් පවසහි’යි කීහ“ වහාම මොහු ඔහු වෙත ගොස් ’මම අල්ලාහ් වෙනුවෙන් නුඹව ප්‍රිය කරමි’යි කීහ“ එවිට ඔහු ඔබ කවරෙකු වෙනුවෙන් මාව ප්‍රිය කරන්නෙහිද ඔහුද ඔබව ප්‍රිය කරන්නේයැ’යි කීය“ |

| | |
|---|---|
| නුඹේ මුස්ලිම් සහෝදරයා කිඹිහුම් පිට කළහොත් | නුඹලාගෙන් කෙනෙක් කිඹුහුමක් පිට කළහොත් *අල්හම්දුලිල්ලාහ්* (සියළු ප්‍රශංසා අල්ලාහ්ටමය) යනුවෙන් පැවසීමත් ඔහුගේ සහෝදරයා හෝ ලග සිටින්නා *යර්හමුකල්ලාහ්*(ඔබට දයාව පහළ කරත්වා) යැයි පවසණු“ ඔහු එසේ කීම හා කිඹිහුම පිටකළ තැනැත්තා *යහ්දීකුමුල්ලාහු ව යුස්ලිහු බාලකුම්* (අල්ලාහ් ඔබට සෘජු මග පෙන්වත්වා“ තවද ඔබේ කටයුතු සාර්ථක කරත්වා“) යැයි පවසනු“ තවද කාෆිර් කෙනෙකු කිඹිහුමක් හැර (අල්හම්දුලිල්ලාහ් කිවහොත් යර්හමුකල්ලා නොකියා යහ්දීකුමුල්ලාහ් පමණක් කියනු“ |
| දුෂ්කරතාවන් ඇති වූ විට | *ලාඉලාහ ඉල්ලල්ලාහුල් අලීමුල් හලීම්“ ලා ඉලාහ ඉල්ලල්ලාහු රබ්බුල් අර්ෂිල් අලීම්” ලා ඉලාහ ඉල්ලල්ලාහු රබ්බුස් සමාවාති වරබ්බුල් අර්ළි වරබ්බුල් අර්ෂිල් කරීම්” අල්ලාහු අල්ලාහු රබ්බී ලා උෂ්රිකු බිහී ෂෙයිආ” යාහය්යු යා කය්යූම් බිරහ්මතික අස්තගීස්” සුබ්හානල්ලාහිල් අලීම්* (ඉවසීම ඇති ගෞරවාන්විත අල්ලාහ් හැර නැමදුමට සුදුසු දෙවියකු අන් කිසිවෙක් නැත“ ශ්‍රේෂ්ඨ අර්ෂ්හි රක්ෂකයා හැර අන් කිසිවෙක් නැත“ ඔහු අහස්හිද පොළොවෙහිද අර්ෂිහි ද රක්ෂකයා වූ අල්ලාහ්ය“ ඔහුට කිසිවක් ආදේශ නොකරමි“ ජීවමානවූද ස්ථාවර වූද නුඹ නුඹේ දයාව මගින් නුඹෙන් උදව් පතමි“ ශ්‍රේෂ්ඨ වූ අල්ලාහ්ට තුති පුදමි“) |
| සතුරන්ට විරුද්ධව | *අල්ලාහුම්ම මුන්සිලල් කිතාබ් මුජ්රියස් සහාබ් සරීඅල් හිසාබ් ඉහ්සිම්ල් අහ්සාබ අල්ලාහුම්මහ් දිල් හුම් වසල්සිල්හුම්* (වලාකුළු ලුහු බදින්නා ඔබය“ ආගම පහළ කළේද ඔබය“ ඉතා ඉක්මණින් විභාග කරනුයේ ද ඔබය“ විරුද්ධ සේනාවන් පරාජය කරනු“ යා අල්ලාහ් ඔවුන්ව පරාජයට පත් කර ඔවුන්ව අස්ථාවර කරනු මැන“) |
| යම් වැඩක් කිරීම දුෂ්කර වූ විට | *අල්ලාහුම්ම ලා සහ්ල් ඉල්ලා මා ජඅල්තහු සහ්ලා වඅන් තජ්අලුල් හුස්න ඉදා ෂිඃත සහ්ලා* (යා අල්ලාහ් නුඹ පහසු නොකළ දෑ හැර පහසුවක් නොමැත“ දුෂ්කරතාද නුඹ මනාප නම් පහසු කරන්නෙහිය“) |
| ණය පියවීමේ අවස්ථාව උදා කර ගැනීමට | *අල්ලාහුම්ම ඉන්නී අඌදුබික මිනල් හම්මි වල් හසන් වල්අජ්සි වල් කසල් වල් ජුබ්නි වල් බුහුල් වළල් ඉද්දයිනි වගලබතිර්-රිජාල්* (යා අල්ලාහ් දුක දොම්නසින්ද කනස්සල්ලෙන්ද නුඹෙන් ආරක්ෂාව පතමි“ බැරිකම අලසකම නිවටකම මසුරුකම” ණය බර හා මිනිසුන්ගේ බලපෑම් ආදියෙන් ද නුඹේ ආරක්ෂාව පතමි“) |
| වැසිකිළි යන විට | *අල්ලාහුම්ම ඉන්නී අඌදුබික මිනල් කුබසි වල් කබාඉසි* (දෙවියනි” පිරිමි ෂෙයිතාන් හා ගැහැණු ෂෙයිතාන්වරුන්ගේ (හානිවලින්) නුඹේ ආරක්ෂාව පතමි“ |
| කැසිකිලි වැසිකිලිවලින් පිටවන විට | *ගුෆ්රානක* (නුඹෙන් පාප ක්ෂමාව පතමි“) |
| සලාතයේදි සැකයක් පහළ වුවිට | එසේ සැකයක් ඇති කරනුයේ කන්සබ් නමැති ශෛයිතාන්ය“ උගෙන් ආරක්ෂාව ලබා දෙනමෙන් අල්ලාහ් වම්පසට හැරී තුන් වරක් කෙල ගසන්නාක් මෙන් ඉගි කළ යුතුය“ |
| සුජූද්හි | *අල්ලාහුම්මග් ෆිර්ලි දන්බී කුල්ලහු දික්කහු වජිල්ලහු වඅව්වලහු වආඛිරුහු වඅලානියියතහු වසිර්රහු” සුබ්හානක රබ්බී වබි හම්දික අල්ලාහුම්මග්ෆිර්ලි” අල්ලාහුම්ම ඉන්නී අඌදු බිරිළාක මින් ෂකතික වමුආෆියතික මින් උකූබතික වඅඌදුබික මින්ක ලා උහ්සී සනාඅන් අලෙයික අන්ත කමා අස්නයිත අලා නෆ්සික* (යා අල්ලාහ්” මගේ කුදු” මහත්” පෙර” පසු” ප්‍රසිද්ධ හා අප්‍රසිද්ධ සියළු පාපයන් ද ක්ෂමා කරනු මැනව”  යා අල්ලාහ් නුඹව ස්තෝත්‍ර ගයමි“ නුඹව ප්‍රශංසා කරමි“ යා අල්ලාහ් මගේ පාපයන්ට ක්ෂමාව දෙනු මැන“ යා අල්ලාහ්” නුඹේ කෝපයෙන්ද” නුඹේ දඬුවමින් ගැලවුමද නුඹේ තෘප්තිය තුළින් මම ආරක්ෂාව පතමි“ නුඹ විසින් නුඹට ප්‍රශංසා කළා සේ මා ප්‍රශංසා කිරීම සීමා කළ නොහැක“ |
| සජ්දා කරන වැකියක් කියවා සජ්දා කරන විට | *අල්ලාහුම්ම ලක සජත්තු වබික ආමන්තු වලක අස්ලම්තු සජද වජ්හියලිල්ලදි කලකහු වසව්වරහු වෂක්ක ෂම්අහු වබසරහු තබාරකල්ලාහු අහ්සනුල් හාලිකීන්* (යා අල්ලාහ් නුඹ වෙනුවෙන්ම හිස පහත් කළෙමි“ නුඹ නුඹවාම විශ්වාස කරමි නුඹට යටත් වෙමි“ මගේ මුහුණ එය මවා රූපය ලබා දී එහි පෙනීම හා ඇසීම නිර්මාණය කළ ඔහුට හිස පහත් විය“ නිර්මාපකන් අතුරින් අල්ලාහ් උසස් විය“) |
| සලාතය ආරම්භයේ | *අල්ලාහුම්ම බාඉද් බයිනී වබයින කතායාය කමා බාඅත්ත බයිනල් මෂ්රිකි* |

| | |
|---|---|
| (ඉහ්රාම් තක්බීරය හා ෆාතිහාව අතර) | *වල් මග්රිබ් අල්ලාහුම්ම නක්කිනී මින් කතායාය කමා යුනක්කස් සව්බුල් අබ්යළු මිනද් දනස් අල්ලාහුම්මග්සිල්නි බිල් මාඉ වස්සල්ජි වල්බරද්* (යා අල්ලාහ්” නැගෙනහිරට හා බටහිරට කෙසේ දුරක් ඇති කළ හිද එසේම මටත් මගේ වැරදිවලටත් අතර දුරක් ඇති කරනු මැන“ සුදු පැහැති ඇඳුමක් කෙසේ කුණු ඉවත් වී සුදු වෙයි ද එසෙම මගේ පාපයන්ගෙන් මාව පිරිසිදු කරනු මැන“ ජලයෙන් ද පිණිකැට වලින්ද (පිරිසිදු කර) කුණු ඉවත් කරනු මැන“ |
| සලාතය අවසානයේ (අත්තහියියාත්හිදී) | *අල්ලාහුම්ම ඉන්නී ළලම්තු නෆ්සී ශුල්මන් කසීරන් වලා යග්ෆිරුද් දුනූබ ඉල්ලා අන්ත ෆග්ෆිර්ලි මග්ෆිරතන් මින් ඉන්දික වර්හම්නි ඉන්නක අන්තල් ගෆූරුර් රහීම්* (යා අල්ලාහ්” මම මටම අධිකව අසාධාරණ කර ගතිමි“ පව්ක්ෂමා කිරීමට නුඹ හැර වෙනත් අයෙක් නැත“ නුඹ මට පාප ක්ෂමාව දෙනු මැන“ මට පිහිටද වෙනු මැනව“ නියත වශයෙන්ම නුඹමය අධිකව කෂමාව ලබා දී පිහිට ලබා දෙන්නා“) |
| සලාතය අවසන් වූ පසු | *අල්ලාහුම්ම අඉන්නී අලා දික්රික වෂුක්රික වහුස්නි ඉබාදතික“ අල්ලාහුම්ම ඉන්නී අඋඃදුබික මිනල් කුෆ්රි වල් ෆක්රි ව අදාබිල් කබ්ර්“* (යා අල්ලාහ්” නුඹව මෙනෙහි කිරීමටද නුඹට ස්තුති කිරීමට ද නුඹව ලස්සන අයුරින් නැමදුම් කිරීමටත් මට උදව් කරනු මැන“ යා අල්ලාහ් දේව ප්‍රතික්ෂේපය” දුප්පත්කම” කබ්රයෙහි වේදනාව” ආදියෙන් නුඹෙන් ආරකෂාව පතමි“) |
| කවරෙකු හෝ උදව් කළ විට | කෙනෙකුට කවරෙකු මගින් හෝ උදව් ලැබ උදව් කළ අයට ඔහු *ජසාකල්ලාහු* ***කයිරා*** (අල්ලාහ් නුඹට යහඵල ලබා දෙත්වා) යනුවෙන් කීව්ටක එය සම්පූර්ණයෙන් ඔහුට ප්‍රශංසා කළා වෙයි“ මෙය පිළිතුරක් වශයෙන් ඔහු ද *ජසාකල්ලාහු කයිරා* යනුවෙන් කියයි“ |
| වැසි වසිනු දුටු විට | දෙවරක් හෝ තුන්වරක් *අල්ලාහුම්ම සයියිබන් නාෆිආ* (දෙවියනි! මෙම වැස්ස ප්‍රයෝජනවත් එකක් කරනු මැන!) අල්ලාහ්ගේ දයාවෙන් අපට වැසි ලැබී ඇත“ මෙම අවස්ථාවේ අවශ්‍ය ප්‍රාර්ථනා කිරීම වටී“ මන්ද වැස්ස වසින විට කරන ප්‍රාර්ථනා පිළිගැනේ“ |
| තදින් සුළං හමන විට | *අල්ලාහුම්ම ඉන්නී අස්අලුක කයිරහා වකයිර මා ෆීහා වකයිර මා උර්සිලත් බිහී“ ව අඋඃදුබික මින් ෂර්රිහා වෂර්රි මා ෆීහා වෂර්රි මා උර්සිලත් බිහී“* (යා අල්ලාහ්” මෙහි යහපත් දෑ ද මෙහි ඇති යහපත ද එය කුමක් සඳහා එවනු ලැබුවේ ද එහි යහපතද මම නුඹෙන් අසමි“ ඒ වගේම එහි අයහපතද එහි ඇති අයහපතින්ද එය කුමක් සඳහා එවන ලැබුවේද එම අයහපතින් ද මම නුඹෙන් ආරක්ෂාව පතමි“) |
| මුල් හඳ දුටුවහොත | *අල්ලාහුම්ම අහිල්ලහු අලෛයිනා බිල්යුම්නි වල් ඊමාන් වස්සලාමති වල් ඉස්ලාම් හිලාල් කයිරින් වරුෂ්දින් රබ්බී වරබ්බු කල්ලාහ්“* (ප්‍රතිසංස්කරණය” විශ්වාසය ශාන්තිය සමාදානය ආදියෙන් පිරුණ ස්වාභාවයෙන් මෙම පළමු හඳ අපට ඇති කරත්වා මෙය යහපතට හා සෘජු මගට අයත් පළමු හඳයි“ මගේ රක්ෂකයාද නුඹේ රක්ෂකයාද අල්ලාහ්ය“ |
| ගමනක් යන අයෙකු පිටත්කර හැරීමේදී | *අස්තව්දි උල්ලාහ් දීනක වඅමානතක වකවාතීම අමලික“* (නුඹේ ආගමද නුඹේ ප්‍රවේසම් සහිත දෙයද නුඹේ ක්‍රියාවන්ගේ අවසානය ද අල්ලාහ් වෙත ආරක්ෂාවට තබමි“) |
| පිටත්කර යවන්නා බලා ගමන යන්නා | *අස්තව්දි උකුමුල්ලාහල්ලදී ලාතළීඋ වදාඉඋහු“*(කවරෙකු ලග ආරක්ෂාවට තැබුවහොත් ආරක්ෂාව නිෂ්ඵල නොවන්නේද ඔහු ලග ඔබව ආරකෂාවට තබා යන්නෙමි“) |
| ගමනක් යාමේදී | *අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර් අල්ලාහු අක්බර්” සුබ්හානල්ලදී සක්කරලනා හාදා වමා කුන්නා ලහු මුක්රිනීන් ව ඉන්නා ඉලා රබ්බිනා ලමුන්කලිබූන් අල්ලාහුම්ම ඉන්නා නස්අලුක ෆී සෆරිනා හාදා අල් බිර්ර වත්තක්වා වමිනල් අමලි මාතර්ළා අල්ලාහුම්ම හව්වින් අලෛයිනා සෆරනා හාදා වත්ව් අන්නා බුංදහ් අල්ලාහුම්ම අන්තස් සාහිබු ෆිස් සෆරි වල් කලීෆතු ෆිල් අහ්ල් අල්ලාහුම්ම ඉන්නී අඋඃදුබික මින් වඃසා ඉස්සෆරි” වකආබතිල් මන්ළරි වසූඉල් මුන්කලබ්” ෆිල්මාලි වල් අහ්ලි“* (ශක්තිමත් නොවූ අපට මෙය වසග කර දුන් අල්ලාහ්ටම සියළු ප්‍රශංසා හිමි කරමි“ අපි අපේ රක්ෂකයා වෙත නැවත යන්නෙමු“ යා අල්ලාහ් මෙම ගමනේදි යහපත හා බිය බැතිකම නුඹෙන් පතමි“ වතාවත්වලින් නුඹ ප්‍රියමනාප දෙයම පතමු“ යා අල්ලාහ් අපේ ගමන පහසු කර කෙටි කර දෙත්වා“ යා අල්ලාහ් ගමනේදි මගේ මිතුරා නුඹමය“ පවුලේ නියෝජිතයා ද ඔබමය“ යා අල්ලාහ් ගමනේ දුෂ්කරතා හා අසභ්‍ය දර්ශණ වස්තුවේ හා පවුලේ නරක |

| | |
|---|---|
| | සිදුවීම්වලින් ද නුඹෙන් ආරක්ෂාව පතමි“) තවද ආපසු පැමිණෙන විට ඉහත සඳහන් දෑ කියවන අතරම මෙය ද අමතරව කිව යුතුය:- එනම්” ආයිබූන තාඉබූන ආබිදූන ලිරබ්බිනා හාමිදූන් (අල්ලාහ්ට ප්‍රශංසා කරමින් ද ඔහුට නැමදුම් ඉටු කරමින් ද ක්ෂමාව අයැදමින්ද නැවතත් එන්නෙමු“) |
| නිදාගැනීම සඳහා ඇල වන විට | අල්ලාහුම්ම අස්ලම්තු නෆ්සී ඉලෙයික් වෆව්වල්තු අම්රී ඉලෙයික වඅල්ජඃතු ලහ්රී ඉලෛක“ රහ්බතන් වරැග්බතන් ඉලෛක ලා මල්ජ අ වලා මන්ජඅ මින්ක ඉල්ලා ඉලෙයික ආමන්තු බිකිතාබිකල්ලදී අන්සල්ක වබි නබියියි කල්ලදී අර්සල්තත අල්හම්දු ලිල්ලාහිල්ලදී අත් අමනා වසකානා වකෆානා ව ආවානා ෆකම් මිම්මන් ලා කාෆිය ලහු වලා මුඃවිත අල්ලාහුම්ම කිනී අදාබක යව්ම තබ්අසු ඉබාදකත සුබ්හානකල්ලාහුම්ම රබ්බී බික වළඃතු ජන්බී වබික අර්ෆාඋහු ඉන් අම්සක්ත නෆ්සී” ෆග්ෆිර්ලහා වඉන් අර්සල්ත හා පහ්ෆල් හා බිමා තහ්ෆලු බිහී ඉබාදකස් සාලිහීන්“ (යා අල්ලාහ් මගේ ආත්මය නුඹට භාර කරමි“ මගේ ක්‍රියාවන් නුඹට පවරමි“ මගේ පිටකොන්ද නුඹ දෙසට හරවමි“ නුඹේ (දඬුවමට) බියෙන් ද නුඹේ (දයාව) ආසා කරමින් ද මම සිටිමි“ නුඹේ (දඬුවමෙන්) යා යුතු තැන හෝ ආරක්ෂාව ලැබිය යුතු තැන හෝ නුඹ වෙතම මිස වෙනත් නැත“ නුඹ පහළ කළ ආගමද නුඹ දූතයෙකු වශයෙන් එවූ නබිවරයා ද මම විශ්වාස කළෙමි“ අපට ආහාර සපයා පානයද දී අපට ආරක්ෂාව ද ලබා දී අපට අවස්ථාව ලබා දුන් අල්ලාහ්ටම සියලු ප්‍රශංසා කොපමණ දෙනෙක් ආරක්ෂකයෙකු හෝ උදව්කරුවෙකු නොමැතිව සිටි ද“ නුඹේ ගැත්තන්ව නැගිටුවන දවසේ නුඹේ දඬුවමෙන් මාව ආරක්‍ෂා කරනු මැන“ මගේ රක්ෂකයාවූ අල්ලාහ්ට තුති පුද කරමි“ නුඹේ උදව්වෙන් මගේ ඉලය තැබුවෙමි“ නුඹේ උදව්වෙන් එය උස්සමි“ මගේ ආත්මය නුඹ අත්පත් කර ගන්නේ නම් -නින්දට ගිය පසු- එය ක්ෂමා කරනු මැන“ නුඹ එය අත් හරින්නේ නම් -අවදියෙන් පසු- නුඹේ යහපත් ගැත්තන්ව ආරක්ෂා කරන්නාක් මෙන් එයද ආරක්‍ෂා කරනු මැන“) පසුව තම අත් දෙකට පිඹ සූරාඅල් ෆලක්” අන්නාස් ආදිය කියවා දැතින්ම ශරීරය පිරිමැදිය යුතුය“ සෑම රාත්‍රියකම අලිෆ් ලාම් මීම් සජ්දා සූරාව හා තබාරකල්ලදී (අල් මුල්ක්) සූරාව යන දෙක නොකියවා නින්දට නොයා යුතුයි“ |
| සලාතයට පිටව යන විට | අල්ලාහුම්මජ්අල් ෆී කල්බී නූරා වෆී ලිසානී” නූරා වෆී සම්ර් නූරා වෆී බසරී නූරා වමින් ෆව්කී නූරා වමින් තහ්තී නූරා ව අන් යමීනි නූරා වඅන් සිමාලී නූරා“ වමින් අමාමී නූරා වඉන් හල්ෆී නූරා වජ්අල් ෆී නෆ්සී නූරා වඅඃලිම්ලී නූරා වජ්අල්නී නූරා අල්ලාහුම්මඃතිනී නූරා වජ්අල් ෆී අසබී නූරා වෆී ලහ්මී නූරා වෆී දමී නූරා වෆී ෂඃරී නූරා වෆී බසරී නූරා“ (යා අල්ලාහ් මගේ හිතේ ආලෝකය ලබා දෙන මැනවි“ මගේ දිවේ ද මගේ සවනෙහි ද මගේ පෙනුමෙහි ද මට ඉහළින් පහළින් ද මගේ දකුණෙන් ද වමෙන් ද මගේ ඉදිරියෙන් ද පසුපසින් ද ආලෝකය ඇති කරනු මැන“ මට ආලෝකය අධික කරනු මැන“ මට ආලෝකය ලබාදී මාවද ආලෝකවත් කරනු මැන“ මගේ නහරවල ද” මාංශවල ද රුධිරයේ ද කෙස්වල ද ශරීරයේ ද ආලෝකය ඇති කරනු මැන“) |
| ඉස්තිකාරාහි පැතුම“ (අනිවාර්ය නොවූ රක්අත් දෙකක් නෆිල් සලාතය කර මෙම පැතුම කියවහි“ | එනම්:- අල්ලාහුම්ම අස්තකීරු බිඉල්මික වඅස්තක්දිරුක වඅස්ලුක මින් වළ්ලික“ ෆඉන්නක තක්දිරු වලා අක්දිරු වතඃලමු වලා අඃලමු වඅන්ත අල්ලාමුල් ගුයූබ් අල්ලාහුම්ම ෆඉන් කුන්ත තඃලමු - කරුණ ගැන සිතා - අන්න හාදල් අම්ර කයිරුන් ලී ෆී දීනී වමආෂී වආකිබති අම්රී ෆක්දුර්හු ලී වයස්සිර්හු ලී සුම්ම බාරික් ලී ෆීහි වඉන් කුන්ත තඃලමු අන්න හාදල් අමර ෂර්රුන් ලී ෆී දීනී“ වමආෂී ව ආකිබති අම්රී ෆස්රිෆ්හු අන්නී වස්රිෆ්නී අන්හු වක්දුර් ලී අල් කයිර හයිසු කාන සුම්ම රළ්ලිනී බිහී“ යා අල්ලාහ් ඔබේ ඥානයෙන් මම යහපත පතමි“ ඔබේ බලයෙන් ශක්තිය පතන්නෙමි“ ඔබේ භාග්‍යය අයැද සිටින්නෙමි“ එබැවින් ඔබ බලවත්ය“ මම බලවත් නොවෙමි“ තවද නුඹ ගුප්ත දෑ සියල්ල දන්නාය“ යා අල්ලාහ් මෙම කටයුත්ත දහමේ ද මගේ ජීවිතයේද මගේ අවසානයේද යහපතක් වෙයි නම් එය මට පිළියෙල කරනු මැන“ පසුව එහි මට අභිවෘද්ධිය ඇති කරනු මැන“ මෙම කරුණ මගේ දහමේද මගේ ජීවිතයේද මගේ අවසානයේද මෙලොවද පරලොවද නරකක් වෙයිනම් එය මගෙන් හරවනු මැන“ මට යහපත පිළියෙල කරනු මැන“ පසුව එය පිළිගැනීම සලස්වනු මැන“ |
| නබි තුමා | යා අල්ලාහ්” නරක අවසානය භාග්‍යයෙන් තොර ස්වභාවය අප දුක්වන විට සතුරන් |

| | |
|---|---|
| ප්‍රාර්ථනා කළ සාර්ථක ප්‍රාර්ථනාවන් තුළ ඇති සමහර අදහස් | සතුටුවීම” තදබල වේදනාවන් ආදියෙන් නුඹෙන් ආරකෂාව පතමි“ යා අල්ලාහ්” මා සැබැවින් කළ පාපයන්” සමච්ජලයට කළ පාපයන් වැරදීමකින් කළ පාපයන් සියලුම පාපයන් මා ලග ඇති ඒවාය“ යා අල්ලාහ් මා පෙර කළ පව්” පසුව කළ පාපයන් රහසේ කළ පාපයන්” ප්‍රසිද්ධියේ කළ පාපයන් මට වඩා නුඹ දැනගත් පාපයන් සියල්ල ක්ෂමා කරනු මැන“ පෙරට යවන්නේත් නුඹය“ පසු කරන්නනේත් නුඹය“ නුඹ සියල්ල කෙරෙහි ශක්තිය ඇත්තාය“ යා අල්ලාහ්” මගේ සියළු කාර්යයන්ගේ ආරක්ෂාව වු මගේ දහම පෙළ ගස්වනු මැන“ මා ජීවත්වන මෙලොව සාර්ථක කර දෙන මැන“ මා නැවත යා යුතු පරලොවද සාර්ථක කරනු මැන මගේ මරණය සියලු ආපදාවලින් තොර එකක් කරනු මැන“ යා අල්ලාහ් මගේ ආත්මයේ බිය ඇති කරනු මැන“ එය ශුද්ධ පවිත්‍ර කරනු මැන“ එය පිරිසිදු කළ අයගෙන් නුඹ ඉතා අනර්ඝය“ තවද එහි වග කිව යුත්තා ද භාර කාරයාද ඔබය“ එහි ස්වාමියා ද ඔබයි“ යා අල්ලාහ්” ප්‍රයෝජනයෙන් තොර අධ්‍යාපනයෙන්ද බියෙන් තොර සිතෙන්ද කුස නොපිරෙන ආශාවෙන් ද පිළිනොගන්නා ප්‍රාර්ථනාවන්ගෙන්ද නුඹෙන් ආරකෂාව පතමි“ යා අල්ලාහ් නුඹේ දයාව නොමැතිවීම නිරෝගි කම නැති වීම නුඹේ පරිකෂණය හදීසියේ පැමිණිම වැනි නුඹේ කෝපයන්ගෙන් ආරකෂාව පතමි“ |

# ලාභ ගෙන දෙන වෙළඳාම

අල්ලාහ් සෑම මැවීමකටම වඩා මිනිසාව වැදගත් අන්දමින් මැව්වේය“ ඔහුට දිවක් දී එයින් කතා කළ හැකි හැකියාවක් ලබා දුන්නේය“ දිව වනාහි හොඳ නරක දෙකටම භාවිතා කළ හැක්කකි“ එය කවරෙකු යහපතට භාවිතා කරයි ද ඔහුට මෙලොව සතුට හා පරලොව ස්වර්ගයේ උසස් තත්ත්වයන් එය ලබා දෙයි“ එසේ නොමැතිව එය අයහපතට කවරෙකු භාවිතා කරයි ද ඔහුට දෙලොවෙහිම විනාශයන් ළඟා කර දෙන අතර කාලයෙන් එය හොඳ ක්‍රියාවන්හි යෙදවිය හැක්කේ අල්-කුර්ආනය කියවීම හා අල්ලාහ්ට 'දික්ර්' කිරීමෙහි යෙදවීමය“ අල්ලාහ් දික්ර් කිරීම පිළිබඳව බොහෝ හදීස් ඇත“ ඒවායින් සමහරක් මෙසේය“

✷නුඹලාගේ වත්පිළිවෙත්වලින් වැදගත් වූත් නුඹලාගේ දෙවියන් ලඟ ඉතා සුවිශුද්ධවූත් නුඹලාගේ තත්ත්වයෙන් උසස් කළ හැකිවූත් රන්“ රිදී වියදම් කරනවාටත් වඩා අගනාවූත් නුඹලාගේ සතුරන්ව නුඹලා සටන් බිමේ මුණ ගැසී එවුන් විසින් නුඹලාව ඝාතනය කිරීමටත් නුඹලා අතින් ඔවුන් ඝාතනය වීමටත් වඩා වැදගත්වූ දෙයක් නුඹලාට කියා දෙන්නදැ? යි නබිතුමාණන් ඇසූවිට 'ඔව්' කියා දෙන්න නබිතුමනි“ යැයි ඔවුන් පිළිතුරු දුන්විට 'අල්ලාහ්ව මෙනෙහි (දික්ර්) කිරීමයැ යි පැවසුහ“ (තිර්මිදි)

✷අල්ලාහ්ව සිහි කරන්නාත් ඔහුව සිහි නොකරන්නාක් පන ඇති තැනැත්තා හා මිය ගිය තැනැත්තා වැනිය“ (බුහාරි,මුස්ලිම්)

✷අල්ලාහ් ප්‍රකාශ කරන බව නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ කීහ“ 'මගේ ගැත්තා මා ගැන සිතන ආකාරයෙන්ම මම (ඔහු ගැන සිතන විෂයෙහි) කටයුතු කරමි“ ඔහුගේ සිතේ මා ගැන සිතයි නම් මම ද මගේ සිතේ ඔහු ගැන සිතමි“ ඔහු පිරිසක් අතර මාව සිතයි නම් ඊට වඩා විශාල පිරිසක් සමග ඔහු ගැන සිතමි“ ඔහු මාවෙත වියතක් ළංවෙයි නම් මම ඔහු වෙතට රියනක් ළංවෙමි“( බුහාරි)

✷මුෆර්රිදුන්වරු කළින් ගියහැයි නබිතුමාණෝ කීහ“ එවිට ඔවුහු කවරෙහුදැ යි සහබාවරු ඇසූහ“ එවිට නබි තුමාණෝ අල්ලාහ්ව මෙනෙහි (දික්ර්) කරන ගැහැණු හා පිරිමි' යි පිළිතුරු දුන්හ“ (මුස්ලිම්)

✷නබි තුමාණෝ තම මිත්‍රයෙකුට පැවසුවෙය. නුඹගේ දිව දික්රයේ ගිලාතබාගනු. (තිර්මිදි)

**ප්‍රතිඵල අධික ගුණයකින් ලබා ගැනීම** :- කුර්ආනය කියවීමට ප්‍රතිඵල අධික ගුණයෙන් ලැබෙන්නාක් මෙන් අනෙක් වත්පිළිවෙත් වලටද සිතේ විශ්වාසය“ සිතේ පවිත්‍රතාව“ අල්ලාහ් මත තබා ඇති ආදරය වැනි දේවල්වල ප්‍රමාණය අනුව ප්‍රතිඵලවල ගුණය වැඩි කෙරේ“ ඒ වගේම දිවෙන් දික්ර් කිරීම පමණක් නොව සිතෙන් මෙනෙහි කිරීමට ද විපාක දෙගුණයක් හිමි වේ“

මෙම තත්ත්වය සම්පූර්ණ වන විට අල්ලාහ් එම ගැත්තාගේ පාපයන් සම්පූර්ණයෙන් ක්ෂමාකර ප්‍රතිඵල ද සම්පූර්ණයෙන් ලබා දෙන්නේය“ තවද මෙය සම්පූර්ණ නොවන විට ඉහත සඳහන් අනෙක් දේවල් ද අසම්පූර්ණ ලෙසම හිමිවෙයි“

**අල්ලාහ්ව දික්ර් කිරීමෙන් අත්වෙන ප්‍රයෝජන** :-

❖ අල්ලාහ්ගේ ආදරය හා ඔහු කෙරෙහි සමීපතාවද ඇති කරයි“ තවද ඔහු කෙරෙහි ගෞරවය ද ඔහු තමා දෙස බලා සිටී යන හැඟීම ද ඇති කරයි“ මිනිසා නිවැරදි වී ඔහු වෙත යොමුවීමටත් ඔහුට අවනත වී වත්පිළිවෙත් ඉටු කිරීමටත් උපකාරවෙයි“

❖ ශෝකය නැතිකර සතුට හා සිතේ පවිත්‍රතාව හා එඩිතරකම ඇති කරවයි“

❖ සිතේ එක්තරා හිස්බවක් ඇත“ එය පිරවිය හැක්කේ දික්ර් කිරීමෙන් පමණකි“

❖ දික්ර් මගින් සිතේ ඇති රෝග ඉවත් වී එය පිරිසිදු වන අතර වෙන කිසිවක් මගින් ලබා ගත නොහැකි එක්තරා සතුටක්ද සිතට දැනේ“ එසේ නැතුව අල්ලාහ් පිළිබඳ මෙනෙහි කිරීමෙන් තොර වීම මානසික රෝගයන්ට එක් ලක්ෂණයකි“

❖ යමෙක් යම් දෙයක් ගැන ප්‍රිය වන්නේ නම් ඔහු ඒ පිළිබඳව අධිකව සිතන්නා සේ දික්ර් මගින් අල්ලාහ් පිළිබඳව සීමා රහිත ආදරය මතු වෙන්නේය“ තවද දික්ර් කිරීම අඩුවීම කුහක කමේ ලක්ෂණයකි“

❖ ගැත්තෙක් තමා සරු කාලයක අල්ලාහ්ව මෙනෙහි කරයි නම් ඔහුට යම් දුෂ්කරතාවක් ඇති වූ විටක අල්ලාහ් ඔහුව සිහි කරයි“

❖ අල්ලාහ්ගේ වේදනාවෙන් ආරක්ෂාවීමටත්“ සකීනත් නැමැති මානසික තැන්පත්කම ඇතිවීමටත් සන්සුන් පරිසරයක් නිර්මාණය වීමටත් අල්ලාහ්ගේ ආදරය හා මලක්වරුන්ගේ පාපක්ෂමාව සඳහා කරන ප්‍රාර්ථනාවන්ට හිමිකරුවෙක් වීමටත් එය උපකාර වන්නේය“

❖ ඔපාදූප කීම“ කේලම් කීම“ බොරු හා අනවශ්‍ය කථාවලින් දිව ආරක්ෂාවීමට දික්ර් හේතුවක් වන්නේය“

❖ දික්ර් කිරීම වත්පිළිවෙත්වලින් අගනා එකක් වන අතර දිවට ඉතා පහසු කුසල් දවන්නේය“ තවද කරනු ලබන දික්ර්වල ප්‍රමාණයට ස්වර්ගයේ ගස් සිට වන්නේය“

❖ දික්ර් ලෝකය තුළද සොහොන් ගැබේද පරලොවෙහිද එය කළ තැනැත්තාට ආලෝකය ලබා දෙයි“ තවද ඔහුට සතුට ද මුහුණේ දිස්නයද ගෞරවයද ඇති කරන්නේය“

❖ දික්ර් මගින් අල්ලාහ්ගේ පාපක්ෂමාව ද මලක්වරුන්ගේ ප්‍රාර්ථනය ද ලැබෙයි“ තවද දික්ර් කරන අය ගැන අල්ලාහ් මලක්වරුන් අතර ප්‍රශංසා කරයි“

❖ කුසල් කරන්නන් අතර උතුම් වන්නේ එයත් සමඟ දික්ර් කරන්නාය“ උපවාසය රකින්නන් අතර උතුම් වන්නේ උපවාසය සමඟ දික්ර් කරන අය වන්නෝය“

❖ දික්ර් දුෂ්කරතා පහසු කරයි“ තවද සැප පහසුකම් වැඩිකර ශරීරය ශක්තිමත් කරයි“

**සටහන:-** ඉබ්නු තෙයිමියා (රහ්මතුල්ලාහි අලෙයිහි) තුමා පහත සඳහන් පරිදි කියයි“ මත්සයාට ජලය කොතරම් අත්‍යවශ්‍යද සිතට දික්ර් එසේම අවශ්‍ය වන්නේය“ මත්සයා ජලයෙන් මතුපිටට ගත් විට ඌට කුමක් වෙයි ද?

## උදේ සවස දිනපතා කියවිය යුතු ප්‍රාර්ථනා

| | පාරායනා කළයුතු දුආවන් | පාරායනා කළයුතු වෙලාවන් | ඵල ප්‍රයෝජණ හා මහිමයන් |
|---|---|---|---|
| 1 | ආයතුල් කුර්සි [1] | **අනිවාර්ය සලාතයන්ට පසුව උදේ සවස හා නින්දට පෙර** | ෂෛතාන් ළං නොවෙයි. ස්වර්ගයට යාමට හේතු වෙයි. |
| 2 | සූරා බකරාවෙ අවසාන ආයත් දෙක [2] | **සවස හෝ නිදාගැනීමට පෙර වරක්** | සියළුම ආපදාවන්ගෙන් ආරක්ෂාව |
| 3 | ඉඛ්ලාස්“ ෆලක්“ අන්නාස් ආදි සූරාවන් පාරායනය කිරීම | **උදේ සවස 3 වරක්** | සියල්ලට ප්‍රමාණවත්ය |
| 4 | බිස්මිල්ලාහිල්ලදී ලා යළුර්රු ම අස්මිහි ෂෛඋන් ෆිල් | **උදේ සවස 3** | හදිසි ආපදාවන් හෝ |

[1] ﴿ اللَّهُ لَا إِلَٰهَ إِلَّا هُوَ الْحَيُّ الْقَيُّومُ ۚ لَا تَأْخُذُهُ سِنَةٌ وَلَا نَوْمٌ ۚ لَّهُ مَا فِي السَّمَاوَاتِ وَمَا فِي الْأَرْضِ ۗ مَن ذَا الَّذِي يَشْفَعُ عِندَهُ إِلَّا بِإِذْنِهِ ۚ يَعْلَمُ مَا بَيْنَ أَيْدِيهِمْ وَمَا خَلْفَهُمْ ۖ وَلَا يُحِيطُونَ بِشَيْءٍ مِّنْ عِلْمِهِ إِلَّا بِمَا شَاءَ ۚ وَسِعَ كُرْسِيُّهُ السَّمَاوَاتِ وَالْأَرْضَ ۖ وَلَا يَئُودُهُ حِفْظُهُمَا ۚ وَهُوَ الْعَلِيُّ الْعَظِيمُ ﴾

අල්ලාහු ලා ඉලාහ ඉල්ලා හුවල් හය්යුල් කය්යූම් ලා තඃහුදුහු සිනතුන් වලානව්ම්“ ලහු මා ෆිස්සමාවාති වමා ෆිල්අර්ල් මන්දල්ලදී යෂ්ෆඋ ඉන්දහු ඉල්ලා බිඉද්නිහි යඃලමු මාබයින අය්දීහිම් වමා කල්ෆහුම් වලායුහීතූන බිෂෙයිඉන් මින් ඉල්මිහි ඉල්ලා බිමාෂාඅ වසිඅ කුර්ෂියියුහුස් සමාවාති වල් අර්ළ් වලායඌදුහු හිෆ්ළුහුමා වහුවල් අලියියුල් අළීම්

[2] ﴿ آمَنَ الرَّسُولُ بِمَا أُنزِلَ إِلَيْهِ مِن رَّبِّهِ وَالْمُؤْمِنُونَ ۚ كُلٌّ آمَنَ بِاللَّهِ وَمَلَائِكَتِهِ وَكُتُبِهِ وَرُسُلِهِ لَا نُفَرِّقُ بَيْنَ أَحَدٍ مِّن رُّسُلِهِ ۚ وَقَالُوا سَمِعْنَا وَأَطَعْنَا ۖ غُفْرَانَكَ رَبَّنَا وَإِلَيْكَ الْمَصِيرُ ﴿٢٨٥﴾ لَا يُكَلِّفُ اللَّهُ نَفْسًا إِلَّا وُسْعَهَا ۚ لَهَا مَا كَسَبَتْ وَعَلَيْهَا مَا اكْتَسَبَتْ ۗ رَبَّنَا لَا تُؤَاخِذْنَا إِن نَّسِينَا أَوْ أَخْطَأْنَا ۚ رَبَّنَا وَلَا تَحْمِلْ عَلَيْنَا إِصْرًا كَمَا حَمَلْتَهُ عَلَى الَّذِينَ مِن قَبْلِنَا ۚ رَبَّنَا وَلَا تُحَمِّلْنَا مَا لَا طَاقَةَ لَنَا بِهِ ۖ وَاعْفُ عَنَّا وَاغْفِرْ لَنَا وَارْحَمْنَا ۚ أَنتَ مَوْلَانَا فَانصُرْنَا عَلَى الْقَوْمِ الْكَافِرِينَ ﴾

ආමනර් රසූලු බිමා උන්දිල ඉලෙයිහි මිර්රබ්බිහි වල් මුඃමිනූන් කුල්ලුන් ආමන බිල්ලාහි වමලා ඉකතිහි වකුතුබිහි වරුසුලිහ් ලා නුෆර්රිකු බයින අහදින් මිර්රුස්ලිහ් වකාලූ සමිඃනා වඅතඃනා ගුෆ්රානක රබ්බනා ව ඉලෙයිකල් මසීර් ලා යුකල්ලිෆුල්ලාහු නෆ්සන් ඉල්ලා වුස්අහා ලහා මා කසබත් ව අලෙයිහා මක්තසබත්“ රබ්බනා ලාතුආකිද්නා ඉන්නසීනා අව් අක්තඃනා රබ්බනා වලා තහ්මිල් අලෙයිනා ඉස්රන් කමා හමල්තහු අලල්ල දීන මින් කබ්ලිනා රබ්බනා වලා තුහම්මිල්නා මාලා තාකතලනා බිහ් වඃෆුඅන්නා වග්ෆිර්ලනා වර්හම්නා අන්ත මව්ලානා ෆන්සුර්නා අලල් කව්මිල් කාෆිරීන්

| | | | |
|---|---|---|---|
| | *අර්ළි වලා ෆිස්සමා ඉ වහුවස් සමීඋල් අලීම්* (අල්ලාහ්ගේ නාමයෙන් මම (ආරම්භ කරමි) ඔහුගේ නාමයත් සමග භූමියේ හෝ අහසේ හෝ කිසිම දෙයක් අනතුරක් නොකරයි" ඔහු සියල්ල එක්කරන" දන්න අයෙකි" | **වරක්** | වෙනත් ආගාදාවක් හෝ සිදුනොවේ. |
| 5 | *අඋෟදු බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ෂර්රි මා හලක්"* (අල්ලාහ්ගේ සම්පූර්ණ වදන් මගින් ඔහු මැවූ සියලු මැවීම්වල අනතුරුවලින් මම ආරක්ෂාව පතමි. | **උදේ සවස 3 වරක් හා යම්තැනක නවාතැන් ගන්නා විට :-** | බියන තැන්වල ආපදාවන්ගෙන් ආරක්ෂාව |
| 6 | *බිස්මිල්ලාහි තවක්කල්තු අලල්ලාහි ලාහව්ල වලා කුව්වත ඉල්ලාහ් බිල්ලාහ්* (අල්ලාහ් මත විශ්වාසය තැබුවෙකු ලෙස ඔහුගේ නම කියා -පිටවෙමි"- යහපත කිරීමට හෝ අයහපතින් වැළකීමට හෝ අල්ලාහ්ගේ උපකාරය නොමැතිව කිසිම හැකියාවක් නොමැත. | **නිවසෙන් පිටවෙන විට** | ආපසු එන තෙක් අල්ලාහ්ගේ ආරක්ෂාව |
| 7 | *හස්බියල්ලාහු ලා ඉලාහ ඉල්ලා හුව අලෙයිහි තවක්කල්තු වහුව රබ්බුල් අර්ෂිල් අලීම්"* (අල්ලාහ් මට ප්‍රමාණවත්ය" ඔහු මතම මම භාර කරමි" ඔහු ගෞරවාන්විත අර්ෂ්හි දෙවියාය") | **උදේ සවස 7 වරක්** | දෙලොව දුක ශෝබය අල්ලාහ් ඉවත් කරයි. |
| 8 | *රළීතු බිල්ලාහි රබ්බන් වබිල් ඉස්ලාමි දීනන් වබි මුහම්මදින නබිය්යන් වරසූලා* (මම අල්ලාහ්ව දෙවියෙකු ලෙස ද ඉස්ලාමය දහම ලෙස ද මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් නබි වරයෙකු හා දූතයෙකු ලෙස ද පිළි ගතිමි") | **උදේ සවස 3 වරක්** | කියවන්නා සතුටු කරවීම අල්ලාහ්ගේ වගකීමය" |
| 9 | උදේ :- *අල්ලාහුම්ම බික අස්බහ්නා වබික අම්සෙයිනා වබික නහ්යා වබික නමූතු වඉලෙකන් නුෂූර්*<br>සවස:- *අල්ලාහුම්ම බික අම්සෙයිනා වබික අස්බහ්නා වික නහ්යා වබික නමූතු ව ඉලෙයිකල් මසීර්*<br>(යා අල්ලාහ් නුඹ නිසාම අපි උදෑසනට පිවිසියෙමු" නුඹ නිසාම සවස් කාලයටද පිවිසියෙමු" තවද නුඹ නිසාම අපි ජීවත් වෙමු" නුඹ නිසා අපි මරණයට පත් වන්නෙමු" තවද අපි නැගිට්ටුවා ඒකරාශි වන්නේද නුඹ වෙතය") | **උදේ සවස** | කියවන ලෙස දිරිගන්වා ඇත" |
| 10 | *අස්බහ්නා අලා ෆිත්රතිල් ඉස්ලාම් වකලිමතිල් ඉක්ලාස් වදීනි නබිය්යිනා මුහම්මදින් (වමිල්ලති අබීනා ඉබ්‍රාහීම් (අලෛ) හනීෆන් මුස්ලිමන් වමා අන මිනල් මුෂ්රිකීන්* (අපි ඉස්ලාම් දහමද ඒකීයත්වයේ කලිමාවද අපේ නබි මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමන්ගේ දහම ද අපේ පියා වූ ඉබ්‍රාහිම් (අලෙයිහිස් සලාම්) තුමාගේ දහමද පිළිගත් අය ලෙස උදයට පිවිසුනෙමු" එතුමා (ඉබ්‍රාහිම්තුමා) දහම කරා යොමුවුවෙකු ලෙස සිටියේය" ඔහු ආදේශ කරන්නෙකු ලෙස සිටියේ නැත. | **උදේට එක් වරක්** | නබි තුමන් කියවා ඇත. |
| 11 | *අල්ලාහුම්ම මා අස්බහ බී මින් නිඃමතින් අව් බිඅහදින් මින් හල්කික ෆමින්ක වහ්දක" ලාෂරීක ලක ෆලකල් හම්දු වලකල් සුක්ර්*<br>(සවස)*අල්ලාහුම් මා අම්සා බී මින්නිඃමතින් අව් ෆී අහදින්* ' """""""""<br>යනුවෙන් මුල් වැකි වෙනස් කර කියවිය යුතුයි" යා අල්ලාහ් මෙම උදෑසන මා කෙරෙහි හෝ නැත්නම් නුඹේ මැවීම්වලින් එකකු මත හෝ නුඹ දයාව පහළ කළේ නම් එය නුඹෙන් පහළ වුවකි" නුඹ තනි කඩයෙකි" නුඹට සමානයෙක් නොමැත" සියලු ප්‍රශංසා නුඹටය" සියලු ස්තුතිය නුඹටම අයත්ය. | **උදෑසන 1 වරක්** | දිවා රාත්‍රියේ අල්ලාහ් ස්තුති කළාට සමානය |
| 12 | *අල්ලාහුම්ම ෆාතිරස් සමාවාති වල් අර්ළි ආලිමල් ගයිබ් වෂ්-ෂහාදති රබ්බ කුල්ලි ෂෙයිඉන් වමලීකහු අෂ්හදු අන්ලා ඉලාහ ඉල්ලා අන්ත අඋෟදු බික මින් ෂර්රි නෆ්සි වමින් ෂර්රිෂ් ෂෙයිතානි වෂිර්කිහි"* (යා අල්ලාහ් අහස් හා පොළොවේ මැවුම් කරුවාණනි" එළිපිට හා සැගවුන | **උදේ සවස හා නිදා ගැනීමට පෙර 1 වරක්** | ෂෛතාන්ගේ අනවශ්‍ය සැකයන්ගෙන් ආරක්ෂාව |

| | | | |
|---|---|---|---|
| | සියල්ල ඔබ දනී" සෑම දෙයකම රක්ෂකයා හා හිමි කරුවාණනි" නැමදුමට සුදුසු දෙවියා නුඹ හැර වෙනත් කෙනෙකු නැතැ යි මම සාක්ෂි දරමි" මගේ සිතේ ආපදාවන්ගෙන්ද ෂෛතාන්ගේ ආපදාවන්ගෙන්ද ඔහුට සම කිරීමෙන්ද නුඹෙන් ආරක්ෂාව පතමි. | | |
| 13 | අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් හම්මි වල් හඳන් ව අඌදුබික මිනල් අජ්ඳි වල් කසල් වඅඌදු බික මිනල් ජුබ්නි වල්බුඛ්ල් වඅඌදු බික මින් ඝලබතිද් දයිනි වකහ්රිර් රිජාල් (යා අල්ලාහ් දුක ශෝකයෙන්ද කණස්සල්ලෙන්ද නුඹෙන් ආරක්ෂාව පතමි" බැරිකම හා අලසකම ආදියෙන්ද නුඹෙන් ආරක්ෂාව පතමි" තවද නිවටකම" මසුරුකම ණය බර මිනිසුන්ගේ බලපෑම් ආදියෙන් ද නුඹේ ආරක්ෂාව පතමි. | උදේ සවස 1 වරක් | දුක ශෝකය ඉවත්වී යයි තවද ණය පිය වීමට මග සැලසෙයි" |
| 14 | අල්ලාහුම්ම අන්ත රබ්බී ලා ඉලාහ ඉල්ලා අන්ත කලක්තනී වඅන අබ්දුක ව අන අලා අහ්දික වවඃදික මස්තතඃතු අඌදුබික මින් ෂර්රි මා සනඃතු අබූඋ ලක බිනිඃමතික අලෙයිය වඅබූඋ ලක බදන්බී ෆග්ෆිර්ලි ෆ ඉන්නහු ලයග්ෆිරුද් දුනුබ ඉල්ලා අන්ත" (යා අල්ලාහ් නුඹමය මගේ රක්ෂකයා නුඹ හැර වෙනත් දෙවියෙක් නැත" නුඹ මා මැව්වේය" මා නුඹේ ගැත්තාය" තවද හැකි පමණින්" මා නුඹට දුන් ප්‍රතිඥාව හා පොරොන්දුව අනුව මා ස්ථාවරව සිටිමි" මම කළ දැවලින් අයහපත් දේවල් ගැන නුඹෙන් ආරක්ෂාව පතමි" නුඹ මට පහළ කළ දායාදයන් පිළිගනිමි" මට ක්ෂමා කර දයාව පහළ කරනු මැන" පාප ක්ෂමා කරන්නා නුඹ හැර වෙන කිසිවෙක් නොමැත. | උදේ සවස 1 වරක් ඉස්තිග්ෆාර්හි ප්‍රධානතම ඉස්තිග්ෆාරය | යම් කෙනෙක් සම්පූර්ණ විශ්වාසයෙන් යුතුව දිවා කාලයේ කියවා එම දවාලේම හෝ රාත්‍රිකාලයේ සම්පූර්ණ විශ්වාසයෙන් යුතුව කියවා එම රාත්‍රියේ මිය ගියේ නම් ඔහුට ස්වර්ගය හිමි වන්නේය. |
| 15 | යා හය්යු යාකය්යුම් බිරහ්මතික අස්තගීස් අස්ලිහ් ලී ෂඃනී කුල්ලහ් වලාතකිල්නී ඉලා නෆ්සී තර්ෆත අයිනින ('ජීවකයාණනි" තමා මතම පිහිටා ස්ථාවරම සිටින නුඹ නුඹේ දයාවේ නාමයෙන් නුඹෙන් උදව් පතමි" මගේ කටයුතු සියල්ල පෙලගස්වා දෙනු මැන" එක මොහොතක් හෝ මාව මගේ වගකීම යටතට භාර නොදෙනු මැන") | උදේ සවස 1 වරක් | නබිතුමාණන් තම දුව ෆාතිමා (රළියල්ලාහු අන්හා) තුමියට කියවීමට ඉගැන්වූ පැතුම වේ. |
| 16 | අල්ලාහුම්ම ආෆිනී ෆී බදනී අල්ලාහුම් ආෆිනී ෆී සම්ඊ" අල්ලාහුම්ම ආෆිනී ෆී බසරී අල්ලාහුම්ම ඉන්නී අඌදුබික මිනල් කුෆ්රි වල්ෆක්ර්" අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් අදාබික කබ්ර් ලා ඉලාහ ඉල්ලා අන්ත" (යා අල්ලාහ් මගේ ශරීරයේද" මගේ ශ්‍රවනයේද" මගේ බැල්මේද" මට සුවය දෙනු මැන" නැමදුමට සුදුසුස්සා නුඹ හැර අන් කිසිවෙකු නැත" යා අල්ලාහ් දේව ප්‍රතික්ෂේපයෙන් ද සාගතයෙන්ද නුඹෙන් ආරක්ෂාව පතමි" තවද කබ්ර් (මිණීවලේ) වේදනාවෙන් ද නුඹෙන් ආරක්ෂාව පතමි") | උදේ සවස 03 වරක් | නබිතුමාණෝ මෙය කියවා ඇත්තාහ" |
| 17 | ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලාෂරීකලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලාකුල්ලි ෂෙයිඉන් කදීර් (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැත" ඔහු තනිකඩය" ඔහුට ආදේශයක් නැත" පාලන බලතල සියල්ල ඔහුටය" ඔහු සියල්ල කෙරෙහි බලය ඇත්තාය") | උදේ සවස 10 වරක් | වහලෙකු නිදහස් කළාට සමාන වෙයි" පින් 10ක් ලියවෙයි" පව් 10ක් මකාලයි" තත්ත්වයන් 10ක් උසස් කරයි" ෂෛතාන්ගෙන් ආරක්ෂා කරයි" |
| 18 | සුබ්හානල්ලාහි වබිහම්දි හි අදද කල්කිහි වරිළා නෆ්සිහි වසිනත අර්ෂිහි වමිදාද කලිමාතිහි" (අල්ලාහ්ගේ මැවීම්වල සංඛ්‍යාව තරම් වු ද ඔහුගේ සතුටේ ප්‍රමාණයටද ඔහුගේ අර්ෂ්හි බරට සමාන වූද ඔහුගේ වදන්හි ප්‍රමාණයටද මම ඔහුට ප්‍රශංසා කර සුවිශුද්ධ කරමි") | උදේ සවස 3 වරක් | උදේ සිට දවල් දක්වා දෙවියන් 'දික්ර්' කරනවා වඩා අගනා ය. |

# අධික වශයෙන් යහපත ලඟා කර දෙන වදන් හා කුසල්

| | යහා විපාකයන් හිමිවන වදන් හා ක්‍රියාවන් | ඒ හා සම්බන්ධ හදීසයන්, කුසල් හා මහිමයන් |
|---|---|---|
| 1 | “ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුවඅලා කුල්ලිෂෛයිඉන් කදීර් (නැමදුමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැත“ ඔහු තනිකඩයෙකි“ ඔහුට ආදේශයක් නැත“ පාලනය ඔහු සතුය“ ප්‍රශංසා ඔහුටමය“ සෑම දෙයක් කෙරෙහිම ඔහු බලවත්ය“) | මහිමය: කවරෙක් මෙය දවසකට 100 වරක් කියවන්නේ ද ඔහු වහලුන් දස දෙනකුට නිදහස ලබා දුන් අයෙකුට සමාන වන්නේය“ තවද ඔහුට කුසල් 100 ක් සටහන් කර අකුසල් 100ක් ක්ෂමා කර මකා දැමෙයි“ එදින සවස දක්වා ඔහුට ෂෙයිතාන්ගෙන් ආරක්‍ෂාව සැලසෙයි“ මොහුට වඩා වැඩි වාර ගණනක් කියන අයෙකු මිස වෙන කිසිවෙකුට ඔහුව අභිබවා යා නොහැක“ |
| 2 | “සුබ්හානල්ලාහි වල්හම්දු ලිල්ලාහි වලා ඉලාහ ඉල්ලල්ලාහු වල්ලාහු අක්බර් වලා හව්ල වලාකුව්වත ඉල්ලාහ් බිල්ලාහ්“ (මම අල්ලාහ්ට තුති පදම්“ ප්‍රශංසාව ඔහුටය“ නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙක් නොමැත“ අල්ලාහ් ඉතා ශ්‍රේෂ්ඨය“) | මහිමය: මම විශ්ව තරණය කළ රාත්‍රියේ නබි ඉබ්‍රාහිම් (අලෛයිහිස් සලාම්) තුමාව මුණ ගැසුනෙමි“ එවිට එතුමා මුහම්මද් ඔබේ සමූහයාට මගේ සලාම් කියන්න“ තවද ස්වර්ගයේ පස සුගඳය” එහි වතුර ඉතා මදුරය“ එය විශාල පොළොවක් බවත් එහි ගස් (සුබ්හානල්ලාහි වල් හම්දුලිල්ලාහි වලාඉලාහ ඉල්ලල්ලාහු වල්ලාහු අක්බර් වලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ්) ආදිය බවද කියන්නැ’යි කීහ“ |
| 3 | “සුබ්හානල්ලාහි වබිහම්දිහි සුබ්හානල්ලාහිල් අලීම් | මහිමය: කවරෙකු සුබ්හානල්ලාහි වබිහම්දිහි යනුවෙන් උදේ හා සවස 100 වරක් කියවන්නේද විනිශ්වය දිනයේ මොහුගේ පාපයන් මුහුදු පෙන තරම් තිබුණද සියල්ල ක්ෂමා කරන්නේය“ මෙය පැවසු අයෙකු හැර අන්කිසිවෙක් මොහුට වඩා කුසල් වලින් අබිබවා යා නොහැක“ දිවට ඉතා පහසු වූ ද මීසාන් තරාදියේ බර වැඩිවූ ද රහ්මාන්ට ඉතා ප්‍රියමනාප වූ ද වචන වන්නේ (සුබ්බහානල්ලාහි වබිහම්දිහි” සුබ්හානල්ලාහිල් අලීම්) යන වාක්‍ය දෙක වන්නේය“ |
| 4 | “ලා හව්ල වලාකුව්වත ඉල්ලා බිල්ලාහ් | මහිමය: නුඹට ස්වර්ගයේ භාණ්ඩාගාරවලින් එකක් ගැන කියන්නද?’යි විමසුවිට ’එසේය කියනු ලැබීය“ එවිට නබි තුමාණෝ මෙම දික්ර්ය ප්‍රකාශ කළහ“ |
| 5 | ස්වර්ගය අයැද නිරයෙන් ආරක්ෂාව පැතීම | කවෙරෙකු තුන්වරක් ස්වර්ගය අයැදින්නේ ද, ස්වර්ගය පවසයි. යා අල්ලාහ්!ඔහුව ස්වර්ගයට ඇතුල් කර මැනව. තවද කවෙරෙකු තුන්වරක් නිරයෙන් ආරක්ෂාව පතන්නේ ද,නිරය පවසයි. යා අල්ලහ්!ඔහුව නිරයෙන් ආරක්ෂා කරනු මැනව. |
| 6 | රැස්වීම්වල ඇතිවන අඩුපාඩුවලට ප්‍රතිකර්මය | කවෙරෙකු රැස්වීමක වාඩිවී එහි ඝෝෂා නගා, පසුව එම ස්ථානයෙන් නැගිටීමට පෙර ’සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික අෂ්හදු අන් ලා ඉලාහා ඉල්ලා අන්ත අස්තග්ෆිරුක ව අතූබු ඉලෛක’ යනුවෙන් කියන්නේ ද, එම රැස්වීම අතර සිදුවූ ඔහුගේ සියලු පාපයන් කෂමා කරනු ලැබේ. |
| 7 | “කහ්ෆ් සූරාවේ මුල් වැකි 10 යේ මහිමය“ | කවරෙකු කහ්ෆ් සූරාවේ මුල්වැකි 10 මනනය කරන්නේ ද ඔහු දජ්ජාල්ගෙන් ආරක්ෂා වන්නේය“ |
| 8 | නබි (සල්) නමින් සලවාත් කීම“ | මහිමය: කවරෙකු මා නමින් සලවාත් කියන්නේ ද ඔහු වෙනුවෙන් අල්ලාහ් දහ වතාවක් සලවාත් කියයි“ තවද පාපයන් දහයක් ක්ෂමා කෙරෙයි“ තත්ත්වයන් දහයක් උසස් කරයි“ (තවත වාර්තාවක) කුසල් දහයක් ලියවෙයි“ |
| 9 | කුර්ආනයේ වැකි කීපයක් කියවීමේ මහිමය:- | කවරෙකු දිවා රාත්‍රියේ වැකි 50ක් කියවයි නම් ඔහු අමතක කළවුන් සමග නොලියවෙයි“ කවරෙකු වැකි 200ක් කියවයි ද කුර්ආනය පරලොවදී ඔහුට විරුද්ධ ව වාද නොකරයි“ කවරෙකු වැකි 500ක් කියවයි ද ඔහුට විපාක වශයෙන් (පින්) බොහෝමයක් හිමිවෙයි“ |
| 10 | අදාන් කියන්නන්ගේ මහිමය | අදාන් කියන්නාගේ හඬට සවන් දෙන“ මිනිසුන්” ජින්වරුන් හා අනෙක් සියල්ල පරලොවදී සාක්ෂි දරයි“ මුඅද්දින්වරුන් පරලොවදී බෙල්ල දික්වුවන් ලෙස සිටින්නෝය“ |
| 11 | අදානයට පිළිතුරු දීමෙන් ඉන්පසු ප්‍රාර්ථනා කිරීමෙන් මහිමය | කවරෙකු අදාන් කියා අවසන් වූ පසු අල්ලාහුම්ම රබ්බ හාදිහද් දඃවතිත්තාම්මත් වස්සලාතිල් කාඉමත් ආති මුහම්මදිනිල් වසීලත වල් ෆළීලාහ්“ වබ්අස්හු මකාමන් මහ්මූදනිල්ලදී ව අත්තහ් (මෙම සම්පූර්ණ කැඳවුමේ හා ස්ථාවර කරනු ලබන සලාතයෙද රක්ෂකයාණනි” මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාන්ට වසීලා නමැති පදවිය ද මහිමය ද දී නුඹ පොරොන්දු වූ ප්‍රශංසනීය ස්ථානය දෙනු මැන) යැයි ප්‍රාර්ථනා කරයි ද ඔහුට නබිතුමන්ගේ අනුකම්පා බස් (මැතිහත්වීම) අනිවාර්ය වන්නේය“ |
| 12 | වුළුව සම්පූර්ණයෙන් කිරීමේ මහිමය“ | කවරෙකු වුළු සම්පූර්ණ කරන්නේ ද ඔහුගේ පාපයන් තම ශරීරයෙන් හැලෙන්නේය“ ඔහුගේ නියපොතු යටින් පවා ඇති පාපයන් හැලෙන්නේය“ |

| | | |
|---|---|---|
| 13 | **වුළුවෙන් පසුව කරන ප්‍රාර්ථනය“** | කවරෙකු වුළුව සම්පූර්ණයෙන්ද” ලස්සන ලෙසද ඉටුකර පසුව *අෂ්හදු අන්ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅන්න මුහම්මදන් අබ්දුල්ලාහි වරසූලුහි* (නැමැදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැත“ මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) අල්ලාහ්ගේ ගැත්තා ද දූතයෙකු ද වෙයි) යැයි පවසන්නේ ද ඔහු වෙනුවෙන් ස්වර්ගයේ දොරටු අටම විවෘත වී ඔහුට මනාප දොරටුවෙන් ඇතුල් විය හැකි වන්නේය“ |
| 14 | **වුළූ කිරීමෙන් පසු රක්අත් දෙකක් සාතයේ යෙදීමේ මහිමය** | කවර මුස්ලිම් වරයෙකු වුළුව අලංකාර ලෙස කර ඉන්පසු රක්අත් දෙකක් පිළිවෙලින් ඉටු කරයි ද ඔහුට ස්වර්ගය අනිවාර්ය වෙයි“ |
| 15 | **“ මස්ජිද් කරා වැඩියෙන් ඇවිද යාමේ මහිමය“** | කවරෙකු සමූහ සලාතය සඳහා පයින් ගමන් කරන්නේ ද ඔහුගේ එක් පියවරකට එක් පාපයක් මැකී යයි“ අනෙක් පියවරට පිනක් ලියවෙයි“ මෙසේ ඔහු යන විටත් ආපසු එන විටත් පව් මැකී පිං ලියවෙමින් පවති“ |
| 16 | **“කල්වේලා ඇතුව ජුමුආ සලාතයට යාම** | කවරෙකු ජුමුආ දිනයේ වේලාසනින් නාගෙන පිරිසිදු වී වාහනයක නොනැගී මස්ජිදයට පා ගමනින් ගොස් ඉමාම්වරයාට සමීපව වාඩි වී ඔහුගේ දේශනයට අවධානයෙන් සවන් දෙන්නේ ද ඔහුගේ සෑම පියවරකටම වසරක් උපාවාසය රැක” සිටගෙන නමැදුම් කළ කුසල් හිමිවෙයි“ යමෙක් නාගෙන හැකි පමණින් පිරිසිදු වී සුවඳ විලවුන් තවරාගෙන මස්ජිදයට ගොස් දෙදෙනෙකු වෙන් නොවන අන්දමින් තැනකට ගොස් ඔහුට නියම වූ සලාතය කර වාඩි වී නිහඬව දේශනයට සවන් දෙයි නම් ඒ සතියේ සිට ඊළඟ සතිය දක්වා ඔහුගේ පව් ක්ෂමා කෙරේ“ |
| 17 | **“ඉහ්රාම් (ආරම්භ) තක්බීරයට සහභාගි වීමේ මහිමය“** | කවරෙක් නොකඩවා ආරම්භ තක්බීරයට සහභාගි වී දින 40ක් අල්ලාහ් වෙනුවෙන් සලාතයේ යෙදෙන්නේද ඔහුට නිදහස් වීමේ පත්‍ර දෙකක් ලැබේ“ 1“ නිරයෙන් නිදහස 2“ කුහක කමින් නිදහස |
| 18 | **“අනිවාර්ය සලාතයන් සාමූහිකව ඉටු කිරීමේ මහිමය“** | සමූහ සලාතයේ යෙදීම“ තනිවම සලාතයේ යෙදීමට වඩා 27 ගුණයක මහිමයෙන් වැඩි වේ“ |
| 19 | **“ඉෂා ෆජ්ර් සලාතයන් සාමූහිකව ඉටු කිරීමේ මහිමය“** | කවරෙකු ඉෂා සලාතය සාමූහිකව ඉටු කරන්නේ ද ඔහු රැයෙන් අඩක් සිටගෙන නමැදුම් කළ අයෙකුට සමානය“ (ප්‍රතිඵල ලබයි) කවරෙකු ෆජ්ර් සලාතය ද සාමූහිකව ඉටු කරන්නේද ඔහු රාත්‍රිය සම්පූර්ණයෙන් සිටගෙන නමැදුම් කළ අයෙකුට සමාන වන්නේය“ |
| 20 | **“පළමු පේළියේ සිටගෙන සලාතයේ යෙදීමේ මහිමය“** | අදාන් කීමෙහිත් පළමු පේළියේ සිටගෙන සලාතයේ ඉටුකිරීමේත් මහිමය මිනිස්සු දන්නහු නම් පසුව කුසපත් ඇදීමෙන් එම අවස්ථා දෙක ලබා ගත යුතු බව කීව ද කුසපත් ඇද එය ලබා ගන්නෝය“ |
| 21 | **“ සුපුරුදු සුන්නත් සලාතයන් නොවරදවා ඉටු කිරීමේ මහිමය** | කවරෙකු රාත්‍රියෙහි හා දවාලෙහි රක්අත් 12 ඉටු කරයි නම් ඔහුට ස්වර්ගයේ නිවසක් නිර්මාණය කෙරෙයි“ (ඒවා ෆජ්රු පෙර 02” ලුහර් පෙර 04” පසු 02” මග්රිබ් පසු 02” ඉෂා පසු 02 ආදියයි“) |
| 22 | **“නෆීල් සලාතයන් අධිකව ඉටු කිරීම** | නුඹ අධිකව සලාතයේ යෙදෙන්න“ මන්ද නුඹ අල්ලාහ් වෙනුවෙන් කරන සෑම සජ්දාවකට ම අල්ලා නුඹට එක් තත්ත්වයක් උසස් කර පාපයක් ක්ෂමා කරයි“ |
| 23 | **“ ෆජ්ර් හි (පෙර) සුන්නනතය හා ෆජ්ර් සලාතයේ මහිමය“** | ෆජ්ර්හි පෙර රක්අත් දෙක මෙලොව හා එහි ඇති සියලු දැයට වඩා අගනේය“ කවරෙකු හෝ සුබ්හු සලාතයේ යෙදෙයි නම් ඔහු අල්ලාහ්ගේ වගකීම යටතට පත් වන්නේය“ |
| 24 | **“ ලුහා සලාතයේ මහිමය“** | නුඹලා හැම දෙනෙකුම නුඹලාගේ (ශරීරයේ) හංදි ගාණට දන්දිය යුතුය“ (සුබ්හානල්ලාහ්) දානයකි“ (අල්හම්දුලිල්ලාහ්) ද දානයකි“ (අල්ලාහු අක්බර්) ද දානයකි“ නරක මාර්ගයෙහි බාධක වන ද” ඉවතලීමත් දානයකි“ මේ හැම එකක් වෙනුවෙන්ම ලුහා වේලාවේ රක්අත් 2 ක් සලාතයේ යෙදීම ප්‍රමාණවත්ය“ |
| 25 | **“ සලාතය ඉටු කළ තැනම අල්ලාහ්ව මෙනෙහි කිරීමේ මහිමය“** | නුඹලාගෙන් කෙනෙක් වුළු නොකැඩී සලාතය කළ තැන ම වාඩිවී සිටින තාක් මලක්වරු නුඹලාට ප්‍රාර්ථනා කරති“ ’*යා අල්ලාහ් මොහුට කරුණා කරනු මැන“ මොහුගේ පව් කෂමා කරනු මැනවැ*’යි ප්‍රාර්ථනා කරති“ |
| 26 | **“ෆජ්ර් සලාතය සාමුහික ව ඉටු කර සූර්ය උදාව තෙක් අල්ලාහ්ව මෙනෙහි කර රක්අත් දෙකක් ඉටු කිරීමේ මහිමය“** | කවරෙකු හෝ සාමුහිකව ෆජ්ර් සලාතය ඉටු කර හිරු උදාවන තුරු අල්ලාහ්ව දික්ර් කිරීමෙන් අනතුරුව රක්අත් දෙකක් සලාතයේ යෙදෙයි නම් ඔහුට සම්පූර්ණ හජ් උම්රා කළ කුසල් සම්භාරයක් හිමි වන්නේය“ |
| 27 | **රාත්‍රියේ අවදි වී බිරිඳ ද අවදි කර දෙදෙනාම සලාතයේ යෙදීමේ මහිමය“** | කවරෙකු රාත්‍රියේ අවදි වී තම බිරිඳ ද අවදි කරවා දෙදෙනාම රක්අත් දෙකක් සලාතය කරන්නේ නම් ඔවුන් දෙදෙනා අල්ලාහ්ව මෙනෙහි කළ ගැහැණු පිරිමින් ලේඛණයේ ලියවෙන්නේය“ |

| | | |
|---|---|---|
| 28 | “රාත්‍රි සලාතයේ යෙදීමට ස්ථිරව සිතාගෙන සිටිය දී අවදිවීමට නොහැකි වීම | රාත්‍රි සලාතයේ යෙදිය යුතු යැයි සිතා සිටිය ද ඔහු තද නින්දකට වැටී මිනිසාට සලාතය කරන්නට නොහැකිවෙතොත් ඔහු ට සලාතය කළ කුසල අල්ලාහ් ලබා දෙන්නේය“ ඔහුගේ නින්ද ඔහුට දානයක් වන්නේය“ |
| 29 | පොළට ඇතුල්වන විට පාරායනා කරන දුආව | 'ලා ඉලාහා ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු ලහුල් මුල්කු වලහුල් හම්දු යුහ්යී වයුමීතු වහුවල් හය්යු ලා යමූතු බියදිහිල් හයිරු වහුව අලා කුල්ලිෂෙය්යින් කදීර්'. යනුවෙන් කවරෙකු පොළට ඇතුල් වූ විට පවසන්නේ ද, අල්ලාහ් ඔහුට කුසල් ලක්ෂ දහයක් ලියන්නේය. පාපයන් ලක්ෂ දහයක් මකන්නේය. තවද ස්වර්ගයේ ඔහුගේ තරාතිරම ලක්ෂ දහයකින් ඉහළ නංවන්නේය. |
| 30 | සෑම ෆර්ලු සලාතයක අවසානයේදීම සුබ්හානල්ලාහ්, අල්හම්දු ලිල්ලාහ්, අල්ලාහු අක්බර් 33 වතාවක් කියා, අවසාන වශයෙන් ලා ඉලාහා ඉල්ලල්ලාහ් එක් වරක් කියා නිම කිරීම. | කවරෙකු සෑම (ෆර්ලු) සලාතයකම පසුව සුබ්හානල්ලාහ් 33 වතාවක්, අල්හම්දු ලිල්ලාහ් 33 වතාවක්, අල්ලාහු අක්බර 33 වතාවක්, මෙය අනූනවයක් වන්නේය. පසුව සීය සම්පූර්ණ කිරීම සඳහා එක් වරක් 'ලා ඉලාහා ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලිෂෙය්යින් කදීර්'. යනුවෙන් අල්ලාව දික්රු කරන්නේ ද, මුහුදේ පෙණ තරම් ඔහුගේ පාපයන් වුව ද, අල්ලාහ් එය ක්ෂමා කරන්නේය. |
| 31 | “අනිවාර්ය සලාතයෙන් පසු ආයතුල් කුර්ෂි කියවීම | කවරෙකු අනිවාර්ය (ෆර්ල්) සලාතයෙන් පසුව (ආයතුල් කුර්ෂි) කියවන්නේ නම් ස්වර්ගයට පිවිසීමට මරණය හැර වෙනත් බාධකයක් නොමැත“ |
| 32 | “රෝගියා ළගට සුවදුක් විමසීමට යෑම | කවරෙකු හෝ මුස්ලිම් වරයෙක් උදෑසන රෝගියෙක් බලන්න යයි නම් සවස දක්වා මලක්වරු හැත්තෑදහසක් (70”000) ඔහුට පාප ක්ෂමාව පතති“ සවස යයි නම්” උදෑසන දක්වා මලක්වරු 70”000ක් ඔහු වෙනුවෙන් පාප ක්ෂමාව පතති“ ඔහුට සවර්ගයේ නෙලූ පලතුරු ඇත“ |
| 33 | පරීක්ෂණයට ගොදුරු වුවන් දකින අවස්ථාවලදී පැවසීම | කවරෙකු පරීක්ෂණයට ගොදුරු වුවන්ව දකින්නේ ද පහත සඳහන් දුආව පවසයි.'අලහම්දු ලිල්ලිහිල්ලදී ආෆානී මිම්මබ්තලාක බිහී ව ෆල්ළලනී අලා කසීරින් මිම්මන් හලක තෆ්ලීලා. එවිට එම පරීක්ෂාව ඔහුට නොපැමිණේ. |
| 34 | “පරීක්ෂණයන්ට ගොදුරුවුවන්ට සැනසිලිවදන් කීම“ | කවරෙකු පරීක්ෂණයට ගොදුරු වී සිටින අයෙකුට සැනසිලිවදන් කියන්නේ ද ඔහුට ඔහුගේ කුසල් මෙන් ලබා දෙන්නේය“ යම් මුස්ලිම්වරයෙකු තම සහෝදරයෙකුගේ දුකේදි සහන බස් දොඩන්නේ ද ඔහුට අල්ලාහ් ගෞරවය නමැති ආභරණය පළඳවන්නේය“ |
| 35 | “ජනාසා සලාතයේ යෙදී පසුව කනත්තේ භූමදානයට ද සහභාගිවීම | කවරෙකු ජනානාසා සලාතය දක්වා සහභාගි වෙයිනම් ඔහුට 'කිරාත්' 01ක් කුසල් ඇත“ භූමදානය දක්වා කවරෙකු සහභාගිවෙන්නේ ද ඔහුට කීරාත් 02ක් කුසල් ලැබෙයි“ කීරාත් 02 ක් කොතරම් දැයි ප්‍රශ්න කෙරුණු විට එය විශාල කඳු දෙකකට සමාන යැයි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ කීහ“ අපි කඳු බොහොමයක කුසල් නැති කරගත්තෙමු' යි ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමා කීය“ |
| 36 | “ අල්ලාහ් වෙනුවෙන් මස්ජිද් නිර්මාණය කිරීම හෝ කොටස් කරුවෙකු වීම“ | කවරෙකු අල්ලාහ් වෙනුවෙන් මස්ජිදයක් නිර්මාණය කරන්නේ ද එය කුරුළු කූඩුවක් වෙන්වුවත් කමක් නැත“ අල්ලාහ් ඔහුට සවර්ගයේ නිවසක් තනන්නේය“ |
| 37 | “ යහපත් දෑ සඳහා වියදම් කිරීම | දිනපතා උදෑසන මලක්වරුන් දෙදෙනෙකු පහළට බැස එක් අයෙක් 'යා අල්ලාහ් වියදම් කරන්නාට අභිවෘද්ධිය ඇතිකරත්වා'යි පතයි“ දෙවැන්නා 'යා අල්ලාහ් මසුරුකම් කරන්නාට විනාශය ගෙන දෙත්වා'යි පතයි“ |
| 38 | “ දන් දීම | දන් දීමෙන් වස්තුව අඩුනොවෙයි“ ක්ෂමා කිරීම තුළින් ගැත්තා ගෞරවය ම අධික කරගනී“ කවරෙකු නිහතමානීව කටයුතු කරයි ද ඔහුව අල්ලාහ් උසස් කරයි“ දිර්හම් එකක් දිර්හම් ලක්ෂයක් අබිබවා ගියේය“ අල්ලාහ්ගේ දූතයාණනි” ඒ කෙසේ දැ යි නබි තුමන්ගෙන් සහබාවරු ඇසුහ“ කෙනෙක් ළග දිර්හම් දෙකක් ඇත“ ඉන් එකක් ඔහු දන් දෙයි“ තව එකෙක් ළග විශාල වස්තුවක් ඇත“ ඔහු එයින් සුළු ප්‍රමාණයක් වූ දිර්හම් ලක්ෂයක් දන් දෙයි“ යි නබි තුමෝ පිළිතුරු දුන්හ“ |
| 39 | “පොලිය බලාපොරොත්තු නොවී ණයට දීම | කවර මුස්ලිම්වරයෙකු අනෙක් මුස්ලිම්වරයාට දෙවරක් ණය දෙන්නේ ද ඒ මුදල ඔහු වරක් දන් දුන්නාට සමාන වෙයි“ |
| 40 | “දුෂ්කර අයට නම්‍යශීලිවීම | කෙනෙක් ජනතාවට ණය දුන්නේය“ ඔහු තම වහලා අමතා 'නුඹ දුෂ්කර තාවලින් යුත් කෙනෙක් දුටුවේ නම් ණය කපා හරිනු“ මන්ද අල්ලාහ් අපව ක්ෂමා කිරීමට ප්‍රමාණවත්යැ'යි කියන්නෙකුව සිටියේය“ ඔහු අල්ලාහ්ව මුණ |

| | | |
|---|---|---|
| | | ගැසුන විට අල්ලාහ් ඔහුට ක්ෂමාව දුන්නේය“ |
| 41 | “ අල්ලාහ්ගේ මාර්ගයේ දිනක් උපවාස ශීලයේ යෙදීම“ | කවරෙකු අල්ලාහ්ගේ මාර්ගයේ දිනක් උපවාසය රකීද ඔහුගේ මුහුණ අල්ලාහ් නිරයෙන් අවුරුදු 70 ක් දුරට දුරස්ථ කරන්නේය“ |
| 42 | “ සෑම මසකම දින 3 ක්” හා අරෆා හා ආෂුරා දිනවල උපවාසය ඇල්ලීම | සෑම මසකම දින තුනක් උපවාසය රැකීම ජීවිත කාලය පුරාම උපවාසය රැකීමට සමාන වන්නේය“ 'අරෆා' දවසේ උපවාසය ගැන විම සු විට එය පසුගිය අවුරුද්ද හා ලබන අවුරුද්දේ පාපයන්ට ප්‍රතිකර්මයක් බව ද ආෂුරා දින උපවාසය ගැන විමසු විට එය පසුගිය වසරේ පාපයන්ට ප්‍රතිකර්ම වන්නේ යැයි නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ පිළිතුරු දුන්හ“ |
| 43 | “ෂව්වාල් මස දින 06කේ උපවාස ශීලයේ නියැලීම“ | කවරෙකු 'රම්ළාන්' මාසයේ උපවාසයේ නියැලී පසුව ෂව්වාල් මාසයේ දින 06කේ උපවාසයේ නියැලෙයි නම් එය ජීවිත කාලයේ උපවාසයේ නියැලීමට සමාන වෙයි“ |
| 44 | “ තරාවීහ් සලාතය ඉමාම් අවසන් කරන තෙක් සාමුහිකව ඉටුකිරීම | තරාවීහ් සලාතය ඉමාම් සමග අවසානය දක්වා යමෙක් ඉටුකරයි නම් ඔහුට මුළු රාත්‍රියම සිටගෙන නමැදුම් ඉටු කළ කුසල් හිමිවන්නේය“ |
| 45 | “ රම්සාන් මස උම්රා කිරීම | රම්සාන් මස උම්රා කිරීම 'හජ්' වන්දනයට සමානය“ නැතිනම් මා සමග 'හජ්' වන්දනයක් ඉටුකළා හා සමානය යැයි නබිතුමාණෝ ප්‍රකාශ කළහ“ |
| 46 | “ පිළිගත් හජ් | කවරෙකු අල්ලාහ් වෙනුවෙන් හජ් නමැදුමට ගොස් සංසර්ගයේ නොයෙදී පාපකාරී කථාවලින් හා පාපී ක්‍රියාවලින් තොරව ඉටුකරයි නම් එදින උපන් ළදරුවෙකු සේ ආපසු එන්නේය“ හජ් සඳහා සවර්ගය මිස වෙන කුසලක් නැත“ |
| 47 | “ දුල්හජ් මුල් දින 10 තුළයහ ක්‍රියා කිරීම“ | දුල් හජ් මාසයේ මුල් දින 10 තුළ යහක්‍රියා කිරීම මෙන් අල්ලාහ්ට ප්‍රියමනාප දෙයක් වෙනත් නැත“ 'ජිහාද්' වලටත් වඩා දැ?”යි අසන ලදී“ එවිට 'ඔව්' එයටද සමාන නොවේ“ එහෙත් තම ප්‍රාණය හා වස්තුව රැගෙන ගොස් (ජිහාද් සඳහා) ආපසු නොපැමිණි අය හැර” යැයි නබිතුමාණෝ කීහ“ |
| 48 | “ උල්හියියා | නබි මිතුරෝ නිබිතුමාගෙන් උල්හියා පිළිබඳ කරුණු විමසුහ“ එවිට එතුමාණෝ 'මෙය නුඹලාගේ පියා ඉබ්‍රාහිම් (අලෙයිහිස් සලාම්) තුමාගේ මාර්ගයට අයත් එකක් යැයි පිළිතුරු දුන්හ“ එයින් අපට කුමන පළක් ලැබේදැ?'යි විමසුහ“ එවිට එතුමාණෝ “සෑම රෝම කූපයකටම පිනක් ලැබේ“ එසේ කම්බිලි (බැටළුවාට) කෙසේදැ? යි විමසුහ“ බැටළුවාගේ සෑම රෝමයකටම පිනක් ලැබේ යැයි නබිතුමාණෝ කීහ“ |
| 49 | “ ආලිම්වරයෙකුගේ කුසල හා මහිමය | එක 'ආබිද්' වත්පිළිවෙත් කරන්නෙකුට වඩා එක 'උගතෙකු'ගේ ඇති මහිමය නුඹලාගෙන් ඉතා පහත්ම පුද්ගලයාට වඩා මගේ මහිමය වැනිය“ නියත වශයෙන්ම අහස් ද අහස් හා පොළොවෙහි ඉන්න අය ද” තම ගුලේ සිටින කුහුඹුවන් ඇතුලු මහ සයුරේ මත්සයින් පවා ජනතාවට යහපත් දේ උගන්වන අය වෙනුවෙන් පාපක්ෂමාව අයදින්නෝය“ |
| 50 | “ අල්ලාහ්ගේ මාර්ගයේ පුන්‍ය සටනේදී මියගිය අයෙකුට හිමිවන ප්‍රතිඵල“ | අල්ලාහ්ගේ මාර්ගයේ දිවිපිදු කෙනෙකුට අල්ලාහගෙන් කරුණු 6ක් හිමිවන්නේය“ 1“ ඔහුගේ පාපයන් පළමුවෙන්ම ක්ෂමා කෙරෙන්නේය“ 2“ ස්වර්ගයේ ඔහුගේ නවාතැන දකී“ 3“ 'කබ්ර්' (මිනීවළේ) වේදනාවෙන් නිදහස් වෙයි“ 4“ ඉතා භයානක තැති ගැන්මෙන් ආරක්ෂාව ලබයි“ 5“ ඔහුගේ හිසේ 'ගෞරවය' නමැති ඔටුන්නක් පළඳවනු ලබයි“ එහි ඔබ්බවා ඇති මැණික් ගලක් මේ ලෝකය හා එහි සියලු දේට වඩා අගනේය“ 6“ ඔහුට සවර්ග කන්‍යාවන් 70ක් විවාහ කර දෙනු ලබයි“ ඔහුගේ පවුලේ 70 දෙනෙකු වෙනුවෙන් ඔහුගේ සහන බස්දෙඩීම (නිර්දේශය) පිළිගැනේ“ |
| 51 | “ අල්ලාහ්ට බියෙන් ඇඩීමත් ඔහුගේ මාර්ගයේ මුර කිරීමත් | ඇස් දෙකක් නිරයේ නොදැවේ“ එනම් 1“ අල්ලාහට බියෙන් හැඬු ඇස“ 2“ අල්ලාහ්ගේ මාර්ගයේ මුරකෙරුනු ඇස“ |
| 52 | “ පිළිස්සීම” මැතිරීමට ඉල්ලීම” ශාස්ත්‍ර බැලීම ආදියෙන් වැළකීම | මුල් සමාජයේ අයව නබි සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම් තුමාණන්ට සිහිනෙන් පෙන්වනු ලැබීය“ එතුමෝ තම සමූහයාව දුටහ“ එයින් 70”000ක් විභාගයකින් හෝ දඬුවමකින් තොරව ස්වර්ගයට ගියහ“ ඔවුහු ගින්නෙන් නොපිළිස්සු” මැතිරීමට ඉල්ලා නොසිටීම හා ශාස්ත්‍ර නොබැලු ද සියලුම කාර්යයන් හිදී අල්ලාහ් මත අචල විශ්වාසය තැබූ අයයි“ |
| 53 | “කුඩා ළදරුවන් අහිමිවුවන්ගේ ප්‍රතිඵල | කවර මුස්ලිම්වරයෙකුගේ ළදරුවන් තුන්දෙනෙක් වැඩිවියට පත්නොවී මියගියේ නම් අල්ලාහ් ඔහුව සවර්ගයට ඇතුල් කරයි“ |
| 54 | “ පෙනීම නැතිවී ඉවසා සිටි අය“ | නියත වශයෙන්ම අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි“ 'මම මගේ ගැත්තාගේ ඇස් දෙකේ පෙනුම නැතිකර පරීක්ෂා කළ විට ඔහු ඉවසා සිටියේ නම්” ඒ දෙක වෙනුවට ඔහුට සවර්ගය ප්‍රතිඵල වශයෙන් දෙමි“ |

| | | |
|---|---|---|
| 55 | "අල්ලාහ් වෙනුවෙන් කුමක් වුවත් අත්හැරීම" | කුමක් වුවද නුඹ අල්ලාහ්ට බියෙන් අත්හරින්නෙහි නම් අල්ලාහ් නුඹට එයට වඩා වැදගත් දෙයක් ලබා දෙන්නේය" |
| 56 | " ලිගුව හා දිව ආරක්ෂා කිරීම | කවරෙකු තම හකු දෙකට අතර ඇති දෙය ද තම පාද දෙක අතර ඇති දෙය ද ආරක්ෂා කර ගන්නා බවට වගකීම භාරගන්නේ ද මම ඔහුට සවර්ගය ලබා දීමේ වගකීම භාරගනිමි" ඒවා දෙක නම් 'ලිගුව හා දිවයි' |
| 57 | "නිවසට ඇතුල්වීමේදී හා ආහාර ගැනීමේ දී 'බිස්මි' කීම | කෙනෙක් තම නිවසට ඇතුල්වීමේදීත් ආහාර ගැනීමේදීත් අල්ලාහ්ව සිහිකරන්නේ නම් ෂෙයිතාන් තම පිරිස අමතා 'මෙහි නැවතීමට හෝ ආහාර ගැනීමට හෝ අපට නොහැක' යැයි කියයි" එසේම යමෙක් නිවසට ඇතුල්වීමේදීත් ආහාර ගැනීමේදීත් අල්ලාහ්ව සිහිපත් නොකරයි නම් ෂෙයිතාන් තම පිරිස අමතා 'මෙහි නැවතීමට හා නුඹලාට ආහාර ගැනීමට අවශ්‍ය පහසුකම් ඇත'යි කියයි" |
| 58 | " ආහාර ගැනීම අළුත් ඇඳුම් ඇඳීම හා පානය කිරීමෙන් අනතුරුව අල්ලාහ්ට ප්‍රශංසා කිරීම" | කවරෙකු හෝ ආහාරයක් අනුභව කළ පසු '*අල්හම්දුලිල්ලාහිල්ලදී අත්අමනී හාදා වර්සුක්නීහි මින් ගයිරි හව්ලින් මින්නී වලා කුව්වත්*' (මට මෙම ආහාරය ලබාදුන් කිසිඳු හැකියාවක් නොමැති මට රිස්ක් ලබාදුන් අල්ලාහ්ටම සියලු ප්‍රශංසා) යැයි කීවොත් ඔහුගේ පෙර පව් සියල්ල කෂමා කෙරෙයි" කවරෙකුගේ අලුත් ඇඳුමක් අඳිනවිට '*අල්හම්දුලිල්ලාහ් හිල්ලදී කසානී හාදා වරසකනීහි මින් ගයිරි හව්ලින් මින්නී වලා කුව්වත්*' (මට මෙය ඇඳීමට ලබාදුන් මට කිසිඳු හැකියාවක් නොමැතිමව සිටියදී රිස්ක් ලබාදුන් අල්ලාහ්ටමය සියලු ප්‍රශංසා) යැයි ප්‍රකාශ කරයි" |
| 59 | " කවරෙකු හෝ තම කාර්ය බහුලතාව අඩුකරන්න සිතන්නේ නම් | ෆාතිමා (රළියල්ලාහු අන්හා) තුමිය නබිතුමන්ගෙන් තමන්ට මෙහෙකාරියක් ලාබදෙන මෙන් ඉල්ලා සිටියාය" එවිට ෆාතිමා (රළියල්ලාහු අන්හා) තුමියට හා අලි (රළියල්ලාහු අන්හු) තුමාට නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්)තුමාණෝ මෙසේ පිළිතුරු දුන්හ" 'ඔබ දෙදෙනා ඉල්ලු දෙයට වඩා ඉතා වැදගත් දෙයක් මා කියා දෙන්න ද? ඔබ දෙදෙනා නින්දට යාමට පෙර *සුබ්හානල්ලාහ්* - 33" *අල්හම්දුලිල්ලාහ්* 33 *අල්ලාහු අක්බර්* 34 වරක් පවසනු" එය මෙහෙකාරියකට වඩා ඔබ දෙදෙනාට වටින්නේය" |
| 60 | "සංසර්ගයට පෙර ප්‍රාර්ථනය | නුඹලාගෙන් කෙනෙක් තම බිරිඳ සමග සංසර්ගයේ යෙදීමට සිතැගිවුයේ නම් *බිස්මිල්ලාහ් අල්ලාහුම්ම ජන්නිබ්නෂ් ෂෙයිතාන් වජන්නිබ්නෂ් ෂෙයිතාන මා රසක්තනා මින්හු*' යැයි කියන්නේ නම් ඒ අවස්ථාවේ ගැබ්ගනීව් නම් ෂෙයිතාන් එම ළදරුවාට කිසිඳු හානියක් නොකරයි" |
| 61 | " බිරිඳ සැමියාට අවනත වීම | ගැහැණියක පස්වේල සලාතය ඉටුකර" අනිවාර්ය උපවාසය ද අල්ලා තම රහසගද ආරක්ෂා කරමින් තම ස්වාමියාට අවනතවන්නී නම් ඇයට කැමති දොරටුවකින් සවර්ගයට ඇතුල් වන්නැයි ආරාධනා කරනු ඇත" |
| 62 | දෙගුරුන්ට කීකරු වීම හා ඥාතීන් සමග එක් වී ජීවත් වීම | "අල්ලාහු තආලාගේ තෘප්තිය පියාගේ තෘප්තියේ තිබෙන්නේය." "කවරෙකු තම ජීවිතයේ අවශ්‍යයතාවයන් හි අභිවෘද්ධිය ඇතිවීම හා ජීවන කාලය අධික වීම ප්‍රිය කරන්නේ ද ඔහු ඥාතීන් සමග එක් වී ජීවත් වෙයි." |
| 63 | " අනාථයින්ට සැලකීම | මම ද අනාථයින්ව නඩත්තු කරන්නා ද සවර්ගයේ මෙසේ සිටින්නෙමු" යි තම දඹරැගිල්ල හා මැදැගිල්ල එකට තබා නබිතුමාණෝ පෙන්වූහ" |
| 64 | " යහපත් ගතිගුණ | නියත වශයෙන්ම එක් මුඃමින්වරයෙකු සිටගෙන උපවාසයේ නියැලී" සිටගෙන නැමදුම් කරන අයෙකුගේ තත්ත්වයට පත්වෙයි" තම ගුණ යහපත් කම පෙලගස්වාගත් කෙනෙකුට සවර්ගයේ උසස් මාලිගාවකට හිමිකම් ලබනු ඇත" |
| 65 | "මැවීම්වලට කරුණාව දැක්වීම | අල්ලාහ් කරුණාව දක්වන්නේ කාරුණික සිතුවිලි ඇති අයටය" පොළොවේ අයට කරුණාව දක්වන්න" එවිට අහසේ අය නුඹට කරුණාව දක්වන්නේය" |
| 66 | "මුස්ලිම්වරුන්ට යහපත කිරීම | නුඹලාගෙන් කෙනෙකු තමාට රිසි දෙය තම සහෝදරයාට ද රිසිවන තෙක් පූර්ණ මුස්ලිම්වරයෙකු විය නොහැක" |
| 67 | " ලජ්ජාව | ලජ්ජාව යහපතක් මිස වෙනත් දෙයක් ගෙන නොඑයි" ලැජ්ජාව විශ්වාසයට අයත් එකකි" රසුල්වරුන්ගේ කරුණු හතරක් ඇත" 1" ලැජ්ජාව 2" සුවඳ තැවරීම 3" දත් මැදීම හා 4" විවාහ වීමයි" |
| 68 | " පළමුවෙන් සලාම් කීම | මිනිසෙක් නබිතුමාණන් වෙත පැමිණ" 'අස්සලාමු අලෛකුම්' කීය" එයට නබි තුමාණෝ 'දහයයි' කීහ" ඉන් අනතුරු තව කෙනෙක් පැමිණි 'අස්සලාමු අලෛකුම් වරහ්මතුල්ලාහ්' යැයි කීය" එයට නබි තුමෝ 'විස්සයි' කීහ" පසුව තවත් කෙනෙක් පැමිණ" 'අස්සලාමු අලෛකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු' යැයි කීය" එවිට එතුමාණෝ 'තිහයි' කීහ" (එනම් ලැබෙන කුසල්වල ප්‍රමාණය වේ") |

| | | |
|---|---|---|
| 69 | “ මුණගැසෙන විට අතට අත දීම | මුස්ලිම්වරුන් දෙදෙනෙකු මුණගැසී මුසාබහා කරගැනීමේදී ඒ දෙදෙනා වෙන්වී යාමට පෙර දෙදෙනාගේ පාපයන් ක්ෂමා කෙරෙන්නේය“ |
| 70 | “තම සහෝදරයාගේ අභිමානය සුරැකීම | කවරෙකු තම සහෝදරයාගේ අභිමානය සුරැකීමට කතා කරයි ද විනිශ්චය දිනයේ දී අල්ලාහ් ඔහුගෙන් අපාගින්න ඉවත්කර දමන්නේය“ |
| 71 | “ යහපත් අය ප්‍රිය කිරීම හා ඔවුන් සමග මිත්‍රවීම | නුඹ කවරෙකුව ප්‍රිය කරන්නේ ද ඔහු සමග (පරලොවදී) සිටින්නෙහිය“ අනස් (රළියල්ලාහු අන්හු) තුමාණන් මෙසේ කීය“ නබි මිතුරන් මෙයින් සතුටට පත්වූවා සේ වෙන කිසිවෙකින් සතුටු වූයේ නැත“ |
| 72 | “අල්ලාහ් වෙනුවෙන් ආදරය කරන්නන් | අල්ලාහ් මෙසේ පවසයි“ ’මා වෙනුවෙන් එකිනෙකා ආදරය කරන්නන්ට ආලෝකයෙන් නිර්මිත වේදිකා ඇත“ ඔවුන් දැක නබිවරු හා ෂුහදාවරු ද ආශාකරති“ |
| 73 | “මුස්ලිම් සහෝදරයා වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම | කවරෙකු සහෝදරයා වෙනුවෙන් තනිවම ඔහු නොදැනුවත්ව ප්‍රාර්ථනා කරන්නේ ද ඔහුට නියම කළ මලක්වරයා ආමීන් (නුඹටත් එසේම අත්වේවා යැයි කියයි“ |
| 74 | “ මුඃමින් වූ ගැහැණු පිරිමින්ගේ පාප ක්ෂමාව ඇයදීම | කවරෙකු මුඃමින්වූ ගැහැණුන්ට ද පිරිමින්ටද පාපක්ෂමාව අයැද සිටින්නේ ද ඔහුට සෑම ගැහැණු පිරිමි සංඛ්‍යාව අනුව කුසල් (පිං) ලියන්නේය“ |
| 75 | “අනතුරුදායක දෑ පාරෙන් ඉවත් කිරීම | ජනතාවට හානිකර ගසක් කපා ඉවත් කළ මිනිසෙකු සවර්ගයේ ගමන්කරනු මම දුටිමි |
| 76 | “ බොරුවෙන් හා තර්ක කිරීමෙන් වැළකීම | කවරෙකු සත්‍යයෙන් ඇති දේ තහවුරු වීමෙන් පසු තර්ක කිරීමෙන් වැළකෙන්නේ ද ඔහුට ස්වර්ගයේ පැත්තක නිවසක් ලබාදෙන්නට මම වගකීම භාරගනිමි“ කවරෙකු විහිළුවට හෝ බොරු කීමෙන් වළකින්නේ ද ඔහුට සවර්ගයේ මැද නිවසක් ලබාදෙන්නට මම වගකීම භාරගනිමි යැයි නබිතුමාණෝ ප්‍රකාශ කළහ“ |
| 77 | “ කෝපය මැඩගැනීම | කවරෙකු කෝපය මැඩගන්නේ ද විනිශ්චය දිනයේ මැවීම් අතර ඔහුව කැඳවා ඔහුට ප්‍රියමනාප කන්‍යා ස්ත්‍රීන්ව තෝරා ගැනීමට අවස්ථාව ලබා දෙයි“ |
| 78 | යහපත කියා ප්‍රශංසාවට ලක්කිරීම හෝ අයහපත කියා අප්‍රශංසාවට ලක්කිරීම | (මියගිය) තැනැත්තැකු නුඹලා ඔහුගේ යහපත ප්‍රශංසා කිරීමෙන් ඔහුට ස්වර්ගය අනිවාර්‍යය වේ. ඔහුහට අප්‍රශංසා කිරීමෙන් නිරය අනිවාර්‍යය වේ. පොළොව මත අල්ලහ්ගේ සාක්ෂි කරුවන් නුඹලාම වන්නෝය. |
| 79 | “මුස්ලිම්වරයෙකුගේ දුෂ්කරතාව නැති කිරීම අඩුපාඩු වසංකිරීම හා උදව් කිරීම | කවරෙකු හෝ මුඃමින්වරයෙකුගේ මෙලොව දුෂ්කරතාවලින් එකක් නැති කරයි නම් මොහුගේ පරලොව දුෂ්කරතාවක් නැති කරයි“ කවරෙකු හෝ දුප්පතෙකුගේ දුෂ්කරතාවක් ලිහිල් කරයි නම් ඔහුට අල්ලාහ් මෙලොව හා පරලොව දුෂ්කරතාවන් ලිහිල් කරයි“ කවරෙකු මුස්ලිම්වරයෙකුගේ අඩුවක් වසං කරන්නේ ද අල්ලාහ් ඔහුගේ මෙලොව හා පරලොව අඩුපාඩු වසං කරයි“ ගැත්තෙක් තම සහෝදරයාට උදව් කරන තාක් අල්ලාහ් ඔහුට උදව් කරමින් සිටියි“ |
| 80 | “ගැහැණු දරුවන්ට උදව් කිරීම” | ”කවරෙකු ගැහැණු දැරියන්ගෙන් පරීක්ෂණයට ගොදුරු වී එම දරුවන්ට හොඳින් උපකාර කරන්නේ ද ඔවුන් ඔහුට නිරයෙන් වළක්වන තිරයක් වන්නෝය.” |
| 81 | “විනිසුරු තීන්දු දීම” තරුණයින්ගේ විනය” මස්ජිද් සමග සම්බන්ධතාව තබා ගැනීම” අල්ලාහ් වෙනුවෙන් ආදරය කිරීම | අල්ලාහ්ගේ සෙවන හැර කිසිම සෙවනක් නොමැති ඒ දවසේ අල්ලාහ් හත් දෙනෙකුට සෙවන ලබා දෙයි“ 1“ ධර්මිෂ්ට රජු 2“ අල්ලාහ්ගේ වත් පිළිවෙත් අතර වැඩුන තරුණයා 3“ මස්ජිදය සමග සම්බන්ධ සිතක් ඇති මිනිසා 4“ අල්ලාහ් වෙනුවෙන්ම එක්වී ඒ වෙනුවෙන් ම මිත්‍ර වී ඒ පදනම යටතේම වෙන් වී ගිය සහෝදරයින් දෙදෙනා 5“ රුව හා තත්ත්වයෙන් අනුන කාන්තාවක් වරදට කැඳවූ විට මම අල්ලාහ්ට බියවෙමියි යැයි පවසා ඉන් ඉවත් වූ මිනිසා 6“ තම දකුණු අතින් දෙන දේ වම් අත නොදන්නා ලෙස රහසේ දන්දුන් මිනිසා 7“ තනිවම අල්ලාහ් ගැන සිතා කඳුළු හැලූ මිනිසා“ |
| 82 | පාපක්ෂමා | ”කවරෙකු පාපක්ෂමාව ජීවිතයේ අවශ්‍යම දෙයක් කරගන්නේ ද, අල්ලාහ් ඔහුට සියලු ප්‍රශ්නවලින් බැහැර වීමේ මගපහදා දෙන්නේය. සියලු දුක් කරදරවලින් ජය ලබාදෙන්නේය. තවද ඔහු නොසිතූ ආකාරයෙන් ඔහුගේ අවශ්‍යයතාවයන් සපුරන්නේය.” |

# තහනම් කෙරුණු සමහර කරුණු

| | තහනම් කෙරුණු ලැබූ කරුණු | නබිතුමාණන්ගේ වදන් |
|---|---|---|
| 1 | අනෙක් අයව අරමුණු කරගෙන යහක්‍රියා කිරීම | අල්ලාහ් මෙසේ කියයි" 'මම ආදේශ කිරීමෙන් ඉතාමත් අනවශ්‍ය කෙනෙක් වෙමි" කවරෙකු හෝ යම් යහක්‍රියාවක් කිරීමේ දී තවත් කෙනෙක් එයට සම්බන්ධ කරයි නම් ඔහු ආදේශ කළ තැනැත්තාටම භාරකරු වේ" මම ඉන් ඉවත්වෙමි"' |
| 2 | භාහිරය ශීලාචාර වී අභ්‍යන්තරය නරක්ව තිබීම | නබි (සල්) තුමාණන් පැවසුවේය." මා යම් පිරිසකි ගැන දනිමි, ඔවුන් විනිෂ්චය දිනයේ දී 'තිහාමාවේ' දක්නට ලැබෙන සුදු කඳුමෙන් කුසලයන් රැගෙන එයි. අල්ලහ් එය විසිරන ලද දූවිල්ල මෙන් පත්කරයි. එවිට සව්බාන් (රළි) තුමා ඇසුවේය, අල්ලහ්ගේ දූතයානනී ! ඔවුන් කවුරුන් දැයි අපට පැහැදිළි කරන්න. නැත්නම් අපි ද නොදැනුවත්ව එම පිරිසට අයත්වෙමු. එවිට නබි (සල්) කුමාණන් පැවසුවේය : ඔවුන් නුඹලාගේ සහෝදරවරුන් හා නුඹලා මෙන්ය. නුඹලා රාත්‍රියේ නැමදුම් ඉටු කරන්නාමෙන් ඔවුන් ද නැමදුම් ඉටු කරයි. එහෙත් තනිවම සිටය දී තහනම් කරනු ලැබූ දෙයක් කිරීමට අවස්ථාව ලැබුනේ නම් එය කරයි. |
| 3 | උඩගු කම | කවරෙකුගේ හිතේ අනු ප්‍රමාණයක උඩගුකමක් ඇත් ද ඔහු සවර්ගයට නොයයි" උඩගුකම යනු සත්‍ය වසං කිරීමත් අනුන්ව පහත් කොට බැලීමත් ය" |
| 4 | ඇඳුම් වළලු කරට පහළින් ඇඳීම | ඇඳුම්වලින් අනුමැතිය ඇති තරමට වඩා එල්ලා ඇඳීම, එය සරම්, ඉහලින් අඳින කමිස හා තලප්පාව යනාදියෙහි ද ඇත. එසේ කවරෙකු ආඩම්බරකම් වෙනුවෙන් අඳින්නේ ද, අල්ලාහු තආලා විනිශ්චය දිනයේ ඔහු දෙස නොබලයි. |
| 5 | ඊර්ෂ්‍යාව | ඊර්ෂ්‍යාව කිරීම පිළිබඳව නුඹලාට මම අවවාද කරමි" ගින්න දර දහනය කරන්නා සේ ඊර්ෂ්‍යාව යහපත දවාලයි" |
| 6 | පොලිය | පොලිය අනුභව කරන්නා ද ඔහුට අනුභව කිරීමට දෙන්නාට ද නබි (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණෝ ශාප කළහ" එකෙක් දැනගෙනම පොලියෙන් ලැබුණු රිදී කාසියක් අනුභව කිරීම 36 වරක් ගණිකාවක් කාමයේ වරදවා ඇසුරු කළාට වඩා දරුණු වන්නේය" |
| 7 | මත්පැන් පානය" | පුරුද්දක් වශයෙන් මත් පැන් පානය කරන්නාත් හූනියම විශ්වාස කරන්නාත් පවුලේ නෑ කමෙන් ඈත්වී කටයුතු කරන්නාත් ස්වර්ගයට ඇතුල් නොවෙයි" |
| 8 | බොරුව | ජනතාව හිනැස්සීම සඳහා බොරු කියන්නාට විනාශ යැයි නබිතුමාණෝ තුන්වරක්ම කීහ |
| 9 | අනෙකාගේ වැරදි සෙවීම | යම් පිරිසකගේ මනාපයක් නොමැතිව හෝ ඔවුන් ප්‍රසිද්ධ නොකරන්නට සිතද්දී ඔවුන්ගේ කථා බහට (රහසෙන්) සවන් දුනහොත් ඔහුගේ කනේ පරලොව දී ඊයං උණුකර වක්කරනු ලබයි" |
| 10 | රූප නිමාව | පරලොව දී අධික වශයෙන් වේදනා කරනු ලබන්නෝ රූප අඹන්නෝය" බල්ලන් හා රූප ඇති නිවෙස්වලට මලක්වරු නොඑති" |
| 11 | කේලම් කීම | කේලම් කියන්නා සවර්ගයට ඇතුල් නොවෙයි" කේලම් යනු ජනතාව අතරේ ආරවුල් ඇතිකිරීම සඳහා කෙනෙක් කී දේ අනෙකාට කීමය" |
| 12 | ඔපාදූප කීම | ඕපාදූප යනු නුඹලා දන්නෙහුදැ?" යි නබිතුමාණෝ මිතුරන්ගෙන් ඇසුහ" ඔවුහු 'අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන්ම දන්නෝය' යැයි කීහ" 'නුඹේ සහෝදරයා අකමැති දෙයක් ඔහු ගැන ඔහු නොමැති අවස්ථාවක කීමය' යැයි නබිතුමාණෝ පැවසූහ" 'මා කියන දේ ඔහු තුළ තිබුණත් ඕපාදූප වේයිදැ? යි ප්‍රශ්න කෙරිණි" එවිට 'කියන දේ ඔහු තුළ තිබුණ විට ඕපාදූපවේ" නැතිනම් එය අසත්‍ය ප්‍රකාශයක් කළ වරදක් වන්නේය" |
| 13 | ශාප කිරීම | විශ්වාසවන්තයෙකුව ශාප කිරීම ඔහුව ඝාතනය කිරීමක් වන්නේය" ශාප කරන්නේ පරලොවදී සාක්ෂිකරුවන් හො අනුකම්පා බස් දොඩන්නන් නොවන්නෝය" |
| 14 | රහස් හෙලි කිරීම | තම බිරිඳ සමග සංසර්ගයේ යෙදී ඇයගේ රහස් හෙලිකරන්නෝ විනිශ්චය දිනයේ මිනිසුන් අතර නරකම මිනිසෙක් ලෙස අල්ලාහ් දකී" |
| 15 | කැත වචන කථා කිරීම හා නින්දා කිරීම | කවරෙකුගේ කැත වචනය හා ක්‍රියාවන් නිසා ජනතාව ඔහුගෙන් ඈත් වන්නේ ද ඔහු අල්ලාහ් ඉදිරියේ ඉතා නරක පුද්ගලයෙක් වෙයි" |
| 16 | මුස්ලිම්වරයෙකුව කාෆිර් | කවරෙකු හෝ තම සහෝදර මුස්ලිම්වරයෙකු දෙස බලා 'නුඹ කාෆිර්' |

| | | |
|---|---|---|
| | (ප්‍රතික්ෂේප) කරන්නෙකු යැයි සැක කිරීම | යැයි කියයි නම් ඔවුන් දෙදෙනාගෙන් එකෙකු එය භාරගෙන කියනු ලැබූ තැනැත්තා කාෆිර් නොවන්නේ නම් කී තැනැත්තා වෙතම ආපසු එය පැවරෙයි |
| 17 | නියම පියා සිටියදී තව එකෙකු තම පියා යැයි කීම | අයෙක් දැනගෙන තමාගේ පියා නොවන කෙනෙකු තම පියා යැයි වාද කරයි නම් ඔහුට සවර්ගය තහනම්වෙයි“ තම පියාව නොසලකා හරින්නා 'කාෆිර්' වන්නේය |
| 18 | මුස්ලිම්වරයෙකු බිය කිරීම | මුස්ලිම්වරයෙකු අනෙක් මුස්ලිම් වරයාව බියට පත් කිරීම තහනම් ය“ කවරෙකු හෝ ආයුධයක් පෙන්වා තම සහෝදරයාව බියගන්වමින් සිටි නම් ඔහු එය ආයුධය අත්හරින තෙක් මලක්වරු ශාප කරති“ |
| 19 | ඉස්ලාම් රටක ආරක්ෂාවට වගකීමක් දුන් පුද්ගලයෙකු ඝාතනය කිරීම“ | ස්ථිර පොරොන්දුවක් දුන්පසු ජීවිතයක් ඝාතනය කළ අයෙක් ස්වර්ගයේ සුගන්ධය පවා ආඝ්‍රාණය නොකරයි“ ස්වර්ගයේ සුගන්ධය අවුරුදු සියයක දුරකට දැනෙයි“ |
| 20 | අල්ලාහ්ගේ සෙනෙහවන්තයින්ට විරුද්ධ වීම | නියතවශයෙන්ම අල්ලාහ් පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි“ කවරෙකු මගේ එක සෙනෙහෙවන්තයකුට (අල්ලාහ්ට සම්පූර්ණයෙන් බියවී කටයුතු කරන විශ්වාස වන්තයෙකුට) විරුද්ධවන්නේ ද ඔහුට විරුද්ධව මම නියත වශයෙන්ම යුධ ප්‍රකාශ කරමි“ |
| 21 | කුහකයාව හා පාපිෂ්ඨයාව නායකත්වයට පත්කිරීම | කුහකයා දෙස බලා 'නායකයා' යැයි නොකිවහු“ මන්ද එසේ කුහකයා නායකත්වයට පත්වූ විට එමගින් නුඹලාගේ දෙවියන්ව නුඹලා කෝප කරවන්නෝය“ |
| 22 | තම වගකීම යටතේ සිටින අයට ද්‍රෝහිකම් කිරීම | අල්ලාහ් ගැත්තෙකුට වගකීමක් භාර දී (නිසියාකාරව එම වගකීම ඉටු නොකර) එයට ඔහු ද්‍රෝහිකම් කරමින් සිටිය දී මියගියහොත් ඔහුට අල්ලාහ් ස්වර්ගය තහනම් කරයි“ |
| 23 | දැනුමක් නොමැතිව ආගමික තීන්දු දීම | දැනුමක් නොමැතිව ආගමික තීන්දුවක් යමෙකුට දුන් විට එහි පාපය දුන් තැනැත්තාට අත්වෙයි |
| 24 | නොසැලකිල්ලෙන් ජුමුආව හෝ අසර සලාතය අත්හැරීම | අදාල හේතුන් නොමැතිව යමෙක් ජුමුආ තුනක් අත්හරී නම් ඔහුගේ සිත වසා අල්ලාහ් මුද්‍රාව තබන්නේය. කවරෙකු අසර් සලාතය අත් හරින්නේ ද ඔහුගේ කුසල් සියල්ල මැකී යන්නේය |
| 25 | සලාතය ඉටුකිරීමෙහි නොසැලකිලිමත් වීම | අප හා දේව ප්‍රතික්ෂේපකයින් අතර වෙනසකට ඇත්තේ සලාතයයි“ කවරෙකු එය අත් හරින්නේ ද ඔහු දේව ප්‍රතික්ෂේපකයෙක් වන්නේය“ මිනිසෙකුටත් ආදේශ කිරීමටත් අතර ඇත්තේ සලාතයයි“ |
| 26 | සලාතයේ යෙදෙන්නන්ට ඉදිරියෙන් ගමන් කිරීම | සලාතයේ යෙදෙන අයෙකු ඉදිරියෙන් ගමන් කරන්නා එහි පාපය (හොඳින්) දන්නේ නම් අවුරුදු හතලිහක් ඔහු එතැනම සිටගෙන සිටීම වැදගත් වෙයි“ |
| 27 | සලාතය කරන්නන්ට හිරිහැර හා හිංසා කිරීම | කවරෙකු හෝ (අමුවෙන්) ලූණු සුදුලූණු හෝ ලීක්ස් වැනි දෙයක් අනුභව කළේ නම් නියත වශයෙන්ම ඔහු අපේ මස්ජිදයට ළං නොවිය යුතුය“ මිනිසුන්ට හිංසාකාරි දෑ නිසා මලක්වරු ද හිංසා විඳිති“ |
| 28 | ඉඩම් වංචා කිරීම | යමෙක් අනුන්ගේ ඉඩමකින් රියතක් තරම් වංචා කරයි නම් අල්ලාහ් විනිශ්චය දිනයේ ඒ ප්‍රමාණය පොළෝතල හතකින් මාලයක් සේ ගොතා ඔහුගේ ගෙල පලඳවයි“ |
| 29 | අල්ලාහ් ප්‍රිය නොකරන කථා | නියත වශයෙන්ම නොසැලකිලිමත්ව ගැත්තෙක් අල්ලාහ් ප්‍රිය නොකරන කථාවක් කරයි නම් ඔහු නිරයේ වසර 70ක් පහළට වැටෙන ගැඹුරකට ඇද වැටෙයි“ |
| 30 | අල්ලාහ්ගේ 'දික්ර්' වලින් තොරව අධිකව කථා කිරීම | නුඹලා අල්ලාහ්ගේ 'දික්ර්' (මතකය) නොමැතිව අධිකව කථා නොකරනු“ මන්ද අල්ලාහ්ගේ 'දික්ර්' කිරීම හැර අධිකව කථා කිරීම සිත ගලක් බවට පත්කරයි“ |
| 31 | අනවශ්‍ය ලෙස අධිකව කථා කිරීම | නුඹලාගෙන් මට වඩාත් අප්‍රිය වූද විනිශ්වය දිනයේ මගෙන් ඉතා දුරස්ථ වන්නා වූද අය වනුයේ අනවශ්‍ය අන්දමින් අධිකව කථා කරන අයයි“ |

| | | |
|---|---|---|
| 32 | “යහපත් අරමුණකින් ශිල්ප හැදෑරීම | දෙවියන්ගේ තෘප්තිය සඳහාවූ දැනුම මෙලොව අරමුණු කරගෙන හදාරයි නම් ඔහු සවර්ගයේ සුගන්ධ පවා ආඝ්‍රාණය නොකරයි“ |
| 33 | අන්‍ය ජාතියකට සමාන වීම | පිරිමින්ට සමාන ගැහැණුන්ව ද ගැහැණුන්ට සමාන පිරිමින්ව ද නබි තුමාණෝ ශාප කළහ“ |
| 34 | මුස්ලිම්වරුන්ව ඔවුනතර ප්‍රිය නොකර අමනාපයෙන් සිටීම | විශ්වාසවන්තයෙක් සහෝදර මුස්ලිම්වරයෙකුව දින තුනකට වඩා අමනාපයෙන් සිටීමට අනුමැතිය නැත“ කවරෙකු හෝ තම සහෝදරයා සමග අවුරුද්දක් අමනාපයෙන් සිටී නම් ඔහුව ඝාතනය කිරීමට සමාන වෙයි“ |
| 35 | බාහිරව පාපයන් කිරීම | මාගේ සමූහයේ බාහිරව පාපයන් කරන්නා හැර අන් සියල්ලෝම ක්ෂමා කරනු ලැබෙන්නෝය. |
| 36 | අයහපත් ගති ගුණ | නියතවශයෙන්ම විනාකිරි මී පැණි නරක් කරන්නා මෙන්, අයහපත් ගති ගුණ අමලයන් නරක් කරන්නේය. |
| 37 | තෑගි හා උදව් ආපසු ඉල්ලා ගැනීම | තමා දුන් තෑග්ගක් නැවත ආපසු ගන්නා කෑ දේ වමාරා නැවත කන බල්ලාට සමානය“ යමක් දී එය නැවත ගැනීම හලාල් නොවන්නේය“ |
| 38 | “මහ්රම් වූ පිරිමියෙකුගේ සහාය නොමැතිව ගැහැණියක ගමනක් යාම | අල්ලාහ්ව ද විනිශ්වය දිනය ද විශ්වාස කරන ගැහැණියක ’මහ්රම් වූ’ පිරිමියෙකුගේ උදව් නැතිව දවසක දුර ගමනක් යාම තහනම් වෙයි“ |
| 39 | තහනම් දෑ බැලීම | ආදම්ගේ පුත්‍රයින් මත කාමයේ වරදවා හැසිරීම (ගණිකා ඇසුර) ලියවී ඇත“ ඇස් දෙකේ ගණිකා ඇසුර බැලීමද“ කන්දෙකේ ගණිකා ඇසුර ඇසීමද“ අත්දෙකේ ගණිකා ඇසුර ඇල්ලීමද“ දිවේ ගණිකා සේවය කථා කිරීමද“ ලියවී ඇත“ කෙනෙකුගේ සිත (පාපයට) මනාප වෙයි ඔහුගේ රහසග එය ක්‍රියාත්මක කරයි“ |
| 40 | මහ්රම් නොවන කාන්තාවක් සමග තනිව සිටීම | නුඹලාගෙන් කිසිවෙකු ගැහැණියක සමග තනිවම නොසිටිනු“ මන්ද එතැනට තුන්වෙනියා ලෙස ෂෙයිතාන් පැමිණෙයි“ |
| 41 | ෂිගාර්’ ක්‍රමයේ විවාහය | ’ෂිගාර්’ ක්‍රමයේ විවාහය කුමක් දැ?යි විග්‍රහ කළ නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ ’කෙනෙක් තවත් කෙනෙකුට තම දුව විවාහකර කරදීමේදී ඔහුගේ දුවද” තමාට විවාහකර දෙන මෙන් පොරොන්දු වී ඒ ගිවිසුම යටතින් මහර් නොගෙන තම දුව ඔහුට විවාහකර දීමයි කීහ’ |
| 42 | විලාප නගා හැඬීම | මළ කෙනෙකු වෙනුවෙන් විලාප තියා හඬන්නේ නම් ඒ නිසා ඔහුට පරලොව වේදනාව හිමිවෙයි“ විලාප නගන ගැහැණියටද එයට සවන්දෙන්නන්ටද නබිතුමාණෝ ශාප කළහ“ |
| 43 | අල්ලාහ් නොවන දෙයක් මත දිවුරීම | කවරෙකු හෝ අල්ලාහ් නොවන දෙයක් මත දිවුරයි නම් ඔහු කාෆිර් වන්නේය“ නැතිනම් ආදේශ කළේය“ කවරෙකුට හෝ දිවුරන්න අවශ්‍ය නම් අල්ලාහ් මත දිවුරන්න“ නැතිනම් නිහඬව සිටින්න“ |
| 44 | බොරු දිවුරිල්ල | කවරෙකු හෝ අසාධාරණ අන්දමින් අනෙක් මුස්ලිම්වරයෙකුගේ වස්තුව වංචාකර ගැනීමේ අරමුණෙන් බොරුවට දිවුරයි නම් ඔහු අල්ලාහ් කෝපවූ ස්වභාවයෙන් විනිශ්වය දිනයේදී මුණ ගැසෙයි“ |
| 45 | වෙළදාමේදී දිවුරීම | වෙළදාමේදී අධිකව දිවුරීම ගැන නුඹලාට අවවාද කරමි“ ”නියත වශයෙන්ම එය ධනය සොයා දෙයි එහෙත් එය විනාශ වෙයි“ බොරුවට දිවුරීම මගින් භාණ්ඩය විකුණාගත හැක“ එහෙත් එහි අභිවෘද්ධියක් නොමැත“ |
| 46 | දේව ප්‍රතික්ෂේපකයින්ට සමවීම | කවරෙකු යම් පිරිසකට සම වන්නේ ද ඔහු එම පිරිසට අයිති වන්නේය“ අනෙක් අයට සමාන වන්නා අපට අයත් කෙනෙක් නොවන්නේය“ |
| 47 | සොහොන් මත ගොඩනැගිලි සෑදීම | සොහොන් මත හුණු වැනි දෑ ගෑම” ඒ මත ගොඩනැගිලි තැනීම හා ඒ මත වාඩිවීම නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ තහනම් කළහ“ |
| 48 | කුමන්ත්‍රණ කිරීම විශ්වාසය කඩ කිරීම | අල්ලාහ් විනිශ්වය දිනයේ මුළු මානව සංහතියම ඒකරාශි කරන අවස්ථාවේ කුමන්ත්‍රණ කළ හැම එකෙකු වෙනුවෙන්ම කොඩියක් ඔසවා මෙය අහවලා කළ කුමන්ත්‍රණය යැයි ප්‍රකාශ කෙරෙයි“ |
| 49 | සොහොන මත වාඩි වීම | නුඹලාගෙන් කෙනෙක් සොහොනක් මත වාඩිවීමට වඩා ගිනිමැලයක් මත |

| | | |
|---|---|---|
| | | වාඩිවී එයින් නුඹලාගේ ඇදුමද ශරීරයද දැවියාම අගනේය“ |
| 50 | ඇතුල් වන විට අන් අය නැගිට සිට ගැනීම ප්‍රිය කරන්නා | කවරෙකු තමා ඇතුල් වන විට අන් අය නැගිට සිටීම ප්‍රිය කරන්නේ ද, ඔහු නිරයේ නවාතැනක් වෙන් කරගනී. |
| 51 | සිගා කෑමට පටන් ගැනීම | කරුණු තුනක් මම දිවුරා ප්‍රකාශ කරමි“ මා නුඹලාට කියන දෙය මතක තබා ගනු“ (ඒවා කිරීම ආරම්භ කළ නබි තුමාණෝ) ගැත්තෙකු සිගා කෑමට පටන් ගන්නේ නම් ඔහු වෙනුවෙන් අල්ලාහ් දුප්පත් කමේ දොරටු ව විවෘත කරන්නේය“ යැයි පැවසූහ“ |
| 52 | වෙළාදාමේදී අනෙකා රැවටීම සඳහා භාණ්ඩයක මිල නැංවීම | එක නාගරිකයෙක් ගැමියෙකුට විකිනීම තහනම් කළ නබි තුමාණෝ අනෙක් සහෝදරයා කර අවසන් වූ වෙළදාමට විරුද්ධව නුඹලා වෙළදාම් නොකරනු’යි ද ගැනීමේ අරමුණක් නොමැතිව භාණ්ඩවල මිල වැඩි නොකරන ලෙසද පැවසූහ“ |
| 53 | නැතිවූ භාණ්ඩයක් මස්ජිදය තුළ සෙවීම | කෙනෙක් නැති වූ භාණ්ඩයක් මස්ජිදයක් තුළ සොයනු දුටුවහොත් අල්ලාහ් එම භාණ්ඩය නුඹට ආපසු නොදේවා යැයි කියන්න“ මන්ද මස්ජිද් මේ සඳහා නිර්මාණය වූ ඒවා නොවේ“ |
| 54 | මියගිය අයෙකු වෙනුවෙන් ශෝකය පළ කිරීම“ | අල්ලාහ්ව හා විනිශ්චය දිනය විශ්වාස කරන ගැහැණියක තම සැමියා හැර වෙන ඕනෑම කෙනෙකුගේ මරණය වෙනුවෙන් දින තුනකට වඩා ශෝකය පළ කිරීම තහනම්ය“ |
| 55 | ගැහැණුන් ’කබ්රු’ සියාරත් කිරීම | මිනිවළවල් සියාරත් කරන ගැහැණුන්ට අල්ලාහ් ශාප කරත්වා“ උම්මු අතියියා (රළියල්ලාහු අන්හා) තුමිය මෙසේ කියන්නීය“ ’මෘත දේහ පසු පසින් යාම අපට තහනම් කර තිබුණි“ එය අපට අනිවාර්ය තහනමක් නොවීය“ |
| 56 | මංමුළාව කරා කැඳවීම | කවරෙකු හෝ මංමුලාව කරා කැඳවයි නම් ඔහුව පිළිපදින හැම කෙනෙකුගේම පාපය ඔහුට අත්වෙයි“ ඒ හේතුවෙන් එම පාපය කරන අනෙක් අයගේ පාපයත් අඩු නොකෙරේ“ |
| 57 | පානය කිරීමේ දී තහනම් කෙරෙන කරුණු | වතුර මල්ලේ (ලොකුභාජනයේ) කටතියා බීමත් සිටගෙන බීමත් දෙක නබිතුමාණෝ තහනම් කළහ |
| 58 | රන් රිදී භාණ්ඩවල පානය කිරීම | නුඹලා රන් රිදී භාජනවල පානය නොකරනු“ පටරෙදි නොඇඳිනු“ මන්ද ඒවා මෙලොව ප්‍රතික්ෂේපකයින්ට හා පරලොව දී නුඹලාට ද ඇති ඒවාය“ |
| 59 | වම් අතින් පානය කරන්න | නුඹලාගෙන් කිසිවෙකු වම් අතින් කෑම හෝ බීම නොකරනු“ නියත වශයෙන්ම ෂෙයිතාන් වම් අතින් කෑම හා බීම කරයි“ |
| 60 | පවුලෙන් ඉවත්වී කටයුතු කිරීම | පවුලෙන් ඈත්වී කටයුතු කරන්නා ස්වර්ගයට ඇතුල් නොවෙයි |
| 61 | නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) නමින් සලවාත් නොකීම | ’මගේ නම ඇසී මා නමින් සලවාත් නොකී අය නින්දාවට ලක්වූවා වේ“ කවරෙකු සිටින ස්ථානයේ මගේ නම ඇසී මා නමින් සලවාත් නොකියයි නම් ඔහු මසුරෙකි |
| 62 | නිවසේ බල්ලන් ඇති කිරීම | දඩයමට හෝ තමාගේ ආරක්ෂා වෙනුවෙන් හැර කවරෙකු හෝ බල්ලන් ඇති කළහොත් ඔහුගේ කුසල්වලින් දිනපතා කිරාත් දෙකක් අඩුවෙයි“ |
| 63 | සතුන්ට හිංසා කිරීම | බළලෙකුව මිය යන තෙක් වසා තබාගෙන සිටි කාන්තාවක් වේදනාවට ලක්කර නිරයට ඇතුල් වූවාය“ පණ ඇති කිසිම දෙයක් ඉලක්ක බවට නුඹලා පත් නොකරනු“ |
| 64 | හඬ නංවන ගෙජ්ජි සතුන්ගේ කරෙහි බැඳීම | ගෙජ්ජි හෝ බල්ලන් සමග මලක්වරු ගමන් නොකරති“ ගෙජ්ජි ෂෙයිතාන්ගේ සංගීත භාණ්ඩයකි |
| 65 | බුදල් අයිතිකරුවෙක්ම එම අයිතියෙන් වැළැක්වීම | කවරෙකු බුදලේ අයිතිකරුවෙකුට නොදී වංචා කරයි ද ඔහු විනිශ්වය දිනයේ ස්වර්ගයෙන් ඔහුට හිමි විය යුතු කොටස ලබා ගැනීමට අල්ලාහ් ඉඩ නොදෙයි“ |
| 66 | මෙලොව තම අරමුණ කර ගැනීම | කවරෙකුගේ අරමුණ මේ ලෝකය වන්නේ ද අල්ලාහ් දිලිදුකම ඔහුගේ ඇස් ඉදිරියේ තබන්නේය“ ඔහුට විවිධ ගැටළු ද ඇති කරන්නේය“ (ඔහු කොතරම් උත්සාහ කළද) මෙලොවදී ඔහුට නියම කළ ප්‍රමාණය පමණක් ඔහුට ලැබෙන්නේය“ |

# තිම නොවන නිරන්තර චාරිකාව

## ස්වර්ගය හෝ නිරය කරා නුඹේ මග

විශ්වාසවන්තයණි නුඹලා (නුඹලාට අණ කරන ලද දෑ කිරීම තුලින් ද තහනම් කල දැයින් වැලකීමෙන් ද) අල්ලාහ්ට බියවහු. සෑම ආත්මයක්ම හෙට (පරලොව) සඳහා (යහ ක්‍රියාවන්ගෙන්) කුමක් කලින් යැව්වෙමු දැයි සලකා බැලිය යුතුය.

❖ **මිනිවළ(අල්කබ්රු):=** මෙය පරලොවට පා තැබීමේ ප්‍රථම නවාතැන වේ.එය ප්‍රතික්ෂේප කරන්නන් හා කුහකයින් හට ගිනි ජාලාවකින් යුත් වළක් වන අතර විශ්වාසවන්තයින් හට මල් උයනක් වේ. සමහර පාපයන් කෙරෙහි කබ්රයේ දඬුවම ලැබේ යනුවෙන් හදීසයේ පැමිණ ඇත.ඒවානම්,මුත්‍රා කිරීමෙන් පසු හරියාකාරව පිරිසිදු නොකිරීම,කේලම් කීම,යුද්ධ කිරීමෙන් ලබාගත් භාණ්ඩයෙහි වංචා කිරීම,බොරු කීම, සලාතය නොකර නිදාගැනීම,අල් කුර්ආනය සම්බන්ධයෙන් නොසැලකිලිමත්ව සිටීම,ස්ත්‍රී පුරුෂ අපචාරය, සමලිංගික අපචාරය ,පොලියට දීම, ණය නොබේරීම.මෙවන් හැර තවත් කිහිපයක් ඇත.

**පහත සඳහන් දෑ කබ්රයේ වේදනාවෙන් රැක ගන්නේය:** පිරිසිදු චේතනාවෙන් අල්ලහ් වෙනුවෙන් පමණක් කරන අමලයන්, කබ්රයේ වේදනාවෙන් මිදීම වෙනුවෙන් දුආ කිරීම,මුල්ක් නැමති සූරාව සෑම රැයකම පාරායනා කිරීම.තවත් බොහෝ දෙය ඇත.

**කබ්රයේ වේදනාවෙන් පහත සඳහන් තැනැත්තන් ආරක්ෂා කරනු ලැබේ:** ෂහීද් හෙවත් යුද්ධයේ දී ජීවිතය පරිත්‍යාග කළ තැනැත්තා, ජුම්ආ දිනයේ දී මියගිය තැනැත්තා, කුසයේ වේදනාවෙන් මියගිය තැනැත්තා. මෙවන් හැර තවත් කිහිපයක් ඇත.

❖ **(සූර්)නැමති නලාව ලෝක අවසාන දිනයෙහි පිඹීම:** එය ඉතා විශාල නලාවකි.ඉස්රාෆීල් නැමති මැලෙක්වරයා පිඹීම සඳහා එය මත තම මුඛය තබා අල්ලහ්ගේ ඇණවුම බලාපොරොත්තුවෙන් සිටින්නේය.

**මැවීම් සියල්ල පීඩනයට පත් කරන ලද පිඹීල්ල**.මේ හා සම්බන්ධයෙන් අල්ලහ් පවසයි.සූර්(නලාව)පිඹින ලද දිනයෙහි අල්ලහ්ගේ කැමැත්ත ඇතිවුන් හැර අහසේ හා පොලොවේ සිටිනවුන් සිහිය නැතිව මුළාවටපත් වෙති.ඉන් පසුව මෙම මුළු ලොවම විනාශයට පත් වී නැති වේ.පසුව වසර 40කට පසු යළි මැවීම් සියල්ල නැගිටවීම සඳහා නලාව පිඹෙනු ලැබේ.ඒ පිළිබඳව අල්ලහ් මෙසේ පවසයි.පසුව එහි යළි පිඹනු ලැබේ, එවිට ඔවුන් (දේව අණ) බලාපොරොත්තුවෙන් නැගිට සිටින්නෙහුය.

❖ **සමස්ථ ජීවයන් පණ ගන්වා නැගිටවීම(අල් බඃසු):** පසුව අල්ලහ් වර්ෂාවක් පහළ කරයි.එම වර්ෂාව තුලින් ගස් වැල් කෙලින් සිටගන්නා මෙන් ශරීරයන් ද පණ ගැන් වී සිට ගනිති. ජීවීන් සියල්ල පස් සමග එකට එක්ව විනාශ වී ගිය ද (අජ්බු ස්සනබ්) නැමති අපගේ පිට දණ්ඩ අවසානයේ පහිටා ඇති කුඩා ඇටකටුව විනාශ නොවන අතර එමගින් පරලොවෙහි යළි පණ ගන්වනු ලැබේ.තවද ඔවුනට මෙය අළුත් ජීවිතයක් වන අතර යළි ඔවුන්හට මරණය ද නොපැමිණේ එවිට ඔවුන් නිර්වස්ත්‍රව හා පාවහන් රහිතව සිටිති.එදින මැලැක්වරුන් හා ජින්වරුන් ඔවුන්ගේ දෑසට දක්නට ලැබේ.තවද මෙලොවෙහි ඔවුන්ගේ අමලයන් අනුව, ඔවුන් නැගිටවනු ලැබේ.

❖ **එක් රැස් කිරීම(අල් හෂ්රු):**එදින අල්ලහ් මැවීම් සියල්ල ඒකරාශී කරයි.ඔවුන් මත් වී සිටින්නන් මෙන් බියෙන් පීඩනයට පත් වෙති.එදින දින පනස්දහකට සමාන මෙන් දීර්ගව තිබේ.එය මෙලොව ජීවිතයන් සමග සසඳා බැලූ කළ, මෙලොව ජීවිතය සුළු කාලයක් මෙන් පෙනී යයි.එහි සූර්‍යයා අපගේ හිසෙන් මයිලයක තරම් දුරකින් තබනු ලැබේ.එවිට මනුෂ්‍යයින් ඔවුන්ගේ අමලයේ තරාතිරම අනුව දහඩියෙන් ගිලී යයි.මෙලොවෙහි දුර්වල ලෙස සිටියවුන් හා ඔවුන් මත බලයෙන් පාලනය කළවුන්, එදින තර්ක කරගනීයි.කාෆිර්වරයා තමාව අයහාමගට පත් කළ ෂෙයිතාන් හා ඒ සඳහා ඔහුහට උදව් කර මග පහදා දුන් අය වෙනුවෙන් තඩු පවරයි.ඔවුන් අතර එකිනෙකා ශාප කරගනීයි.තමතමාවම අයුක්තියෙහි දැමීම පිණිස ශෝකයට පත් වෙති.

තවද එදින දම්වැල් හැත්තෑ දහසක් මගින් නිරය ඇදගෙන එනු ලබයි.එහි එක් එක් දම්වැල් මැලැක්වරු හැත්තෑ දහසක් ඇදගෙන එන්නෝය.කාෆිර්වරු නිරය දකින අවස්ථාවේ තමා වෙනුවෙන් කුමක් හෝ දෙයක් දඩයක් ලෙස දී එයින් මිදීමට හෝ මා පස් වන්නට නොතිබුණේ දැයි ආශා කරයි.
පාපිෂ්ඨයින් හට ඔවුන්ගේ ධන සම්පත් වලින් ඔවුනට අදාල සකාතය නොදීම සඳහා,එම මුදල් ගින්නෙන් වූ යකඩ තහඩුවක් මෙන් තනා එමගින් මුහුණ රත් කරන ලදී.තවද මෙලොවෙහි ආඩම්බර කමින් හා පුරසාරම් දෙඩීමෙන් සිටියවුන්,එදින කුඩා කුඹියෙකු මෙන් නැගිටවනු ලැබේ.අයුක්තියෙන් අන් අයගෙන් මුදල් පැහැර ගැනීම,තමන් සතු කරගන්නන් හා විශ්වාස ද්‍රෝහිකම් කරන්නන් ඔවුන්ගේ ක්‍රියාව සමස්ථ සමූහය ඉදිරියේ ඔප්පු කර අවනම්බුවට පත්කරනු ලැබේ.සොරකම් කරන්නා තමන් සොරකම් කළ දෑ පටවා ගෙන එනු ලබයි.එසේම මෙලොවෙහි රහසිගතව කල දේවල් එදින පරහසිගත කරනු ලබයි.එහෙත් දේව බියෙන් යුත් සැදැහැමි වරුන් එදින පීඩනයට පත් නොවන්නේය. එරෙහිව ඔවුනට එදින ලුහර් සලාතයක් කරන කාලයක් මෙන් සීඝ්‍රයෙන් ගත වී යයි.

❖ **මනුෂ්‍යයින් වෙනුවෙන් නිර්දේශ කිරීම(අෂ් ෂෆාඅතුල් උළුමා):** විභාග කිරීම සඳහා මැවීම් සියල්ල එක් රැස් කරන එදින, ඔවුන්ගේ දුක් කරදර හා අසන්නට ඇති ප්‍රශ්න පහසු වීම පිණිස, අපගේ නබි(සල්) තුමා හට පමණක් ඔවුන් වෙනුවෙන් නිර්දේශ කිරීමට අවස්ථාව දෙනු ලැබේ.
පොදු වූ නිර්දේශ: මෙය අපගේ නබි තුමා හා වෙනත් අයට ද පොදු වේ.තවද මෙය විශ්වාසවන්තයින් නිරයෙන් බැහැර කිරීමට හා ඔවුන්ගේ තරාතිරම් උසස් කිරීම සඳහා කරන ලද නිර්දෙශය වේ.

❖ **විභාග කිරීම(අල් හිසාබ්):** මනුෂ්‍යයින් ඔවුන්ගේ රක්‍ෂකයා ඉදිරියෙන් පේළි ගතව හිටවනු ලැබේ.එවිට ඔහු ඔවුන්ගේ මෙලොවෙහි කළ අමලයන් ඉදිරිපත් කර විභාගය ආරම්භ කරති.ජීවන කාලය,තරුණ විය,ධන සම්පත්,ශරීර සුවය,දැනුම,අල්ලහ් සමග කළ ගිවිසුම,ඇසීම,බැලීම හා සිතීම යනාදීන් සියල්ල ගැන විභාග කරනු ලැබේ.ප්‍රතික්ෂේප කරන්නන් හා කුහකයින්, සමස්ථ මනුෂ්‍යයින්ගේ ඉදිරියේ විභාග කර ඔවුන්ගේ වැරදි ඔප්පු කරන ලැබේ. ඔවුනට විරුද්ධව සමහර මනුෂ්‍යයින්,පොලොව,දිවා රාත්‍රි කාලයන්,ධන සම්පත්, මැලැක්වරුන් හා ඔවුන්ගේ ශරීර අංගයන් සාක්ෂින් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.ඔවුන්ගේ වැරදි ඔප්පු කර,ඔවුන් එය පිළි ගැනීම පිණිස එසේ කරනු ලැබේ.තවද අල්ලහ් විශ්වාසවන්තයින්ගේ විභාගය තනිව හා රහසිගතව විභාග කර, ඔහු එම වැරදි සියල්ල පිළි ගැනීමෙන් පසු, අල්ලහ් ඔහුට මෙසේ පවසයි:මා ලෝකයේ නුඹගේ වැරදි වැසුවා මෙන් අද දින ද එය වසන්නෙමි.
එදින ප්‍රථමයෙන් විභාග කරනු ලබන්නේ නබි(සල්) තුමාගේ සමූහයයි.අමලයන්ගෙන් ප්‍රථමයෙන් විභාග කරනු ලබන්නේ සලාතයයි.ප්‍රථමයෙන් තීන්දු දෙනු ලබන්නේ මිණී මැරුම් සම්බන්ධයෙනි.

❖ **අමලයන් කිරණ තරාදිය(අල් මීසාන්):** පසුව මැවීම්හට කුලිය ලබාදීම පිණිස,තට්ටු දෙකකින් හා සත්‍යයෙන් යුත් තරාදියෙ හි ඔවුන්ගේ අමලයන් කිරණු ලැබේ.ෂරීආවට අනුකූලව,අල්ලහ් වෙනුවෙන් පිරිසිදු චේතනාවෙන් කරනු ලැබූ අමලයන් පමණක් එම තරාදිය ඝන කරයි.එම අමලයන්ගෙන් සමහරක් පහත දැක්වේ.ලාඉලාහා ඉල්ලල්ලාහ් යන කළිමාව,යහ ගුණාංගයන්,අල් හම්දු ලිල්ලාහ් හා සුබ්හානල්ලාහි වබිහම්දිහි සුබ්හානල්ලා හිල් අළීම් යනාදීන්ගෙන් අල්ලාහු තඅලාව සික්රු කිරීම.තවද එදින ඔවුන් කළ යහ,අයහ ක්‍රියාවලට කුසල හා අකුසල ලබාගතියි.

❖ **පොකුණ(අල් හව්ලු):** ඉන්පසු මූඃමින්වරු නබි(සල්) තුමාණන්ට පමණක් විශේෂ කළ අල් හව්ලුල් හව්සර් නැමැති පොකුණට පැමිණෙන්නේය.එහි ජලය පානය කරන්නාට කිසිදා පිපාසක් ඇති නොවේ.සෑම නබිවරුන්ටම එක් එක් පොකුණු

ඇත.එම සියල්ලටම වඩා අපගේ නබි තුමාගේ පොකුණ ඉතා විශාල වේ. මෙහි ජලය කිරවලට වඩා තද සුදය,මී පැණි වලට වඩා රසය, කපුරුවලට වඩා සුවඳය.එහි භාජනයන් රන් හා රිදී වලින් යුත් අහසේ තරුවන්ගේ සංඛ්‍යාවෙකි.එහි දිග ජෝර්දාන් රටෙහි -අයිලා- නැමැති ස්ථානයේ සිට -ඒඩන්-නගරය තරම් දුරකින් යුක්ත වේ.තවද එයට හව්සර් නැමැති ගඟෙන් ජලය පැමිණේ.

❖ **සැබෑ හා සත්‍යය විශ්වාසවන්තයින් පරීක්ෂාවට ලක් වීම:** එදින මහ්පර් පිටියේ කාෆිර්වරු ඔවුන් නැමදුම් ඉටුකළ දෙවියන් අනුගමනය කරමින් යන්නෝය.එය ඔවුන්ව එළුවන්,හරකුන් හා ඔටුවන් මෙන් කණ්ඩායම් කණ්ඩායම් වශයෙන් එක්රැස් කර නිරයට දමති.කාෆිර්වරු ඇවිදීමෙන් හෝ මූණින්තලාවෙන් හෝ නිරයට ඇතුලු වෙන්නෝය.පසුව සත්‍යය විශ්වාසවන්තයින් හා කුහකයින් ඉතිරි වන්නේය. සර්ව බලධාරී වූ අල්ලහ් ඔවුන් වෙත පැමිණ,නුඹලා කුමක් බලාපොරොත්තු වන්නේ ද?යි ඔවුන්ගෙන් අසයි.එයට ඔවුන් අපගේ රක්ෂකයාණන්ව බලාපොරොත්තුවෙන් සිටින්නෙමු, යනුවෙන් පිළිතුරු දෙන්නෝය. එවිට අල්ලහ් තමාගේ පාදයේ බත් කෙණ්ඩෙන් නිරය ඉවත් කර පෙන්වූ අවස්ථාවේ,ඔවුන් ඔහුව හඳුනා ගෙන,කුහකයින් හැර අන් සියල්ලෝම තම සිරස නමා සුජූද් කරන්නේහුය.අල්ලහ් මෙය අල් කුර්ආනයෙ මෙලෙසින් පවසයි. පාදයේ බත් කෙණ්ඩෙන් (නිරය) ඉවත් කර ඔවුන්ව සුජූද් කරා කැඳවන දිනයේ එයට ඔවුහු ශක්තිය නොලබති. පසුව ඔවුන් ඔහුව අනුගමනය කරමින් යන්නෙහුය.එවිට සිරාත් නැමති පාලම දිස්වේ.එම අවස්ථාවේ අල්ලහ් ඔවුනට ආලෝකයක් ඇති කරයි,නමුත් කුහකයින්ගේ ආලෝකය නිවීයයි.

❖ **(සිරාත්)නැමති පාලම:** මෙය නිරය මත පිහිටා ඇති පාලමකි. සත්‍යය මූඃමින්වරු එය පසු කර ස්වර්ගයට ඇතුලු වේ.මෙම පාලම සම්බන්ධයෙන් නබි(සල්)තුමා මෙසේ පැවසුවේය.එය පාද ලිස්සා වැටෙන ස්ථානය වේ.මනුෂ්‍යයින්ව දැඩි ලෙස අල්ලා ඇදගැනීම සඳහා -සඃදාන්-නැමැති කටු ගසින් කටු වැනි යකඩ මගින් තනන ලද කොකු එල්ලීමෙන් තිබේ.තවද එය කෙස් ගහට වඩා සිහිඳු හා කඩුවට වඩා තියුණුය.(මුස්ලිම්) මෙය පසු කරන අවස්ථාවෙ ඔවුන්ගේ අමලයට අනුව මූඃමින්වරුන් හට ආලෝක විහිදෙයි. එහි අධික ආලෝකය මහා ප්‍රමාණ කන්දක් මෙන් ද, සුළු ආලෝකය දකුණු කකුලේ මහපොට ඇඟිල්ලෙහි සිරස මෙන් තිබේ.ඔවුන්ගෙන් සමහරු ඇසිපිය ගැසීමේ මොහොතෙන් ද,සුළඟ වේගයෙන් ද,අධික වේගයෙන් දුවන අශ්වයන් මෙන් ද පසු කරන්නෙහුය.-සමහරුන් එහි කිසිදු පීඩනයකින් තොරව පසුකර යති.තවත් සමහරු තම ශරීරය තුවාල වීමත් සමග පසු කරති.තවත සමහරු ඔවුන්හට ගසා නිරයට වට්ටන ලදී-නබි වදනකී(බුහාරි,මුස්ලිම්)
කුහකයින්හට කිසිදු ආලෝකයක් දෙනු නොලැබේ.ඔවුන් යලි හැරී යයි.පසුව ඔවුන් හා මූඃමින්වරුන් අතර බිත්තියක් මගින් බාධාවක් ඇති කරනු ලැබේ.එවිට එය පසු කිරීම සඳහා උත්සහා කළ ද,එකා පිට එකා බැගින් නිරයට වැටෙන්නෝය.

❖ **නිරය(අන්නාර්):** එහි ප්‍රථමයෙන් කාෆිර්වරු ඇතුල් වන්නෝය. පසුව පාපිෂ්ඨ මූඃමින්වරුන් හා ඉන්පසුව කුහකයින් ද ඇතුලු වේ. මනුෂ්‍යයන්ගේ සෑම 1000කින්ම 999ක් නිරයට ඇතුල් වෙති. තවද නිරය මහල් ප්‍රසාද හතකින් යුක්තවේ.එහි තිබෙන ගින්දර මෙලොව ගින්දරට වඩා හැත්තෑ ගුණයකින් අධික වේ. එහි ඇතුලුවන කාෆිර් වරුන්ගේ වේදනාව අධික වීම සඳහා ඔවුන්ගේ ශරීරය විශාල වේ.ඔහුගේ උරහිස දෙක අතරැති දුර දින තුනක් ගමන් කරන දුර වේ. ඔහුගේ දත් උහද් කඳු තරම් වේ.ඔහුගේ හම ඝන වේ.වේදනාව බුක්ති විඳීම සඳහා එය නැවත නැවත මාරු කරනු ලැබේ.
ඔවුන් පිපාසය වෙනුවෙන් පානය කරන ලද ජලයේ උෂ්ණය තුලින් ඔවුන්ගේ බොකු කැබැලිවලට පත්වේ.තවද ඔවුන්ගේ ආහාරය නිරයේ තිබෙන ජක්කුම් නැමැති කටු ගස් හා නිරයේ සිටින්නන්ගේ සැරව ය.එහි ඉතා අඩු වූ වේදනාව නම්,ඔහුගේ දෙපා හට නිරයේ තිබෙන ගින්නෙන් යුත් පාවහන් දෙකක් පළඳවන ලදී,එහි ඇතිවන උණුසුම තුලින් ඔහුගේ මොලය උණු වී දිය වී යයි.මෙයින් තොරව තවත්

වේදනාවන් කිහිපයක් එහි දක්නට ලැබේ.එනම් තඹ දියකර වැක්කිරීම,ගින්නේ උණුසුම මගින් මුහුණ පිච්චී දැවීම,ගින්න වෙතට ඇද යාම හා දම්වැල් මගින් බැඳීම යනාදීන් හැර තවත් කිහිපයක්.
නිරය ඉතා ගැඹුරු ය.එදින උපන් ළදරුවෙකු එහි තුළ විසිකළ ද,ඒ ළදරුවා එහි ගැඹුරට පිවිසීම සඳහා වසර 70ක් ගත වේ.ගල් හා කාෆිර්වරුන් එහි දැව ය.එය සුළං පිලිස්සන ගින්දර මෙන් ය.එහි සෙවන ඉතා තද කළු දුම වේ.එහි ඇඳුම් ගින්දර වේ.එය තුළ විසි කරනු ලබන සියල්ල පිළිස්සී යයි. එය ඉතා දැඩි කෝපයෙන් හා ශබ්දයෙන් දැවේ.එහි උෂ්ණය පිණිස හම හා ඇටකටු දිය වී හදවත ද ඇල්ලීමට ළක් වේ.

❖ **ස්වර්ගය හා නිරයට අතරැති පාලම(අල් කන්තරා):** නබි(සල්) තුමාණෝ පවසයි: වේදනා හා පීඩාවන්ගෙන් අවසන් වී, ස්වර්ගය කරා යන මූඃමින්වරු,එය හා නිරය අතරැති පාලමක් මත නවතා තබනු ලැබේ.එම ස්ථානයේ පොළොවෙහි කළ අයුක්තීන්ට එරෙහිව පළි ගනු ලැබේ.එම පාපයන්ගෙන් පරිශුද්ධවීමෙන් පසුව ද,ඔහුට ස්වර්ගය තුළට ඇතුලුවීමට අනුමැතිය ලැබේ.මුහම්මද්ගේ ප්‍රාණය කවෙරෙකුගේ දැතැහි තිබේ ද,ඔහු මත දිවුරන්නෙමි,ඔවුන්ගෙන් කෙනෙකු මෙලොවෙහි තම නිවස හඳුනා ඇතුලු වීමට වඩා,ස්වර්ගයේ ඇති ඔහුගේ නිවස හරියාකාරව හඳුනා ඇතුලු වෙති.(බුහාරි)

❖ **ස්වර්ගය(අල් ජන්නා):** මෙය විශ්වාසවන්තයින්ගේ කීර්තිමත් ස්ථිර නිවස වේ.එය රන් රිදී මගින් තණන ළද්දෙකි.එහි බිත්තිවල බදාම කස්තුරි වේ.එහි පොළොවේ ඇති කුඩා ගල්කැට මුතු,මැණික් වේ.එහි වැලි කුංකුම කල්කය වේ.එයට ඇතුලුවීමට දොරටුවන් හතක් ඇත.එම දොරවල් හි විශාලත්වය දින තුනක් ගමන් කරන දුර වේ.එහෙත් එම ස්ථානයේ මිනිස් තදබදයෙන් පිරී තිබේ.එහි වෙනස්කම් ඇති තරාතිරම් 100ක් තිබේ.එහි එකිනෙක අතර අහස හා පොළොව තරම් දුරකින් යුත් වෙනසක් දක්නට ලැබේ.ස්වර්ගයන්ගෙන් ඉතා උසස් ස්වර්ගය-ෆිර්දව්ස්-වේ.එහි සිට ද,ස්වර්ගයේ ගංගාවන් ගලන්නේය.එහි වහල අල්ලහ්ගේ අර්ෂු වේ.
ස්වර්ගයේ කිරි,මී පැනි,මද්‍ය පාන හා පානය කරන්නට තෘප්තිය ගෙනදෙන ගංගා ඇත.එය ගැඹුරෙන් තොරව පොළොවේ මතුපිට ගලන්නෙකි.එක් මූඃමින්වරයෙකු ඔහුට කැමැති දිශාවට එය හරවයි.ස්වර්ගයේ ආහාර නිරන්තරය.එය ඔහුගේ දෑතෙහි දුරක තිබෙන අතර ඔහුගේ කැමැත්තට අනුව එය අනුභව කරයි.එහි කැණීම් කරන ළද මුතු ඇටයෙන් යුත් කූඩාරම් ඇත. එයි පළල හැතැප්ම මයිලයන් 60ක් පා ගමනින් යන දුර වේ.එහි එක් එක් මුල්ලෙහිම භාර්යාවන් සිටිති.ස්වර්ගයට ඇතුලුවන පුරුෂයන් දැස් කෙස් කලු වූ,ලස්සන,ඉතා තරුණවන්තයින් ලෙස සිටිති.ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් හා යෞවනය ඌනවීමක් හෝ විසන්ධිවීමක් නොවන ස්ථිර භාග්‍යයෙකි.එහි මළ මූත්‍රා පහකිරීම,නාහය කිරීම හෝ පිළිකුල්සාගත විශයන් නොකරති. ඔවුන්ගේ පනාවන් රන්වලින් ද,ඔවුන්ගේ දහඩිය කස්තූරිය වේ.
ස්වර්ග ස්ත්‍රීන් කන්‍යාවියන් වෙති.ඔවුන් සියල්ලන්ම එකම වයසින් සිටිති.තම පුරුෂයින් සමග ඉතා ආදරයෙන් හා කරුණාවෙන් සිටිති.මෙම ස්වර්ගයට ප්‍රථමයෙන් අපගේ නබි(සල්) තුමාණන් ද,අනෙකුත් නබිවරුන් ද ඇතුළු වන්නෝය.ස්වර්ගයට අවසන්ව ඇතුලුවන්නා හට ඔහුගේ සිතුවිල්ලට වඩා දහ ගුණයකින් අධික වූ ස්වර්ගයක් ලැබෙන්නේය.ඔවුනට උදව් උපකාර කිරීම සඳහාම යොවුන් වියට නොයන කුඩා දරුවන් පත් කර ඇත.ඔවුන් ස්වර්ගයේ එහෙට මෙහෙට සැරිසැරීම විසුරුණු මුතුන් මෙන් දක්නට ලැබේ.ස්වර්ග ප්‍රිතියන්ගෙන් ඉතා උසස්ම ප්‍රිතිය වනුයේ අල්ලාහු තආලාව බැහ දැකීම වේ. තවද එහි ඔහුගේ තෘප්තිය සදාකාලික වේ.

# « වුළු කිරීමේක්‍රමය »



**වුළු රහිතව සලාතය නොපිළි ගැනේ.(තහූර්)නැමැති පිරිසිදු කළ හැකි අති පිරිසිදු ජලය මගින් පමණක් වුළු කළ හැක.එනම් එය යථාර්තයෙන්ම පිරිසිදු වූ ගංගා,වැහි,මුහුදු හා ළිං ජලය වේ.** සටහන: අපිරිසිදු දෙයක් සුළු ප්‍රමාණයෙන් වූ ජලයට මිශ්‍රවීමෙන්, එය නජීස්(අපිරිසිදු) වන්නේය.නමුත් ලීටර් 210කට තරම් නොඅඩු වූ අධික ජලය නජීස් මිශ්‍රවීමෙන් එහි පාට රසය හා සුවඳ ආදියෙන් කුමක් හෝ එකකින් වෙනසක් ඇතිවූවහොත් පමණක් නජීස් වන්නේය.



වුළු කරන බව සිතේ ධාරණය කරගෙන බිස්මි කීම. පසුව ඉදිරිපස අත්දෙක මැනික් කටුව දක්වා සේදීම. නින්දෙන් අවදි වූ තැනැත්තා ජලයේ අත ගිල්වන්නට පෙර තුන් වරක් අත්දෙක සෝදා ගැනීම ඉතා වැදගත් වේ.
සටහන: එක් එක් අංගයම තුන් වරකට වඩා සේදීම මක්රූහ් වේ.



පසුව එක් වරක් මුඛය ජලය මගින් කැළැත්තීම.එය තුන්වරක් කිරීම මුස්තහබ් වේ.
සටහන: 1= මෙහි දී මුඛය සේදීමෙන් පමණක් සෑහීමකට පත් නොවී, ජලය මගින් කැළැත්තීම අවශ්‍යය වේ.2= කැළැත්තීමෙන් පසුව එය ගිලීම මක්රූහ් නොවේ.3=එම අවස්ථාවේ දී මිස්වාක් කිරීම මුස්තහබ් වේ.



ඉන් පසුව එක් වරක් නාසයට ජලය ඇතුල් කිරීම.තුන්වරක් කිරීම සුදුසු ය.
සටහන: නාසයට ජලය ඇතුල්කර එය පිට කිරීම පමණක් නොකර,එය අපගේ හුස්මය තුලින් ඉහළට ගෙන පසුව පිට කිරීම අවශ්‍යය වේ.මෙලෙසින් එක් වරක් කිරීම වාජිබ් වන අතර තුන් වරක් කිරීම සුදුසු ය.



පසුව මුහුණ සේදීම (මුහුණේ සීමාවන් :-දිගින් හිසේ කෙස් පැළවුණ ස්ථානයේ සිට නිකටේ යටි පෙදෙස දක්වා. පළලෙන් කන්දෙක අතර ප්‍රදේශයයි.)එක් වරක් සේදීම අනිවර්‍ය්‍යය වන අතර තුන් වරක් සේදීම සුදුසු වේ.
සටහන: කවෙරෙකුගේ යටි රැවුල ඝණව(නිකටේ හම නොපෙනීමෙන්) තිබේ නම්, ඔහු එය අතුල්ලා සේදීම මුස්තහබ් ය.එසේ නොවීමෙන් එය අතුල්ලා සේදීම වාජිබ් වේ.



පසුව ඇඟිලි සහිතව දෑත වැළමිට දක්වා එක් වරක් සේදීම අනිවර්‍ය්‍යය වේ.නමුත් තුන් වරක් සේදීම සුන්නත් වේ.
සටහන: වමතට වඩා දකුණත ප්‍රථමයෙන් සේදීම මුස්තහබ් වේ.



පසුව නළලේ අවසානයේ හිසේ ආරම්භයේ සිට උකුණුවල දක්වා හිස සම්පූර්ණයෙන්ම ජලයෙන් පිරිමැදීම. (කණෙන් ඉහළ සුදු පැහැති කොටස ද හිසට අයත්ය.) දබරැඟිලි දෙක කණ් තුළට යවා මහපටඇඟිලි දෙකෙන් කන්දෙකේ පිට පැත්ත පිරිමැදීම.මෙය එක් වරක් පමණක් සේදීම.
සටහන: 1= නළලේ අවසානයේ හිසේ ආරම්භයේ සිට උකුණුවල දක්වා හිස සම්පූර්ණයෙන්ම ජලයෙන් පිරිමැදීම ද අනිවාර්‍ය්‍යය වේ.2=හිසට ඉහලින් වැටී බිමට එල්ලී තිබෙන කෙස් පිරිමැදීම අනිවාර්‍ය්‍යය නොවේ. 3=හිසෙහි මුළුමනින්ම කෙස් නොමැතිව මුඩු හිසව තිබේ නම්,හිස (තට්යය) මත පිරිමැදීම ප්‍රමාණවත් වේ.4=හිසකෙස් හා කණ අතරැති සම පිරිමැදීම අවශ්‍යය වේ.



පසුව ඇඟිල්ලේ කෙළවර සිට වළලුකර දක්වා දෙපා එක් වරක් සේදීම අනිවාර්‍ය්‍යය වේ.තුන් වරක් සේදීම සුදුසු වේ.

උවධානය 1=වුළුහි අංගයන් හතරකි. (අ)= මුඛය කලත්තා,නාසය තුළට ජලය ඇතුලුකර මුහුණ සේදීම. (ආ)= අත් දෙක සේදීම. (ඉ)= හිස හා කණ පිරිමැදීම. (ඊ)= වළලුකර දක්වා දෙපා සේදීම.තවද මෙම අංගයන් අතර අනුපිළිවෙලින් කිරීම වාජිබ් වන අතර,එසේ නොකිරීමෙන් වුළු බිඳීයන්නේය.
2=එම අංගයන් සේදීමේ දී එකදිගට කිරීම වාජිබ් වේ.එක් අංගයක් වේලෙන තෙක් පමාකර අනෙක් අංගය සේදීමෙන් වුළු බිඳීයන්නේය.
3=වුළු කිරීමෙන් පසු පහත සඳහන් දුආව උසුරීම සුන්නත් වේ. අෂ්හදු අන් ලා ඉලාහා ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු ව අෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු ව රසූලුහු.

# සලාතය ඉටුකරන ක්‍රමය



යමෙකු සලාතය කිරීමට සූදානම් වූයේ නම්,ප්‍රථමයෙන් කිබ්ලාව මුහුණලා සිටගෙන අල්ලාහු අක්බර් යැයි කීම. ඉමාම් එම තක්බීරය හා අනෙක් තක්බීර් ද මඃමූන්වරුන්ට ඇසෙන සේ ශබ්ද නගා කියයි. සෙසු අය නිහඬව කියති. තක්බීර් ආරම්භ කරන විට දෑත උරහිස් දක්වා හා ඇඟිලි එකට එකතු කර කෙලින් ඔසවයි. මඃමූන්වරුන් ඉමාම් තක්බීරය කියා අවසන් වීමෙන් පසු ඔවුන් තක්බීර් කීම ආරම්භ කරයි.

සටහන්: (ලුහර්,අසර් වැනි) නිහඬව පාරායනා කරන සලාතයන් හා අනෙක් සෑම සලාතයකදීම නිහඬව තමන්ට පමණක් ඇසෙන අයුරින් නිශ්ශබ්දව පාරායනය කිරීම අවශ්‍යය වේ.හඬව පාරායනා කිරීමේ අවමය අන් අයට ඇසෙන මෙන් පාරායනා කිරීම වන අතර නිහඬව පාරායනා කිරීමෙ අවම තත්වය තමාගේ කනට ඇසෙන තරම් ය.



පසුව වම් අත මත දකුණු අත තබා සජදා කරන ස්ථානයට බැල්ම හෙළන අතර තම දෑත පපුව මත තබා ගතියි. පසුව හදීසයේ පැමිණැති ආකාරයෙන් සාලාතයේ ආරම්භක (ඉස්තිෆ්තාහ්) දුආවන් හි එකක් හෝ පැවසීම. උදාඃ= (සුබ්හානකල්ලාහුම්ම වබි හම්දික වතබාරකස්මුක වතආලා ජද්තික වලා ඉලාහ ගයිරුක.) ඉස්තිෆ්තාහ් හි දුආ වලින් එකකි. පසුව ඉමාම් අඌදු බිස්මි උසුරයි. (මේවා නිහඬව පාරායනා කරයි) පසුව ෆාතිහාව පාරායනා කරයි. පසුව කුර්ආනයේ කුමක් හෝ කොටසක් පාරායනා කරයි. සලාතයේ ඉමාම් හඬව පාරායනා කරන අවස්ථාවල,මඃමූම් ෆාතිහාව පාරායනා කිරීම මුස්තහබ්වේ. ඉමාම් නිහඬව පාරායනා කරන අවස්ථාවල,මඃමූම් පාරායනා කිරීම වාජිබ් වේ.තවද ඉමාම් ෆජ්රු,මග්රිබ් හා ඉෂා යන සලාතයන් හි ප්‍රථම අදියර(රකආත්) දෙකෙහි හඬනගා ද,අන් සලාතයන්වල නිහඬව ද පාරායනය කරයි.

සටහන්: කුර්ආනයේ සූරාවන් අනුපිළිවෙලින් පාරායනා කිරීම මුස්තහබ් වන අතර එය අනුපිළිවෙල් රහිතව පාරායනා කිරීම මක්රූහ් වේ.තවද සූරාවක වාක්‍යයන් හෝ වචනයන් මාරුකර පාරායනා කිරීම හරාම් වේ.



ඉන්පසු අල්ලාහු අක්බර් කියා දෑත උරහිස්වලට කෙලින් ඔසවා රුකූඋ කරයි. අත් දෙකේ ඇඟිලි විහිදුවා දනිස් මත තබා, කොන්ද කෙලින් කර හිස එයට සමාන්තරව නවයි. පසුව= සුබ්හාන රබ්බියල් අළීම්= යැයි තෙවරක් කියයි.මෙලෙස කිරීම තුළින් ඔහු රකආතයක් ලබා ගන්නේය.

සටහන්: අල්ලාහු අක්බර් හා සමිඅල්ලාහු ලිමන් හමිදාහ් යන්නන් එම සුදුසු ස්ථානයේ පැවසීම අවශ්‍යය වේ.දැනුවත්ව එය පෙර පසු මාරුකර කීමෙන් සලාතය බිඳීයයි.



පසුව =සමිඅල්ලාහු ලිමන් හමීදාහ්= කියමින් හිස ඔසවයි. එවිට පළමු තක්බීරයේ මෙන් අත් ඔසවයි. පසුව (රබ්බනා වලකල් හම්දු හම්දන් කසීරන් තෛයිබන් මුබාරකන් ෆීහි මිල්අස් සමාවාති වමිල් අල් අර්ළි වමිල්අ මාෂිඃත මින් ෂෙයිඉන් බඃදු) යැයි කියයි.

සටහන්: සම්පූර්ණයෙන් කියාමයට පැමිණීමෙන් (කෙලින් වීමෙන්) පසුවම ඉහත සඳහන් දුආව කිව හැකි අතර එහි අතර තුර නොපැවසීම.



පසුව තක්බීර් කියමින් සුජූද් කරයි.එහි දෑත ඉළ ඇටෙන් හා කලවා දෙක කුසයෙන් දුරස්කර තබයි.තවද දෑත උරහිසට කෙලින් හා එහි ඇඟිලි හා පා ඇඟිලි කිබ්ලාවට කෙලින් තබා ගැනීම.පසුව= සුබ්හාන රබ්බියල් අඃලා= යනුවෙන් තෙවරක් කියයි.

සටහන්: අංගයන් හතක් තුළින් සුජූදය කිරීම අනිවාර්‍යය වේ.එනම්: පා ඇඟිල ඇතුල් පැති, දනිස්, අත්ලය හා නළල සමග නහය වේ. සුදුසු කාරනා රහිතව ඉහත සඳහන් අංගයන්ගෙන් එකක් හෝ මගහැරීමෙන් සලාතය පිළිගනු නොලැබේ.



පසුව තක්බීර් කියමින් නැගිට වාඩි වේ.වාඩිවීමේ දී ක්‍රම 2ක් ඇත. 1= වම්පාදය නවා ඒ මත වාඩි වී දකුණු පාදය ඇණ තබා ඇඟිලි කිබ්ලාව දෙසට සිටින සේ පිටතට නවා තබා ගනී. 2= පාද දෙක නවා ඒ මත තට්ටම තබා වාඩි වී ඇඟිලි කිබ්ලාව දෙසට හැරී තිබෙන මෙන් නවා තබා ගනී. පසුව (රබ්බිඃෆිර්ලී) යි තෙවරක් ප්‍රකාශ කරීම. මනාපනම් (වර්හම්නී වජ්බුර්නී වර්ෆඃනී වර්සුක්නී වන්සුර්නී වහ්දිනී වආෆිනී) යන ප්‍රාර්ථනය එක්කර ගනී. පසුව සුජූද් දෙක කලින් කළ ආකාරයෙන්ම කරයි. පසුව තක්බීර් කියා නැගිට දෙවන රකඅතය ද පළමු ආකාරයමෙන්ම ඉටු කරයි.

සටහන්: දෙවන රකආතයට සම්පූර්ණයෙන් පැමිණීමට පෙර,කෙනෙකු සූරා ෆාතිහාව ආරම්භ කලේ නම්,ඔහු කියාමයට පැමිණීමෙන් පසුව එය නැවත පාරායනා කිරීම අනිවාර්‍යය වේ. එසේ නොවූ කළ, සලාතය බිඳ යයි.



දෙවන රකඅතය අවසානයේ ප්‍රථම අත්තහිය්යාතය සඳහා වාඩි වෙයි.එහි වම් පාදය දිගහැර ඒ මත තට්ටම තබා වාඩි වී,දකුණු පාදය කෙලින් සිටවයි.තවද දැතේ ඇඟිලි දිගහැර ළංකරමින් කළව මත තබා, දකුණු අතේ සුලැඟිල්ල හා වෙදැඟිල්ල මොලවා මැද ඇඟිල්ල හා මහපටැඟිල්ල වළල්ලක් මෙන් හදා, දබරැගිල්ලෙන් සංඥා කරයි. පසුව අත්තහිය්යාත් කියයි.(අත්තහිය්යා තු ලිල්ලාහි වස්සලවාතු වත්තයියිබාතු අස්සලාමු අලෛක අය්යුහන් නබිය්යු වරහ්ම තුල්ලාහි වබරකාතුහු අස්සලාමු අලෛනා ව ආලා ඉබාදිල්ලා හිස් සාලිහීන් අජ්හදු අල්ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅජ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වර සූලුහු) යි. රක්අත් තුනක් හෝ හතරක් ඇති සලාතයක් නම් තක්බීර් කියමින් නැගිට සිටී. පළමු රක්අතය වගේම ඉතිරි රක්අත් ඉටුකරයි. එහෙත් ශබ්දනගා නොකියන අතර සිටගෙන ෆාතිහා පමණක් පාරායනා කරයි.




පසුව අවසාන අත්තහිය්යාතය සඳහා(තවර්රුක්) යන විදිහට වාඩි වේ.මෙය සම්බන්ධව සහීහ් වූ හදීසයන් කිහිපයක් පැමිණ ඇත.1=වම් පාදය නවා දකුණු පාදයේ බත් කෙන්ඩය යටින් පිටතට දමා පොලොවෙහි වාඩිවී දකුණු පාදය ඇණ සිටවා තබාගැනීම. 2= වම් පාදය නවා දකුණු පාදයේ බත් කෙන්ඩය යටින් පිටතට දමා පොලොවෙහි වාඩිවී දකුණු පාදය නොඇණ විහිදවා තබාගැනීම. 3= වම් පාදය නවා දකුණු පාදයේ බත් කෙන්ඩය හා කළව අතරින් පිටතට දමා තට්ටම පොලොවෙහි තබා වාඩිවීම.

අත්තහිය්යාත් දෙකකින් යුත් සලාතයක, දෙවන අත්තහිය්යාතයේ මෙසේ වාඩිවීම සුන්නත් වේ. පසුව අත්තහිය්යාතයේ ඉහත සඳහන් කොටස කියා (අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් ව අලා ආලි මුහම්මද් කමා සල්ලෙයිත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුන් මජීද්. අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් ව අලා ආලි මුහම්මද් කමා බාරක්ත අලා ඉබ්රාහීම ව අලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුන් මජීද්) යැයි කියයි,තවද (අඌදු බිල්ලාහි මින් අදාබින්නාර් ව අදාබිල් කබ්ර් ව ෆිත්නතිල් මහ්යා වල් මමාති ව ෆිත්නතිල් මසීහිද් දජ්ජාල්) යන හදීස් හි පැමිණ ඇති ප්‍රාර්ථනා ද කිරීම සුන්නත් ය.



පසුව සලාම් දෙකක් කියයි. දකුණු පසට හිස හරවා (අස්සලාමු අලෛකුම් වරහ්ම තුල්ලාහ්) යනුවෙන් ද පසුව වම් පසට හිස හරවා එමෙන්ම කියයි. පසුව හදීස් හි පැමිණෙන ලද දික්ර් හා දුආවන් උසුරයි.

# දැනුම සෙවීමේඅරමුණ එදිනෙදා ජීවිතයේ ක්‍රියාත්මක කිරීමටය

අල්ලාහු තආලා පවසයි.විශ්වාසවන්තයණි නුඹලා නොකරන දේ ගැන කියනුයේ මන්ද. නුඹලා නොකරන දේ කීම අල්ලාහ්ට ඉතා අප්‍රිය වූ දෙයකි.

- අබූ හුරෙයිරා(රළි) තුමා පවසයි: (දැනුම ඉගෙන ගැන එය ක්‍රියා නොකරන්නන්හට උපමාව වනුයේ,අල්ලහ්ගේ පාදයේ වැය නොකරන සම්පතක් මෙන් ය.)
- ෆුලෙයිල්(රහ්) තුමා පවසයි: එක් දැනුම ඉගෙනගත් විද්වතෙකු,ඔහුගේ දැනුමට අනුව ක්‍රියා නොකරන කල,ඔහු නොදැනුම ඇත්තාය.
- මාලික් බින් දීනාර්(රහ්) පවසයි: සමහරුන් එක් අකුරක් හෝ වැරදි නොමැතිව ඉතා හොඳින් කථා කරයි.නමුත් ඔහුගේ ක්‍රියාවන් සියල්ල වැරදි ය.

ගෞරවණීය මුස්ලිම් සහෝදර සහෝදරියණී ...
සර්වබලධාරී වූ අල්ලහ්ගේ නාමයෙන් නුඹලා මෙම කුඩා පොත කියවා නිම කර ඇත.එහෙයින් ඉතිරිව ඇත්තේ මෙහි එල ප්‍රයෝජණ නෙලා ගැනීම වේ.එනම් මෙම පොතෙහි සඳහන් වූ පරිදි ක්‍රියා කිරීම වේ.

- ඔබ මෙම පොතෙහි යම් අල් කුර්ආන් වැකියන් හි අරුතයන් කියවා ඇති අතර ඒ අනුව ජීවිතය හැඩගැස්වීමට උත්සහා කරනු.මන්ද අප නබි මිත්‍රයින්,ඔහුගෙන් අල් කුර්ආන් වැකි දහයක් පාඩම් කළ ද,එය තේරුම් ගෙන අමල් කිරීමෙන් පසුවය තවත් වැකි දහයක් පාඩම් කරන්නෝය.එනිසාම ඔවුන්-අප දැනුමත් සමග ජීවිතයට අවශ්‍යය අමලය ද ඉගෙන ගත්තෙමු-යනුවෙන් පවසයි.ගෞරවණීය ඉස්ලාමය ද මෙය අගය කරන්නේ ය.ඉබ්නු අබ්බාස්(රළි) තුමා- ඔවුන් එය හරියාකාරව පාරායනා කරන්නෝය-යන අල් කුර්ආන් වැකියට, -ඔවුන් එය හරියාකාරව අනුගමනය කරති- යනුවෙන් විවරණ කර ඇත.තවද පුලයිල්(රහ්) තුමා පවසයි: නියතවශයෙන්ම මෙම කුර්ආනය පහළව ඇත්තේ ඒ අනුව අමල් කිරීමටය.නමුත් මනුෂ්‍යයින් එය පාරායනා කිරීම පමණක් අමලය කර ගත්තෝය.
- ඔබ මෙම පොතෙහි වදන් කිහිපයක් කියවා ඇති අතර එය ද තම ජීවිතයේ අමල් කිරීමට උත්සහා කරන්න.මන්ද ඉස්ලාම් සැදැහැමිවරුන් පහත සඳහන් නබි වදනට අවනත වීමෙන් ද, ඉන් පසුව එන ලද අල් කුර්ආන් වැකියෙහි සංඥා කරනු ලැබූ දඩුවමට බියෙන් ද,යමක් ඉගෙන ගත් කළ, එය අමල් කිරීමට හා ඒ වෙත කැඳවීමට තරග කරති. එනම් නබි(සල්) තුමාණන් පැවසුවේය. මා නුඹලා හට යමක් අණ කළ ද,එය නුඹලාගේ ශක්තියට හැකි පරිදි ගෙන එණු.තවද මා නුඹලා හට වැළකූ දෙයින් නුඹලා මුළුමනින්ම වැළකෙනු. (බුහාරි,මුස්ලිම්) එහෙයින් (අප දූතයා) ඔහුගේ ඇණවුමට එරෙහිව ක්‍රියා කරන්නන් තමා හට යම් පීඩන ඇති විය හැක හෝ ඉතා දරුණු වේදනාවන් පැමිණිය හැක යනුවෙන් බියට පත් වනු. (අන්නූර්-63)

මේ හා සම්බන්ධ අමලයන් කිහිපයක් පහත දැක් වේ.

- නබි(සල්) තුමාගේ බිරියවන උම්මු හබීබා(රළි) තුමිය පවසන්නීය: කවරෙකු එක් දිනෙක රකාඅත් 12ක් (නෆිල්) සලාතය ඉටු කරන්නේ ද,ඒ වෙනුවෙන් ඔහුට ස්වර්ගයේ නිවෙසක් තනනු ලැබේ. (මුස්ලිම්) තවද පැවසුවාය,මා මෙම වදනට සවන් දුන් දින සිට මෙම ක්‍රියාව අත් නොහැරුවෙමි.
- ඉබ්නු උමර්(රළි)තුමා ප්‍රකාශ කරයි: වසීයා කිරීමට ලක්වන ලද දෙයක් එක් මුස්ලිම් වරයෙකු සතුව පසු වී,ඔහු එය තමන් සතුව නොලියා තබා රාත්‍රියන් 2ක්

ගත කිරීම ඔහුට සුදුසු නැත. (මුස්ලිම්) පසුව පැවසුවේය.නබි(සල්) තුමාණන් මෙය පවසා රාත්‍රියක් ගත නොවූණේය මාගේ වසියාව මා සතුව තිබුනියි.

• ඉමාම්අහ්මද්(රහ්) තුමා පවසයි: මා මාගේ ග්‍රන්ථයේ එක් හදීසයක් හෝ නොලිව්වෙමි එය අමල් කිරීමෙන් තොරව.දවසක් මා-නබි(සල්) තුමාණන් හිජාමා (ප්‍රතිකාරයක් වෙනුවෙන් ඇණ ලේ පිටතට ගැනීම) කර,එය කල තැනැත්තා වන අබූ ථයිබාහට දීනාරයක් දුන්නේය යන හදීසය ඉගෙන ගත්තෙමි.පසුව මා ද එසේ කර එය කල තැනැත්තාහට දීනාරයක් දුන්නෙමි.

• ඉමාම්බුහාරි(රහ්)තුමා පවසයි: ඊර්ෂ්‍යා කිරීම හරාම් යනුවෙන් මා ඉගෙන ගත් දින සිට කිසිවෙකු හට මා ඊර්ෂ්‍යා නොකලෙමි. තවද මා අල්ලහ් හමු වන දින ඔහු මාගෙන් ඒ හා සම්බන්ධව ප්‍රශ්න නොකිරීම අපේක්ෂා කරමි.

• නබි(සල්) තුමාණන් පැවසුවේය. කවරෙකු සෑම සලාතයෙකින් පසුව ආයතුල් කුරුසිය පාරායනා කරන්නේ ද,ඔහු ස්වර්ගයට ඇතුලු වීමෙන් මරණය හැර අන් දෙයක් නොවලකියි. (නසාඊ) ඉබ්නුල් කය්යුම්(රහ්) තුමා පවසයි.ෂයිහුල් ඉස්ලාම් ඉබ්නු තෙයිමියා (රහ්) තුමාගෙන් මා හට පුවතක් ලැබුණි. නියතවශයෙන්ම ඔහු අමතකවීමකින් හැර අන් සෑම අවස්ථාවේ දී ම එය ක්‍රියා කලේය.

දැනුම ඉගෙන ගැන එය අමල් කිරීමෙන් පසුව අල්ලහ් නුඹට කල දායාදයන් පිණිස ඒ වෙත කැඳවීම ද නුඹට අවශ්‍යය වේ.මන්ද නුඹ කුසලින් අහිමි නොවන අතර අන් අය ද.යහපතින් අහිමි නොවීම සඳහා ය. නබි(සල්) තුමාණන් පැවසුවේය. කවෙරෙකු යහපතක් සඳහා අන් අයට මග පහදා දෙන්නේ ද,ඔහුට ද එය කරන්නාට ලැබෙන කුසල මෙන් ලැබෙන්නෙය. (මුස්ලිම්) තවද පැවසුවේය.නුඹලාගෙන් වැඩගත් අය වනුයේ අල්-කුර්ආනය හදාරා එය සෙස්සන්ට උගන්වන තැනැත්තන්ය.(බුහාරි) තවද පැවසුවේය.මාගෙන් නුඹලා එක් වැකියක් දැනගන්නේ ද.එය අන් අය හට දන්වනු. (බුහාරි.මුස්ලිම්) නුඹ අධිකව යහපත පැතිරවීමෙන්,නුඹගේ කුසල ද මහගු ලෙස අධික වන අතර එය මෙලොව ජීවිතයේ හා මරණයෙන් මතු ජීවිතයේ ඉදිරියට ගමන් කරයි. නබි(සල්) තුමාණන් පැවසුවේය.මිනිසෙකු මරණයට පත්වීමෙන්,අමලයන් තුනක් හැර අන් සියළු අමලයන්ම විසන්ධි වී යන්නේය: නිරන්තර කුලිය පැමිණෙන සදකාව(දන් දීම),ඔහුට ප්‍රයෝජණය ලබාදෙන දැනුම,ඔහු වෙනුවෙන් දුආව අයැදින යහපත් දරුවා. (මුස්ලිම්)

**අවධානය:** අප එක් දිනෙක සුරා ෆාතිහාව 17වරකට වඩා පාරායනා කරන්නෙමු,තවද එහි අල්ලහ්ගේ කෝපයට භාජණය වූවන් හා මංමුලා වූවන්ගේ මාර්ගයෙන් ආරක්ෂා පතන්නෙමු,පසුව අප ඔවුන්ගේ ක්‍රියාවෙන් ඔවුනට සම වන්නෙමු.එනම් අප ඉගෙන ගැන එය ක්‍රියා නොකිරීමෙන් අල්ලහ්ගේ කෝපයට භාජණය වූ යුදෙව්වන්ට ද,දැනුමෙන් තොරව අමල් කර,මංමුලාවූ ක්‍රිස්තියානින්ට ද සම වන්නෙමු.

මාහට හා නුඹලාහට සර්ව බලධාරී වූ අල්ලහ් ප්‍රයෝජණවත් දැනුම හා යහ අමලයන් කිරීමට අවස්ථා ලබා දෙන්වා! යනුවෙන් ප්‍රාර්ථනා කරමි.

අල්ලහ් ඉතා දැනුම ඇත්තාය.සලවාතය හා සලාමය අපගේ නායක නබි මුහම්මද් (සල්)තුමා හට හා ඔහුගේ ඥාතීන්,හිත මිතුරන් සියල්ලන් හට ඇති වේවා!!!

සිංහල

# تفسير العشر الأخير

## من القرآن الكريم

### من كتاب زبدة التفسير

www.tafseer.info